තිරසාර පදනමකින් ඉදිරියටම

ලංකා බැංකුව

වාර්ෂික වාර්තාව 2017

ලංකා බැංකුව: ජාතියේ මහා පහන් ටැඹ

දැක්ම

ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකීය සලකුණ බවට පත්වෙමින් ගනුදෙනුකාර කේන්ද්‍රීය නවමු මූල්‍ය පහසුකම් පිරිනමන ජාතියේ බැංකුකරුවා වීම.

මෙහෙවර

ගෝලීය බැංකුකරණයේ නැවුම් අත්දැකීම් අප ගනුදෙනුකාර ප්‍රජාව වෙත ලඟාකරලමින් සේවක පරිපූර්ණාත්වය මත ගොඩනැංවූ වඩාත් කාර්යක්ෂමවූත්, නවීන තාක්ෂණවේදයන් මුසුවූත් මූල්‍ය සේවාවන් හරහා සියළු පාර්ශ්වකරුවන් වෙත වටිනාකම් උත්පාදනය කරලීම.

ආයතනික වටිනාකම් ප්‍රකාශය

ගෝලීය බැංකුකරණයේ ශ්‍රී ලාංකීය සලකුණ බවට පත් වෙමින් ගනුදෙනුකාර කේන්ද්‍රීය නවමු මූල්‍ය පහසුකම් සලසන්නා බවට පත්වීමේ අපගේ දැක්ම කරා යන ගමනේදී පහත දැක්වෙන පංචවිධ වූ මූලික හරයන් මත බැංකුව ක්‍රියාත්මක වෙයි:

- ගනුදෙනුකාර කේන්ද්‍රීය වීම
- අප ආයතනය හා බැඳුනු විවිධ ජන කණ්ඩායම්හි විවිධත්වයට ගරු කිරීම
- ඉතා උසස් තත්ත්වයේ ආචාරධර්ම පිළිපැදීම සහ වෘත්තීමය පරිසරයක් ස්ථාපනය සඳහා කැපවීම
- නම්‍යශීලි සහ නවෝත්පාදන පරිසරයක් ප්‍රවර්ධනය කිරීම
- අපගේ සෑම ක්‍රියාකාරකමක් සඳහාම වගවීම



ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ

තිරසාර පදනමකින් ඉදිරියටම

අප අපගේ නව පරපුරේ ගනුදෙනුකරුවන් පිළිගනිමින් ඔවුන්ට සේවා සැපයීමට සූදානම් වන මොහොතේදී අප ජීවත් වෙමින් හා ක්‍රියාත්මක වන්නා වූ අපගේ හරයන්, අපගේ මූලධර්මයන් සහ අපගේ සැලසුම් යන සියල්ලම වේගයෙන් වෙනස්වන බැංකුකරණයේ ගති ලක්ෂණ විඳහා දක්වමින් සිටී. වේගයෙන් ප්‍රතිනිර්මාණය වන ඩිජිටල් අවකාශ ඔස්සේ ව්‍යාපාර ගනුදෙනු නව ආරකින් මෙහෙය වීම සඳහා වූ ව්‍යුහයන් අපගේ හරයන් හා මේ වන විට සම්බන්ධ වී ඇත. මින් ඉදිරියට අනාගතය සඳහා වූ අප දැක්මේ මූලික කොටස්කරුවන් වනුයේ "සහස්‍රක" පරපුර නියෝජනය කරන ගනුදෙනුකරුවන් වුවද, අප අපගේ පාරම්පරික ගනුදෙනුකරුවන් වෙනුවෙන් දක්වන ප්‍රමුඛත්වය ඉදිරියටත් එලෙසම අඛණ්ඩව පවත්වා ගනු ඇත.

ලංකා බැංකුව...පෙරළියක පෙරගමන්කරු.

පටුන

04 වැදගත් තොරතුරු

04— කාර්යසාධන වැදගත් තොරතුරු
05— වැදගත් මූල්‍ය තොරතුරු
06— වැදගත් මූල්‍ය නොවන තොරතුරු

08 සමෝධානික වාර්තාකරණ රාමුව

11 තිරසාර පැවැත්ම

12—**ස්වයං ප්‍රතිනිර්මාණය**
12— සභාපතිතුමාගේ පණිවිඩය
16— විශ්‍රාම යන මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය
20— මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය

23—**අපගේ පරිසරය හා අපගේ ක්‍රියාවලිය**
23— ආර්ථික දෘෂ්ටිය
28— ව්‍යාපාර ආකෘතිය

32—**තිරසාර පැවැත්ම සඳහා අපගේ කැපවීම**

33 ජාතියේ මහා පහන් ටැඹ

34—**ඉදිරි මඟ දැක්ම**
34— අධ්‍යක්ෂ මණ්ඩලය
40— ආයතනික කළමනාකාරිත්වය
54— විධායක කළමනාකාරිත්වය

62—**ආයතනික යහපාලනය**

70—**අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා**
70— විගණන කමිටු වාර්තාව
74— ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව
76— මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව
77— නාම යෝජනා හා ආයතනික යහපාලන කමිටු වාර්තාව

80—**අවදානම් කළමනාකරණය**

93 ප්‍රතිලාභ ජනිත කිරීමේ අපගේ ක්‍රියාවලිය

94— **වැදගත් මූල්‍ය සංඛ්‍යාත**
මූල්‍ය ප්‍රාග්ධනය

100— **භෞතික යටිතල පහසුකම් සහ ඉන් ඔබ්බට**
නිෂ්පාදන ප්‍රාග්ධනය

104— **වැදගත් බුද්ධිමය දේපළ**
ආයතනික ප්‍රාග්ධනය

108— **අනෙක්න්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙන එන සබඳතා පෝෂණය කරමින්**
සාමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

126— **අපගේ වටිනාම වත්කම මඟින් උපරිම දායකත්වයක්**
මානව ප්‍රාග්ධනය

134— **මිහිතලය සුරැකීම සඳහා අපගේ දායකත්වය**
ස්වාභාවික ප්‍රාග්ධනය



137 මූල්‍ය වාර්තා

139— ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

144— ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

146— මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

148— ස්වාධීන සහතිකවීමේ වාර්තාව

149— මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

150— විගණකාධිපති වාර්තාව

151— ලාභ හෝ අලාභ ප්‍රකාශනය

152— විස්තීරණ ආදායම් ප්‍රකාශනය

153— මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

154— හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

158— මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

160— මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

303 අනුකූලවීමේ ඇමුණුම්

304— 2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

324— කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

326— ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතාවන්

329— ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය

344— පැවරුම් මිල සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහතිකය

345 අතිරේක තොරතුරු

346— අපේ ඉතිහාසය සංක්ෂිප්තව

348— පාර්ශ්වකරුවන් හා සම්බන්ධවීම හා ප්‍රමාණාත්මකභාවය

352— GRI දර්ශකය

356— ස්වාධීන සහතික වාර්තාව

358— ලාභ හෝ අලාභ ප්‍රකාශනය (ඇ.ඩො.)

359— විස්තීරණ ආදායම් ප්‍රකාශනය (ඇ.ඩො.)

360— මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය (ඇ.ඩො.)

361— කාර්තුමය විශ්ලේෂණය

364— කොටස් හා ණයකර තොරතුරු

366— දස වර්ෂ සංඛ්‍යාන සාරාංශය - බැංකුව

368— පරිපාලිතයන් හා ආශ්‍රිතයන්

370— මෙහෙයුම් මධ්‍යස්ථාන

388— විදේශීය රටවල නියෝජිත බැංකු - රටවල් පදනම මත

393— විනිමය හුවමාරු සමාගම් - රටවල පදනම මත

394— මූල්‍ය සහ බැංකුකරණ පාරිභාෂික ශබ්ද සංග්‍රහය


397— ආයතනික සහ විදේශීය කාර්යාල

399— සංස්ථාපිත තොරතුරු


වැදගත් තොරතුරු

කාර්යසාධන වැදගත් තොරතුරු


දළ ණය සහ අත්තිකාරම් සහ අත්තිකාරම් මඟින් ඉපයූ ආදායම්




තැන්පතු සහ තැන්පතුකරුවන් සඳහා ගෙවන ලද පොළී ආදායම්




ශුද්ධ පොළී ආදායම සහ ශුද්ධ පොළී අනුපාතය




ණය කළඹේ ව්‍යාප්තිය




ගනුදෙනුකාර ගිණුම්හි ව්‍යාප්තිය




ගනුදෙනුකාර සේවා ජාලයන්හි ව්‍යාප්තිය




වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභය




ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය




සන්නාම වටිනාකම




ලාභය රජයට දක්වන ලද දායකත්වය සහ රජයට ගෙවන ලද ලාභාංශ



සේවක සංඛ්‍යාවට එරෙහිව සේවක සුභසාධනය සහ සේවක පුහුණුවීම් සඳහා වැය කිරීම්



ආදායමට පිරිවැය අනුපාතය



වැදගත් මූල්‍ය තොරතුරු

දෙසැම්බර් 31 දිනට	බැංකුව			සමූහය		
	2017	2016	වෙනස %	2017	2016	වෙනස %
මෙහෙයුම් ප්‍රතිඵල (රු. මිලියන)						
මුළු ආදායම	189,211	154,121	22.8	197,013	159,701	23.4
ශුද්ධ පොළී ආදායම	58,356	53,957	8.2	61,490	56,606	8.6
මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැංවීමේ බදු සහ ආදායම් බද්දට පෙර ලාභය	37,592	37,454	0.4	38,195	36,431	4.8
බදු පෙර ලාභය	30,343	31,189	(2.7)	30,816	30,117	2.3
බදු පසු ලාභය	21,312	24,791	(14.0)	21,487	23,386	(8.1)
රජයට දායකත්වය	28,524	30,064	(5.1)	28,923	30,554	(5.3)
මූල්‍ය තත්ත්වය (රු. මිලියන)						
මුළු වත්කම්	1,951,804	1,669,291	16.9	1,999,410	1,716,557	16.5
දළ ණය සහ අත්තිකාරම්	1,219,914	1,047,190	16.5	1,252,363	1,075,952	16.4
හානිකරණ ප්‍රතිපාදන වලට පසු ශුද්ධ ණය සහ අත්තිකාරම්	1,163,161	1,000,083	16.3	1,194,294	1,027,768	16.2
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු	1,546,832	1,256,589	23.1	1,566,376	1,273,631	23.0
මුළු වගකීම්	1,840,649	1,576,442	16.8	1,877,084	1,613,202	16.4
මුළු ස්කන්ධය	111,155	92,850	19.7	122,326	103,355	18.4
කොටස් පිළිබඳ දත්තයන් (රු.)						
කොටසක ඉපැයුම	1,856	2,479	(25.1)	1,870	2,350	(20.4)
කොටසක ශුද්ධ වත්කම්	7,410	9,285	(20.2)	8,093	10,248	(21.0)
කාර්යසාධන අනුපාත (%)						
වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභය	1.7	1.9	(0.2)	1.7	1.8	(0.1)
ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය	20.9	28.4	(7.5)	19.0	23.8	(4.8)
පොළී ආන්තිකය	3.2	3.3	(0.1)	3.3	3.4	(0.1)
ආදායමට පිරිවැය	38.4	43.0	(4.6)	40.5	46.7	(6.2)
තැන්පතු වලට ණය අනුපාතය	78.9	83.3	(4.4)	80.0	84.5	(4.5)
ස්කන්ධය මත ණය	41.5	124.5	(83.0)	–	–	–
හානිකරණ ප්‍රතිපාදන, දළ ණය හා අත්තිකාරම් වල ප්‍රතිශතයක් ලෙස	4.7	4.5	0.2	4.6	4.5	0.1
ව්‍යවස්ථාපිත අනුපාත (%)						
ද්‍රවශීලතා වත්කම් අනුපාතය (දේශීය) (අවම අවශ්‍යතාවය 20%)	27.2	21.6	5.6	–	–	–
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (රු.) (අවම අවශ්‍යතාවය 80%)	141.5	174.1	(32.6)	–	–	–
ද්‍රවශීලතා ආවරණ අනුපාතය (සියලු මුදල්) (අවම අවශ්‍යතාවය 80%)	105.0	102.0	3.0	–	–	–
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත (%)						
පොදු ස්කන්ධය ස්ථර 1 ප්‍රාග්ධනය (අවම - බාසල් III - 6.25%)	10.8*	N/A	–	10.9*	N/A	–
ස්ථර 1 ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාවය - බාසල් II - 5%, බාසල් III - 7.75%)	10.8*	8.7	2.1	10.9*	8.8	2.1
මුළු ප්‍රාග්ධනය (අවම අවශ්‍යතාවය - බාසල් II - 10%, බාසල් III - 11.75%)	14.6*	12.3	2.3	14.5*	12.5	2.0

**2017 සඳහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත බාසල් III නියාමන අවශ්‍යතාවලට අනුකූලව ගණනය කර ඇත.*

වැදගත් මූල්‍ය නොවන තොරතුරු

නිෂ්පාදන ප්‍රාග්ධනය

භෞතික සහ ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනයට ආයෝජන
රු. බිලියන **3.6**

ශාඛා
578

සිමිත සේවාවන් සහිත ශාඛා
48

"ජංගම බැංකු රථ"
02

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන
15

ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන
14

ස්වයංක්‍රිය මුදල් ගැනුම් යන්ත්‍ර
764

ස්වයංක්‍රිය මුදල් තැන්පතු යන්ත්‍ර
168

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

මිලියන **13** කට අධික ප්‍රතිලාභී ගනුදෙනුකරුවන්

නව නිෂ්පාදන හඳුන්වාදීම්
05

ක්ෂුද්‍ර මූල්‍යන ඇංශය සඳහා ණය ලබාදීම් රු. මිලියන
287.3

ආයතනික ව්‍යාපෘති මූල්‍යනය හරහා උත්පාදිත වක්‍ර රැකියා
1,800

සුළු හා මධ්‍ය පරිමාණ ඇංශයේ සංවර්ධනය සඳහා ණය ලබා දීම රු. බිලියන
60.0

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ලාභාංශ රු. බිලියන
12.3

වර්ෂය තුළ ප්‍රසම්පාදනයන්
556

තිරසාරත්ව මූලාරම්භයන් සඳහා ආයතනික සමාජීය වගකීම් අරමුදල් යෙදවීම
රු. මිලියන **127.5**

මානව ප්‍රාග්ධනය

මුළු ස්ථිර සේවක සංඛ්‍යාව **7,587**

පුරුෂ **43%**
ස්ත්‍රී **57%**

සේවක පුහුණුව සඳහා ආයෝජනය රු. මිලියන
322.0

සේවක පුහුණු පැය **11,884**

නව සේවක බඳවා ගැනීම්
534

උසස් වීම්
1,831

ආයතනික ප්‍රාග්ධනය

සමුච්චිත සේවා පළපුරුද්ද වසර
81,841

වටිනාම ශ්‍රී ලාංකික වෙළඳ නාමය

සන්නාම වටිනාකම
රු. බිලියන **40.6**

ශක්තිමත් ලෙස ස්ථාපිත කරන ලද යහපාලන සංස්කෘතිය



ලෝකයේ ඉහළම බැංකු 1,000 වර්ගීකරණය තුළ වසර **7** ක අඛණ්ඩ නියෝජනය

ස්වාභාවික ප්‍රාග්ධනය

පරිසර හිතකාමී යටිතල පහසුකම් සංවර්ධනය

ශාඛා
20 ක් සූර්ය බල පැනල මඟින් විදුලි බල අවශ්‍යතා සපුරා ගනු ලැබේ

හරිත ගොඩනැගිලි සංකල්පය යටතේ GBCSL ආයතනය මඟින් රන් සම්මානයෙන් කැකිරාව ශාඛාව පිදුම් ලැබීම

ලිපිගොනු කළමනාකරණ පද්ධති හරහා ණය ලබාදීම මඟින් ඉතිරි වූ A4 කඩදාසි ගණන
178,297

BoardPAC යොමුව හරහා ඉතිරි වූ A4 කඩදාසි ගණන
81,595

හරිත බැංකුකරණය සඳහා ඩිජිටල්කරණය

විද්‍යුත් ප්‍රකාශන සඳහා ලියාපදිංචි වීම්
135,540
(වර්ධනය 67%)

ස්මාර්ට් පාස්බුක් යෙදුම සඳහා ලියාපදිංචි වීම්
41,567

"ස්මාර්ට් පේන්" ගිණුම්
196,343
(වර්ධනය 93%)

හරිත ණය පහසුකම්

ශාඛා ණය අංශය මඟින් පුනර්ජනනීය බලශක්ති උත්පාදනය ණය සහ අත්තිකාරම් ප්‍රදානයන්
රු. මිලියන **640.6**

සමෝධානික වාර්තාකරණ රාමුව


වාණිජ ආයතනයක් එහි මෙහෙයුම් කටයුතුවලදී විවිධ යෙදවුම් ලබා ගන්නා අතර ඒවා ආයතනයට හා එහි පාර්ශ්වකරුවන්ට වටිනාකමක් දෙන ලෙස පරිවර්තනය කරයි. මෙම වටිනාකම් නිර්මාණය කිරීම, කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන ලෙස විවිධ කාල රාමු පුරා විහිදේ. සමෝධානික වාර්තාව මඟින් ව්‍යාපාරික ආකෘතිය, උපායමාර්ග, යහපාලනය, ක්‍රියාවලි, අවදානම් සහ අවස්ථා ඇතුළත් මෙම වටිනාකම් නිර්මාණ ක්‍රියාවලිය කෙටියෙන් විස්තර කරනු ලැබේ.

රාජ්‍ය අංශයේ ආයතන රජයේ අරමුදල් ලබන්නන් වේ. සාමාන්‍යයෙන්, ඕනෑම රටක විශාලතම ආයතන අතර ඔවුන් වේ. මෑත කාලවලදී, ලෝකය පුරා එවැනි ආයතනවල අරමුදල් උපයෝගී කිරීම කෙරෙහි අවධානය ඉහළ යාමක් හා යහපාලනය, විනිවිදබව හා වගවීම සඳහා වැඩි යොමුවීමක් පවතී. තවද, වර්තමානයේ වාණිජ ආයතනවල පවා අවධානය මුළුමනින්ම මූල්‍ය කාර්යසාධනය නොවේ. ආයතනවලින් ආර්ථිකය, සමාජය සහ පරිසරය කෙරෙහි වන පුළුල් බලපෑම ගැන එහි පාර්ශ්වකරුවන් සැලකිලිමත් වේ. තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමෙහිලා සංවිධානාත්මක කාර්යභාරය ගෙන හැර දැක්වීම නිසා සමෝධානික වාර්තාකරණය වඩාත් වැදගත් වේ.

රාජ්‍ය අංශයේ ව්‍යාපාර ආයතනවල ප්‍රධාන පාර්ශ්වකරුවන් වන්නේ රජය, රාජ්‍ය ව්‍යවසායන්, සේවකයන්, නියාමන අධිකාරීන්, විශාලතම පෞද්ගලික ව්‍යාපාර ආයතන සිට කුඩාතම පෞද්ගලික ව්‍යාපාර ආයතන සහ පොදු මහජනතාවයි. රාජ්‍ය හිමිකාරිත්වය ඇති ආයතන විසින් එහි පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය පවත්වා ගෙනයාම වඩා වැදගත් වේ. පෞද්ගලික අංශයද මූල්‍ය සේවා හා උපයෝගිතා සපයන්නන් ලෙස කාර්යසාධනය සම්බන්ධයෙන් දැඩි ලෙස සැළකිලිමත් වේ.


ලංකා බැංකුව, ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනය මෙන්ම රටේ වැඩිම ලාභය ලබන තනි ආයතනය ලෙස රටේ ආර්ථිකයට ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. බැංකුව එහි ශාඛා ජාලය හා පුළුල් ගනුදෙනුකාර පදනම සමඟ බිම් මට්ටම දක්වා විහිදී යයි. එම නිසා එහි බලපෑම ලාභයට වඩා වැඩිය. එබැවින් මහජන යහපත සුරැකීම සඳහා බැංකුව සිය පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය තහවුරු කිරීම අත්‍යාවශ්‍ය වේ.

ලංකා බැංකුවේ සමෝධානික වාර්තාවෙන් ආවරණය කෙරෙන මාතෘකා පහත රූපසටහනේ දක්වා ඇත:



ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ රාමුවෙහි නිර්වචනය කර ඇති ප්‍රාග්ධනයන් පහත රූපසටහනේ දැක්වෙන පරිදි වාර්තාවේ ඇතුළත් කර ඇත. කෙසේ වෙතත් සමහර ප්‍රාග්ධනයන් වෙනස් ශීර්ෂයන් යටතේ මෙම වාර්තාව තුළ විස්තර කර ඇත.





මෙම වාර්තාව සකස් කිරීමේදී පහත සඳහන් අදාළ දේ පිළිබඳව අප අවධානය යොමුකර ඇත. ගෝලීය වාර්තාකරණ තිරසාර මාර්ගෝපදේශ, පෙර අනුගමනය කරන GRI ප්‍රමිත (2018 ජූලි) (www.globalreporting.org), ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ රාමුව (2013) (www.theiirc.org) සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික සාමෝධානික වාර්තාකරණය පිළිබඳ මාර්ගෝපදේශනය.

මෙම වාර්තාවේ ශ්‍රී ලංකාව, ඉන්දියාව, මාලදිවයින, සීෂෙල්ස් සහ එක්සත් රාජධානිය යනාදී රටවල පිහිටි ශාඛා කාර්යාල හා පරිපාලිතයින් ආවරණය කරමින් සමස්ථ සමූහයේ කාර්යඵලය හා මෙහෙයුම් විස්තරාත්මකව දක්වා ඇති අතර, තොරතුරුවලින් බහුතරය ලංකා බැංකුව හා සම්බන්ධ වේ. ඒ හිමිකාර ආයතනය ලෙස, සමූහයේ ගනුදෙනුවලින් සහ ලාභයෙන් වැඩි ප්‍රමාණයකට දායකවන්නේ ලංකා බැංකුව බැවිනි.

ප්‍රමාණාත්මක හෝ වැදගත් කරුණු පිළිබඳව අවදානය යොමු කරන අතර, කෙටි, මධ්‍ය හා දිගුකාලීන අගයන් බිහිකිරීමට බැංකුවට ඇති හැකියාව සඳහා හරයාත්මක බලපෑම මෙහිදී සලකා බලනු ලැබේ. ප්‍රමාණාත්මක බව නිර්ණය කිරීමේ ක්‍රියාවලිය පිටු අංක 350 සිට 351 දක්වා සාකච්ඡා කෙරේ.


2017 වර්ෂයේ බැංකුවේ වාර්ෂික වාර්තාව 2017 ජනවාරි 01 වෙනි දින සිට 2017 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් මාස 12 ක කාලපරිච්ඡේදය ආවරණය කරනු ලබන අතර, එය පෙර වර්ෂවල මූල්‍ය හා සමෝධානික වාර්තාකරණයෙන් ආවරණය කරනු ලැබූ සාමාන්‍ය වාර්ෂික වාර්තාකරණ ක්‍රියාවලියේ කාලපරිච්ඡේද හා අනුගත වේ. ආසන්නතම පෙර වර්ෂයේ වාර්ෂික වාර්තාව වන්නේ 2016 දෙසැම්බර් 31 දිනැති වාර්තාව වේ.

ප්‍රමාණාත්මකභාවය හා හිමිකාරත්වය පිළිබඳ සැලකිය යුතු මට්ටමේ වෙනසක් මෙම වාර්තාකරණ කාලපරිච්ඡේදයේ දී සිදු වී නොමැත.

බැංකුව සමාජ හා පාරිසරික තිරසාරභාවය සම්බන්ධයෙන් පූර්ව ආරක්ෂිත ක්‍රියාමාර්ග සමූහය වෙනුවෙන්ම අනුගමනය කෙරේ. නව ව්‍යාපාර හා අත්හදා බැලීම් ක්‍රියාත්මක කිරීමට පෙර, එහි විභව බලපෑම ගණනය කිරීම සඳහා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය මඟින් අප අවශ්‍ය පියවර ගනු ලබන අතර, ඒ පිළිබඳ පිටු අංක 80 සිට 92 දක්වා සාකච්ඡා කරනු ලැබේ.

පෙර වාර්තාවල සපයා ඇති තොරතුරු සඳහා කිසිදු ගැලපීමක් සිදුවී නොමැත. පෙර කාලපරිච්ඡේදයන්හි විෂය පථය හා සම්බන්ධ අංශවල ද සැලකිය යුතු වෙනස්කම් සිදු වී නොමැත.





තිරසාර පැවැත්ම

12 — ස්වයං ප්‍රතිනිර්මාණය

12 — සභාපතිතුමාගේ පණිවිඩය

16 — විශ්‍රාම යන මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය

20 — මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය


23 — අපගේ පරිසරය හා අපගේ ක්‍රියාවලිය

23 — ආර්ථික දෘෂ්ඨිය

28 — ව්‍යාපාර ආකෘතිය

32 — තිරසාර පැවැත්ම සඳහා අපගේ කැපවීම

ස්වයං ප්‍රතිනිර්මාණය
සභාපතිතුමාගේ පණිවිඩය



අද අපි නව්‍යකරණය වූ ලෝකයකට පියවර නගමින් සිටින අතර, පැවති බැංකුකරණ පරිසරය වෙනසකට පරිවර්තනය වෙමින් සහ පාරිභෝගික පදනම විකාශනය වෙමින් පවතී. අපි නව සහස්‍රයේ පරපුර වෙත සේවය සලසමින් සිටින අතර තුර අපිට උරුම පාරිභෝගික පදනම අමතක නොකරමු. අප නව යුගයකට පියවර තබන්නේ අපගේ සේවාවන් නව පරිසරයට ගැලපෙන පරිදි නිසිලෙස ප්‍රති ව්‍යුහගත කරමින්ය.

උපාය මාර්ගය හා 2018 සහ ඉන් ඔබ්බට දිශා ගතවීම

2018 වසර එළඹීමත් සමඟ බැංකුව එහි 78 වසරක ගමන තුළ ඊළඟ පියවරට පිය නගන්නේ නව දැක්ම, මෙහෙවර ප්‍රකාශනය, වටිනාකම් ප්‍රකාශනය සහ උද්යෝග පාඨය ඔස්සේ නවමු මුහුණුවරකින් දිශා ගත වෙමින්ය. විකාශනය වන අන්තර්ජාතික, ජාතික හා තාක්ෂණික සන්දර්භය තුළ මෙම වෙනස්කම් කර තිබේ. තාක්ෂණික වෙනස්කම්වල ඉදිරියෙන් සිටීමත්, අතිශයින්ම තරඟකාරී කර්මාන්තයක් තුළ නවීකරණය වීමත්, පාරිභෝගික සේවා සැලසීම වෙත කේන්ද්‍රගත වීමත්, සේවකයින් බල ගැන්වීමත් මෙයින් විදහා දැක්වේ. 2018 - 2020 කාල සීමාව සඳහා නව ආයතනික සැලැස්මක් සකස් කර දියත් කර තිබෙන අතර එය "බැංකුව අනාගතය සඳහා ප්‍රතිනිර්මාණය සහ බලගැන්වීම" යන තේමාව යටතේ ප්‍රධාන අංශ නවයක් මත ක්‍රියාත්මක කරනු ලැබේ.

වෙනස්වන පරිසරය තුළ අපගේ විවිධ වූ පාරිභෝගික පදනමට සේවා සැපයීම

අප නවීන තාක්ෂණය පිරුණු ලොවකට පියවර නගමින් සිටින අතර මෙම වෙනස තුළ ඉදිරියෙන්ම සිටින්නේ බැංකු කර්මාන්තයයි. බැංකු කර්මාන්තයේ ස්වභාවය වන්නේ නව තාක්ෂණය බැංකුවේ පසු පෙළ කාර්යාල සඳහා පමණක් සීමා නොවී, සෘජු පාරිභෝගික සේවා සැපයීමට දායක වීමයි. සංවර්ධනය සමඟ උරෙනුර ගැටී පවත්වා ගෙන යාමටත්, මෙම නව පරිසරය සමඟ සේවකයින්ට සුවපහසු ලෙස කටයුතු කිරීමටත් වගකීමක් මෙයින් සැලසෙනු ඇත. මෙම දැඩි තරඟකාරී හා සිඝ්‍රයෙන් වෙනස් වන වෙළඳ වටපිටාව තුළ අංක එකේ බැංකුව ලෙස අපගේ තත්ත්වය පවත්වා ගැනීම සඳහා තාක්ෂණය භාවිතා කළ යුතුය. මිලියන 13 ක අපගේ පාරිභෝගික පදනම, අපගේ පැතිරුණු ශාඛා ජාලය සහ අතිශයින්ම නව තාක්ෂණික දැනුමින් හෙබි සහස්‍රයේ පරපුර යන කරුණු ගැන සැලකීමේ දී මෙය වඩා වැදගත් වේ. අපගේ ශ්‍රම බලකායෙන් භාගයකට වඩා අවුරුදු 35 කට වඩා අඩු ඩිජිටල් යුගය තුළ හැදී වැඩුණ අය නිසා මෙම ඉල්ලුම සපුරා ගනිමින් එක්තරා ඉමකට බැංකුව පැමිණ සිටී. කෙසේ වුවද, මෙහි තවත් පැතිකඩක් ද තිබේ. පාරම්පරික බැංකු කටයුතු සමඟ බැඳුණු බොහෝ පාරිභෝගිකයින් සිටීම අපගේ දිගුකාලීන ඉතිහාසය සැලකීමේ දී අපට අමතක කළ නොහැකි කරුණක් වේ. මෙම සේවාදායක පිරිස තවමත් බැංකුවේදී මුහුණට මුහුණ මුණ ගැසීමට හා භෞතික ලෙස බැංකු පාස් පොතක් තිබීමෙන් ලැබෙන ආරක්ෂාව සම්බන්ධයෙන් දැඩි කැමැත්තකින් පසුවෙති. කණ්ඩායම් දෙකෙහිම අවශ්‍යතා තුලනය කරමින් ප්‍රශස්ත මට්ටමින් සේවා සැපයීමට අප වගබලා ගත යුතුව ඇත.

ජාතික මෙහෙවර සඳහා අපගේ බැඳියාව

ලංකා බැංකුව වාණිජ ව්‍යාපාරයක් පමණක් නොවන අතර, එය සමාජ ව්‍යාපාරයක් ද වේ. අපගේ නිෂ්පාදන හා සේවා සංවර්ධනය කිරීමේදී, අපගේ සේවාදායකයින්ගේ විවිධත්වය සම්බන්ධයෙන් අපි දැනුවත් විය යුතු අතර, සුවලභ්‍යතාව හා නවීකරණය ප්‍රධාන ආයතනික අවශ්‍යතාවයන්ගෙන් එකක් ලෙස සැලකේ. එම නිසා ප්‍රමාණය, ණය වර්ගය හා ඉලක්ක පාරිභෝගික කණ්ඩායම අනුව අතිශයින්ම විවිධ වූ ණය කළඹක් අප සතුව ඇත. කුඩා ව්‍යවසායකයින් හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක කණ්ඩායම් අරමුණු කරගත් "අත්වැල" වැනි සහනදායී පොළී සහිත ණය යෝජනා ක්‍රම ගණනාවක් අප සතුව ඇත. මෙම ණය උපකරණ මගින් රජයේ අරමුණු සපුරා ගැනීමටත්, දුප්පත්කම අවසන් කිරීමේ ප්‍රධාන තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමටත් අපි දායක වන්නෙමු.

යහපාලනය

මිලියන 13 කට වඩා වැඩි අපගේ පාරිභෝගිකයින්ගේ අරමුදල්වල භාරකරු වශයෙන් අපගේ මෙහෙයුම්වලදී විචක්ෂණශීලි, ආචාරධර්ම වලින් හෙබි හා විනිවිදභාවයකින් යුතු වීමට අපට වගකීමක් තිබේ. අපගේ පාරිභෝගිකයින් සඳහා පමණක් නොව අපගේ පාර්ශ්වකරුවන්ට ද අපගේ වගකීම් ඉටු කරන බව සහතික කිරීම සඳහා යෝග්‍යතම යහපාලන ව්‍යූහයක් අප සතුව ඇත. අපගේ යහපාලන පිළිවෙත් උසස් ප්‍රමිතියෙන් යුතු හොඳම භාවිතයන් ආධාරයෙන් ගොඩනංවා ඇත. අපගේ සියලුම පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වන අන්තර් ක්‍රියාවන් සහ මෙහෙයුම් එමඟින් ආවරණය වන අතර, සියලුම නීති හා රෙගුලාසි සමඟ අනුකූල වන බව ද සහතික කෙරේ. බාසල් III අවශ්‍යතා ක්‍රියාත්මක වීමත් සමඟ පද්ධතිමය වශයෙන් වැදගත් වන බැංකු තත්ත්වය ලංකා බැංකුවට ප්‍රදානය කර ඇත (D - SIB).

අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරන අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු හා මහා කළමනාකරුට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් එක් අයෙකුට වාර්තා කරනු ලබන කළමනාකරණ උප කමිටුවලින් සමන්විත කමිටු පද්ධතියක් අපගේ යහපාලන ව්‍යූහයට සහයෝගය දක්වනු ලැබේ. මෙහෙයුම් අවදානම් කළමනාකරණය, ණය, මානව සම්පත් ප්‍රතිපත්තිය, වත්කම් හා වගකීම් කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර අඛණ්ඩතා කළමනාකරණය ආදිය ද කමිටුවල විෂයන්ට ඇතුළත් වේ. කමිටුවල විෂය ක්ෂේත්‍රය ඉතා පැහැදිලිව සකස් කර ඇත. කමිටු සාමූහික වශයෙන් තීරණ ගන්නා අතර, අධිකාරිය සහ වගකීම තනි පුද්ගලයින් මත රඳා පවතී. අපගේ ශේෂ පත්‍රයේ ප්‍රබලත්වයට කිසිම බලපෑමක් නොමැතිව 2017 වසර තුළ ගෙවීමට නියමිත වූ ඇමෙරිකන් ඩොලර් මිලියන 500 ක ණයකරය ගෙවා දැමීමෙන් පිළිබිඹු වන්නේ අපගේ විචක්ෂණශීලි අරමුදල් කළමනාකරණය කිරීමයි. 2018 වසර තුළ දෙවන ඇමෙරිකන් ඩොලර් මිලියන 500 ක ණයකරය ගෙවා දැමීම සඳහා අපි සූදානම්ව සිටින්නෙමු.

පුහුණු කිරීම

අපගේ සේවක ප්‍රජාව අපගේ මූලික වත්කමක් මෙන්ම ඔවුන්ගේ භූමිකා තුළ විශිෂ්ටයෙක් වීමට අවශ්‍ය දැනුම, දක්ෂතා හා අභියෝගයන් ඔවුන් තුළ ජනිත කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් අපි සැමවිටම දැනුවත්ව සිටින්නෙමු. අපගේ කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම අපි සුලුපටු වශයෙන් නොසලකනු ඇත. අපගේ මානව සම්පත් සංවර්ධන වැඩ සටහන් අපගේ ආයතනික උපායමාර්ගය සමඟ සමීපව බැඳී පවතී. අපගේ ආයතනික සැලැස්ම මත පදනම් වූ පුහුණු කිරීම් සැලැස්මක් අප සතුවන අතර, පුහුණු කිරීමේ විශේෂ තොරතුරු ඇතුළත් ලේඛන වාර්ෂිකව සංශෝධනය කරනු ලැබේ. අමතර අවශ්‍යතා හඳුනා ගන්නා විට සුදුසු වැඩසටහනක් සම්පාදනය කොට පවත්වන බවට අපි සහතික වන්නෙමු. බැංකුව තුළම පවත්වාගෙන යන පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් අප සතුව පවතින අතර ශ්‍රී ලංකාවේ හා විදේශීය රටවල ඇති බාහිර ආයතන වලදී ද පුහුණුව ලබාදෙනු ලැබේ.

අපගේ වෙළඳ කටයුතුවල තිරසාර පිය සටහන්

තිරසාර පැවැත්ම උදෙසා අපි කැපවී සිටින අතර, අප බැංකුවේ තිරසාර වර්ධනයක් සඳහා පමණක් නොව මුළු ජාතියේම තිරසාර වර්ධනයක් සාක්ෂාත් කර ගැනීම ප්‍රාර්ථනා කරන්නෙමු. අපි ආර්ථික වශයෙන් පමණක් නොව සාකල්‍ය ලෙස ප්‍රජාවගේ යහපත වැඩි දියුණු කරන්නෙමු. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය මගින් 2015 දී ප්‍රසිද්ධ කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක 17 බැංකුව පිළිගෙන ඇති අතර, මෙම තිරසාර සංවර්ධන ඉලක්ක බැංකුවේ ආයතනික උපාය මාර්ග තුළට අන්තර්ගත කර ඇත.

බැංකුව එහි උපායමාර්ග වලින් එකක් ලෙස හරිත බැංකුකරණය භාවිතා කරයි. මූල්‍ය අතරමැදියෙක් ලෙස අපගේ භූමිකාව මගින් පරිසර හිතකාමී තිරසාර ආයෝජන සඳහා අනුග්‍රහ දැක්වීමට අපට හැකියාව තිබේ. කඩදාසි මත පදනම් වූ ක්‍රියාවලියක සිට ඩිජිටල්කරණය දක්වා පරිවර්තනය වීමක් සමඟ කාබන් විමෝචනය ඇතුළු අපද්‍රව්‍ය අවම කර ගැනීමට අපට හැකි වී ඇත. අපි අපගේ නිෂ්පාදන, අනාගත සමාජයීය, ආර්ථික හා පාරිසරික භූමිකාවන් සුදුසු ලෙස වෙනස් කරමින් සංවර්ධනය කරන නිසා බැංකුවේ උපායමාර්ග තුළට තිරසාර පැවැත්ම පිළිබඳ සංකල්පය ඇතුළත් කර ඇත.

නව නියාමන වෙනස්කම් හා අභියෝගාත්මක ප්‍රාග්ධන අවශ්‍යතා

දශකයකට පෙර වූ මූල්‍ය අර්බුදයේ බලපෑම හේතුවෙන් සිදුවී ඇති ප්‍රතිවිපාක මුළු බැංකු ක්ෂේත්‍රය තුළම ආන්දෝලනයක් ඇති කර තිබෙන අතර එය හේතු කොට ගෙන නියාමන වෙනස්කම් සිදුවී ඇත. 2018 සිට නව බාසල් III හා ශ්‍රී.ලං.ගි.වා.ප්‍ර. 9 ක්‍රියාත්මක වීමට නියමිතය. පසුගිය වසර කිහිපය පුරාම මෙම වෙනස්කම් සඳහා සූදානම් වීමට අවශ්‍ය මූලික කටයුතු යෙදීමට අපට සිදුවිය. වැඩි වූ ප්‍රාග්ධන අවශ්‍යතා අප වෙත අතිශයින්ම අභියෝගාත්මක තත්ත්වයක් නිර්මාණය කර තිබෙන අතර, මෙම තත්ත්වය විසඳීම සඳහා බැංකුවට ඇති සෑම විකල්පයක්ම පරීක්ෂා කරමින් මෙම වෙනස්කම්වලට මුහුණ දීම සඳහා එහි හැකියාවන් වර්ධනය කර තිබේ.

ඇගයීම

මගේ සහෘද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විසින් මා වෙත දැක් වූ සහයෝගිතාව හා බැංකුවට උපායමාර්ගික උපදෙස් ලබාදෙමින් ඔවුන් ප්‍රදර්ශනය කළ වෘත්තීය දක්ෂතාව සම්බන්ධයෙන් මගේ ඇගයීම මා මෙහි සටහන් කළ යුතුය. 2018 පෙබරවාරි මාසයේදී සේවයෙන් විශ්‍රාම ගිය මහා කළමනාකාර ඩී.එම්. ගුණසේකර මහතාට ඔහුගේ කැපවීම හා සහයෝගිතාව සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වෙමි. ඔහුගේ දිගුකාලීන සේවා කාලය පුරාම කැපවීමෙන් බැංකුවට සේවය කර තිබෙන අතර ඔහුගේ අනාගත සෑම උත්සාහයක්ම සාර්ථක වන්නට සුභ ප්‍රාර්ථනා කරමි. බැංකුව තුළ අවුරුදු 28 ක කීර්තිමත් වෘත්තියකින් පසු මහා කළමනාකාර තනතුරට පත්වූ නව මහා කළමනාකාර සෙනරත් බණ්ඩාර මහතා හෘදයාංගමව නව තනතුරට පිළිගන්නේ අනාගත කටයුතු උදෙසා සුභ ප්‍රාර්ථනා කරමින්ය. සිය රාජකාරී ඉටු කිරීමේදී සුලුපටු නොවූ කැපවීමක් ආයතනික කළමනාකාර කණ්ඩායමේ සාමාජිකයින්ද පෙන්වා තිබෙන අතර, ඒ සම්බන්ධයෙන් මගේ කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි. අපගේ ප්‍රධාන කොටස්කරු වන ශ්‍රී ලංකා රජයේ සහයෝගය බැංකුවේ දියුණුවට නොමඳ සහයෝගයක් වී ඇත. ඔවුන්ගේ උපදෙස් හා මඟපෙන්වීම සම්බන්ධයෙන් ගරු මුදල් අමාත්‍යතුමාටත්, ගරු රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාටත්, එම අමාත්‍යාංශවල කාර්ය මණ්ඩලවලටත් මාගේ ගෞරව ස්තුතිය හිමිවේ.

බැංකුවේ භාරකාරත්වය මත පදනම්ව ඔවුන්ගේ උපදෙස් සම්බන්ධයෙන් මහ බැංකු අධිපතිතුමා සහ මහ බැංකුවේ කාර්ය මණ්ඩලයත්, මෙම වාර්තාවේ ඇතුළත් කර ඇති මූල්‍ය ප්‍රකාශන මත පදනම්ව මත පළකිරීම සම්බන්ධයෙන් විගණකාධිපතිතුමා ඇතුළු ඔහුගේ කාර්ය මණ්ඩලයත් ඉටු කරන භූමිකාව සම්බන්ධයෙන් මා ස්තුති කළ යුතුය.

අපගේ ආයතනයේ පිට රුධිරය අපගේ පාරිභෝගිකයින් වන අතර ඔවුන්ගේ නොසැලෙන පක්ෂපාතිත්වය නොවන්නට අපගේ ගමන තුළ මේ දක්වා දුරක් යාමට අපට නොහැකි වන්නට තිබුණි. තවද වෘත්තීය සමිති විසින් අප වෙත දක්වන ලද මිත්‍රශීලී සහයෝගිතාව සම්බන්ධයෙන් මම කෘතඥ වෙමි. අපගේ කාර්ය මණ්ඩලයේ කැපවීම හා බැඳීම සහ බැංකුවට ඔවුන් ලබා දුන් සේවය මත බැංකුව මෙතරම් වර්ධනයක් විඳහා දක්වා ඇති අතර එය මම කිසිදා අමතක නොකරන අමිල මෙහෙවරකි.

වසර 78 ක් පුරා එහි ගමන තුළ බැංකුව දිගු දුරක් ගොස් තිබේ. එහිදී බොහෝ දුෂ්කර අවස්ථාවලට මුහුණ දී තිබෙන අතර, ඒවාට ඔරොත්තු දීමේ හැකියාව ඔප්පු කර තිබේ.

අපට හිමි ශක්තීන් සහ සම්පත් මත, මුහුණ දෙන ඕනෑම අභියෝගයක් ජය ගැනීමට අපට හැකි බව සහ අනාගතයේදී රටේ ආර්ථිකය තුළ සහ ජන ජීවිතය තුළ මීට වඩා විශාල භූමිකාවක් ඉටු කරමින් ඉදිරියට ගමන් කිරීමට හැකි බව මම විශ්වාස කරමි.



ජනාධිපති නීතිඥ රොනල්ඩ් සී පෙරේරා
සභාපති

2018 මාර්තු 27 දින
කොළඹදී ය.


ABC

විශ්‍රාම යන මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය



බ්‍රෑන්ඩ් ෆයිනෑන්ස් ශ්‍රී ලංකා ආයතනය විසින් අංක එකේ සන්නාමය ලෙස අපි නැවත වරක් පිළිගෙන ඇති බව දැනුම් දෙන්නේ ඉතාම ආඩම්බරයෙනි. පිට පිටම නවවැනි වසරටත් මෙම ගෞරවය අප වෙත පිරිනැමීම අසමසම ජයග්‍රහණයකි. අපගේ සන්නාමය රු. බිලියන 40 කට අධික වටිනාකමකට අගය කර ඇත.

අපගේ ව්‍යාපාර පැතිකඩ

රාජ්‍ය හෝ පුද්ගලික වශයෙන් සලකා බැලීමේදී 2017 වසර තුළ බදුවලට පෙර ලාභය රු. බිලියන 30.3 ඉක්මවමින්, ශ්‍රී ලංකාවේ තනි ආයතනයක් ඉපයූ ඉහළම ලාභය වාර්තා කර ඇත්තේ ලංකා බැංකුව වේ. 2016 වසර තුළ ඉපයූ අති විශේෂ ලාභය බදු පෙර ලාභයට ගැළපූ පසු 8% ක වර්ධනයක් බැංකුව වාර්තා කර ඇත. රු. ට්‍රිලියන 1.5 දක්වා ලඟා වෙමින් බැංකුවේ තැන්පතු පදනම 23% ක වර්ධනයක් වාර්තා කර ඇත. වසර කීපයක් පුරා රට තුළ තනි ආයතනයක් සතු වැඩිම වත්කම් උසුලන ආයතනය වන්නේ ලංකා බැංකුවයි. ණය සහ අත්තිකාරම් 16% කින් වර්ධනය කර ගනිමින් රු. ට්‍රිලියන 1.2 කට ලඟා වීම මගින් මෙම තත්ත්වය තවදුරටත් ශක්තිමත් වී තිබේ. වසර තුළ වත්කම් 17% කින් වර්ධනය වී තිබේ. 2016 වසර තුළ වත්කම්, තැන්පතු සහ ණය ලෙස ත්‍රිත්ව ට්‍රිලියනයක් අප සාක්ෂාත් කර ගැනීම ඉතා වැදගත් සිද්ධියකි. අපට ආසන්නයේම ඇති තවත් සංධිස්ථානයක් වන්නේ අපගේ වත්කම් පදනම රු. ට්‍රිලියන 2 ක් දක්වා වර්ධනය කර ගැනීමයි. මෙය 2018 වසර තුළ සාක්ෂාත් කර ගැනීමට අපි බලාපොරොත්තු වෙමු.

අපගේ බැංකුවේ විදේශීය ජාලය විදේශ ශාඛා තුනකින් හා එක්සත් රාජධානියේ පරිපාලිත සමාගමකින් සමන්විත වේ. ඊට අමතරව, ලෝකය පුරා 700 කට වඩා ඇති නියෝජිත බැංකු සමඟ අප සම්බන්ධ වී ඇත. ශ්‍රී ලංකාව තුළට එන මුළු ආමුඛ ප්‍රේෂණ වලින් 46% ක කොටසක් ලංකා බැංකුව හරහා හුවමාරු වේ. රටේ ගෙවුම් තුලනය පවත්වා ගෙන යන අපගේ විදේශ ශ්‍රමිකයින්ට ලබාදෙන සේවය සම්බන්ධයෙන් අපට විශාල ආධිපත්‍යයක් ඇත. ප්‍රේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා විදේශීය රටවල විවිධ ස්ථානවල ස්ථාන ගත කළ නියෝජිතයින් අපට සිටී. 2018 වසර තුළ එම නියෝජිතයින් සංඛ්‍යාව 100 දක්වා වැඩි කිරීමට සැලසුම් කර තිබේ.

සන්නාමය සහ ජයග්‍රහණයන්

බැංකුවේ සන්නම් තානාපති ලෙස, මාගේ නිල කාලය පුරාම මා විශේෂ සැලකිල්ලක් දක්වා තිබෙන්නේ සන්නම් ප්‍රතිරූපයට හා සන්නම් වටිනාකම කෙරෙහිය. බ්‍රෑන්ඩ් ෆයිනෑන්ස් ශ්‍රී ලංකා ආයතනය මගින් අංක එකේ සන්නාමය ලෙස අප නැවත වතාවක් පිළිගැනීම මා දැනුම් දෙන්නේ විශාල ආධිපත්‍යයක් සමගිනි. පිට පිට නමවැනි වරටත් මෙම ගෞරවය අපට ලැබුණ අතර, එය අසම සම ජයග්‍රහණයකි. රු. බිලියන 40 කට වඩා අධික වටිනාකමකට අපගේ සන්නාමය අගය කර ඇත. මෙය පරිසරය තුළ අනේක විධ කැලැඹීම් හා වෙනස්කම් තිබියදී වුවද අප ස්ථාවරය රැක ගැනීමට අප සතු ශක්තිය උදෙසා ලද උපහාරයකි. මීට අමතරව පළමු ඉන්ටර් බ්‍රෑන්ඩ් හොඳම ශ්‍රී ලාංකික වෙළඳනාම සම්මේලනයේදී ලංකා බැංකුවට ශ්‍රී ලංකාවේ අංක එකේ සන්නාමයට හිමි සම්මානය පිරිනමන ලදී. මෙම ඇගයීම මගින් සන්නාමයේ මූල්‍ය කාර්යසාධනය පමණක් නොව, පාරිභෝගිකයා විසින් සන්නාමයට දී ඇති පිළිගැනීමද මනාව පිළිබිඹුවේ. මෙම ගෞරව නාමවලින් පැහැදිලිවම තහවුරු වන්නේ, ලංකා බැංකුව සැමතැන නිරතුරුව කියවෙන නමක් බවට පත්වී ඇති බව හා සියලු ගණයට අයත් ශ්‍රී ලාංකිකයින්ට ඔවුන්ගේ ප්‍රාර්ථනා සැබෑ කර ගැනීමට අප විසින් ලබා දී තිබෙන දායකත්වයයි.

මෙම සියලුම ජයග්‍රහණ අප සාක්ෂාත් කරගෙන ඇත්තේ මූල්‍ය ප්‍රතිලාභ ගැන පමණක් සිත යොමුකර නොවන අතර, අපගේ සමාජ වගකීම්ද නොකඩවා පවත්වා ගෙන යමින් වීම විශේෂත්වයකි. වෙළඳ වාසිවල ප්‍රමාණවත් බව නොසලකමින් ක්ෂුද්‍ර ව්‍යවසායකයින්, කාන්තා ව්‍යවසායකයින්, ගොවීන්, ධීවරයින්, තරුණ තරුණියන් හා නිවාස ඉදිකරන්නන් ආදී විවිධ පාරිභෝගික අංශ වෙත අපි සේවය සලසන්නෙමු. කෙසේ වුවද, රටේ සංවර්ධනයට හා මූල්‍ය, සමාජ, හා පාරිසරික කාර්ය සාධනය යන ත්‍රිත්වය සඳහා අපගේ කැපවීම හේතුකොට ගෙන එවැනි සේවාදායක පිරිස් වෙත අපි අරමුදල් සපයන්නෙමු. අනිකුත් බැංකු හා සැසඳීමේදී අපගේ ශුද්ධ පොළී ආන්තිකය වඩා අවම අතර, එයින් පිළිබිඹු වන්නේ අපගේ තැන්පතුකරුවන්ට ඉහළ පොළී අනුපාත ගෙවීමේ හා ණය හා අත්තිකාරම් සඳහා අඩු පොළී අය කිරීමේ අපගේ පුරුද්දයි. අපගේ උපාය මාර්ග තුළ හරිත බැංකුකරණය, තිරසාර පැවැත්ම පිළිබඳ සංකල්ප, එස් පහ සංකල්පය, සහ දේශගුණික විපර්යාස පිළිබඳ සැළකිල්ල යනාදිය ඇතුළත් කර ඇත. අප දිනාගෙන ඇති විවිධ සම්මාන අපගේ සමාජ ආචාර ධර්ම සඳහා කරන ලද ගෞරවයකි.

මෙහෙයුම් පරිසරය හා නියාමනයන්

බාසල් III හා ශ්‍රී ලං.ගි.වා.ප්‍ර. 9 සඳහා අනුගත වීමත් සමග, අපගේ ව්‍යාපාරික හා සමාජ භූමිකා තුළ ක්‍රියාත්මක වීම සහ තරඟකාරීව රැඳී සිටීම අප මුහුණපාන නව අභියෝග වේ. කෙසේ වුවද, අප සතුව පවතින ශක්තීන් සමඟ අප වටා ඇති පරිසරය සමඟ මුසුවෙමින් ලැබෙන අවස්ථාවලින් නිසි ප්‍රයෝජන ලබා ගන්නේ නම් අභියෝග ජය ගැනීමට හැකිබව අපගේ විශ්වාසයයි.

දේශීය හා විදේශීය මෙහෙයවීම් වලදී බොහෝ ක්ෂේත්‍රවල වේගයෙන් වෙනස්වන සංවර්ධනයට බැංකුවටද මුහුණ දීමට සිදුවේ. ආර්ථික, සමාජීය, තාක්ෂණික නියාමන හා පාරිසරික වෙනස්කම් මීට ඇතුළත් වේ. මෙම අභියෝග මධ්‍යයේ බැංකුව ඉදිරියට පවත්වාගෙන යන අතරතුර රාජ්‍ය බැංකුවක් හා රටේ ප්‍රමුඛතම බැංකුව වශයෙන් අපගේ සමාජ වගකීම් ඉටු කිරීමද අප වෙත පැවරේ.

මහ බැංකුවේ සහ අනිකුත් නියාමන අධිකාරිවල නීති හා රෙගුලාසි සමඟ බැංකුව නිසියාකාරව අනුකූල වනු ඇත. මුදල් විශුද්ධිකරණය වැලැක්වීම, වත්කම් හා බැරකම් කළමනාකරණය හා විදේශ විනිමය ගනුදෙනු වැනි කරුණු ආශ්‍රිතව සිදු වන අන්තර් ජාතික වර්ධනයන් හේතුවෙන් අප වෙත නව ඉල්ලීම් නිරන්තරයෙන් ලැබෙමින් පවතී. අප ද අන්තර්ජාතික වශයෙන් සම්බන්ධිත බැංකුවක් වන නිසා අපගේ ජාත්‍යන්තරව සම්බන්ධිත පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සමඟ අනුකූල වීම සඳහා බැඳී සිටී.

මෙම වසර තුළදී ප්‍රධාන නියාමන වෙනස්කම් හඳුන්වාදීම ප්‍රධාන වශයෙන් සිදු විය. 2017 ජූලි මස පළමුවැනිදා සිට බාසල් III ක්‍රියාත්මක වූ අතර, එය 2019 ජනවාරි වන විට සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට නියමිතය. ශ්‍රී ලං.ගි.වා.ප්‍ර. 9, 2018 වසර තුළ ක්‍රියාත්මක වීමට නියමිතය. ප්‍රාග්ධන හා ද්‍රවශීලතා අවශ්‍යතා වැඩිකරමින් හා දැඩි මූල්‍ය සුරක්ෂණය මගින් වත්කම්වල ගුණාත්මක භාවය වැඩි දියුණු කරමින් ලෝකය පුරා බැංකු පද්ධතියේ ස්ථාවරත්වය ඉහළ දැමීම මෙම නව නියාමනයන්ගේ අරමුණු වේ. පසුගිය වසර තුළ අපගේ මෙහෙයුම් හා ක්‍රියා පටිපාටිය සුසර කිරීමට සිදුවූයේ ඒ මගින් ඇති වන බලපෑම් කෙරේ අවධානය යොදවමින්ය. විශේෂයෙන්ම වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් විශේෂ සැළකිල්ලක් යොදවන ලදී.

වත්කම් කළමනාකරණය

ඉහතින් සඳහන් කළ නව අවශ්‍යතා විසඳීම සඳහා අපගේ ප්‍රාග්ධනය ගොඩනැගීමත් එය ඉහළම මට්ටමින් භාවිතා කිරීමත් ප්‍රමුඛතම කාරණයකි. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා අපගේ වත්කම් නියම ලෙස කළමනාකරණය කිරීම අවශ්‍ය වන අතර, මේ හා සම්බන්ධ ප්‍රධාන කරුණු ත්‍රිත්වයක් වේ. අපගේ භෞතික යටිතල ව්‍යුහය පළමුවැන්න වේ. අපගේ ශාඛා වලින් බොහොමයකට නව්‍ය මුහුණුවරක් අප ලබාදී ඇත. ගතානුගතික ක්‍රමයෙන් බැහැරව ඩිජිටල් බැංකුකරණය දක්වා බැංකු මොඩලය වෙනස් වෙමින් පවතී. එයින් වඩාත් වැදගත් බවට පත් වී ඇත්තේ ඩිජිටල් මාදිලියේ අති නවීනතම තාක්ෂණය දෙසට අපව රැගෙන යාම සඳහා අපගේ තාක්ෂණික දෘඩාංග වැඩි දියුණු කිරීමයි. මෙය සිදුකිරීම සඳහා හුදු කෙටිකාලීන අවශ්‍යතා ගැන පමණක් නොසිතා ඉදිරි අවුරුදු 10-15 කින් ඔබ්බට අප සිතිය යුතුය.

උප සහරානු අප්‍රිකාව වැනි සාපේක්ෂව නොදියුණු කලාපයන්හි පවා ගෝලීය වශයෙන් ඩිජිටල්කරණය ඉතා වේගයෙන් දියුණු වෙමින් පවතී. වයස්ගත පරම්පරාවට අයත් ගනුදෙනුකාර ප්‍රජාවන් පවා ඩිජිටල්කරණයට පිය නගිමින් සිටින අතර ඔවුන් අන්තර්ජාල හා ජංගම බැංකු ක්‍රම මගින් ගනුදෙනු කරගෙන යනු ලැබේ. අපගේ 2018-2020 ආයතනික සැලැස්ම මෙම වෙනස්කම් සිත්හි දරාගෙන පිළියෙල කර තිබේ. 2017 වසර තුළ බැංකුව නව තාක්ෂණය සඳහා මූලික වශයෙන් ආයෝජන කරන ලදී. ATM හා CDM මගින් අපගේ පාරිභෝගික සේවා අපි පුළුල් කර ඇති අතර අන්තර්ජාල හා ජංගම බැංකු කටයුතු සඳහා ඇති පහසුකම් පුළුල් කරන ලදී. මෙය සිදු කිරීම සඳහා අපගේ දෘඩාංග, මෘදුකාංග හා ජාලයන් වැඩි දියුණු කිරීම අත්‍යාවශ්‍ය විය.

2017 වසර තුළ අපගේ වෙළඳ ක්‍රියාවලිය නැවත මෘදුකාංග මගින් සංවර්ධනය කිරීම නිසා බොහෝ ක්‍රියාවලින් ස්වයංක්‍රීය වී තිබේ. මේ මගින් නව චෙක් පොත්, ණය ඉල්ලුම් පත්‍ර හා ස්ථාවර නියෝග වැනි සේවා සඳහා පාරිභෝගිකයන් භෞතිකව බැංකුවට පැමිණීමට ඇති අවශ්‍යතාවය ඉවත් කර ඇත. අපගේ මෙහෙයුම් වල සඵලත්වය හා කාර්යක්ෂමතාවය මෙමගින් වැඩිවී තිබේ. 2017 වසර තුළ "B app" ලෙස හඳුන්වන අපගේ නව යෙදුම දියත් කරන ලදී. වසර තුළ සිදුවූ අනිකුත් මං සළකුණ වනුයේ "ස්මාර්ට් පාස්බුක්" යෙදුම දියත් කිරීමයි. මෙය, ගෙවීමකින් තොරව ජංගම උපකරණ ත්‍රිත්වයකටම අනුගත කල හැකි යෙදවුමක් වන අතර ගනුදෙනු කටයුතු පිරික්සීම, ශේෂය පිරික්සීම් සහ මාසික ප්‍රකාශ ලබා ගැනීම ආදී සේවාවන් සපයනු ලැබේ. වසර තුළ බැංකුව එයට අයත් ආපදාවලින් මුදා ගැනීමේ මධ්‍යස්ථානය (DRC) නව ස්ථානයක ප්‍රතිස්ථාපනය කරන ලදී. පාරිභෝගික සේවා සඳහා දැඩි බලපෑම් කළ හැකි බාධාකාරී සිද්ධීන් හැසිරවීම සඳහා මෙම මධ්‍යස්ථානය වර්තමානයේ ස්ථානගත කර ඇත. ආපදා තත්ත්වයක් තුළ තොරතුරු තාක්ෂණ සේවා නැවත පිහිටුවීමට විකල්ප ස්ථානයක් ලෙස මෙය කටයුතු කරනු ඇත.

වත්කම් කළමනාකරණයේ දෙවන වැදගත් අංගය වනුයේ පොළී උපයන වත්කම් වන ණය අත්තිකාරම් සහ ආයෝජන වැනි වත්කම් වේ. නියාමන වර්ධනය හා නව ගිණුම් ප්‍රතිපත්ති සන්දර්භය තුළ වඩා වැදගත් ස්ථානයක් හිමිවන්නේ වත්කම්වල ගුණාත්මක භාවයටයි. අපගේ මෙහෙයුම් කටයුතු මත විශාල බලපෑමක් මින් සිදුව තිබේ. අපි අපගේ ණය ඇගයීම සහ අපගේ ආයෝජන කළඹ දෙස බලන ආකාරය මෙයින් වෙනස් කර ඇත. හුදෙක්ම වත්කම් උපලබ්ධි කිරීමේ හැකියාව පදනම් වෙමින් පෙරදි කළ ඇගයීම, දැන් මුදල් ප්‍රවාහ මත පදනම්ව කළයුතු අතර අප විසින් සුරැකුම් ලෙස අත්පත් කර ගන්නා වත්කම් වල අවදානම් සහගත බවට අනුකූලව හානිකරණ ප්‍රතිපාදන වෙන් කළ යුතුය.

ආයෝජන සඳහා වෙළඳපොල අගයට වාර්තා කිරීමේ ගිණුම්කරණ පරිචය යොදූ ගත යුතුය. වත්කම් වල ගුණාත්මක භාවය පවත්වාගෙන යාම සඳහා, වත්කම් අත්පත් කර ගැනීම සඳහා සහ වත්කම් ප්‍රතිසංවිධානය සඳහා නිසි මග පෙන්වීමක් සහ නිසි ක්‍රමවේද අප සතුවිය යුතුය. ණය කළමනාකරණය, ණය ඇගයීම සහ අවදානම් කළමනාකරණය ආදී අපගේ විවිධ ක්‍රියාකාරී ඒකක ඒ වෙත ගොඩ නැගී ඇති නව ඉල්ලුමට සරිලන පරිදි සූදානම් කළ යුතුව තිබේ. 2018 වසරේ සිට ලාභ හෝ පාඩු ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය මෙම නව අවශ්‍යතා මගින් ඇති කරන බලපෑම පිළිබිඹු කරනු ඇත.

අවසාන වශයෙන්, අපගේ මානව සම්පත අපගේ වඩාත්ම වටිනා වත්කම වශයෙන් තවදුරටත් පවතින අතර අපගේ උපාය මාර්ගික අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් අපගේ මානව සම්පත් සැලැස්මෙහි ප්‍රධාන වෙනස්කම් අපි සිදු කර ඇත්තෙමු. පසුගිය කාලය තුළ සිදු වූ බඳවා ගැනීම් රටාවේ ප්‍රතිඵලයක් ලෙස මෑතකදී විශ්‍රාම ගිය හා විශ්‍රාම යාමේ වයසට ආසන්නව ඇති ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයෙන් විශාල කොටසක් අප සතුව ඇත. විශාල වශයෙන් නව බඳවා ගැනීම් සිදුවෙමින් පවතින අතර, දැනට කාර්ය මණ්ඩලයේ සාමාන්‍ය වයස අවුරුදු 35 හෝ ඒ ආසන්නයේ පවතී. 2017 වසර තුළදී කළමනාකරණ අභ්‍යාසලාභීන් ලෙස තරුණ වෘත්තිකයින් 300 ක් පමණ බඳවා ගන්නා ලදී. 2018 වසරේද නව බඳවා ගැනීම් විශාල සංඛ්‍යාවක් සිදු කිරීමට නියමිතය. මේ හේතුවෙන් බොහෝ අත්දැකීම් ඇති කාර්ය මණ්ඩලය විශාල සංඛ්‍යාවක් අපට අහිමි වුවත්, සුභදායී තත්ත්වය වනුයේ, අප අළුතෙන් බඳවා ගන්නා තරුණ පරම්පරාව නව ගනුදෙනු හා සැකසුම් ක්‍රම හැසිරවීමට තාක්ෂණික නිපුණතාවයකින් හෙබි පිරිසක් වීමයි. එම නිසා වර්තමාන අවශ්‍යතා සඳහා ගැලපෙන මානව ප්‍රාග්ධන පදනමක් අප සතුව ඇත.

ආර්ථිකය තුළ ක්‍රමයෙන් විකාශනය වන වෙනස්කම් වලට ප්‍රතිචාර දැක්වීම

ගෝලීය නියාමන හා මෙහෙයුම් වෙනස්වීම් මගින් ඇතිවන අභියෝග මධ්‍යයේ, ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජීය මුහුණුවරෙහි පවතින ගතික ස්වභාවය යන මේ දෙකම අප වෙත නොයෙකුත් අවස්ථාවන් උදා කරන අතර අභියෝගයන් ද මතු කරයි. දේශගුණික වෙනස්කම් හා එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වන ආහාර හිඟය හේතුවෙන් කෘෂිකර්මය ගෝලීය වශයෙන් වැදගත් භූමිකාවක් ඉටු කරමින් සිටී. දශකයක පමණ කාලයක දී, කෘෂිකර්මය වාසිදායක ක්ෂේත්‍රයක් වනු ඇති බව පෙන්නුම් කරයි. ආහාර සැකසුම්, කැපූ මල් හා විසිතුරු මසුන් ඇති කිරීම වැනි ක්ෂේත්‍රවල විශාල අවස්ථාවන් විවෘත වෙමින් පවතී. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය මගින් මෙබඳු ක්ෂේත්‍ර මෙහෙයවීම සිදු කරන අතර, එය රටේ ආර්ථික වර්ධනය කෙරෙහි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයේ වැදගත්කම ඉහළ නැංවීමට හේතු වනු ඇත. අද පවත්නා ගෝලීය ව්‍යාපාර පරිසරය තුළ කෙනෙකුට අන්තර්ජාතික වෙළඳපොලට පිවිසීමට, ව්‍යාපාරික ලෝකයේ දැවැන්තයකු වීම අත්‍යාවශ්‍ය නොවන අතර සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය ගෝලීය වටිනාකම් දාමයට සම්බන්ධ කිරීම මඟින් මේ සඳහා පහසුකම් සැලසීමට ද අපට හැකියාව ඇත.

රට තුළ සිදුවූ යටිතල පහසුකම් දියුණුවීමත් සමඟ ආර්ථික පසුබිම පෙර පැවති බස්නාහිර පළාත කේන්ද්‍රීය කොටගත් ආකෘතියෙන් ඉවතට යමින් පවතී. උතුරු, නැගෙනහිර පමණක් නොව අනිකුත් පළාත් වලද වේගවත් සංවර්ධනයක් සිදුවෙමින් පවතී. මෙම නව සංවර්ධන අවශ්‍යතාවලට ගැළපෙන පරිදි අපි අපගේ ආයතනයේ ව්‍යුහය වෙනස් කර ඇත්තෙමු. තවද, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා සේවය සැලසීමට වැඩි අවධානයක් යොමු කර ඇත. ශාඛා බැංකුකරණ අංශයෙහි මතුවෙමින් එන වෙළඳපොල අවස්ථා සඳහා සේවය ලබා දීමේ අරමුණින් එම අංශය සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් ආයෝජනය කරමින් පවතී. මේ අනුව ශාඛා බැංකුකරණ අංශය සඳහා වැඩි සම්පත් ප්‍රමාණයක් එකතු කරමින් එම අංශය කොටස් දෙකකට බෙදා ඇති අතර, ඒ මගින් එහි ව්‍යාපාර කටයුතු ප්‍රසාරණය කිරීම සඳහා ඉඩකඩ ලබා දී ඇත. ණය ප්‍රදානය කිරීමේ ක්‍රියාවලිය වේගවත්

කිරීම සඳහා ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන 14 ක් සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මධ්‍යස්ථාන 15 ක් අප විසින් ස්ථාපනය කර ඇති අතර සෑම දිස්ත්‍රික්කයකම එක් ප්‍රාදේශීය ණය මධ්‍යස්ථානයක් වන පරිදි මෙය ඉහළ නැංවීමට අප කටයුතු කරගෙන යනු ලබයි.

අපගේ සියලුම අභ්‍යන්තර ක්‍රියාවලීන්, පද්ධති හා ප්‍රාග්ධනය අනාගත අභියෝග වලට මුහුණ දිය හැකි පරිදි හොඳින් හැඩගස්වා ඇති අතර දේශීය මෙන්ම විදේශීය වශයෙන් සිදුවන වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස මතුවන අවස්ථා අත්පත් කර ගැනීම සඳහා ලංකා බැංකුව නිසි ලෙස ස්ථානගත කර ඇත. ලංකා බැංකුව සැමවිටම "ජාතියේ මහා පහන් ටැඹ" වනු ඇත.

ඇගයීම

ඔවුන්ගේ උපදෙස් හා මගපෙන්වීම පිළිබඳව මම, සභාපතිතුමා හා අධ්‍යක්ෂ මණ්ඩලයට ද, කැපවීම හා අප්‍රතිහත උත්සාහය සම්බන්ධයෙන් ආයතනික හා විධායක කළමනාකාරිත්වයට සහ අපගේ කාර්ය මණ්ඩලයට ද, අප සමඟ සහයෝගයෙන් වැඩ කිරීම සම්බන්ධයෙන් වෘත්තීය සමිති වලට ද, ඔවුන්ගේ අබණ්ඩ පක්ෂපාතීත්වය දැක්වීම සම්බන්ධයෙන් විශ්‍රාමික සේවක පිරිස් හා අපගේ පාරිභෝගිකයින්ට ද මාගේ ප්‍රශංසාව පිරිනැමීමට කැමැත්තෙමි. ඔවුන්ගේ මගපෙන්වීම හා සහයෝගීතාවය සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ගරු අමාත්‍යවරයා සහ ගරු මුදල් අමාත්‍යවරයාටත්, එම අමාත්‍යාංශ දෙකෙහි කාර්ය මණ්ඩලයටත් ස්තුති කිරීමට මම කැමැත්තෙමි. තවද ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබාදුන් නියාමන අධීක්ෂණය හා ඊට අදාල කාර්ය මණ්ඩලය ද අතිශයින් අගය කරමි. මෙම වාර්තාව නිසි කාලයට ප්‍රසිද්ධ කිරීම සඳහා හැකියාව ලබා දෙමින් මූල්‍ය වාර්තා විගණනය ඉටු කිරීම සම්බන්ධයෙන් විගණකාධිපතිතුමාටත්, ඔහුගේ කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාව හිමිවේ.

2018 වසර තුළ හා ඉන් ඔබ්බට අපගේ ශක්තිය හා සම්පත් සමඟ පැන නගින කුමන අභියෝගයකට වුවද මුහුණ දෙමින් බැංකුව ඉදිරියටම යන බවටත්, ලැබෙන සියලුම අවස්ථා වලින් උපරිම වාසි ලබා ගෙන ලංකා බැංකුවට පමණක් නොව සියලුම ශ්‍රී ලාංකිකයන් සඳහා වර්ධනය වීමටත්, සෞභාග්‍යමත් වීමටත් හැකි බවට මට සම්පූර්ණ විශ්වාසයක් තිබේ.



ඩී.එම්. ගුණසේකර
මහා කළමනාකාරතුමා

2018 පෙබරවාරි 21 දා
කොළඹදී ය.

මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය



2018 වර්ෂය තුළ, 2018-2020 කාල සීමාව සඳහා වූ ආයතනික සැලැස්ම සමඟ බැංකුව තම ගමන් මග තුළ නව පරිච්ඡේදයකට පියවර නගමින් ඇත. සැලැස්ම දියත් කිරීමට සමගාමීව, අපි අපගේ ඉදිරි දැක්ම, මෙහෙවර සහ වටිනාකම් ප්‍රකාශනය සමාලෝචනය කර නව්‍යකරණය කර ඇත්තෙමු. "බැංකුව අනාගතය සඳහා ප්‍රතිනිර්මාණය සහ බලගැන්වීම" වන අපගේ නව තේමාව ආයතනික සැලැස්ම සමඟ අන්‍යෝන්‍යව බැඳී පවතී.

"ජාතියේ මහා පහන් ටැඹ"

ලංකා බැංකුවේ මහා කළමනාකරුගේ භූමිකාව ඉතා ආඩම්බරයෙන් හා නිහතමානීව මා භාර ගනිමි. ආරම්භයේ සිටම දේශීය වෙළඳ ප්‍රජාව සඳහා සිය සේවය සැලසූ බැංකුවක් ලෙස 1939 වසරේ සිට අන්‍යෝන්‍ය වශයෙන් නිරහංකාර ආරම්භයක සිට පැවත එන ලංකා බැංකුව ඇත්ත වශයෙන්ම එම ගමන තුළ ඉතා දුරක් ගමන් කර තිබේ. රට තුළ ඇති විශාලතම හා ඉහළම ලාභයක් ලබන තනි ආයතනය ලංකා බැංකුව වන අතර අපි "ජාතියේ මහා පහන් ටැඹ" වන්නෙමු. 2016 වර්ෂය තුළ ශ්‍රී ලංකා රු. ට්‍රිලියනය බැගින් ඉක්මවූ වත්කම්, ණය සහ තැන්පතු යන ත්‍රිත්වය සැලකීමේදී ලංකා බැංකුව විශාලතම බැංකුව වේ. එමෙන්ම වඩාත් විස්තීරණවූ ශාඛා ජාලයක් ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර (ATM) හා මුදල් තැන්පතු යන්ත්‍ර (CDM) අප සතුව ඇත. ඉතා ශක්තිමත් හා සංයමයකින් යුතු ප්‍රතිරූපයක් ඇති ආයතනයක් පෝෂණය කර මා වෙත භාරදීම සම්බන්ධයෙන් මගේ පුරෝගාමියා වන ඩී එම්. ගුණසේකර මහතාට මම ගෞරවය පුද කළ යුතුය. මාගේ ඉදිරි සේවා කාලය තුළ ලංකා බැංකුව එහි පළමු ස්ථානයෙහි දිගටම රඳවා තබා ගැනීමට හා ඊට වඩා තවත් ඉහළ ස්ථානයකට ගෙන යාමට මා සහතික වෙමි.

2018 වර්ෂයේ සිට අපගේ මූල්‍ය විසඳුම් නවීකරණය කරමින් තවදුරටත් පාරිභෝගික කේන්ද්‍රීයකරණය කරන අතර, අප ගෝලීය වශයෙන් ඉදිරියෙන් සිටීම ශක්තිමත් කිරීම උදෙසා අපට ඇති ජාතික පිළිගැනීම තවදුරටත් වර්ධනය කරමින් නව දැක්ම සමඟ නැවත සන්නාම ගත කරනු ඇත. අපේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම, මූල්‍ය වෙළෙඳපොල හා යෝජිත අවශ්‍යතා ගැඹුරින් විශ්ලේෂණය කිරීම, සුදුසු විසඳුම් සංවර්ධනය කිරීම, නවීන තාක්ෂණය භාවිතා කිරීම හා අපගේ සේවක පිරිස බලගැන්වීම නව දැක්ම සාක්ෂාත් කර ගැනීමේ ක්‍රමෝපායන් වනු ඇත.

අපගේ ආයතනික සැලැස්ම

2018 වසර තුළ, 2018-2020 කාල සීමාව සඳහා වූ ආයතනික සැලැස්ම සමඟ ලංකා බැංකුව නව පරිච්ඡේදයකට පියනගනු ඇත. මෙම සැලැස්ම දියත් කිරීමට සමගාමීව අපගේ නව දැක්ම, මෙහෙවර හා වටිනාකම් ප්‍රකාශනය සමාලෝචනය කර සංශෝධනය කර ඇත. ආයතනික සැලැස්මේ අන්‍යෝන්‍ය ව්‍යුහගත සම්බන්ධය සමඟ අපගේ නව තේමාව වන්නේ "බැංකුව අනාගතය සඳහා ප්‍රතිනිර්මාණය සහ බලගැන්වීම" වේ. මෙම සැලැස්ම සකස් කරන ලද්දේ වෘත්තීයමය දැනුම පදනම් වූ ප්‍රබල ක්‍රියාවලියක් මඟිනි. ව්‍යාපාර ආකෘතිය හා මෙහෙයුම් නැවත දැඩිලෙස පරීක්ෂා කළ අතර වර්තමාන ආර්ථික, සමාජයීය හා ව්‍යාපාර පරිසරය තුළ අප මුහුණ දෙන අභියෝග හා නව අවස්ථා සංදර්භය සැළකිල්ලට ගෙන ඒවා හැඩගැන්වීම කළ හැක්කේ කෙසේද යන්න සළකා බලන ලදී.

ආයතනික සැලැස්ම පිළියෙල කිරීම සරල පහසු ව්‍යායාමයක් නොවන අතර සෑම තලයකම අදහස් උකහා ගනිමින් සිදුකරන ලද සැළසුම් සහගත ක්‍රියාවලියකි. ඒ සඳහා තොරතුරු දෙපාර්තමේන්තුවලින්, ශාඛාවලින් හා පළාත් මට්ටමින් රැස් කරන ලදී. සමස්ත ආයතනික හා විධායක කළමනාකරණයේ සහභාගිත්වය සමඟ වැඩමුළුවක් කැඳවන ලද අතර එහිදී කෙටුම්පත් සැලැස්ම සාකච්ඡා කර අවශ්‍ය සංශෝධන කරන ලදී. සැලැස්ම දියත් කරන විට අපගේ සියළුම කාර්ය මණ්ඩලය එක හා සමානව ඒ සම්බන්ධව දැනුවත් කරන ලදී. සාර්ථක ක්‍රියාවට නැංවීමක් සඳහා බැංකුවේ සියලු කාර්ය මණ්ඩලයේ දැනුවත්භාවය, කැපවීම හා සහයෝගය අවශ්‍ය බව අපගේ දැඩි විශ්වාසයයි. ආයතනික සැලැස්මට අනුව අපගේ නියම කාර්යසාධනය අබණ්ඩව හා දැඩි ලෙස සමාලෝචනය කරනු ලැබේ. විවිධ කළමනාකරණ මට්ටම් වලදී සතිපතා, මාසිකව හා කාර්තුමය ලෙස සමාලෝචනය කරනු ලැබේ.

පාරිභෝගිකයාට ඇති සමීප බව

අප දකින ආකාරයට ඉතා වැදගත් කරුණු වන්නේ, අප පාරිභෝගික සේවා වැඩි දියුණු කිරීමෙන් වැඩි වැඩියෙන් පාරිභෝගික කේන්ද්‍රීය වීමේ අවශ්‍යතාවයයි. රටේ බැංකු තිහකට අධික ප්‍රමාණයක් පැවතීම තුළින් අපගේ බැංකු පරිසරය අතිශයින්ම තරඟකාරී වී ඇත. නව වෙළෙඳ කටයුතු බැංකුව වෙත ලබා ගැනීම සහතික කිරීම පමණක් නොව අපට දැනට සිටින පාරිභෝගිකයන් රඳවා තබා ගැනීම සඳහාද පාරිභෝගික සබඳතා අතිශයින්ම වැදගත් බවට පත්වී තිබේ.

එම නිසා පාරිභෝගිකයින්ට කඩිනම් හා ආචාරශීලී සේවයක් සැපයීම, ඉතා වැදගත් වේ. එබැවින් පාරිභෝගික කේන්ද්‍රීයකරණය අපගේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන්ට, ක්‍රියාවලින්ට හා පද්ධතිවලට එකසේ වැදගත් වේ. අපගේ වටිනාකම් වලින් එකක් ලෙස "පාරිභෝගික කේන්ද්‍රීයකරණය වීම" තෝරා ගැනීම තුළින් මෙය තහවුරුවේ. අපගේ පාරිභෝගික පදනම බොහෝ පුළුල් පරාසයක පැතිර පවතින අතර; විශාලතම ආයතන, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ක්ෂුද්‍ර ව්‍යවසායකයින්, මධ්‍යම පාන්තික වෘත්තිකයින්, විදේශික ශ්‍රමිකයින්, ගොවියන් හා ධීවරයින් ඇතුළු විවිධ කණ්ඩායම් වලින් සමන්විත වෙයි. එක් එක් පාරිභෝගික කණ්ඩායම් සඳහා ඊට ආවේනික අවශ්‍යතා, ඊට ආවේනික ගති ලක්ෂණ හා අභිරුචීන් ඇත. ඔවුන්ගේ මූල්‍ය සාක්ෂරතාව අනුවද ඔවුන් බොහෝ දුරට වෙනස් වේ. බැංකුව මේ සම්බන්ධයෙන් දැනුවත් වීම අවශ්‍ය වන අතර, සෑම පාරිභෝගිකයෙකුටම නිසියාකාර ලෙස සැලකීමටත් ඔහුගේ/ඇයගේ අවශ්‍යතා අනුව සේවය කිරීමටත් මෙමඟින් හැකි වේ. පුහුණුව, දැනුවත් භාවය වර්ධනය කිරීම හා කාර්ය මණ්ඩල සංවර්ධනය හරහා අපගේ කාර්ය මණ්ඩලය තුළ පාරිභෝගික කේන්ද්‍රීයකරණයට අදාළ ආචාර ධර්ම හඳුන්වා දීමට අදහස් කරන්නෙමු. අපි දැනට මාණ්ඩලික සහකරුවන් කණ්ඩායමක් අලුතින් බඳවා ගැනීමේ ක්‍රියාවලියක නිරත වන අතර, ඔවුන්ට බැංකු කටයුතු සම්බන්ධ තාක්ෂණික කරුණු මෙන්ම පාරිභෝගික සේවා සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදීමට කටයුතු කෙරෙනු ඇත.

අපගේ පාරිභෝගික පදනම මිලියන 13 ක් පමණ වන අතර, අපි සේවය සලසනු ලබන්නේ ඉහළ විවිධාංගීකරණයෙන් යුත් පාරිභෝගික පදනමකටයි. අපි සේවය සලසනු ලබන සෑම පාරිභෝගික කොටසක් සඳහාම සිත් ඇදගන්නා ආකාරයෙන් පාරිභෝගික කේන්ද්‍රීයකරණය සාක්ෂාත් කර ගන්නේ කෙසේද යන්න අනියෝගයකි. ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර (ATM), මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍ර (CDM), අන්තර්ජාල හෝ ජංගම බැංකුකරණය යන ඕනෑම මාර්ගයකින් ඩිජිටල් මාර්ග භාවිතා කිරීමට අපගේ පාරිභෝගිකයන් උනන්දු කිරීමට අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙමු. ශක්තිමත් හා අංක 1 ට වර්ගීකරණය කළ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් බැංකුව සතු වන අතර, පාරිභෝගිකයින් අතර දැනුවත්භාවය වර්ධනය කර එහි වාසිය අපි ලබාගත යුතුය. අප 2017 වර්ෂය තුළ හඳුන්වා දුන් ජංගම යෙදුම, "B-App" නමින් හඳුන්වන මෘදුකාංගය වඩාත් ජනප්‍රිය වීම අප ධෛර්යමත් වීමට හේතුවිය. මෙම යෙදුම මඟින් අපේ සේවා දායක පිරිසට බැංකු කටයුතු වලට පිවිසීම තවදුරටත් දියුණු සහ පහසු වී ඇත.

අපගේ ඩිජිටල් සේවා හැකි තරම් පරිශීලනය කරන්නන්ට භාවිත කිරීමට පහසු ලෙස හැඩගැන්වීමට අපි උත්සාහ දැරිය යුතුය. බැංකු කවුන්ටර් වෙත යාමෙන් වැලකීමට සේවා දායක පිරිසට විශ්වාසයක් ඇති කරමින් ඩිජිටල් සේවා භාවිතා කිරීමේදී ඇති ආරක්ෂාව තහවුරු කිරීම අපි කළ යුතුය. පාරිභෝගිකයන් වැඩියෙන් ඩිජිටල් මාධ්‍ය භාවිත කරන විට ශාඛාවන් හිඳී, වඩා හොඳ සේවාවක් ලබා දීමට අපිට හැකිය.

මූල්‍ය පහසුකම් ලබාදීම සහ මූල්‍ය ඇතුළත්කරණය

ණය ලබාදීම සඳහා අපගේ ප්‍රවේශය දෘෂ්ඨිකෝණ දෙකක් හා සම්බන්ධ වේ. එකක් වාණිජ ප්‍රවේශය වන අතර, අනෙක සංවර්ධන ප්‍රවේශයයි. රජයට අයත් බැංකුවක් වීමත් රට තුළ ඇති විශාලතම බැංකුව වීමත් නිසා අපි සංවර්ධන ප්‍රවේශය සඳහා වැඩි කැමැත්තක් ලබා දෙන්නෙමු. ජීවන තත්ත්වයේ පතුලේම සිටින අවශ්‍යතා සහිත ජනතාවගේ ආදායම් මට්ටම, සමාජ තත්ත්වය, සහ ජීවන තත්ත්වය දියුණු කිරීමට උදව් කිරීම අපගේ වගකීම වේ. වෙළෙඳපොලෙහි මෙම කොටසට සේවය සැලසීම සඳහා ණය යෝජනා ක්‍රම 50 කට වඩා අප වෙත හිමි වීමෙන් ප්‍රදර්ශනය කරනු ලබන්නේ අපගේ කැපවීමයි. විශේෂිත අවශ්‍යතාවයන් සඳහා කැප වූ බාහිර අරමුදල් සහිත ණය යෝජනා ක්‍රම නොමැති නම් තවත් වාසිදායක කොන්දේසි වලින් යුතු අප සතු අරමුදල් භාවිතයෙන් අපි ණය යෝජනා ක්‍රම නිර්මාණය කිරීමට බලාපොරොත්තු වෙමු. කෙසේ වුවත් ව්‍යවසායකත්වය පිළිබඳ ප්‍රේරණයක් සහිත අඩු ආදායම් මට්ටම් වල සිටින අයට ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා උදව් කිරීමට බැංකුව කැමැත්ත දක්වයි. අපි සහනදායී මූල්‍ය පහසුකම් ලබා දීමට අනුග්‍රහ දක්වන්නේ, එසේ නොවුණහොත් ඔවුන් අවිධිමත් ණය ලබා දෙන ආයතන වෙත ගොස් දැඩි අපහසුතාවයන්ට ලක්වන නිසාය.

අපි වඩා වැඩි වැදගත් කමක් ලබා දෙන අනිත් අංශය වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වේ. ආර්ථිකය තුළ ඉහළ වර්ධනයක් සඳහා දායක වන්නේ මෙම අංශයයි. මෙම අංශය සඳහා රට

පුරා මෙහෙයවන අපගේ වැඩ සටහන් තුළින් අපි තවත් විවිධ වාණිජ කණ්ඩායම් සමඟ සම්බන්ධ වී ඇත. මේ සම්බන්ධයෙන් වැදගත් නව්‍යකරණයක් වන්නේ අපගේ "ව්‍යාපාර හමුව" වැඩසටහනයි. අපගේ ජ්‍යේෂ්ඨ නිලධාරීන්ද සහභාගී වන මෙම වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් මෙහෙයවනු ලැබේ. බැංකු ජාලය තිරසාර අගයන් නිර්මාණය කළ හැකි මෙවලමකි. මෙම අවස්ථා වලදී බැංකු නිලධාරීන්ට සහ ව්‍යවසායකයන්ට විවෘත සාකච්ඡා මගින් එකිනෙකාගේ අවශ්‍යතා තේරුම් ගැනීමටත් ප්‍රශ්න හඳුනා ගැනීමටත් අවස්ථාවක් ලැබෙනු ඇත.

සමාලෝචිත වසර තුළ විශේෂයෙන්ම ග්‍රාමීය ජනතාවට වාසි ගෙන දෙන අනෙක් පියවර වන්නේ ප්‍රථම වතාවට ජංගම බැංකු ශාඛා සේවාව හඳුන්වාදීමයි. පාරිභෝගිකයා බැංකු ශාඛාව වෙත ඒම වෙනුවට බැංකුව පාරිභෝගිකයා හමුවට යාම මෙමඟින් සිදු වේ. මෙම ජංගම බැංකු ශාඛා මඟින් ගිණුම් විවෘත කිරීම, මුදල් තැන්පතු, මුදල් ආපසු ගැනීම, බිල්පත් ගෙවීම, ණය ඉල්ලුම්පත්‍ර ආදී සේවා ගණනාවක් ලබාදේ. මෙම ජංගම බැංකු සේවය අන්තර්ජාල සම්බන්ධතාවය සමඟ සම්බන්ධව ඇති නිසා ඕනෑම ගනුදෙනුවක් එම වේලාව තුළම යාවත්කාලීන කළ හැකිය. වර්තමානයේ බැංකු කටයුතු සඳහා හැඩගැසී නොමැති කොටස් අතරට බැංකු සේවාව මෙමඟින් ලබාදිය හැකිය. විශාල වශයෙන් ජනතාව එක්රැස් වන අවස්ථා වලදී හා ආපදා අවස්ථා වලදී අපගේ පැමිණීම අපි සහතික කරන්නෙමු.

වාණිජ ණය ලබා දීම

විශාලතම තැන්පතු පදනම සමඟ කර්මාන්තය තුළ දැවැන්තයා වීමෙන් උපරිම ලාභ ලැබීම සඳහා වාණිජ ණය ලබා දීමේදී තරඟකාරී අනුපාත මත සැමවිටම ණය ප්‍රදානය කර ඇත. මුදල් ප්‍රවාහ මත පදනම්ව ව්‍යාපෘති ඇගයීමට අපි උත්සාහ කරන්නෙමු. තවද අවදානම් ආවරණය කිරීම සඳහා ඇප ලබා ගැනීමේදී ඇත්ත වශයෙන්ම අපි විචක්ෂණශීලි වන්නෙමු. අපගේ පුහුණු වැඩසටහන් වලදී අපගේ ණය නිලධාරීන්ගේ දක්ෂතා වර්ධනය කිරීම සම්බන්ධයෙන් අවධාරණය කරන්නෙමු. ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන මඟින් අපගේ ණය මෙහෙයුම අප සුමට කර ඇත්තෙමු.

තරුණ පරම්පරාව වෙත ලඟා වීම සඳහා 2017 වසර තුළ අප ආරම්භ කළ ප්‍රමුඛතම වැඩ සටහන් තුළින් ද්විතීයික පාසල් සිසුන්ට මූල්‍ය වගකීමේ පණිවිඩය රැගෙන යන ලදී. දෙමාපියන් විසින් සිය දූ පුතුන්ගේ අනාගතය සඳහා තමන්ගේ යුතුකම් ඉටුකරමින් පවත්වා ගෙන යන ලද ළමා ඉතුරුම් ගිණුම් වලට මෙම සිසුන් හිමිකම් කියයි. අවුරුදු 18 ට ළඟා වීමේදී ඔවුන්ට සිය මුදල් ආපසු ගැනීමට පිළිවන. මූල්‍ය විනය සම්බන්ධයෙන් හා ඔවුන්ගේ ව්‍යක්තීය සංවර්ධනය සඳහා වැදගත් වන සුමට දක්ෂතා සම්බන්ධයෙන් සිසුන්ට මගපෙන්වීමට බැංකු කළමනාකරුවන් ඔවුන් විසින්ම පැයක් පුරා දිවෙන සැසි මෙහෙයවන ලදී. මේ සම්බන්ධයෙන් යොවුන් පරපුර වෙත ශක්තිමත් පණිවිඩයක් රැගෙන යාම සඳහා 100 කට වඩා කළමනාකරුවන් ක්‍රියාකාරී පුහුණු කරන්නන් ලෙස පුහුණු කරන ලදී. 2017 වසර තුළ එවැනි පුහුණු සැසි 200 කට වඩා පවත්වන ලද අතර මෙම වැඩසටහන 2018 වසර තුළ අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලැබේ. බාහිර විශේෂඥතාවයෙන් හෙබි ප්‍රවීණයන්ගෙන් දැනුම ලැබුණ නිසා ඉතා ඉක්මණින් සිසුන්ට එය වටහා ගැනීමට හැකිවූ බව අපගේ අත්දැකීමයි. වැඩ සටහනෙන් ලැබෙන වාසි විවිධය. එහි ආයතනික සමාජ වගකීම පිළිබඳ දෘෂ්ඨියද තිබුණ අතර, සෞභාග්‍යමත් අනාගතයක් සඳහා යොවුන් පරපුර යොමු කිරීමත් මගපෙන්වීමත් මෙයින් සිදු කෙරේ. ජීවිත කාලය පුරා ඉතිරි කරන්නන් ලෙස විභවයක් සහිත කණ්ඩායමක් බැංකුව වෙත ඇද ගැනීම බැංකුවේ තිරසාර පැවැත්මට හේතු වේ. අපගේ කළමනාකරුවන්ගේ පෞද්ගලික සංවර්ධනයට ද එය දායක වූ අතර ඔවුන් ඵලදායී සන්නිවේදකයන් ලෙස අනාවරණය වීමටද හේතුවිය.

ඉදිරි දැක්ම

අනාගතය දෙස බැලීමේදී විවිධ හා වෙනස්වන අවශ්‍යතා වලට අනුකූලව සේවය සැලසීමට නම් අපගේ ව්‍යාපාර ආකෘතිය පුළුල් ලෙස දියුණු කිරීමත් ක්‍රමයෙන් විකාශයට පැමිණවීමත් කළයුතුය. අප වෙත දිගු කාලයක් පක්ෂපාතීව සිටින ලද අපට ආවේණික පාරිභෝගිකයින් අමතක නොකරන අතර නව සහශ්‍රයේ පරපුරටද අප සේවය කළයුතු වේ. ගතානුගතික ජාලයට ඇති වැදගත්කම අඛණ්ඩව ලබාදෙන අතර ඩිජිටල් සංඛ්‍යාක හා නාමික බැංකුකරණයෙන් අපි ඉදිරියෙන්ම සිටිය යුතුය. ව්‍යාපාරික අවස්ථා මෙන්ම සමාජ දායකත්වය සැපයීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ අති විශාල විභවයක් තිබේ. මෙම අවස්ථා වලින් අපි ප්‍රයෝජන ගත යුත්තේ ආයතනික අංශය සඳහා වඩා හොඳ කාර්යක්ෂමතාවයකින් අඛණ්ඩව සේවය කරන අතරතුර වේ.

බැංකුව පාරිභෝගිකයා දෙසට නැඹුරු වීම අත්‍යවශ්‍ය වන්නේ එහි නිෂ්පාදනය සංවර්ධනය සහ පාරිභෝගික සේවා යන අංශ දෙක කෙරෙහිම අවධානය යොමු කිරීමේදීය. මෙම කරුණු දෙකෙහිම අවසාන අරමුණ විය යුත්තේ පාරිභෝගික තෘප්තියයි. මෙය ඉටුකර ගැනීමට හා අනෙකුත් අවශ්‍යතා සපුරාලීම සඳහා අප අපගේ අභ්‍යන්තර ක්‍රියාවලීන් ඵලදායි හා කාර්යක්ෂම ලෙස පවත්වා ගැනීම සහතික කළ යුතුය.

අපගේ ප්‍රමුඛතම ශක්තියක්ව පවතින ඉතා විශිෂ්ට සේවක කණ්ඩායමක් අප සතුවේ. කෙසේ වුවද වෙනස් වන අවශ්‍යතා සහ මතුවන අභියෝග හමුවේ සේවය සැලසීමට ඔවුන්ට උදව් වීම සඳහා ඔවුන්ගේ දක්ෂතා මුවහත් කිරීම අපි කළයුතු වන්නෙමු. අපගේ වර්ධන කේන්ද්‍රයේ ඉතාම වැදගත් කොටසක් වන ඔවුන් තවදුරටත් අභිප්‍රේරණය කිරීමත් පුහුණු කිරීමත් කළ යුතුය. අපගේ පුහුණු කිරීමේ වැඩසටහන් නිසියාකාරයෙන් දක්ෂ ලෙස සැකසීමටත් ඒවා ලෝකයේ හොඳම වැඩසටහන් වලට සමාන වීමත් අවශ්‍ය වේ. අප අළුතින් ඉදිරියට පියවර තැබීමේදී, බැංකුවේ මානව සම්පත් භාවිතය බැංකුවේ උපාය මාර්ගික අවශ්‍යතා පිරිමැසීමට හැකිවන පරිදි අපි සංවිධානය කර ඇත්තෙමු.

රාජ්‍ය බැංකුවක් වශයෙන් අපි හුදු ලාභ හා පාඩු ගැන පමණක් සිත යොමු නොකරන අතර සමාජ, පාරිසරික හා මූල්‍ය කරුණු ගැනද සිත යොමු කරයි. අපි දැඩි ලෙස රජයේ තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා සහයෝගය ලබා දෙන්නෙමු. අපගේ හරිත බැංකුකරණය සහ ආයතනික සමාජ වගකීම් මුල් පිරීම් මඟින් හා අපගේ සාමාන්‍ය මෙහෙයුම් මඟින් බැංකුව මේ සඳහා තම දායකත්වය ලබාදේ.

අභියෝග කළ නොහැකි සන්නාම ශක්තිය සමඟ නැවත සන්නම් කරන ලද "2018 - 2020 ඉදිරි දැක්ම" හා මාගේ බොහෝ පළපුරුදු සහ වටිනා සේවක කණ්ඩායම, මාගේ පුරෝගාමීන් විසින් මා වෙත ත්‍යාග කරන ලදී. කිසිදු සැකයකින් තොරව "ජාතියේ මහා පහන් ටැඹ" වන ඔබගේ බැංකුව සැමවිටම අංක එකේ රැඳී පවතින බවට සහ ඔබ වෙත වඩා හොඳින් සේවය කරන බවටද ඉදිරි අනාගතය සාර්ථක කරන බවටද අපගේ සියලුම පාර්ශ්වකරුවන්ට ප්‍රතිඥා දෙමි.

ඇගයීම්

මාගේ පුරෝගාමියා වන ඩී.එම්. ගුණසේකර මහතාට, මා කලින් පදවිය දරණ විට මා හට ලබා දුන් සහයෝගය සහ මගපෙන්වීම් වෙනුවෙන් සහ මාවෙත මෙම පදවිය සුමටව භාරදීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත විය යුතුය. සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පුද කරන ලද ධෛර්ය්‍යමත් කිරීම හා මගපෙන්වීම සම්බන්ධයෙන් මම කෘතඥවෙමි. ගරු මුදල් ඇමතිතුමා සහ ගරු රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ඇමතිතුමා සහ මා වෙත මගපෙන්වීම් ලබා දුන් එම අමාත්‍යාංශවල කාර්ය මණ්ඩලය මම අමතක නොකරමි. ශ්‍රී ලංකා මහා බැංකුව, කොළඹ කොටස් වෙළඳපොල සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිසන් සභාව අවශ්‍ය නියාමන පාලනය ලබා දෙමින් ඔවුන්ගේ දායකත්වයද ලබාදී තිබේ. මෙම වාර්තාව නියමිත වෙලාවට ප්‍රසිද්ධ කිරීමට හැකිවන පරිදි මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විගණකාධිපතිතුමාට ස්තුති කිරීමට ද කැමැත්තෙමි.

අපගේ පාරිභෝගිකයින් අපගේ වර්ධනයට හා සෞභාග්‍යමත් භාවයට "දිගු කාලයක් පුරා" ලබාදී තිබෙන දායකත්වය නිරතුරුව අගයමි. ව්‍යක්තීය සම්බන්ධතා උදව් සහ සහයෝගය ලබා ගැනීමට බැංකුවට හැකි වී තිබෙන අතර, එමඟින් අපට කිසිදු බාධාවකින් තොරව බැංකුව මෙහෙයවීමට හැකියාව ලැබුණි. වසර ගණනාවක් පුරා පෙන්වන ලද උපරිම කැපවීම හා මා වෙත දෙන ලද ඔවුන්ගේ නිර්ලෝභී සහයෝගය සම්බන්ධයෙන් කළමනාකාර කණ්ඩායමට හා කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාවය ප්‍රකාශ කිරීමටද කැමැත්තෙමි.



සෙනරත් බණ්ඩාර
මහා කළමනාකාරතුමා

2018 මාර්තු 27 දින
කොළඹදී ය.

අපගේ පරිසරය හා අපගේ ක්‍රියාවලිය

ආර්ථික දෘෂ්ටිය

ගෝලීය ආර්ථිකය


වසර 2016 දී යටපත් වූ ගෝලීය ආර්ථික කාර්යසාධනය, වසර 2017 තුළදී යම්තාක් දුරකට යථා තත්ත්වයට පත් විය. ආර්ථික වර්ධනය 3.0%ක් දක්වා ලඟා වී ඇති බවට ඇස්තමේන්තු කර ඇති අතර එය පෙර කරන ලද පුරෝකථනයන්ට වඩා මඳක් ඉහළ වර්ධනයකි. ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් හතරෙන් තුනකට වඩා වාර්තා කරන රටවල්, පෙර වසරට සාපේක්ෂව 2017 දී ඉහළ වර්ධනයක් අත්පත් කර ගැනීම සතුටට කරුණකි. 2008 වසරේ වූ අර්බුදකාරී තත්ත්වයෙන් පසු යළි යථා තත්ත්වයට පත් විමේදී ඵලදායීතාවයේ සුභ ලකුණු දක්නට ලැබේ. ජර්මනිය, ජපානය, දකුණු කොරියාව සහ ඇමරිකා එක්සත් ජනපදය විසින් ප්‍රධාන වශයෙන්ම වර්ධනය මෙහෙයවනු ලැබේ. බ්‍රසීලය, චීනය සහ දකුණු අප්‍රිකාව ද පෙර අපේක්ෂා කළ තත්ත්වයට වඩා හොඳ වර්ධනයක් පෙන්නුම් කරන ලදී. වර්ෂයේ අවසන් මාස කිහිපය තුළ, ගෝලීය වෙළඳාමේ පුනර්ජීවනයක් දක්නට ලැබුණි. මේ සඳහා බලපෑ ප්‍රධාන සාධකයන් වූයේ ඇතැම් ආසියාතික රටවල නිෂ්පාදන කටයුතු වල පිබිදීම සහ දියුණු ආර්ථිකයන් සිය ආයෝජන ඉහළ නැංවීම වේ. අමතර ධාරිතාවය අඩුවෙමින් පවතින අතර එක්සත් ජනපදයේ හා සමහර දියුණු ආර්ථිකයන් තුළ දැනටමත් ශූන්‍ය අගයක් ගනියි. බොහෝ දියුණු ආර්ථිකයන්හි විරැකියා අනුපාතයද අර්බුදයට පෙර මට්ටම ආසන්නයට ලඟා වී ඇත. කෙසේ වෙතත්, පෙර පැවති අඩු වෙළඳ භාණ්ඩ මිලෙහි ප්‍රතිඵලයක් ලෙස මූලික උද්ධමනය පහළ මට්ටමක පවති.

2017 වසර තුළදී, එක්සත් ජනපදයේ ආර්ථිකය 2.3% ක පමණ මධ්‍යස්ථ වර්ධනයක් අත්පත් කර ගනු ඇතැයි බලාපොරොත්තු විය. ඇතැම් අවිනිශ්චිතතාවයන් මධ්‍යයේ වුවද, ආයතනික සහ පුද්ගල බදු වල පහත වැටීම ආර්ථිකයට තල්ලුවක් විය. යුරෝපා කලාපීය වර්ධනය 2.4%ක් ලෙස ඇස්තමේන්තු විය. ශක්තිමත් දේශීය මෙන්ම බාහිර ඉල්ලුමක් පැවතීම නිසා ජර්මනිය, ඉතාලිය සහ නෙදර්ලන්තය හොඳින් කටයුතු කරනු ඇති බවට බලාපොරොත්තු විය හැක. එක්සත් රාජධානිය යුරෝපා සංගමයෙන් ඉවත් වීමේ තීරණයත් සමඟ ඇතිවූ අවිනිශ්චිතතාවයන් හේතුවෙන් බාධා එල්ල වූ එක්සත් රාජධානියේ ආර්ථිකය, 2017 වසර තුළදී 1.7%ක පමණ අගයකින් පමණක් වර්ධනය වනු ඇති බවට බලාපොරොත්තු වූ අතර මෙය 2018 වසර වන විට 1.5%ක් දක්වා තවදුරටත් අඩු වනු ඇති බවට බලාපොරොත්තුවේ. කෙසේ නමුදු, චීනයේ ආර්ථිකය 6.8% ක සැලකිය යුතු වර්ධනයක් පෙන්වනු ඇති බවට අපේක්ෂා කෙරේ. දේශීය ඉල්ලුම වැඩිවීම හා ගෝලීය වෙළඳාමේ ඉහළ යාම මෙම වර්ධනයට තල්ලුවක් වී ඇත. මුදල් නෝට්ටු වෙනස් කිරීම සහ භාණ්ඩ හා සේවා මත බදු හඳුන්වා දීම යන කරුණු මත ඇතිවූ මන්දගාමී බව තිබියදීත්, ඉන්දියාවේ 6.7% ක ආර්ථික වර්ධනයක් අපේක්ෂා කරන ලදී. ජී එස් ටී හඳුන්වාදීම දිගු කාලීනව වර්ධනයට හේතු වේ.


පසුගිය වසර දෙක තුළ තෙල් මිල පහත වැටීම නිසා දරුණු අර්බුදයකට ලක්වූ බණිජ තෙල් නිපදවන රටවල්, 2017 වසර අවසාන භාගයේ දී මිල ගණන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් යම් සහනයක් ලැබූවද, ඔවුන් දිගින් දිගටම සැලකිය යුතු ලෙස ආදායම් පහළ යාම නිසා පීඩා විඳිනු ලබයි. පසුගිය වසර දෙක තුළ වාර්තා වූ තෙල් මිලෙහි උච්චතම අගය වන ඇ.ඩො. 60 ඉක්මවා ගිය, බැරලයක මිල 2017 වසරේ දෙසැම්බර් මාසයේදී වාර්තා වුවද එය පසුගිය වසර 10 තුළ වාර්තා වූ ඉහළම අගය වන 2008 වසරේ පැවති බැරලයක් සඳහා වූ ඇ.ඩො. 141 ක අගයට වඩා සැලකිය යුතු මට්ටමක පහලින් පැවතුනි. ඉදිරියට පියවර තැබීමේදී, තෙල් අපනයනය මත දැඩිලෙස රඳා පවතින රටවල් ආර්ථික විවිධාංගිකරණයට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය. මැද පෙරදිග සහ උතුරු අප්‍රිකාවේ වර්ධන වේගය 1.8% දක්වා ලඟා වනු ඇති බවට සැලකේ. අනෙක් අතට, සාපේක්ෂව අවම වූ තෙල් මිල, තෙල් ආනයනය මත රඳා පවතින රටවල ජංගම ගිණුම් ශේෂය සඳහා යහපත් තත්ත්වයක් ඇති කරනු ඇත. අනෙකුත් භාණ්ඩ වල කාර්යසාධනය විවිධ වූ අතර, ආහාර සහ වටිනා ලෝහ මිල ගණන් ස්ථාවර මට්ටමක පවතිද්දී ලෝහ සහ බණිජ මිල ගණන් 10% සිට 50% දක්වා වූ පරාසය තුළ වර්ධනය විය. අඩු ආදායම්ලාභී රටවල්, තම ආර්ථිකයන් විවිධාංගිකරණය කිරීම, තිරසාර සංවර්ධන අරමුණු සඳහා ගමන් කිරීමේ ප්‍රගතිය සහ ඇතැම් භාණ්ඩ මිල ගණන් මන්දගාමී වීම ආදි වූ අභියෝගයන්ට මුහුණ දේ. මැද පෙරදිග සහ අප්‍රිකානු කලාපයේ බොහෝ රටවලට දේශපාලන අස්ථාවරත්වය, සිවිල් යුද්ධ සහ ත්‍රස්තවාදය යනාදියෙන්ද බලපෑම් එල්ල විය. දකුණු ආසියාතික රටවල් ස්වභාවික විපත්, අයවැය හිඟය සහ බදු ආදායම් හිඟවීම වැනි කරුණු මත පීඩා විඳින ලදී. ඇෆ්ගනිස්ථානය වැනි ඇතැම් රටවල් අවිනිශ්චිත ආරක්ෂක තත්ත්වයන් වලට මුහුණ දී ඇත.

සමස්ථයක් ලෙස, ගෝලීය වර්ධනයේ ප්‍රවනතාවය ඉහළ ගොස් ඇති අතර, 2018 සහ 2019 වසර වලදී 3.1% ක වර්ධනයක් අපේක්ෂා කෙරේ. වර්ධනය සඳහා වන අවදානම කෙටි කාලීනව මධ්‍යස්ථ වන නමුත් මධ්‍ය කාලීනව අඩු වී ඇති බව පෙනේ.

මූර්ත ද.දේ.නි. වර්ධන අනුපාතය



බොර තෙල් බැරලයක් සඳහා නාමික මිල



ශ්‍රී ලංකාවේ ආර්ථිකය

ශ්‍රී ලංකාවේ ආර්ථිකය, විශේෂයෙන්ම නියඟ සහ ගංවතුර වැනි අහිතකර කාලගුණික තත්ත්වයන් හේතු කොටගෙන මේ වසරේ බරපතල බාධකයන්ට මුහුණ දුන් අතර එමඟින් වර්ෂය සඳහා වූ මූලික පුරෝකථන අඩු මට්ටමකට ගෙන ඒම සඳහා සංශෝධනයන් සිදු වී ඇත. වසර සඳහා ද.දේ.නි. යේ වර්ධනය 3.1% ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කෘෂිකාර්මික අංශයේ කටයුතු සඳහා කාලගුණ තත්ත්වයන් බලපෑම් එල්ල කරද්දී කර්මාන්ත සහ සේවා යන අංශ කෙසේ නමුදු, සාපේක්ෂව යහපත් තත්ත්වයක් පෙන්නුම් කරන ලදී. විශේෂයෙන්ම, මූල්‍ය සේවා, විදුලි සංදේශ හා වෙළඳ කටයුතු වල කාර්යසාධනය කැපී පෙනේ.

වසර තුළදී, රටේ තරඟකාරී වාසි වැඩිදියුණු කිරීම මඟින් ආයෝජන ආකර්ශණය කර ගැනීම සඳහා සහ වර්තමාන ආයෝජකයින් හරහා සෘජුවම සහ ඔවුන්ගේ බාහිර සම්බන්ධතා ජාලය උපයෝගි කරගනිමින් යන දෙයාකාරයෙන්ම අතිරේක ආයෝජන ගෙනඒම සඳහා නව ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. ආයෝජන වැඩිදියුණු කිරීම සඳහා නව විනිමය පනත හරහා විදේශ විනිමය රෙගුලාසි ද ලිහිල් කර තිබේ.


පසුගිය වසර සමඟ සැසඳීමේදී, 2017 වසර තුළ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 2% කින් අවප්‍රමාණය විය. ඉහළ නගින ආනයන, ණය වාරික ගෙවීම සහ විදේශ ආයෝජකයින් රාජ්‍ය සුරැකුම් මත ඇති ඔවුන්ගේ ආයෝජන ඉවත්කර ගැනීම වැනි කරුණු මත මූලිකවම පිටතට ගලා යෑම් වැඩි විය. කෙසේ වෙතත්, පසුකාලීනව කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත ලැබුනු ශුද්ධ ලැබීම් සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොල තුළ යළි කරන ලද ආයෝජනයන් හේතුවෙන් විනිමය අනුපාතය මත පීඩනය අඩු විය. 2017 දෙසැම්බර් මාසයේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ අරමුදලේ සතරවන කොටස ප්‍රදානය කිරීම සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය නිකුත් කිරීම මඟින් රුපියල තවදුරටත් අවප්‍රමාණය වීම ලිහිල් විය. රටේ ණය ශ්‍රේණිගත කිරීම වසර තුළදී හිතකර ලෙස සංශෝධනය විය. ෆිච් රේටින්ස් ආයතනය ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම B + Negative සිට Stable දක්වා 2017 පෙබරවාරි මස තුළදී සංශෝධනය කරන ලද අතර එස් ඇන්ඩ් පී රේටින්ස් ආයතනයද ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම B + Negative සිට Stable දක්වා 2017 නොවැම්බර් මාසයේදී ඉහළ නංවන ලදී.

අපගේ අපනයන ආදායම 2016 වසරට සාපේක්ෂව 10% ක වර්ධනයක් පෙන්නුම් කරමින් ඇ. ඩොලර් බිලියන 11.4 ක අගයක් වාර්තා කරන ලදී. යුරෝපා හවුල විසින් ජී එස් පී (GSP) සහනය නැවත ලබාදීම සහ රුපියල අවප්‍රමාණය වීම මීට හේතු සාධක වූ ප්‍රධාන කාරණා විය. කෙසේ වෙනත්, අයහපත් කාලගුණික තත්ත්වයන් හේතු කොටගෙන ඇතිවූ අමතර ආනයනයන් සහ විදේශීය ශ්‍රමිකයන්ගේ මුදල් ප්‍රේෂණය වීම් පහත වැටීම යන කාරණා දෙකෙහිම බලපෑම හේතුකොටගෙන අපනයන වැඩිවීමේ වාසිය ඉවත් වූ අතර වඩාත් අහිතකර ගෙවුම් ශේෂ තත්ත්වයක් ඇති විය. විදේශීය ශ්‍රමික ප්‍රේෂණ සඳහා ආර්ථික තත්ත්වයන් සහ මැද පෙරදිග කලාපයේ භූගෝලීය හා දේශපාලනික ආතතීන් යන කරුණු මත අහිතකර බලපෑම් එල්ල විය.


දැඩි මූල්‍ය ප්‍රතිපත්ති සහ ණය වර්ධනය අඩුවීම් හමුවේ වුවද 2017 වසර තුළදී උද්ධමනය 7.3% මට්ටම දක්වා ලඟා විය. අයහපත් කාලගුණික තත්ත්වය නිසා ඇතිවූ ආහාර මිල ඉහළයාම, ජාත්‍යන්තර භාණ්ඩ මිල ගණන් ඉහළයාම, රුපියල අවප්‍රමාණය වීම සහ වක්‍ර බදු ඉහළ නැංවීම ආදිය මේ සඳහා බලපෑ ප්‍රධාන සාධක වේ. කෙසේ වෙතත්, නම්‍යශීලි උද්ධමන ඉලක්ක කිරීමේ රාමුවක් (FIT) වෙත සංක්‍රමණය වීම අනාගතයේදී වඩා හොඳින් උද්ධමනය පාලනය කිරීම සඳහා පහසුකම් සපයනු ඇත. FIT රාමුව තුළ ශ්‍රී ලංකා මහ බැංකුව 4-6% වූ උද්ධමන අනුපාතයක් ඉලක්ක කර ඇත. රටෙහි දළ නිල සංචිත 2016 අගදී පැවති ඇ. ඩොලර් බිලියන 6.0 සිට 2017 වසර අග වන විට ඇ. ඩොලර් බිලියන 7.9 ක් දක්වා වැඩි වී ඇත.

2017 වර්ෂය තුළදී ආර්ථික වර්ධනයේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් නොකලද වසර සඳහා ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් 9% ක් වාර්තා කල මූල්‍ය අංශය ශක්තිමත් කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී. බැංකු ක්ෂේත්‍රයේ බදු පසු ලාභය 2016 ට සාපේක්ෂව 18% ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කරමින් රු. බිලියන 194.7 ක් දක්වා ලඟා විය.

ද.දේ.නි. වර්ධන අනුපාතය



රුපියල් ඇ. ඩොලර් විනිමය අනුපාතය – මාසය අවසන අගය (2017)



බැංකු ක්ෂේත්‍රය


2017 වර්ෂය තුළදී ආර්ථික වර්ධනයේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් නොකලද වසර සඳහා ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් 9% ක් වාර්තා කළ මූල්‍ය අංශය ශක්තිමත් කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී. බැංකු ක්ෂේත්‍රයේ බදු පසු ලාභය 2016 ට සාපේක්ෂව 18% ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කරමින් රු. බිලියන 194.7 ක් දක්වා ලඟා විය. ශුද්ධ පොළී ආදායම 2016 වසරට සාපේක්ෂව 12% කින් වර්ධනය වූ අතර එය රු. බිලියන 341.6 ක් විය. මුළු ශුද්ධ වත්කම් අගය 2017 අග වන විට රු. ට්‍රිලියන 10.3 ක් වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව 14% ක වර්ධනයකි. බැංකු ක්ෂේත්‍රය, වත්කම්වල ගුණාත්මකභාවය, ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා මට්ටමෙහි වර්ධනය, නියාමන අවම මට්ටමට වඩා ඉහළ අගයක රඳවාගෙන ඇත. අරමුදල් සඳහා වූ ප්‍රධාන මූලාශ්‍රය වනුයේ තැන්පතු වන අතර එය 2017 දී රු. ට්‍රිලියන 7.4 ක් දක්වා 18% කින් වර්ධනය විය. ණය සහ අත්තිකාරම් වසර තුළදී 16% කින් වර්ධනය වී ඇති අතර එය රු. ට්‍රිලියන 6.4 ක් දක්වා ලඟා වී ඇත. ඉහළ පොළී අනුපාත තත්ත්වයක් මධ්‍යයයේ වුවද ආර්ථිකයේ සියලු අංශ වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

වර්ෂය තුළ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගනු ලැබූ විවිධ පියවරයන්, මූල්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයට මග පාදා ඇත. විදේශ විනිමය ගනුදෙනු ලිහිල් කරන ලද නව විදේශ විනිමය පනත සහ බැංකු නොවන මූල්‍ය ආයතන නියාමනය කිරීමේ රාමුව ශක්තිමත් කිරීම මෙයට ඇතුලත් වේ. වසර තුළදී, කර්මාන්තයේ ප්‍රාග්ධන හා ද්‍රවශීලතා අවශ්‍යතාවයන් තවදුරටත් දැඩි කරන නව බාසල් III රෙගුලාසි බලාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී පියවර ගැනීමට සිදු විය. කර්මාන්තය ශ්‍රී.ලං.මූ.වා.ප්‍ර. 9 ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම් වෙමින් පවතින අතර එතුළින් හානිකරණ ප්‍රතිපාදන සඳහා ප්‍රධාන වශයෙන් බලපෑම් සිදු කෙරේ.


ශ්‍රී ලංකා මහ බැංකුව පොළී අනුපාත ඉහළ මට්ටමක පවත්වා ගැනීම මඟින් මූල්‍ය ප්‍රතිපත්තිය තදින් ක්‍රියාත්මක කරන ලදී. 2017 මාර්තු මස සිට නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙලින් 7.25% සහ 8.75% දක්වා පදනම් ඒකක 25 කින් වැඩි කරන ලදී.

ජාත්‍යන්තර සංවර්ධන ආයතනය මඟින් මූල්‍ය ප්‍රතිපාදන සපයන ලද මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය යටතේ මූල්‍ය ක්ෂේත්‍රයේ තවත් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වනු ඇත. වසර 5 ක් පුරා ව්‍යාප්තව පවතින මෙම ව්‍යාපෘතිය යටතේ නියාමන රාමුව සහ මූල්‍ය යටිතල පහසුකම් නවීකරණය කරනු ලැබේ. මෙමඟින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්හට හා කුඩා ව්‍යවසායකයින්හට දැරිය හැකි මූල්‍යමය පහසුකම් සඳහා ප්‍රවේශය ලබා ගැනීමේ හැකියාව වැඩි කරනු ඇත.


බැංකු ක්ෂේත්‍රයේ තැන්පතු




බැංකු ක්ෂේත්‍රයේ ලාභදායීතාව



බැංකු ක්ෂේත්‍රයේ වත්කම්



බැංකු ක්ෂේත්‍රයේ ණය සහ අත්තිකාරම්





එකතු කළ අගය මත වාර්තාව

බැංකුවේ අගය එක්කිරීම සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් සඳහා එම අගය විසර්ජනය වන ආකාරයෙහි විශ්ලේෂණය පහතින් දැක්වේ.

	2017 රු. මිලියන	2016 රු. මිලියන	වෙනස %
එකතු කළ අගය			
බැංකු සේවා කටයුතු සැපයීමෙන් ලද ආදායම	185,427	147,554	26
සේවා සැපයීම් පිරිවැය	(102,502)	(71,030)	44
බැංකු සේවා තුළින් එකතු කළ අගය	82,925	76,524	8
බැංකු සේවා නොවන ආදායම	3,784	6,568	(42)
ණය හා අනෙකුත් අලාභ සඳහා හානිකරණය	(9,341)	(4,397)	112
අගය එකතු කිරීම	**77,368**	**78,695**	**(2)**
අගය විසර්ජනය			
සේවකයන්ට			
වැටුප්, වේතන හා අනෙකුත් ප්‍රතිලාභ	16,996	16,844	1
රජයට			
ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ	12,346	17,346	(29)
ආදායම් බදු	8,929	6,452	38
මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද	7,249	6,265	16
	28,524	30,063	(5)
ප්‍රජාව වෙත			
සමාජ වගකීම් ව්‍යාපෘති	128	135	(5)
බාහිර අරමුදල් සපයන්නන්ට			
සෙසු ණය ගැනීම් උදෙසා පොළිය	15,714	18,239	(14)
නිකුත් කළ ණයකර සඳහා පොළිය	5,014	4,571	10
	20,728	22,810	(9)
ව්‍යාප්තිය හා වර්ධනය උදෙසා			
රඳවා ගත් ලාභය	8,966	7,445	20
ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය	1,925	1,453	32
විලම්බිත බදු	101	(55)	(286)
	10,992	8,843	24
	77,368	**78,695**	**(2)**

එකතු කල අගයේ බෙදීයාම





එකතු කළ ආර්ථික අගය

එකතු කළ ආර්ථික අගය මඟින් ආයතනයක සත්‍ය ආර්ථික ලාභය පෙන්නුම් කරයි. සංසන්දනාත්මක අවදානමේදී කොටස්හිමියන්ගේ අවම ප්‍රතිලාභය ඉක්ම වූ හෝ අඩු වූ ඉපැයුම් අගය සඳහා ඇස්තමේන්තුවක් මෙමඟින් ලබා දේ.

	2017 රු. මිලියන	2016 රු. මිලියන	වෙනස %
ආයෝජිත ප්‍රාග්ධනය			
කොටස්හිමියන්ගේ අරමුදලේ සාමාන්‍ය	102,002	87,167	17
එකතු කළා: ණය අලාභයන් සහ හානිකරණයන් සඳහා ප්‍රතිපාදනයන්හි එකතුව	57,179	47,832	20
	159,181	**134,999**	**18**
ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ			
බදු පසු ලාභය	21,312	24,791	(14)
එකතු කළා: ණය අලාභයන් සඳහා ප්‍රතිපාදන සහ අනෙකුත් අලාභයන්	9,341	4,397	112
අඩු කළා: ණය කපාහැරීම්	(1,181)	(31)	3,709
ආයෝජිත ප්‍රාග්ධනය මත මුළු ප්‍රතිලාභය	29,472	29,157	1
ආයෝජිත ප්‍රාග්ධනයෙහි ආවස්ථික පිරිවැය*	(16,003)	(13,396)	19
එකතු කළ ආර්ථික අගය	**13,469**	**15,761**	**(15)**

*මාස 12 බර තැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් අනුපාතය මත පදනම්ව ගණනය කරයි 2017 - 10.05% (2016 - 9.92%).

ව්‍යාපාර ආකෘතිය







මූල්‍ය ප්‍රාග්ධනය	නිෂ්පාදන ප්‍රාග්ධනය	ආයතනික ප්‍රාග්ධනය

ආදානය

බැංකුවේ මෙහෙයුම් ක්‍රියාවලිය සඳහා යෙදවුම් වනුයේ විවිධ වූ ප්‍රාග්ධනයන් සහ විවිධ ආකාරයෙන් ගොනු වී ඇති වටිනාකම් වේ. මෙම ප්‍රාග්ධනයන් සැලකීමේදී මූල්‍ය ප්‍රාග්ධනය, නිෂ්පාදිත ප්‍රාග්ධනය සහ ආයතනික ප්‍රාග්ධනය බැංකුවට අයත් එහි අභ්‍යන්තර ප්‍රාග්ධනයන් වේ. මානව ප්‍රාග්ධනය, සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය සහ ස්වභාවික ප්‍රාග්ධනය බැංකුවට පරිබාහිර ප්‍රාග්ධනයන් වේ.

- කොටස් ප්‍රාග්ධනය **රු. බිලියන 20.0**
- මුළු ස්කන්ධය **රු. බිලියන 111.2**
- මුළු තැන්පතු **රු. ට්‍රිලියන 1.5**
- මුළු ණය ගැනුම් **රු. බිලියන 265.2**

- දේපල සහ පිරියත වෙනුවෙන් සිදු කරන ලද ආයෝජන **රු. බිලියන 1.9**
- විශාල ප්‍රමාණයේ නවීකරණයන් වලට භාජනය කරන ලද **ශාඛාවන් 02**
- වසර තුළ නවීකරණය කරන ලද **ශාඛා 97**
- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් මත සිදු කරන ලද ආයෝජන **රු. බිලියන 1.7**

- සන්නාම නාමය වෙනුවෙන් සිදු කරන ලද ආයෝජනයන් **රු. බිලියන 1.2**
- ශක්තිමත් ලෙස ස්ථාපිත කරන ලද යහපාලන සංස්කෘතිය
- **වසර 81,000** ක් ඉක්මවූ ආයතනගත දැනුම

මෙහෙයුම් ක්‍රියාවලීන්

යහපාලන සහ

තැන්පතුකරුවන් සහ ණය ඉල්ලුම්කරුවන්, ආනයනකරුවන් අපනයනකරුවන් සහ ණය ලබාදෙන්නන්, විදේශීය රටවල සේවය කරමින් රටට විදේශ විනිමය ප්‍රේෂණය කරන්නන් යනාදි වූ මූල්‍ය සේවා අවශ්‍ය වන්නා වූ පාර්ශවකරුවන් අතර අතරමැදියකු ලෙස බැංකුව කටයුතු කරනු ලැබේ. එමෙන්ම බැංකු විසින් කෙටි කාලීන තැන්පතු දිගු කාලීන ණය අත්තිකාරම් බවට පත් කරනු ලැබේ. ණයගැතියන්ගෙන් සහ ආයෝජන මගින් අයකරගත් පොළී ආදායම සහ ණයහිමියන්ට සහ තැන්පතුකරුවන් වෙනුවෙන් ගෙවන ලද පොළී වියදම් අතර වෙනස ශුද්ධ පොළී ආදායම මගින් නිරූපනය වන අතර 2017 වර්ෂයේ දී මෙය මුළු මෙහෙයුම් ආදායමෙන් 78% ක් නිරූපනය කරන ලදී. (2016 වසරේදී 75%) මෙහෙයුම් ආදායම සමන්විත වන ඉතිරි 22% ක (2016 වසරේදී 25%) ගාස්තු මත පදනම් වූ සේවාවන් සහ වෙළඳ ගනුදෙනු මත ඉපයූ ආදායම් වේ.

නිමැවුම්

නිමැවුම් යනු අපගේ මෙහෙයුම් ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස විවිධ ආකාර වලින් නිර්මාණය වන වටිනාකම් සමුදායකි.

- බදු පසු ලාභය **රු. බිලියන 21.3**
- ලාභාංශ ගෙවීම් **රු. බිලියන 12.3**
- ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය සහ වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභය **20.9%** සහ **1.7%**

- ශාඛා **578**
- සීමිත සේවාවන් සහිත ශාඛා **48**
- ස්වයංක්‍රිය මුදල් ගැනුම් යන්ත්‍ර **764**
- ස්වයංක්‍රිය මුදල් තැන්පතු යන්ත්‍ර **168**
- ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන **14**
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන **15**
- ජංගම බැංකු රථ **02**

- මෙහෙයුම් වැඩිදියුණු කිරීම්
- ශ්‍රී ලංකාවේ අංක 01 කේ සන්නාම නාමය
- සන්නාම වටිනාකම **රු. බිලියන 40.6**

ප්‍රතිඵල

ප්‍රතිඵල යනු විවිධ වූ නිමැවුම් මගින් ගොඩනැගුණු විවිධ වූ ප්‍රාග්ධනයන් හා සම්බන්ධව කාර්යසාධනය මැනිය හැකි නිර්ණායකයන් වේ.

- ලාභය, තැන්පතු ප්‍රමාණය, ණය සහ අත්තිකාරම් සහ වත්කම් මත ශ්‍රී ලංකාවේ **අංක 01 බැංකුව**
- ශ්‍රී ලංකාවේ රජය වෙනුවෙන් **රු. බිලියන 28.5** ක් ලාභාංශ සහ බදු ලෙස ගෙවීම් සිදු කරන ලදී
- පොළී ලෙස තැන්පත්කරුවන් වෙනුවෙන් **රු. බිලියන 92.2** ගෙවන ලදී
- ණයකර නිමිකරුවන් සඳහා **රු. බිලියන 5.0** ක් පොළී ගෙවීම්
- ශ්‍රී ලංකාවේ රජයේ සුරැකුම්පත් වල **රු. බිලියන 516.5** ආයෝජනය කරමින් ජාතික අවශ්‍යතාවයන් සහිත මහා පරිමාණ යටිතල පහසුකම් සඳහා රජයට අවශ්‍ය අරමුදල් සම්පාදනයට දායක වීම.

- ශ්‍රී ලංකාව තුළ විශාලතම මූල්‍ය ආයතනය
- විවිධ වූ ක්‍රම මගින් ගනුදෙනුකරුවන් හා සම්බන්ධ වීමේ මධ්‍යස්ථාන 1,589
- සෑම තරාතිරමකම ගනුදෙනුකරුවන් හා සම්බන්ධවීම අරමුණු කරගත් ශාඛා සහ ඩිජිටල් සේවා වලින් සමන්විත වූ සමබර ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන ජාලයක්

- උසස්ම තත්ත්වයේ යහපාලන මූලධර්මයන් පිළිපැදීම්
- අනුකූලතාව හා විනිවිද බව මත පදනම් වූ සංස්කෘතියක්
- ශ්‍රී ලංකාව තුළ ශක්තිමත්ම සන්නාම නාමය





මානව ප්‍රාග්ධනය	සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය	ස්වභාවික ප්‍රාග්ධනය

බැංකුව විසින් මෙම සියලුම ප්‍රාග්ධනයන් එටිනාකම් උත්පාදනය කිරීමේ ක්‍රියාවලිය සඳහා යොදවනු ලැබේ. ව්‍යාපාර මෙහෙයුම් ක්‍රියාවලිය තුළදී ප්‍රාග්ධනයන් යොදාගනිමින් එම ප්‍රාග්ධනයන් නව ආකරයන්ට නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලැබේ.

මානව ප්‍රාග්ධනය

- වසර 20 කට වැඩි පළපුරුද්දක් සහිත සේවක සංඛ්‍යාව - **1,336**
- නව බඳවා ගැනීම් **534**
- සේවා උසස් කිරීම් **1,831**
- පුහුණු පැය ගණන **11,884**
- පුහුණු කිරීම් සඳහා ආයෝජනය **රු. මිලියන 322.0**

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

- "B app" ජංගම බැංකුකරණ යෙදුම හඳුන්වාදීම.
- අන්තර්ජාල බැංකුකරණ පහසුකම නව පහසුකම් සහිතව නැවත එළි දැක්වීම
- ''මිතුරු'' ශුද්ධ මූල්‍ය ණය ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා **රු. මිලියන 237.2**

ස්වභාවික ප්‍රාග්ධනය

- තිරසාරත්ව අංශය පිහිටවීම
- වසර තුළ සූර්ය බලශක්ති පැනල **ශාඛා 14** ක් තුළ ස්ථාපනය
- බැංකුව සඳහා පාරිසරික සහ සාමාජීය කළමනාකාරිත්ව ප්‍රතිපත්තිය එලි දැක්වීම
- හරිත ගොඩනැගිලි සංකල්පය ශාඛා සඳහා හඳුන්වාදීම

අවදානම් කළමනාකාරිත්ව රාමුව

රාජ්‍ය බැංකුවක් ලෙස අපට හුදු ව්‍යාපාර අරමුණකට එපිට ගිය සමාජීය වගකීමක් පවතී. මෙම වගකීම පිළිබඳ සැලකිල්මත් වෙමින් බැංකුව සෑම විටම තම ශුද්ධ පොළී ආදායම උපරිම අගයෙහි නොව ප්‍රශස්ථ අගයක පවත්වා ගනිමින් සාම්ප්‍රදායික බැංකුකරණයට එහා ගිය සමාජ හා පාරිසරික වගකීමක් ඉටු කරමින් සිටි.

සේවකයන්

- සේවකයන් සඳහා ප්‍රතිලාභ **රු. බිලියන 17.0**
- සේවකයකු උපයන ලාභය **රු. මිලියන 4.0**
- **7,587** ක ක්‍රියාශීලී සේවක ප්‍රජාවක්

සමාජය

- විවෘත කරන ලද නව තැන්පතු ගිණුම් සංඛ්‍යාව - **548,630**
- **රු. ට්‍රිලියන 1.2** ක් වූ මුළු ණය සහ අත්තිකාරම් ප්‍රමාණයෙන් **රු. බිලියන 60.0** ක් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා ප්‍රදානය කර තිබීම
- නියෝජිත ආයතන හා පවතින සම්බන්ධතා - **859**
- ගනුදෙනුකරුවන් ප්‍රමාණය **මිලියන 13**

පරිසරය

- හරිත ගොඩනැගිලි සංකල්පය යටතේ GBC SL ආයතනය මගින් රන් සම්මානයෙන් කැකිරාව ශාඛාව පිදුම් ලැබීම
- ඩිජිටල්කරණ ක්‍රියාමාර්ග ඔස්සේ A4 කඩදාසි **259,892** ක ඉතිරියක්
- පුනර්ජනනීය බලශක්ති ආශ්‍රිත ණය සහ අත්තිකාරම් **රු. මිලියන 640.6**
- සූර්ය බලශක්ති උත්පාදනය **515 Kwh**
- පාරිසරික අනුකූලතා සඳහා දැඩි පරීක්ෂාවට භාජනය වූ ණය සහ අත්තිකාරම් **362** ක් (ශාඛා ජාලය)

ප්‍රතිඵල

- විශිෂ්ට වෘත්තීය සංවර්ධන අවස්ථා
- සේවය හැර යාමේ අනුපාතය **0.3%**

- විශාලතම ගනුදෙනුකාරභවතුන් සංඛ්‍යාව සහිත බැංකුව වීම
- තිරසාර සංවර්ධන ඉලක්ක සඳහා කැපවීම
- මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථායිතාව සහ ආර්ථික වර්ධනය සඳහා දායකවීම
- ඒකාබද්ධ සැපයුම් ජාලයක්
- සැපයුම්කරුවන්ගේ දියුණුව සහ වර්ධනය
- තෘප්තිමත් සහ වර්ධනය වන ගනුදෙනුකාර පදනම
- විශාල නියෝජිත ජාලයක් සහිත බැංකුවක් වීම

- **ශාඛා 20** ක් සූර්ය බල පැනල මගින් විදුලි බල අවශ්‍යතා සපුරා ගනු ලැබේ
- පුනර්ජනනීය නොවන ප්‍රභවවලින් නිපදවන විදුලිය භාවිතය **2%** කින් අවම වීම
- කඩදාසි භාවිතය අවම වීම

ඕනෑම රටක ජාතික ආර්ථිකය කෙරෙහි බැංකු පද්ධතිය මඟින් ලබා දෙනුයේ අති මහත් දායකත්වයකි. එමෙන්ම ඕනෑම රටක ව්‍යාපාර හා වාණිජ අංශයේ ක්‍රියාකාරිත්වය හා පැවැත්ම කෙරෙහි මෙන්ම රටක ආර්ථිකයේ දිශානතිය කෙරෙහිද බැංකු පද්ධතිය මඟින් ලබා දෙනුයේ අති මහත් දායකත්වයකි. වාණිජ ගනුදෙනු සඳහා පහසුකම් සලසන අතරමැදියෙකු ලෙස ලංකා බැංකුව මඟින් සිදුකරන තම ප්‍රධාන ව්‍යාපාරය අන් බැංකු හා සමාන වේ. බැංකුව එයින් සංසන්ධනාත්මකව අඩු අවධානම් ආයෝජන සඳහා කැමැත්තක් ඇති ඒක පුද්ගල ගනුදෙනුකරුවන්ගෙන් සහ ආයතන වෙතින් ආරක්ෂාව සහ සතුටුදායක පොළියක් ලබාදීමේ පොරොන්දුව මත තැන්පතු භාරගනු ලැබේ. මෙම තැන්පතු ඉන්පසුව, දැරිය හැකි එනමුත් බැංකුවටද සාධාරණීකරණය කල හැකි ලාභයක් සහිත පොළී අනුපාතයකට ඒක පුද්ගල ගනුදෙනුකරුවන් සහ ආයතන සඳහා ණය සහ අත්තිකාරම් වශයෙන් ලබා දෙනු ලැබේ.

මෙම මූලික ක්‍රියාවලිය හා බැඳී ඇති බැංකුව විසින් සලකා බලනු ලබන අනෙකුත් ප්‍රධාන සාධකයන් කිහිපයක් වේ. තැන්පතුකරුවන් විසින් බැංකුව සඳහා තැන්පතු ලබාදෙන කාලසීමාවත්, බැංකුව මඟින් එම මුදල් ණය සහ අත්තිකාරම් ලෙස ගනුදෙනුකරුවන් සඳහා ලබාදෙන කාල සීමාවත් එකිනෙකට වෙනස් වේ. සාමාන්‍යයෙන් තැන්පතු කෙටිකාලීන වන අතර ණය සහ අත්තිකාරම් දිගු කාලීන වේ. මේ නිසා බැංකුව විසින් තම මූල්‍ය ප්‍රවාහ නිසිලෙස කළමනාකරණය කල යුතු අතර එමඟින් ගනුදෙනුකරුවන් විසින් ඉල්ලා සිටින අවස්ථාවන්හිදී තැන්පතු මුදල් නැවත ලබා දීමට එමඟින් බැංකුව බැඳී සිටිය යුතු වේ. බැංකු ව්‍යාපාරය යනු ආවේණික අවදානමක් සහිත ව්‍යාපාරයක් වේ. ණය ගැතියන් ණය පැහැර හැරීම මෙන්ම පොළී අනුපාත ඉහළ හෝ පහළ යාම සැමවිටම බැංකු පද්ධතිය මුහුණ දෙන අවදානමක් වේ. මීට අමතරව මුළු කර්මාන්තය සහ මුළු ආර්ථිකය කෙරෙහිම බලපෑම් ඇති කරන සාර්ව ආර්ථික දර්ශකයන්ගි විචල්‍යන්ද බැංකු පද්ධතිය කෙරෙහි පුළුල් වූ බලපෑම් ඇති කරනු ලැබේ. අවදානම සහ ආදායම කාර්යක්ෂමව සහ වඩා වගකීම් සහගතව තුලනය කිරීම මේ නිසා අපේක්ෂා කෙරේ. බැංකුවට ආවේනික වූ අවදානම් කළමනාකරණය සඳහා වන විධි සහ ක්‍රියාපටිපාටින් බැංකුවේ ආයතනික යහපාලන තන්ත්‍රයට ඇතුලත් කර ඇත. බැංකුවට පැහැදිලිව අර්ථ දක්වා ඇති අවදානම් අභිරුචියක් ඇති අතර, ඒ ඔස්සේ බැංකුව විසින් ලබා ගනු ලබන උපරිම අවදානම් සීමාවන්ද අර්ථ දක්වා ඇත. ණය සහ අත්තිකාරම් මෙන්ම ආයෝජන ක්‍රමෝපායන්ද තීරණය කරනුයේ මේ අවදානම් අභිරුචිය පදනම් ව වේ.

බැංකුව විසින් තම ප්‍රධාන ව්‍යාපාරයට අමතරව ණය ලබා දීමට පරිභාහිරව විදේශ විනිමය ගනුදෙනු ආදී වූ ගාස්තු මත පදනම් වූ සේවාවන් හා මෙහෙයුම් ද සලසනු ලැබේ. ශ්‍රී ලංකාවට පැමිණෙන ආමුක ප්‍රේෂණ වලින් 45% කට අධික ප්‍රමාණයක් ලංකා බැංකුව හරහා ප්‍රේෂණය වන අතර ඒ ඔස්සේ අප අපගේ විදේශීය රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකික ප්‍රජාව කෙරෙහි සුවිශේෂී සේවාවක් සලසනු ලැබේ. උපලබ්ධිය සඳහා පවතින අපගේ ආයෝජන කළඹ මූලික වශයෙන්ම සමන්විත වනුයේ භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර මඟිනි. මෙම ආයෝජන අවදානමක් රහිත රජයේ සුරැකුම්පත් වන අතර එම නිසා ප්‍රාග්ධනය සඳහා වන බලපෑම අවම වේ.

ලංකා බැංකුව රාජ්‍ය බැංකුවක් ලෙස, යම් යම් සමාජීය වගකීම් සමුදායක් සහිත වේ. එම නිසා බැංකුවට ගිණුම්ගත ලාභය යන පටු අරමුණ පමණක්ම සහිතව ක්‍රියාත්මක විය නොහැකිය. එම නිසා බැංකුව විසින් ව්‍යාපාරික අරමුණු මෙන්ම සමාජීය අරමුණුද තුලනය වන්නාවූ වඩා යෝග්‍ය ප්‍රතිලාභ අරමුණු කර ගත් ඉලක්ක කරා යා යුතු වේ. අපගේ ශුද්ධ පොළී ආදායම් අනුපාතය අනිකුත් බොහෝ බැංකු හා සැසඳීමේදී ඉතා අවම අගයක පැවතීම අපගේ ප්‍රතිලාභ අරමුණු හා අනිකුත් සමාජීය අරමුණු අතර අප පවත්වා ගන්නා තුලනාත්මක බව පැහැදිලි වන එක් සාධකයකි. තිරසාරකත්වය අපගේ ක්‍රමෝපායන් හා මුල්බැස ගත් සංකල්පයක් වේ. ආර්ථික, සමාජීය හා පාරිසරික අරමුණු ලඟා කර ගැනීම වස් හඳුන්වා දී ඇති තිරසාර සංවර්ධන ඉලක්ක අප අපගේ නිමැවුම් සේවාවන් හා ක්‍රියාවලින් සඳහා අන්තර්ග්‍රහණය කර ඇත. තිරසාරකත්වය අප අපගේ මූලික මෙහෙයුම් මත පමණක් නොව අපගේ මුළු වටිනාකම් උත්පාදනය කිරීමේ පටිපාටිය තුලට ප්‍රවලිත කර ඇත. විවිධ වූ ක්‍රියාකාරකම් ඔස්සේ අප එකිනෙකක් වූ තිරසාර සංවර්ධන ඉලක්ක ආමන්ත්‍රණය කර ඇති අතර බැංකුව විසින් කාන්තාවන්, යොවුන් පුද්ගලයන්, ළමුන් හා කුඩා කර්මාන්තකරුවන් ඇතුළු සමාජයේ වැඩි අවධානය අවශ්‍ය ප්‍රජාවන් සඳහා වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

නවීන ලෝකය තුළ තාක්ෂණය වේගයෙන් ප්‍රවලිත වෙමින් පවතින අතර, බැංකු මෙහෙයුම් කටයුතු ද ඊට අදාලව වෙනස්කම් වලට භාජනය වෙමින් පවතී. 30 කට අධික බැංකු ප්‍රමාණයක් සහිත වූ පරිසරයක ක්‍රියාත්මක විමේදී අපගේ වෙළෙඳපොල කොටස පවත්වා ගැනීමට නම් අප විසින් සැමවිටම ගනුදෙනුකරුවන්ගේ හෘද ස්පන්ධනයට සංවේදී වෙමින් ඒ ඔස්සේ නව මූල්‍ය සේවාවන් හඳුන්වා දීම සැමවිටම සිදු කළ යුතුවේ. ගනුදෙනුකරුවන් වේගයෙන් ස්වංක්‍රීය මුදල් ගැනුම් යන්තු හා මුදල් තැන්පතු යන්තු, අන්තර්ජාල බැංකුකරණය සහ ජංගම බැංකුකරණ යෙදවුම ඇතුළු නව තාක්ෂණික බැංකු ක්‍රමවේදයන් සඳහා නුරු වෙමින් පවතී. මෙය විශේෂයෙන්ම සහස්‍රක ගනුදෙනුකරුවන්ගේ හැසිරීම මඟින් නිරූපණය වූවද ඔවුන්ට පමණක් සීමා නොවේ. මෙම නව තාක්ෂණික ක්‍රියාවලින් සෑම වයස් කාණ්ඩයක්ම සහ සෑම සමාජීය තරාතිරමක් හරහාම පැතිරෙමින් පවතී. අප හා බැඳී සිටින සෑම තරාතිරමකම ගනුදෙනුකරුවන් බැංකුව විසින් හඳුන්වාදුන් ස්වංක්‍රීය මුදල් තැන්පතු යන්ත්‍රය ඉතා ඉක්මණින් වැලඳ ගැනීම මීට හොඳම උදාහරණයකි. අපගේ නව ලිපිගොනු කළමනාකරණ පද්ධතිය හරහා අප විසින් අපගේ සේවාවන් රැසක් ස්වංක්‍රීය කර ඇත. ණය සහ අත්තිකාරම් සඳහා අයඳුම්පත් යොමු කිරීම, ගිණුම් විවෘත කිරීම ආදිය මෙලෙස ස්වංක්‍රීය මෙහෙයුම් බවට පරිවර්තනය කර ඇත. කෙසේ නමුදු අප විසින් සැම විටම අපගේ ව්‍යාපාර ආකෘතිය සහ අපගේ සේවාවන් සහස්‍රක ගනුදෙනුකරුවන්ට මෙන්ම අප හා දීර්ඝ කාලයක් රැඳී සිටි ගනුදෙනුකරුවන්ට ගැළපෙන ලෙස සකසා ඇත.

වර්ෂ 1939 දී එවකට පැවති විදේශීය බැංකු මඟින් සේවාවන් සපයනු නොලැබූ ශ්‍රී ලාංකීය ව්‍යාපාර ප්‍රජාවට සේවය කිරීම සඳහා ඇරඹි ලංකා බැංකුව අද වන විට පුළුල් වූ පරාසයක සුවිශාල ගනුදෙනුකරුවන් පිරිසකට තම සේවාවන් සැපයීම දක්වා ව්‍යාප්ත වී ඇත. අතීතයේදී අපගේ වර්ධනය මූලික වශයෙන්ම රාජ්‍ය අංශය වටා කේන්ද්‍රගත වී තිබූ අතර අද වන විට එය ක්‍රමිකව වෙනස් වී ආයතනික හා සුළු හා මධ්‍ය පරිමාණ අංශ වලින්ද අපගේ වර්ධනය සඳහා විශාල දායකත්වයක් සපයනු ලැබේ. ශ්‍රී ලංකාව තුළ පවත්නා ආර්ථික ආකෘතිය ද මේ වන විට රාජ්‍යතන්ත්‍රය සහ විශාල ව්‍යාපාර මත පදනම් වූ ආර්ථික ක්‍රමයක සිට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මත පදනම් වූ ආර්ථික ක්‍රමයක් දක්වා පරිවර්තනය වෙමින් පවතී. ආර්ථිකය තුළ සිදුවන මෙම වෙනස් වීම් හා පදනම් ව අප විසින් අපගේ දිගු කාලීන තිරසාරත්වයද ඉලක්ක කර ගනිමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අපගේ දායකත්වය ඉහළ නංවා ඇත.

කුඩා හා මධ්‍ය පරිමාණ අංශය තුළ අප විසින් විවිධ වූ ගනුදෙනුකරුවන් සඳහා සේවාවන් සැපයීම වස් පුළුල් වූ පරාසයක සේවාවන් රැසක් හඳුන්වා දී ඇත. උදාහරණයක් වශයෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රය සඳහා අප විසින් වී ගොවීන්, කිරි ගොවීන්, තේ, පොල්, රබර් මෙන්ම තිරිඟු හා මිරිස් වැනි විවිධ වූ කෘෂි භෝග සඳහා වෙන් වෙන් එම භෝග වලට සුවිශේෂී වූ ණය ක්‍රම හඳුන්වා දී ඇත. අපගේ මෙහෙයුම් රාජ්‍ය, ආයතනික සහ කුඩා හා මධ්‍ය පරිමාණ යන සියලු අංශ කෙරෙහි විහිදීම හරහා අප අපගේ අවදානම් තුලනාත්මකව කළමනාකරණය කර ඇත.

ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුව වන අතරම තනි ආයතනයක් මඟින් උපයන උපරිම ලාභ ප්‍රමාණය උපයන ආයතනයද වේ. වර්ෂ 2017 දී බැංකුව විසින් උපයන ලද බදු පෙර ලාභය රු. බිලියන 30.3 ක් විය. ලංකා බැංකුව විසින් බදු සහ ලාභාංශ ලෙස රජයට ගෙවන ලද ලාභය රු. බිලියන 28.5 ක් විය. ලංකා බැංකුව සතුව ශාඛා 578 ක් සහ සීමිත සේවා සහිත ශාඛා 48 ක් පවතී. අපගේ විදේශීය ශාඛා මාලදිවයින, සිෂෙල්ස් රාජ්‍ය හා ඉන්දියාව (චෙන්නායි) යන රටවල පවතින අතර ලන්ඩන් නුවර පරිපාලිත ආයතනයක්ද පවතී. විදේශීය රටවල් වල අපගේ සේවාවන් ව්‍යාප්ත කිරීම සඳහා අපට ඇති හැකියාවන් අප විසින් නිරන්තරයෙන් අධ්‍යයනය කරමින් සිටී.

අපගේ ව්‍යාපාර ආකෘතිය අභ්‍යන්තර මෙන්ම බාහිර පරිසරයේ වෙනස්කම් සඳහා සංවේදී වන අතරම ඊට අනුකූලව පහසුවෙන් හැඩ ගැසිය හැකි ලෙස සැකසී ඇත. එමෙන්ම එම ආකෘතිය ආචාරධර්ම සහ තිරසාරකත්වය මත පදනම්ව ඇත. බැංකුව විසින් පොදු ජනතාවගේ මුදල් තැන්පතු ලෙස භාර ගන්නා අතර ණය සහ අත්තිකාරම් ලෙස නැවතත් එම මුදල් පොදු ජනයා වෙතට ලබා දේ. මෙම ක්‍රියාවලියේදී බැංකුව විසින් තම සමාජීය හා පාරිසරික වගකීම පිළිබඳවද සැලකිලිමත් වේ. එමෙන්ම අප රාජ්‍ය බැංකුවක් වීම හේතුවෙන්ම අප උපයන ලාභයද නැවතත් බදු සහ රජයට ගෙවන ලාභාංශ ලෙස මහජනතාව අතරටම බෙදී යයි. අප විසින් අපගේ සියලු ක්‍රියාකාරකම් ඔස්සේ අප රටේ ආර්ථික වර්ධනය සඳහා දායකත්වයක් සපයන

අතර අඩු පහසුකම් සහිත ජන කොට්ඨාශය නඟා සිටුවීම මෙන්ම ආදායම් හා සමාජ විෂමතා අවම කිරීම වැනි අංශ කෙරෙහිද පරිසර සංරක්ෂණය සඳහාද අපගේ දායකත්වය සපයනු ලැබේ. අප මෙතෙක් පසුකල සුවිශේෂී සංධිස්ථානයන් හා ලබා ගත් ජයග්‍රහණ සැලකීමේදී ලංකා බැංකුව ඉදිරියේදීද තව දුරටත් වර්ධනය වෙමින් තමාට මෙන්ම තම පාර්ශ්වකරුවන් වෙතද තව තවත් වටිනාකම් උත්පාදනය කරනු ඇති බවට කිසිදු සැකයක් නොමැත.

අපගේ 2018-2020 ආයතනික සැලැස්ම

ලංකා බැංකුව උපායමාර්ග ඔස්සේ දිවෙන බැංකුවක් වේ. අපගේ උපායමාර්ග අපගේ පසුගිය වකවානු තුළ අප ලබා ගත් වර්ධනයන්ට ඉමහත් පිටුවහලක් ලබා දී ඇත. අපගේ 2010 උපායමාර්ගික සැලැස්ම “One 10 twelve” මඟින් අප විසින් 2012 වන විට රු. ට්‍රිලියන 1.0 ක වත්කම් සහ රු. බිලියන 10.0 ක ලාභ අරමුණු ඉටුකරගැනීමේ අපගේ ඉලක්ක එලි දක්වන ලද අතර එම සියලු අරමුණු සැලසුම් කල දිනට ළඟා කර ගන්නා ලදී. වර්ෂ 2016 දී වත්කම්, තැන්පතු සහ ණය සහ අත්තිකාරම් යන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රධාන අංශ තුනෙහිම රු. ට්‍රිලියනයක ඉලක්ක ඉක්මවා යාමට අපට හැකි වීම මඟින් අප තවත් සංධිස්ථානයක් පසු කරන ලදී.

වර්ෂ 2017 දී අප අපගේ ආයතනික සැලැස්ම තවත් වසර තුනකට නිර්මාණය කරන ලදී. මෙම ක්‍රියාවලියේදී බැංකු පද්ධතිය තුළ සිදුවෙමින් පවතින සුවිශේෂී විකාශනයන්, තොරතුරු සහ සන්නිවේදන ක්ෂේත්‍රයේ සිදුවන නව වැඩිදියුණු වීම්, ජන විකාශනයන් වල වෙනස්වීම් ඔස්සේ සිදුවන ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් සහ දැඩි වෙළඳපොල තරඟකාරිත්වය යන සියලු කරුණු සැලකිල්ලට යොමු කරන ලදී. අපගේ තැන්පතු, අත්තිකාරම් ආදී වූ මූල්‍ය කළඹයන්, සේවාවන්, ව්‍යාප්තිය, සේවාවන්හි ගුණාත්මකභාවය මෙන්ම අපගේ අභ්‍යන්තරික මෙහෙයුම් හා ක්‍රියාපටිපාටීන්හිදී සුවිශේෂ වෙනස්කම් රැසක් සහිතව ඒ සියල්ල නව තලයකට පත් කල යුතු බවට අප විසින් අවබෝධ කරගෙන ඇති අතර අපගේ මෙම නව ආයතනික සැලැස්ම තුළට ඒ සඳහා අත්‍යවශ්‍ය වූ ප්‍රශස්ථ උපායමාර්ගයන් ඇතුලත් කර ඇත.

ගනුදෙනුකරුවා යනු අපගේ ව්‍යාපාරයේ ප්‍රධාන සාධකය වීම හේතුකොටගෙන අප විසින් ගනුදෙනුකාර සේවාවේ ගුණාත්මකභාවය සහ එහි ප්‍රමිතීන් ඉහළ තලයකට ගෙන ඒම අරමුණු කරන අතර මේ සඳහා සියලු ගනුදෙනුකාර සේවා මධ්‍යස්ථාන සඳහා ඉහළ පෙළේ ගුණාත්මක ගනුදෙනුකාර සේවාවක් සමාන ප්‍රමිතියකින් සැපයීම ස්ථාපනය කිරීම මඟින් ගනුදෙනුකරුවන්ට එක හා සමාන ඉහල ගනුදෙනුකාර සේවා අත්දැකීමක් සපයා දීම අපේක්ෂා කෙරේ.

අප සෑම ගනුදෙනුකරුවෙකුගේම අපේක්ෂාවන් මල්ඵල ගැන්වීම සඳහා කැපවන අතරම අපගේ ණය සහ අත්තිකාරම් වල ගුණාත්මක බව ඉහළ නැංවීමත්, ණය සහ අත්තිකාරම් ඉහළ කළමනාකාරිත්වයකින් යුතුව ලබාදිය හැකි මෙන්ම ලබා ගතහැකි, නව ණය සංස්කෘතියක් හඳුන්වා දීම මඟින්ද අප විසින් මේ සඳහා තවදුරටත් ක්‍රියාකරනු ඇත. මෙනිදී ශාඛා බැංකු, ආයතනික, සුළු හා මධ්‍ය පරිමාණ මෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය යන සියලු අංශයන්හි ගනුදෙනුකරුවන් සඳහා අපගේ අවධානය යොමුවන අතරම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් හි අංක 9 ට අනුකූල වෙමින් වත්කම් හි ගුණාත්මක භාවය ඉහල නැංවීම සඳහාද ඊට සමගාමීව කටයුතු කරනු ඇත.

නව ආයතනික සැලැස්මට අනුකූලව නව ව්‍යාපාර ආකෘතීන්ට අනුගත වෙමින් නව මෙහෙයුම් සහ ක්‍රියාපටිපාටි හඳුන්වා දීම මඟින්ද, ගනුදෙනුකාර සේවා සැපයීමේ ජාලයන් ව්‍යාප්ත කිරීම සහ ගෝලීය වෙළඳපොල සඳහා විවෘත වූ 24X7 බැංකු කටයුතු හඳුන්වා දීම ඔස්සේද අපගේ ව්‍යාප්තිය නව මානයන් සඳහා යොමු කිරීම අරමුණු වේ.

තාක්ෂණය යනු අද වන විට සෑම බැංකුවකටම තරඟකාරීත්වය තීරණය කරන ප්‍රධාන සාධකයක් වී ඇත. අද වන විට සහස්‍රක ගනුදෙනුකරුවන් අපගේ ගනුදෙනුකාර ප්‍රජාව තුළ සිඝ්‍රයෙන් විකාශනය වෙමින් පවතින වටපිටාවක් මත අපට ඔවුන්ගේ අපේක්ෂාවන් වලට අනුකූල සේවාවක් සැපයීම සඳහා ඉතා ඉහළම තත්ත්වයේ තාක්ෂණික පහසුකම් අත්‍යවශ්‍ය වේ. තාක්ෂණික යොදා ගැනීම් වර්ධනය වීමේදී ඒ සමඟම ඒ මඟින් ඇතිවන අවදානමද ඉහළ යයි. එම නිසා අප විසින් තවදුරටත් අපගේ අවදානම් කළමනාකරණයන් ඉහළ මට්ටමකට ගෙන ඒම තුළින් අපගේ මෙන්ම ගනුදෙනුකරුවන්ගේ වත්කම්වල සියලු වැදගත් සහ සංවේදී තොරතුරු ගබඩාවන්හිදී ද ආරක්ෂාව තවදුරටත් සහතික කිරීම සඳහා කැප වනු ඇත.

බැංකුවේ කාර්යක්ෂම සහ ඵලදායී මෙහෙයුම් සඳහා අපගේ පද්ධතීන් සහ ක්‍රියාපටිපාටීන්හි අඛණ්ඩ මෙන්ම කිසිදු බිඳ වැටීමක් නොමැති පූර්ණ ක්‍රියාකාරිත්වයක් පැවතීම අත්‍යවශ්‍ය වේ. අපගේ නව ආයතනික සැලැස්ම මඟින් ගනුදෙනුකරුවන්ට මෙන්ම සේවකයන්ට සිදු වන අවහිරතාව හඳුනා ගනිමින් එම පද්ධතීන් හා ක්‍රියාදාමයන් යාවත්කාලීන කිරීම සහ අවශ්‍ය වෙනස්කම් හඳුන්වා දීම අරමුණු කෙරේ.

කෙසේ නමුත් තාක්ෂණයට අප ගෙන යා හැකි දුර සැමවිටම තීරණය වනුයේ නිවැරදි මානව යෙදවීම් තුලින් බව අපගේ දැඩි විශ්වාසයයි. මේ හේතුව නිසාම අප අපගේ සේවක ප්‍රජාව බල ගැන්වීම සඳහා විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ. වේගයෙන් වෙනස්වන ව්‍යාපාරික ලෝකය හා උරින් උර ගැටීම සඳහා අවශ්‍ය වෘත්තීය නිපුණතාවන්, දැනුම මෙන්ම ගුණාංගද අප සේවක ප්‍රජාව තුළ තව තවත් වර්ධනය කිරීම සඳහා අප කැපවී සිටිමු. මේ නිසා සේවක ප්‍රජාව තුළ වෘත්තීය නිපුණතාවය මෙන්ම පුද්ගල ගුණාංග වර්ධනය කිරීමටද අප එක හා සමාන වටිනාකමක් ලබා දී ඇත.

බැංකුවේ මූල්‍ය ස්ථායීතාව මෙන්ම පිළිගැනීම ආරක්ෂා කර ගැනීම සඳහා ආයතනික යහපාලන මෙන්ම සදාචාර සම්පන්න බවද සැමවිටම අත්‍යවශ්‍ය වේ. දැනටත් අප මේ අංශයන්හි ඉතා ඉහළ ප්‍රමිතීන් පවත්වා ගත්තද තවදුරටත් එම අංශයන්හි ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා ආයතනික යහපාලනය හා සදාචාර සම්පන්න විධි ක්‍රම පිළිබඳ වූ ලොව පිළිගත් ඉහළම ප්‍රමිතීන් හා ළඟාවීම අපගේ ඉලක්ක බවට පත්කරගෙන ඇත. එමෙන්ම ආර්ථික, සමාජීය හා පාරිසරික සාධක මත සාධාරණීකරණය කල හැකි සමබරතාවක් පවත්වා ගැනීම අරමුණු කර ගනිමින් අප විසින් තිරසාරකත්වය සඳහා වූ අපගේ දැක්ම නවීන වෙනස්කම් වලට භාජනය කරමින් නව ජවයකින් පුළුල් කර ගනිමින් සිටී.

මේ සියලු කර්තව්‍යයන් හි අවසාන ප්‍රතිඵලය වනුයේ අපගේ සන්නාම නාමය තව තවත් වර්ධනය කිරීම වේ. සන්නාම නාමය යනු සහස්‍රක මෙන්ම දීර්ඝකාලීන ගනුදෙනුකරුවන් මෙන්ම සාමාන්‍ය පොදු මහ ජනතාව අතරද අප පිළිබඳව ඇති පිළිගැනීම වේ. මේ අනුව අපගේ නව ආයතනික සැලැස්ම ඔස්සේ අප විසින් අපගේ සන්නාම නාමය වර්ධනය කරමින් වත්කම් සහ ලාභ තවතවත් වැඩිදියුණු කරමින් අපගේ පාර්ශ්වකරුවන්ට තවදුරටත් ඉහළ ප්‍රතිලාභ අත්කර දෙමින් ඉදිරියටම යෑම අපේක්ෂා කෙරේ.



බැංකුව අනාගතය සඳහා ප්‍රතිනිර්මාණය සහ බලගැන්වීම

තිරසාර පැවැත්ම සඳහා අපගේ කැපවීම

ලංකා බැංකුවේ තිරසාර ප්‍රතිපත්තිය

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල 2016 සැසිවාරයේදී ප්‍රකාශයට පත් කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක ලංකා බැංකුව තම උපායමාර්ග සඳහා ඇතුළත් කරගෙන ඇත. පුළුල් පරාසයක පැතිරුණ ආර්ථික සමාජීය ගැටළු, දිළිඳුකම, ආහාර සුරක්ෂිතතාව, අධ්‍යාපනය, සෞඛ්‍ය, පාරිසරික ගැටළු, දේශගුණික විපර්යාස සහ යහපාලනය පිළිබඳව අවධානය යොමු කරන තිරසාර සංවර්ධන ඉලක්ක 17 කින් සමන්විත වේ. තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීමේ වගකීම රජයන් පමණක් නොව ව්‍යාපාර කෙරේද ඇති බව පිළිගැනීමයි. බැංකුව, තිරසාර සංවර්ධන අරමුණු බැංකුවේ කටයුතු හා අන්තර්ග්‍රහණය කර ඇති අතර එකිනෙකක් හා අනුගත වූ අයුරු අදාළ ප්‍රාග්ධනයන් යටතේ දක්වා ඇත.


ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද මහා කළමනාකාරතුමා විසින් මූලිකත්වය හොබවන තිරසාර කමිටුවට මෙම තිරසාර සංවර්ධන ඉලක්ක හා බැඳුනු සංවර්ධනයක් ළඟා කරගැනීමේ වගකීම පවරා ඇත. මෙම කමිටුවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ තිරසාර සංවර්ධන අරමුණු බැංකුවේ මූලික ව්‍යාපාර කටයුතු හා අන්තර්ග්‍රහණය කිරීම සහ ඒ හරහා සෑම ව්‍යාපාර කටයුත්තක දීම කෙටිකාලීනව මෙන්ම දිගුකාලීනව ද ඒ මගින් සිදුවන ආර්ථික, පාරිසරික සහ සමාජීය බලපෑම පිළිබඳව අවධානය යොමු කරමින් එම තීරණ ක්‍රියාවට නැංවීමයි. බැංකුව මගින් සිදුකරන වටිනාකම් උත්පාදන ක්‍රියාවලිය මගින් සිදුවන ආර්ථික, පාරිසරික සහ සමාජීය බලපෑම සඳහා අවධානය යොමුකිරීමට තිරසාර සංවර්ධන අරමුණු මගින් බැංකුව පොළඹවා ඇත.

මූල්‍ය ක්ෂේත්‍රයේ අතරමැදියෙකු ලෙස තිරසාර සංවර්ධනය ප්‍රගමණය කිරීමෙහිලා ලංකා බැංකුවට විශාල භූමිකාවක් හිමිවී තිබේ. ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුව ලෙස එයට තම එදිනෙදා ව්‍යාපාර කටයුතු හරහා සෘජුව ම මෙන්ම විශේෂයෙන් ණය පහසුකම් ලබා ගැනීමට පැමිණෙන ගනුදෙනුකරුවන් සහ විවිධ වූ පාර්ශ්වකරුවන් හරහා ද තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට සුවිශේෂී හැකියාවක් ඇත.

තිරසාර සංවර්ධනයෙහි ලා ලංකා බැංකුව විසින් මූලිකවම සලකා බලනු ලබනුයේ ඔවුන්ගේ ක්‍රියාපිලිවෙත්, නිමැවුම් සේවා සහ පාරිභෝගික සම්බන්ධතා හරහා මූල්‍ය ක්ෂේත්‍රයට ඇති කරන බලපෑම වේ. තම ගනුදෙනුකරුවන්, පාර්ශ්වකරුවන් සමඟ මෙන්ම නියාමන ආයතන හා රජය සමඟ ආචාරධර්ම පද්ධතියකට යටත්ව සහ විනිවිදභාවයකින් යුතුව ක්‍රියාකිරීමට බැංකුවට විශේෂ වගකීමක් ඇත. එසේ හෙයින් මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශක්තිමත් සහ ව්‍යුහගත නීති රෙගුලාසි සහිත ව්‍යාපාර පාලනයක් අවශ්‍ය වේ.

මෙම තත්ත්වයන් හමුවේ බැංකුව විසින් තම තීරණ ගැනීමේ දී එහි ලාභ අරමුණු පමණක් නොව පුළුල් ආර්ථික, පාරිසරික සහ සමාජීය බලපෑම පිළිබඳව සලකා බැලීමෙන් පසුව තීරණ වලට එළඹෙනු ඇත. මූල්‍ය සාක්ෂරතාව සමාජ ගත කිරීම හරහා ලංකා බැංකුව අඩු පහසුකම් ලාභීන්ට මූල්‍ය සේවා සැපයීම පුළුල් කර ඇත. එමෙන්ම පාරිසරික ගැටළු හා දේශගුණික විපර්යාස අවම කිරීමේ වැඩසටහන් සිදු කිරීමට උත්සාහ ගත යුතුය. තම නිමැවුම් සේවා හා ණය ලබා දීමේ ක්‍රියාවලියේ දී තිරසාර සංවර්ධන ඉලක්ක ද සලකා බැලීමට ක්‍රියාත්මක වීම තුළ තවදුරටත් බැංකුවට දිගුකාලීනව තිරසාරකත්වය සමඟින් තම ක්‍රියාත්මක ලාභ ලබා ගැනීමේ ක්‍රියාවලිය පුළුල් කිරීමට හැකිවනු ඇත.

තිරසාර කමිටුව





ජාතියේ මහා පහන් ටැඹ

34 — ඉදිරි මඟ දැක්ම
34 — අධ්‍යක්ෂ මණ්ඩලය
40 — ආයතනික කළමනාකාරිත්වය
54 — විධායක කළමනාකාරිත්වය

62 — ආයතනික යහපාලනය

70 — අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා
70 — විගණන කමිටු වාර්තාව
74 — ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව
76 — මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව
77 — නාම යෝජනා හා ආයතනික යහපාලන කමිටු වාර්තාව

80 — අවදානම් කළමනාකරණය

ඉදිරි මඟ දැක්ම
අධ්‍යක්ෂ මණ්ඩලය



(වමේ සිට දකුණට) අසුන්ගෙන - රොනල්ඩ් සී පෙරේරා මහතා - සභාපති, රනෙල් ටී විජේසිංහ මහතා, සපිත් ආර් ආටිගල මහතා

(වමේ සිට දකුණට) සිටගෙන - එච් පී අජිත් ගුණාවර්ධන මහතා, මොහාන් විජේසිංහ මහතා, සමන්ත රාජපක්ෂ මහතා,
ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය - (ලේකම් - ලංකා බැංකුව, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

රොනල්ඩ් සී පෙරේරා මහතා
ජනාධිපති නීතිඥ - සභාපති,
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

කුසලතා හා අත්දැකීම්
පෙරේරා මහතා ප්‍රාථමික අධිකරණයේ, අභියාචනාධිකරණයේ සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂයෙන් සිවිල් හා අපරාධ නඩු කටයුතු, වාණිජ කෙටුම්පත්, ප්‍රවාහන කොන්ත්‍රාත් සහ ගිවිසුම් සම්බන්ධ පුළුල් පළපුරුද්දක් ඇති නීතිඥවරයෙකි. ඔහු වාණිජ නීති, බැංකු නීති, කාර්මික නීති, තහනම් නියෝග, අපහාස නඩු, මැතිවරණ පෙත්සම්, සිවිල් අභියාචනා, සංශෝධනය කිරීමේ අයදුම්පත්, නීති ආඥා සහ මූලික අයිතිවාසිකම් නඩු සම්බන්ධ විශේෂඥයකු ද වේ. මීට අමතරව විවිධ වාණිජ බේරුම්කරණ කටයුතු සඳහා ද එතුමා දායකත්වය සපයා ඇත. පෙරේරා මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ නීති උපාධිය සහ එක්සත් රාජධානියේ නොර්තම්බ්‍රියා විශ්වවිද්‍යාලයෙන් අන්තර්ජාතික වාණිජ නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් ද ලබාගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම
2015 ජනවාරි 28 දින සභාපති ලෙස පත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සාමාජිකත්වය
නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුවේ සභාපති ලෙස සහ මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි.

වර්තමානයේ දරණ තනතුරු
ලංකා බැංකුව (යූ.කේ.) සමාගමෙහි සහ හොටෙල්ස් කලම්බු සමාගමෙහි වැඩබලන සභාපති ලෙස කටයුතු කරයි.

කලින් දැරූ ප්‍රධාන තනතුරු
ලංකා බැංකුව, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී, සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගම සහ සී/ස මිරේකා හෝම්ස් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කර ඇත.

සජිත් ආර් ආටිගල මහතා
නිල බලයෙන් පත් වූ විධායක නොවන අධ්‍යක්ෂ

කුසලතා හා අත්දැකීම්
ආටිගල මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයකු වන අතර, දැනට මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ලෙස කටයුතු කරයි. ඔහුට මූල්‍ය හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ වසර 25 කට වඩා අත්දැකීම් ඇත.

ඔහු එක්සත් රාජධානියේ වෝවික් සරසවියේ ප්‍රමාණාත්මක සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ කොළඹ විශ්වවිද්‍යාලයේ භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් ද හිමිකර ගෙන ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම
2016 අප්‍රේල් මස 27 වෙනි දින අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සාමාජිකත්වය
විගණන කමිටුවේ, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සහ මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

වර්තමානයේ දරණ තනතුරු
ආටිගල මහතා භාණ්ඩාගාරය නියෝජනය කරමින්, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කොමිෂන් සාමාජිකයකු ලෙස දැනට කටයුතු කරයි.

කලින් දැරූ ප්‍රධාන තනතුරු
මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් ලෙස පත්වීම ලැබීමට පෙර ආටිගල මහතා මුදල් අමාත්‍යාංශය යටතේ ඇති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ලෙස රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ රජයේ ක්‍රියාවලිය සඳහා සුවිශේෂී දායකත්වයක් සපයා ඇත. ඔහු රජයේ වාර්ෂික අයවැය සම්පාදනය සඳහා දායකවන අතරම, චීනය සමඟ වන නිදහස් වෙළෙඳ ගිවිසුම පිළිබඳ තාක්ෂණික කණ්ඩායමට නායකත්වය සපයයි.

ඔහු ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස සහ වැඩබලන සභාපතිවරයා ලෙස ද ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සහ ලංකා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද කටයුතු කර ඇත. එමෙන්ම ඔහු රාජ්‍ය භාණ්ඩාගාරය නියෝජනය කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය හා ශ්‍රී ලංකා ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම වැනි ඉහළ වැදගත්කමක් ඇති රාජ්‍ය ආයතන කිහිපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස කටයුතු කර ඇත.

රනෙල් ටී විජේසිංහ මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

කුසලතා හා අත්දැකීම්
රනෙල් ටී විජේසිංහ මහතා ස්වාධීන, ජාත්‍යන්තර කළමනාකරණ උපදේශකයකු වශයෙන් කටයුතු කරන අතර, ව්‍යෘත්තිය සුදුසුකම් ලැබීමෙන් පසු දේශීය හා විදේශීය අංශයන්හි, පෞද්ගලික හා රාජ්‍ය අංශයන්හි නිෂ්ණිකරණය, විගණනය සහ උපදේශනය යන අංශයන්හි පොදු භාවිතය සහ කර්මාන්ත අතර තුලනය පිළිබඳව අවුරුදු 35 කට වඩා වැඩි සුවිශේෂී අත්දැකීම් සහිත වේ.

පසුගිය වසර 25 තුළ ඔහු විසින් ශ්‍රී ලංකා රජයට ව්‍යවස්ථාපිත, නියාමන සහ උපදේශන සේවා සැපයීම වැනි කටයුතු හරහා රාජ්‍ය අංශයට දායකත්වය සපයන ලදී.

එමෙන්ම පසුගිය ආසන්න දස වසරක කාලය තුළ දකුණු ආසියානු සංවර්ධන බැංකුව වැනි අන්තර් ජාතික සංවර්ධන හවුල්කරුවන් වෙනුවෙන් රටවල් ගණනාවක විදේශීය රාජ්‍යයන්වල රාජ්‍ය අංශයන් සඳහා උපදේශන සේවාවන් සපයා ඇත. මෙම සේවා සැපයීම් කටයුතු සඳහා ආයතනික යහපාලනය, රාජ්‍යයේ මූල්‍ය කළමනාකරණය හා යටිතල පහසුකම් වලට අදාළ ආයතනික අවදානම් තක්සේරුකරණය සහ ප්‍රසම්පාදන ව්‍යාපෘති ඇගයීම, ආයතනික සංවර්ධනය සහ ශක්‍යතා ඉහළ නැංවීම යන අංශ ඔස්සේ කණ්ඩායම් නායකයකු ලෙස දැක්වූ දායකත්වයන් ඇතුළත් වේ.

ජෝන් කීල්ස් සමූහ ව්‍යාපාරයේ ව්‍යාපාර සංවර්ධන අධ්‍යක්ෂ ධුරය, ශ්‍රී ලංකාවේ ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් ආයතනයේ හවුල්කාරිත්වය සහ ප්‍රධාන උපදේශක තනතුර, බහමාස් හි ඩිලොයිට් ආයතනයේ කළමනාකරණ ධුරයන් දරමින් ඔහු පෞද්ගලික අංශයේ ද විශාල අත්දැකීම් ප්‍රමාණයක් සපුරා ඇත. උපායමාර්ගික ව්‍යාපාර දිශානතිය, ආයතනික ව්‍යුහගත කිරීම්, නව ව්‍යාපෘති විශ්ලේෂණය, පෞද්ගලිකරණය හා සම්බන්ධ විනිශ්චයන්, තක්සේරුකරණය, ලංසුතැබීම්, ව්‍යාපාර අත්පත් කර ගැනීම් සහ ආයෝජන හරණය යන අංශ කෙරෙහි ඔහු සතුව පුළුල් දැනීමක් සහ අත්දැකීම් සම්භාරයක් ඇත.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය ද ඇමරිකා එක්සත් ජනපදයේ පෙන්සිල්වේනියාවේ පිටස්බර්ග් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ද ලබාගෙන ඇත. එසේම රාජ්‍ය සහ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ විශ්වවිද්‍යාල උපාධි පාසලෙන් බහුජාතික සමාගම් සහ දේශපාලන අවදානම් පිළිබඳ අධ්‍යනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම
2015 පෙබරවාරි 9 වෙනි දින පත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සාමාජිකත්වය
විගණන කමිටුවේ සභාපති ලෙස කටයුතු කරයි.

වර්තමානයේ දරණ තනතුරු
ඔහු කොළඳෙනිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කරයි.

කලින් දැරූ ප්‍රධාන තනතුරු
විදුලි බල සහ බලශක්ති අමාත්‍යාංශයේ අධීක්ෂණ සහ උපදේශන කමිටුවේ සභාපති ලෙස ද, පාරිභෝගික සබඳතා අධිකාරී පනත යටතේ පිහිට වූ පළමු පාරිභෝගික සබඳතා කවුන්සිලයේ සාමාජිකයෙකු ලෙස ද, 2015 සිට 2018 දක්වා සහ ඉන් පෙර අවස්ථාවකදී ඇතුළත්ව ගිණුම්කරණ හා විගණන ප්‍රමිති අධීක්ෂණ කමිටුවෙහි සමාජිකයෙකු ලෙස ද, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ කොමසාරිස්වරයෙකු ලෙස ද, (2015 සිට 2018 දක්වා සහ ඊට පෙර එක් අවස්ථාවක්ද ඇතුලුව අවස්ථා දෙකකදී) ව්‍යාපාර කළමනාකරණය පිළිබඳව ජාතික ආයතනයේ (NIBM) පාලන කවුන්සිලයේ සාමාජිකයෙකු ලෙස ද, පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ද, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ ප්‍රධාන කමිටු සාමාජිකයකු ලෙස ද, වාණිජ හා කර්මාන්ත මණ්ඩල සමුළුවේ උපදේශක ලෙස ද, සාර්ක් වාණිජ හා කර්මාන්ත මණ්ඩල සමුළුවේ උපදේශක ලෙස ද කටයුතු කර ඇත.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හිටපු සභාපතිවරයෙකු වන අතර, ආසියා සහ ශාන්තිකර ගණකාධිකාරවරුන්ගේ 23 වන ජාතික සහ සම්මේලනයේ සභාපති ලෙස ද කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා සහ මාලදිවයිනේ විසිර පවත්නා හෝටල් 11 කින් සැදුම්ලත් හෝටල් ජාලයක් මෙහෙයවන ජෝන් කීල්ස් හොටෙල්ස් පී එල් සී සමාගමේ විගණන කමිටු සභාපති ලෙස සහ විධායක නොවන අධ්‍යක්ෂවරයකු ලෙස ඔහු 2005 වසර සිට 2016 ජූලි දක්වා දීර්ඝ කාලයක් කටයුතු කර ඇත.

එච් පී අජිත් ගුණවර්ධන මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

කුසලතා හා අත්දැකීම්
ගුණවර්ධන මහතා කොටස් වෙළඳපොල ගනුදෙනු සහ අරමුදල් කළමනාකරණය පිළිබඳ අත්දැකීම් බහුල අතර, රාජ්‍ය භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොල පිළිබඳ විශේෂඥයෙකු වේ. තවද, ඔහු විවිධ ලැයිස්තුගත සමාගම් හි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් ආයතනික යහපාලන අත්දැකීම් බහුල පුද්ගලයෙකු වේ. ඔහු වසර 25 කට වැඩි මූල්‍ය ක්ෂේත්‍රයේ පලපුරුද්ද සහිත නිලධාරියකු වේ. ඔහු ව්‍යාපාර පරිපාලනවේදී ඩිප්ලෝමාවක් සහ වරලත් මූල්‍ය විශ්ලේෂක දෙවන අදියරද සම්පූර්ණ කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම
2015 නොවැම්බර් මස 6 වෙනි දින පත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සාමාජිකත්වය
මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුවෙහි සභාපතිත්වය දරයි.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුව යන කමිටු වල සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

වර්තමානයේ දරණ තනතුරු
සී/ස ලංකා සෙකියුරිටිස් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

කලින් දැරූ ප්‍රධාන තනතුරු
සී/ස ජනශක්ති සෙකියුරිටිස් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු සහ ප්‍රධාන විධායක නිලධාරි ලෙස කටයුතු කර ඇත. මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී සමාගම, ක්ෂාට්‍රියා හෝල්ඩින්ස් පී එල් සී, ෆස්ට් කැපිටල් හෝල්ඩින්ස් පී එල් සී, කෙල්සි හෝම්ස් පී එල් සී සහ කොත්මලේ හෝල්ඩින්ස් පී එල් සී ආයතනයන්හි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඇත.

සමන්ත රාජපක්ෂ මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

කුසලතා හා අත්දැකීම්
රාජපක්ෂ මහතා අවුරුදු 30 ක අත්දැකීම් සහිත ව්‍යාපාර වෘත්තිකයෙකු වන අතර, දේශීය හා විදේශීය ප්‍රධාන කළමනාකරණ තනතුරු කිහිපයක් දරා ඇත.

රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ සහ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකත්වය දරයි. ඔහු එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ අධි සාමාජිකත්වය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත.

රාජපක්ෂ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනය මගින් පිරිනමන කළමනාකරණ ක්ෂේත්‍රය සඳහා වන වෘත්තීය විශිෂ්ටත්වය වෙනුවෙන් පිරිනමන ප්ලැටිනම් ගෞරව සම්මානයෙන් පිදුම් ලැබිය.

අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම
2017 ජූලි මස 25 වෙනි දින පත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවල සාමාජිකත්වය
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සභාපති ලෙස සහ විගණන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි.

වර්තමානයේ දරණ තනතුරු
රාජපක්ෂ මහතා කිත්‍රා හෝල්ඩින්ස් (පෞද්ගලික) සමාගමේ සභාපති/අධ්‍යක්ෂ ලෙස සහ ආසිරි රෝහල් සමූහය, රකුයින් හෝටල් සමූහය හා කලම්බු ආර්චරි ස්කූල් (පෞද්ගලික) සමාගම යන ආයතනයන් හි අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කරයි.

ඔහු ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ විධායක සාමාජිකයකු ලෙසද, ශ්‍රී ලංකා - ඇමරිකා එක්සත් ජනපද ව්‍යාපාර කවුන්සිලයේ සභාපති ලෙස සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ අධ්‍යක්ෂකවරයකු ලෙස ද, කටයුතු කරයි.

කලින් දැරූ ප්‍රධාන තනතුරු
ඇසෝසියේටඩ් මෝටර්වේස් (පෞද්ගලික) සමාගමෙහි සමූහ කළමනාකරණ අධ්‍යක්ෂකවරයා ලෙස, ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලිසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී, ඇසෝසියේටඩ් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම, ඇසෝසියේටඩ් ඔටෝවේස් (පෞද්ගලික) සමාගම, ඇසෝසියේටඩ් මෝටර් (ලංකා) සීමිත සමාගම, ඇසෝසියේටඩ් ග්ලෝබල් ට්‍රේඩිං (පෞද්ගලික) සමාගම, ඇසෝසියේටඩ් රබර් ඉන්ඩස්ට්‍රිස් සමාගම, ඇසෝසියේටඩ් යුනිවර්සල් (පෞද්ගලික) සමාගම, අල් ෆුටෙයිම් ලොජිස්ටික්ස් (පෞද්ගලික) සමාගම යන ආයතනයන්හි අධ්‍යක්ෂකවරයකු ලෙස, ඉන්ෆෝමැටික්ස් ඉන්ටර්නැෂනල් (පෞද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී ලෙස, සී එෆ් වෙන්චර් ෆන්ඩ් ලිමිටඩ් ආයතනයෙහි අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ලෙස, සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පී එල් සී ආයතනයෙහි අධ්‍යක්ෂකවරයකු ලෙස, AT&T Inc. USA ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති කළමනාකරු ලෙස, ක්ෂාටියා හෝල්ඩින්ස් පී එල් සී ආයතනයෙහි සමූහ අධ්‍යක්ෂ ලෙස, සොෆ්ට්ලොජික් කොමියුනිකේෂන් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී ලෙස සහ සොෆ්ට්ලොජික් හෝල්ඩින්ස් පී එල් සී ආයතනයේ සමූහ අධ්‍යක්ෂ ලෙස කටයුතු කර ඇත.

මොහාන් විජේසිංහ මහතා
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

කුසලතා හා අත්දැකීම්
මොහාන් විජේසිංහ මහතා වසර 25 කට වැඩි අත්දැකීම් සහිත නීතිඥවරයෙක් වන අතර ඔහු පෞද්ගලික හා රාජ්‍ය යන දෙයංශයම වෙනුවෙන් වැඩ කිරීමෙන් අත්දැකීම් ලබා ඇත.

ඔහු බ්‍රසල්ස් හි විරිජ් විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර නෛතික සහයෝගිතාවය පිළිබඳ පශ්චාත් උපාධිය ලබා ඇත. ඔහු එංගලන්තයේ සහ වේල්සයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සොලිසිටර්වරයකු ලෙස, ඕස්ට්‍රේලියානු කැපිටල් ටෙරිටරි ශ්‍රේෂ්ඨාධිකරණයේ සොලිසිටර්වරයකු හා අධිනීතිඥවරයෙකු ලෙස සහ ඕස්ට්‍රේලියානු ඉහළ උසාවියේ අධිනීතිඥවරයෙකු ලෙස කටයුතු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම
2017 නොවැම්බර් මස 24 වෙනි දින පත් කර ඇත.

වර්තමානයේ දරණ තනතුරු
ඔහු කොළඹ අන්තර් ජාතික කන්ටේනර් ටර්මිනල්ස් සමාගමෙහි නීති අංශයේ සාමාන්‍යාධිකාරී සහ චීනයේ මර්චන්ට්ස් පෝර්ට්ස් හෝල්ඩින්ස් සමාගමෙහි ජ්‍යෙෂ්ඨ විදෙස් උපදේශකයෙකු වේ. ලංකා හෝස්පිටල්ස් පී එල් සී, මඟ හැගුම මාර්ග සංවර්ධන උපකරණ සමාගම, මඟ හැගුම උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා සමාගම, ඉන්ටර්ඕෂන් සර්විසස් සමාගම යන ආයතනයන්හි අධ්‍යක්ෂවරයකු ලෙස සහ ජාතික වාණිජ මණ්ඩලයෙහි ජාතික න්‍යාය පත්‍ර කමිටුවෙහි සාමාජිකයෙකු වේ.

කලින් දැරූ ප්‍රධාන තනතුරු
මහජන බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස, මහරාජා සමූහ ව්‍යාපාරයේ සමූහ මානව සම්පත් කළමනාකරු ලෙස, ඕස්ට්‍රේලියානු විශ්‍රාම වැටුප් කොමිසමෙහි සහකාර අධ්‍යක්ෂවරයකු ලෙස, ශ්‍රී ලංකා උසස් නාඤණ අධ්‍යාපන ආයතනයෙහි අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස, සහ ජාතික ලොතරැයි මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කර ඇත.

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය -
(ලේකම් - ලංකා බැංකුව, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

විස්තර පිටු අංක 45 හි දක්වා ඇත.

ගනුදෙනුකාර කේන්ද්‍රීයගත වීම

වෙනස්වන පාරිසරික සාධක හා අනුගත වෙමින් "අනාගතයට සූදානම්" වීමට අප මෙහෙයවන්නා වූ ප්‍රධානතම පාර්ශ්වකරුවා වනුයේ අපගේ ගනුදෙනුකරුවන් වේ. මේ නිසා අප අපගේ සෑම ක්‍රමෝපායක් සහ සෑම වෑයමක් වටාම ගනුදෙනුකරුවන් කේන්ද්‍ර කර ගනී. අප සෑම විටම මෙම න්‍යාය පිළිපැද ඇති අතර, මේ මොහොතේද එය සිදුකරයි. එමෙන්ම පෙරට වඩා ජවයකින් ඉදිරියටත් එය සිදු කරනු ඇත.



ආයතනික කළමනාකාරීත්වය



(වමේ සිට දකුණට) අසුන්ගෙන - ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය, සෙනරත් බණ්ඩාර මහතා, ඩී එම් ගුණසේකර මහතා, ඩබ් පී රසල් ෆොන්සේකා මහතා, ගයා ජයසිංහ මහත්මිය

(වමේ සිට දකුණට) සිටගෙන - ඩී එන් එල් ප්‍රනාන්දු මහතා, ආර් එම් ඩී විපුල ජයබාහු මහතා, ඩී පී කේ ගුණසේකර මහතා, කේ ඊ ඩී සුමනසිරි මහතා, ආචාර්ය ඉඳුනිල් ලියනගේ, එම් එම් ලක්ෂමන් පෙරේරා මහතා, පී සී වික්‍රමපතිරණ මහතා, එම් ජේ පී සල්ගාදු මහතා, සී අමරසිංහ මහතා, පී එම් ලියනගේ මහතා, ඩබ් ඒ සී තිසේරා මහතා, එස් හේවාවිතාරණ මහතා, එම් ටී එම් ජලාල්ඩීන් මහතා, ඩී එම් එල් බී දසනායක මහතා



ඩී එම් ගුණසේකර මහතා
(2018 පෙබරවාරි මස 21 වන දින විශ්‍රාම යන ලදී)
මහා කළමනාකරු

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2010 ඔක්තෝබර් මස

සමූහ සමාගම් වල සභාපති ධුරයන්
MSS, HH

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්
BoC UK, Travels, PDML, Ceybank Asset, HCL, KHP, MBSL, MBSL Insurance

කුසලතා හා අත්දැකීම්
වෘත්තීය බැංකුකරුවෙකු වන ගුණසේකර මහතා වසර 34 කට වඩා ආයතනික හා අක්වෙරළ බැංකුකරණය, විකුණුම් හා හැසිරවීම් කළමනාකරණය, ජාත්‍යන්තර බැංකුකරණය, ණය කළමනාකරණය හා පරිපාලනය යනාදී විවිධ මානයන් ඔස්සේ පැතිරුන බැංකුකරණ අත්දැකීම්වලින් සමන්විත වේ.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය මූල්‍යය සහ බදුකරණය පිළිබඳ විශේෂ උපාධිය ලබා ගත් ඔහු ජපානයේ විදේශීය තාක්ෂණික සංගමයේ ශිෂ්‍යත්ව සඳහා වන එකමුතුව (AOTS) මඟින් පවත්වන ලද ශ්‍රී ලංකාවේ ආයතනික කළමනාකරිත්වය සඳහා වන උසස් ඩිප්ලෝමාව (LKCM2) සහ ඇමරිකාවේ පෙන්සිල්වේනියාවෙහි වොර්ටන් විශ්වවිද්‍යාලය මඟින් පවත්වන වැඩසටහනක් වන ශ්‍රී ලංකාව සඳහා ආයතන කළමනාකරණය පිළිබඳ පාඨමාලාව (AMP63) සාර්ථකව සම්පූර්ණ කර ඇත. තව ද, ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වේ.

ආයතනික කළමනාකාරිත්වයේ දරණ ලද තනතුරු
නියෝජ්‍ය මහා කළමනාකරු - (ශාඛා බැංකු කටයුතු)
නියෝජ්‍ය මහා කළමනාකරු - (විකුණුම් හා හැසිරවීම්)

මහා කළමනාකරු/ප්‍රධාන විධායක නිළධාරී -
(2013 ජනවාරි මස සිට)

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු
සී/ස ලංකාක්ලියර් (පෞද්ගලික) සමාගම, ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ සමාගම සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය යන සමාගම් වල අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කර ඇති අතර, සී/ස ශ්‍රී ලංකා බෑන්ක්ස් ඇසෝසියේෂන් (ඇපකර) සමාගම සහ සී/ස ෆයිනෑන්ෂල් ඔම්බුඩ්ස්මන් ශ්‍රී ලංකා (ඇපකර) සමාගම යන සමාගම් වල 2016/17 වර්ෂයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කර ඇත.

එමෙන් ම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ (IBSL) පාලක කමිටු සාමාජිකයකු ලෙස සහ ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනයේ සාමාජිකයකු ලෙස කටයුතු කරයි. තවද, එතුමා ආසියා පැසිෆික් ග්‍රාමීය හා කෘෂිකාර්මික ණය ආයතනයේ (APRACA) උප සභාපතිවරයා වශයෙන් 2016/17 වසරේදී කටයුතු කර ඇත.

වෘත්තීය මං සලකුණු
1983 වසරේ තම වෘත්තීයමය බැංකු ජීවිතය අරඹා වසර ගණනාවක් පුරා විවිධ මට්ටම් වලින් විවිධ ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් පුහුණුවක් හා දැනුමක් ලබා ගෙන ඇති ගුණසේකර මහතා ණය කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ වැඩි අවධානයක් යොමු කර ඇත. තවද, ඔහු වර්ෂ 1997 සිට 2000 දක්වා ලන්ඩන් ශාඛාවේ සේවය කර ඇත.

ඩුබායි හි ලෝක තිරසාර කොංග්‍රසය මඟින් ප්‍රදානය කරනු ලබන "ගෝලීය තිරසාර නායකයින් 100 සඳහා වන සම්මානය" 2016 වර්ෂයේදී එතුමා වෙත පිරිනමන ලදී. විශේෂ තිරසාර නායකයින් ලෙස කීර්තිමත් වෘත්තිකයින් සහ ආයතන වෙත පිළිගැනීමක් මෙමඟින් ලබා දේ.

සෙනරත් බණ්ඩාර මහතා
(2018 පෙබරවාරි මස 22 වන දින මහා කළමනාකරු ලෙස පත්විය)
නියෝජ්‍ය මහා කළමනාකරු (විකුණුම් හා හැසිරවීම්)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2012 මාර්තු මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්
MBSL, HH, KHP හි විකල්ප අධ්‍යක්ෂවරයකු ලෙස

කුසලතා හා අත්දැකීම්
වෘත්තීය බැංකුකරුවකු වන බණ්ඩාර මහතා වසර 28 කට වඩා විවිධ ක්ෂේත්‍ර තුළ දේශීය හා ජාත්‍යන්තර බැංකු කටයුතු සම්බන්ධව බැංකුකරණ අත්දැකීම් ලත් අයෙකි.

කැළණිය විශ්වවිද්‍යාලයේ දෙවන පන්ති ඉහළ සාමාර්ථයක් සහිත භෞතික විද්‍යා උපාධිධාරියකු වන බණ්ඩාර මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය විශිෂ්ට සාමාර්ථයක් සහිතව ලබාගෙන ඇති අතර, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය ද දරයි. එමෙන්ම එම ආයතනයේ පශ්චාත් විධායක ඩිප්ලෝමාවක් ලබා ගෙන ඇති අතර, 1998 වර්ෂයේ හොඳම ශිෂ්‍යයාට හිමි රන් පදක්කම ලබා ගෙන ඇත. එක්සත් ජනපදයේ හාවඩ් ව්‍යාපාරික පාසල මඟින් පවත්වන ලද උසස් කළමනාකරණ පාඨමාලාව ඔහු විසින් සාර්ථකව සම්පූර්ණ කර ඇත.

ආයතනික කළමනාකාරිත්වයේ දරණ ලද තනතුරු
නියෝජ්‍ය මහා කළමනාකරු (නිමවුම් හා බැංකුකරණ සංවර්ධන) - 2013 ජනවාරි මස සිට 2016 ජූලි මස දක්වා
නියෝජ්‍ය මහා කළමනාකරු (විකුණුම් හා හැසිරවීම්) - 2016 ජූලි මස සිට 2018 පෙබරවාරි මස 21 දින දක්වා

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු
බණ්ඩාර මහතා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ නාමික අධ්‍යක්ෂවරයකු ලෙස ලංකා බැංකුව වෙනුවෙන් සේවය කර ඇත. එමෙන් ම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක කමිටු සාමාජිකයකු ලෙස කටයුතු කරන අතර, වෘත්තීය බැංකුකරුවන්ගේ ප්‍රමුඛතම ආයතනය වන, ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනයේ පසුගිය වර්ෂයේ සභාපති ලෙසද කටයුතු කර ඇත. ඔහු සී/ස එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස ද කටයුතු කර ඇත.

වෘත්තීය මං සලකුණු

1990 වසරේ කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස බැංකු සේවයට එක් වූ බණ්ඩාර මහතා තම වෘත්තීය ජීවිතයේ දී දේශීය හා විදේශීය වශයෙන් විශේෂයෙන්ම තොරතුරු පද්ධති, ආයෝජන, භාණ්ඩාගාර කළමනාකරණය, ජාත්‍යන්තර බැංකුකරණ මෙහෙයුම් සහ ආයතනික බැංකුකරණය යන අංශයන්ගේ විවිධ අත්දැකීම් සමුදායක් සහිතව ඉහළ තලයකට පැමිණ සිටී. ඔහු සහකාර මහා කළමනාකරු (විදේශීය ශාඛා) තනතුර දරන සමයේ එක්සත් රාජධානියෙහි ලන්ඩන් ශාඛාව පරිපාලිතයක් බවට පත් කිරීමේ ක්‍රියාවලියේ දී මූලිකත්වය ගෙන කටයුතු කළේ ය. ඉන් පසුව 2011 වසරේදී ලංකා බැංකුව (එක්සත් රාජධානි) සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරි තනතුරට පත්වීමට ප්‍රථම සහකාර මහා කළමනාකරු (ජාත්‍යන්තර මෙහෙයුම්) සහ සහකාර මහා කළමනාකරු (ආයතනික සම්බන්ධතා) යන තනතුරු හොබවන ලදී.

බණ්ඩාර මහතා තාක්ෂණය පදනම් වූ සංවර්ධන ව්‍යාපෘති කිහිපයකට නායකත්වය සපයා ඇති අතර, 2013/14 කාලපරිච්ඡේදය තුළ මූලික බැංකු පද්ධතිය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියට හා 2014/15 කාලපරිච්ඡේදය තුළ බොස්ටන් කන්සල්ටින් කණ්ඩායම සමඟ එක්ව දියත් කරන ලද බැංකු නව්‍යකරණ ක්‍රියාවලියට නායකත්වය සපයන ලදී. එමෙන්ම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ණය හා ආයෝජන කළමනාකරණ අංශයන්ට සම්පත් දායකයකුද වේ.

බණ්ඩාර මහතා බැංකුවට සම්බන්ධ වීමට පෙර, කැළණිය විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයකු ලෙස කටයුතු කර ඇති අතර, මහවැලි අධිකාරියේ වසර හතරකට ආසන්න කාලයක් සේවය කර ඇත.

ඩබ් පී රසල් ෆොන්සේකා මහතා
ප්‍රධාන මූල්‍ය නිලධාරි/
නියෝජ්‍ය මහා කළමනාකරු
(ජාත්‍යන්තර,භාණ්ඩාගාර හා ආයෝජන)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2012 මාර්තු මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්
MBSL සහ PDL (විගණන කමිටුවේ සභාපති)

කුසලතා හා අත්දැකීම්

වසර 28 කට අධික කාලයක් බැංකු කටයුතු සම්බන්ධව විශාල අත්දැකීම් ප්‍රමාණයක් ඇති ෆොන්සේකා මහතා මූල්‍ය කළමනාකරණය සහ ක්‍රමෝපාය සැලසුම් සම්බන්ධව විශේෂඥ දැනුමක් ඇති අයෙකි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියකු වන ඔහු එම විශ්වවිද්‍යාලයේම කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවකට ද හිමිකම් කියන අතර, ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වීන්ස්ලන්ත සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය ද ලබාගෙන ඇත. ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය ද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද දරයි.

ආයතනික කළමනාකාරිත්වයේ දරණ ලද තනතුරු

නියෝජ්‍ය මහා කළමනාකරු (මූල්‍ය හා සැලසුම්) - 2012 මාර්තු මස සිට 2013 මැයි මස දක්වා ද 2015 අප්‍රේල් මස සිට 2016 දෙසැම්බර් මස දක්වා.

නියෝජ්‍ය මහා කළමනාකරු (ශාඛා බැංකු කටයුතු) - 2013 මැයි මස සිට 2015 අප්‍රේල් මස දක්වා.

වැඩබලන ප්‍රධාන මූල්‍ය නිලධාරි 2014 ජූලි මස සිට 2016 මාර්තු මස දක්වා.

ප්‍රධාන මූල්‍ය නිලධාරි 2016 මාර්තු මස සිට මේ දක්වා.

නියෝජ්‍ය මහා කළමනාකරු (ජාත්‍යන්තර, භාණ්ඩාගාර හා ආයෝජන) - 2017 පෙබරවාරි මස සිට.

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු

2016 අප්‍රේල් මස සිට සී/ස ලංකා සිකියුරිටීස් (පොදුගලික) සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස එතුමා පත් කරන ලදී. ඔහු සී/ස ලංකාක්ලියර් (පොදුගලික) සමාගමේ විකල්ප අධ්‍යක්ෂ ධුරයද 2012 නොවැම්බර් මස සිට එම සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක් වන විගණන කමිටුවෙහි සභාපති තනතුරද හොබවයි. 2017 දෙසැම්බර් මස දක්වා ඔහු විසින් TLRS සමාගමේ සභාපති ධුරය දරූ අතර, සී/ස එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් සමාගමේ අධ්‍යක්ෂ ධුරයද දරා ඇත.

වෘත්තීය මං සලකුණු

1990 ජනවාරි මස දී ශාඛා බැංකුකරණයෙන් බැංකු ජීවිතය ඇරඹූ ෆොන්සේකා මහතා බැංකුවේ මූල්‍ය කළමනාකරණය සහ ක්‍රමෝපාය සැලසුම් පිළිබඳ විශේෂඥ දැනුමකින් යුතු වන අතර, වාණිජ බැංකුකරණයෙහි සියලුම අංශයන්හි පුළුල් අත්දැකීම් සමුදායකින් පරිපූර්ණය. තවද, ඔහු ලංකා බැංකු ලන්ඩන් ශාඛාවෙහි සේවය කර ඇති අතර, එහිදී භාණ්ඩාගාර කටයුතු සහ ජාත්‍යන්තර බැංකුකරණ කටයුතු යන අංශයන්හි විශාල අත්දැකීම් සම්භාරයක් ලබා ඇත.

ඩී පී කේ ගුණසේකර මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2013 මැයි මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්
MSS

කුසලතා හා අත්දැකීම්
ගුණසේකර මහතා වසර 38 කට අධික කාලයක් බැංකුවේ විවිධ ව්‍යාපාර මෙහෙයුම් තුළ බැංකුකරණ අත්දැකීම් ලත් අයෙකි.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ව්‍යාපාර පරිපාලන) උපාධිධාරියෙකු වන අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාගෙන ඇත. තවද, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වන ඔහු ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වීන්ස්ලන්ත සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගෙන ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය විසින් පවත්වන කළමනාකරණ සංවර්ධන පාඨමාලාවද සම්පූර්ණ කර ඇත.

ආයතනික කළමනාකාරිතවයේ දරණ ලද තනතුරු
නියෝජ්‍ය මහා කළමනාකරු (ශාඛා බැංකු කටයුතු) - 2013 පෙබරවාරි මස සිට මැයි මස දක්වා

නියෝජ්‍ය මහා කළමනාකරු (ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු) - 2013 මැයි මස සිට

වෘත්තිය මං සලකුණු
1980 වසරේදී බැංකුවට බැඳි තම වෘත්තීය ජීවිතය ශාඛා බැංකුකරණයෙන් අරඹා ශාඛා ජාලයෙහි පුළුල් අත්දැකීම් සමුදායක් ලබා ගත් ගුණසේකර මහතා මධ්‍යම මුදල් ඒකකයේ සහ ගිණුම් අංශයේද සේවය කර ඇත. ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩාගාර අංශයට බැඳීමෙන් හා ඉන්දියාවේ චෙන්නායි ශාඛාවේ සේවය කිරීම තුළින් භාණ්ඩාගාර හා මූල්‍ය වෙළඳපොළ මෙහෙයුම් පිළිබඳ මනා දැනුමක් හා අත්දැකීම් සමුදායක් ලබා ගන්නා ලදී. ලංකා බැංකුවේ ප්‍රාපනික අංශයේ (Dealing Room) තනතුරු සියල්ලම පාහේ ඔහු විසින් දරා ඇත. ඔහු 2008 සිට 2010 දක්වා චෙන්නායි ශාඛාවේ නියෝජ්‍ය කළමනාකරු වශයෙන් සේවය කර ඇත. එමෙන්ම ගුණසේකර මහතා ලංකා බැංකු භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර අංශයේ කළමනාකරු/ජ්‍යෙෂ්ඨ ප්‍රාපනිකයා (Senior Dealer) වශයෙන් කටයුතු කර ඇත.

ඔහු සී බෑන්ක් සිකියුරිටිස් සමාගමෙහි ප්‍රථම ප්‍රධාන ප්‍රාපනිකයා ලෙස සේවය කර ඇති අතර ලංකා බැංකුවේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ මධ්‍යම කාර්යාලය පිහිටුවීමේ පුරෝගාමියෙකු ද වේ. ගුණසේකර මහතා ආයතනික කළමනාකාරිත්වයට පත්වීමට පෙර සහකාර මහා කළමනාකරු (විදේශීය ශාඛා) සහ සහකාර මහා කළමනාකරු (ආයතනික සබඳතා) යන තනතුරු ද දරන ලදී.

කේ ඊ ඩී සුමනසිරි මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(මානව සම්පත්)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2013 මැයි සිට

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්
HH

කුසලතා හා අත්දැකීම්
සුමනසිරි මහතා වසර 28 ක් පුරා ශාඛා බැංකුකරණය, ක්ෂුද්‍ර මූල්‍යනය, ආයතනික මූල්‍ය සහ මානව සම්පත් සංවර්ධනය වැනි විවිධ අංශයන්ගේ මනා අත්දැකීම් රැසක් ලබාගෙන ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණ) ගෞරව උපාධිධරයෙකු ද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකුද වන අතර, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනය විසින් පවත්වන ව්‍යාපාර නායකයන් සඳහා වූ උසස් කළමනාකරණ සහ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ විශේෂ කළමනාකරණ පාඨමාලාව ද සාර්ථකව සම්පූර්ණ කර ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනය විසින් පවත්වන ලද ඉහළ කළමනාකාරිත්වය සඳහා වන කළමනාකරණ සංවර්ධන පාඨමාලාවක් ද සම්පූර්ණ කොට ඇත.

ආයතනික කළමනාකාරිත්වයේ දරණ ලද තනතුරු
නියෝජ්‍ය මහා කළමනාකරු - (අයකරගැනීම්) 2013 මැයි මස සිට 2014 අප්‍රේල් මස දක්වා සහ 2015 පෙබරවාරි සිට 2016 දෙසැම්බර් මස දක්වා
නියෝජ්‍ය මහා කළමනාකරු - (මානව සම්පත්) 2014 අප්‍රේල් මස සිට 2015 පෙබරවාරි මස දක්වා සහ 2016 දෙසැම්බර් මස සිට මේ දක්වා

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු
සුමනසිරි මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලක මණ්ඩලයේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කරනු ලබයි.

වෘත්තිය මං සලකුණු
1990 දී සිය බැංකු ජීවිතය ඇරඹූ සුමනසිරි මහතා ශාඛා ජාලය තුළ සිය සේවය සපයන අතරතුර ප්‍රධාන තනතුරු කිහිපයක්ම දරන ලදී. කළමනාකරු (පුනුණු කිරීම්) වශයෙන් ඔහු බැංකුවේ පුහුණුකිරීමේ ආයතනයේ පීඨ සාමාජිකත්වය දරමින් කාර්ය මණ්ඩලයේ වෘත්තීය සංවර්ධනය සහ දැනුම වර්ධනය උදෙසා නිරතුරුව සිය දායකත්වය සැපයුවේය. ආයතනික කළමනාකාරිත්වයට පත්වීමට පෙර සුමනසිරි මහතා සහකාර මහා කළමනාකරු (උතුරු පළාත) ලෙස කටයුතු කරන අතරතුර උතුරු පළාතේ නැවත පදිංචි වූ ජනතාවගේ, ජීවන තත්ත්වය උසස් කරලීමට සහ උතුරු පළාතේ ආර්ථිකය නැවත නගාසිටුවීම උදෙසා සුවිසල් කාර්යභාරයක් බැංකුව වෙනුවෙන් ඉටු කළේය.

එස් හේවාවිතාරණ මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(උපකාරක සේවා)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2015 නොවැම්බර් මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්
HH

කුසලතා හා අත්දැකීම්
හේවාවිතාරණ මහතා වසර 34 ක සිය වෘත්තීය බැංකු ජීවිතයේ විවිධ ක්ෂේත්‍රයන්හි අත්දැකීම් සමූහයක් ලබා ඇති අතර, දේශීය හා විදේශීය ව්‍යාපාර මෙහෙයුම්හි විශාල දැනුමක් උපයාගෙන ඇත.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා විශේෂ උපාධිධාරියෙකු වේ. තවද, ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය දරන අතර, ශ්‍රී ලංකා රුහුණු විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවකට ද හිමිකම් කියයි.

වෘත්තීය මං සලකුණු
හේවාවිතාරණ මහතා 1983 දී බැංකු සේවයට බැඳී ශාඛා ජාලයට සිය දායකත්වය ලබාදෙමින් ඉහළ තනතුරු කිහිපයක්ම දැරීය. එමෙන්ම ඔහු මහරගම මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයේ පීඨ සාමාජිකයෙකු ලෙස කටයුතු කළ අතර, පසුව ජ්‍යේෂ්ඨ කළමනාකාර (පුහුණු කිරීම්) ධුරයට පත්විය. එම කාලය තුළදී ඔහු බාහිර සම්පත් දායකයින්ගේ සහාය ලබාගනිමින් සේවක මණ්ඩලයේ කුසලතා වර්ධන වැඩසටහන් දියත් කරමින් විශාල සේවාවක් ඉටු කළේය. ලංකා බැංකුවේ ප්‍රමුඛතා බැංකුකරණ ඒකකය ස්ථාපිත කිරීමේ මූලිකත්වය ගෙන කටයුතු කළ අතර, එහි මුල්ම ප්‍රධාන කළමනාකරු ලෙසද කටයුතු කළේය.

තවද ඔහු ලංකා බැංකු චෙන්නායි ශාඛාවේ නියෝජ්‍ය කළමනාකරු වශයෙන් කටයුතු කරමින් ජාත්‍යන්තර බැංකුකරණය හා ආයතනික බැංකුකරණය පිළිබඳ මනා පරිචයක් ලබාගත් අතර, ඉන්දියාවේ මහ බැංකුව සමඟ සාර්ථක සාකච්ඡා වට කිහිපයක් පවත්වමින් චෙන්නායි ශාඛාවේ මූලික බැංකු පද්ධතිය මවි බැංකුවේ එම පද්ධතියට (ICBS) පරිවර්තනය කිරීමේ කර්තව්‍යයේ මූලිකත්වය ගෙන කටයුතු කළේය.

හේවාවිතාරණ මහතා ආයතනික කළමනාකාරිත්වයට පත්වීමට ප්‍රථම සහකාර මහා කළමනාකරු (ණය පළාත) හා සහකාර මහා කළමනාකරු (මධ්‍යම පළාත) ලෙස කටයුතු කරන ලදී.

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය
ලේකම් ලංකා බැංකුව/
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2010 ඔක්තොම්බර් මස

කුසලතා හා අත්දැකීම්
වසර 22 කට වඩා බැංකු සේවයේ අත්දැකීම් ඇති සිරිවර්ධන මහත්මිය සමාගම් ලේඛන කටයුතු සහ ආයතනික යහපාලනය සම්බන්ධව විශේෂ නිපුණතාවයක් දක්වයි.

වෘත්තියෙන් නීතිඥවරියක් වන ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ නීතිවේදී උපාධිය ද එම විශ්වවිද්‍යාලයෙහිම ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය විශිෂ්ඨ සාමාර්ථයක් සහිතව හිමි කර ගෙන ඇත.

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු
සී/ස සිබෑන්ක් හොලිඩේ හෝම්ස් (පොද්ගලික) සමාගම සහ සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පොද්ගලික) සමාගම යන සමාගම් වල සමාගම් ලේකම්වරිය ලෙස කටයුතු කරයි.

වෘත්තීය මං සලකුණු
1996 ජනවාරි මස දී අධ්‍යක්ෂ මණ්ඩලයේ සහකාර ලේකම් වශයෙන් බැංකු සේවයට එක් වූ සිරිවර්ධන මහත්මිය ලංකා බැංකුවේ/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් ලෙස 2005 නොවැම්බර් මස දී පත් කරන ලදී.

ලංකා බැංකුවේ/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් වශයෙන් ඉටු කරන කටයුතු වලට අමතරව ඇය සියලුම අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල ලේකම් ධුරය හොබවයි. එමෙන්ම ආයතනික යහපාලන නීති රීති වලට අනුකූලව බැංකුව කටයුතු කරන්නේද යන්න ඇය විසින් නිරතුරුව සොයා බැලේ.

බැංකු සේවයට එක්වන්නට පෙර වෘත්තීය නීතිවේදිනියක වශයෙන් ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ කටයුතු කළ ඇය පුද්ගලික අංශයේ සමාගම් කිහිපයකම මූලික කොටස් නිකුතූන්, සමාගම් ඒකාබද්ධ කිරීම් සහ නෛතික හා මානව සම්පත් කටයුතු ඇතුළුව ලේකම් කටයුතු හැසිරවීම සිදු කොට ඇත.

තවද, ඇය කැළණිය විශ්වවිද්‍යාලයේ කර්මාන්ත කළමනාකරණ දෙපාර්තමේන්තුවේ වාණිජ හා කර්මාන්ත නීතිය සම්බන්ධයෙන් බාහිර කථිකාචාර්යවරියක ලෙස ද කටයුතු කර ඇත.

ඩී එන් එල් ප්‍රනාන්දු මහතා
ප්‍රධාන අවදානම් නිලධාරි

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2015 දෙසැම්බර් මස

කුසලතා හා අත්දැකීම්
ප්‍රනාන්දු මහතා බැංකුවේ සියලුම අංශයන් පුරා විහිදුනු වසර 32 ක අත්දැකීම් වලින් පරිපූර්ණ වෘත්තීය බැංකුකරුවකු වේ.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ ගණිත අංශයේ විද්‍යාවේදී උපාධිධාරියෙකු වන අතර ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ.

වෘත්තීය මං සලකුණු
වෘත්තීය ජීවිතයේ මුල් භාගයේදී ඔහු මධ්‍යම හා ඌව පළාත් වල ශාඛාවන්හි විවිධ තනතුරු දරමින් කටයුතු කළ අතර, පසුව ප්‍රධාන කාර්යාලයේ අයකර ගැහීමේ අංශයේ සහ නිමැවුම් හා සංවර්ධන බැංකු අංශයේ සේවය කළේය. මෙම කාලය තුළදී නව නිමැවුම් හා සේවා කිහිපයක්ම හඳුන්වාදෙන ලදී. ඔහු 1995 දී ලන්ඩන් ශාඛාවේ වසරක පුහුණුවක් ලැබූ අතර, පාකිස්තානයේ කරච්චි නුවර පිහිටි ශාඛාවේ වසර තුනක් සේවය කරමින් විදේශීය අත්දැකීම් ලබාගන්නා ලදී.

තවද, ප්‍රධාන අවදානම් නිලධාරි තනතුරට පත්වීමට පෙර ප්‍රනාන්දු මහතා වසර හතරක් පුරා බැංකුවේ විශාලතම පළාත වන බස්නාහිර පළාත දකුණ භාර සහකාර මහා කළමනාකරු ලෙස සිය දායත්වය ලබාදුන්නේය. එමෙන්ම ඔහු ලංකා බැංකුව (එක්සත් රාජධානිය) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරි ලෙස වසර තුනක් කටයුතු කළේය.

ප්‍රධාන අවදානම් නිලධාරි ලෙස බැංකුවේ අවදානම් කළමනාකරණ සංස්කෘතිය වෙනස් මඟකට පරිවර්තනය කිරීම, එහි විෂය පථය පුළුල් කිරීම සහ බැංකුවේ අවදානම් ආකෘති විවිධ වාර්තා කිරීම් මට්ටම් වලදී වැඩි දියුණු කිරීම ආදිය ඔහුගේ උපකාරය මත සිදුවිය.

එම් එම් ලක්ෂමන් පෙරේරා මහතා
ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරි

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2013 අගෝස්තු මස

කුසලතා හා අත්දැකීම්
බැංකු ක්ෂේත්‍රයේ වසර 32 කට වඩා පළපුරුද්දක් ඇති පෙරේරා මහතා තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශයෙන් විවිධ තනතුරු හොබවමින් අත්දැකීම් රාශියක් ලබා ගත් අයෙකි.

පෙරේරා මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා උපාධිධරයකු වන අතර, ඔහු එම විශ්වවිද්‍යාලයෙන්ම පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියද, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධියද හිමි කර ගෙන ඇත. තවද, ඔහු ශ්‍රී ලංකාවේ පරිගණක සංගමයේ අධි සාමාජිකත්වය දරණ අතර බ්‍රිතාන්‍ය පරිගණක සංගමයේ සාමාජිකත්වය ද උසුලයි.

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු
ඔහු බැංකුවල CIO සංගමයේ සභාපතිත්වයත් FINCSIRT හි මෙහෙයුම් කමිටුවේ සාමාජිකත්වයත් දරන ලදී.

වෘත්තීය මං සලකුණු
පෙරේරා මහතා 1986 වසරේ දී පද්ධති විශ්ලේෂණ නිලධාරියකු ලෙස ලංකා බැංකුවේ සේවයට බැඳුණි. මූලික බැංකු යෙදවුම් පද්ධති වලට සම්බන්ධ වීමෙන් ඔහුගේ බැංකු වෘත්තිය ආරම්භ කරන ලද අතර, බහුකාර්ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති වලට ක්‍රියාකාරි ලෙස සම්බන්ධ වීමෙන් පලපුරුද්ද වඩාත් තීව්‍ර කර ගන්නා ලදී. ආයතනික කළමනාකාරිත්වයට පත්වීමට පෙර ඔහු තොරතුරු තාක්ෂණ සහකාර අධ්‍යක්ෂ (යෙදවුම් පද්ධති) ලෙස සේවය කර ඇත.

1996-1997 අතර කාල පරාසය තුළ ඔහු දකුණු අප්‍රිකාවේ ස්ටෑන්ඩර්ඩ් බැංකුවෙහි ද සේවය කර ඇත.

ගයා ජයසිංහ මහත්මිය
ප්‍රධාන නීති නිලධාරී

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2016 ජූනි මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධූරයන්
Travels

කුසලතා සහ අත්දැකීම්
ජයසිංහ මහත්මියට වසර 34 කට අධික කාලයක් නීති ක්ෂේත්‍රයේ අත්දැකීම් ඇති අතර, වසර 31 කට අධික කාලයක් ලංකා බැංකුවේ අත්දැකීම් ලබා ඇත. ඇය වෘත්තියෙන් නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්වරියක වේ. එමෙන්ම ඇය අන්තර්ජාතික වෙළඳ නීතිය පිළිබඳ පශ්චාත් - නීතිවේදී ඩිප්ලෝමාවක් හිමි කර ගෙන ඇත. ඇය ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ මෙන්ම ආයතනික නීතිඥ සංගමයේ ද සාමාජිකත්වය උසුලයි.

ඇය සතුව, ණය ගනුදෙනු ලේඛනගත කිරීම සහ බැංකු නීතිය පිළිබඳව පුළුල් දැනීමක් තිබේ. ආසියානු පැසිෆික් කලාපයේ යුරෝ මනී ට්‍රේනින් ආයතනය මඟින් පවත්වන ලද සංකීර්ණ ණය ගනුදෙනු සඳහා වන ලියකියවිලි, ඇපකර පිළිබඳ නීතිය සහ සිංගප්පූරුවේ සහ හොංකොං හි ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිතා වන ණයවර ලිපි පිළිබඳ ජාත්‍යන්තර පුහුණුවක් ඇය සතුය.

වෘත්තිය මං සලකුණු
ජයසිංහ මහත්මිය, සහකාර නීති නිලධාරිනියක ලෙස 1986 ජූලි මස දී ලංකා බැංකුවට සම්බන්ධවී ඇයගේ බැංකු වෘත්තිය ලංකා බැංකුවේ නීති අංශයෙන් ආරඹා ඇත. ලංකා බැංකුවේ පළාත් නීති ඒකක කිහිපයක සේවය කරමින් ණය සහ අයකරගැනීම්, බැංකු නීතිය හා වාණිජ ගනුදෙනු සඳහා අදාළ සියලු ආකාරයේ නීති රීති පිළිබඳ පුළුල් දැනුම් සම්භාරයක් ලබා ඇත.

වසර 2005 සිට 2012 දක්වා ජ්‍යෙෂ්ඨ නීති නිලධාරිනියක ලෙස ආයතනික ශාඛාව සඳහා සුවිශේෂී දායකත්වයක් සපයන ලදී. එහි දී ඇය ඒකාබද්ධ ණය පහසුකම්, නැව් හා සම්බන්ධ උකස් සහ වෙළඳ මූල්‍ය කටයුතු සඳහා බලපවත්වන නීති රීති පිළිබඳ පුළුල් පරිචයක් ලැබීය. ප්‍රධාන නීති නිලධාරී ලෙස පත්වීම ලැබීමට පෙර ඇය 2012 සිට 2016 දක්වා ණය පිළිබඳ නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරී ලෙස සේවය කර ඇත.

ජයසිංහ මහත්මිය ශ්‍රී ලංකා මහ බැංකුවේ පුහුණු කිරීම් ආයතනයේ වෙළඳ හා බැංකු නීතිය පිළිබඳ බාහිර කථිකාචාර්යවරියක ලෙසද සේවය කරයි.

සී අමරසිංහ මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(ශාඛා බැංකු කටයුතු කලාප II)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2016 ජූලි මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධූරයන්
Travels සහ PDML සමාගම් වල විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

කුසලතා සහ අත්දැකීම්
අමරසිංහ මහතා ශාඛා බැංකු කටයුතු, ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු ආදී විවිධ ක්ෂේත්‍ර පිළිබඳව වසර 28 කට වැඩි අත්දැකීම් සම්භාරයක් ඇති වෘත්තීය බැංකුකරුවෙකි.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ රාජ්‍ය පරිපාලනය විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ද, එම විශ්වවිද්‍යාලයෙන්ම ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ද හිමි කර ගෙන ඇත. එමෙන් ම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු ද වේ.

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු
ඔහු ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

එමෙන්ම අමරසිංහ මහතා ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ උප සභාපති ලෙසද කටයුතු කරයි.

වෘත්තිය මං සලකුණු
අමරසිංහ මහතා 1990 වර්ෂයේ දී කළමනාකරණ අභ්‍යාසලාභියකු ලෙස සිය බැංකු ජීවිතය ශාඛා බැංකුකරණයෙන් ආරම්භ කළ අතර, පසුව ආයතනික හා අක්වෙරළ බැංකු අංශය හා සම්බන්ධ වී එම ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් හා අත්දැකීම් ලබා ගන්නා ලදී. එමෙන්ම ආයතනික හා අක්වෙරළ බැංකු අංශයේ ව්‍යාපාර කටයුතු ප්‍රවර්ධනය සඳහා සැලකිය යුතු කාලයක් ඔහු විසින් විශේෂ දායකත්වයක් සපයන ලදී.

ආයතනික කළමනාකාරිත්වයට පත් වීමට පෙර ඔහු සහකාර මහා කළමනාකරු (අක්වෙරළ බැංකු කටයුතු) සහ සහකාර මහා කළමනාකරු (ආයතනික සබඳතා) ලෙස කටයුතු කරන ලදී.

එම් ජේ පී සල්ගාදු මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(නිමැවුම් හා බැංකුකරණ සංවර්ධන)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2016 ජූලි මස

කුසලතා සහ අත්දැකීම්
සල්ගාදු මහතා ශාඛා බැංකු කටයුතු, පළාත් විකුණුම් කළමනාකරණය සහ නිමැවුම් හා සංවර්ධන බැංකුකරණය යන ක්ෂේත්‍ර පිළිබඳ පුළුල් දැනුමක් සහිතව වසර 28 කට අධික කාලයක් ලංකා බැංකුවේ අත්දැකීම් ලබා ඇත.

ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වාණිජවේදී (විශේෂ) උපාධියක් ලබා ගෙන ඇති අතර, වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීන්ගේ සංගමයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ. එමෙන්ම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ ආවසරික සහනික පත හිමි කරගෙන ඇත.

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු
සල්ගාදු මහතා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයද නියෝජනය කරයි.

වෘත්තීය මං සලකුණු
සල්ගාදු මහතා වසර 1990 ජනවාරි මස දී කළමනාකරණ අභ්‍යාසලාභියකු ලෙස ලංකා බැංකුවේ ශාඛා බැංකු කටයුතු හරහා තම බැංකු වෘත්තීය ආරම්භ කළ අතර ඔහු පසුව ප්‍රධාන පෙළේ තනතුරු කිහිපයක් හොබවමින් දේශීය බැංකු කටයුතු සහ ණය කාඩ්පත් මෙහෙයුම් පිළිබඳ පුළුල් අත්දැකීම් ලබා ඇත.

සල්ගාදු මහතා ආයතනික කලමනාකාරිත්වයට පත්වීමට පෙර, සහකාර මහා කළමනාකරු (පළාත් විකුණුම් කළමනාකරණ) ලෙස බැංකුවේ ISSP මෙහෙයුම් ඒකකය ස්ථාපිත කිරීම සඳහාත්, විශේෂ ව්‍යාපෘති, බී ඕ සී ඇමතුම් ඒකකය, ප්‍රමුඛතා බැංකුකරණ ඒකකය සහ බී ඕ සී සහනික කිරීමේ දෙපාර්තමේන්තුව යන අංශ ඔහුගේ අධීක්ෂණයට අයත් විය. එමෙන්ම ඔහු ලංකා බැංකුවේ "වෙනස" ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සාමාජිකයකු ද වේ.

ආර් එම් ඩී විපුල ජයබාහු මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(මූල්‍ය හා සැලසුම්)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2016 නොවැම්බර් මස

සමූහ සමාගම් වල සභාපති ධුරයන්
TLRS

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්
විකල්ප අධ්‍යක්ෂ MBSL සහ HCL

කුසලතා සහ අත්දැකීම්
බැංකුවේ විවිධ ව්‍යාපාරික මෙහෙයුම් පිළිබඳ වසර 28 කට වඩා වැඩි බැංකුකරණ අත්දැකීම් ජයබාහු මහතා සතුය.

ඔහු කැළණිය සරසවියේ ව්‍යාපාරවේදී (විශේෂ) උපාධිය ලබා ඇති අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවක් ද ලබා ඇත. එමෙන්ම ඔහු ඕස්ට්‍රේලියාවේ දකුණු කුවින්ස්ලන්ඩ් සරසවියෙන් මූල්‍ය කටයුතු පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී පශ්චාත් උපාධියක් ලබා ඇත. එමෙන්ම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කළමනාකරණ අධ්‍යයන ආයතනය මඟින් පවත්වනු ලබන කළමනාකරණ සංවර්ධන පාඨමාලාවක් ද ඔහු සාර්ථකව සම්පූර්ණ කර ඇත.

වෘත්තීය මං සලකුණු
වර්ෂ 1990 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස ලංකා බැංකුවට එක් වූ ඔහු ග්‍රාමීය බැංකු කටයුතු සහ ශාඛා බැංකු කටයුතු හරහා තම බැංකු වෘත්තීය ආරම්භ කර ඇත. අනතුරුව මූල්‍ය කළමනාකරණය පිළිබඳ විශේෂිත අත්දැකීම් ලබා ගනිමින් බැංකුවේ ආයතනික සැළසුම් කිහිපයක් සකස් කිරීම සඳහා සිය දායකත්වය සපයා ඇත.

ලංකා බැංකුවේ සජීවී ජාලගත මූලික බැංකු මෙහෙයුම් පද්ධතිය (ICBS) හඳුන්වාදීමේ ව්‍යාපෘතියේ කණ්ඩායම් නායකයෙකු ලෙස ඔහු කටයුතු කර ඇත. එමෙන්ම නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත හඳුන්වා දීමේ ගිණුම්කරණ ව්‍යාපෘතිය, බැංකුවේ මූලික බැංකු මෙහෙයුම් පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සහ වෙනත් පරිගණක පද්ධති හඳුන්වා දීමේ ව්‍යාපෘතීන්හිදී කණ්ඩායම් සාමාජිකයින් වෙත මඟ පෙන්වමින් සිය දැනුම සහ අත්දැකීම් ලබා දී ඇත.

ආයතනික කළමනාකාරිත්වයට පත් වීමට ප්‍රථම ජයබාහු මහතා 2012 අගෝස්තු සිට 2016 නොවැම්බර් දක්වා සහකාර මහා කළමනාකාර (අයවැය, ක්‍රමෝපාය සැළසුම් සහ කළමනාකරණ තොරතුරු පද්ධති) ලෙස විධායක කළමනාකාරිත්වය නියෝජනය කරන ලදී.

ජයබාහු මහතා ලංකා බැංකුවට එක්වීමට ප්‍රථම පුහුණු නිලධාරියෙකු ලෙස අපනයන සංවර්ධන මණ්ඩලයේ සහ සහකාර ගණකාධිකාරීවරයෙකු ලෙස ලංකා සතොස ආයතනයේ සේවය කර ඇත.

එම් ටී එම් ජලාල්ඩීන් මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(ආයතනික පරිවර්තන ව්‍යාපෘති)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2016 නොවැම්බර් මස දී

කුසලතා සහ අත්දැකීම්
ජලාල්ඩීන් මහතා ලංකා බැංකුවේ වසර 28 කට වැඩි අත්දැකීම් සහිතව ලංකා බැංකුවේ විවිධ මෙහෙයුම් ක්ෂේත්‍ර සම්බන්ධව පුළුල් හා ප්‍රායෝගික දැනුමක් ලබා ඇත.

ඔහු යාපනය සරසවියේ ගණිත විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබා ඇති අතර, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ බැංකු හා මූල්‍ය කටයුතු පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවක්ද ලබා ඇත. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන ඔහු එම ආයතනයෙන් ඉස්ලාමීය බැංකුකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද ලබා තිබේ.

ශ්‍රී ලංකාව පුරා විවිධ ප්‍රදේශයන්හි විවිධ වූ තනතුරු දරමින් සේවය කර ඇති ඔහු එමඟින් ශාඛා බැංකු කටයුතු හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ඇත. තාක්ෂණය හා සබැඳි බැංකුකරුවෙකු වන ඔහු සුවිශේෂී තාක්ෂණික භාවිතයන් සහිත බැංකු මෙහෙයුම් හා සබැඳි ව්‍යාපෘති මෙහෙයුම් සඳහා විශේෂ හැකියාවක් සහිත වේ.

වෘත්තිය මං සලකුණු
වර්ෂ 1990 දී කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස තම වෘත්තිය ආරම්භ කළ ජලාල්ඩීන් මහතා ක්‍රමිකව තම වෘත්තියේ ඉහළ තලයකට පැමිණ ඇත. ඔහු ලංකා බැංකුවේ චෙන්නායි ශාඛාවේ නියෝජ්‍ය කළමනාකරු ලෙස 2010 ඔක්තොබර් සිට වසර දෙකක කාලයක් සේවය කර ඇත.

ඔහුගේ නැවත පැමිණීමෙන් පසුව ඔහු ලංකා බැංකුවේ අනුකූලතා නිලධාරී ලෙස පත්විය. 2013 මාර්තු සිට වසර එකහමාරක කාලයක් ඔහු සහකාර මහා කළමනාකරු (මානව සම්පත් මෙහෙයුම්) ලෙස සේවය කළ අතර, එයට සමගාමීව ලංකා බැංකුවේ සජීවී ජාලගත මූලික බැංකු මෙහෙයුම් පද්ධතිය (ICBS) යාවත්කාලීන කිරීමේ ව්‍යාපෘතිය ද මෙහෙයවනු ලැබීය. එමෙන්ම ඔහු 2014 ජූලි මස සිට වසර දෙකක කාලයක් ආයතනික පරිවර්තන ව්‍යාපෘතිය යටතේ මෙහෙයවනු ලැබූ ව්‍යාපාර මෙහෙයුම් නව මානයට හැරවීමේ අනු ව්‍යාපෘතිය හාර ව්‍යාපෘති කළමනාකරු ලෙස සේවය කරන ලදී. නියෝජ්‍ය මහා කළමනාකාර ධූරයට උසස් වීමෙන් පසුවද, ආයතනික පරිවර්තන ක්‍රියාවලිය සඳහා ඔහුගේ නායකත්වය අඛණ්ඩව ලබාදෙයි.

ඩී එම් එල් බී දසනායක මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(ශාඛා බැංකු කටයුතු කලාප I)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2016 දෙසැම්බර් මස දී

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධූරයන්
විකල්ප අධ්‍යක්ෂ MBSL

කුසලතා සහ අත්දැකීම්
දසනායක මහතා වසර 35 කට අධික සේවා කාලයක් සහිතව දේශීය මෙන්ම විදේශීය බැංකු ශාඛාවල සේවය කරමින් ශාඛා බැංකු කටයුතු, ආයතනික මූල්‍ය කටයුතු සහ ජාත්‍යන්තර මෙහෙයුම් පිළිබඳ පුළුල් අත්දැකීම් ලබා ඇත.

දසනායක මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපති කලා උපාධියක් (ආර්ථික විද්‍යා විශේෂ) ලබා ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳව පශ්චාත් ඩිප්ලෝමාවක් ද, ඉන්දියාවේ මහත්මා ගාන්ධි විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳව පශ්චාත් උපාධියක්ද ලබා ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු ද වේ.

ආයතනික කළමනාකාරිත්වයේ දරණ ලද තනතුරු
නේවාසික කළමනාකරු - (මාලේ ශාඛාව)
2016 දෙසැම්බර් මස සිට 2017 පෙබරවාරි දක්වා

නියෝජ්‍ය මහා කළමනාකරු - (ශාඛා බැංකු කටයුතු කලාප I) 2017 පෙබරවාරි මස සිට මේ දක්වා

වෘත්තිය මං සලකුණු
1982 වර්ෂයේදී තම බැංකු වෘත්තිය ආරම්භ කරමින් සියලු අංශයන් පිළිබඳව පූර්ණ අත්දැකීමක් ලබා ඇති දසනායක මහතා වසර 9 කට අධික කාලයක් විදේශ ශාඛාවල ආයතනික බැංකුකරණය සහ විදේශ මෙහෙයුම් පිළිබඳව විශේෂඥ දැනුමක් ලබා ඇත. ආයතනික අංශයේ සබඳතා නිලධාරියෙකු, සබඳතා කළමනාකරුවෙකු ලෙස කටයුතු කර ඇති අතර පසුව ඔහු එම අංශයේම සහකාර මහා කළමනාකරු (ආයතනික ණය) ලෙස පත් විය. ඔහු විසින් වර්ෂ 2000 සිට 2003 කාලය තුළදී ලංකා බැංකුවේ පරිපාලිත සමාගමක් වන ලංකා බැංකුව (එක්සත් රාජධානිය) ලන්ඩන් ශාඛාවේ වෙළඳ මූල්‍ය කටයුතු හාර ප්‍රධානී ලෙස කටයුතු කර ඇත.

2016 ආයතනික කළමනාකාරිත්වයට පත් වීමට ප්‍රථමව දසනායක මහතා විසින් මාලේ ශාඛාවේ නේවාසික කළමනාකරු ලෙස සේවය ලබා දෙන ලදී.

ඩබ් ඒ සී තිසේරා මහතා
නියෝජ්‍ය මහා කළමනාකරු
(අයකර ගැනීම්)

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2016 දෙසැම්බර් මස

සමූහ සමාගම් වල අධ්‍යක්ෂ ධුරයන්
MSS

කුසලතා සහ අත්දැකීම්
වසර 39 කට වැඩි බැංකු ක්ෂේත්‍රයේ පුළුල් අත්දැකීම් සහිත තිසේරා මහතා, සංවර්ධන බැංකුකරණය සහ ක්ෂුද්‍ර මූල්‍ය බැංකු කටයුතු පිළිබඳව සුවිශේෂී අත්දැකීම් සහිතව කෘෂිකර්ම, ධීවර හා පශු සම්පත් යන ක්ෂේත්‍ර වලට ණය දීම පිළිබඳ තම විශේෂඥ දැනුම තවදුරටත් ප්‍රකාශනය කරමින් සිටී.

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන ඔහු එම ආයතනයෙන් බැංකු කළමනාකරණය පිළිබඳව පශ්චාත් විධායක ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු
තිසේරා මහතා කෘෂිකර්ම හා ගොවිජන සේවා රක්ෂණ මණ්ඩලයේ සහ ජාතික ධීවර මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙසද කටයුතු කර ඇත.

වෘත්තිය මං සලකුණු
වසර 1978 දී බැංකු වෘත්තිය ආරම්භ කළ ඔහු සංවර්ධන බැංකු කටයුතු සහ විශේෂයෙන් ව්‍යාපෘති සඳහා ණය දීම පිළිබඳ සුවිශේෂී අත්දැකීම් ලබා ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළමු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව - කළුතර සඳහා අඛණ්ඩව වසර පහක් සේවය කිරීමට එතුමාව තෝරා පත් කර ඇත.

ශක්‍යතා ගොඩනැංවීම, නිපුණතා සංවර්ධනය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය වැනි ක්ෂුද්‍ර මූල්‍ය කළමනාකරණ පුහුණු වැඩසටහන් ශාඛා ජාලය සහ මධ්‍යම පුහුණු කිරීමේ ආයතනය තුළ පැවැත්වීම සඳහා ඔහුගේ විශේෂිත දැනුම සහ අත්දැකීම් ඉවහල් වී ඇත. තිසේරා මහතා ආයතනික කළමනාකාරිත්වයට පත්වීමට ප්‍රථම වසර පහක් පුරා සහකාර මහා කළමණාකරු (සංවර්ධන බැංකු කටයුතු) ලෙස ක්‍රියා කර ඇත.

අකීය ණය අයකරගැනීමේ ක්‍රියාවලිය සඳහා ඔහු විසින් ශාඛා ජාලය තුළ "වගකියන අයකිරීමේ සංස්කෘතියක්" ගොඩනැංවීම සඳහා මූලික පියවරගෙන කටයුතු කර ඇත. එමඟින් බැංකුව තුළ යහපත් අක්‍රීය ණය මට්ටමක් පවත්වා ගැනීමට හැකි වී ඇත.

ආචාර්ය ඉඳුනිල් ලියනගේ
ප්‍රධාන අලෙවිකරණ නිලධාරී

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2012 සැප්තැම්බර් මසදී

කුසලතා සහ අත්දැකීම්
ආචාර්ය ලියනගේ නොයෙකුත් ආයතන වල අලෙවිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධව සිය දායකත්වය ලබා දෙමින් 1989 වසරේ සිට වසර 28 කට අධික කාලයක් ශ්‍රී ලාංකීය මූල්‍ය සේවා කර්මාන්තයේ සහ වේගවත්ව අලෙවි වන පාරිභෝගික භාණ්ඩ (FMCG) ක්ෂේත්‍රයේ, විද්‍යුත් උපකරණ සහ කෘෂිකාර්මික අංශයේ අත්දැකීම් සම්භාරයක් ලබා ඇත.

ආචාර්ය ඉඳුනිල් ලියනගේ වෘත්තීයමය වශයෙන් සහ අධ්‍යාපනික වශයෙන් අලෙවිකරණය, කළමනාකරණය සහ මූල්‍ය යන විෂය පථයන් තුනකින් සුදුසුකම් ලබා ඇත. ඔහු ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරී අධ්‍යයන පීඨයේ ආචාර්ය උපාධිධාරියකු වේ. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය ලබා ගෙන ඇත. තවද, ලියනගේ මහතා එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකු ද වේ. එමෙන්ම ඔහු ඕස්ට්‍රේලියානු සහතිකපත් කළමනාකරණ ගණකාධිකරුවන්ගේ සංගමයේ (ICMA) සාමාජිකත්වය ද දරයි.

ආචාර්ය ලියනගේ ශ්‍රී ලංකාවේ ප්‍රථම වරලත් අලෙවිකරුවන්ගේ කණ්ඩායමේ සාමාජිකයෙකු වන අතර, ඔහු 1997 වසරේ සිට වරලත් අලෙවිකරුවකු ලෙස කටයුතු කරයි. එමෙන්ම ඔහු වරලත් අලෙවිකරණ ආයතනයේ (CIM) සහ ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ (FSLIM) අධි සාමාජිකත්වය උසුලයි. ඔහු 1995 වසරේ සිට එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකයෙකු ලෙස සහ 2017 වසරේ සිට ඕස්ට්‍රේලියාවේ සහතිකලත් ගණකාධිවරුන්ගේ ආයතනයේ (CMA) සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. ඔහු 2009 වසරේදී සිංගප්පූරු ජාතික විශ්වවිද්‍යාලයෙන් (NUS) පවත්වනු ලැබූ උපායමාර්ගික කළමනාකරණ විධායක වැඩසටහන ද ඇතුව විවිධ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වී ඇත.

වෘත්තිය මං සලකුණු
ලංකා බැංකුවට එක්වීමට ප්‍රථම ආචාර්ය ලියනගේ ජාතික සංවර්ධන බැංකුවෙහි සහකාර උප සභාපති (ප්‍රධාන අලෙවිකරණ) ලෙස සේවය කර ඇත. එමෙන්ම ඔහු බහුජාතික සහ දේශීය සමාගම් වල නිමැවුම් ධාරිතාව/සන්නම් කළමනාකරු සහ අලෙවිකරණ කළමනාකරු යන ජ්‍යේෂ්ඨ තනතුරු උසුලා ඇත. ඔහුගේ අලෙවිකරණ වෘත්තිය පුරා ප්‍රමුඛ දේශීය හා අන්තර්ජාතික සන්නම්/නිමැවුම් ගොඩනැංවීමට ඔහු සමත්වී ඇත.

ආචාර්ය ලියනගේ මහතා ශ්‍රී ලංකා වෘත්තිකයන්ගේ සංගමය (OPA) විසින් සංවිධානය කරන ලද Pinacle Award 2016 සම්මාන උළෙලේදී අලෙවිකරණය සඳහා වන ජාතික ගෞරව (APEX) සම්මානයෙන් පිදුම් ලැබීය. ආචාර්ය ලියනගේ වර්ෂ 2015 දී ඉන්දියාවේ මුම්බායිහිදී පැවැත්වූ ලෝක අලෙවිකරණ සම්මේලනයේදී බලවත්ම අලෙවිකරණ නියමුවන්ගේ ලැයිස්තුවෙන් ගෞරවයට පාත්‍ර විය. එමෙන්ම ඔහු මලයාසියාවේ පැවැත්වූ 2013 ගෝල්ඩන් ග්ලෝබ් ටයිගර් සම්මාන උළෙලෙහි දී "දක්ෂතම ප්‍රධාන අලෙවිකරණ නිලධාරීන් 50" යන සම්මානයෙන් පිදුම් ලැබූ අතර, ඇමරිකා එක්සත් ජනපදයේ හවායි හී පිහිටි "ඇමරිකා එක්සත් ජනපදය - ජපානය කළමනාකරණ විද්‍යායතනය" (JAIHS) මඟින් පැවැත්වූ ගෝලීය කළමනාකරුවන් සඳහා වන අන්තර් සංස්කෘතික අධ්‍යාපන වැඩසටහන සඳහා තේරී පත් වූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා ද වේ. ඔහුගේ විෂය, ජාත්‍යන්තර අවබෝධය සහ කීර්තිනාමය වෙනුවෙන් ලබාදෙන ලද විභව දායකත්වය ඇගයීම උදෙසා 1996 දී ජපානයේ ෆුජිට්සු පදනම විසින් ඉහත වැඩසටහන නිම කිරීම සඳහා ඔහුට පූර්ණ ශිෂ්‍යත්වයක් පිරිනමන ලදී.

පී එම් ලියනගේ මහතා
ප්‍රධාන අභ්‍යන්තර විගණක

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2014 දෙසැම්බර් මස

කුසලතා හා අත්දැකීම්
ලියනගේ මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙක් වන අතර, වරලත් ගණකාධිකාරී සුදුසුකම ලබා ගැනීමෙන් පසු වසර 18 ක අත්දැකීම් සම්භාරයකට හිමිකම් කියන අයෙකි. ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ගණකාධිකරණය සහ මූල්‍ය කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය ලබා ඇති අතර, ඇමරිකාවේ තොරතුරු පද්ධති විගණන හා පාලන සංගමයේ (ISACA) සහතිකලත් තොරතුරු පද්ධති විගණකයන්ගේ (CISA) සාමාජිකයෙකුද වේ.

වෘත්තීය මං සලකුණු
ලංකා බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස පත් වීමට ප්‍රථම ඔහු සී/ස කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී සහ පෘන් ඒෂියා බැංකුවේ එම තනතුරම දරා ඇත. ලියනගේ මහතා 2006 සිට 2008 කාලපරිච්ඡේදයේ දී ලංකා බැංකුවේ අභ්‍යන්තර විගණක ලෙස සහකාර මහා කළමනාකාර ශ්‍රේණියේ කටයුතු කර ඇත.

ඔහු සී/ස ලංකාක්ලියර් (පෞද්ගලික) සමාගමේ මූල්‍ය හා පරිපාලන කළමනාකරු ලෙසත්, අර්න්ස්ට් ඇන්ඩ් යංග් ආයතනයේ සුදුසුකම් ලත් සහායකයෙකු ලෙසත් කටයුතු කර ඇත.

පී සී වික්‍රමපතිරණ මහතා
තාක්ෂණික පරිවර්තන ප්‍රධානී

ආයතනික කළමනාකාරිත්වයට පත්වීම
2016 ජූලි මස

කුසලතා සහ අත්දැකීම්
වික්‍රමපතිරණ මහතා තොරතුරු තාක්ෂණ නායකත්වය, කළමනාකරණය සහ තාක්ෂණ පරිවර්තන පිළිබඳ වසර 31 කට අධික පළපුරුද්දක් ඇති වෘත්තීය තොරතුරු තාක්ෂණවේදියෙකි. ඔහු විසින් වසර 27 කට වැඩි කලක් බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රය ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක තොරතුරු තාක්ෂණය පිළිබඳ අධීක්ෂණ හා ආයතනික කළමනාකාර තනතුරු හොබවා ඇත.

ඔහු ඉන්දියාවේ සිකිම් මනිපාල් විශ්වවිද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණවේදය පිළිබඳ පශ්චාත් උපාධියත්, එක්සත් රාජධානියේ කීලේ විශ්වවිද්‍යාලයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් පාඨමාලාවක් සහ ආයතනික කළමනාකරණය පිළිබඳ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනය මඟින් පවත්වන ලද පශ්චාත් උපාධි පාඨමාලාවක් සම්පූර්ණ කර ඇත. එමෙන්ම ඔහු ස්විඩන් කළමනාකරණ ආයතනයෙන් (IFL) ව්‍යවහාරික අන්තර්ජාතික ඩිප්ලෝමාව ද සම්පූර්ණ කර ඇත.

වසර තුළ දරණ ලද අනෙකුත් තනතුරු
වික්‍රමපතිරණ මහතා විසින් ආසියා පැසිෆික් තොරතුරු තාක්ෂණ සම්මාන උළෙල්දී (APICTA) ශ්‍රී ලංකාව නියෝජනය කරමින් විධායක කමිටු සාමාජිකත්වය උසුලන ලදී. එමෙන්ම ඔහු ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ මණ්ඩලයේ (FITISL) අධ්‍යක්ෂවරයෙකු ලෙසද, ඉන්ෆොටෙල් (INFOTEL) ලංකා සංගමයේ විධායක කමිටු සාමාජිකයෙකු ලෙසද කටයුතු කර ඇත.

වෘත්තීය මං සලකුණු
ලංකා බැංකුවට සම්බන්ධ වීමට ප්‍රථම වික්‍රමපතිරණ මහතා අමානා බෑන්ක් පී එල් සී ආයතනයේ ප්‍රධාන තොරතුරු නිලධාරී ලෙස වසර පහකට අධික කාලයක් සේවය කර ඇත. ඔහු අමානා ඉන්වෙස්ට්මන්ට් සමාගමේ ද ප්‍රධාන තාක්ෂණික නිලධාරී ලෙස කටයුතු කර ඇත. ඔහු එක්සත් ජාතීන්ගේ ජාත්‍යන්තර ආයතනයක ජාතික තොරතුරු තාක්ෂණ උපදේශක ලෙස සේවය කරමින් රාජ්‍ය අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුළුල් පරිචයක් ලබා ඇත. එමෙන්ම ඔහු ශ්‍රී ලාංකික තොරතුරු තාක්ෂණ මෘදුකාංග සමාගමක කළමනාකරණ අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී ලෙස කටයුතු කර ඇත. මෙයට පෙරාතුව කොළඹ පිහිටි ප්‍රධාන ලැයිස්තු ගත සමූහ සමාගම් ජාලයක සමූහ තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ ලෙස කටයුතු කර ඇත. එමෙන්ම ඔහු එහි අනුබද්ධිත සමාගම් කිහිපයකද අධ්‍යක්ෂධුර දරා ඇත.

වික්‍රමපතිරණ මහතා බැංකු වල CIO සංසදයේ ආරම්භක සාමාජිකයකු වන අතර, 2013/2014 සහ 2014/2015 කාල වලදී එම සංසදයේ ලේකම් ලෙස කටයුතු කර ඇත. ඔහු ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ මෘදුකාංග කර්මාන්ත එකමුතුවේ (SLASI) 2005/2006 වසර සභාපතිවරයා ද විය.

BoC UK – ලංකා බැංකුව (යූ.කේ.) සමාගම, PDL – සී/ස ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී.එල්.සී, HCL – සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම, MSS – සී/ස බී.ඕ.සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝට් සර්විසස් (පෞද්ගලික) සමාගම, PDML – බී.ඕ.සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම, Travels – සී/ස බී.ඕ.සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම, MBSL – මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී, MBSL Insurance – සී/ස එම්.බී.ස්.එල් ඉන්ෂුවරන්ස් සමාගම, KHP – සී/ස කොළදෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම, HH – සී/ස සී බෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම, Ceybank Asset – සී/ස සී බෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම, TLRS – සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම.





නවෝත්පාදන පරිසරයක්

බැංකුකරණය ඇසිපිය හෙලන නිමේශයෙන් වෙනස්වීම් වලට භාජනය වෙමින් තිබේ. මෙම නව රැල්ල හා අනුගත වෙමින් එය ග්‍රහණය කර ගැනීමට නම් අපට "රාමුවෙන් පිටතින්" සිතීමට කාලය පැමිණා ඇත. "නවෝත්පාදනය" අපගේ ශබ්දකෝෂය තුළ යළි යළිත් නිමිනාද වීමට මූලික වී ඇත්තේ මෙම සත්‍යයයි.



විධායක කළමනාකාරිත්වය



ඩබ් අයි හෙට්ටිහේවා
සහකාර මහා කළමනාකාරිණී -
දකුණු පළාත



එස් එම් ඩබ් සමරකෝන්
සහකාර මහා කළමනාකරු -
ජාත්‍යන්තර කටයුතු



පී ඒ ජයශාන්ත
සහකාර මහා කළමනාකරු -
බස්නාහිර පළාත දකුණ



ජේ ඒ ඒ ජයසිංහ
සහකාර මහා කළමනාකරු -
මානව සම්පත් මෙහෙයුම්



ඩබ් එන් පී සුරවීමල
සහකාර මහා කළමනාකරු -
අක්වෙරළ බැංකුකරණය



ඊ එම් ජයරත්න
සහකාර මහා කළමනාකරු -
පළාත් විකුණුම් කළමනාකරණය



ටී ඒ ඩී කුලරත්න
සහකාර මහා කළමනාකරු -
ආයතනික සබඳතා



ඩී ආර් එල් පෙරේරා
සහකාර මහා කළමනාකරු -
ශාඛා ණය - කලාප II



ආර් පී ඩී කේ රත්නසිංහ
සහකාර මහා කළමනාකරු -
ආයතනික ණය



ඒ ද එස් පින්නදුවගේ
සහකාර මහා කළමනාකරු - අනුකූලතා



කේ ටී ඒ ඊ ද සිල්වා
සහකාර මහා කළමනාකරු -
විද්‍යුත් බැංකුකරණ මධ්‍යස්ථානය



ඩී එස් මුතුකුඩආරච්චි
සහකාර මහා කළමනාකරු - චෙන්නායි ශාඛාව



බී නන්දකුමාර්
සහකාර මහා කළමනාකරු - උපකාරක සේවා



වයි ඒ ජයතිලක
සහකාර මහා කළමනාකරු - නිමැවුම් සංවර්ධන
කටයුතු සහ ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ



ඒ ආර් එෆ් ජෝන් පුල්ලෙ
ප්‍රධාන විධායක නිලධාරී -
ලංකා බැංකුව (යූ කේ) සමාගම



වී එස් වික්‍රමආරච්චි
සහකාර මහා කළමනාකරු - භාණ්ඩාගාර



ජී ආර් ද සිල්වා
සහකාර මහා කළමනාකරු -
භාණ්ඩාගාර පසුපෙළ කාර්යාලය



පේ සී ඒ කුරුඳුකුඹුර
සහය අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ
(මෙහෙයුම්/තාක්ෂණ සහය)



එච් එම් සී එම් මල්දෙනි
සහය අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ
(යෙදවුම් පද්ධති)



ඩී එම් කේ එස් දිසානායක
සහකාර මහා කළමනාකරු -
නැගෙනහිර පළාත



එම් එච් එස් මාලා
සහකාර මහා කළමනාකාරිණී -
සංවර්ධන බැංකු කටයුතු



ඒ එම් ආර් ඩී සුබසිංහ
සහකාර මහා කළමනාකාරිණී -
පිටකොටුව ශාඛාව



පී පී එම් විජේසේකර
සහකාර මහා කළමනාකාරිණී -
පරිපාලන සේවා



එච් එම් එම් බී හේරත්
සහකාර මහා කළමනාකරු -
සබරගමු පළාත



ඩබ් බී පී රත්නායක
සහකාර මහා කළමනාකාරිණී -
බස්නාහිර පළාත - උතුර



ආර් පී එස් රාජපක්ෂ
සහකාර මහා කළමනාකරු -
මධ්‍යම පළාත



එම් ඩී ඒ කරුණාරත්න
සහය අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ
(සැපයුම් හැසිරවීම)



එම් ජේ ප්‍රභාහරන්
සහකාර මහා කළමනාකරු -
උතුරු පළාත



එච් පී කේ සිල්වා
සහකාර මහා කළමනාකරු -
අලෙවිකරණ



බී කේ ගුරුසිංහ
සහකාර මහා කළමනාකරු -
මාලේ ශාඛාව



ඒ ඩී එස් ඉන්ද්‍රානි
සහකාර මහා කළමනාකාරිණී -
වෙළෙඳ සේවා



එම් පී රුවන් කුමාර
සහකාර මහා කළමනාකරු -
ආයෝජන මෙහෙයුම්



ඩබ් රංජිත්
සහකාර මහා කළමනාකරු -
උතුරු මැද පළාත



ඒ ජී සිරිනිමල්
සහකාර මහා කළමනාකරු -
ඌව පළාත



එල් ජේ දිසානායක
සහකාර මහා කළමනාකරු -
සීෂෙල්ස් ශාඛාව



පේ ඥානසම්බන්ධන්
සහකාර මහා කළමනාකාරිණී - අයවැය ක්‍රමෝපාය
සැලසුම් සහ කළමනාකරණ තොරතුරු පද්ධති



පී එන් ගෝමස්
සහකාර මහා කළමනාකාරිණී -
ආපසු අයකර ගැනීම් - ආයතනික



එල් ඒ ආර් සෙනෙවිරත්න
සහකාර මහා කළමනාකරු -
ණය, පළාත් සහ ශාඛා විගණන



ඩී එම් සෙනෙවිරත්න බණ්ඩා
සහකාර මහා කළමනාකරු -
විශ්‍රාම නඩත්තු අංශය



එස් ටී කේ හේවගේ
නියෝජ්‍ය ප්‍රධාන නිති නිලධාරී -
ආපසු අයකර ගැනීම්



එම් ඩී සී නිලන්ත
සහකාර මහා කළමනාකරු -
අවදානම් කළමනාකරණය



කේ ජී සී දිපාල්
සහකාර මහා කළමනාකරු -
තොරතුරු පද්ධති විගණන



අයි එම් එල් කරුණාතිලක
සහකාර මහා කළමනාකරු -
වයඹ පළාත



ටී පෙරේරා
සහකාර මහා කළමනාකාරිණී -
ශාඛා ණය - කලාප I



ආර් එම් එම් විරසේකර
සහකාර මහා කළමනාකාරිණී -
මෙට්‍රොපොලිටන් ශාඛාව



ආර් එම් කේ එස් එම් රත්නායක
නියෝජ්‍ය ප්‍රධාන නිති නිලධාරිණී - ණය



එන් පී ජී චන්ද්‍රිකා
නියෝජ්‍ය ප්‍රධාන නිති නිලධාරිණී -
ජාත්‍යන්තර හා ආයෝජන





ස්ථාවරත්වය

ලංකා බැංකුවේ ස්ථාවරත්වයේ මූලික සාධකය වනුයේ දේශීය ආර්ථිකය තුළ අප විහිදුවා ඇති ශක්තිමත් මූලයන් මිස අන් කිසිවක් නොවේ. අපගේ මූල්‍ය පද්ධතිය, දේශීය ආර්ථිකයේ සෑම මූලයක් ඔස්සේම විශිෂ්ට කාර්යභාරයක් ඉටු කර ඇති අතර සත්‍ය ලෙසම ජාතියට ශක්තියක් වීමේ සාඩම්බර කොටස්කරුවා වේ.

ආයතනික යහපාලනය

හැඳින්වීම

ආයතනික යහපාලනය යනු යහපාලන ව්‍යුහයන්, ප්‍රතිපත්තීන්, ක්‍රියාවලීන්, පද්ධතීන් සහ මානව සම්පතින් සමන්විත වන අභ්‍යන්තර පද්ධතියක් වන අතර එමඟින් අප කොටස්කරුවන්ගේ සහ පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවයන් සපුරාලනු ලබන්නේ කළමනාකාරිත්ව කටයුතු යහපත් ව්‍යාපාරික ප්‍රවිනතාවයන්ගෙන් යුතුව, අවංකභාවයෙන් සහ මධ්‍යස්ථව මෙහෙයවීම මඟිනි. සෑම ආයතනයක්ම යහපත් ආයතනික යහපාලන පද්ධතියක් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලැබේ. යහපාලන ගැටළු වැළැක්වීම සඳහා ඵලදායී පද්ධතීන් සහ පාලනයන් ක්‍රියාත්මක බවට වග බලා ගැනීම ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමක් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වගකීම් ඉටුකර ලීමේ ඵලදායීතාවය, ඵලදායී වගකීම හා බැඳුණු රාමුවක් තුළ ඉටු කරලීම තුළින් ආයතනයේ තරගකාරිත්වය තීරණය කරනු ලැබේ. බැංකු සතු සුවිශේෂී ස්වභාවය හේතුවෙන් එහි ආයතනික යහපාලනය විශාල වශයෙන් සංකීර්ණ ස්වභාවයක් ගනු ලබන අතර ඒ සඳහා බොහෝ සෙයින් හේතු වනුයේ බැංකු කර්මාන්තය විශාල ලෙස නියාමන අවශ්‍යතා සහිත වීම සහ එතුළින් කරනු ලබන ආර්ථික සහ සමාජ බලපෑම හේතුවෙනි.

බැංකුවෙහි ආයතනික යහපාලන රාමුව

රාජ්‍ය ආයතනයක් වශයෙන් ලංකා බැංකුව සිය සියලු කටයුතු වලදී ඉහළ ප්‍රමිතියෙන් යුතු යහපත් ආයතනික යහපාලනයක්, ව්‍යාපාරික විශ්වාසනීයත්වයක් සහ ඍත්තීයමයභාවයක් සුරැකීම සඳහා කැපවී සිටින අතර එතුළින් සියලු පාර්ශවකරුවන්ගේ අවශ්‍යතාවයන් ආරක්ෂා කර දිගුකාලීන තිරසාරත්වය සහතික කරනු ලැබේ. මෙමඟින් බැංකු කර්මාන්තය තුළ ලංකා බැංකුව විසින් දැනට පවත්වාගෙන යනු ලබන ස්ථානය තවදුරටත් රඳවා තබා ගැනීම බලාපොරොත්තු වේ. සිය සංස්කෘතියෙහි සහ වටිනාකම්හි සදාචාරාත්මක කළමනාකරණ පුරුදු ඇතුලත් ශක්තිමත් ආයතනික යහපාලන රාමුවක් අප සතු වන අතර මෙම යහපත් යහපාලන පුරුදු ඉතා විශාල වශයෙන් විනිවිදභාවය සඳහා පහසුකම් සැපයීම සහ වගකීම් සහගත බව ප්‍රවර්ධනය කිරීම සිදු කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය සෑම වර්ෂයකම අඛණ්ඩව පරිණාමනය වෙමින් සහ දියුණු වෙමින් බැංකුවෙහි යහපාලන රාමුව සහ යහපාලන ප්‍රතිපත්තීන්හි මෑත කාලීන වර්ධනයන්, බැංකුවෙහි පරිණතභාවය සහ සියලුම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සමඟ අනුගතව ඇති බවට සහතික කරනු ලැබේ.

මෙම සංස්කෘතිය සුරැකීම සහ පෝෂණය කිරීම බැංකුවෙහි ආයතනික කළමනාකාරිත්වය සතු වගකීමක් වේ. යහපාලනය සඳහා වන සමස්ථ වගකීම, අදාළ නීතිරීති සහ නියාමනයන් සමඟ අනුගත බවට සහතික කිරීම සඳහා උපායමාර්ග සහ ප්‍රතිපත්තීන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ආයතනික කටයුතු සඳහා වන ප්‍රධාන අධිකාරිය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

බැංකුවේ ඉහළම තීරණ ගන්නා ස්ථානය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සංස්කෘතිය, අභ්‍යන්තර පාලන ක්‍රම, විගණනය, අවදානම් කළමනාකරණය, අනුකූලතාවය, මූල්‍ය අක්‍රමිකතා වැළැක්වීම, ගනුදෙනුකරුවන් සුරැකීම යනාදිය සඳහා මාර්ගෝපදේශක භූමිකාවක් සිදු කරනු ලැබේ. තවද, පරිවර්තනීය වෙනස්කම් සඳහා මූලාරම්භය සැපයීම සහ ශක්තිමත් කිරීම, ආයතනික යහපාලනය සම්බන්ධයෙන් බැංකු කර්මාන්තය තුළ සිදු වූ මෑත කාලීන සංවර්ධනයන් හා අන්තර්ජාතික යහපත් පරිචයන් සවිබලගැන්වීම මෙහිදී සිදු කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ කටයුතු සඳහා මාර්ගෝපදේශ සැපයීමට විධිමත් ආචාර ධර්ම පද්ධතියක් ස්ථාපිත කර ඇත. කාලානුරූපී වූ ඵලදායී තීරණ ගැනීමේ ක්‍රියාවලියක් උදෙසා අවශ්‍ය තොරතුරු සැපයීම සඳහා කාර්යක්ෂම ලෙස කළමනාකරණ තොරතුරු පද්ධතිය වැඩි දියුණු කර ඇත.

ප්‍රශස්ත පරිචයන් සඳහා වන යහපාලන ආචාරධර්ම සංග්‍රහ සහ අන්තර්ජාතික ප්‍රමිතීන් හා අනුකූල වන පරිදි අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු ස්ථාපිත කර ඇත. ඔවුන්ගේ අධිකාරීන්ට සීමාවන් සහ වාර්තාකරණ රේඛාවන් පැහැදිලි ලෙස දක්වා ඇත. ක්‍රියාවලීන් සහ වාර්තාකරණ රේඛා නිර්ණය කිරීමේදී, අනුකූලතාවය සඳහා වන අවශ්‍යතාවය සහ බාහිර වාර්තාකරණය මූලික වශයෙන් සලකා බලන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලැබේ.

බැංකුවේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන් විසින් තෝරාගත් ක්ෂේත්‍රයන්හි විශේෂඥතාවයෙන් යුතු පළපුරුදු වෘත්තිකයන්ගෙන් සමන්විත වන අතර ඔවුන්ගෙන් බහුතරයක් ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ. ඔවුන් විසින් ඔවුන්ට අදාළ ප්‍රවිනතා ක්ෂේත්‍රයන් තුළින් "ස්වාධීන විනිශ්චයන්" සහ පුළුල් දැක්මක් සපයනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩල විචාරයන් සඳහා සහ බැංකුවේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සහ කළමනාකාරිත්ව කාර්යයන් ශක්තිමත් කිරීම සඳහා මෙය ඉතා තීරණාත්මක වේ. එළඹෙන වර්ෂයේදී බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව පුළුල් කිරීමට බැංකුව අදහස් කර තිබෙන අතර එමඟින් බැංකුවේ වර්ධනය වන අවශ්‍යතා සහ යහපාලන අවශ්‍යතා ඉටුකර ගැනීම අපේක්ෂා කෙරේ.

ට්‍රිලියන දෙකක් වූ සන්ධිස්ථානය සාක්ෂාත් කර ගැනීම

වර්ෂ 2016 දී ලංකා බැංකුව විසින් වත්කම්, ණය සහ අත්තිකාරම් සහ තැන්පතු යන සෑම අංශයක්ම ට්‍රිලියනය ඉක්මවමින් ප්‍රධාන සන්ධිස්ථානයක් ළඟාකර ගැනීමට සමත් විය. මෙය දැඩි ප්‍රයත්නයක් දරමින් අප විසින් ළඟා කර ගන්නා ලද විශාල ජයග්‍රහනයකි. යථා කාලයේදී ඉටු කර ගැනීමට අපේක්ෂා කරන බැංකුවෙහි ඊළඟ සංධිස්ථානය වනුයේ වර්ෂ 2018 දී වත්කම් ට්‍රිලියන දෙක ඉක්මවීමයි.


මෙම ඉලක්කය සපුරා ගැනීම සඳහා බැංකුවෙහි ස්ථාවර බව සහ සිය පාර්ශවකරුවන් බැංකුව වෙත තබා ඇති විශ්වාසය පිළිබඳ සහතික කර ගැනීම අත්‍යාවශ්‍ය වේ. අනුකූලතාවය සහතික කරලීම සඳහා කාර්ය මණ්ඩලයෙහි අඛණ්ඩ ආචාර ධාර්මික හැසිරීම අත්‍යාවශ්‍ය වේ. මෙම ඉලක්කය කෙරෙහි බැංකුව සිය අවධානය යොමු කර තිබෙන අතර බාසල් III සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 9 විසින් හඳුන්වා දී ඇති ගිණුම්කරණ නියාමන සංවර්ධනයන් හා අනුකූල බවට සහතික වීම අත්‍යාවශ්‍ය වේ. බැංකුවේ අරමුණු අතර ප්‍රශස්ථ සමබරතාවයක් පවත්වා ගැනීම යහපාලනයේදී සලකා බලනු ලබන ප්‍රධානතම කරුණක් වේ.

නියාමන රාමුව

ශක්තිමත් ආයතනික යහපාලන තන්ත්‍රයක් සහ පුරුදු ස්ථාපිත කිරීම සඳහා වන බැංකුවෙහි කැපවීම නියාමන අවශ්‍යතා සමඟ අනුගත වීම මතම රඳා නොපවතී. සිය ක්‍රියාපටිපාටීන් සහ පද්ධතීන් අඛණ්ඩව සමාලෝචනය කිරීම සඳහා වන කැපවීම මතද මෙය රඳා පවතියි. මෙමඟින් වගකීම සහ විනිවිදභාවය සහතික කරනු ලබන අතර දේශීය සහ අන්තර්ජාතික වශයෙන් සිදුවන නවතම සංවර්ධනයන් සමඟ යහපාලන ක්‍රියාවලිය යාවත්කාලීන කිරීම සහ ශක්තිමත් ආයතනික යහපාලනය ඵලදායී කළමනාකරණ මෙවලමක් ලෙස හඳුනාගැනීම ද සිදු කෙරේ.

ලංකා බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වශයෙන් නියාමන අධිකාරීන් විසින් පනවන අවශ්‍යතා සමඟ අනුගතව ඇති අතර ඉන් ප්‍රධානතම නියාමකයා වනුයේ ශ්‍රී ලංකා මහ බැංකුවයි. බැංකුවට අදාළ වන නියාමන රාමුවට ප්‍රධාන වශයෙන් ඇතුළත් වනුයේ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන් සහ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ වන 2007 අංක 11 දරණ බැංකු පනත් විධානයයි. මෙම නියාමන රාමුවෙහි කොටසක් වශයෙන් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන් සැලකිය හැක. බැංකුවෙහි ශක්තිමත්භාවය සහ යහපත් ආයතනික යහපාලනය සඳහා වන කැපවීම 2017 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව හවුල්ව නිකුත් කර ඇති ආයතනික යහපාලන සංග්‍රහය 2013 සමඟ ස්වේච්ඡාවෙන්ම අනුකූල වීම මඟින් පෙන්නුම් කෙරේ. ඉහතින් සඳහන් කරන ලද අනුකූලතාවය හේතුවෙන් කොළඹ කොටස් වෙළඳපොළ විසින් අඛණ්ඩව ලැයිස්තු ගත කිරීමේ අවශ්‍යතාවල 7.10 කොටසෙහි දක්වා ඇති පරිදි අනුකූලතාවයන් අනාවරණය කිරීමෙන් බැංකුව නිදහස් වේ.

රාජ්‍ය බැංකුවක් වශයෙන් ලංකා බැංකුව රජයේ විගණකාධිපතිගේ අධීක්ෂණයට යටත් වන බැවින් එම දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ සහ එහි පරිපාලිතයන්ගේ මූල්‍ය වාර්තා පිළිබඳ සහතිකය, අභ්‍යන්තර පාලනයන්ට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ආයතනික යහපාලනය සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2007 අංක 11 දරණ බැංකු පනත් විධානයට අනුකූල බවට නිකුත් කරන ලද සහතිකය සපයා ඇත.



ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වන 2007 අංක 11 දරණ බැංකු පනතේ උපදෙස්වලට අනුකූලවීම්

ඉහත රෙගුලාසිවලට අනුගත වෙමින් විශේෂිත අනාවරණය කිරීම් මෙම වාර්තාවේ 304 සිට 323 දක්වා පිටුවල අඩංගු කර ඇති අතර, ආයතනික යහපාලනය සම්බන්ධයෙන් මෙම වාර්තාවේ අත්‍යාවශ්‍ය කොටසක් ලෙස සලකා මෙම වාර්තාව සකසා ඇත.

ආයතනික යහපාලනය



අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

බැංකුවේ ආයතනික අගයන්, ආචාරධර්ම, උපායමාර්ග, අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ, පාර්ශවකරුවන් සමඟ සන්නිවේදනය සඳහා වන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන, කළමනාකරණ තොරතුරු පද්ධති සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් පත් කිරීම් සහ ඔවුන්ගේ වගකීම් සම්බන්ධයෙන් වන මූලික වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇත.



සම්බන්ධිත පාර්ශවයන්හි ගනුදෙනු

සම්බන්ධිත පාර්ශවයන් සහ ඔවුන්ගේ ගනුදෙනු, එම ගනුදෙනු වලට ඇති සීමා කිරීම් සහ එබඳු ගනුදෙනු සම්බන්ධයෙන් අදාළ වන ප්‍රකාශනයන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට පැහැදිලි ප්‍රතිපත්තියක් ඇත.



අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කර ඇති කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ විෂය ක්ෂේත්‍රයට අදාළ, අනුකමිටු හතරක් ලංකා බැංකුව ස්ථාපිත කර ඇත. මෙම කමිටුවල වාර්තා මෙම වාර්තාමය වාර්තාවේ ඇතුළත් කර ඇත.



අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් බලය පවරන ලද කළමනාකරණ කාර්යයන්

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කලට බලය පැවරීමේ ප්‍රමාණය සහ වාර්තාකරණ ක්‍රියාපටිපාටිය සමාලෝචනය කරන අතර එම ක්‍රියාපටිපාටිය බැංකුවේ උපරිම වාසිය සඳහා වන බවට සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල බවට සහතික කරනු ලැබේ.



අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය

රාජ්‍ය බැංකු භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන විධායක නොවන හය දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන අතර එයින් පස් දෙනෙකු ස්වාධීන අධ්‍යක්ෂවරුන් වේ.



අනාවරණයන්

සමස්ථයක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිතෝෂික සහ සම්බන්ධිත පාර්ශවයන්ගේ ගනුදෙනු අනාවරණය කරනු ලැබේ.



සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී

සභාපති හා ප්‍රධාන විධායක නිලධාරීගේ (මහා කළමනාකාරතුමා) කාර්යයන්, බලය සහ අධිකාරිය සමබරව පවත්වාගෙන යාම සඳහා වෙන්කර දක්වා ඇත. ඔවුන්ගේ භූමිකාව අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ ඉතා පැහැදිලිව අර්ථ දක්වා ඇත.



අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාව තක්සේරු කිරීමේ නිර්නායක

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් විවිධ පසුබිම් වලට අයත් වන අතර ඔවුන් අනේකවිධ දක්ෂතා සහ පළපුරුද්දෙන් හෙබිය. අරමුණු සහ ස්වාධීන නිගමන දෙසට යොමු වන ඵලදායී සාකච්ඡා වලට ඔවුන් දායකත්වය ලබා දේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ හා බැංකුවේ කටයුතුවලට ප්‍රමාණවත් කාලයක් කැප කිරීමට ඔවුන්ට හැකි විය යුතු අතර, සාකච්ඡා කිරීමට නියමිත කරුණු සම්බන්ධයෙන් ඔවුන්ව දැනුවත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ඒකාබද්ධව නිකුත් කරන ලද 2013 ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලතාව



අධ්‍යක්ෂ මණ්ඩලය

බැංකුවේ ඉහළම තීරණ ගන්නා ස්ථානය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය වන අතර, සම්පූර්ණ උපායමාර්ගික සැලසුම් හා යහපාලනය සම්බන්ධයෙන් ඔවුන් වගකියනු ඇත.

සභාපතිවරයා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබා දෙන අතර, අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතේ සහ එහි සංශෝධනවල සඳහන් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයට වෙන් කර ඇති බලතල පිළිබඳ ලැයිස්තුවක්ද ඇතුළත්ව අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය හා වගකීම් පිළිබඳ විර්ෂය තුළදී සමාලෝචනය කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ සඳහන් කර ඇත. උපායමාර්ගික දිශාව නිර්ණය කිරීම, මූල්‍ය වාර්තාකරණය, නියාමන අනුකූලතාවය සහතික කිරීම, ආයතනික යහපාලනය, බැංකුවේ ව්‍යාපාර කටයුතු හා කාර්යයන් අධීක්ෂණය කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම් වලට ඇතුළත් වේ.

ලේකම්, ලංකා බැංකුව/ලේකම්, අධ්‍යක්ෂ මණ්ඩල, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල පිළිගත් ආචාර ධර්ම සහතික කරමින් ආයතනික යහපාලනයේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගෙන යමින් පටිපාටික නිවැරදිතාවය සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා සඳහා අනුකූල වීමට සහය වෙමින් ප්‍රධාන භූමිකාවක් ඉටු කරනු ලබයි.



සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී (මහා කළමනාකාරතුමා)

සභාපති හා ප්‍රධාන විධායක නිලධාරීගේ (මහා කළමනාකාරතුමා) කාර්යයන්, බලය හා අධිකාරිය සමබරව පවත්වාගෙන යාම සඳහා වෙන්කර දක්වා ඇත.

ඔවුන්ගේ භූමිකාව අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ ඉතා පැහැදිලිව අර්ථ දක්වා ඇත. සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් වන අතර, ප්‍රධාන විධායක නිලධාරී අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙක් නොවේ. බැංකුවේ ආයතනික සැලැස්මේ දක්වා ඇති පරිදි මූලෝපායන් ඉටු කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇති මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්ක සපුරා ගැනීම භාරව ඇත්තේ ප්‍රධාන විධායක නිලධාරී වෙතය. වසර ආරම්භයේදී සාමාන්‍යයෙන් නියම කරනු ලබන කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන අරමුණු මෙයට ඇතුළත් වේ.



සභාපතිගේ භූමිකාව

අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය ලබා දෙනු ලබන්නේ සභාපතිවරයා වන අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයට ඔහු පහසුකම් සලසයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ගේ කාර්යක්ෂම සහභාගිත්වය සහතික කිරීම සඳහා ඔහු වග කියනු ලැබේ. ප්‍රධාන කළමනාකරණ පිරිස් සමඟ සාකච්ඡා කරනු ලබන අතර, උපායමාර්ගික හා මෙහෙයුම් කටයුතු වලට අදාළව සිය දායකත්වය ලබා දෙනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල සාකච්ඡාවට බඳුන් වන කරුණු සම්බන්ධයෙන් නිවැරදි සංක්ෂිප්ත තොරතුරු සියලුම අධ්‍යක්ෂවරුන්ට ලැබෙන බවට හා එම අදාල සියලු තොරතුරු නියමිත ආකාරයට නියමිත වේලාවට කලින් ලබා දෙන ලෙස කළමනාකරණ පිරිස්වලට උපදෙස් ලබා දෙන බවට ඔහු සහතික වේ.



මූල්‍ය තීක්ෂණභාවය


මූල්‍යමය කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය මගපෙන්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය සතුව අත්‍යාවශ්‍ය මූල්‍යමය තීක්ෂණභාවය, දැනුම සහ පළපුරුද්ද ඇත. මෙම පළපුරුද්ද ඔවුන් හට ලැබී ඇත්තේ අධ්‍යක්ෂකවරුන් කිහිපදෙනෙක් මූල්‍ය/ගිණුම්කරණ යන අංශ වල ව්‍යක්තීමය සුදුසුකම් දරා තිබීමෙන් සහ ජ්‍යෙෂ්ට කළමනාකරණ තනතුරු සහ/හෝ අධ්‍යක්ෂ මණ්ඩල තනතුරු දැරීම තුළින් සහ වර්තමානයේද එම තනතුරු දැරීමෙනි.



අධ්‍යක්ෂ මණ්ඩලයේ සමබරතාවය

රාජ්‍ය බැංකු භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන විධායක නොවන අධ්‍යක්ෂවරුන් හය දෙනෙකුගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වන අතර, එයින් පස් දෙනෙකු ස්වාධීන අධ්‍යක්ෂවරුන් වේ.

මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් නිල බලයෙන් අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කෙරේ. 2007 අංක 11 දරණ බැංකු පනතේ උපදෙස්වල විශේෂිතව සඳහන් නිර්නායක මත පදනම්ව අධ්‍යක්ෂවරුන්ගේ ස්වාධීනභාවය හඳුනාගනු ලැබේ. සිය වගකීම් ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විවිධ වූ දක්ෂතා හා පළපුරුද්දෙන් යුතු වේ.



තොරතුරු සැපයීම

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී සාකච්ඡා කිරීමට නියමිත කරුණු සම්බන්ධයෙන් නිවැරදි සංක්ෂිප්ත තොරතුරු සියලුම අධ්‍යක්ෂවරුන්ට ලැබෙන බවට සභාපතිවරයා සහතික වේ.

සියලුම තොරතුරු නිසියාකාරව සංක්ෂිප්ත ලෙස හා නියමිත කාලයට පෙර ලබාදෙන ලෙසට සභාපතිවරයා සියලුම කළමනාකාර පිරිස් දැනුවත් කර ඇත. සියලුම අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට දින හතකට පෙර අධ්‍යක්ෂවරුන් වෙත ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික මාර්ගයන් ඔස්සේ ලැබීමට සලස්වනු ලැබේ. මෙයට ප්‍රමාණාත්මක සහ ප්‍රමාණාත්මක නොවන යන දෙයාකාරයෙන්ම තොරතුරු ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ගත් තීරණ සියලුම අධ්‍යක්ෂවරුන් වෙත වාර්තා කරනු ලබන අතර එම තීරණ සියලුම අධ්‍යක්ෂවරුන් දැනුවත් වන බවට වග බලා ගනේ. සියලුම රැස්වීම් සඳහා සියලුම අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය අපේක්ෂා කරනු ලැබේ. කෙසේ නමුත් සාධාරණ හේතුවක් මත රැස්වීම් වලට පැමිණීමට නොහැකි අවස්ථාවලදී ගනු ලබන තීරණ රැස්වීම් වාර්තා මගින් ඔවුන් වෙත දැනගැනීමට සලස්වනු ලැබේ.



අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම්

රජයට අයත් බැංකුවක් බැවින් සියලුම අධ්‍යක්ෂවරුන් බැංකු විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලැබේ.

2017 වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩලයේ සිදු කෙරුනු වෙනස් වීම් පිටු අංක 139 හි ඇතුළත් අධ්‍යක්ෂ වාර්තාවේ සටහන් කර ඇත.

සියලුම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික තොරතුරු පිටු අංක 35 සිට 37 දක්වා විස්තර කර ඇත. අධ්‍යක්ෂවරයෙකුට සිය ධූරය දැරිය හැකි උපරිම කාලසීමාව, 2007 අංක 11 දරණ බැංකු පනතේ ආයතනික යහපාලනය සඳහා වූ ප්‍රතිපාදන යටතේ වසර නවයකට සීමා කෙරේ.



අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය ඇගැයීම

අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ වගකීම සතුටුදායක ලෙස ඉටු කරනු ලබන බව සහතික කිරීම පිණිස ඔවුන්ගේ කාර්යසාධනය වාර්ෂිකව ඇගැයීමට ලක් කෙරේ.

මෙනිදී සෑම අධ්‍යක්ෂවරයෙක්ම සිය කාර්යසාධනය සම්බන්ධව ඇගැයීම් පත්‍රයක් සම්පූර්ණ කළ යුතු වේ. ප්‍රතිචාරයන් සංක්ෂිප්ත කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. 2017 වසර සඳහා වන ඇගැයීම් සාර්ථකව නිම කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුද ඒවායේ කාර්යසාධන ඇගැයුම් පත්‍රයන් නිසි පරිදි සම්පූර්ණ කර අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර ඇත.



අධ්‍යක්ෂවරුන් සම්බන්ධ තොරතුරු අනාවරණය

අතිශය විනිවිදභාවයකින් යුක්ත වීම යන බැංකුවේ ප්‍රතිපත්තියට අනුකූලව අධ්‍යක්ෂවරුන්ට අදාළ පහත තොරතුරු පහත සඳහන් පිටුවලින් හෙළිකර ඇත.

නම, සුදුසුකම්, නිපුණත්වය, ප්‍රමාණාත්මක ව්‍යාපාර කටයුතු පිළිබඳ ලැබෑදියාවන් සහ සංක්ෂිප්ත පැතිකඩ පිටු අංක 35 සිට 37 දක්වා සහ 144 සිට 145 දක්වා ඇති පිටුවල සඳහන් වේ.

සම්බන්ධිත පාර්ශව වල ගනුදෙනු පිටු අංක 274 සිට 275 දක්වා සඳහන් වේ.

අනුකමිටුවල සාමාජිකත්වය සම්බන්ධයෙන් වූ තොරතුරු පිටු අංක 35 සිට 37 දක්වා සඳහන් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අනුකමිටුවල රැස්වීම්වලට පැමිණීම පිළිබඳ විස්තර පිටු අංක 69 හි සඳහන් වේ.



ප්‍රධාන විධායක නිලධාරී/ මහා කළමනාකාරතුමා පිළිබඳ ඇගයීම

අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බැංකුවේ ආයතනික සැලැස්මෙහි විස්තර කර ඇති උපායමාර්ග සහ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් තීරණය කර ඇති මූල්‍ය හා මූල්‍ය නොවන ඉලක්ක සපුරා ගැනීම ප්‍රධාන විධායක නිලධාරිතුමා වෙත පවරා ඇත.

වසර ආරම්භයේදී නියම කරනු ලබන කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන අරමුණු මෙයට ඇතුළත් වන අතර, ඔහුගෙන් ඉටුවිය යුතු අපේක්ෂාවන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් අත්‍යාවශ්‍ය වේ. මෙම වාර්තාව සකස් කරන අවස්ථාව වන විට 2018 වසර සඳහා බැංකුව අපේක්ෂා කරන ප්‍රතිඵල ලංකා බැංකුවේ නව මහා කළමනාකාරතුමා විසින් ඉටුකරන බවට ඇගැයීම් කර ඇත.

මෙම ඇගැයීම වාර්ෂිකව සිදු කරනු ලැබේ.



පාරිතෝෂික පටිපාටිය


අදාළ අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛන හා ලිපි සහ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුව අධ්‍යක්ෂවරුන්ගේ පාරිතෝෂික තීරණය කරන අතර එය අධ්‍යක්ෂවරුන්ගේ පාරිතෝෂික ප්‍රතිපත්තිය තුළට අන්තර්ග්‍රහනය කර ඇත. සලකා බලනු ලබන වර්ෂය තුළදී බැංකුව විසින් පාරිතෝෂික ප්‍රතිපත්තිය සමාලෝචනය කර ඇත.

ඔහුගේ/ඇයගේ පාරිතෝෂික නිගමනය කිරීම සඳහා අධ්‍යක්ෂවරුන් සම්බන්ධ නොවේ. මහා කළමනාකාරතුමාගේ සහ ප්‍රධාන කළමනාකරණ පිරිස්වල පාරිතෝෂික සම්බන්ධයෙන් මානව සම්පත් හා පාරිතෝෂික කමිටුව විසින් සිය නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර, මෙම නිර්දේශවලට පදනම් වූ කරුණු සෑම වසර තුනකට වරක් සමාලෝචනයට ලක් කෙරේ. ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද පාරිතෝෂික ප්‍රතිපත්තියක් ඇත. අවසානයේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය නිර්දේශ විෂය භාර අමාත්‍යවරයාට ඉදිරිපත් කරන අතර ඔහු විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුකූලව අවසාන අනුමැතිය ලබා දේ.



කොටස්කරුවන් සමග සන්නිවේදනය

ශ්‍රී ලංකා රජය බැංකුවේ එකම කොටස්කරුවා වන අතර ඒ නිසාම මෙම වාර්ෂික වාර්තාව බැංකුව අයත්වන රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.



ඉතා වැදගත් හා ප්‍රමාණාත්මක කරුණු

බැංකු මෙහෙයුම් කටයුතු ආයතනික සැලැස්ම මත පදනම්ව සිදු කරන බැවින් අවස්ථාවන්, අවදානම්, නැමියාවන් සහ පරතරයන් සැලකිල්ලට ගනිමින් උපායමාර්ග සැලසුම් කරගෙන යනු ලැබේ.

කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන අරමුණු ආයතනික සැලැස්මෙහි පැහැදිලිවම දක්වා ඇත. බැංකුවට බලපෑමක් කර ඇති හා අනාගතයේදී බැංකුවට බලපෑමක් විය හැකි ඉතා වැදගත් ගනුදෙනු පහත සටහන් තුළින් අනාවරණය කර ඇත.

සභාපතිතුමාගේ පණිවිඩය පිටු 13 සිට 14 දක්වා.

මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය පිටු 21 සිට 22 දක්වා.

විශ්‍රාම යන මහා කළමනාකාරතුමාගේ පණිවුඩය පිටු 17 සිට 19 දක්වා.

අප වටිනාකම් ජනිත කරනුයේ කෙසේද පිටු 94 සිට 136 දක්වා.



මූල්‍ය වාර්තාකරණය

විනිවිදභාවය, පැහැදිලිබව, නිවැරදිතාවය, පරිපූර්ණබව සහ වගකීම සහතික කිරීම සඳහා මෙම වාර්ෂික වාර්තාවේ අඩංගු සියලු තොරතුරු හැකි උපරිම ආකාරයෙන් විශ්ලේෂණය කර සහ ඇගැයීමට ලක්කර ඉදිරිපත් කර ඇත.

බැංකු කර්මාන්තය සඳහා පවතින විවිධ වූ නියාමනයන් සහ ස්වේච්ඡා ආචාරධර්ම වලට අනුකූලව බැංකුවේ මූල්‍ය තත්ත්වය, කාර්යසාධනය පිළිබඳ සාධාරණ ඇගයීමක් සහ අපේක්ෂාවන් පිළිබඳ සමබරවූත් තේරුම් ගැනීමට පහසු වූත් නක්සේරුවක් මෙම වාර්ෂික වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ. ගෝලීය වාර්තාකරණ ආයතනය විසින් ප්‍රසිද්ධ කරනු ලබන තිරසර වාර්තාකරණය සඳහා වූ G4 ප්‍රමිතීන් සහ ජාත්‍යන්තර ඒකාබද්ධ වාර්තාකරණ සභාව මඟින් ප්‍රසිද්ධ කරන ලද ඒකාබද්ධ වාර්තාකරණ රාමුව සමඟ ලංකා බැංකුව අනුකූල වේ.



විගණන කමිටුව සහ අභ්‍යන්තර පාලනය

බැංකුවේ වත්කම් ආරක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සකස් කිරීමේත් ඒවා ක්‍රියාවේ යෙදවීමේත් වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවන අතර, ඒ සඳහා විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වේ.

මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනය, අභ්‍යන්තර විගණනය සහ බාහිර විගණන ආදී වගකීම් විගණන කමිටුවේ විෂය පථය යටතට ගැනේ. ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ යහපාලන ආචාරධර්ම විගණන කමිටුවේ විෂය ක්ෂේත්‍රය සමඟ අනුකූල වේ. මූල්‍ය පාලනයේ කාර්යක්ෂමතාවය, බැංකු වත්කම්හි අවංකභාවය සහ මූල්‍ය වාර්තාවල නිවැරදිතාවය විගණන කමිටුව විසින් සහතික කෙරේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ සමාලෝචන වරින් වර සිදු කරන අතර, ඒවා විගණන කමිටුව වෙත අඛණ්ඩව වාර්තා කරනු ඇත.



ව්‍යාපාර පරිචය සහ ආචාර ධර්ම සංග්‍රහය

දෙයාකාර වූ ආචාරධර්ම සංග්‍රහ බැංකුව සතුවන අතර, එයින් එකක් අදාල වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයට වන අතර, අනික අදාළ වන්නේ සේවා නියුක්තිකයින් සඳහායි.

නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුව ආචාරධර්ම සංග්‍රහ සමාලෝචනය සම්බන්ධයෙන් වගකියනු ඇත. අල්ලස හා දූෂණයට එරෙහිව දැඩි අවංකභායෙන් යුත් සංස්කෘතික පරිසරයක් බැංකුව තුළ පවතී. කිසිදු හෝ නීතිය කඩ කිරීමක් සිදු වුවහොත් එම තත්ත්වයන් ක්ෂණිකව හඳුනාගෙන ක්‍රියාමාර්ග ගැනීම සඳහා යාන්ත්‍රණ කිහිපයක් සූදානම්ව පවතී. සියලුම නිලධාරීන් සිය වත්කම් හා බැරකම් ප්‍රකාශන වාර්ෂිකව මානව සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, සියලුම අධ්‍යක්ෂවරුන් එය ඉදිරිපත් කළ යුත්තේ අදාල අමාත්‍යාංශයටයි. අක්‍රමිකතා වලින් ආරක්ෂා වීම සඳහා විනිවිදභාවයකින් යුතු ප්‍රසම්පාදන ක්‍රමවේදයක්ද ක්‍රියාත්මක වේ. භාරගැනීම, රැඳවාගැනීම සහ පැමිණිලි සඳහා ක්‍රියාත්මක විය යුතු ආකාරය ආවරණය කරනු ලබන "විස්ල් බ්ලෝවර් ප්‍රතිපත්තියක්" ඇත.



ආයතනික යහපාලන අනාවරණයන්

ආයතනික යහපාලන සම්බන්ධයෙන් වූ මූලධර්ම හා භාවිතාවන් සමඟ බැංකුව කොපමණ දුරකට බැඳී සිටිය යුතු ද යන්න අධ්‍යක්ෂවරුන් විසින් අනාවරණය කිරීම අවශ්‍ය වේ.

මෙම වාර්තාවේ පිටු අංක 62 සිට 69 දක්වා ඇති ආයතනික යහපාලනය සම්බන්ධ කොටසේ මෙය විස්තර කර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය හා ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් විසින් නිකුත් කර ඇති "ආයතනික යහපාලනය සම්බන්ධයෙන් වූ යහපාලන ආචාරධර්ම 2013" සඳහා අනුකූලතාවය පිටු අංක 65 සිට 68 දක්වා විස්තර කර ඇත.

2007 අංක 11 දරණ බැංකු පනතේ උපදෙස් සහ ආයතනික යහපාලන සම්බන්ධයෙන් ආචාරධර්ම පිටු අංක 304 සිට 323 දක්වා විස්තර කර ඇත.



තිරසාර වාර්තාකරණය

මෙම වාර්තාවේ දැක්වෙන තිරසාර වාර්තාකරණය සම්බන්ධ ආචාර ධර්ම සමඟ බැංකුව බැඳී ඇත.

අගයන් නිර්මාණය කිරීම සඳහා වූ තිරසාර ප්‍රවේශයක් නිරතුරුවම නෝරා ගනු ලබන්නේ සාකල්‍ය ප්‍රවේශයකි. බැංකුව සිය පාර්ශවකරුවන් සඳහා කෙටි, මධ්‍ය හා දිගු කාලීන ආර්ථික, සමාජ, පාරිසරික වටිනාකම් නිර්මාණය කිරීමද සලකා බලයි. තිරසාර වාර්තාකරණ ක්‍රියාවලිය හඳුනාගැනීම, මැනීම, අනාවරණය කිරීම ආදී කරුණු සමඟ සම්බන්ධ වන අතර තිරසාර සංවර්ධන අරමුණු දෙසට ගමන් කිරීමට හේතුවන ආයතනයේ කාර්යසාධනය සම්බන්ධයෙන් අභ්‍යන්තර හා බාහිර පාර්ශවකරුවන්ට වගකිව යුතුය.

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

සිය වගකීම් ඉටුකරලීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වන අධ්‍යක්ෂක මණ්ඩල උප කමිටු හතරකි. මෙම කමිටු ස්ථාපිත කර ඇත්තේ යහපාලන ආචාරධර්ම සංග්‍රහ හා ප්‍රශස්ත පරිචයන් හා අනුකූල වෙමිනි. සමහරක් මූලික අංශ කෙරේ ප්‍රමාණවත් අවධානය යොමු කෙරෙන බවට තහවුරු කරලනු පිණිස, උප කමිටු රාජකාරි සහ වගකීම් ලිඛිත යොමු කිරීම් අනුදේශයන්හි විධිමත් ලෙසින් අන්තර්ගත කොට ඇත. මෙම යොමු කිරීමේ අනුදේශ වාර්ෂිකව සමාලෝචනය කරනු ලබන්නේ පරිසරයේ වෙනස්කම් හා අනුගත වේද යන්න හා බැංකුවේ මෙහෙයුම් මත අඛණ්ඩව ප්‍රතිඵලදායී පාලනය හා අධීක්ෂණය තහවුරු කිරීම තුළින් දීර්ඝකාලීන තිරසාරත්වය සඳහා දායකත්වය ලබා දීම සඳහාය.

විගණන කමිටු වාර්තාව පිටු අංක 70 සිට 73 දක්වා දැක්වේ.

නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටු වාර්තා (NCGC) පිටු අංක 77 හි දැක්වේ.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව (IRMC) පිටු අංක 74 හා 75 හි දැක්වේ.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව (HRRC) පිටු අංක 76 හි දැක්වේ.

ක්‍රමික රැස්වීම්

අවශ්‍යතාවය පරිදි විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනවාට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය, සුපුරුදු පරිදි දෙසතියකට වරක් රැස්වෙයි. වසර තුළදී විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ද ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 28 ක් පැවැත්විණ. ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීම විශේෂිතව දක්වමින් අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු රැස්වීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

2017 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු සඳහා අධ්‍යක්ෂකවරුන්ගේ පැමිණීම

2017 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු රැස්වීම්

අධ්‍යක්ෂවරයාගේ නම	අධ්‍යක්ෂ මණ්ඩලය	විගණන කමිටුව	මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව	නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව
ජනාධිපති නීතිඥ රොනල්ඩ් සී පෙරේරා මහතා - සභාපති	28	N/A	3	N/A	3
සපිත් ආර් ආටිගල මහතා - නිලබලයෙන් පත් වූ අධ්‍යක්ෂ	24	6	1	–	–
රනෙල් ටී විජේසිංහ මහතා - අධ්‍යක්ෂ	27	10	N/A	N/A	N/A
චරිත එන් විජේවර්ධන මහතා - අධ්‍යක්ෂ (2017 ජූලි 21 දින සිට බල පැවැත්වෙන පරිදි ඉවත් වූ)	15	6	1	4	N/A
සංජය පද්මපෙරුම මහතා - අධ්‍යක්ෂ (2017 ජූනි 30 දින සිට බල පැවැත්වෙන පරිදි ඉවත් වූ)	10	2	N/A	3	1
එච් පී අජිත් ගුණවර්ධන මහතා - අධ්‍යක්ෂ	27	N/A	3	5	3
මනෝ සේකරම් මහතා - අධ්‍යක්ෂ (2017 ජූලි 6 දින සිට බල පැවැත්වෙන පරිදි පත් කරන ලදී) (2017 සැප්තැම්බර් 8 දින සිට බල පැවැත්වෙන පරිදි ඉවත් විය)	3	N/A	N/A	N/A	N/A
සමන්ත රාජපක්ෂ මහතා - අධ්‍යක්ෂ (2017 ජූලි 25 දින සිට බල පැවැත්වෙන පරිදි පත් කරන ලදී)	13	3	N/A	1	N/A
මොහාන් විජේසිංහ මහතා - අධ්‍යක්ෂ (2017 නොවැම්බර් 24 දින සිට බල පැවැත්වෙන පරිදි පත් කරන ලදී)	1	N/A	N/A	N/A	N/A
පැවැත් වූ රැස්වීම් සංඛ්‍යාව	**28**	**11**	**3**	**5**	**3**

N/A – අදාළ නොවේ.

අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තා
විගණන කමිටු වාර්තාව

සභාපතිගේ ප්‍රකාශය

විගණන කමිටු ප්‍රඥප්තිය

විගණන කමිටුවේ සම්බන්ධතේමේ නියාමනයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට සම්මත කළ විගණන කමිටු ප්‍රඥප්තිය මගින් පාලනය වේ. 2017 වසර තුළ අවසන් වරට සමාලෝචනය කරන ලද විගණන කමිටු ප්‍රඥප්තිය අඛණ්ඩ සමාලෝචනයේදී ලංකා බැංකුවට විශේෂිත හා බැංකු ක්ෂේත්‍රයට අදාළ නව ප්‍රවනතාවන් සැලකිල්ලට භාජනය කරනු ලැබේ. තම විෂය පථය හා ආවරණය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2007 අංක 11 දරණ බැංකු පනත සහ පසුව නිකුත් කරන ලද එයට අදාළ සංශෝධන වලට අනුව ශ්‍රී ලංකාවේ බලපතලාභී වාණිජ බැංකු සඳහා වන ''ආයතනික යහපාලන'' අනුකූලතා සපුරන බවට කමිටුව තහවුරු කරයි.

ප්‍රධානතම අවධානය

විගණන කමිටුව මූලික කොට අවධානය යොමු කරන්නේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ ස්වාධීන හා වාස්තවික සමාලෝචනයක් සපයමින් සිය රාජකාරිය ඉටු කිරීමෙහි ලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වීමයි.

වාර්තා කරන මාධ්‍ය

විගණන කමිටුවේ රැස්වීම් වල වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් තුළ සභාගත කෙරේ. මෙහිදී සියලුම ප්‍රධාන ගැටළු, අවධානය යොමු කල යුතු සංසිද්ධීන්, ගන්නා ලද ක්‍රියාමාර්ග,සාක්ෂාත් කරගත් හෝ අපේක්ෂිත ප්‍රතිඵල හා ආරම්භ කළ පසු විපරම් ක්‍රියාමාර්ග සාකච්ඡාවට බඳුන් කරමින් පැහැදිලි කරමින් ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලීය අනුමැතිය ලබා ගැනේ.

සංයුතිය

සමාලෝචනය කරනු ලබන වසර තුළ විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ.

රනෙල් ටී විජේසිංහ මහතා
සභාපති,
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ

සපිත් ආර් ආටිගල මහතා
සාමාජික,
විධායක නොවන නිල බලයෙන්
පත් වූ අධ්‍යක්ෂ

සමන්ත රාජපක්ෂ මහතා
සාමාජික,
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
(2017 අගෝස්තු 11 දින සිට කමිටුවේ කටයුතු කරයි)

සංජය පද්මපෙරුම මහතා
සාමාජික,
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
(2015 නොවැම්බර් 5 සිට 2017 ජූනි 30 දක්වා)

චරිත එන් විජේවර්ධන මහතා
සාමාජික,
ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
(2015 නොවැම්බර් 5 සිට 2017 ජූලි 21 දක්වා)

කමිටුවේ සාමාජිකයන්ට අවශ්‍ය මූල්‍ය නිපුණත්වය, පළපුරුද්ද, ප්‍රවීණත්වය, පසුබිම ඔවුන් සතුව තිබූ අතර, කමිටුවේ සාමාජිකයින් වීමට යෝග්‍ය මට්ටමේ ස්වාධීනත්වයක් පැවතිනි. කමිටු සාමාජිකයින්ගේ විස්තරාත්මක පැතිකඩ පිටු 35-37 දක්වා ඇත.

විගණන කමිටුවේ ලේකම්

නීතිවේදිනියක සහ නියෝජ්‍ය මහා කළමනාකාරිණියක වන ලංකා බැංකුවේ ලේකම් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් මෙම කමිටුවේ ලේකම් ලෙස ක්‍රියා කරයි.

කමිටු රැස්වීම් හා බාහිර විගණනයන් සමඟ සම්බන්ධතා

සාමාලෝචිත වසර තුළ කමිටුව 11 වතාවක් රැස් විය. රැස්වීම් වල වාර ගණන හා කාලසීමාව කමිටුවේ සිය වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට හැකියාව ලබාදී ඇත. කමිටු සාමාජිකයින්ගේ පැමිණීමේ ලේඛනය 69 වන පිටුවේ ඇති වගුවෙහි දක්වා ඇත.

කමිටුවේ ගණපූර්ණය දෙදෙනෙකි.

වසර පුරාම ලංකා බැංකුවේ පූර්ණ කාලීන වශයෙන් බැංකුව තුළ කටයුතු කරන විගණකාධිපතිතුමාගේ නියෝජිතයා සමග කමිටුව නිරන්තර සම්බන්ධතාවයක් පවත්වා ගනී. KPMG වරලත් ගණකාධිකාරිවරුන් විසින් කරගෙන ගිය බාහිර විගණනය හා සඳහා කළමනාකාරිත්වය ලබා දෙන සහාය තවදුරටත් තහවුරු කරනු වස් හා බාහිර විගණනයේ ස්වාධීන තත්ත්වය ඉහළ නංවනු සඳහා විගණන කමිටුවේ සභාපතිවරයා කමිටුවේ සාමාන්‍ය විධිමත් රැස්වීම් වලට අමතරව අවශ්‍යතාවය පැන නැගුන අවස්ථාවන්හිදී විගණනය භාර ජ්‍යෙෂ්ඨ හවුල්කරුවන් හමුවිය. මෙමගින් ප්‍රධාන කරුණු සහ අවධානය යොමු කල යුතු ගැටළු පිළිබඳව වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට හැකිවූ අතර එමගින් ඵලදායී වැටහීමක් සඳහා මාර්ග හා නියමාකාර මග පෙන්වීමක් නිර්මාණය කළේය.

වර්ෂ අවසාන විගණනයේ සමාප්තියට ප්‍රථම පැවැත්වූ අවසාන රැස්වීමේදී කමිටුව හා බාහිර විගණකවරුන් හමුවූයේ මහා කළමනාකාරතුමා සහ කළමනාකාරිත්වයේ සෙසු සාමාජිකයින් ගේ සහභාගිත්වය රහිතව වන අතර එමගින් විගණනයේ විෂය පථය කිසියම් සීමා කිරීමක් තිබුණේද යන්න නිශ්චය කිරීම අරමුණු වූ අතර එවැන්නක් නොවූ බවට සහතිකයක් ලැබුණි.

රැස්වීම් වලට සහභාගි වීම

පහත සඳහන් කළමනාකාර පිරිස් සෑම විගණන කමිටු රැස්වීමකටම සහභාගි විය.

- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- ප්‍රධාන අවදානම් නිලධාරි
- අනුකූලතා නිලධාරි
- සහකාර මහා කළමනාකරු (පළාත්/ශාඛා සහ ණය විගණන)
- සහකාර මහා කළමනාකරු (විමර්ශණ)
- සහකාර මහා කළමනාකරු (තොරතුරු පද්ධති විගණන)
- සහකාර මහා කළමනාකරු (අවදානම් කළමනාකරණ)
- අභ්‍යන්තර විගණක
- තොරතුරු තාක්ෂණ අවදානම් නිලධාරි
- විගණකාධිපතිතුමාගේ නියෝජිතයින් (බැංකුවේ බාහිර විගණන සහ KPMG වරලත් ගණකාධිකාරිවරුනගේ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවන් හා කළමනාකරුවන්)
- අර්නස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරිවරුනගේ ජ්‍යෙෂ්ඨ හවුල්කරුවන් හා කළමනාකරුවන්

2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වසරේ විගණකාධිපතිතුමා විසින් මොවුන් බාහිර විගණකවරුන් ලෙස පත් කරන ලද අතර, ඔවුන්ද සමාලෝචිත වසර අතර තුර පැවති රැස්වීම් කිහිපයකටම විගණනයේ පසු විපරම්කරුවන් ලෙස සහභාගි විය.

ආරාධනයෙන් පමණක් සහභාගි වූ කළමනාකාරිත්වයේ සාමාජිකයින් පහත දැක්වේ.

- මහා කළමනාකාරතුමා
- ප්‍රධාන මූල්‍ය නිලධාරි
- නියෝජ්‍ය මහා කළමනාකාරතුමා (මූල්‍ය හා සැලසුම්)

ණය, නිමැවුම් හා සංවර්ධන බැංකු කටයුතු, භාණ්ඩාගාර කළමනාකරණය, පරිපාලිත සමාගම් හා විදේශවල පිහිටි ශාඛා අධීක්ෂණය, ශාඛා බැංකු කටයුතු, පෙරවරණය හා ආපසු අය කර ගැනීම් නීතිමය කරුණු සහ තොරතුරු තාක්ෂණ අවදානම් වලට අදාල කරුණු වැනි ක්ෂේත්‍රවලට අදාළ කරුණු පැහැදිලි කර ගැනීම් පිණිස වසර අතර තුර විවිධ කාල වලදී විගණන කමිටුවේ රැස්වීම් වලට කාර්යාංශ ප්‍රධානීන්ට ආරාධනය කරන ලදී. මෙමගින් ආරම්භ වූ සෘජු සංවාදය මගින් පද්ධති, ක්‍රියාපටිපාටින් පාලන ශක්තිමත් කිරීමත්, ප්‍රඥප්ති සංග්‍රහ වැඩි දියුණු කිරීම හෝ ප්‍රසාරණය වීමත් සමග අනුකූලතාවයට පහසුකම් සැලසීම වැනි ක්ෂේත්‍ර කිහිපයක් සම්බන්ධයෙන් සම්මුතියකට පැමිණීමට හැකිවිය.

මෙම සාකච්ඡාවලට සහභාගිවූ ප්‍රධාන කළමනාකරණ පිරිස් වූයේ,

- නියෝජ්‍ය මහා කළමනාකාර (නිමැයුම් හා බැංකුකරණ සංවර්ධන)
- නියෝජ්‍ය මහා කළමනාකාර (ආයතනික හා අක් වෙරළ බැංකු කටයුතු)
- නියෝජ්‍ය මහා කළමනාකරු (විකුණුම් හා හැසිරවීම්)
- නියෝජ්‍ය මහා කළමනාකරු (ආපසු අය කර ගැනීම්)
- නියෝජ්‍ය මහා කළමනාකරු (ජාත්‍යන්තර, භාණ්ඩාගාර හා ආයෝජන)
- නියෝජ්‍ය මහා කළමනාකරු (ශාඛා බැංකුකරණය)
- නියෝජ්‍ය මහා කළමනාකරු (උපකාරක සේවා)
- නියෝජ්‍ය මහා කලමනාකරු (මානව සම්පත්)
- ප්‍රධාන නීති නිලධාරි
- ප්‍රධාන තොරතුරු තාක්ෂණ නිලධාරි
- තාක්ෂණික පරිවර්තක ප්‍රධානී
- තවදුරටත් මහා කළමනාකාරතුමා, ප්‍රධාන මූල්‍ය නිලධාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන අවදානම් නිලධාරි, ප්‍රධාන නීති නිලධාරි සහ අනෙකුත් පෙෂ්ඨ කළමනාකරුවන් සමග සභාපති තනි තනි හා කණ්ඩායම් වශයෙන් වෙනමම කණ්ඩායම් රැස්වීම් පවත්වන ලදී.

2017 වර්ෂය තුළ ඉටු කරන ලද කටයුතු

මූල්‍ය වාර්තාකරණය

- පාලනය පිළිබඳ ආයතන සහ නියාමන අධිකාරි වලින් හා අදාල ගිණුම් ප්‍රමිතීන් මගින් නියම කර ඇති අවශ්‍යතා වලට අනුකූලව මාසිකව, කාර්තුමය හා වාර්ෂිකව විගණනය නොකළ/විගණනය කළ මූල්‍ය ප්‍රකාශන සකස් කර ප්‍රසිද්ධ කර ඇති බව සමාලෝචනය කිරීමෙන් පසු සහතික කර ඇත.
- කාර්තුමය මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට පෙර අයවැය, වාර්ෂික උපාය මාර්ගික සැලසුම්, බැංකු කර්මාන්තය සහ තරඟකාරී පරිසරය හා අනුකූලව බැංකුවේ මුළු කාර්යසාධනය හා වෙළඳ ඒකකවල කාර්යසාධනය පිළිබඳ විශ්ලේෂණාත්මක සමාලෝචනයක් පවත්වනු ලැබේ.
- මූල්‍ය ප්‍රකාශනවල විශ්වසනීයත්වය වැඩි කිරීම සඳහා මෙන්ම දැනට පවතින හා අනාගත උපායමාර්ගික සැලසුම් සඳහා යෙදවුම් ලබාදීම දෙසට යොමු කරමින් සමාලෝචනවල කාර්යක්ෂමතාවය ඉහත කරුණු මගින් දැඩි ලෙස ශක්තිමත් වී ඇත.
- තනි තනිව වැදගත් ණය සම්බන්ධයෙන් ණය හානි ප්‍රතිපාදන පිළිබඳ හා අනෙකුත් ණය මත සාමූහික හානිකරණ දීමනා සම්බන්ධයෙන් වැදගත් තීන්දු, ඇස්තමේන්තු සහ නිගමනයන් සමාලෝචනය කරන ලදී.

නියාමන අනුකූලතාවය.

- බැංකුවේ මෙහෙයුම් පවතින රටවල විශේෂ කොට ගෙන දේශීය හා අන්තර් ජාතික වශයෙන් නියාමන පරිසරය තුළ සිදුවන වෙනස්කම් අඛණ්ඩව අධීක්ෂණය කර ප්‍රතිචාර දක්වන ලදී.
- බැංකුකරණ සහ අනෙකුත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා සමග අනුකූලතාවය සමාලෝචනය කෙරුණි.
- නියාමකයින් විසින් කරගෙන යන ලද පරීක්ෂා කිරීම් වල සොයා ගැනීම් සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියා මාර්ගවල ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය සහ ප්‍රාග්ධන ස්ථායීකරණ සැලැස්ම සහ ඒ මත ක්‍රියාත්මක වීම සමාලෝචනය කිරීම.
- බාසල් III සහ ශ්‍රීලංමුවාප්‍ර. 9 ක්‍රියාත්මක කිරීම උදෙසා සැකසුණු මූලාරම්භය හා ක්‍රියාකාරී සැලසුම් සමාලෝචනය සහ එම ක්‍රියාකාරී සැලසුම් සහ ආරම්භයන් සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම.
- මුදල් විශුද්ධීකරණය හා ත්‍රස්තවාදයට මූල්‍ය පහසුකම් සැලැස්වීම වැලැක්වීම හා ගනුදෙනුකාර තත්ත්ව විශ්ලේෂණය පිළිබඳ අනුකූලතාවය සමාලෝචනය කිරීම.
- ප්‍රධාන විවල්‍යයන්ට එරෙහිව ආතති පරීක්ෂණ ගිණුම්කරණය හඳුන්වා දීම සහ ඒවායේ ප්‍රතිඵලයන් සමාලෝචනය කෙරුණි.
- රාජ්‍ය/පෞද්ගලික අංශ වලට, විවිධ ආර්ථික අංශවලට, අනු අංශවලට සහ ණය ගන්නන්ට ලබාදී ඇති ණය නිරාවරණයන් අධ්‍යයනය කර අවදානම් අවම කිරීම සහ ලිහිල් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සලකා බැලීය.

අභ්‍යන්තර පාලන පිළිවෙත්

- විශේෂිත සිද්ධි හා කරුණු මත අවශ්‍යවේ නම් හා මාසික පදනමකින් පදනම් සාධක විශ්ලේෂණයන් සිදු කෙරුණු අතර, පද්ධති පිළිවෙත් හා අභ්‍යන්තර පාලන විධිවල අවශ්‍ය දියුණු කිරීම් සිදු කරන ලදී.
- බැංකුව විසින් භාවිතා කරන ණය/ව්‍යාපෘති ඇගයීමේ ක්‍රියාදාම දිගින් දිගටම සමාලෝචනය කොට ශක්තිමත් කරන ලදී.
- අනාවරණ හෝ අවදානමට ලක්විය හැකි ප්‍රධාන ක්ෂේත්‍ර හා අවදානම අවම කිරීම හා ඒ සඳහා අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් විශේෂ කාර්යයන් ප්‍රධාන අභ්‍යන්තර විගණන හා ප්‍රධාන අවදානම් නිලධාරිට පවරන ලදී.
- විශේෂ අවධානයක් යොමු කර ඇති ගනුදෙනුකරුවන්ගේ ණය ගෙවීම අධීක්ෂණය, සේවා අධීක්ෂණය කිරීම හා ණය ගෙවීම පැහැරහැරීමට ඇති විභවයන් වැලැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සැලසුම් කිරීම අඛණ්ඩව ශක්තිමත් කිරීම.
- ඉහත අධීක්ෂණ ක්‍රියාවලියේ චිරස්ථිතිය සඳහා ණය ලාභීන් අවවාදවලට හා කොන්දේසි වලට අනුකූල වීම සහතික කිරීම සඳහා අදාළ කළමනාකාර පිරිස්වලින් සමන්විත මෙහෙයුම් ඒකකයක් පිහිටුවීම.

- ණය ඇගයීම සම්බන්ධයෙන් විශේෂිත අවධානයක් සහිතව ප්‍රධාන අවදානම් නිලධාරියාගේ ස්වාධීන භූමිකාව ශක්තිමත් කිරීමේ අදහසින් ඔහුගේ භූමිකාව සමාලෝචනය කෙරුණි.
- ණය ඇගයීමේ හා අධීක්ෂණ කාර්යයේ නියැලී සිටින කාර්ය මණ්ඩලයේ කුසලතා වැඩි දියුණු කිරීමේ සහ ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීමේ සැලසුම් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීමට මානව සම්පත් දෙපාර්තමේන්තුවට මග පෙන්වීමත්, සහාය වීමත් අඛණ්ඩව සිදු කෙරේ. එමෙන්ම එම ක්‍රියාමාර්ග වල ප්‍රගති සමාලෝචනයද සිදුකරන ලදී.
- ණය ආපසු අයකර ගැනීමේ දෙපාර්තමේන්තුවේ ක්‍රියා පටිපාටිය හා උපායමාර්ග සමාලෝචනය කර ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කෙරුණි.
- විසඳීමට තිබෙන නඩු කටයුතු මාසිකව සමාලෝචනය කෙරුණි.
- අවශ්‍ය අනුකූලතාව පදනම් කරගනිමින් දැනට පවතින ප්‍රසම්පාදන ක්‍රියා පිළිවෙල සමාලෝචනය කෙරුණි.

අභ්‍යන්තර පාලන පිළිවෙත් පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය හා විගණකාධිපතිතුමාගේ වාර්තාව පිටු 146 සිට 147 දක්වා පිටුවල ලබාදී ඇත. මූල්‍ය වාර්තාවල හෙළි කරන ලද මූල්‍ය තත්ත්වය හා ප්‍රතිඵල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බව සහ බැංකුවේ වත්කම් ආරක්ෂිත බවට විශ්වාසනීය ආරක්ෂණයක් සැපයීම සඳහා අවශ්‍ය පරීක්ෂා කිරීම් සහ සමතුලිතතාවන් පවතින බව විගණන කමිටුවේ මතය වේ.

අභ්‍යන්තර විගණනය

- අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ කාර්යසාධනය විමර්ශනය කිරීම සහ එම දෙපාර්තමේන්තුවේ සම්පත්වල ප්‍රමාණවත් බව ප්‍රධාන ඒකක තුනක් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් විමර්ශනය කිරීම -
  - පළාත්/ශාඛා සහ ණය විගණනය
  - තොරතුරු පද්ධති විගණනය
  - විමර්ශන
- විදේශීය ශාඛාවල අභ්‍යන්තර විගණන ප්‍රතිපත්තිය සහ ඒ මත පදනම්ව සිදු කරන ලද විගණනයන් සමාලෝචනය කරන ලදී.
- අභ්‍යන්තර විගණන සැලැස්ම 2017 වසර තුළ ක්‍රියාත්මක කිරීමේ ඵලදායීතාවය සමාලෝචනය කෙරුණි.
- කාලීනව නිවැරදි ක්‍රියා මාර්ග ගැනීමේ අදහසින් වැදගත් අභ්‍යන්තර විගණන සොයා ගැනීම් හා කළමනාකාරිත්වය හා ඒ සම්බන්ධයෙන් දක්වන ප්‍රතිචාර සමාලෝචනය කෙරුණි.
- වංචා හා අක්‍රමිකතා වැලැක්වීම, අනාවරණය සහ විමර්ශනය කිරීම සම්බන්ධ ශක්‍යතාව වැඩිදියුණු කිරීම සඳහා පිහිටුවීමට නියමිත වෝහාරික විගණනය ඒකකය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහනක් කරගෙන යන ලදී.
- ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධනය ඇගයීමට ලක් කළ අතර අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ විගණන කාර්ය මණ්ඩලයේ ඇගැයීම සමාලෝචනය කෙරුණි.
- විමර්ශන කාර්ය මණ්ඩලය සඳහා විශේෂ අවධානයක් සහිතව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ පුහුණු සහ සංවර්ධන අවශ්‍යතා සහ එම දෙපාර්තමේන්තුවේ ශක්‍යතාව ගොඩ නැංවීමේ අවශ්‍යතාව සමාලෝචනය කෙරුණි.
- 2018 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම සම්මත කිරීම නිර්දේශ කෙරුණි.

බාහිර විගණනය

රටේ ව්‍යවස්ථාවට අනුකූලව විගණකාධිපතිතුමා විසින් බාහිර විගණනය කරගෙන යනු ලැබේ. 2017 වර්ෂය විගණනය සඳහා සහාය වීමට KPMG වරලත් ගණකාධිකාරිවරුන්, විගණකාධිපතිතුමා විසින් පත් කරන ලදී.

කමිටුව,

- 2016 වසර සඳහා වූ විගණනයට අදාළව විගණකාධිපතිතුමා විසින් පත් කරන ලද කලින් සිටි විගණකවරුන් වන අර්නස්ට් සහ යංග්, වරළත් ගණකාධිකාරිවරුන් විසින් හඳුනාගත් විගණන කරුණු සමාලෝචනය කර පසු විපරම් කෙරුණි.
- 2016 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා බැංකුවේ ගිණුම් සම්බන්ධයෙන් විගණකාධිපතිතුමා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාව, කළමනාකරණ ලිපිය සහ කළමනාකරණ ලිපියට කළමනාකාරිත්වයේ පිළිතුරු දැක්වීම සහ බැංකුව විසින් ගෙන ඇති නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම.
- විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් ලද ප්‍රධාන වාර්තා සමාලෝචනය කර සාකච්ඡා කළ අතර ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍යයැයි සිතූ ඒවා සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කෙරුණි.
- වසර තුළ KPMG, වරළත් ගණකාධිකාරිවරුන් විසින් කරගෙන ගිය බාහිර විගණන ක්‍රියාවලියේ ඵලදායකත්වය සමාලෝචනය කරන ලද අතර පහත සඳහන් දේ සඳහා කමිටුවේ සභාපති කැඳවූ කමිටු රැස්වීම් වලදී සහ විශේෂ රැස්වීම් වලදී විසඳුම් ලබා දුන්හ.
  - 2017 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා ලංකා බැංකුවේ සහ ඊට අයත් පරිපාලිතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා KPMG, වරළත් ගණකාධිකාරිවරුන් ඉදිරිපත් කළ 2017 වසර සඳහා වූ විගණන සැලැස්ම
  - විගණන කණ්ඩායමේ තාක්ෂණික දක්ෂතා සහ කර්මාන්තය තුළ පළපුරුද්ද
  - බැංකුවේ කළමනාකාරිත්වය සහ බාහිර විගණන කණ්ඩායම අතර පවතින අන්තර් සම්බන්ධතාවල සඵලත්වය
  - අවශ්‍ය තොරතුරු නිසි වේලාවට ඉදිරිපත් කිරීම
  - එක් එක් මෙහෙයුම් ක්ෂේත්‍ර වලට අදාළව විගණන ක්‍රියාවලියේ සඵලත්වය සම්බන්ධව කළමනාකාරිත්වයේ සාමාජිකයන්ගේ ප්‍රතිපෝෂණය
  - 2017 වසර සඳහා විගණනයට අදාළව විගණකවරුන් හඳුනා ගත් අතුරු සහ අවසාන විගණන කරුණු

ලංකා බැංකුවේ පරිපාලිතයන් සහ ආශ්‍රිත සමාගම් අධීක්ෂණය සහ විගණනය

- පරිපාලිතයන් අධීක්ෂණය හා පාලනය සඳහා වන පරිපාලිත කළමනාකරණ ප්‍රඥප්තිය සමාලෝචනය කළ අතර ඒ හා බැඳුනු ක්‍රියා පිළිවෙත් ශක්තිමත් කෙරුණි.
- බැංකුවේ පරිපාලිතයින් හා ආශ්‍රිත සමාගම් සඳහාවූ වගවීම සහ අධීක්ෂණය ශක්තිමත් කෙරුණි.
- පරිපාලිතයන්ගේ අභ්‍යන්තර විගණන ප්‍රතිපත්තියට අනුකූලව පරිපාලිතයන් සම්බන්ධයෙන් කරගෙන යන ලද විගණන සමාලෝචනය කෙරුණි.

සයිබර් ආරක්ෂණය

- තොරතුරු තාක්ෂණය බාරව සිටින කළමනාකාරිත්ව පිරිස් සමග නිරන්තර සංවාදයක යෙදෙමින් සයිබර් ආරක්ෂක අවදානම් බැංකුව විසින්ම කළමනාකරණය කර ගැනීම.

විශේෂ මුල් පිරීම

- බාසල් III ක්‍රියාත්මක කිරීමෙන් මතු වූ අභියෝග සඳහා විසඳුම් සෙවීම වස් සාකච්ඡා ක්‍රියාවලියට මග පාදමින් අර්නස්ට් ඇන්ඩ් යංග් වරලත් ගණකාධිකාරිවරු සමග සාකච්ඡා ආරම්භ කළ අතර එයට ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසමට අයත් නියාමන නිලධාරීන්ට ආරාධනා කරන ලදී.
- වංචා සිදුවීමට පෙර වැළැක්වීම සඳහා අභ්‍යන්තර පාලන පිළිවෙත් වල ඇති වැදගත්කම පිළිබඳව බැංකුවේ මෙහෙයුම් කාර්යමණ්ඩලය පුහුණු කිරීමේ අරමුණින් ප්‍රධාන අභ්‍යන්තර විගණන කාර්යාලයට අවශ්‍ය මග පෙන්වීම ලබා දුනි. මෙම වැඩසටහන යටතේ නිලධාරීන් 3,000 කට වඩා පුහුණු කරන ලදී.

යහපාලනය

පහත කරුණු වලට විශේෂ අවධානයක් සහිතව පවතින පදනම අනුකූලව යහපත් ආයතනික යහපාලන භාවිතා ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ කමිටුව විසින් සමාලෝචනයක් සිදු කරන ලදී.

- "ශ්‍රී ලංකාවේ බලපතලාභී වාණිජ බැංකු සඳහා වන ආයතනික යහපාලනය" පිළිබඳ 2007 අංක 11 දරණ බැංකු පනත සහ එයට පසුව එකතුවූ සංශෝධන
- කොළඹ කොටස් වෙළඳපොලෙහි ලැයිස්තු ගත කොන්දේසි
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ඒකාබද්ධව 2013 වසරේදී නිකුත් කරන ලද ආයතනික යහපාලන පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහය (ආයතනික යහපාලනය පිළිබඳ මහා පරිචය)
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් අනිකුත් සංවිධාන හෝ සම්බන්ධිත පාර්ශව සමග කටයුතු කිරීමේදී සහ ඒවාට ඇති බැඳීම් වලදී අරමුණු අතර ගැටුම් හෝ එවැනි ගැටුම් ඇතිවීම නියාමනය පිළිබඳ ප්‍රතිපත්තිය යාවත්කාලීන වී ඇත්ද යන්න සමාලෝචනය කෙරුණි.

ආයතනයක විශේෂතා හා බැංකු ක්ෂේත්‍රයට විශේෂිත යහපාලන අවශ්‍යතා උපායමාර්ගික උපදෙස් හා ඒ හා බැඳුණු අභියෝග වලට වඩා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම පිණිස ලංකා බැංකු ආඥා පනතට සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට සාර්ථක නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් ලංකා බැංකු ආඥාපනත පිළිබඳ සමාලෝචනයක් ආරම්භ කෙරුණි.

2017 වර්ෂය සඳහා වූ වාර්ෂික ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාව පිටු 62 සිට 69 දක්වා පළ වී ඇත.

පැමිණිලි සඳහා ස්ථාපිත ක්‍රියාපටිපාටිය - "විසිල් බ්ලෝවර්" ප්‍රතිපත්තිය

පැමිණිලි භාර ගැනීම, රඳවා ගැනීම හා පිළියම් යෙදීම සඳහා දිගු කලක් තිස්සේ ස්ථාපිත පිළිවෙත් සම්බන්ධයෙන් වූ "විසිල් බ්ලෝවර්" ප්‍රතිපත්තියක් බැංකුව සතුව ඇත. මෙම පැමිණිලි ප්‍රශ්නකාරී ගිණුම්කරණය, අභ්‍යන්තර පාලන දුර්වලතා, අල්ලස් සහ/හෝ කොමිස් ගැනීම්, ව්‍යාජ ලේඛන සැකසීම, රහස්‍ය අභ්‍යන්තර තොරතුරු අවභාවිතාවන් හරහා සිදුකරන ගනුදෙනු, මුදල් විශුද්ධිකරණය, සොරකම් හා වංචා, බැංකුවේ වත්කම් අවභාවිතය, ව්‍යාජ තොරතුරු හෝ අවනියෝජනය හෝ ආචාරධර්ම හෝ ආයතනික යහපාලනය හා කළමනාකාරිත්වයට පටහැනි හෝ නීතිවිරෝධී ප්‍රතිපත්ති හා බැංකුවේ මූල්‍ය හා කීර්තිනාමයට හානිකර වෙනත් ඕනෑම ක්‍රියාවක් සම්බන්ධයෙන් විය හැක.

ප්‍රධාන අභ්‍යන්තර විගණක පැමිණිලි පිළිබඳ සුපරීක්ෂක ලෙස කටයුතු කරන අතර, නියෝජ්‍ය මහා කළමනාකාර සේවය හා ඉන් ඉහළ ශ්‍රේණියන්ගේ කාර්ය මණ්ඩල සාමාජිකයන්ට එරෙහි පැමිණිලි අධ්‍යක්ෂ මණ්ඩලීය විගණන කමිටු සභාපතිවරයා වෙත යොමු කෙරේ.

කාර්ය මණ්ඩල සාමාජිකයන් ඕනෑම නීත්‍යානුකූල ගැටළුවක් පිළිබඳව ඉදිරිපත් කිරීමට පොළඹවන අතර, ඔවුන්ට නිර්නාමිකව හෝ සිය අනන්‍යතාවයන් හෙළි නොකරන බවට ඉල්ලීමක් සහිතව පැමිණිලි ඉදිරිපත් කළ හැක. ගනුදෙනු කරුවන් හා පොදු මහජනතාවට සිය පැමිණිලි නිර්නාමිකව හා රහසිගතව පැමිණිලි සුපරීක්ෂක වෙත යොමු කළ හැකිය. ඔහු මෙම පැමිණිලි පිළිබඳව විමර්ශනය කොට ප්‍රතිපත්තියෙහි සඳහන් කාලසීමාව ඇතුළත ඒ පිළිබඳව වාර්තාවක් විගණන කමිටුව වෙත සැපයිය යුතුය.

කමිටු ඇගයීම

කමිටුවේ වාර්ෂික ඵලදායකත්වය පිළිබඳ ඇගයීම් සිදු කරන අතර ඒ පිළිබඳ ප්‍රතිඵල අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය කරනු ලැබේ. ඊට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලීය ඇගයීම් ක්‍රියාවලිය පුරාම විගණන කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලීය මට්ටමින් ඇගයීමට ලක් කෙරේ.



රනෙල් ටී විජේසිංහ
සභාපති

විගණන කමිටුව
2018 මාර්තු 27 දින
කොළඹ දීය.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

සභාපතිගේ ප්‍රකාශය

කමිටුවේ කාර්යභාරය

කමිටුවේ ප්‍රධාන කාර්ය භාරය හා වගකීම වන්නේ, අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් කළමනාකරණයේ සියලුම අංශයන් සඳහා සිය සුපරීක්ෂක වගකීම ඉටු කිරීමට සහාය වීමයි. මේ පිළිබඳව කටයුතු කිරීමේ දී කමිටුව ණය, වෙළඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම් කෙරෙහි අවධානය යොමු කරමින් සමාලෝචනය කරන්නේ උචිත අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු අනුසාරයෙනි.

ඉහත කරුණු වලට අමතරව, කමිටුවට ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය මඟින් හඳුනාගෙන ඇති පහත සඳහන් අංග සමාලෝචනය සහ/හෝ නිර්දේශය පිළිබඳව වගකීමද පැවරී ඇත.

- අවදානම් කළමනාකරණය හා අනුකූලතාවය හා බැඳුනු ප්‍රතිපත්ති, වැඩසටහන් හා කළමනාකරණ කමිටු ප්‍රඥප්ති
- ප්‍රධාන අවදානම් නිලධාරී විසින් නිර්දේශ කළ අවදානම් සීමා හා ණය, වෙළඳපොල, ද්‍රවශීලතා, මෙහෙයුම් හා වෙනත් අවදානම් අභිරුචීන් ස්ථාපිත කෙරෙන ප්‍රතිපත්ති
- ණය කමිටුව සහ වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව වැනි සියලුම කළමනාකාරිත්ව මට්ටමේ කමිටු වලට, විශේෂිත අවදානම් පිළිබඳ අවධානය යොමු කිරීමට හා කමිටුව විසින් දක්වා ඇති ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා ඇතුළත මෙම අවදානම් කළමනාකරණයට ඇති ප්‍රමාණාත්මකතාවය හා සඵලතාවය
- බැංකුවේ අවදානම් පැතිකඩ මෙන්ම වර්තමාන වෙළඳපොල හා නියාමන අවදානම් හා එබඳු අවදානම් හඳුනාගැනීම, මිනුම්කරණය, අධීක්ෂණය හා පාලනය සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳ අවදානම් කළමනාකරණ වාර්තා
- බැංකුවේ ප්‍රතිපත්ති හා නියාමන හා සුපරීක්ෂණ අවශ්‍යතාවය පදනම මත කමිටුව විසින් තීරණය කර විවක්ෂණශීලී මට්ටම් වලට ඉහළින් විශේෂිත අවදානම් වේ නම් එහි අනිසි ප්‍රතිඵල අවම කිරීමට පිළියම් යෙදීම.
- විශේෂිත අවදානම් හඳුනා ගැනීමට අපොහොසත් වීම පිළිබඳ වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව උචිත පියවර ගැනීම සහ බැංකු කටයුතු සුපරීක්ෂණ අධ්‍යක්ෂ හෝ වෙනයම් අයෙකු විසින් දුන් නියෝග ප්‍රකාර නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග ගැනීම.
- ණය, වෙළඳපොල, ද්‍රවශීලතාවය, මෙහෙයුම් හා අනුකූලතා අවදානම් හඳුනාගැනීම, මිනුම්කරණය, අධීක්ෂණය හා අවම කිරීමේ ක්‍රියාවලියේ ප්‍රමාණාත්මකතාව හා සඵලතාවය

සංයුතිය හා ගණපූරණය

සමාලෝචනයට බඳුන් වූ වසර තුළ කමිටු සාමාජිකයින් පහත දැක්වේ.

- **චරිත එන් විජේවර්ධන මහතා**
  සභාපති,
  ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ - 2017 ජූලි 21 දින තෙක් කමිටුවේ කටයුතු කරන ලදී.
- **සංජය පද්මපෙරුම මහතා**
  සාමාජික,
  ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ - 2017 ජූනි 30 දින තෙක් කමිටුවේ කටයුතු කරන ලදී.
- **එච් පී අජිත් ගුණවර්ධන මහතා**
  සාමාජික,
  ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
- **සමන්ත රාජපක්ෂ මහතා**
  සභාපති,
  ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ - 2017 සැප්තැම්බර් 28 දින සිට කමිටුවේ කටයුතු කරයි.
- **සජිත් ආර් ආටිගල මහතා**
  සාමාජික,
  ස්වාධීන නොවන විධායක නොවන නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ - 2017 සැප්තැම්බර් 28 දින සිට කමිටුවේ කටයුතු කරයි.

කමිටුවේ ස්ථිර කළමනාකරණ නියෝජිතයින් වන්නේ.

- මහා කළමනාකාරතුමා
- ප්‍රධාන අවදානම් නිලධාරී

කමිටුවේ සාමාජිකයින් ද වන අධ්‍යක්ෂවරුන්ගේ සංක්ෂිප්ත විස්තරයන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 35 සිට 37 දක්වා ඇත.

කමිටුවේ ගණපූරණය සාමාජිකයින් දෙදෙනෙකි.

ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය කමිටුවෙහි ද ලේකම් ලෙස කටයුතු කරයි. ප්‍රධාන මූල්‍ය නිලධාරී හා ප්‍රධාන අභ්‍යන්තර විගණක ආරාධනය මත රැස්වීම්වලට සහභාගී වෙති. අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන් කමිටුව විසින් ඔවුන්ගේ පැමිණීම අවශ්‍යයැයි දැක්වූ විටක ඊට ආරාධනා ලබති.

රැස්වීම් හා ක්‍රියාකාරකම්

සමාලෝචනයට බඳුන් වූ වසර තුළ කමිටුව පස් වතාවක් රැස්විය. මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 69 හි ඇති වගුවේ මෙම එක් එක් රැස්වීමට කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පිළිබඳ තොරතුරු සඳහන් කර ඇත.

සමාලෝචනයට භාජනය වූ වසර තුළ කමිටුව විසින් ඔවුන්ගේ වගකීම් ඉටුකරමින් කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි සාරාංශ ගත කර ඇත.

- බැංකුවේ අවදානම් පැතිකඩ තක්සේරු කර ඇති ආකාරය මත පදනම්ව පහත සඳහන් ප්‍රතිපත්ති සමාලෝචනය කර සහ/හෝ නිර්දේශ කරන ලදී.
  - (අ) ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - (ආ) වෙළඳපොල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - (ඇ) මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - (ඈ) ආතති පිරික්සුම් ප්‍රතිපත්තිය
  - (ඉ) මුදල් විශුද්ධිකරණ විරෝධී අනුකූලතා ප්‍රතිපත්තිය
  - (ඊ) ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - (උ) විදේශ විනිමය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - (ඌ) ණය සමාලෝචන යාන්ත්‍රණ ප්‍රතිපත්තිය
  - (එ) ණය කළඹ කළමනාකරණ ප්‍රතිපත්තිය
  - (ඒ) මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් යෙදවීම මැඩලීම (CFT) සඳහා අවදානම මත පදනම් වූ ප්‍රවේශය (RBA)
  - (ඔ) වෙළඳාම මත පදනම් වූ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය සඳහා මුදල් යෙදවීම (TBML/TF) වැළැක්වීමේ ප්‍රතිපත්තිය
  - (ඕ) සීෂෙල්ස් ශාඛාව සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා (ML) සහ ත්‍රස්තවාදයට මුදල් යෙදවීම මැඩලීමේ (CFT) ප්‍රතිපත්තිය
  - (ක) චෙන්නායි ශාඛාව සඳහා මෙහෙයුම් අවදානම් ප්‍රතිපත්තිය
  - (ඛ) චෙන්නායි ශාඛාව සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදය සඳහා මුදල් යෙදවීම මැඩලීමේ ප්‍රතිපත්තිය
  - (ට) වංචා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය 2017
  - (ත) සීෂෙල්ස් ශාඛාව සඳහා අනුකූලතා ප්‍රතිපත්තිය
  - (ප) වෙළඳ අඛණ්ඩතා කළමනාකරණ ප්‍රතිපත්තිය (BCMP) (වෙළඳ අඛණ්ඩතා කළමනාකරණ ප්‍රතිපත්තිය හා සම්බන්ධ ජාත්‍යන්තර මගපෙන්වීම්, ශ්‍රී ලංකා මහබැංකුවේ මගපෙන්වීම්, අයි එස් ප්‍රතිපත්තිය සහ ජාත්‍යන්තර ප්‍රමිති අංක ISO 22301)
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රතිපත්තිය හා සම්බන්ධ නියාමනයන් වැඩි දියුණු කිරීම හා සමාලෝචනය කිරීම සිදු කෙරුණි.

- බැංකුවේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් බැංකුවේ අවදානම මාසික පදනමකින් තක්සේරු කරන අතර ඊට අදාළ සංක්ෂිප්ත වාර්තා කමිටුව හමුවට ඉදිරිපත් කෙරේ. කමිටුව මෙම වාර්තා සමාලෝචනය කොට ඒ පිළිබඳ විශේෂිත නිර්දේශ සමග කමිටු රැස්වීම් වාර්තා ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරේ.
- 2017 වසර සඳහා අවදානම් අභිරුචිය හා සීමා පැනවීම් ස්ථාපිත කෙරුණි.
- සීමා ඉක්මවා පැහිරී ගිය ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් අධීක්ෂණය කොට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කෙරුණි.
- ඒකාබද්ධ අවදානම් කළමනාකරණ මෘදුකාංගය (ණය, මෙහෙයුම් හා වෙළඳපොල අවදානම් කළමනාකරණය කිරීමේ පද්ධතිය), වත්කම් හා වගකීම් කළමනාකරණ පද්ධතිය, ව්‍යාපාර වංචා කළමනාකරණ මෘදුකාංගය හා මුදල් විශුද්ධිකරණ මෘදුකාංග විසඳුම ආදිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසුවිපරම් කෙරුණි.
- 2017 වර්ෂය සඳහා සංශෝධිත අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය තක්සේරු ක්‍රියාවලිය (ICAAP) ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරුණි.
- චෙන්නායි ශාඛාව සඳහා සංශෝධිත කෙරුණු අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය තක්සේරු ක්‍රියාවලිය (ICAAP) ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කෙරුණි.
- අනුකූලතා නිලධාරි විසින් ඉදිරිපත් කළ විස්තීර්ණ අනුකූලතා වාර්තාව සමාලෝචනය කෙරුණි.
- පරිපාලිතයන්ට සිය අවදානම් කළමනාකරණය සඳහා අවදානම් කළමනාකරණ දර්ශක පුවරුව වර්ධනය කරන ලදී. මෙයට අමතරව පරිපාලිතයින්ට සිය අවදානම් කළමනාකරණ කටයුතු වලදී සහාය වීමට අවදානම් කළමනාරණ අංශයේ කණ්ඩායමක් ස්ථාපිත කරන ලදී.
- පරිපාලිතයන්ගේ අවදානම් කළමනාකරණ දර්ශක පුවරු සහ පරිපාලිතයින් මුහුණදෙන විවිධ අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ අධීක්ෂණය හා සමාලෝචනය කරන ලදී.
- ශාඛා පද්ධතිය, තීරණාත්මක ව්‍යාපාර අංශ හා උපකාරක සේවා අංශ තුළ ප්‍රධාන අවදානම් දර්ශක අධීක්ෂණය කෙරුණි.
- 2017/18 සඳහා සංශෝධිත ව්‍යාපාරික අඛණ්ඩතා සැලැස්ම භාවිතය නිර්දේශ කරන ලදී.
- ආනති පිරක්සුම් ප්‍රතිඵල තෙමසකට වරක් සමාලෝචනය කෙරුණි.
- තොරතුරු තාක්ෂණික අවදානම හා ඒ හා බැඳුණු පරිගණක ජාල (සයිබර්) ආරක්ෂාව කෙරේ විශේෂිත අවධානයක් යොමුකොට, බැංකුව පරිගණක ජාල (සයිබර්) ආක්‍රමණ වලින් සුරක්ෂිත කරනු පිණිස විවිධ ක්‍රියාමාර්ග ස්ථාපිත කොට පසු විපරම් කරන ලදී. (බැංකුවේ තොරතුරු තාක්ෂණ පද්ධති යටිතල පහසුකම් සහ ව්‍යාපාර ප්‍රතිශක්තිකරණ පද්ධතිය වැනි)
- දැනටමත් ක්‍රියාත්මක කරන ලද නව සහකාර තොරතුරු අවදානම් නිලධාරියෙක් පත් කිරීම නිර්දේශ කරන ලද අතර තොරතුරු තාක්ෂණ අවදානම් හා බැඳුනු කරුණු කළමනාකරණය සඳහා ප්‍රධාන තොරතුරු ආරක්ෂණ නිලධාරියෙක් පත් කිරීම සම්බන්ධයෙන් දැනට පසුවිපරම් කරමින් පවතී.
- නව තොරතුරු මධ්‍යස්ථානයේ අවසන් අදියරේ ක්‍රියාවලිය අධීක්ෂණය කරමින් පවතී.
- යෝජිත අංග සම්පූර්ණ ආපදා ප්‍රතිසාධනය කිරීමේ (DR) ස්ථානය සම්බන්ධයෙන් දැනට පසු විපරම් කරමින් පවතී.
- අවදානම් ඇගයීමේ වාර්තාවේ සොයා ගැනීම් සහ විනිවිද භාවය පිළිබඳ කරනු ලැබූ පරීක්ෂණය තුළ හඳුනාගත් කරුණුවල ප්‍රගතිය අධීක්ෂණය කෙරුණි.
- ලංකා බැංකුවේ පරිපාලිතයන්ගේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම (AML) සහ ත්‍රස්තවාදයට මුදල් යෙදවීම මැඩලීම (CTF) පිළිබඳ අනුකූලතා තත්ත්වය සමාලෝචනය කෙරුණි.
- බැංකුවේ ලාභාංශ පිළිබඳ ප්‍රතිපත්තිය ස්ථාපනය.
- මූලික බැංකු පද්ධතියේ සියලු මොඩියුලර් දැනට උපයෝජනය කර තිබෙන බවට තහවුරු කිරීම අධීක්ෂණය කරමින් පවතී.
- මාලදිවයින් මුදල් අධිකාරියේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි ප්‍රතිසංස්කරණය කරන ලද මාලේ ශාඛාවේ මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට මුදල් යෙදවීම මැඩලීම සඳහා වූ සංශෝධිත ප්‍රතිපත්ති පසු විපරම් කරමින් පවතී.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2016 අංක 01 දරණ නිර්දේශ වලට අනුකූලතාවය තහවුරු කිරීම පිණිස බලපත්‍ර ලාභී වාණිජ බැංකු සඳහා වන බාසල් 111 මාර්ගෝපදේශ අනුව අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයන් පවත්වා ගැනීම අධීක්ෂණය කරන ලදී.
- බැංකුව තුළ යල්පැනගිය යෙදවුම් භාවිතය වෙනුවට නව දෘඩාංග හා මෘදුකාංග භාවිතා කිරීම පිළිබඳ පසු විපරම් කරන ලදී.
- චෙන්නායි, සීෂෙල්ස් සහ මාලේ ශාඛා සඳහා අවදානම් කළමනාකරණ රාමු ක්‍රියාත්මක කරන ලදී.

කමිටුව සිය කමිටු රැස්වීම් වාර්තා නිර්දේශ සහිතව ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළේය. කමිටුවේ සෑම කමිටු රැස්වීම් වාර්තාවක්ම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කර සම්මත කර ගන්නා ලද අතර, නොවිසඳුනු කරුණු කෙරෙහි පසු විපරම් ක්‍රියා මාර්ගද ගනු ලැබේ.

සමාප්තිය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් 2017 වර්ෂය සඳහා වූ කාර්යසාධනය ඇගැයීමට ලක් කර එහි කාර්යසාධනයෙන් සෑහීමකට පත්විය හැකි බවත් බැංකුවේ අවදානම් නිරාවරණය ඵලදායී ලෙස කළමනාකරණය කරමින් සිටින බවටත් නිගමනය කර තිබේ.

බැංකුව මුහුණපාන විවිධ අවදානම් කමිටුව විසින් නොකඩවා සමාලෝචනය කරන අතර ශක්තිමත් අවදානම් පාලන රාමුවක් හා අවදානම් අභිරුචිය නිගමනය වන පරිදි හොඳින් දියුණු කරන ලද ඉතා පැහැදිලි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම, මූල්‍ය අවදානම් ගණනය කිරීම සඳහා නවීන ක්‍රමවේදයන් භාවිතා කිරීම, අභ්‍යන්තර විශේෂඥතාවය සංවර්ධනය කිරීම, අවදානම් වාර්තාකරණය තුළින් අවදානම් නිවාරණයන් සහ ආතති පිරක්සුම් හෝ සිද්ධි විශ්ලේෂණ ප්‍රතිඵල, දත්ත විශ්ලේෂණය සහ සමාන්තර බැංකු විශ්ලේෂණය නිවැරදිව සන්නිවේදනය කිරීම ආදිය කමිටුව විසින් සිදු කරනු ලැබේ.

තාක්ෂණය වැඩි දියුණු වීම, සාර්ව ආර්ථික කම්පන හා විචලතාවයන් සමඟ වැඩි අවදානමක් ඇතිවීම සහ බැංකු වංචා හා පරිගණක ජාල (සයිබර්) තර්ජන නිසා විශාල අභියෝගයක් එල්ල වීමට ඇති ඉඩ ප්‍රස්ථාව සම්බන්ධව කමිටුව තවදුරටත් විමසිල්ලෙන් සිටින අතර අවදානම් වර්ගීකරණ උපාය මාර්ග තවදුරටත් වැඩි දියුණු කළ යුතු ආකාරය පිළිබඳ අවධානය යොමු කරයි.

කමිටුව වෙත දක්වන ලද සුවිශේෂී දායකත්වය වෙනුවෙන් සභාපති හා සාමාජිකයන් වූ චරිත එන් විජේවර්ධන මහතාටත්, සංජය පද්මපෙරුම මහතාටත් කමිටුවේ ස්තූතිය හිමිවේ.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙනුවෙන්,



සමන්ත රාජපක්ෂ
සභාපති

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2018 මාර්තු 27 දින
කොළඹ දීය.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු වාර්තාව

සභාපතිගේ ප්‍රකාශය

කමිටුවේ කාර්යභාරය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපතුලාභී වාණිජ බැංකු වෙත නිකුත් කළ ආයතනික යහපාලනය සඳහා වන 2007 අංක 11 දරණ බැංකු පනතේ නියාමනයන් මත මූලික වශයෙන් පදනම් වූ කමිටුවේ ප්‍රධානතම වගකීම් පහත දැක්වෙන පරිදි වේ.

- බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස (KMP) සඳහා පාරිශ්‍රමික (වැටුප්, දීමනා හා වෙනත් මූල්‍යමය ගෙවීම්) ප්‍රතිපත්තිය නිර්ණය කිරීම.
- මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ පිරිස වෙත ලබාදුන් අරමුණු හා ඉලක්ක, නියම කිරීම.
- මහා කළමනාකරු හා ප්‍රධාන කළමනාකරණ පිරිස වෙත ලබා දුන් අරමුණු හා ඉලක්ක කාල පදනමක් මත කාර්යසාධනය ඇගයීම හා කාර්ය සාධනය මත පදනම් දිරිදීමනා තුළ පාරිශ්‍රමික, ප්‍රතිලාභ හා අනිකුත් ගෙවීම් සංශෝධනය කිරීමේ පදනම නිශ්චය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කමිටුවට යොමු කළ කාර්ය මණ්ඩලයට අදාල කරුණු සමාලෝචනය.
- බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය හා සංවිධාන ව්‍යුහය නිශ්චය කිරීම.

සංයුතිය හා ගණපූරණය

සමාලෝචනයට බඳුන්වූ වසර තුළ කමිටු සාමාජිකත්වය පහත දැක්වෙන පරිදි වේ.

- **එච් පී අජිත් ගුණවර්ධන මහතා**
  සභාපති,
  ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
- **ජනාධිපති නීතිඥ රොනල්ඩ් සී පෙරේරා මහතා**
  සාමාජික,
  ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
- **සජිත් ආර් ආටිගල මහතා**
  සාමාජික,
  විධායක නොවන නිලබලයෙන් පත්වූ අධ්‍යක්ෂ
- **චරිත එන් විජේවර්ධන මහතා**
  සාමාජික,
  ස්වාධීන විධායක නොවන
  අධ්‍යක්ෂ (2015 නොවැම්බර් 5 දින සිට
  2017 ජූලි 21 දක්වා)

කමිටුවේ ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකි. මහා කළමනාකරුට අදාල කරුණු සාකච්ඡාවන අවස්ථාවල හැර සෙසු සෑම රැස්වීමකටම මහා කළමනාකරු සහභාගී වේ. කමිටුවට ඔවුන්ගේ පැමිණීම අවශ්‍ය වන අවස්ථාවන්හිදී නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්) සහ අනිකුත් කාර්ය මණ්ඩලයටද සහභාගි වන්නට ඇරයුම් කරනු ලබයි. ලංකා බැංකුවේ ලේකම් හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය කමිටුවෙහි ද ලේකම් වශයෙන් කටයුතු කරයි.

රැස්වීම් හා ක්‍රියාකාරකම්

කමිටුව සමාලෝචනයට බඳුන් වූ වසර තුළ තෙවරක් රැස්විය. රැස්වීම් තුළ සාමාජිකයන්ගේ සහභාගිත්වය පිටු 69 හි දක්වා ඇත. කමිටු රැස්වීම් වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්හි සභාගත කොට අනුමත කරන අතර, ඒ ඔස්සේ කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනේ. නොවිසඳුනු කරුණු පිළිබඳව පසුවිපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ඉහත සඳහන් කළ 2007 අංක 11 දරණ බැංකු පනත යටතේ වන නියාමනයන්ට අනුව, මෙම කමිටුවට අධ්‍යක්ෂවරුන් හා බැඳුනු පාරිශ්‍රමික ප්‍රතිපත්තිය නිශ්චය කිරීම පැවරී ඇත. කෙසේ වුවත්, ලංකා බැංකුව සම්බන්ධයෙන් ගත් කළ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමිකයන් නිශ්චය කරනු ලබන්නේ එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් ප්‍රකාරවය. 1938 අංක 53 දරණ බැංකු ආඥාපනත හා ඊට කළ සංශෝධනද මෙහිලා සැලකිල්ලට ගනු ලැබේ. ඉහත සඳහන් පරිදි පිළියෙල කරන ලද පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් බැංකුව සතුව ඇති අතර, රජය විසින් නව රෙගුලාසි නිකුත් කළවිට එය සමාලෝචනය කර මෙම ප්‍රතිපත්තිය සමාලෝචනයට බඳුන්වූ වසර තුළ සංශෝධනය/සමාලෝචනය කරන ලදී. අධ්‍යක්ෂවරුන් වෙත ලබාදුන් පාරිශ්‍රමික විස්තර, වාර්ෂිකව වාර්ෂික වාර්තා හරහා හෙළිදරව් කෙරේ.

මහා කළමනාකරු හා නියෝජ්‍ය මහා කළමනාකාරතුමන්ලාගේ අරමුණු හා ඉලක්ක බැංකුවේ ආයතනික සැලැස්මෙහි හා ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත කොට ඇත. නියෝජ්‍ය මහා කළමනාකරුවන් හරහා ආයතනික සැලැස්ම ක්‍රියාත්මක කරලීමේ වගකීම මහා කළමනාකරුට පැවරී ඇත. ආයතනික සැලැස්ම මත ගොඩනැගුණු ක්‍රියාකාරී සැලැස්ම පදනම් කර ගනිමින්, අංශ භාර නියෝජ්‍ය මහා කළමනාකාරවරු, සහකාර මහා කළමනාකාරවරුන් වෙත ඉලක්ක ලබාදෙති.

බැංකු ආඥා පනතේ ප්‍රතිපාදන අනුව බැංකුව අයත් වන අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව සේවකයින්ගේ පාරිශ්‍රමිකය අවුරුදු තුනකට වරක් සංශෝධනය කරනු ලැබේ. මීලඟ පාරිශ්‍රමික සංශෝධනය 2018 වසරේ යෙදී ඇති අතර එම සංශෝධනය මගින් 2018 වසරේ සිට 2020 වසර දක්වා වසර 3 ක් ආවරණය වේ.

2017 වසර තුළදී කමිටුවේ ප්‍රධාන පෙළේ ක්‍රියාකාරකම් පහත දැක්වෙන පරිදි වේ.

- ලංකා බැංකුවේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය සමාලෝචනය කර නිර්දේශ කරන ලදී.
- බහු කාර්ය සහකාරවරුන් ප්‍රධාන කළමනාකාර ශ්‍රේණියට උසස් කිරීම සඳහා උසස් කිරීමේ ප්‍රතිපත්තිය හා යෝජනා ක්‍රමය නිර්දේශ කරන ලදී.
- බැංකුවේ පුහුණු කිරීමේ අවශ්‍යතා සමාලෝචනය කර අවශ්‍ය නිර්දේශ කරන ලදී.
- නියෝජ්‍ය මහා කළමනාකරුවන්ගේ කාර්යසාධනය කමිටුව ඇගයීමට ලක් කරන ලදී. සහකාර මහා කළමනාකරුවන්ගේ කාර්යසාධනය ඔවුන්ගේ ප්‍රධානීන්, එනම් නියෝජ්‍ය මහා කළමනාකරුවන් මගින් ඇගයීමට ලක් කෙරේ.
- මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටු ප්‍රඥප්තිය සංශෝධන/සමාලෝචනය කිරීම කරන ලදී.
- බැංකුවේ සේවය හැර යන සේවකයින්ගෙන් හේතු විමසන සම්මුඛ පරීක්ෂණ ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදී.
- බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදී.
- භාණ්ඩාගාර අංශයට අයත් ප්‍රාපනිකයන් සඳහා ගනුදෙනු දීමනා සංශෝධනය කරන ලදී.
- ක්‍රියාත්මක කිරීමට ඉතිරිවී ඇති තීන්දු පිළිබඳ පසු විපරම් කරන ලදී.
- කමිටුවේ ප්‍රඥප්තිය ප්‍රකාරව 2017 වසර සඳහා වූ එහි කාර්යසාධනය කමිටුව ඇගයීමට ලක් කළ අතර අවශ්‍ය පරිදි එහි පොරොන්දු ඉටු කොට නිබීම සම්බන්ධයෙන් කමිටුව සෑහීමට පත් වේ.

සමාප්තිය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන් යටතේ එන කරුණු සම්බන්ධයෙන් කමිටුව තවදුරටත් සහාය පළකරනු ඇත. නියමිත සැලකිල්ල හා උද්යෝගය හා ප්‍රතිපත්ති සෑදීම සඳහා දක්ෂතා භාවිතය සහ ඒවායෙහි කරන සංශෝධන සහ මානව ප්‍රාග්ධන හා පාරිශ්‍රමික කරුණු සම්බන්ධයෙන් පොදුවේ තීරණ ගැනීම සම්බන්ධයෙන් කමිටුවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව වෙනුවෙන්,



එච් පී අජිත් ගුණවර්ධන
සභාපති
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

2018 මාර්තු 27 දින
කොළඹ දිය.

නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටු වාර්තාව

සභාපතිගේ ප්‍රකාශය

කමිටුවේ කාර්යභාරය

නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුවට ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන දෑ සම්බන්ධයෙන් වගකීම පැවරී ඇත.

- මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම (KMP) තෝරාගැනීම/පත් කිරීම පිළිබඳ පටිපාටිය ක්‍රියාත්මක කිරීම.
- මහා කළමනාකරණ තනතුර හා ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම සඳහා පත් කිරීම/උසස් කිරීම වෙනුවෙන් සුදුසුකම්, පළපුරුද්ද හා ප්‍රධාන යෝග්‍යතා නිර්නායක සැකසීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපතුලාභී වාණිජ බැංකුවලට නිකුත් කරනු ලැබූ ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අංක 3 (3) දරණ නියමයේ සඳහන් නිර්නායකවල නිශ්චිතව දක්වා ඇති පරිදි, අදාළ තනතුරු දැරීමට මහා කළමනාකාරතුමා සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් යෝග්‍ය හා සුදුසු බව සහතික කිරීම.
- ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම සඳහා අනුප්‍රාප්තික වැඩපිළිවෙල හා අතිරේක/නව ප්‍රවීනතා අවශ්‍යතාවයන් පිළිබඳ විටින් විට සළකාබැලීම හා නිර්දේශ කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය හා ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටුවල සඵලතාවය වාර්ෂිකව ඇගයීම උදෙසා කාලානුරූපව ක්‍රමෝපාය නිශ්චය කොට ක්‍රියාත්මක කිරීම සහ වාර්ෂික කාර්යසාධනය ඇගයීමේ ක්‍රියාවලිය සඳහා සහාය වීම.
- බැංකු ආචාරධර්ම සංග්‍රහය සමාලෝචනය.
- ආයතනික යහපාලන මූලධර්ම හා අනුකූලවීමේ මට්ටම් නිශ්චය කිරීම.

සංයුතිය හා ගණපූර්ණය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ කමිටුවේ සාමාජිකත්වය පහත පරිදි විය.

- **ජනාධිපති නීතිඥ රොනල්ඩ් සී පෙරේරා**
  සභාපති,
  ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
- **සංජය පද්මපෙරුම මහතා**
  සාමාජික,
  ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ 2017 ජූනි 30 දින තෙක් කමිටුවේ සේවය කළේය.
- **එච් පී අජිත් ගුණවර්ධන මහතා**
  සාමාජික,
  ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
- **සජිත් ආර් ආටිගල මහතා**
  සාමාජික,
  ස්වාධීන නොවන විධායක නොවන නිලබලයෙන් පත්වූ අධ්‍යක්ෂ 2017 සැප්තැම්බර් 28 දින සිට කමිටුවේ සේවය කරයි.

මෙම වාර්ෂික වාර්තාවේ පිටු 35 සිට 37 දක්වා කමිටුවේ සාමාජිකයින් වන අධ්‍යක්ෂවරුන්ගේ සංක්ෂිප්ත විස්තරයක් දක්වා ඇත.

මහා කළමනාකරු, ආරාධනය මත කමිටු රැස්වීම්වලට සහභාගි වෙයි. කමිටුවට ඔවුන්ගේ පැමිණීම අත්‍යවශ්‍ය කෙරෙන අවස්ථාවන් හිදී සෙසු කාර්ය මණ්ඩල සාමාජිකයන්ටද ආරාධනා කෙරේ. ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය කමිටුවේද ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම්

කමිටුව සමාලෝචනයට බඳුන්වූ වසර තුළ තුන් වතාවක් රැස් විය. මේ එක් එක් රැස්වීම් වලට සාමාජිකයින්ගේ පැමිණීම මෙම වාර්ෂික වාර්තාවේ පිටු 69 හි ඇති වගුව තුළ දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම

කමිටු රැස්වීම් වල සියලුම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කොට සම්මත කෙරෙන අතර කමිටුව විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කරන්නට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඒ ආකාරයෙන් ලබා ගනු ලැබේ. නොවිසඳුනු කරුනු පිළිබඳව පසු විපරම් කටයුතු කරනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පත් කිරීම

2007 අංක 11 දරණ බැංකු පනත් නියමයන්ට අනුව නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව නව අධ්‍යක්ෂවරුන් තේරීමේ/පත් කිරීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කළ යුතුය. කෙසේවුවත්, ලංකා බැංකුව සම්බන්ධයෙන් ගත්කල එහි පූර්ණ අයිතිකරු ශ්‍රී ලංකා රජය වන බැවින් අධ්‍යක්ෂවරුන් පත් කිරීමට අදාළ විෂය භාර ඇමති විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධන වල විධිවිධාන අනුව සිදු කරනු ලබයි. එම නිසා අධ්‍යක්ෂවරුන් පත් කිරීමට නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව සම්බන්ධ නොවේ.

සමාලෝචනයට බඳුන්වූ වසර තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම්

- පහත සඳහන් දෑ සමාලෝචනය කර නිර්දේශ කරන ලදී.
  - අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය
  - අධ්‍යක්ෂවරුන් සඳහා වූ ආචාරධර්ම සංග්‍රහය
  - සේවකයින් සඳහා ආචාරධර්ම සංග්‍රහය
  - බැංකුවේ සන්නිවේදන ප්‍රතිපත්තිය
  - ආයතනික කළමනාකරණය සහ විධායක කළමනාකරණය (KMPs) සඳහා අනුප්‍රාප්තික සැලසුම
- ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම් සඳහා පදවි විස්තර භාවිතය සමාලෝචනය කොට නිර්දේශ කරන ලදී.
- ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමට පත් කළ හෝ උසස් කළ විට ඔවුන් එම තනතුරු දැරීමට නිසි හෝ යෝග්‍ය පුද්ගලයින් බවට සහතික කරන ලදී.
- අධ්‍යක්ෂවරුන් විසින් කරන ලද සියලුම ස්වයං ඇගයීම් ක්‍රියාවලිය සමාලෝචනය කරන ලදී.
- කමිටුවේ කාර්යසාධනය සම්බන්ධයෙන් ඇගයීම් කරන ලදී.

සමාප්තිය

කමිටුව, ලංකා බැංකුව තුළ ප්‍රශස්ත යහපාලන පරිචයක් පවත්වාගෙන යාමට උපරිමයෙන් කටයුතු කරනු ඇත.

මෙම කමිටුවේ සාමාජිකයෙක් වශයෙන් ඔහු විසින් කරන ලද අගනා දායකත්වයන් වෙනුවෙන් සංජය පද්මපෙරුම මහතාට කමිටුවේ ස්තුතිය හිමිවේ.

නාම යෝජනා හා ආයතනික යහපාලන කමිටුව වෙනුවෙන්,



ජනාධිපති නීතිඥ රොනල්ඩ් සී පෙරේරා
සභාපති
නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව

2018 මාර්තු 27 දින
කොළඹ දීය.





ඩිජිටල්කරණය


බැංකු කටයුතු මෙන්ම අපගේ ක්‍රියාකාරකම් සියල්ලම පාහේ පූර්ණ වෙනස්වීමකට භාජනය කරනුයේ නවීන තාක්ෂණික හඳුන්වාදීම් වේ.

බැංකුව තම ශක්තිය තවදුරටත් යොදවනු ඇත්තේ ඔවුන් විසින් වැළඳගෙන ඇති මෙම නව තාක්ෂණික වෙනස්වීම් සහ ඒ ඔස්සේ සිදුවන ජීවන ක්‍රමයේ වෙනස්වීම සඳහා වේ.

අනාගතය සඳහා වන වේගවත් ප්‍රවේශය වනුයේ මෙයයි.

අවදානම් කළමනාකරණය


ප්‍රධාන අවදානම් දර්ශක



බැංකු මෙහෙයුම්වල ස්වභාවය හමුවේ අවදානම බැංකුවකට සාමාන්‍ය තත්ත්වයකි. නෛසර්ගික ලක්ෂණයකි. එම නිසා සුරක්ෂිතතාව හා ස්ථාවරත්වය කළමනාකරණය කිරීම සඳහා විචක්ෂණ ලෙස අවදානම කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය වේ. මෙය සඵලදායී වනු පිණිස නිරවුල් ලෙස නිර්වචනය කරන ලද පද්ධති හා කාර්යපටිපාටි සහිත නිශ්චිත සැකැස්මක් තුළ සිදු කරනු ලැබිය යුතු ය. ලංකා බැංකුවේ අවදානම් කළමනාකරණ සැකැස්ම විචක්ෂණීය ප්‍රාග්ධන ප්‍රතිපාදනයක රුකුල ඇතිව එම අවදානම ඉදිරිය පදනම් වූ ආකාරයකින් හඳුනා ගැනීම හා කළමනාකරණය කිරීම පිණිස සංකේන්ද්‍රිතව තිබේ. කළමනාකාරිත්වය විසින් දෘඪතර අවදානම් පාලන ව්‍යූහයක් හා අවදානම් අභිරුචීන් සකස් කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එය අනුමත කෙරේ. එය ක්‍රියාත්මක කෙරෙනුයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටු සහ කළමනාකරණ කමිටු සම්බන්ධ වන පද්ධතියක් විසිනි.

බැංකුවේ දැක්ම, මෙහෙවර, උපායමාර්ග හා ඉලක්ක වනාහි බැංකුවේ අවදානම් දර්ශනය තීරණය කරන සවිමත් පදනමයි. බැංකුව ගැනීමට කැමති අවදානම් මට්ටම වන අවදානම් අභිරුචිය නිශ්චිතව නිර්ණය කර තිබේ. ඉදිරිය පදනම් වූ ආකාරයකින් අවදානම් හඳුනා ගැනීම හා කළමනාකරණය කිරීම පිණිස නිරීක්ෂණ හා පාලන ප්‍රතිපත්තිවලින් සමන්විත දැඩි ප්‍රමාණාත්මක සැකැස්මක් පිහිටුවා තිබේ. අපගේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි බැංකුව තුළ නිරවුල්ව සන්නිවේදනය කෙරෙන අතර ඒවා සාර්ථකව ක්‍රියාත්මක කෙරෙන බවට සහතික වනු පිණිස එම සන්නිවේදනය අත්‍යවශ්‍ය වේ. අවදානම හා ප්‍රතිලාභය සමබර කිරීමේ අවශ්‍යතාව පිළිබඳව සියලු අභ්‍යන්තර පාර්ශවකරුවන් දැනුවත් කර ඇත. මෙම අවදානම්-ප්‍රතිලාභ හුවමාරුව නිශ්චිතව නියම කළ අවදානම් සීමාවන් ඇතුළත කළමනාකරණය කර ගත යුතුය.

පාලන ව්‍යූහය



බැංකුවෙහි අවදානම් කළමනාකරණ කාර්යය ශක්තිමත් කරනු පිණිස සංවිධානමය විධිවිධාන යොදා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුකමිටුවක් වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි (IRMC) අධීක්ෂණය යටතේ ප්‍රධාන අවදානම් නිලධාරිවරයා ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශයේ (IIRMD) ප්‍රධානිත්වය දරයි. ඒ අනුව ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) ආදායම් උත්පාදනය කරන උපායමාර්ගික ව්‍යාපාරික ඒකක (SBUs) කෙරෙන් ස්වාධීනව පවතින අතර එමගින් එම අංශය සිය කාර්යයන් ඉෂ්ට කිරීම පිණිස සංවිධානමය වශයෙන් මනා සේ ස්ථානගතව සිටින බවට සහතික කෙරේ.

බැංකුවෙහි අවදානම් පැතිකඩ

ණය දීම ශේෂපත්‍රයෙහි ප්‍රධාන සංරචකයක් වන බැවින් ඉහළම ප්‍රාග්ධන පැවරුම ණය අවදානම වෙත ප්‍රතිපාදනය කර ඇත. ප්‍රාග්ධන ප්‍රතිපාදන අංශයෙන්, වෙළඳපල අවදානම සන්සන්දනාත්මකව ණය අවදානමට හා මෙහෙයුම් අවදානමට වඩා අඩුය. පසුගිය වර්ෂ තුන සඳහා ලංකා බැංකුවේ අවදානම් සැකැස්ම පහත දක්වා ඇත:-

අවදානම් සංස්කෘතිය

වර්තමාන බැංකු ක්ෂේත්‍රය තුළ පරිපූර්ණ අවදානම් සංස්කෘතියක් ඇති කර ගැනීම අවශ්‍යතාවක් බවට පත්ව ඇත. කාර්ය මණ්ඩලය අතර අවදානම් සංස්කෘතිය ඇති කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ මගපෙන්වීම ඉතා වැදගත් වේ. මෙයට අවදානම්-ප්‍රතිලාභ නුවමාරුව පිළිබඳ දැනුවත්භාවය මෙන්ම අවදානමේ හා ප්‍රාග්ධනයේ සෘජු පැතිකඩක්ම කළමනාකරණය කිරීම ඇතුළත් ය. අවදානම් නිශ්චිත අවදානම් අභිරුචියක් තුළ ගනු ලබන අතර, ප්‍රතිලාභයද සැලකිල්ලට ගන්නා නිශ්චිත අවදානම් කළමනාකරණ රාමුවක් ඇතුළත අනුමත කරනු ලැබේ. වෙළඳපොල හෝ කර්මාන්ත තත්ත්වයන්හි විපර්යාස හේතුවෙන් අවදානම්වල ස්වරූපය සීඝ්‍ර ලෙස වෙනස් විය හැකි බැවින් අවදානම් අඛණ්ඩව අධීක්ෂණය කිරීමට සිදු වේ.

බැංකුව තුළ ගැඹුරට මුල්බැස ගත් අවදානම් සංස්කෘතියක් හුරු කරවීම පිණිස ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) පරිණාමනය වෙමින් ඇති අවදානම් කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳව අළුතින් බඳවා ගනු ලබන්නන් දැනුවත් කිරීමටත්, සිටින කාර්ය මණ්ඩලයේ දැනුම අඛණ්ඩව යාවත්කාලීන කිරීමටත් පියවර ගෙන ඇත. අවදානම් කළමනාකරණය කිරීම සඳහා සියලුම සේවකයින්ගේ සහභාගිත්වය ලබා ගැනීමට අපි ප්‍රයත්න දරන අතර උචිත විට අවදානම් පිළිබඳ සැලකිල්ල ඉහළ දැමීමට ඔවුන් දිරිගන්වනු ලැබේ.

ආරක්ෂක පථ තුනක්

බැංකුවෙහි එකිනෙකින් ස්වායත්ත ආරක්ෂක පථ තුනක් මත පදනම් වූ හොඳින් සැකසුණු අවදානම් කළමනාකරණ ආකෘතියක් ඇත. එක් එක් ආරක්ෂක පථය එකිනෙකට වෙනස් සංවිධාන ඒකකයන් විසින් ක්‍රියාවෙහි යොදවනු ලැබේ. පළමු ආරක්ෂක පථය සමන්විත වන්නේ තමන් ක්‍රියාකාරකම් සිදු කරන නිසාම අවදානම් පැහැනගින අංශ වන ව්‍යාපාරික අංශ හා උපකාරක ඒකකවලිනි. දෙවන ආරක්ෂක පථය වශයෙන් ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) සැලසුම්, ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි සංවර්ධනය කිරීමත් අවදානම් අභිරුචිය ස්ථාපිත කිරීමත් සිදු කරයි. කාලීන ආතති පරීක්ෂාව හා අඛණ්ඩ අධීක්ෂණයද දෙවන ආරක්ෂක පථයේ අභ්‍යන්තරික කොටස් වේ. තුන්වැන්න වන්නේ ස්වාධීන සුපරීක්ෂණ කාර්යයක් පිරිනමන විගණන හා අනුකූලන කර්තව්‍යයි.

	2017 රු. මිලියන	2016 රු. මිලියන	2015 රු. මිලියන
පවතින ප්‍රාග්ධනය	125,460	104,858	92,245
ණය අවදානම	89,818	73,482	59,816
වෙළඳපොල අවදානම	922	1,987	2,529
මෙහෙයුම් අවදානම	10,270	9,504	8,242
මුළු ප්‍රාග්ධන භාවිතය	101,010	90,437	70,588
අතිරේක නියාමන ස්වාරක්ෂකය*	9,671	9,559	–
ව්‍යාප්තිය සඳහා ඇති නිදහස් ප්‍රාග්ධනය	14,778	5,015	21,657
ණය අවදානම/මුළු අවදානම් බරතැබූ වත්කම්	89%	86%	85%
වෙළඳපල අවදානම/මුළු අවදානම් බරතැබූ වත්කම්	1%	2%	4%
මෙහෙයුම් අවදානම/මුළු අවදානම් බරතැබූ වත්කම්	10%	11%	12%
අවදානම් බරතැබූ වත්කම්/මුළු වත්කම්	44%	51%	45%

*2017 ජූලි 1 දිනට බාසල් III මාර්ගෝපදේශක මගින් නියම කරන ලද නියාමන ස්වාරක්ෂකය (2016) දී 10.625% සහ 11.75% අතර වෙනස සහ 2017 දී 11.75% සහ 12.875% අතර වෙනස.

1 වන පථය ව්‍යාපාරික ඒකක	2 වන පථය අවදානම	3 වන පථය විගණනය
• එදිනෙදා අවදානම කළමනාකරණයෙහි නියැළේ • අවදානම් ක්‍රියාවලියක් අනුගමනය කරයි • අභ්‍යන්තර පාලන විධි හා අවදානම් ප්‍රතිචාර යොදා ගනියි	• අවදානම් කළමනාකරණය සුපරීක්ෂණය හා අභියෝගයට ලක් කිරීම කරයි • මාර්ගෝපදේශනය හා මෙහෙයවීම සිදුකරයි • අවදානම් කළමනාකරණ රාමුව සංවර්ධනය කරයි	• 1 වන හා 2 වන පථ සමාලෝචනය කරයි • ස්වාධීන දෘෂ්ටියක් ලබා දෙන අතර ක්‍රියාවලියට අභියෝග කරයි • වාස්තවිකව කටයුතු කරමින් තහවුරුව ලබා දෙයි

අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

ඍණාත්මක සිදුවීම් සිදුවීමේ හැකියාව සහ එබඳු ඍණාත්මක සිදුවීම්වල විභව්‍ය පිරිවැය හේතුවෙන් මනා ලෙස ස්ථාපිත අවදානම් කළමනාකරණ ක්‍රියාවලියක් පැවතීමේ අවශ්‍යතාව මතු කෙරේ. අවදානම් හඳුනා ගැනීම, මැනීම, නිරීක්ෂණය කිරීම, හානි අවම කිරීම හා වාර්තා කිරීම යන මේවායෙන් අපගේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සමන්විත ය. ව්‍යාපාරයේ සැලකිය යුතු අවදානම් කළමනාකරණය කරනු පිණිස අභ්‍යන්තර පාලනවිධි කට්ටලයක් සංවර්ධනය කර ඇත.

උපායමාර්ගික ව්‍යාපාරික සැලැස්ම පදනම් කොට ගෙන අවදානම් උපායමාර්ගය සකස් කෙරෙන අතර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ අවදානම් අභිරුචිය හා ප්‍රාග්ධන සැලැස්ම මගින් අවදානම, ප්‍රාග්ධන හා කාර්යසාධන ඉලක්ක වාර්ෂිකව දිශාගත කෙරේ. අවදානම, ලාභදායිත්වය හා තිබෙන ප්‍රාග්ධනය අතර සමතුලිතතාවක් ඇති කර ගැනීම අවශ්‍ය කෙරෙනු ඇත. ණය අවදානම, වෙළඳපොල අවදානම, මෙහෙයුම් අවදානම, කීර්තිනාම අවදානම හා උපායමාර්ගික අවදානම වැනි විවිධ ආකාරවල අවදානම් කේවල හා සමස්ත වශයෙන් ආමන්ත්‍රණය කිරීමට අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට සිදු වේ. අවදානම් හා ඒවායේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වන ප්‍රාග්ධන අවශ්‍යතාවන් ප්‍රමාණනය කිරීම සිදු කරනු ලබන්නේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) විසින් සංවර්ධනය කරනු ලබන ප්‍රමාණාත්මක ආකෘති හා මෙවලම් හරහා ය. බැංකුවට විශේෂිත අහිතකර සිද්ධිරූපණ හා සාර්ව විශේෂිත වූ අහිතකර සිද්ධිරූපණ යටතේ බැංකුවට ඇති ප්‍රත්‍යාස්ථිතිය ඇගයීම පිණිස කලින් කලට ආතති පරීක්ෂාවන් සිදුකරයි. මෙම ආතති පරීක්ෂාවන් ණය, වෙළඳපොල, මෙහෙයුම් හා ද්‍රවශීලතා වැනි සියලු සැලකිය යුතු අවදානම් මත සංකේන්ද්‍රණය කරයි. ඇති විය හැකි තර්ජනයන් පිළිබඳව සුපරීක්ෂාකාරිත්වය සඳහා එම පරීක්ෂාවන්හි ප්‍රතිඵල කළමනාකාරිත්වය හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.


බැංකුව දැරීමට කැමති අවදානමේ ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් අභිරුචි ප්‍රකාශයෙහි විස්තරාත්මකව දැක්වේ. එය ද අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය විසින් අනුමත කරන ලද, බැංකුවේ අවදානම් සංස්කෘතිය පිළිබඳ පුළුල් භාවප්‍රකාශයක් වන අවදානම් අභිරුචි රාමුව මගින් පාලනය වන අතර, එය බැංකුවේ පරමාර්ථ හා උපායමාර්ග සමග දිශාගතව ඇත. මෙහි පාලන යාන්ත්‍රණය ලෙස ක්‍රියා කරනුයේ විවිධ ප්‍රභේදයන්හි අවදානම් සඳහා ගුණාත්මක හෝ ප්‍රමාණාත්මක විය හැකි පිවිසුම් මට්ටම් හා සීමාවන් ය. ප්‍රතිපත්ති, කාර්යපටිපාටි හා පාලනවිධි මගින් අවදානම් පාලන ක්‍රියාවලිය ක්‍රියාන්විතකරණය කෙරේ. එකී අවම පිවිසුම් මට්ටම් හා සීමාවන් උපායමාර්ගික මට්ටම හා ව්‍යාපාරික මට්ටම ලෙස තවදුරටත් බෙදනු ලැබේ. ඉහළ මට්ටමේ අවදානම් වඩාත් කැටි වූ මට්ටමකට පහළට ගෙනෙනු ලබන අතර ඒවා සංවිධානමය ව්‍යුහ රාමු හරහා ක්‍රියාන්විතකරණය කරනු ලැබේ.

නියාමන උල්ලංඝණයන්, බැංකුවෙහි කීර්තිනාමය පළුදු වීම්, විශාල ව්‍යාපාරික බිඳවැටීම් හා බැංකුවේ පැවැත්ම ආශ්‍රිත ගැටළුකාරී තත්ත්වයන් වැනි තීරණාත්මක අංශ ශූන්‍ය අවදානම් අභිරුචියක් ඇති ඒවා ලෙස සැලකේ.

අවදානම් අභිරුචිය මගින් ආවරණය වන සීමාවන් වෙතින් අවම පිවිසුම් මට්ටම් කේවල අවදානම් ගාමකයන්ට මෙන්ම ණය කළඹ ඵලයන්ට පූර්ණ වශයෙන් අවදානම්-සංවේදී වන බවට වගබලාගනු පිණිස අපි ප්‍රාග්ධනය අපගේ මූලික මිම්ම ලෙස යොදා ගෙන ඇත.

අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP)

බැංකුව කවර ආකාරයෙන් තමා නිරාවරණය වන අවදානම් හඳුනා ගැනීම සහ කෙලෙස එම අවදානම්වල හානි අවම කරමින් සිටියිද යන්න හා සිය ව්‍යාපාරික සැලසුම් සුමට ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කොපමණ ප්‍රාග්ධනයක් අවශ්‍යද යන්න නිශ්චය කර ගනු පිණිස එම අවදානම් තක්සේරු කිරීම අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලියේ (ICAAP) අරමුණයි. අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP) වනාහි බැංකුවේ කළමනාකරණ හා තීරණ ගැනීමේ ක්‍රියාවලියේ ආංශික කොටසකි. හඳුනාගත් අවදානම් ප්‍රමාණනය කිරීම එම අවදානම් ප්‍රාග්ධන අවශ්‍යතාවලට පරිවර්තනය කිරීම මගින් සිදුකෙරේ. බැංකුව අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලියේ කාර්යයන් උදෙසා බැංකුව පදනමින් හා සමූහය පදනමින් ණය, වෙළඳපොළ, මෙහෙයුම්, හා ද්‍රවශීලතා අවදානම්, බැංකුකරණ පොළී අනුපාතික අවදානම, කීර්තිනාම, අනුකූලන, ණය සංකේන්ද්‍රණ හා උපායමාර්ගික අවදානම් හඳුනාගෙන ඇත.



අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP) වනාහි පහත දේ ද ඇතුළත් වන උපායමාර්ගික වශයෙන් ඉදිරි බලන ක්‍රියාවලියකි:-

- ව්‍යාපාරික සැලසුම් හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා මත පදනම්ව ප්‍රාග්ධන අවශ්‍යතා තක්සේරු කිරීම හා ඒ පිළිබඳ පුරෝකථනය කිරීම. - මෙම වර්ෂයේදී බාසල් III නියාමන මඟින් විශාල බලපෑමක්, විශේෂයෙන් ඉහළ නැඟි ප්‍රාග්ධන හා ද්‍රවශීලතා අවශ්‍යතා මඟින් ඇති කර ඇත.
- අවදානම් උපායමාර්ගය හා අභිරුචිය යන දෙක ව්‍යාපාරික අරමුණු සමඟ දිශාගත කරන උපායමාර්ගික සැලසුම්කරණ ක්‍රියාවලියක්. ව්‍යාපාරික උපායමාර්ගවලට උරදෙනු පිණිස විශේෂිත ආතති පරීක්ෂණ ඇතුළත් සමබර ප්‍රාග්ධන හා ආතති පරීක්ෂණ රාමුවක්.
- තිබෙන ප්‍රාග්ධනය හා අහඹු අවස්ථා සැලසුම් සම්බන්ධයෙන් අවකාශ තක්සේරුව.

ආතති පරීක්ෂාව

ආතති පරීක්ෂාව යනු අහිතකර සාර්ව ආර්ථික තත්ත්වයන් හෝ වෙනත් අසාමාන්‍ය එහෙත් යථාරූපී අවස්ථා යටතේ මූල්‍ය ප්‍රතිවිපාක රූපනය කිරීමේ ක්‍රියාවලියයි. මෙමගින් අපට එබඳු අවස්ථාවන්ට ඔරොත්තු දීමට බැංකුවට ඇති හැකියාව මැනිය හැකි ය. ආතති පරීක්ෂාව මඟින් අවදානම කළමනාකරණය කිරීමෙහි හා පාලනය කිරීමෙහි යෙදී සිටින සියල්ලන් අතර අවදානම පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කෙරේ. එයට අමතරව, එය ප්‍රාග්ධන හා ද්‍රවශීලතා සැලසුම්කරණය ප්‍රවර්ධනය කරන අතර ව්‍යාපාරික තීරණ ගැනීම පහසු කරයි.

ආතති පරීක්ෂණ ක්‍රියාවලිය

බැංකුව ඇතුළත සළුලදායී ආතති පරීක්ෂාව සඳහා ප්‍රාථමික වශයෙන් වගකිව යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයයි. එමෙන්ම ආතති පරීක්ෂාවන්හි ප්‍රතිඵල ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ද සන්නිවේදනය කෙරේ. එය අවදානම් සීමාවන් ස්ථාපිත කිරීම, විවිධ අවදානම් සඳහා ප්‍රාග්ධනය ප්‍රතිපාදනය කිරීම, අවදානම් නිරාවරණයන් කළමනාකරණය කිරීම සහ අහිතකර වාතාවරණයන් සඳහා අහඹු අවස්ථා සැලසුම් සැකසීම සඳහා පහසුකම් සලස්වයි. බැංකුවේ ආතති පරීක්ෂණය මෙහෙයවනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආතති පරීක්ෂණ ප්‍රතිපත්තියකට අනුව ය. සාර්ව ආර්ථික පරිසරයේ වැඩි වෙමින් ඇති විචලනයන් සැලකිල්ලට ගෙන පරීක්ෂාව වඩාත් දැඩි කර ඇති අතර සමූහයද සැලකිල්ලට ගෙන යම්-පුළුල් ආතති පරීක්ෂණය ද සිදු කරනු ලැබ ඇත. දැඩි සේ අවදානමට පාත්‍ර වත්කම් කළඹ දෛනික පදනමින් පරීක්ෂාවට ලක් වන අතර ඒවායේ ප්‍රතිඵල ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත ඉදිරිපත් කෙරේ.

ආතති පරීක්ෂා වැඩසටහන ක්‍රියාත්මක කිරීම

ක්‍රියාකාරකම	විස්තරය
අවදානම් තක්සේරුව	අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP) බැංකුව කෙරෙහි ඇති සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම සඳහා වගකීම දරයි.
ආතති පරීක්ෂා සැලැස්ම	ආතති පරීක්ෂාවන් නිතිපතා මෙන්ම නිරන්තර පදනමින් සිදුකෙරේ. නිරන්තර ආතති පරීක්ෂාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආතති පරීක්ෂා ප්‍රතිපත්තිය අනුව සිදුකෙරෙන අතර අවස්ථාව මඟින් අවශ්‍ය කෙරෙන පරිදි ද ආතති පරීක්ෂාව සිදුකෙරේ.
නිර්මාණ සංවේදීතා පරීක්ෂණ, සිද්ධිරූපණ රාමුව හා සාර්ව ආර්ථික සාධක	අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලි (ICAAP) නියමු කමිටුව පර්යේෂණ, මූල්‍ය හා ව්‍යාපාර දෙපාර්තමේන්තු සමඟ සාකච්ඡා කොට, කේවල අවදානම්, ඒකාබද්ධ සිද්ධිරූපන හා සාර්ව ආර්ථික සිද්ධිරූපන සඳහා ආතති පරීක්ෂාවන් සිදුකරනු පිණිස වූ සංවේදීතා පරීක්ෂණ සංවර්ධනය කරයි.
අවදානම් ගාමකයන් හඳුනා ගැනීම	හඳුනා ගන්නා ලද සැලකිය යුතු අවදානම් මත පදනම්ව, පසුව බලපෑමට මගපෑදිය හැකි ගාමකයන් හඳුනා ගැනේ.
ප්‍රතිඵල මැනීම	පහත ඒවා මත අවදානම් ගාමකයන්හි බලපෑම හඳුනා ගැනේ: • ප්‍රාග්ධනය • ද්‍රවශීලතාව • ලාභදායීත්වය
ආතති පරීක්ෂා වැඩසටහන ක්‍රියාත්මක කිරීම	ඉහත ක්‍රියාකාරකම් සම්පූර්ණ කළ විට, හඳුනාගනු ලැබූ විවිධ සැලකිය යුතු අවදානම් සඳහා අදාළ ප්‍රතිදාන ලබා ගනු පිණිස අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP) නියමු කමිටුව විසින් සිද්ධිරූපන/ ආතති පරීක්ෂාවන් ස්ථානගත කරනු ලැබේ.
ප්‍රතිඵල එකලස් කිරීම	සියලු අවදානම් බාණ්ඩවලම ආතති පරීක්ෂණ ප්‍රතිඵල එකට එකතු කර බලනු ලැබේ.
ප්‍රතිඵල සමාලෝචනය හා වාර්තා කිරීම	ආතති පරීක්ෂාවෙහි ප්‍රතිඵල සමාලෝචනය හා අනුමැතිය සඳහා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) වෙත ඉදිරිපත් කෙරෙන අතර, ඒ මත පදනම්ව කළමනාකරණ ක්‍රියාමාර්ග සැලසුම් අවසන් වශයෙන් සකස් කෙරෙනු ඇත.
කළමනාකාරිත්ව තීරණ ගැනීම සඳහා යොදා ගැනීම	ආතති පරීක්ෂා ප්‍රතිඵල පහත සඳහන් කළමනාකරණ මට්ටම් ගැනීම්වලදී භාවිතා කෙරෙනු ඇත: • අවදානම් අභිරුචි සැලසුම්කරණය • ප්‍රාග්ධන සැලසුම්කරණය • ද්‍රවශීලතා කළමනාකරණය

ණය අවදානම් කළමනාකරණය

ණය අවදානම යනු ප්‍රතිපාර්ශ්වයක් එකඟ වී ඇති නියමයන්ට අනුව සිය වගකීම් භාරයන් සපුරාලීමට අසමත් වීමේ විභවතාවයි. මෙය ගෙවීම ප්‍රමාද වීමේ හෝ සම්පූර්ණයෙන්ම නොගෙවීමේ ස්වරූපය ගත හැකි ය. බැංකුවේ ණය දීමේ හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් පැන නගින ණය අවදානම බැංකුවේ මුළු අවදානම් බරතැබූ වත්කම්වලින් 80% ක් පමණ වේ. ප්‍රතිපාර්ශ්වයන්ගේ, ව්‍යාපාරික ක්ෂේත්‍රවල හෝ භූගෝලීය කලාපයන්හි නොගෙවීමේ අවදානම හා සංකේන්ද්‍රණ අවදානම ආවරණය කරමින් ගනුදෙනු සහ කළඹ මට්ටමේදී ණය අවදානම කළමනාකරණය කෙරේ.

බැංකුවට ශ්‍රී ලංකාව මෙන්ම එතෙර ස්ථාන ආවරණය කෙරෙන තනි පුද්ගල, ක්ෂුද්‍ර ව්‍යාපාර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, විශාල වාණිජ ව්‍යාපාර හා රජය යනාදී විවිධාකාරී වූ විශාල ගනුදෙනුකාර පදනමක් ඇත. බැංකුවට එම එක් එක් ගනුදෙනුකාර කණ්ඩායම ඇතුළත පිළිගත හැකි ණය සීමාවන් තුළ ණය අවදානම කළමනාකරණය කර ගැනීමට සිදු වේ. සංජානනය කෙරෙන අවදානම මත පදනම්ව ප්‍රතිලාභය තීරණය කිරීම මඟින් ණය දීමේ තීරණ වෙත අවදානම් සංවේදීතාව ගෙන ඒමේ මූලිකත්වයන් ක්‍රියාත්මකව ඇත.

ණය අවදානම් පාලනතන්ත්‍රය

ණය අවදානම් පාලනතන්ත්‍රය මඟින් අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සිය ව්‍යාපාරය හා ඒ ආශ්‍රිත ණය අවදානම් කළමනාකරණ ගැටළු පාලනය කරන ප්‍රවේශය හා වගකීම නියම කෙරේ. සළුලදායී පාලනතන්ත්‍ර රාමුව මඟින් ණය උත්පාදනය හා පරිපාලනය කළමනාකරණය කරන පිරිස් කෙරෙන් ණය අවදානම් කළමනාකරණ කර්තව්‍යය ස්වායත්ත වීම

සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද සුවිලදායී අවදානම් පාලන රාමුවක් හරහා බැංකුව ප්‍රමාණවත් ලෙස ණය අවදානම් සුපරීක්ෂණය, අධීක්ෂණය හා වාර්තාකරණය සහතික කිරීමට උත්සුක වෙයි.

ණය අවදානම් කළමනාකරණය සඳහා වගකිව යුතු ප්‍රධාන කළමනාකරණ මට්ටමේ කමිටුව වන්නේ බැංකුවේ මහා කළමනාකාරතුමා ප්‍රධානත්වය දරන ණය කමිටුවයි. ණය කමිටුවේ වගකීම් පහත පරිදි වේ:

- ණය අවදානම් අභිරුචිය සැකසීම, සමාලෝචනය හා ක්‍රියාත්මක කිරීම හා තථ්‍ය අවදානම්, අවදානම් අභිරුචිය ඇතුළත පවතින බවට සහතික වීම සහ අවදානම් සංකේන්ද්‍රණය වීම් අධීක්ෂණය කිරීම.
- බැංකුවේ අවදානම් ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ තුළ නියාමන අනුකූලතාවය සහතික වීම.
- කමිටුවට බලය ඇති ණය සීමාව දක්වා ණය අනුමත කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අවශ්‍ය විට උචිත නිර්දේශ ඉදිරිපත් කිරීම.
- කාලාවර්තක ලෙස ණය සීමා අධීක්ෂණය කිරීම.

ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති කේවල ණයගැනුම්කරු මට්ටමෙන් මෙන්ම කළඹ මට්ටමෙන් ණය කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ සපයයි. එය, බැංකුවේ මෙහෙයුම්වල සංකීර්ණත්වය හා ණය කළඹේ හා ගනුදෙනුකරුවන්ගේ විවිධත්වය හමුවේ, නියාමන අවශ්‍යතාවන්ට හා විවක්ෂණශීලි පිළිවෙත්වලට අනුගත වන බවට සහතික කරනු පිණිස අත්‍යවශ්‍ය වේ.

කළමනාකරණයට සම්බන්ධ ප්‍රතිපත්ති, එනම් ණය ශ්‍රේණිකරන ප්‍රතිපත්තිය හා කළඹ කළමනාකරණ ප්‍රතිපත්තිය වෙනස් වන පරිසරයේ සන්දර්භය අනුව සමාලෝචනය කරන ලදී.

ව්‍යාපාරික ඒකක කෙරෙන් ණය අවදානම් කළමනාකරණ කර්තව්‍යය ස්වායත්ත වන බවට සහතික කෙරෙන ආකාරයකින් එය ව්‍යූහගත කර තිබේ.

ණය ඇගැයීම් ප්‍රමිතීන්, ක්‍රියාවලීන් හා මූලධර්ම ආයතනික බණ්ඩයේ හා ශාඛා බැංකු බණ්ඩයේ සංගතව යෙදේ.

හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා අධීක්ෂණය


ණයගැනුම්කරුට කාලීන ආකාරයෙන් සිය වගකීම් භාරයන් සපුරාලීමට ඇති හැකියාව කෙරෙහි අවධානය යොමු කරන මූලික තක්සේරු කිරීම හා ණය ඇගැයීම යන ද්විත්වයෙන් ණය ආරම්භ කිරීමේ ක්‍රියාවලිය සමන්විත වෙයි.

යම් නව ණයගැනීමක්, දීර්ඝ කිරීමක් හෝ තිබෙන ණය පහසුකමෙහි යම් වැදගත් වෙනසක් කිරීමක් සඳහා උචිත බලාධිකාර මට්ටමේ අනුමැතියට යටත්ව කිරීමට අවශ්‍ය කෙරෙන ණය අනුමැතීන් සඳහා බැංකුව නිරවුල් මාර්ගෝපදේශ ස්ථාපිත කර තිබේ.

යම් අවම සීමාවක් අභිබවා යන ණය පහසුකම් සඳහා ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) විසින් ස්වාධීනවම සමාලෝචනය කිරීම සඳහා කාර්යපටිපාටි නියම කර තිබේ. ණය අවදානම නිරවද්‍ය ලෙස මැනීමට සුවිලදායී ණය ශ්‍රේණිකරණ පද්ධතිය සමත් වන අතර එය තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී භාවිතා කළ හැකි ය. ශ්‍රේණිකරණ ආකෘති වනාහි කළඹවල ණය අවදානම් කළමනාකරණය, මැනීම හා අධීක්ෂණය කෙසේ සිදු කෙරේද යන්න පිළිබඳ මූල්‍ය යෙදවුමකි.

මෙම බැංකුව විවිධ කර්මාන්ත හා ගනුදෙනුකරුවන් ආවරණය කරමින් ආයතනික හා මධ්‍ය ව්‍යාපාරික කළඹ මුළුල්ලේ ණය අවදානම් ශ්‍රේණිකරණ ආකෘති පරාසයක්ම භාවිත කරයි. ශාඛා බැංකු නිරාවරණයන් ශාඛා බැංකු ලකුණු පත් හරහා කළමනාකරණය කෙරේ.

ණය පාඩු අඩු කොට ආපසු අයකර ගැනීම් වැඩිකර ගනු පිණිස යාන්ත්‍රණ පිහිටුවා ඇත. විශාල නිරාවරණයන් සම්බන්ධයෙන් අනුමැතියෙන් පසු සමාලෝචනය ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) යටතේ ඇති ණය ගුණාත්මකතා තහවුරු කිරීමේ ඒකකය විසින් කාලාන්තරිකව සිදු කෙරේ. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) අබණ්ඩ පදනමින් ණය කළඹෙහි මනා බව පරීක්ෂා කොට, ණයගැනුම්කරුවකු නොගෙවා සිටීමේ හැකියාව ඇති වුවහොත් කල් ඇතිව අනතුරු ඇඟවීමේ සංඥා නිකුත් කරයි. කාර්යසාධනය නිශ්චය කර ගැනීමට හා කළඹ සංකේන්ද්‍රණයට එරෙහිව ආරක්ෂා කර ගැනීමට, ණය අවදානම් කළමනාකරණ වාර්තා කාලාවර්තිකව සකස් කොට ණය කමිටුව හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) වෙත ඉදිරිපත් කෙරේ.



සුරැකුම් කළමනාකරණය



සුරැකුම් යනු විභව්‍ය නොගෙවීමකට එරෙහිව රැකවරණයක් වශයෙන් ණයගැනුම්කරුවකු වෙනුවෙන් සපයනු ලබන සුරැකුමකි. එය වත්කමක් හෝ තුන්වන පාර්ශ්වයක් විසින් දෙනු ලබන වගකීම් සහතිකයක් වැනි වගකීම්භාරයක ස්වරූපය ගත හැකිය. සුරැකුම් මගින් අවදානම අවම කළ හැකි වුවද, එමඟින් උසස් තත්ත්වයේ ණයදීමේ ප්‍රමිතීන් පවත්වා ගැනීමේ අවශ්‍යතාව බැහැර නොකෙරේ.

බැංකුව නිතිපතා තක්සේරුවට ලක් කෙරෙන නිශ්කාෂණය කළ හැකි හා මැනිය හැකි සුරැකුම් වත්කම් සඳහා නීතිමය වශයෙන් සඵලදායී හා බලාත්මක කළ හැකි ලිපිලේඛන ලබා ගැනීමට උත්සුක වෙයි.

සංකේන්ද්‍රණ අවදානම


ණයගැනුම්කරුවන් සංකේන්ද්‍රණය වීම කර්මාන්තය, නිෂ්පාදනය, භූගෝලීය ප්‍රදේශය, ක්ෂේත්‍රය හා සුරැකුම් ස්වභාවය යන කවර ආකාරයෙන් සිදු වුවද එය කුමන නිර්ණායකයක් අනුව වුවද ඉහළ අවදානමක් ඵල්ල කරයි. බැංකුව සංකේන්ද්‍රණ අවදානම අඩු කරනු පිණිස කළඹ පදනමින් ණය අවදානම මනින අතර, විවිධ මට්ටම්වලදී එනම් තනි පුද්ගල, ණයගැනුම්කාර කණ්ඩායම හා කර්මාන්තය යන මට්ටම්වලදී සීමාවන් නියම කෙරේ. බැංකුවේ පුළුල් ලෙස ව්‍යාප්ත ගනුදෙනුකරුවෝ එහි ණය කළඹ වෙතින් ප්‍රමාණවත් ආදායමක් උත්පාදනය කරන අතරම, සංකේන්ද්‍රණය අවම කිරීමට සහය වෙති. සංකේන්ද්‍රණ අවදානම ප්‍රමාණනය කිරීමට බැංකුව විශ්ලේෂණාත්මක මෙවලම් භාවිත කරන අතර, සැලකිය යුතු සංකේන්ද්‍රණයන් පිළිබඳව ණය කමිටුව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IIRMC) හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කෙරේ.

ණය අවදානම් දර්ශක

අවදානම් සාධකය	අවදානම් දර්ශකය	සටහන්
නොගෙවීමේ අවදානම ණයගැනුම්කරුවකුට හෝ ප්‍රතිපාර්ශ්වයකට සිය ප්‍රතිඥාව ඉටුකිරීමට නොහැකි වීමේ අවදානම	**අක්‍රීය ණය අනුපාතය** 	අභියෝග නොතකා බැංකුවට අක්‍රිය ගිණුම් අනුපාතය පෙර වසරේ අගයේම පවත්වා ගත හැකි විය.
සංකේන්ද්‍රණ අවදානම ණය කළඹවල සංකේන්ද්‍රණ අවදානම පැහැනගිනුයේ පුද්ගලයින්, කර්මාන්ත ක්ෂේත්‍ර හෝ භූගෝලීය ප්‍රදේශ සිසාරා අසම ලෙස ණය බෙදීයාම නිසා ය.	**කර්මාන්ත ක්ෂේත්‍ර අනුව සංකේන්ද්‍රණය - 2017**  A – කෘෂිකර්ම හා ධීවර 4.7% B – බැංකු, මූල්‍ය, රක්ෂණ හා ව්‍යාපාර ක්ෂේත්‍ර 3.5% C – හෝටල්, සංචාරක හා සේවා 2.8% D – නිවාස, ඉදිකිරීම් හා යටිතල පහසුකම් 13.6% E – නිෂ්පාදන 3.7% F – වාණිජ වෙළඳ 10.9% G – ස්වෛරී සහ සෘජු රාජ්‍ය 37.4% H – ප්‍රවාහන හා කාර්ය සම්පාදන සේවා 4.6% I – වෙනත් වාණිජ සේවා 1.6% J – පරිභෝජන හා වෙනත් 17.2%	ක්ෂේත්‍ර නිරාවරණයන් අවදානම් අභිරුචියේ සීමාවන් ඇතුළත පවතී.

අවදානම් ඝාධකය	අවදානම් දර්ශකය	සටහන්


නිෂ්පාදන අනුව සංකේන්ද්‍රණය - 2017



A – වෙළඳ මූල්‍යනය	6.0%	H – නිවාස ණය	4.7%
B – රන් සුරැකුම්	4.0%	I – විදේශ මුදල් ණය	9.1%
C – කල්බදු	4.0%	J – කාලීන ණය	21.0%
D – කාර්ය මණ්ඩල ණය	2.3%	K – පුද්ගල ණය	16.5%
E – යෝජනාක්‍රම යටතේ ණය	2.8%	L – ඔඩපන ණය	0.9%
F – අයිරා පහසුකම්	14.8%	M– මුදල් වෙළඳපල ණය	2.5%
G – ණයපත්	0.3%	N – වෙනත් ණය	11.1%

බැංකුවේ ණය කළඹ නිෂ්පාදිත අතර මනාසේ විවිධාංගීකරණය වී ඇත.

සුරැකුම් අනුව නිරාවරණය - 2017



A – මුදල්	4.1%	F – චංචල දේපල	6.4%
B – සුරැකුම්	1.3%	G – රන් භාණ්ඩ වෙනුවට ඔඩපනය කරන ලද	4.0%
C – ඇපකර	0.2%	H – වෙනත්	3.5%
D – දේපල	13.3%	I – සුරක්ෂිත නොකළ	37.4%
E – රජයේ සුරැකුම්පත්/ ඇපකර	29.8%		

ණය නිරාවරණයෙන් 62% ක් සුරැකුම් මඟින් සුරක්ෂිත ය.

වෙළඳපොල අවදානම

වෙළඳපොල අවදානම යන්න අපගේ වෙළඳපොල තත්ත්වයන් හෝ වගකීම්භාරයන්වල වෙළඳපොල වටිනාකම වෙනස් වීම් ලෙස නිර්වචනය කෙරේ. මෙයට හේතු පොළී අනුපාතිකවල, විනිමය අනුපාතිකවල, භාණ්ඩ මිලගණන්වල හෝ කොටස් මිලගණන්වල උච්ඡාවචනයන් විය හැකිය. වෙළඳපොල අවදානම කළමනාකරණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ බැංකුව අපේක්ෂිත අලාභයන්ට නිරාවරණය නොකර අවදානම්-ප්‍රතිලාභ සම්බන්ධය ප්‍රශස්ත කිරීමයි.

වෙළඳපොල අවදානම පාලනය

වෙළඳපොල අවදානම පාලනයෙහි කේන්ද්‍රීකය යාවත්කාලීන කරන ලද "වෙළඳපොල අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය" තුළ දක්වා ඇත. මෙම ප්‍රතිපත්තිය බාසල් නියමයන් හා ශ්‍රී ලංකා මහ බැංකු රෙගුලාසිවලට අනුකූල වන අතර වත්කම් හා බැරකම් කළමනාකරණය, විදේශ විනිමය අවදානම, ද්‍රවශීලතා අවදානම, සීමා කළමනාකරණ රාමුව හා මැදි කාර්යාල මෙහෙයුම් කාර්ය සංග්‍රහය ආවරණය කරන වෙනත් නීතිපතා යාවත්කාලීන කෙරෙන ප්‍රතිපත්ති සමඟ කියැවිය යුතු වේ.

මෙම ප්‍රතිපත්ති පහත දේ සම්බන්ධයෙන් මාර්ගෝපදේශනය ලබා දෙයි:

- වෙළඳපොල අවදානම කළමනාකරණය සඳහා දෘඪතර ව්‍යුහයක් ස්ථාපිත කොට පවත්වා ගෙන යාම.
- භාණ්ඩාගාර මෙහෙයුම් කාර්යක්ෂම ලෙස හා සඵලදායී ලෙස නිරීක්ෂණය කිරීම.
- භාණ්ඩාගාර මෙහෙයුම් සඳහා උචිත අවදානම් සීමා කිරීමේ අවම පිවිසුම් මට්ටම් ස්ථාපිත කිරීම.
- මෙහෙයුම් පරිසරය තුළ වෙනස්කම් වෙතින් පැමිණිය හැකි බලපෑම් කලින් දැකීම හා කළමනාකරණය කර ගැනීම.

පැන නැගිය හැකි වෙළඳ මෙන්ම වෙළඳ නොවන ස්වභාවයේ විවිධ වෙළඳපොල අවදානම් ගණනාවක් තිබේ.

- විදේශ මුදල් හා සුරැකුම්පත්වල මිල උච්චාවචනයන් හේතුවෙන් වෙළඳ අවදානම් පැන නැගිය හැකි ය.
- ප්‍රතිපාර්ශ්වයන් සිය ප්‍රතිඥාවන් පැහැර හැරීමෙන් වෙළඳ පැහැර හැරීම් අවදානම පැන නගී.
- බැංකුවේ පොත්වල හා ශේෂපත්‍රයෙන් බැහැර අයිතමවල වෙළඳපොල සංචලනයන් වෙතින් වෙළඳ නොවන වෙළඳපොල අවදානම පැනනැගිය හැකි ය.

වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව (ALCO) වෙළඳපොල අවදානම කළමනාකරණය කිරීමෙහිලා මුඛ්‍ය කාර්යභාරයක් ඉටු කරන අතර එය මහා කළමනාකාරතුමාගේ සභාපතිත්වයෙන් හා ප්‍රධාන ආයතනික කළමනාකරණ සාමාජිකයින් ගෙන් සමන්විත වෙයි. මෙම කමිටුව අත්තිකාරම්, තැන්පතු හා ආයෝජන කළඹ අධීක්ෂණයේ යෙදෙමින්,

නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමෙන් වෙළඳපොල අවදානම් කළමනාකරණය කරයි. මෙම කමිටුවේ වැදගත් කර්තව්‍යයන් වන්නේ පොළී අනුපාතික හා ද්‍රවශීලතා තත්ත්වය කළමනාකරණය කිරීම සහ වත්කම් හා බැරකම් නොගැලපීම් සමබර කිරීමයි.



වෙළඳපොල අවදානම අධීක්ෂණය කිරීමෙහිලා මුඛ්‍ය කාර්යභාරයක් ඉෂ්ට කරන මධ්‍යම කාර්යාලය වෙත සීමා කළමනාකරණ රාමුව තුළ දක්වා ඇති විස්තීර්ණ රාමුවක සහ මධ්‍යම කාර්යාල මෙහෙයුම් කාර්ය සංග්‍රහයේ මාර්ගෝපදේශකත්වය ලැබේ.


හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා අධීක්ෂණය

අභ්‍යන්තර මෙන්ම නියාමන අවශ්‍යතා පිළිපැදීම සම්බන්ධයෙන් වෙළඳපොල අවදානම මැනීම සඳහා මිනුම් කිහිපයක් සංවර්ධනය කර තිබේ. අවදානමේදී වටිනාකම (VaR), පාදක ලක්ෂ්‍යය සඳහා මිල වටිනාකම (PVPB), කාලපරිච්ඡේදය, ආතති පරීක්ෂාව, අන්තර විශ්ලේෂණය (GAP analysis) හා සංවේදීතා විශ්ලේෂණය වනාහි සමස්ත කළඹ මට්ටමෙන් වෙළඳපල අවදානම කළමනාකරණය කිරීම සඳහා විධාත්ම බහුල ලෙස භාවිතා කෙරෙන උපකරණයන් වේ. අවදානමේදී වටිනාකම (VaR) වනාහි 99% ක විශ්වාසනීයත්වයක් ඇතුළත ගණනය කෙරෙන වෙළඳපොල උච්චාවචන විභවතාව පිළිබඳ ප්‍රමාණාත්මක මිනුමකි. වර්තමානයේදී බැංකුව අවදානම් වටිනාකම (VaR) ගණනය සඳහා ඓතිහාසික ක්‍රමයක් භාවිත කරන අතර, එම ගණනය එක් එක් කළඹ සඳහා වෙන් වෙන්ව සිදුකරනු ලැබේ. පාදක ලක්ෂ්‍යය සඳහා මිල වටිනාකම (PVPB) ආදායමෙහි එක් පාදක ලකුණක් සඳහා වූ සුරැකුමක මිල උච්චාවචනය මනියි. වෙළඳපොල අවදානම සඳහා වූ ආතති පරීක්ෂාව දෛනික පදනමින් සිදු කෙරේ.

වෙළඳපොල අවදානම් ඒකකය දෛනික පදනමින් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සීමාවන් අධීක්ෂණය කරන අතර සීමා අතික්‍රමණයන් වත්කම් හා බැරකම් කළමනාකරණ කමිටුව (ALCO), ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කාලාවර්තය ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

වෙළඳපොල අවදානම් දර්ශකය

සාධකය	විස්තරය	සටහන්
විදේශ විනිමය අවදානම	**විදේශ විනිමය විවෘත තත්ත්වය** ඇ.ඩො. මිලියන  	බැංකුවෙහි විදේශ විනිමය පිළිබඳ විවෘත තත්ත්වය වර්ෂය මුළුල්ලේම අවදානම් අභිරුචියේ සීමාව තුළ පැවතුණි.
පොළී අනුපාතික අවදානම	**කාලපරිච්ඡේදය** වසර  	කළඹවල කාලපරිච්ඡේදයන් නිතිපතා අධීක්ෂණය කරනු ලබන්නේ පොළී අනුපාතික වෙනස්කම්වලට මිලගණන් දක්වන සංවේදීතාව තක්සේරු කරනු පිණිස ය.

සාධකය	විස්තරය	සටහන්
ස්කන්ධ මිල අවදානම	**ස්කන්ධවල අවදානමේදී වටිනාකම (VaR)**  	බැංකුවෙහි ස්කන්ධවල අවදානම් වටිනාකම (VaR) පිළිබඳ තත්ත්වය වර්ෂය මුළුල්ලේම අවදානම් අභිරුචියේ සීමාව තුළම පැවතුණි.

ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය

ද්‍රවශීලතා අවදානම වනාහි ගෙවීම් වගකීම්හාරයන්වල කාලය එළඹී විට ඒවා සපුරාලීමට නොහැකි වීම හෝ අධික පිරිවැයක් දරමින් පමණක් එසේ කිරීමට හැකි වීම විභවයක් පැවතීම හේතුවෙන් පැන නගින අවදානමයි. ද්‍රවශීලතා අවදානම නිතරම පැන නගිනුයේ අයවිය යුතු දේ හා ගෙවිය යුතු දේ එකිනෙකට වෙනස් කාලරාමුවල පැවතීම මගිනි. බැංකුවට සිය ගෙවීම් වගකීම්හාරයන් නියමිත කාලයට සපුරාලීමට හා එය නිර්වචනය කළ අවදානම් අභිරුචිය ඇතුළත කිරීමට හැකි වන බවට වගබලාගනු පිණිස ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුවක් ස්ථාපිත කර ඇත. බැංකුවේ ද්‍රවශීලතා තත්ත්වය කළමනාකරණය කිරීම වත්කම් හා බැරකම් කමිටුව (ALCO) වෙත පැවරී ඇත. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD), වත්කම් හා බැරකම් කමිටුව (ALCO) හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) විසින් කරනු ලබන නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවෙහි ද්‍රවශීලතා උපායමාර්ගය හා අවදානම් අභිරුචිය අනුමත කරයි.




බැංකුවේ ද්‍රවශීලතා කළමනාකරණ උපායමාර්ග එහි ද්‍රවශීලතා කළමනාකරණ ප්‍රතිපත්තිය තුළ සහ වත්කම් හා බැරකම් කළමනාකරණ ප්‍රතිපත්තිය තුළ ප්‍රකාශයට පත් කර ඇත. මෙම ප්‍රතිපත්ති මගින් ද්‍රවශීලතාව කළමනාකරණය කළ හැකි උපායමාර්ග මාලාවක් විස්තර කෙරේ. සැලකිය යුතු වත්කම් ප්‍රතිශතයක් ද්‍රවශීල ස්වරූපයෙන් පවත්වා ගැනීම, මුදල් වෙළඳපොල වෙතින් ණයට ගැනීමේ හැකියාව ඇති කර ගැනීම මෙන්ම ද්‍රවශීලතාව වැඩිදියුණු කිරීමේ වෙනත් උපායමාර්ග ද මේ තුළ ඇතුළත් ය.


හඳුනාගැනීම, තක්සේරු කිරීම හා නිරීක්ෂණය

ද්‍රවශීලතා අවදානම හඳුනා ගැනීමේ ප්‍රාථමික මෙවලම වන්නේ වත්කම් හා බැරකම් ප්‍රකාශයේ පරිණති පරතරයයි. මෙය සාමාන්‍ය මෙන්ම අහිතකර වාතාවරණයන්හිදී අයවිය යුතු දේ හා ගෙවිය යුතු දේ අතර කාල පරතරය විශ්ලේෂණය කරයි.

බැංකුව විවිධ වෙළඳපල බණ්ඩ හරහා මෙන්ම දේශීය හා විදේශීය මාර්ග ඔස්සේ විවිධාංගීකෘත අරමුදල්කරණ පදනමක් ගොඩනැගීම මගින් ද්‍රවශීලතා අවදානම අවම කිරීමට යත්න දරයි. ඒ සමානවම, තැන්පතු පදනම ද පුද්ගලයන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්, සමාගම් හා රාජ්‍ය හරහා විවිධාංගීකරණය කර ඇත. බැංකුවට අධික ණය වර්ධනය, අනපේක්ෂිත පැවරුම්, විශාල ණය නිරාවරණයන් පැහැරහැරීම සහ අනපේක්ෂිත තැන්පතු ආපසු ගැනීම් වැනි අර්බුදකාරී වාතාවරණයන් සමනය කර ගත හැකි විය යුතු ය. එබඳු වාතාවරණයන් හසුරුවා ගනු පිණිස හදිසි අවස්ථා සැලසුම් සකස් කර තිබේ. එබඳු සිදුවීම්වල බලපෑමේ තීව්‍රතාව මනිනු පිණිස හා හානි අවම කිරීමේ උපායමාර්ග සංවර්ධනය කරනු පිණිස ආතති පරීක්ෂාව භාවිත කෙරේ.

ද්‍රවශීලතා අවදානම් දර්ශකය

අවදානම් සාධකය	අවදානම් දර්ශක	සටහන්
ද්‍රවශීලතා අවදානම	**අරමුදල්කරණය සඳහා පවතින වෙනත් බැඳීම් වලට යටත් නොවූ සුරැකුම්** 	යහපත් ද්‍රවශීලතා තත්ත්වයක් පෙන්නුම් කරමින් අරමුදල්කරණය සඳහා පවතින වෙනත් බැඳීම් වලට යටත් නොවූ සුරැකුම් 2017 වර්ෂය තුළ ඉහළ ගොස් තිබේ.
	වත්කම් හා බැරකම් පරිණත විශ්ලේෂණය 	සමුච්චිත ධනාත්මක පරතරය බැංකුව විසින් මාස තුනක් දක්වා පවත්වා ගනු ලැබේ.
	ද්‍රවශීල වත්කම් අනුපාතය 	බැංකුවෙහි ද්‍රවශීල වත්කම් අනුපාතය වර්ෂය මුළුල්ලේම අවදානම් අභිරුචියේ සීමාව තුළම පැවතුණි.

අවදානම් සාධකය	අවදානම් දර්ශක	සටහන්
		බැංකුවෙහි ද්‍රවශීලතා ආවරණ අනුපාතය වර්ෂය මුළුල්ලේම අවදානම් අභිරුචියේ සීමාව තුළම පැවතුණි.

මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවූ හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පුද්ගලයන් හා පද්ධති වෙතින් හෝ බාහිර සිදුවීම් හේතුවෙන් ඇති වන අලාභයන්හි අවදානමයි. මෙහෙයුම් අවදානමට නෛතික අවදානම ඇතුළත් වන නමුදු උපායමාර්ගික හා කීර්තිනාම අවදානම ඇතුළත් නොවේ. බැංකුවේ ව්‍යාපාරික සහ උපකාරක ඒකක යන දෙකින්ම හට ගන්නා මෙහෙයුම් අවදානම මනා ලෙස සැකසුණු අභ්‍යන්තර පාලන පද්ධතියක් හරහා නියමිත අවදානම් අභිරුචිය ඇතුළත කළමනාකරණය කෙරේ. බැංකුව සිය මෙහෙයුම් අවදානම් කළමනාකරණය ත්‍රිත්ව ආරක්ෂක පථ ආකෘතිය සමග පෙලගස්වා ඇත. දෙවන පථයේදී, ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුව හා සමස්ත අවදානම් අභිරුචිය නියම කිරීම සඳහා සහ සාර්ව මට්ටමේ පාලන ව්‍යුහයක් සැකසීම සඳහා වගකීම දරයි. බැංකුවේ සියලුම ව්‍යාපාරික හා උපකාරක ඒකක එම පාලන ව්‍යුහයට අනුකූල වීම අපේක්ෂා කෙරෙනුයේ අවදානමට ප්‍රාථමික වශයෙන් මුහුණ දීම හා කළමනාකරණය කිරීම කරනු ලබනුයේ පළමු පෙළ වන බැවිනි. තුන්වන ආරක්ෂක පථය වශයෙන් විගණනය හා අනුකූලතාව සිය කාර්යභාරය ඉටු කරනුයේ ස්ථාපිත ව්‍යුහයන්හි හා පාලනවිධි වල සඵලදායිත්වය සත්‍යාපනය කිරීම මගිනි.

මෙහෙයුම් අවදානම් පාලනය

මෙහෙයුම් අවදානම පාලනය සඳහා වූ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත පවතී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය, වංචා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මගින් බැංකුවේ සමස්ත මෙහෙයුම් අවදානම් කළමනාකරණ පාලනය නිර්වචනය කෙරේ. ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) ප්‍රධානත්වය දරන මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC) හා වංචා අවදානම් කළමනාකරණ කමිටුව විසින් ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශයේ (IIRMD) සහයෝගය ඇතිව මෙහෙයුම් අවදානම හඳුනා ගැනීම, මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සැකසීම, ප්‍රතිඵල ඇගැයීම හා අවශ්‍ය විට සංශෝධන නිර්දේශ කිරීම සඳහා වගකීම දරති. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) ව්‍යාපාරික අඛණ්ඩතා සැලැස්ම (BCP) ක්‍රියාත්මක කිරීම සුපරීක්ෂණය කරනු ලබන අතර, ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) ව්‍යාපාරික අඛන්ධතා සම්බන්ධීකරණ කමිටුවේ (BCCC) සම-සභාපතිවරයා වෙයි. බැංකුවේ සමස්ත තොරතුරු සුරක්ෂිතතාව පිළිබඳ වගකීම දරනු ලබන්නේ ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) ද සාමාජිකයකු වන ආයතනික තොරතුරු ආරක්ෂක කමිටුව විසිනි. සියලුම නව නිමැයුම් මූලාරම්භයන් අවදානම් දෘෂ්ටිකෝණයකින් ද ඇගැයීමට ලක් කෙරේ. සියලුම නව නිමැයුම් මූලාරම්භ කමිටු තුළ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) නියෝජනය කිරීම හරහා එය සිදු කෙරේ.


හඳුනා ගැනීම, තක්සේරුව හා නිරීක්ෂණය

මෙහෙයුම් අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා නිරීක්ෂණය කිරීම සඳහා හොඳින් අත්හදා බලන ලද ශිල්පීය ක්‍රම භාවිත කෙරේ. මේවාට මූලික අවදානම් දර්ශක (KRIs), අවදානම් හා පාලන ස්වයං ඇගයීම (RCSA), අභ්‍යන්තර හානි වූ දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය, මූල හේතු විශ්ලේෂණය සහ උගත් පාඩම් අභ්‍යාස ඇතුළත් ය. ප්‍රධාන බාහිර සිදුවීම්වලින් බැංකුවට එල්ල විය හැකි අවදානම් කවරේද යන්න හා අවශ්‍ය හානි අවම කිරීමේ ක්‍රියාමාර්ග කවරේද යන්න නිශ්චය කර ගනු පිණිස එබඳු සිදුවීම්වලින් වියහැකි බලපෑම් සුපරීක්ෂාකාරී ලෙස විශ්ලේෂණය කෙරේ. මූලික අවදානම් දර්ශක (KRI) වනාහි මූලික තීරණ ගන්නන් හට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවදානම් කල් ඇතිව හඳුනා ගන්නා පූර්ව ක්‍රියාකාරී මෙවලම් ය. අවදානම් හා පාලන ස්වයං ඇගයීම් (RCSA) යනු වියහැකි අවදානම් හා ඒ ආශ්‍රිත පාලනවිධි හඳුනා ගැනීමේ, වාර්තා කිරීමේ හා තක්සේරු කිරීමේ ක්‍රියාවලියයි. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) අවදානම් තක්සේරු කරනු පිණිස තීරණාත්මක ව්‍යාපාරික හා උපකාරක ඒකක පිළිබඳව කලින් කලට අවදානම් හා පාලන ස්වයං ඇගයීම් (RCSA) සිදුකරයි.

හානි වූ දත්ත රැස්කිරීම හා විශ්ලේෂණය මගින් සියලු ව්‍යාපාරික හා උපකාරක ඒකකවල යෙදවුම් සමගින් අඛණ්ඩ පදනමින් තථ්‍ය අලාභයන් පිළිබඳ දත්ත රැස් කරනු ලබයි. මෙම ක්‍රියාවලිය මගින් ඉදිරිපත් කරනු ලබන වාර්තා අනතුරුව සමාලෝචනය කොට ඇගැයීමට ලක් කෙරේ. හඳුනා ගන්නා අඩුපාඩුවක් වේ නම් ඒ පිළිබඳව ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) විසින් මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC), ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) හා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලබන අතර ඒ මගින් අවශ්‍ය කවර හෝ ක්‍රියාමාර්ග පිළිබඳව තීරණ ගනු ලැබේ.

ක්‍රියාකාරී උගත් පාඩම් ක්‍රියාවලියක් හරහා, ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) අභ්‍යන්තර පාලනවිධි ශක්තිමත් කරනු පිණිස බාහිර පරිසරය වෙතින් එන ආසන්න වැරදීම් හා තර්ජන පිළිබඳව ශාඛා ජාලය ඇතුළු අදාළ ව්‍යාපාරික හා උපකාරක ඒකක වෙත කඩිනමින් අනතුරු ඇඟවීම් යැවීමට මූලිකත්වය ගෙන ඇත.

බාසල් අවදානම් සිදුවීම් අනුව අලාභ බෙදීයාම



පාලන විධි හා හානි අවම කිරීම

රාජකාරී වෙනුකර දක්වන ශක්තිමත් අභ්‍යන්තර පාලනවිධි රාමුවක්, සුමට කරන ලද වාර්තාකරණ නාලිකා හා පැහැදිලිව නිර්වචනය කරන ලද ව්‍යාපාරික අඛණ්ඩතා කළමනාකරණය යන මේවා මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවක කැපී පෙනෙන ලක්ෂණ වේ. පාලනය කළ නොහැකි ඉහළ උග්‍රතා අවදානම්වල හානි අවම කිරීම පිණිස අවදානම් පැවරුම් උපායමාර්ගයක් ලෙස රක්ෂණ උපකරණ භාවිත කෙරේ. එබඳු හඳුනාගත් අවදානම් ප්‍රමාණවත් ලෙස ආවරණය කරනු පිණිස බැංකුව සිය රක්ෂණය වාර්ෂිකව සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදු කරයි.

සියලුම තීරණාත්මක ව්‍යාපාරික හා උපකාරක ඒකක තමාගේම ව්‍යාපාරික අඛණ්ඩතා සැලසුම් (BCP) සකස් කර ගෙන ඇති බවට සහතික කළ යුතු බව ව්‍යාපාරික අඛණ්ඩතා කළමනාකරණ ප්‍රතිපත්තිය (BCMP) දක්වයි. වර්ෂය තුළ පරීක්ෂණ අභ්‍යාස දෙකක් සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලදුව එහි ප්‍රතිඵල අදාළ බලධාරීන් වෙත වාර්තා කරන ලදී. විය හැකි කවර හෝ ව්‍යසනයන්ට බැංකුව ප්‍රතිරෝධී බවට පත්කිරීම සඳහා, මෙහෙයුම්වල අඛණ්ඩතාව සඳහා පහසුකම් සලස්වනු පිණිස කොළඹ නාගරික සීමාවෙන් පිටත, සියලු පහසුකම් වලින් යුත් ආපදා ප්‍රතිසාධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ඇත.

ඉහළ ගොස් ඇති ගනුදෙනුකාර ඉල්ලීම් හා සංකීර්ණ ව්‍යාපාරික ආකෘතිය හේතුවෙන් අද බැංකු ක්ෂේත්‍රය සැලකිය යුතු නෛතික අවදානම්වලට මුහුණ පායි. මෙම අවදානම් සංරචකය ආමන්ත්‍රණය කරනු පිණිස, ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) නීති අංශයෙන් විමසා නෛතික අවදානම තක්සේරු කර එය බැංකුවේ වාර්ෂික අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණිකත්ව ඇගයීමේ ක්‍රියාවලිය (ICAAP) වෙත අන්තර්ග්‍රහණය කරනු ලබයි.

උපායමාර්ගික අවදානම

උපායමාර්ගික අවදානම බැංකුවෙහි උපායමාර්ග සැකසීමේ හා තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි දෝෂයන් වෙතින් පැන නැගිය හැකි ය. සීඝ්‍රයෙන් වෙනස් වන පරිසරයක් තුළ, තවත් විෂයයන් රැසක් අතරේ නිමැවුම්, සේවා, සම්පත් ප්‍රතිපාදනය හා සන්නිවේදන නාලිකා පිළිබඳ වේගවත් තීරණ ගැනීමට සිදු වේ. එබඳු අවශ්‍යතාවන්ට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමට නොහැකි වුවහොත් බැංකුවේ ලාභදායීත්වය හා ද්‍රවශීලතාව වෙත තර්ජන එල්ල වීමේ හැකියාව පවතී. බැංකුවෙහි උපායමාර්ගික දිශානතිය එහි ආයතනික සැලැස්ම තුළ දක්වා ඇති අතර තථ්‍ය කාර්යසාධනය එම සැලැස්ම සමග ගැලපීම සිදු වන්නේද යන්න තහවුරු කර ගැනීමේ ක්‍රියාවලියක්ද ස්ථාපිතව පවතී. බැංකුව සිය උපායමාර්ගික අවදානම තක්සේරු කරනු පිණිස සිය අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණිකත්ව ඇගයීමේ ක්‍රියාවලිය (ICAAP) තුළ ලකුණු පත්‍රිකා පාදක ප්‍රවේශයක් භාවිත කරයි.

කීර්තිනාම අවදානම

ලංකා බැංකුවේ 78 වසරක ඉතිහාසය තුළ එහි කීර්තිනාමය නිකැළැල්ව තිබී ඇති අතර එමගින් සියලු කොටස්කරුවන් අතර ඉහළ පිළිගැනීමක් හා විශ්වාසයක් ඇති වී තිබේ. සිය පුරෝගාමී විලාසය, මූල්‍ය ස්ථාවරත්වය හා උචිත අනුකූලතාවය හේතුවෙන් සියලු පාර්ශ්වකරුවන්ගේ සිත් තුළ ප්‍රථමයෙන් සිහියට නැඟෙන නාමය බවට පත්වීමට ලංකා බැංකුව සමත්ව ඇත. වසරින් වසර බැංකුව ලබා ගන්නා අති විශේෂ සම්මාන වසර ගණනාවක් මුළුල්ලේ බැංකුව ගොඩනගා ඇති අඛණ්ඩ හා සවිමත් කීර්තිය පිළිබඳව මැනවින් සාක්ෂි දරයි. කෙසේ වුවද, දේශීය මෙන්ම ගෝලීය අභියෝගාත්මක හා ගතික වාතාවරණය තුළ එම කීර්තිය කවර හෝ අවස්ථාවක අවදානමට ලක් විය හැකිය යන අවබෝධය ඇත.

එම නිසා අපගේ කීර්තිනාමයට හානි පමුණුවිය හැකි අවදානම් සාධක හඳුනා ගැනීම හා ඒවා පිළිබඳව විමසිලිමත්ව සිටීම සහ අපගේ අවදානම් කළමනාකරණ හැකියාවන් පවත්වා ගැනීම හා වර්ධනය කිරීම අප බැංකුවෙහි මූල්‍ය හා උපායමාර්ගික අරමුණු අනුමත අවදානම් අභිරුචි මට්ටම් ඇතුළත සාක්ෂාත් කර ගන්නා බවට තහවුරු කිරීම සඳහා අතිශයින් වැදගත් බව අපි හඳුනා ගෙන සිටිමු. කීර්තිනාම අවදානම කළමනාකරණය කිරීම සමස්ථ සංවිධානයම සතු ප්‍රයත්නයකි. එම නිසා බැංකුව මුළුල්ලේම අවදානම් කළමනාකරණය තුළ යහපත් ආයතනික පරිපාලන සංස්කෘතියක් හා හොඳ පරිචයන් ප්‍රවර්ධනය කිරීමට බැංකුව ඇපකැප වී සිටී.

අනුකූලතා අවදානම

අනුකූලතා අවදානම වනාහි නීති රීති, රෙගුලාසි, මාර්ගෝපදේශ හෝ නියාමන බලධාරීන් විසින් පනවනු ලබන චර්යා රීති නොපිළිපැදීම මගින් ඇති විය හැකි ප්‍රතිවිපාකයි. මෙය බැංකු කර්මාන්තයෙහි ස්වයං-නියාමන ප්‍රමිති හෝ පරිචයන් දක්වාද ව්‍යාප්ත විය හැකි ය.

අනුකූලතා නීති රීති හා රෙගුලාසි මගින් වෙළඳපොල හැසිරීම, අරමුණු අතර ගැටුම්, ගනුදෙනුකරුවන්ට සමාන හා සර්ව සාධාරණ ලෙස සැලකීම සහ ගනුදෙනුකාර සබඳතා වැනි කාරණා ආවරණය කෙරේ. එමෙන්ම, ඒ තුළ මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්ත මූල්‍ය සම්පාදනය වැනි අක්‍රමිකතාවන්ට එරෙහි ආරක්ෂක විධිවිධානයන්ද ඇතුළත් ය.

අනුකූලතා අවශ්‍යතා ආවරණය කරනු පිණිස බැංකුවෙහි පරිපාලන ව්‍යුහයක් සහ පද්ධති හා කාර්යපටිපාටි ස්ථාපිතව ඇත. මෙම අනුකූලතා රාමු අවදානම හඳුනා ගැනීම, තක්සේරු කිරීම හා අවම කිරීමත්, පාලනවිධි හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීමත්, කවර හෝ අපගමනය වීමක් සංඥා වුවහොත් අනුකූල නොවීමේ අවස්ථා වලක්වනු පිණිස කාලෝචිත ප්‍රතිකර්ම යෙදීමත් සිදුකරයි. අනුකූලතාව සඳහා සහ මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්ත මූල්‍ය සම්පාදනය

මැඩලීම සඳහා පරිපූර්ණ අනුකූලතා ප්‍රතිපත්ති ස්ථාපිතව ඇත. උපායමාර්ගික සැලසුම් සැකසීමේදී අනුකූලතා අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කෙරේ. අප අනුකූලතා නියමයන් පිළිපැදීමෙහිලා ඌණතාවක් දක්වා නොමැතිය යන කාරණය අපගේ කීර්තිය ඔප් නංවන අතර පාර්ශ්වකාර විශ්වාසය තවත් වර්ධනය කරයි.

බැංකුවේ කාර්යයන් සුළුලදායී ලෙස ඉෂ්ට කරනු පිණිස එහි අනුකූලතා කාර්යභාරය ප්‍රමාණවත් අධිකාරිබලය, ස්වාධීනත්වය හා සම්පත් වලින් පෝෂණය වී ඇත. බාසල් III වැනි වෙනස් වන ගෝලීය රෙගුලාසි මගින් අනුකූලතා කාර්යය මත අනියෝග වැඩි කර ඇති නමුදු, බැංකුව මෙම අතිරේක වගකීම් හැසිරවීමෙහි සමත් බව සනාථ කර ඇත.

අනුකූලතා කාර්යයේ එක් කාර්යභාරයක් වන්නේ බැංකුවට අදාළ වන නීති, රීති හා රෙගුලාසි, කවර හෝ වෙනස්කම්වල බලපෑම, අභ්‍යන්තර පද්ධති හා කාර්යපටිපාටි හරහා එම වෙනස්කම් ක්‍රියාත්මක කළ යුතු ආකාරය සහ අනුකූලතාව සහතික කරනු පිණිස අවශ්‍ය වන නිරීක්ෂණය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය දැනුවත් කිරීමයි. එමෙන්ම අනුකූලතා ඒකකය අනුකූලතා අවශ්‍යතාවන් පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ හා මෙම විෂයය සම්බන්ධයෙන් යම් විමසුමක් තිබේ නම් ඒවා හැසිරවීමේ කාර්යභාරයද ඉටුකරයි.

අනුකූලතා ඒකකයේ කාර්යයන්ට කවර හෝ යෝජිත නව නිපැයුම් හා සේවා, නව ව්‍යාපාරික පිළිවෙත්, නව ව්‍යාපාරික හා ගනුදෙනුකාර සබඳතා පිළිබඳව අනුකූලතා දෘෂ්ටි කෝණයකින් තක්සේරු කිරීමද ඇතුළත් ය.

ස්වයංකෘත "මූල්‍ය අපරාධ අනාවරණ පද්ධතිය" (AMLOCK) මගින් ඔබේ ගනුදෙනුකරු හඳුනාගැනීම (KYC) සහ සැක කටයුතු ගනුදෙනු හඳුනා ගැනීම සඳහා පහසුකම් සලස්වයි. තවද, බාහිර ප්‍රේෂණ තථ්‍ය කාලයේ දී පිරික්සීමට SWIFT වෙතින් බැංකුව එහිම කොටසක් ඇති පද්ධතියක් ස්ථාපනය කරනු ලැබ ඇත.

බැංකුවේ මුදල් විශුද්ධිකරණ විරෝධී (AML) හා ත්‍රස්තවාදී මූල්‍ය සම්පාදන මැඩලීමේ (CTF) ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයේ අවදානම් පාදක ප්‍රවේශය (RBA) සමග දිශාගත කිරීමේ අවශ්‍යතාවක් ද දැනී තිබේ. මෙම අවශ්‍යතාව ආමන්ත්‍රණය කරනු පිණිස මෙම වර්ෂය තුළ දී තථ්‍යකාල මුදල් විශුද්ධිකරණ විරෝධී හා ත්‍රස්තවාදී මූල්‍ය සම්පාදන මැඩලීමේ පද්ධතියක් (AML/CTF) ප්‍රසම්පාදනය කර ඇත.

එමෙන්ම බැංකුව ගෝලීය අතරමැදි අනන්‍යතා අංකය (GIIN) යටතේ විදේශ ගිණුම් බදු අනුකූලතා පනත (FATCA) යටතේ සහභාගිත්ව විදේශ මූල්‍ය ආයතනයක් (PFFI) ද වෙයි.

අනුකූලතා අංශය - සංවිධාන ව්‍යුහය

නියාමන අනුකූලතා ඒකකය හා මුදල් විශුද්ධිකරණය විරෝධී/ත්‍රස්තවාදී මූල්‍ය සම්පාදන මැඩලීමේ ඒකකය යන අංශ දෙකකින් සමන්විත අනුකූලතා අංශය විසින් බැංකුවේ අනුකූලතා කර්තව්‍යය හසුරුවනු ලැබේ. "අනුකූලතා ප්‍රධානී" යනුවෙන් හැඳින්වෙන ජ්‍යේෂ්ඨ විධායක කළමනාකරණ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු මෙම අංශයේ ප්‍රධානත්වය දරයි. අනුකූලතා ප්‍රධානී අනුකූලතා අවශ්‍යතාවන්හි වෙනස්කම්, කාර්යසාධන දර්ශක, හඳුනාගත් කිසියම් කඩකිරීම් හෝ ඒවායේ අනතුරු ඇඟවීමේ සංඥා, පද්ධතිවල හා කාර්යපටිපාටිවල ඌණතා සහ ඒවාට පිළියම් යෙදීම සඳහා අවශ්‍ය සංශෝධන ක්‍රියාමාර්ග පිළිබඳව සෘජුවම අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) වෙත වාර්තා කරයි.


බාසල් III

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය පිළිබඳ බාසල් III නියමයන් 2017 ජූලි 1 වැනි දින සිට ක්‍රියාත්මක විය. ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ නව විධානයන් මහ බැංකුව විසින් නිකුත් කරන ලද අතරම, බැංකු ක්‍රියාශීලි ලෙස 2016 වර්ෂයේ පටන්ම මෙම නව නියමයන්ට සූදානම් විය. මෙම නව අවශ්‍යතාවන් අනුව සමානුපාත වනු පිණිස බැංකුව අභ්‍යන්තර ප්‍රාග්ධන සප්‍රමාණිකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP) සුමට කර තිබේ. නියාමන අවශ්‍යතා වර්ෂ තුනක කාලයක් සඳහා අදියරගත කර ඇති අතර බැංකුව ප්‍රාග්ධන අවශ්‍යතාවන්ට උරදෙනු පිණිස හා ස්වාරක්ෂක ප්‍රවර්ධනය කරන අතරම සියලු අවදානම් ප්‍රමාණවත් ලෙස ආවරණය කරනු පිණිස ප්‍රාග්ධන ස්ථායීකරණ සැලැස්මක් සංවර්ධනය කර ඇත. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා නිරීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කරනු පිණිස ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) විසින් ප්‍රමාණාත්මක බලපෑම් අධ්‍යයනයන් හා ආතති පරීක්ෂාවන් සිදු කරනු ලැබේ.

මෙම වෙනස මගින් මුල් අභ්‍යන්තර අවදානම් කළමනාකරණ පද්ධතියට විශාල වෙනසකට අනුවර්තනය වීමට ඇති සුනම්‍යතාව හා ඔරොන්තු දීමේ හැකියාව මැනවින් ප්‍රදර්ශනය විය.







ප්‍රතිලාභ ජනිත කිරීමේ අපගේ ක්‍රියාවලිය

94 — **වැදගත් මූල්‍ය සංඛ්‍යාත**
මූල්‍ය ප්‍රාග්ධනය

100 — **භෞතික යටිතල පහසුකම් සහ ඉන් ඔබ්බට**
නිෂ්පාදන ප්‍රාග්ධනය

104 — **වැදගත් බුද්ධිමය දේපළ**
ආයතනික ප්‍රාග්ධනය

108 — **අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙන එන සබඳතා පෝෂණය කරමින්**
සාමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

126 — **අපගේ වටිනාම වත්කම මඟින් උපරිම දායකත්වයක්**
මානව ප්‍රාග්ධනය

134 — **මිහිතලය සුරැකීම සඳහා අපගේ දායකත්වය**
ස්වාභාවික ප්‍රාග්ධනය



වැදගත් මූල්‍ය සංඛ්‍යාත





බදු පෙර ලාභය

රු. **බිලියන 30.3**

බැංකු කර්මාන්තයේ ඉහළම ලාභය

ආදායමට පිරිවැය අනුපාතය

38%

අක්‍රිය ණය අනුපාතය

2.8%



ණය සහ අත්තිකාරම්

රු. ට්‍රිලියන 1.2

16% ↑

තැන්පතු

රු. ට්‍රිලියන 1.5

23% ↑

වත්කම්

රු. ට්‍රිලියන 1.9

17% ↑

ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය

20.9%

වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභය

1.7%

මුළු ප්‍රාග්ධන අනුපාතය

14.6%

එකම කොටස්කරුවා වන ශ්‍රී ලංකා රජයට ගෙවන ලද ලාභාංශ

රු. **බිලියන 12.3**

ලාභාංශ ගෙවීමේ අනුපාතය

58%

ශ්‍රී ලංකා රජයට දක්වන ලද මූල්‍ය දායකත්වය

රු. **බිලියන 28.6**

මූල්‍ය ප්‍රාග්ධනය


වසර ගණනාවක් සාර්ථක වාර්තාවන් තබා ඇති ලංකා බැංකුව නැවතද කර්මාන්තයේ ඉහළම බදු පෙර ලාභය වාර්තා කරමින් 2017 වසර අති සාර්ථකව නිමා කර ඇත. බදු පෙර ලාභය රු. බිලියන 30.3 ක් වූ අතර බදු පසු ලාභය රු. බිලියන 21.3 කි. ලංකා බැංකුව ලාභය, වත්කම්, තැන්පතු සහ ණය හා අත්තිකාරම් යනාදියෙන් කර්මාන්තයේ අංක 01 ස්ථානය අබණ්ඩව විශිෂ්ට ලෙස පවත්වා ගැනීමට සමත් වී ඇත.

මූල්‍ය ප්‍රාග්ධනයේ ප්‍රතිලාභයන්

මුළු ආදායම

2017 වර්ෂය සඳහා බැංකුවේ වාර්තාගත මුළු ආදායම රු. බිලියන 189.2 වූයේ 23% ක වාර්ෂික වර්ධනයක් සමඟය. මුළු ආදායමෙන් 90% ක් පොළී ආදායම වන අතර පොළී ආදායමෙන් 73% ක් ජනනය වූයේ ණය හා අත්තිකාරම් වලිනි. ගාස්තු හා කොමිස් ආදායම සහ වෙළඳ සහ මූල්‍ය ආයෝජනවල ශුද්ධ ලාභ පිළිවෙළින් 5% ක් සහ 2% ක් ලෙස මුළු ආදායමට දායක වී ඇත. වෙනත් ආදායම් මුළු ආදායමෙන් 3% ක් නිරූපණය කරයි.


මුළු ආදායමේ සංයුතිය



ශුද්ධ පොළී ආදායම

බැංකුවේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වන පොළී ආදායම රු. බිලියන 171.3 දක්වා 2017 වර්ෂයේ දී 27% කින් වර්ධනය විය. ඉහළ ගිය ප්‍රතිපත්ති අනුපාත, එනම් නිත්‍ය ණය පහසුකම් අනුපාතය (SLFR) සහ නිත්‍ය තැන්පතු අනුපාතය (SDFR) පිළිවෙලින් 8.75% සහ 7.25% ලෙස වැඩිවීම ට අනුගාමිව ඉහළ පොළී අනුපාත තත්ත්වයක් වසර තුළ පැවතුණි. වෙළඳපොලේ පොළී අනුපාත ඉහළ යාමේ ප්‍රවණතාව, පොළී ආදායමේ සහ පොළී වියදමේ වැඩිවීමට හේතු වුවද, බැංකුව පෙර වර්ෂයට වඩා ශුද්ධ පොළී ආදායමේ 8% ක වර්ධනයක් ලබා ගැනීමට සමත් වුණි. ණය සහ අත්තිකාරම්හි පොළී ආදායම 33% කින් වැඩි වූ අතර එයට ණය කළඹේ 16% ක වර්ධනය උපකාරී විය. මුළු පොළී ආදායමෙන් 27% ක් වන ආයෝජනයන්හි පොළී ආදායම 14% කින් වර්ධනය වීම සඳහා රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජන ආදායම දායක විය.


පොළී ආදායමේ සංයුතිය



කාලීන තැන්පතුවල සහ ඉතුරුම් තැන්පතුවල පොළී අනුපාතයන්හි පැවති ඉහළ පරතරය හේතුවෙන් පාරිභෝගිකයන් අඩු පිරිවැය ඉතුරුම් තැන්පතුවලට වඩා කාලීන තැන්පතුවලට ආකර්ෂණීය විය. එමගින් ජංගම හා ඉතුරුම් තැන්පතුවලින් (CASA) කාලීන තැන්පතුවලට තැන්පතු හුවමාරුවක් සිදුවූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2015 දී 46% ක් වූ හා 2016 දී 43% ක් වූ මුළු තැන්පතුවලට ජංගම හා ඉතුරුම් තැන්පතු අනුපාතය (CASA), 2017 දී 37% දක්වා තවදුරටත් අඩු විය. මෙමගින් බැංකුවේ පොළී වියදම රු. බිලියන 113.0 දක්වා පෙර වසරට සාපේක්ෂව 40% කින් වර්ධනය විය. බැංකුවේ පොළී වියදම් සංයුතිය සුළු වශයෙන් වෙනස් වූයේ ඇ. ඩො. මිලියන 500 ක අන්තර් ජාතික බැඳුම්කර ආපසු ගෙවීමෙනි. මෙහි ප්‍රතිඵලයක් ලෙස බැංකුවේ ණය පිරිවැය 9% කින් අඩු විය.

තැන්පතු සඳහා පොළී වියදම සැලකිය යුතු ලෙස ඉහළ යාමක් තිබියදීත් බැංකුව ශුද්ධ පොළී ආන්තිකය, 2016 වර්ෂයේ මට්ටමට වඩා ඉතා සුළු පහළ යාමක් පමණක් සහිතව පවත්වා ගනිමින් ඉහළ පොළී අනුපාත තත්ත්වයේ බලපෑම අවම කර ගැනීමට අරමුදල් කළමනාකරණ ක්‍රියාවන්හි අඛණ්ඩ අධීක්ෂණ සහ සංවර්ධන සැලසුම් හරහා කටයුතු කර ඇත.

ශුද්ධ පොළී ආදායම (NII) සහ ශුද්ධ පොළී ආන්තිකය (NIM)



පොළී නොවන ආදායම

පොළී නොවන ආදායම බැංකුවේ මුළු ආදායමින් 10% ක් වූ අතර, එය ගාස්තු හා කොමිස් ආදායම, වෙළඳ කටයුතු තුළින් උපයන ලද ලාභ සහ වෙනත් මෙහෙයුම් ආදායම්වලින් සමන්විත විය. හරපත් හා ණයපත්වල වර්ධනය සමඟ ශුද්ධ ගාස්තු හා කොමිස් ආදායම වර්ෂය තුළ 1% ක වර්ධනයක් ලබාගෙන ඇත. වෙළඳාමේ ශුද්ධ ලාභය 36% කින් පෙර වර්ෂයට සාපේක්ෂව වැඩි වූ අතර එයට විදේශ විනිමය ආදායම සුවිශේෂී දායකත්වයක් දැක්විය. 2017 දී මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ ලාභ, 231% වර්ධනය වූයේ ඉහළ ගිය රාජ්‍ය සුරැකුම්පත් විකිණීමෙන් ලද ලාභ සහ ලාභාංශ ආදායම් මගිනි.

2017 වර්ෂයේදී, වෙනත් මෙහෙයුම් ආදායමේ 40% ක අඩු වීමක් වාර්තා විය. කෙසේ වෙතත්, පසුගිය වර්ෂයේ ආශ්‍රීත සමාගමක් වූ මිරේකා කැපිටල් ලෑන්ඩ් (පුද්ගලික) සමාගම විකිණීම තුළින් ඉපැයූ රු. බිලියන 3.1 ක විශේෂ ලාභය ඉවත් වූ විට, මෙම අඩු වීම 5% ක් පමණි.

හානිකරණ ප්‍රතිපාදන

මුළු හානිකරණ ප්‍රතිපාදනවල 112% ක වැඩි වීම, ප්‍රධාන වශයෙන් ණය හා අත්තිකාරම් සඳහා වන කේවල හානිකරණය ඉහළ යාමේ ප්‍රතිඵලයකි. බැංකුව විසින් පෙර සාමූහික හානිකරණයට අගය කළ නමුදු සමහර කේවල වශයෙන් වැදගත් ණය ගනුදෙනුකරුවන්, මෙවර කේවල හානිකරණයට

තක්සේරු කර ඇත. කේවල හානිකරණය ඉහළ යාමට විශාල වශයෙන් මෙය හේතු වූ අතර 2018 සිට බල පැවැත්වෙන හානිකරණය සම්බන්ධ නව ගිණුම්කරණ ප්‍රමිතයට (SLFRS 09) අනුගත වන ලෙස කටයුතු කිරීමට ගෙන ඇති විවක්ෂණශීලී පියවරයන් ද තවදුරටත් මෙම ඉහළ යාමට හේතු වී ඇත.


නියාමන සම්මතයන්ට අනුකූලව ගණනය කරන ලද දළ අක්‍රිය ණය අනුපාතය, 2017 වර්ෂය අවසානයේ දී 2.8% ක් වූයේ, කර්මාන්තයේ දළ අක්‍රිය ණය අනුපාත මට්ටමෙහි පවත්වා ගනිමිනි.

මෙහෙයුම් වියදම්


සේවක මණ්ඩල වියදම් හා පරිපාලන වියදම්වලින් සමන්විත මෙහෙයුම් වියදම්, පෙර වසරට වඩා 9% කින් අඩු වී ඇත. බැංකුවේ ඉතාමත් වටිනා ප්‍රාග්ධනයක් වන සේවක මණ්ඩලය වෙනුවෙන් වසරේ දරණ ලද වියදම රු. බිලියන 17.0 කි. වෙනත් මෙහෙයුම් වියදම් 21% කින් අඩුවීමට රු. බිලියන 3.3 ක අතැති රත්‍රං සාධාරණ අගයකට ගැලපීම හේතු විය.

බැංකුව සතු මෙහෙයුම් වියදම් ඵලදායී ලෙස කළමනාකරණයේ ශක්‍යතාව විදහා දක්වමින් ආදායමට පිරිවැය අනුපාතය වර්ෂය තුළ 43% සිට 38% දක්වා අඩු විය.

මෙහෙයුම් වියදම්




ආදායමට පිරිවැය අනුපාතය




ලාභදායීතාව

නවීන නාක්ෂණය බැංකුවේ මෙහෙයුම් කටයුතුවලට සම්බන්ධ කරමින් හා දේශීය හා විදේශීය ප්‍රවණතාවන්ට අනුගත වෙමින් වර්ෂය තුළදී බැංකුවේ උපායමාර්ගික ප්‍රමුඛතා ක්‍රියාත්මක කරන ලදී. 2017 වසරේදී, බැංකුව කර්මාන්තයේ ඉහළම මට්ටමක සිය ලාභ දායිතාව පවත්වා ගනිමින් බදු පෙර ලාභය රු. බිලියන 30.3 ක් වාර්තා කර ඇත. එම වාර්තාව සමඟ, බැංකුව සිය වර්ෂයට අදාළ ඉලක්ක සපුරා ගෙන ඇත්තේ වර්ෂය අවසානයේ වූ නව ප්‍රාග්ධන සම්පාදනයන් සමඟින් වූ වත්කම්හි සාමාන්‍ය මත ප්‍රතිලාභ හා ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභ අනුපාතයන්හි පහළ යාමක් නිඛ්‍යදීප්ත්‍ය.


බදු පෙර ලාභය




බදු පසු ලාභය



වත්කම් හි සාමාන්‍ය මත ප්‍රතිලාභය



ස්කන්ධයෙහි සාමාන්‍ය මත ප්‍රතිලාභය



වත්කම්

2017 වර්ෂයේදී මුළු වත්කම් රු. ට්‍රිලියන 1.7 සිට රු. ට්‍රිලියන 1.9 දක්වා වැඩි වූයේ 17% ක විශිෂ්ට වර්ධනයක් සමඟය. ඒ සමඟ බැංකුව මුළු වත්කම්වලින් 90% කට වඩා නිරූපණය කරන ශක්තිමත් ණය කළඹකින් හා ඉහළ සුරක්ෂිත මූල්‍ය ආයෝජනවලින් සමන්විත වත්කම් පදනමක් ළඟා කරගෙන ඇත.

ණය හා අත්තිකාරම්, මුළු වත්කම්වලින් 60% ක් නිරූපණය කරන අතර එය කාලච්ඡේදයේදී 16% කින් වර්ධනය වුයේ බැංකුවේ ප්‍රමුඛ ව්‍යාපාරය වන ණය දීමේ ශක්තිමත් බව විදහා දක්වමිනි.

බැංකුව විවිධාංගීකරණය වූ ආයෝජන කළඹක් පවත්වා ගනිමින් ප්‍රාග්ධන ලාභ හා පොළී ආදායම් උපයන අතර එය 2017 වර්ෂය අවසානයේදී, රු. බිලියන 308.3 ක් වූ කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන සහ රු. බිලියන 213.2 ක ණය හා ලැබිය යුතු දෑ මූල්‍ය ආයෝජන හරහා පුළුල් විය. වර්ෂය තුළදී මූල්‍ය ආයෝජන 20% කින් වර්ධනය වූයේ ඉහළ ගිය ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගනු ලැබූ සුරැකුම් ආයෝජන, රාජ්‍ය භාණ්ඩාගාර බිල්පත් ආයෝජන හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන හරහා වන අතර මෙමඟින් බැංකුවේ අවදානම් අභිරුචිය පහළ මට්ටමක රඳවා ගැනීමට හැකි වී ඇත.


ණය සහ අත්තිකාරම්

බැංකුවේ ණය කළඹේ වර්ධන ගමන්පාව සනාථ කරමින් දළ ණය සහ අත්තිකාරම් වර්ෂයේ අවසානයේ රු. ට්‍රිලියන 1.2 කට ළඟා විය. පසුගිය වසරට සාපේක්ෂව 16% ක වර්ධනයට පුද්ගලික ණය, කාලීන ණය සහ අයිරා පහසුකම්වල ඉහළ යාම දායක විය. මෙම සන්ධිස්ථානය ළඟාකර ගැනීමට වැඩි දියුණු කරන ලද ණය පහසුකම් ලබා ගැනීමේ විවිධ ප්‍රවේශයන්, පද්ධති ස්වයංක්‍රීය කිරීමෙන් වූ වේගවත් සේවාවන් හා බැංකුවේ වෙළඳ සංස්කෘතියේ වූ නවීන වෙනස්කම් සැලකිය යුතු ලෙස දායක විය.

වෙළඳපොලේ විවිධ පාරිභෝගික කණ්ඩායම්වල අවශ්‍යතා සපුරාලීමට ණය සහ අත්තිකාරම්හි නිෂ්පාදිත කළඹක් බැංකුව විසින් ඉදිරිපත් කර ඇත. මෙම කළඹ පුද්ගලික හා රාජ්‍ය අංශවල මනා සමතුලිතයක් 2017 වර්ෂයේ පෙන්වා ඇත.

වර්ෂය තුළදී, විදේශීය ශාඛාවන් ද ණය සහ අත්තිකාරම් වල 10% ක වර්ධනයක් වාර්තා කරමින් බැංකුවේ විදේශ මෙහෙයුම් වර්ධන අපේක්ෂාවන්ට දායක විය.

අක්‍රීය ණය අනුපාතය ආන්තික වශයෙන් පහළ යාමෙන් ඉහළ නංවන ලද වත්කම්වල ගුණාත්මක බව, යහපත් කළමනාකරණ හා ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග විදහා දැක්වේ.




2017 වර්ෂයේදී මුළු වත්කම් රු. ට්‍රිලියන 1.7 සිට රු. ට්‍රිලියන 1.9 දක්වා වැඩි වූයේ 17% ක විශිෂ්ට වර්ධනයක් සමඟය. ඒ සමඟ බැංකුව මුළු වත්කම්වලින් 90% කට වඩා නිරූපණය කරන ශක්තිමත් ණය කළඹකින් හා ඉහළ සුරක්ෂිත මූල්‍ය ආයෝජනවලින් සමන්විත වත්කම් පදනමක් ළඟා කරගෙන ඇත.


තැන්පතු

2017 වර්ෂයේදී, බැංකුව සිය වෙළඳපොලේ නායකත්වය රඳවා ගනිමින් ගනුදෙනුකරුවන්ගේ තැන්පතුවලින් 20% ක් හිමිකර ගෙන ඇත. බැංකුවේ තැන්පතු පදනම රු. ට්‍රිලියන 1.3 සිට රු. ට්‍රිලියන 1.5 දක්වා පුළුල් වුයේ 23% ක සිත්ගන්නා සුළු වාර්ෂික වර්ධනයක් සමඟය. මෙයින් පිළිබිඹු වන්නේ බැංකුවේ සේවක මණ්ඩලයේ දැඩි උත්සාහයන්ගේ සාර්ථකත්වය හා එයට අනුරූපීව වසර පුරා හඳුන්වාදුන් නව්‍ය හා ආකර්ෂණීය නිමැවුම්, ක්‍රියා පටිපාටි, ක්‍රමවේද සපිරි පාරිභෝගික කේන්ද්‍රගත සංස්කෘතියයි.


වර්ෂය තුළදී මුළු තැන්පතුවලින් 78% ක් වූ දේශීය මුදල් තැන්පතු 28% කින් වර්ධනය විය. වෙළඳපොලේ ප්‍රවණතාව වූ ඉතුරුම් තැන්පතුවලින් ඉහළ ඉපැයුම් ලබාදෙන කාලීන තැන්පතුවලට මාරුවීමේ ප්‍රවනතාවක් සමඟ දේශීය හා විදේශීය මුදල් යන කාලීන තැන්පතු දෙකම රු. බිලියන 258 ක් ලෙස වාර්තා වූයේ 36% ක වර්ධනයක් සමඟය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මුළු තැන්පතුවලින් ජංගම සහ ඉතුරුම් තැන්පතු (CASA) අනුපාතය අඩු වුයේ කර්මාන්තයේ නියාමයන්ට සමගාමීවය.




තැන්පතු (දේශීය සහ විදේශීය මුදල්)



ණය ගැනුම්



කොටස් හිමියන්ගේ අරමුදල්




ණය ගැනුම්

යටත් කාලීන ණය, නිකුත් කළ ණය සුරැකුම්පත්, ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකුණුම් හා වෙනත් ණය ගැනුම්වලින් සැදුම්ලත් ණය ගැනුම් වර්ෂය තුළදී රු. බිලියන 31.7 කින් අඩු විය. මෙම පහළ වැටීම පසුගිය වසරට සාපේක්ෂව 11% ක් වූ අතර ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් හා පරිණත ණය පත්‍ර හරහා ණය ගැනුම් අඩු වීම එයට හේතු විය.

වර්ෂය තුළදී බැංකුව රු. බිලියන 10.0 ක වටිනාකමින් යුතු සුරැකුම් රහිත යටත් කාලීන නිදහස් කළ හැකි ණයකර නිකුත් කරන ලදී.


ජංගම සහ ඉතුරුම් තැන්පතු අනුපාතය



ලාභාංශ

2017 වර්ෂය තුළදී, බැංකුව විසින් සිය එකම කොටස්කරුවා වන ශ්‍රී ලංකා රජයට රු. බිලියන 12.3 ක ලාභාංශ ගෙවන ලද්දේ ලාභාංශ ගෙවීමේ අනුපාතය 2017 වර්ෂයට 58% ක් ලෙස වාර්තා කරමිනි.

ලාභාංශ ගෙවීම්



කොටස්හිමියන්ගේ අරමුදල්

වර්ෂය අවසානයේ දී, කොටස්හිමියන්ගේ අරමුදල් රු. බිලියන 111.2 ක් ලෙස 20% ක සුවිශේෂී වර්ධනයක් වාර්තා කර ඇත්තේ වැඩි වූ රඳවාගත් ඉපැයුම් හා ශ්‍රී ලංකා රජයේ රු. බිලියන 5.0 ක ප්‍රාග්ධන සම්පාදනයත් සමඟය.

ප්‍රාග්ධනය හා ද්‍රවශීලතාව


ප්‍රාග්ධන ප්‍රමාණාත්මක බව හා ද්‍රවශීලතාව සම්බන්ධයෙන් වන ශ්‍රී ලංකා මහ බැංකුවේ බාසල් III හි අවශ්‍යතාවයන් ඉහළ මට්ටමකින් සපුරාලීමට බැංකුව සමත් වී ඇත.

වර්ෂය අවසානයේ දී, ස්ථර 1 ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය 10.8% ක් වූ අතර මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය 14.6% වූයේ පිළිවෙළින් නියාමන අවශ්‍යතාව වන 7.75% හා 11.75% ට සාපේක්ෂවය. තවදුරටත් වර්ෂයේ ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය 27.2% වූයේ එහි අවම නියාමන අවශ්‍යතාව 20% ක් ලෙස තිබියදීය.


තවද, වර්ෂය තුළදී බාසල් III නියාමනයන්හි ප්‍රතිඵලයක් ලෙස ද්‍රවශීලතා ආවරණ අනුපාතය (LCR) අලුතින් හඳුන්වා දී තිබේ. බැංකුව මෙම නව නියාමන අවශ්‍යතාව සියලු මුදල් ඒකක සඳහා ද්‍රවශීලතා ආවරණ අනුපාතය 105% ක් ලෙස සහ ශ්‍රී ලංකා රුපියල් සඳහා ද්‍රවශීලතා ආවරණ අනුපාතය 141.5% ක් ලෙස ළඟා කර ගෙන ඇත්තේ එහි අවශ්‍යතාව 80% ක් ලෙස තිබියදීය.

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා හා ද්‍රවශීලතාව සම්බන්ධ මෙම විශිෂ්ට කාර්යසාධනය මගින් පිළිබිඹු වන්නේ ප්‍රාග්ධන කළමනාකරණයේ ශක්තිමත් බව හා බැංකුවේ ශේෂ පත්‍රයේ ප්‍රත්‍යස්ථිතියයි.

මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය



නියාමන අවශ්‍යතාවයන්



*2013 සිට 2016 දක්වා, බාසල් II නියාමනයන්ට අනුවද 2017 වසරේදී බාසල් III නියාමනයන්ට අනුවද ඉදිරිපත් කර ඇත.

ලංකා බැංකු සමූහය

පරිපාලිත සමාගම් දහයකින් මෙන්ම ආශ්‍රිත සමාගම් හතරකින් ලංකා බැංකු සමූහය සමන්විත වේ. සමූහයේ මුළු වත්කම්වලින් 2% ක දායකත්වයක් මෙම සමාගම් වලින් ලැබෙන අතර, උපායශීලී අරමුණු වෙනුවෙන් මෙම සමාගම් පිහිටුවා ඇත. මෙම පරිපාලිත සමාගම් දහයෙන් පහකම පූර්ණ අයිතිය ලංකා බැංකුව සතු වේ.

මූලික ක්‍රියාකාරකම්

අපගේ පරිපාලිත සමාගම්, මූල්‍ය සේවා සැපයීම (MBSL), ගුවන් ගමන් සේවාවන් සැපයීම (BOC ට්‍රැවල්ස්), ජල විදුලිය නිපදවීම (සී/ස කොළඳෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම) ආදී විවිධ ක්ෂේත්‍ර වෙත යොමු වී ඇති අතර ලංකා බැංකුව (යූ.කේ.) සමාගම මූල්‍ය සේවා ක්‍රියාවන් හි නිරත වී සිටියි. ඒකක භාර අරමුදල්, කොටස් වෙළඳපොල හා දේපල හා සම්බන්ධ ව්‍යාපාරයන්ගේ අපගේ ආශ්‍රිත සමාගම් නියැලී සිටියි.

වාර්ෂික කාර්යසාධන සමාලෝචනයක් හරහා බැංකුව පරිපාලිතයන්ගේ කාර්යසාධනය අගයන අතර දූරදර්ශී යහපාලන සහ අවදානම් කළමනාකරණ රාමුව හරහා මනා පරිපාලන ක්‍රියා පිළිවෙත් අඛණ්ඩව පවත්වාගෙන යයි. බැංකුව මෙම පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් බොහෝමයක්හි අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කරමින් ඒවාහි ප්‍රතිපත්ති සහ උපායමාර්ග නිවැරදි දැක්මක් සහ අරමුණු පෙර දැරිව ක්‍රියාත්මක වන බවට අධීක්ෂණය කරමින් අවදානයෙන් සිටියි. මව් සමාගම ලෙස ලංකා බැංකුව සියලුම පරිපාලිතයන්ගේ හා ආශ්‍රිතයන්ගේ මූල්‍ය කාර්යසාධනය අධීක්ෂණය කරන අතර එහිදී මතුවන මූල්‍ය දුෂ්කරතාවන් නිවැරදි කිරීමට කළමනාකාරිත්වයේ ප්‍රමුඛ අවධානය යොමු කිරීමට පියවර ගනී. ඒ හා සමානව සමූහයේ සමාගම් බැංකුවට අවදානමක් ඇති නොවන පරිදි සිය අවදානම් කළමනාකරණය කරන බවට සහතික වෙමින් සියලුම අවදානම් තොරතුරු බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරි හට වාර්තා කරයි.

භෞතික යටිතල පහසුකම් සහ ඉන් ඔබ්බට



භෞතික යටිතල පහසුකම්

ශාඛා සහ සීමිත සේවා ශාඛා

626

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මධ්‍යස්ථාන

15

ප්ංගම ශාඛා

02

ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන

14

ඩිජිටල් යටිතල පහසුකම්

ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර

764

ලංකා බැංකු අන්තර්ජාල බැංකුකරණය

මුදල් තැන්පතු යන්ත්‍ර -

168

B

යෙදුම

භෞතික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජන

රු. **බිලියන**

1.9

ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජනය

රු. **බිලියන**

1.7

2017 අගවන විටදී නවීන ශාඛා බවට පරිවර්තනය කළ ශාඛා සංඛ්‍යාව -

209

ශාඛා පද්ධති සඳහා හරිත ගොඩනැගිලි සංකල්පය හඳුන්වා දීම

2017 අගවන විටදී සූර්ය බලශක්තිය මඟින් විදුලිය සැපයූ ශාඛා සංඛ්‍යාව

20

නිෂ්පාදන ප්‍රාග්ධනය

විචල්‍යයන්ට ඔරොත්තු දිය හැකි යටිතල පහසුකම් ගොඩනැගිලි පුර්ණ සහ තිරසාර කාර්මීකරණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය

9 කර්මාන්ත, නවෝත්පාදන සහ යටිතල පහසුකම්

අපගේ ගනුදෙනුකරුවන් හා බැංකුව අතර වූ සම්බන්ධතාවය ප්‍රතිනිර්මාණය කර ඇති අතර නව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පතු යන්ත්‍ර සහ ජංගම ශාඛා මගින් සිය ව්‍යාප්තිය පුළුල් කර ඇත.

- **ඕනෑම අවස්ථාවක ඕනෑම තැනක දින 365, පැය 24, තුළම බැංකුකරණ කටයුතු සිදු කිරීම සඳහා "B යෙදුම" හඳුන්වාදෙන ලදී**
- **අඩු වරප්‍රසාද සහිත සමාජ කොටස් සඳහා ජංගම ශාඛා මගින් මූල්‍ය පහසුකම් සැපයීම**

අපගේ යටිතල පහසුකම්

නිෂ්පාදන ප්‍රාග්ධනය අපගේ භෞතික ශාඛා ජාලය සහ අපගේ මෙහෙයුම් සඳහා යොදා ගන්නා උපකරණ, තොරතුරු තාක්ෂණ පද්ධති සහ ජාල වැනි අනෙකුත් ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය අයිතම වලින් සමන්විත වේ. අපගේ දිගු ඉතිහාසයක් සමඟ අප උරුමකම් කියන භාණ්ඩ මෙන්ම උරුමයන්සේ සැලකෙන බොහෝ වත්කම් සහ මෑතකදී එකතු කරන ලද වත්කම් ප්‍රමාණයක් අප සතුව ඇත. අපගේ ශාඛා ජාලය හා ඩිජිටල් සැපයුම් නාලිකා සමඟ රටෙහි වඩාත් පුළුල්ම මූල්‍ය ජාලය බව සාධම්බරයෙන් ප්‍රකාශ කරමු. 2017 දෙසැම්බර් 31 දිනට අප සතුව ශාඛා 578 ක්, සීමිත සේවා සැපයුම් ශාඛා 48 ක්, ජංගම ශාඛා 02 ක්, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරික මධ්‍යස්ථාන 15 ක්, ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන 14 ක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 764 ක් සහ මුදල් තැන්පතු යන්ත්‍ර 168 ක් පැවතුනි. කුමන ආකාරයේ තාක්ෂණික වර්ධනයන් හා නවෝත්පාදනයන් සිදුවුවත් පාරිභෝගිකයින්ගෙන් වැඩි දෙනෙක් තවමත් මානව මැදිහත් වීම් අගය කරන බැවින්, අපගේ ගනුදෙනුකාර මධ්‍යස්ථාන ජාලය සහ එහි මෙහෙයුම් සඳහා තව දුරටත් වැදගත් ස්ථානයක් හිමිවේ. බිම් මට්ටම සහ සියලුම තරාතිරම්වල අය සඳහා සේවය සැපයීම සඳහා වන අපගේ අචාරධර්මයන් අනුව අපගේ ශාඛා ඉහල සංවර්ධිත නගරවල සිට ග්‍රාමීය ප්‍රදේශ කරා වූ දිවයින පුරා ප්‍රදේශවල ව්‍යාප්තව පවතී. දිවයිනේ විශාලතම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ මුදල් තැන්පතු යන්ත්‍ර ජාලය ලංකා බැංකුව සතුව පවතින අතර, මෙම වසර තුල අප ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 86 ක් සහ මුදල් තැන්පතු යන්ත්‍ර 45 ක් සේවා ජාලයට එකතු කර ඇත. අපගේ පුළුල්ව ව්‍යාප්ත වූ සේවා ජාලය විශේෂයෙන්ම එමගින් පාරිභෝගිකයින්ට සපයන පහසුව මත අගනා වත්කමක් ලෙස තව දුරටත් පවතී.

වර්තමානය වනවිට බැංකු ආකෘතිය ශාඛා පද්ධති ආකෘතියේ සිට ඩිජිටල් යුගයක් දක්වා වෙනස්වීමකට භාජනය වෙමින් පවතී. එබැවින් නව යුගයේ බැංකු ක්‍රම වැඩි වශයෙන් ඉල්ලා සිටින, වර්ධනය වන නව සහස්‍රයේ ගනුදෙනුකරුවන් වෙත සේවා පහසුකම් සැලසීම සඳහා අප මෙම වසර තුළ අපගේ ඩිජිටල් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා විශාල ආයෝජනයක් සිදුකර ඇත.

ජනයා සඳහා සේවා සැපයීම සඳහා අප විසින් ජංගම ශාඛා දෙකක් යොදා ඇත. මෙම වසර තුළ සිදුවූ ආපදා තත්ත්වයන්ට පසුව, ආපදාවට ලක් වූ ප්‍රදේශවල පිහිටි ශාඛා වලට මෙහෙයුම් කටයුතු සිදුකළ නොහැකි වූ බැවින් මෙම ජංගම ශාඛා ඒ සඳහා යොදා ගැණුනි.

තවද, අපගේ ගනුදෙනුකරුවන්ට වඩාත් යහපත් සේවාවක් සැපයීම වස් ශාඛා පද්ධතියේ භෞතික පෙනුමක් සහ ආකර්ශනීය භාවය ඉහළ නැංවීම සඳහා විශාල නවීකරණයක් සිදුකරන ලදී. මෙම වසර තුළ අප ශාඛා නවීකරණය කිරීම් කටයුතු ශාඛා 97 ක අවසන් කරන ලදී.



ජංගම ශාඛා

ශාඛා ජාලය වැඩි දියුණු කිරීම

කෙසේ නමුදු, අප අපගේ අතීත ගනුදෙනුකරුවන් අමතක කර නොමැති අතර සෑම විටම ඩිජිටල් සේවා සැපයුම් නාලිකා සහ ශාඛා පද්ධති ව්‍යාප්තිය යන දෙක අතර සමබරතාවයක් පවත්වාගෙන ගැනීමට කටයුතු කරමු. යහපත් ගනුදෙනුකාර සේවාවක් සැපයීම සඳහා මෙම වසර තුළ අපගේ ශාඛා පද්ධතිය විධිමත් කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ කාර්යයද අප සිදු කලෙමු. ඒ අනුව, ශාඛා දෙකක් සහ සීමිත සේවා ශාඛාවක් වසා දැමුණු අතර එක් නව ශාඛාවක් විවෘත කරන ලදී. මීට අමතරව ශාඛා 19 ක් යලි ස්ථාපනය කළ අතර ශාඛා 41 ක් වසර තුළ නවීකරණය කරණ ලදී.

ග්‍රාමීය ප්‍රදේශවල පිහිටි අපගේ ශාඛා, එම ප්‍රදේශවල සිටින අඩු පහසුකම් සහිත ජනතාවට සේවා සපයන අතර එමගින් අප පුළුල් මූල්‍ය ඇතුලත්කරණයක් ප්‍රවර්ධනය කර ඇත. සාම්ප්‍රදායික බැංකු ක්‍රම මගින් ළඟා වීමට අපහසු 2017 දෙසැම්බර් 31 දිනට, ශාඛා 209 ක් සම්පූර්ණයෙන්ම නවීකරණය කර ඇති අතර ශාඛා 48 ක නවීකරණ කටයුතු සිදු කෙරෙමින් පවතී. තවද, වසර තුළ ශාඛා 02 ක් සඳහා ප්‍රධාන නවීකරණ කටයුතු සිදු කරන ලදී.

ශාඛා පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා වසර තුළ දරා ඇති මුළු පිරිවැය රු. බිලියන 1.9 කි. අපගේ සේවා නාලිකා සාම්ප්‍රදායික වුවද, අති නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කළද ශාඛා පද්ධතිය අපගේ පාරිභෝගික සේවා සැපයීම සඳහා අත්‍යවශ්‍ය වන්නක් වන බැවින් මෙම ප්‍රාග්ධනය අපගේ ප්‍රතිලාභ ජනිත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන ධාවකයන් වේ.

ඩිජිටල් පරිවර්තනය

සාම්ප්‍රදායික බැංකුකරණයේ සිට ඩිජිටල් බැංකුකරණ දක්වා ගමන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අපගේ තාක්ෂණික යටිතල පහසුකම් වැඩි

දියුණු කිරීම සඳහා ඉල්ලුමක් ඇති වී ඇත. මෙය නව ආරක්ෂක සහ සේවා විශේෂාංග සහිත වැඩි දියුණු කළ ජාල යටිතල පහසුකම්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ මුදල් තැන්පතු යන්ත්‍ර සහිත වේ. මෙමගින් ගනුදෙනුකරුවන්ගේ පහසුව සහ විශ්වාසනීයත්වය විශාල වශයෙන් ඉහළ නංවා ඇති අතර වෙළඳපොලෙහි අංක 1 ස්ථානය රැඳවා ගැනීමට අපට සහය වී තිබේ. රටේ සෑම කෙලවරකම කෙතරම් ඉක්මනින් මුදල් තැන්පතු යන්ත්‍ර ජනප්‍රිය වුවාද යන්න, පාරිභෝගිකයින්ගේ මනාපය වෙනස්වීමේ වේගය පිළිබඳ එක් දර්ශකයක් ලෙස ගත හැකිය. අන්තර්ජාල සහ ජංගම බැංකුකරණයේ නිරන්තර ඉහළ යන අවශ්‍යතා සමඟ අපගේ තොරතුරු තාක්ෂණ දෘඩාංග හා මෘදුකාංග නිතිපතා වැඩිදියුණු කළ යුතුය. ඩිජිටල් නාලිකා ආරක්ෂිත, පහසුවෙන් ප්‍රවේශ විය හැකි, භාවිතයට පහසු, විශ්වාසනීය හා කඩිනම් විය යුතුය. ගනුදෙනුවල පරිමාව වැඩිවීමක් සමඟ එම ඩිජිටල් නාලිකා ගැලපීම සිදුකළ යුතුය. නියාමන අවශ්‍යතා වෙනස්වන අතර එමගින් මතුවන තොරතුරු අවශ්‍යතා සැපයීම සඳහා අවශ්‍ය පරිදි තොරතුරු තාක්ෂණ පද්ධති සහ ක්‍රියා පටිපාටි වෙනස් කළ යුතුය. විශේෂයෙන්ම මෙය, අවදානම් කළමනාකරණය, නියාමන වාර්තාකරණ අවශ්‍යතා සහ මුදල් විශුද්ධිකරණය වැලැක්වීම පිළිබඳ රෙගුලාසි වල වෙනස්වීම් සඳහා වේ. 2017 වසර තුළදී නව පරිගණක උපාංග මෘදුකාංග සහ ජාල යටිතල පහසුකම් සඳහා සිදුකළ ආයෝජනය රු. බිලියන 1.7 කි.

කර්මාන්තයේ පවතින වර්තමාන ප්‍රවනතා අනුව ගැලපෙන පරිදි, අප විසින් වසර පුරා අපගේ ඩිජිටල්කරණ මූලාරම්භයන් හි සැලකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන ඇත. අපගේ අන්තර්ජාල බැංකුකරණ සේවාව වැඩිදියුණු කිරීම සමඟ නැවත දියත් කරන ලදී. "ස්මාර්ට්" පාස්පොත් සඳහා ලියාපදිංචි වීම් 41,567 ක් දක්වා වර්ධනය වී ඇත. නවත් වැදගත් වර්ධනයක් වනුයේ අපගේ නව ජංගම දුරකතන යෙදුම වන "B-App" හඳුන්වා දීමයි. මෙම යෙදුම ඕනෑම මෙහොතක ඕනෑම තැනක සිට පාරිභෝගිකයින්ට සිය ඩිජිටල් බැංකු කටයුතු වේගවත්ව සහ ආරක්ෂිතව සිදු කිරීම සඳහා හැකියාව සපයන නාලිකාවක් වේ. ඩිජිටල් නාලිකා සඳහා වන ආරක්ෂණ උපක්‍රම ද වසර තුළදී වැඩිදියුණු කිරීම සිදුවිය.

අපගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් සිදුකළ මුළු ගනුදෙනු සංඛ්‍යාව මිලියන 62.9 ක් ලෙස වාර්තා වූ අතර මුදල් තැන්පතු යන්ත්‍ර හරහා එය මිලියන 10.9 ක් විය. EMV චිප් කාඩ්පත් නිකුත් කිරීමේ පහසුකම හඳුන්වා දුන් අතර EMV චිප් කාඩ්පත් පිළිගැනීමේ පහසුකම, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 500 කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා ක්‍රියාත්මක කරන ලදී. මීට අමතරව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 500 ක් සහ මුදල් තැන්පතු යන්ත්‍ර 13 ක් සඳහා කාඩ්පත් රහිත උපයෝගිතා බිල්පත් ගෙවීමේ සහ ජංගම දුරකතන ගිණුම් ශේෂ ඉහළ දැමීමේ පහසුකම සක්‍රීය කරන ලදී. තවද මුදල් තැන්පතු යන්ත්‍ර 13 ක් සඳහා මුදල් ප්‍රතිචක්‍රීකරණ පහසුකම සක්‍රීය කරන ලදී.

නිෂ්පාදන ප්‍රාග්ධනය වර්ධනය කිරීමේදී යම් ප්‍රදේශයක ඕනෑම නව ආයෝජනයක්, එමගින් ලැබෙන ප්‍රතිලාභ සහ ඒ හා සම්බන්ධ කාලරාමුව යන කරුණු සැලකිල්ලට ගෙන ඇගයීමට ලක්කිරීම සෑම විටම අත්‍යවශ්‍ය වේ.

සමාජ මාධ්‍ය ජාල බලපෑම

නව සහස්‍රයේ පරම්පරාව සමඟ සන්නිවේදනය කිරීම වැනි කාරණා වලදී සමාජ මාධ්‍ය ජාල වැනි ගෝලීය ප්‍රවනතාවයක් මඟින් බැංකු ක්ෂේත්‍රය හැඩ ගැස්වීම් අනාගතයේදී තවත් ඉහළ යනු ඇත.

ගනුදෙනුකරුවන් සමඟ සන්නිවේදනය සඳහා සමාජ මාධ්‍ය ජාලයක් වඩාත් යෝග්‍ය වනු ඇත. මෙමගින් ගනුදෙනුකරුවන්ගේ ප්‍රතිචාර ක්ෂණිකවම විශාල පිරිසක් වෙත සන්නිවේදනය වීම වැනි අභියෝග රැසක් උදාවනු ඇත. මේ හරහා ගලා එන අති විශාල තොරතුරු ප්‍රමාණයක් විශ්ලේෂණය කිරීම සඳහා බුද්ධිමත් පද්ධති සංවර්ධනය කිරීමට සිදුවනු ඇත.

වර්තමානය වනවිට බැංකු ආකෘතිය ශාඛා පද්ධති ආකෘතියේ සිට ඩිජිටල් යුගයක් දක්වා වෙනස්වීමකට භාජනය වෙමින් පවතී. එබැවින් නව යුගයේ බැංකු ක්‍රම වැඩි වශයෙන් ඉල්ලා සිටින, වර්ධනය වන නව සහස්‍රයේ ගනුදෙනුකරුවන් වෙත සේවා පහසුකම් සැලසීම සඳහා අප මෙම වසර තුළ අපගේ ඩිජිටල් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා විශාල ආයෝජනයක් සිදුකර ඇත.



සමාජ ජාල හරහා ගනුදෙනුකරුවන් හා සම්බන්ධ වීම.

අපගේ භෞතික වත්කම් ආරක්ෂා කිරීම

අපගේ ශාඛාවල ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය අප කිසිවිටෙක නොසලකා හරිනු නොලැබේ. අපගේ ශාඛා ජාලයේ ආරක්ෂිත පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සලකා බලන වසර තුළදී රු. මිලියන 258 ක් වැය කොට ඇත. ප්‍රධාන කාර්යාලය ඇතුළු සියලුම ශාඛාවන්හි සංචිත මුදල් සඳහා වූ රක්ෂණ ආවරණ සීමාවන් සහ ගිණි රක්ෂණ ආවරණ කලානුරූපව යාවත්කාලීන කිරීම සඳහා බැංකුව අතිශය ප්‍රවේශම් සහගත ලෙස කටයුතු කරනු ලැබේ. අපේක්ෂා කරන ඉහළම මට්ටමේ ආරක්ෂාවක් අපගේ ශාඛා ජාලය සතුවන බව සහතික කිරීම සඳහා අවශ්‍ය සෑම පියවරක්ම ගනු ලැබේ. සෑම ශාඛාවක් සඳහාම ආරක්ෂිත කැමරා පහසුකම් ලබාදීමේ කටයුත්ත වසර 2017 තුළදී අවසන් කර ඇත.

අපගේ ශාඛා ජාලය හරිතකරණය

සලකා බලන වසර තුළ ශාඛා 14 ක් සූර්ය බලශක්ති භාවිතයට පරිවර්තනය කරන ලද අතර 2017 වසර තුළ ස්ථාපනය කරන ලද මුළු ධාරිතාව කි.වො. 515 කි.

බලශක්ති කාර්යක්ෂම විදුලි පහන් සවිකිරීම, විදුලි පරිභෝජනය අවම කරන පරිදි ශාඛාවල ගෘහ නිර්මාණකරනය වෙනස් කිරීම, ඇතැම් ශාඛාවල භූ අලංකරණ කටයුතු සඳහා වැසි ජලය භාවිතා කිරීම සහ ආලෝකකරණ කටයුතු පාලනය කිරීම සඳහා ස්වයංක්‍රීය පද්ධති ස්ථාපනය කිරීම වැනි ක්‍රියාවලීන් අප අඛණ්ඩව ක්‍රියාවට නංවාගෙන යන්නේමු. අපගේ කැකිරාව ශාඛාව හරිත සංකල්ප සඳහා ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය, මගින් පිරිනැමූ රන් සම්මානය දිනාගත් අතර එම සංකල්පය තවත් තෝරාගත් ශාඛාවන් වෙත ව්‍යාප්ත කිරීම සඳහා අප කටයුතු කරන්නෙමු.



හරිත ගොඩනැගිලි සංකල්පය මත ගොඩනැගුණු ලංකා බැංකුවේ ප්‍රථම ශාඛාව - කැකිරාව ශාඛාව

වැදගත් බුද්ධිමය දේපළ



සවිමත් සන්නාමය

ලංකාවේ
අංක එකේ
සන්නාමය

එක්සත් රාජධානියේ "ද බෑන්කර්"
සඟරාව නම් කරන ලද ලොව
විශිෂ්ටතම බැංකු
1,000 අතරට

බෑන්ඩ් ෆයිනෑන්ස් ලංකා ආයතනය මඟින්
තක්සේරු කරන ලද සන්නාම අගය
රු. බිලියන 40.6

සන්නාමය සඳහා වන ආයෝජනය
රු. බිලියන 1.2

නෛසර්ගික දැනුම



කාර්ය මණ්ඩලය සතු වසර
81,841 ක
සමුච්චිත සේවා පළපුරුද්ද

වසර 20 කට වැඩි සේවා කාලයක්
සහිත සේවා නියුක්තිකයින් සංඛ්‍යාව
1,336

ණය ශ්‍රේණිගත කිරීම

දේශීය ශ්‍රේණිගත කිරීම්

AA+(1Ka) Outlook Stable- ෆිච් රේටින්ස් ලංකා

AAA Stable - ICRA ලංකා

ගෝලීය ශ්‍රේණිගත කිරීම්

B+ Stable - ෆිච් රේටින්ස්

B 1 Negative - මූඩීස් ඉන්වෙස්ටර් ස්විසර්ස්

ආයතනික ප්‍රාග්ධනය

තිරසාර සංවර්ධනයන් සඳහා සාමකාමී සහ පූර්ණ සමාජයන් ප්‍රවර්ධනය කිරීම සහ සැමට යුක්තිය ප්‍රවර්ධනය කිරීම



බැංකුවේ සෑම අංශයකම මෙහෙයුම් කටයුතු ආවරණය කරන ශක්තිමත් පාලන ආකෘතියක් බැංකුව සතුය. ඕනෑම ආකාරයක දූෂණ, අල්ලස් හෝ වංචා තුරන් කිරීම සඳහා විවිධාකාර ප්‍රතිපත්ති සහ ගනුදෙනුකරුවන්ගේ මානව අයිතිවාසිකම් සුරැකීම සඳහා ප්‍රතිපත්ති බැංකුව විසින් පිහිටුවා ඇත.

- **බැංකුවේ "විස්ල් බ්ලෝවර්" ප්‍රතිපත්තිය**
- **ශක්තිමත් පාලන ආකෘතිය**

ආයතනික ප්‍රාග්ධනය බැංකු සංස්කෘතිය, ආචාරධර්ම, වටිනාකම්, ආයතනික දැනුම, පද්ධති, ක්‍රියා පටිපාටි සහ සන්නාම වටිනාකම ආදී අස්පෘශ්‍ය වත්කම් වලින් සමන්විත වේ. මෙම අස්පෘශ්‍ය වත්කම් ශේෂ පත්‍රයෙහි නිරූපණය නොවුවද, සත්‍ය වශයෙන්ම බැංකුව සතු වත්කම් වේ. මෙම වත්කම් ඉහළ මට්ටමේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ සිට එදිනෙදා කාර්යයන් ඉටුකිරීම ආදී බැංකුවේ සියලු මෙහෙයුම් කටයුතු සඳහා සෑම මට්ටමකින්ම දායක වේ. තවද මෙම වත්කම් බැංකුව කෙරෙහි අපගේ ගනුදෙනුකරුවන් තුළ ඇති දැක්ම කෙරෙහි ද බලපෑම් සිදු කරයි.

අපගේ සන්නාමය ඇගැයීම

78 වසරක ඉතිහාසයක් සහිත ලංකා බැංකුව, රටේ බැංකු ක්ෂේත්‍රය තුල පෙරමුණ ගෙන සිටී. ලංකා බැංකුව "දේශයේ බැංකුකරුවා" වේ. අද දින අප කෙරෙහි මුළු මහත් ජාතියම තබා ඇති විශ්වාසය දිගු කාලයක් පුරා ගොඩනංවා ගත්තකි. ජාතියේ ආර්ථික වර්ධනයෙහි ලා අප රජයේ, ව්‍යාපාරික ප්‍රජාවගේ සහ සාමාන්‍ය පොදු ජනතාවගේ හවුල්කරුවකු විය. අපගේ ජනතාවගේ ජීවිත වඩාත් යහපත් කරවීම සඳහා රටේ විශාලතම බැංකුව ලෙස අප සතු හැකියාව අතිමහත් වන අතර බොහෝ ජීවිත වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා අප විසින් සිදු කොට ඇති වැඩ කොටස පිළිබඳ නිහතමානී අභිමානයක් අප තුළ ඇත. අපි සියලුම ආකාරයේ විවිධත්වයන්ට ගරු කරන අතර, ජාති, ආගම්, හෝ සමාජ පසුබිම පදනම් කරගෙන කිසිදු වෙනස්කමක් සිදු නොකරයි.

කොළඹ නගරයේ හදවත වැනි වූ ස්ථානයක පිහිටා ඇති විශේෂිත වූ සිලින්ඩරාකාර හැඩයක් සහිත අපගේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල සුවිශේෂී වූ වටිනාකමකින් යුක්ත වේ. තව ද අපගේ බැංකු ලාංඡනය සහ බැංකු ගීතය ද මිලියන ගණනක් වූ ප්‍රජාවගේ මනසට කාවැදී ඇත්තේ අපගේ සන්නාමයේ ඇති ශක්තිය විදහාපාමිනි. සමාලෝචනයට භාජනය වන වසර තුළ ලංකා බැංකුව සිය සන්නාම වටිනාකම සඳහා වූ සම්මාන රැසකට පාත්‍ර වී ඇත. එක්සත් රාජධානියේ බ්‍රෑන්ඩ් ෆයිනෑන්ස් ආයතනයේ ශ්‍රී ලංකා සහකරු වන බ්‍රෑන්ඩ් ෆයිනෑන්ස් ලංකා ආයතනය විසින්, ලංකා බැංකුව, ලංකාවේ අංක එකේ සන්නාමය ලෙස පිට පිට නවවැනි වසරටත් නම් කරනු ලැබිය. අපගේ සන්නාම අගය රු. බිලියන 40.6 ක් ලෙස තක්සේරු කර ඇත. තව ද ලෝකයේ වඩාත්ම බලවත් වෙළඳ නාම උපදේශන ආයතනය වන "ඉන්ටර්බ්‍රෑන්ඩ්" ආයතනය විසින් පවත්වන ලද "හොඳම ශ්‍රී ලාංකික වෙළඳ නාම" සම්මේලනයේ දී හොඳම ශ්‍රී ලාංකික වෙළඳ නාමය ලෙස ලංකා බැංකුව නැවත වරක් ගෞරවයට පාත්‍ර විය. මෙම සම්මානය, වෙළඳ නාමයේ මූල්‍ය කාර්ය සාධනය සහ පාරිභෝගික තේරීම කෙරෙහි එයට සිදු කල හැකි බලපෑම ආදී විවිධ නිර්ණායක මත පදනම් වී ඇත. අලෙවිකරණ කටයුතු සඳහා අපි 2017 වසර තුළ රු. බිලියන 1.2 ක් ආයෝජනය කර ඇති අතර එය නිසැක ලෙසම අපගේ සන්නාමය සඳහා වන ආයෝජනයකි. ලෝකයේ ඉහළම බැංකු 1,000 වර්ගීකරණය තුළ ලංකා බැංකුව වසර 2012 සිට අඛණ්ඩව නියෝජනය වේ.

අපගේ වටිනාකම් සන්නිවේදනය

උසස් ආචාර ධර්ම ප්‍රමිතීන් සහ වටිනාකම් ලංකා බැංකුවේ සංස්කෘතියට අනුගත වී ඇත. තවද බැංකුවේ සියලුම හර පද්ධතීන් සෑම මට්ටමකම සේවා නියුක්තිකයන් තුළට කාවැද්දීම සිදු කෙරේ. පාරිභෝගික සේවා සැපයීම අපගේ ප්‍රධාන ව්‍යාපාරික ක්‍රියාවලියක් බැවින්, කාර්ය මණ්ඩල පුහුණුවේදී මූලිකව ඉහත කරුණ සැලකිල්ලට ගනු ලබයි. අපගේ කාර්ය මණ්ඩලය පාරිභෝගික අවශ්‍යතාවයන්ට කාරුණික විය යුතු අතර ප්‍රතිචාර දැක්විය යුතුය. අපගේ පුහුණු වැඩසටහන් තුළදී පාරිභෝගික සේවා පිළිබඳ පුහුණුවට විශාල වැදගත්කමක් ලබා දී ඇත. අපගේ පාරිභෝගික පදනම විශාලතම සමාගම් වල සිට කුඩා පරිමාණ ග්‍රාමීය ව්‍යවසායකයින් දක්වා ද ඉහළ වටිනාකමක් සහිත ගනුදෙනුකරුවන්ගේ සිට ග්‍රාමීය ප්‍රදේශවල ජනයා දක්වා ද අතිශයින්ම විවිධාංගිකරණය වී ඇත. මෙම සන්දර්භය තුළ සුමට වූ පාරිභෝගික සේවාවක් සැපයීම සඳහා අපගේ කාර්ය මණ්ඩලය පාරිභෝගික කේන්ද්‍රීය වීම අත්‍යාවශ්‍ය කාරණයක් වී ඇත. පාරිභෝගිකයින් සමග සානුකම්පිතව කටයුතු කිරීමටත් විවිධත්වය මධ්‍යයේ සෑම ගනුදෙනුකරුවකු සමගම සුදුසු ලෙස කටයුතු කිරීමටත් සියලු සේවකයන්ට හැකි විය යුතුය. ශිෂ්ඨතාවය සහ නව්‍යකරණය පිළිබඳ බැංකුව සිය නිරන්තර අවධානය යොමු කරනු ලබයි. ස්වයංක්‍රියකරණය හා ඩිජිටල්කරණය හරහා ඩිජිටල් සැපයුම් නාලිකා ක්‍රියාවලිය වෙනස් කිරීම් සහ කාර්ය ප්‍රවාහ පද්ධති සරල කිරීම සඳහා අප විසින් ආයෝජනය කරනු ලබයි. ව්‍යාපාර ක්‍රියාවලි අඛණ්ඩ පදනමක් යටතේ සමාලෝචනය කිරීම සහ ප්‍රතිනිර්මාණය කිරීම සිදු කරන අතර නව ක්‍රමවේදයන් හඳුන්වා දෙයි. විශේෂිත දැනුමෙන් යුතු, ඒ සඳහාම කැප වූ දෙපාර්තමේන්තු බිහි කිරීම මගින් තාක්ෂණික පරිවර්තනය සංවිධානාත්මක පරිවර්තනයක් සමඟ අනුපූරක වී ඇත. අපගේ නිෂ්පාදන හා සේවාවන්ට වටිනාකමක් එකතු කිරීම සඳහා සහ අපගේ කාර්ය ප්‍රවාහය කාර්යක්ෂම කිරීම සඳහා ලේඛන කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර ඇත. පර්යේෂණ අංශය, නිමැවුම් හා බැංකුකරණ සංවර්ධන අංශය සමඟ නව නිෂ්පාදන, සේවා සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සඳහා තම අදහස් ඉදිරිපත් කිරීමට සේවක මණ්ඩලය නිරතුරුව දිරිමත් කරනු ලබයි.

යහපාලනය

බැංකුවේ වටිනාකම් සහ ආචාර ධර්ම එහි පාලන ව්‍යුහය හා එහි පද්ධති, ක්‍රියා පටිපාටි සහ තීරණ ගැනීම තුල පිළිබිඹු වේ. අපි ඉහළ මට්ටමේ ආචාර ධර්ම යහපාලනය සහ වෘත්තීමය භාවය කෙරෙහි කැපවී කටයුතු කරන අතර අපගේ සියලු ක්‍රියාවන්ට වග වෙනු ලැබේ. මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය සඳහා මුදල් යෙදවීම වැනි නීත්‍යානුකූල නොවන කටයුතුවලින් ජාතිය ආරක්ෂා කිරීම සඳහා වූ සිය වගකීම පිළිබඳව ලංකා බැංකුව නිරතුරුවම අවධානය යොමු කරයි. විවිධ වූ අංශ පිළිබඳ කටයුතු කරන කළමනාකරණ කමිටු මගින් ක්‍රියාත්මක කරන ක්‍රියා පටිපාටි මෙම කැපවීම තවත් ශක්තිමත් කරයි. අපගේ තැන්පත්කරුවන්ගේ අරමුදල් වල භාරකරු ලෙස අප සතු කාර්යභාරය නිසා අපගේ සියලු ක්‍රියාකාරකම් වල දී නිසි සැලකිල්ලක් දැක්විය යුතුය. අවදානම යන්න බැංකු කටයුතු වල දී ආවේණික වේ. කෙසේ වෙතත් ඉහළ වෘත්තීමය අවදානම් කළමනාකරණ ක්‍රියා පටිපාටි මගින් අපගේ තැන්පත්කරුවන්ට ඇති ඕනෑම අවදානමක් අවම කිරීමට අපි සෑම විටම උත්සාහ කරමු. ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි දැඩි ලෙස ක්‍රියාත්මක වන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වේ. දූෂණය, මුදල් විශුද්ධිකරණය, වංචා සහ වෙනත් සදාචාර විරෝධී හෝ නීති විරෝධී ගනුදෙනු පිළිබඳව වාර්තා කිරීම සඳහා සේවකයන් සහ සේවකයන් නොවන අයට හැකියාව ලබාදී ඇති "විස්ල් බ්ලෝවර්" ප්‍රතිපත්තිය අපට ඇති තවත් ආරක්ෂාකාරී පියවරක් වේ. මෙම ක්‍රමවේදය පොදුගලිකත්වය සුරකින අතර, ගැටළුව මතු කරන සියලු පාර්ශ්වයන් ආරක්ෂා කරයි.

අපගේ කාර්ය මණ්ඩලය සතු සමුච්චිත සේවා පළපුරුද්ද වසර 81,841 කි. මීට අමතරව, වසර 20 කට වැඩි කාලයක් පුරා සේවයේ නියුතු සේවා නියුක්තිකයින් සංඛ්‍යාව 1,336 ක් වේ. මෙය අපගේ මානව ප්‍රාග්ධනය සතු අත්දැකීම්වල අගය පෙන්නුම් කරයි. කාර්ය මණ්ඩලය ඔවුන් ලබාගත් දැනුම සහ සුදුසුකම් සඳහා පිළිගැනීමට ලක් කරනු ලැබේ. අපගේ කාර්ය මණ්ඩලය ඔවුන් ලබාගෙන ඇති දැනුම හා ඔවුන්ගේ කාර්යභාරය ඉටුකරන අතරතුර ලබා ගන්නා ඉගෙනුම් අත්දැකීම් තුළින් ගම්‍ය වන දැනුම් සංචිතයන් ගොඩ නංවා ඇත.

වගකීම තනි තනිව පැවරුන ද බැංකුවේ සියලුම තීරණ පාහේ ගනු ලබන්නේ සාමූහික පදනමකිනි. තනි පුද්ගලයකු වෙත පැවරෙන තීරණ ගැනීමේ බලය සීමිතය. එබැවින් මෙය වැඩි විනිවිද භාවයක් සහතික කරන අතර වංචා හෝ දූෂණ ඇතිවීමේ හැකියාව ද අවම කරයි.

(වැඩි විස්තර සඳහා පිටු අංක 68 වෙත යොමු වන්න).

අපගේ ආයතනික දැනුම් සංචිතය

වර්තමාන ව්‍යාපාරික පරිසරය තුළ ආයතනය සතු දැනුම් සංචිතය ඕනෑම ආයතනයක වැදගත් අස්පෘශ්‍ය වත්කමක් බවට පත් වී ඇත. ආයතනය සතු සාමූහික දැනුම සහ සේවා නියුක්තිකයින් සතු දැනුම යන දෙයාකාරයෙන්ම මෙම දැනුම පවතී. බැංකුව යනු ඉගෙනුම් ආයතනයක් වන අතර සිය ඉගෙනුම් අත්දැකීම් ඔස්සේ එහි ආයතනික ව්‍යුහයන්, පද්ධති සහ ක්‍රියා පටිපාටි අඛණ්ඩව නිර්වචනය කරයි.

සියලුම සේවකයින් තුළ අවශ්‍ය දැනුම සහ නිපුණතා ගොඩනැංවීම සේවක මට්ටමේදී අපගේ ප්‍රධාන උපාය මාර්ගයන්ගෙන් එකකි. අපගේ සියලුම සේවකයින් ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමට අවශ්‍ය පුහුණුව ලබන බවට අපි සහතික වෙමු.

අපගේ කාර්යමණ්ඩලය සතු සමුච්චිත සේවා පළපුරුද්ද වසර 81,841 කි. මීට අමතරව, වසර 20 කට වැඩි කාලයක් පුරා සේවයේ නියුතු සේවා නියුක්තිකයින් සංඛ්‍යාව 1,336 ක් වේ. මෙය අපගේ මානව ප්‍රාග්ධනය සතු අත්දැකීම්වල අගය පෙන්නුම් කරයි. කාර්ය මණ්ඩලය ඔවුන් ලබාගත් දැනුම සහ සුදුසුකම් සඳහා පිළිගැනීමට ලක් කරනු ලැබේ. අපගේ කාර්ය මණ්ඩලය ඔවුන් ලබාගෙන ඇති දැනුම හා ඔවුන්ගේ කාර්යභාරය ඉටුකරන අතරතුර ලබා ගන්නා ඉගෙනුම් අත්දැකීම් තුළින් ගම්‍ය වන දැනුම් සංචිතයන් ගොඩ නංවා ඇත. කාලයත් සමඟම ප්‍රතිපත්ති, පද්ධතීන් සහ ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම සඳහා ඔවුන් දක්වන දායකත්වය තුලින් මෙම ගම්‍ය ව්‍යංගික දැනුම ආයතනගත දැනුම බවට පරිවර්තනය කරනු ඇත. ඒ අනුව මෙම ඉගෙනුම් ක්‍රියාවලිය කෙටි හා දිගු කාලීන වශයෙන් අගය එකතු කිරීමේ මාධ්‍යයක් බවට පත්වේ.

දැනුම ව්‍යාප්ත කිරීම

අපගේ ආයතනික කළමනාකාරිත්ව සාමාජිකයින්ගේ අත්දැකීම් බැංකු කර්මාන්තය තුළ විවිධ ක්ෂේත්‍රවල වසර 20 සිට 38 ක කාලයක් දක්වා විහිදේ. එම නිසා ඔවුන් සාමූහිකව රැගෙන එන දැනුම් සංකලනය සහ අත්දැකීම් අති මහත්ය. හොඳින් සැලසුම් කළ කුසලතා කළමනාකරණය කිරීමේ ක්‍රියාවලීන් හා කාලෝචිත ආකාරයෙන් ක්‍රියාත්මක කළ වගකීම් පැවරීම මඟින් මෙම ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම දෙවන පෙළ නායකත්වයක් ගොඩනගනු ඇත. මෙම ක්‍රියාවලිය තුළින් ඔවුන්ගේ දැනුම සහ අත්දැකීම් පහළ පෙළ සඳහා ව්‍යාප්ත කර ඇත.

බැංකුව සියලුම කාර්යමණ්ඩලයට සිදු කරන ස්ථාන පරීක්ෂණයන් හරහා සහ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය තුළින් බෙදාහැරීමේ සටහන් පත්‍රිකා සහ පුවත් පත් ලිපි මඟින් මෙම දැනුම සිය නව කාර්ය මණ්ඩලය වෙත බෙදාහැරීමේ ක්‍රියාවලියේ නිරත වී සිටියි.

පුද්ගලයන් තුළ රැඳී ඇති අත්දැකීම් සහ දැනුම ආයතනගත කිරීම සඳහා කාර්යක්ෂම සහ නව ඉගෙනුම් ක්‍රම ද සිය නව ආයතනික සැලසුම් තුළ හඳුන්වා දී ඇත. අපගේ වෙළඳ නාමය සඳහා ඇති පිළිගැනීම සමඟ සංකලනය වී ඇති අපගේ වටිනාකම්, සංස්කෘතිය, ආචාරධර්ම සහ ආයතනික දැනුම, ආයතනික ප්‍රාග්ධනය අනුව අපව කර්මාන්තය තුළ ඉදිරියෙන්ම තබනු ලබයි.

ශ්‍රී ලංකාවේ අංක 01 සන්නාම නාමය



ශ්‍රී ලංකාවේ අංක 01 සන්නාම නාමය
ඉන්ටර්බ්‍රෑන්ඩ් 2017



ග්ලෝබල් මාස්ටර් බ්‍රෑන්ඩ් ආසියාවේ ප්‍රධාන
අලෙවිකරණ නිලධාරීන්ගේ සංගමය



ශ්‍රී ලංකාවේ අංක 01 සන්නාමය
බ්‍රෑන්ඩ් ඇනුවල් 2017

විශිෂ්ට කාර්යසාධනය



ලොව විශිෂ්ටතම බැංකු 1000 අතරට
ද බෑන්කර් සඟරාව (එක්සත් රාජධානිය)



ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම සහකාර බැංකුව
(ටී එෆ් පී ආසියානු සංවර්ධන බැංකුව)



වසරේ මහජන සේවා සන්නාමය (SLIM)
නිල්සන් මහජන සම්මාන 2017/2018



රාජ්‍ය අංශයේ විශිෂ්ටතම
බැංකුව BFSI සම්මාන

වාර්ෂික වාර්තාව සඳහා සම්මාන



රාජ්‍ය අංශයේ
බැංකු - රන්
සම්මානය
ශ්‍රී ලංකා වරලත්
ගණකාධිකාරී
ආයතනයේ වාර්ෂික
වාර්තාව සම්මාන



විශිෂ්ටතම දේශීය
වාර්තාව -
රන් සම්මානය
විෂන් සම්මාන
(LACP)



ප්ලැටිනම් සම්මානය
හොඳම බැංකු අංශයේ
වාර්ෂික වාර්තාව
විෂන් සම්මාන (LACP)



රන් සම්මානය
(ජාත්‍යන්තර) හොඳම
මූල්‍ය තොරතුරු
(ARC) සම්මාන



රිදී සම්මානය
(ජාත්‍යන්තර)
සාම්ප්‍රදායික වාර්ෂික
වාර්තා බැංකු අංශය
(ARC) සම්මාන



කුසලතා සම්මානය
රාජ්‍ය අංශයේ
ව්‍යාපාර CMA
විශිෂ්ටතා සමෝධානික
වාර්තාකරණ සම්මාන



දෙවන ස්ථානය
රාජ්‍ය අංශයේ බැංකු
ආයතන SAFA
සම්මාන 2016

මානව කළමනාකරණ සම්මාන



ආසියාවේ විශිෂ්ටතම
සේවායෝජක සන්නාමය
සේවායෝජක
සන්නාම සම්මාන - ඉන්දියාව



ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම
සේවායෝජක සන්නාමය
සේවායෝජක
සන්නාම සම්මාන -ඉන්දියාව



රිදී සම්මානය
SLITAD ජනතා
දිරිගැන්වීම් සම්මාන

තොරතුරු තාක්ෂණික දිරිගැන්වීම් සම්මාන



ටෙක්නොවේෂන් සම්මාන - අන්තර් බැංකු ගනුදෙනු
සමස්ත/ගනුදෙනුකාර පහසුව/මූල්‍ය ඇතුලත්කරණය - ජයග්‍රාහක

තිරසාර/CSR සම්මාන



රන් සම්මානය හරිත බැංකුකරණය
(කැකිරාව ශාඛාව) ශ්‍රී ලංකා හරිත
ගොඩනැගිලි කවුන්සිලය



ආර්ථික තිරසාරභාවය (ලාභදායීත්වය)
ත්‍රිත්ව ලාභදායීතා ජයග්‍රාහක හොඳම
ආයතනික පුරවැසි තිරසාර සම්මාන
ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය



ආර්ථික දායකත්ව අංශයේ ජයග්‍රාහක
හොඳම ආයතනික පුරවැසි
තිරසාර සම්මාන ශ්‍රී ලංකා
වාණිජ මණ්ඩලය



පුනර්ජනනීය බලශක්තිය නැංවීම උදෙසා
සූර්ය බල සංග්‍රාමය සම්මානය බලශක්ති
සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙන එන සබඳතා පෝෂණය කරමින්



ගනුදෙනුකරුවන්

මිලියන 13

ශාඛාවන් සහ සීමිත සේවා සැපයුම් ශාඛාවන්

626

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ ස්වයංක්‍රීය මුදල් තැන්පතු යන්ත්‍ර ජාලය

932

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මධ්‍යස්ථාන

15

ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන

14

නියෝජිත බැංකු ජාලය

859

ආයතනික සමාජ වගකීම සඳහා දායකත්වය

රු. **මිලියන 127.5**

"ස්මාර්ට්පේන්" ගිණුම් වර්ධනය

93%

අන්තර්ජාල බැංකුකරණ වර්ධනය

38%

ශාඛා බැංකුකරණ අංශයේ තැන්පතු

රු. **ට්‍රිලියන 1.0** ඉක්මවයි

"මිතුරු" ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන හරහා මූල්‍ය ඇතුළත්කරණය

18,250

"මිතුරු" කණ්ඩායම් ගණන

444

"මිතුරු" සමාජ ගණන

සාමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය

ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රය පෙර නොවූ තරම් වඩා තරඟකාරී වන අතර, පාරිභෝගික සේවාව සහ පහසුව වැනි සාධක ගනුදෙනුකරුවන් සොයන විශේෂිත ලක්ෂණ වේ. දිවයින පුරා විහිදී ශාඛා 575 ක් සහ සීමිත සේවා සැපයුම් ශාඛා 48 ක් සහිත විස්තීර්ණ ශාඛා ජාලය සමඟ, බොහෝ ව්‍යාපාර වලට ලඟා කර ගැනීමට අපහසු වූ ශක්තිමත් භූගෝලීය ප්‍රවේශයක් ලංකා බැංකුව පවත්වා ගනී.

පාර්ශ්වකරුවන්


බැංකුවේ ප්‍රධානතම පාර්ශ්වකරුවන් ලෙස රජය, සේවකයන්, ගනුදෙනුකරුවන්, ආයෝජකයන්, නියාමකයන්, සැපයුම්කරුවන් සහ සමස්ථයක් ලෙස එය ක්‍රියාත්මක වන සාමාජය ඇතුළත් වේ. බැංකුවේ ගනුදෙනුකරුවන් ප්‍රධාන කාණ්ඩ දෙකකි. එනම් තැන්පත්කරුවන් හා ණයගැතියන් වේ.

ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රය පෙර නොවූ තරම් වඩා තරඟකාරී වන අතර, පාරිභෝගික සේවාව සහ පහසුව වැනි සාධක ගනුදෙනුකරුවන් සොයන විශේෂිත ලක්ෂණ වේ. දිවයින පුරා විහිදී ශාඛා 575 ක් සහ සීමිත සේවා සැපයුම් ශාඛා 48 ක් සහිත විස්තීර්ණ ශාඛා ජාලය සමඟ, බොහෝ ව්‍යාපාර වලට ලඟා කර ගැනීමට අපහසු වූ ශක්තිමත් භූගෝලීය ප්‍රවේශයක් ලංකා බැංකුව පවත්වා ගනී.

ඊට අමතරව, ජංගම ශාඛා 02 ක් හඳුන්වාදීම, ගනුදෙනුකරුවන්ට වඩා කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ශාඛා 41 ක් වැඩි දියුණු කිරීම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 86 ක් හා ස්වයංක්‍රීය මුදල් තැන්පතු යන්ත්‍ර 45 ක් ස්ථාපනය කිරීම මෙම වසර තුළදී සිදු කරන ලදී. ජාතියේ මහා පහන් ටැඹ ලෙස, අපි හැම විටම අපගේ ජනතාව වෙත ඔවුන්ගේ සමාජ තත්ත්වය නොසළකා හොඳම දේ ලබා දීම සඳහා පෙරමුණ ගෙන සිටිමු. අපි හැමවිටම නගරයේ සිට ග්‍රාම්‍ය ප්‍රදේශ වෙත තාක්ෂණය රැගෙන යාමේ මූලික පියවර ගෙන සිටිමු. උදාහරණ ලෙස, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ විශේෂයෙන් ස්වයංක්‍රීය මුදල් තැන්පතු යන්ත්‍ර හඳුන්වා දීම පෙන්වා දිය හැක. තාක්ෂණය සුළු පිරිසකට සීමා නොකොට බොහෝ දෙනෙකු වෙත ගෙන යාමේ අපගේ ප්‍රයත්නය මුළුමනින්ම පාහේ සාර්ථක වී ඇත. බිම් මට්ටමේ සිටින ගනුදෙනුකරුවන්ගේ පවා වෙනස් වන පැතිකඩයන් සහ වැඩි දියුණු කරන ලද සහ ඊළඟ මට්ටමේ මූල්‍ය සේවාවන් සඳහා ඔවුන්ගේ ඉල්ලුම මගින් මෙය පෙන්නුම් කරයි.


2017 වසර අවසන් වන විට, බැංකුව සියලුම ශාඛා ඵලදායීතාවය පිළිබඳ පංචවිධ සංකල්පයට (5S) අනුගත කර ඇත. "5S" සංකල්පයට අදාල පියවරයන් වනුයේ සංවිධිත බව, සුපිළිවෙල, සුපිරිසිදුකම, සම්මිතිය හා ශික්ෂණයයි. මෙම සංකල්පය නාස්තිය හා අපතේයාම් අවම කරන අතරම වැඩ පරිසරය හොඳින් සංවිධානය හා කළමනාකරණය කිරීමේ ක්‍රමෝපායක් ලෙස ක්‍රියා කරයි. මෙය සාර්ථකව ක්‍රියාවට නැංවීම මගින් ගිණුම් විවෘත කිරීම සහ ණය අයදුම්පත්‍ර සැකසීම වැනි සාමාන්‍ය බැංකු සේවාවන්ට අදාල වැදගත් ක්‍රියාවලි වැඩි දියුණු කිරීම හා පූරක කාලය අඩු කිරීම මගින් පාරිභෝගිකයන්ට වාසි හිමි වේ.

පාරිභෝගික සේවා සඳහා ගතවන කාලය



A ඉතුරුම් ගිණුම් ඇරඹීම
B ස්ථාවර ගිණුම්
C මුදල් තැන්පතු/ආපසු ගැනීම්
D උකස් කිරීම්
E මුදල් සුරැකුම් මත පහසුකම්

වෙනත් බැංකු කටයුතු



ගනුදෙනුකරුවන් සමඟ සබඳතා

ලංකා බැංකුව විවිධ මාර්ග ඔස්සේ සිය වර්තමාන හා ආශ්‍රිත ගනුදෙනුකරුවන් සමඟ සබඳතා පවත්වයි.

ශාඛා ජාලය

පුළුල් ශාඛා ජාලය ඔස්සේ ලංකා බැංකුව සිය ගනුදෙනුකරුවන් සමඟ සෘජු සම්බන්ධතාවයක් පවත්වයි. සරල ඉතිරි කිරීමේ ගිණුම් වල සිට නව තාක්ෂණය මත පදනම් නිමැවුම් දක්වා වන විස්තීර්ණ සේවාවන් පෙළක් තුළින් බැංකුව සිය ගනුදෙනුකරුවන්ගේ විවිධ වූ අවශ්‍යතා සපුරාලයි.

ලංකා බැංකුවේ වෙබ් අඩවිය

වෙබ් අඩවිය ගනුදෙනුකරුවන් වෙත බොහෝ ප්‍රයෝජනවත් තොරතුරු සපයයි. ගනුදෙනුකරුවන්ට වඩාත්ම උචිත ශාඛාව සොයාගැනීම සඳහා ශාඛා ජාලය පහසුවෙන් නිරීක්ෂණය කළ හැක. ශාඛා ගනුදෙනුකරුවන්ට ඔවුන්ට ලබා ගත හැකි විවිධ වර්ගයේ නිමවුම් පිළිබඳ, විශේෂයෙන්ම ඉතිරි කිරීම් ගිණුම් පිළිබඳ තොරතුරු ලබා ගත හැක. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට විවිධ අංශ සඳහා ලබා දෙන විවිධ ණය යෝජනා ක්‍රම පිළිබඳ විස්තරාත්මක තොරතුරු ලබා දෙයි. විනිමය අනුපාත, ණය/හර කාඩ්පත් ප්‍රවර්ධනය වැනි තොරතුරු සහ ණය ගණනය කිරීමේ ක්‍රමවේදයන් වැනි ප්‍රයෝජනවත් මෙවලම් ද එහි ඇත. “apply online” පහසුකම හරහා ගනුදෙනුකරුවන්ට පුද්ගලික ණය හා නිවාස ණය සඳහා අයදුම් කළ හැකිය. එබැවින් ගනුදෙනුකරුවන් පෙළඹවීම සඳහා මෙම වෙබ් අඩවිය ප්‍රයෝජනවත් මෙවලමකි.

සමාජ මාධ්‍ය ජාල

බැංකුව ෆේස් බුක්, ට්විටර්, ලින්ක්ඩ්ඉන් සහ යූ ටියුබ් වැනි විවිධ සමාජ මාධ්‍ය ජාල නියෝජනය කරයි. මෙම මාධ්‍යයන් බැංකුවට සිය ගනුදෙනුකරුවන් වෙත ළඟා වීමට, නව සැපයුම් හා ප්‍රවර්ධනයන් පිළිබඳ තොරතුරු ලබා දීමට සහ වැඩිදුර තොරතුරු ලබා ගැනීමට ඔවුන් වෙත පිවිසීමට උපකාර කරයි. මෙම සමාජ මාධ්‍ය භාවිතා කරමින් ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ අදහස් බැංකුව වෙත ඉදිරිපත් කළ හැකිය.

ඇමතුම් මධ්‍යස්ථානය

ඇමතුම් මධ්‍යස්ථානය අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනය සඳහා වන මාධ්‍යයක් ලෙස යොදා ගනී. එය අපගේ සේවාවන් පිළිබඳ තොරතුරු සඳහා වන ඉල්ලීම් වලට පිළිතුරු සැපයීම සිදු කරයි. ඇමතුම් මධ්‍යස්ථානය පැය 24 ම ක්‍රියාත්මක වේ.

කෙටි පණිවිඩ බැංකුකරණය

විශේෂිත පාරිභෝගික කණ්ඩායම් ඉලක්ක කර ඔවුන් වෙත වෙළඳපොල තොරතුරු ලබා දීම සඳහා මෙය භාවිතා කරයි. එමෙන්ම, එය ගනුදෙනුකරුවන්ට සිය ගිණුම් වල ක්ෂණික යාවත්කාලීන තොරතුරු ලබා දීමට හා ඔවුන්ගේ ණය වාරිකයන් සිහිපත් කිරීම සඳහා ද යොදා ගැනේ.

දැන්වීම්

විවිධ නාලිකා ඔස්සේ සිදු කරන දැන්වීම් තුළින්, බැංකුවේ නිමැවුම් හා සේවාවන් ප්‍රවර්ධනය කිරීම, ගනුදෙනුකරුවන් දැනුවත් කිරීම, සන්නාම නාම දෘෂ්‍යතාව, සන්නාම නාම දැනුවත්භාවය හා ප්‍රතිරූපය වැඩි දියුණු කිරීම සිදු කරයි.

බැංකුව සඳහා ඇති අවසාන අරමුණ වන්නේ විශ්වාසය හා රහස්‍යභාවය මත පදනම් වූ දිගුකාලීන, තිරසාර, අනෙක්‍යන්‍ය වශයෙන් ප්‍රතිලාභ ගෙන එන සබඳතා ඇති කර ගැනීම හා පවත්වා ගැනීමයි.

සේවා මධ්‍යස්ථාන ව්‍යාප්තිය

ශාඛා මධ්‍යස්ථාන



උතුරු පළාත

63	05	51	09	01	01

උතුරු මැද පළාත

49	02	65	15	01	02

නැගෙනහිර පළාත

55	03	42	06	01	01

වයඹ පළාත

57	02	76	18	02	02	01

මධ්‍යම පළාත

67	04	82	15	02	01

බස්නාහිර පළාත

125	12	230	58	01	03	01

ඌව පළාත

39	02	52	12	02	01

සබරගමුව පළාත

49	02	62	12	02	01

දකුණු පළාත

64	03	81	20	03	02

ආයතනික හා විදේශීය සේවා මධ්‍යස්ථාන


ආයතනික ශාඛා	5	13	17	3
ප්‍රමුඛ බැංකු ශාඛා	1	–	1	–
විදේශීය ශාඛා	3	–	4	–
අක්වෙරළ බැංකු ශාඛා	1	–	–	–
ජංගම ඒකක	–	–	1	–

මුළු සේවා මධ්‍යස්ථාන

ශාඛා	සීමිත සේවා සැපයුම් ශාඛා	පංගම ශාඛා	ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර	මුදල් තැන්පතු යන්ත්‍ර	සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය මධ්‍යස්ථාන	ප්‍රාදේශීය ණය මධ්‍යස්ථාන
578	**48**	**2**	**764**	**168**	**15**	**14**

මෙහෙයුම් අංශ

බැංකුවේ ප්‍රධානතම මෙහෙයුම් අංශ තුනකි. එනම්, ශාඛා බැංකුකරණය, ආයතනික හා අක්වෙරළ බැංකුකරණය සහ ජාත්‍යන්තර, භාණ්ඩාගාර හා ආයෝජන අංශයයි.




ශාඛා බැංකුකරණය


ශාඛා බැංකුකරණය සම්ප්‍රදායික බැංකු ක්‍රමයක් ලෙස බැංකුව හඳුනා ගන්නා අතර කුඩා පරිමාණ ව්‍යාපාර මට්ටමේ සිට ආයතනික මට්ටම දක්වා හා ඈත එපිට ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ සිට ධනවත් පාරිභෝගිකයන් දක්වා වන පුළුල් පරාසයක ගනුදෙනුකරුවන් මෙම අංශයෙන් ආවරණය වේ. මෙම අංශය යටතේ පිරිනමන නිමැවුම් වන්නේ, ඉතුරුම් ගිණුම්, ස්ථාවර තැන්පතු, ජංගම ගිණුම්, පුද්ගලික ණය, නිවාස ණය, වාණිජ ණය, සංවර්ධන ණය, සුළුදු මූල්‍ය ණය, උකස් ගනුදෙනු, කල්බදුකරණය හා ණය කාඩ්පත් ආදිය වේ.

ශාඛා බැංකුකරණ අංශය මගින් හැම සමාජ තලයකටම අයත් අයවළුන් සඳහා නිමැවුම් පිරිනමයි. තරුණ තරුණියන්, කාන්තාවන්, ළමුන් සහ ජ්‍යේෂ්ඨ පුරවැසියන් සඳහා අප ඉතුරුම් නිෂ්පාදන පිළිගන්වා ඇත. අප විසින් මෙම විශේෂ කණ්ඩායම්වලට අදාළ ඉතුරුම් නිෂ්පාදන සඳහා විශේෂ පොළී අනුපාතයන් ද පිරිනමා ඇත. ණය කළඹින් 40% ක් දරණ බැවින්, ලංකා බැංකුවට උපායමාර්ගික අතින් මෙම අංශය ඉතා වැදගත් වේ. එසේම බැංකුවේ බදු ගෙවීමට පෙර ලාභය සඳහා මෙම අංශයේ දායකත්වය 55% කි.

ශාඛා බැංකුකරණ ණය කළඹේ සංයුතිය




පළාත් අනුව තැන්පතු බෙදීයාම




ණය කාඩ්පත්/හර කාඩ්පත්

ලංකා බැංකුවේ ණය කාඩ්පත්, ශ්‍රී ලංකාවේ 6,000 කට අධික අලෙවිකරුවන් විසින් හා ලොව පුරා මිලියන 20 කට අධික වෙළඳ ප්‍රජාව විසින් පිළිගැනේ. අපගේ හර කාඩ්පත ද මෙලෙසම පිළිගැනීමට ලක්වන අතර එය ස්වයංක්‍රීය ටෙලර් කාඩ්පතක් ලෙස හා විචක්ෂණශීලී වියදම් සහතික කරන මාධ්‍යයක් ලෙස ද්විත්ව කාර්යයක් ඉටුකරයි. 2017 දී ණය කාඩ්පත් 15,684 ක් සහ හර කාඩ්පත් 883,939 ක් නිකුත් කරන ලදී. වර්ෂය තුළදී ණය කාඩ්පත් සහ හර කාඩ්පත් පිළිවෙලින් 12% කින් හා 18% කින් ඉහළ ගොස් ඇත.


හර කාඩ්පත් ගනුදෙනු සංඛ්‍යාව



ණය කාඩ්පත් ගනුදෙනු



පළාත් අනුව ණය ව්‍යාප්තිය



වසර තුළ උපායමාර්ගික ප්‍රමුඛතා

ලංකා බැංකුව, පාරිභෝගික සේවාව වැඩි දියුණු කිරීමට හා ගනුදෙනුකරුවන්ගේ බැංකුකරණ අත්දැකීම් කරදරයකින් තොරව පහසුවෙන් ඉටු කර ගැනීමට හා පාරිභෝගිකයින් සවිබල ගැන්වීම කෙරෙහි අවධානය යොමු කරයි. මේ අනුව, ඩිජිටල් බැංකුකරණය කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කර ඇත. 2017 අවසන් වන විට, මුදල් තැන්පතු හා මුදල් ආපසු ලබා ගැනීම් සඳහා වන කෙටි පණිවිඩ සේවාව සඳහා ගනුදෙනුකරුවන් 290,221 ක් ලියාපදිංචි වී ඇත. මෙම සේවාව මගින් දිනකට සාමාන්‍යයෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගනුදෙනු වලට අදාලව කෙටි පණිවිඩ 5000 ක් පමණ නිකුත් කරනු ලැබේ. දිවයින පුරා විහිදි මුදල් තැන්පතු යන්ත්‍ර 168 කින් දිනකට සාමාන්‍යයෙන් තැන්පතු 27,047 ක් ලබා ගන්නා අතර වසර තුළදී රු. බිලියන 265 ක් වටිනා ගනුදෙනු සිදු කරන ලදී. විද්‍යුත් බැංකු ප්‍රකාශන සඳහා ලියාපදිංචි වූ 135,540 ක් වූ ගනුදෙනුකරුවන් අතරින් 40% ක් 2017 දී ලියාපදිංචි වී ඇත. තවද, වර්ෂය තුළදී පාරිභෝගික පැමිණිලි හැසිරවීමේ ප්‍රතිපත්තිය තවදුරටත් ශක්තිමත් කර ඇති අතර, පාරිභෝගික පැමිණිලි මධ්‍යගතව හැසිරවීම සඳහා ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ ඒකකයක් ද පිහිටවිය.

තවදුරටත් බැංකුවේ ආයතනික සැලැස්ම තළින් සේවා ආරක්ෂණය, පාරිභෝගිකයා වෙත ළඟාවීම, තාක්ෂණය සහ සයිබර් ආරක්ෂණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත.

ඩිජිටල් බැංකුකරණය

වර්ෂය තුළදී අලෙවිකරුවන් 1,435 ක් එකතු වූ අතර මුළු අලෙවිකරුවන් සංඛ්‍යාව 4,216 කි.

"ස්මාර්ට් පාස් බුක්" යෙදුම සඳහා ලියාපදිංචි වූ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව 41,567 කි.

අන්තර්ජාල බැංකුකරණය සඳහා ලියාපදිංචි වූ මුළු පාරිභෝගික සංඛ්‍යාව 247,635 ක් වන අතර වසර තුළදී 68,887 ක් (වර්ධනය 38%) ලියාපදිංචි වී ඇත.

විද්‍යුත් බැංකු ප්‍රකාශන සඳහා ලියාපදිංචි වූ මුළු පාරිභෝගික සංඛ්‍යාව 135,540 ක් වන අතර වසර තුළදී 54,302 ක් (වර්ධනය 67%) ලියාපදිංචි වී ඇත.

BOC SMARTGEN
my savings, my convenience

"ස්මාර්ට්පෙන්" ගිණුම් වර්ධනය:

2017 වසර අවසානයේ දී "ස්මාර්ට්පෙන්" ගිණුම් සඳහා ලියාපදිංචි වූ මුළු පාරිභෝගික සංඛ්‍යාව 196,343 ක් වන අතර වසර තුළදී 94,640 ක් (වර්ධනය 93%) ලියාපදිංචි වී ඇත.

2017 දී පාරිභෝගික පහසුව සඳහා හඳුන්වා දුන් නව පිරිනැමුම්

B යෙදුම

B යෙදුම ගනුදෙනුකරුගේ එදිනෙදා ගනුදෙනු කළමනාකරණය කිරීම සඳහා උපකාරීවේ. මෙම යෙදුම හරහා ඕනෑම තැනක සිට ඕනෑම වේලාවක ගනුදෙනුකරුට සිය සියලුම ගිණුම් මෙහෙය විය හැකිය.

බහු මුදල් පෙර ගෙවුම් සංචාරක කාඩ්පත



බහු මුදල් පෙර ගෙවුම් සංචාරක කාඩ්පත, විදෙස් සංචාර සඳහා විදේශ මුදල් නෝට්ටු රැගෙන යාමෙන් පාරිභෝගිකයා නිදහස් කරයි.

ස්මාර්ට් ස්ථාවර තැන්පතු

BOC SMART FD

නිර්ලේඛන ස්ථාවර තැන්පතු ක්‍රමයකි.

ලංකා බැංකුවේ "ස්මාර්ට් පාස් බුක්" යෙදුම හඳුන්වාදීම



මෙය ජංගම යෙදුමක් වන අතර තත්කාලීන ගිණුම් ගනුදෙනු, ගිණුමේ ශේෂය, ගිණුමේ අවසන් ගනුදෙනු 15, වර්තමාන හා පසුගිය මාසයේ ගිණුම් ප්‍රකාශනයන් ජංගම උපාංග තුළින් පෙන්නුම් කරයි.

බිල්පත් ගෙවීමේ "කියොස්" පහසුකම්



මෙම යන්ත්‍ර මගින් ගනුදෙනුකරුවන්ට ශාඛා වෙත ඇතුල් නොවී, පෝලිම් වල රැඳී නොසිට පැය 24 පුරා තම බිල්පත් ගෙවීමට හැකියාව ඇත.

සියලුම ශාඛා වල පහත ව්‍යාපාර ක්‍රියාවලින් ස්වයංක්‍රියව සිදු කිරීම අරඹන ලදී.

- පුද්ගලික ණය කාර්ය පටිපාටිය, නිවාස ණය කාර්ය පටිපාටිය, ව්‍යාපාරික ණය කාර්ය පටිපාටිය, ජංගම හා ඉතිරිකිරීම් ගිණුම් ආරම්භ කිරීම, ස්ථාවර නියෝග සැකසීම, පැමිණිලි හැසිරවීම සහ ගනුදෙනුකාර ලිපි ලේඛන හුවමාරුව.
- ඩිජිටල් බැංකුකරණය පිළිබඳව අවධානය යොමු කරමින් 2017 වසරේ දී විද්‍යුත් බැංකු සේවා සඳහා සැලකිය යුතු ගනුදෙනුකරුවන් සංඛ්‍යාවක් ලියාපදිංචි වී ඇත. මෙය හරිත බැංකුකරණය ක්‍රියාත්මක කිරීමේලා බැංකුව ගන්නා ලද ප්‍රධාන මූලික පියවරකි.

මූල්‍ය ඇතුළත්කරණය පෝෂණය කිරීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ආර්ථිකයේ කොඳුනාරටිය නිර්මාණය කිරීමට විශාල වශයෙන් දායක වේ. 2017 දී ලංකා බැංකුවේ සුළු හා මධ්‍ය පරිමාණ ණය කළඹ රු. බිලියන 60 කි. අප සතුව විවිධ ආර්ථික අංශ හා අවශ්‍යතාවයන්ට ගැලපෙන එකිනෙකට වෙනස් වූ සුළු හා මධ්‍ය පරිමාණ නිමැවුම් ඇත.

අපගේ ණය යෝජනා ක්‍රම තුළින් කෘෂි කර්මාන්තය, කිරි නිෂ්පාදනය, ධීවර කර්මාන්තය සහ වැවිලි භෝග වැඩි දියුණු කිරීමට අනුග්‍රහය දක්වයි. පුනර්ජනනීය බල ශක්තිය සඳහා ද ණය යෝජනා ක්‍රම පවතියි. ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රම මඟින් නව ව්‍යවසායන් ආරම්භ කිරීමට කුඩා, බිම් මට්ටමේ ව්‍යවසායකයන්ට අතහිත දෙනු ලැබේ. මීට අමතරව, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා කාරක ප්‍රාග්ධන පහසුකම් හා උපකරණ මිලදී ගැනීම සඳහා ණය සැපයීම අප විසින් සිදු කරයි. උතුරු හා නැගෙනහිර පලාත්වල ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා විශේෂයෙන් සකස් කරන ලද ණය යෝජනා ක්‍රම ඇත.

බැංකුව සිය ඉතුරුම් යෝජනා ක්‍රම මඟින් සහ සුළු හා මධ්‍ය පරිමාණ/ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රම මඟින් මූල්‍ය ඇතුළත්කරණය දිරිගන්වයි. මූල්‍ය ඇතුළත්කරණය හා සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම අපගේ සමාජ වගකීම් වල කොටසකි.

වර්ෂය තුළ ලියාපදිංචි කරන ලද "මිතුරු" සමාජ සාරාංශය:

පළාත	ශාඛාව	ලියාපදිංචි වූ "මිතුරු" සමාජ සංඛ්‍යාව
නැගෙනහිර පළාත	මොල්ලිපොතාන	1
	කලවන්චිකුඩි	1
	වෙන්කලාඩි	1
එකතුව		**3**
උතුරු මැද පළාත	නොච්චියාගම	1
	බකමූණ	1
එකතුව		**2**
උතුරු පළාත	කන්කසන්තුරේ	1
එකතුව		**1**
ඌව පළාත	ලුණුවත්ත	3
	ඌව පරණගම	1
එකතුව		**4**
මුළු එකතුව		**10**

"මිතුරු" ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන බැංකුවේ අරමුදල් හරහා සිදුකෙරේ. මෙම වැඩසටහන සඳහා බැංකුව විසින් රු. මිලියන 237.2 ක් වසර තුළ දී වැයකර ඇති අතර මිතුරු කණ්ඩායම් 277 ක් සහ මිතුරු සමාජ 10 ක් පිහිටුවා ඇත. එසේම බැංකුව විසින් සංවිධානය කරන ලද මිතුරු පොළ හරහා මිතුරු සමාජ තුළින් ගොඩනංවන ලද ව්‍යවසායකයින් හට ඔවුන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීමට ද බැංකුව උපකාර කර ඇත. 2017 දෙසැම්බර් 31 දිනට ලියාපදිංචි කරන ලද මිතුරු කණ්ඩායම් 18,250 ක් හා මිතුරු සමාජ 444 ක් විය.

වසර තුළ දී බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ක්ෂුද්‍ර මූල්‍ය යෝජනා ක්‍රම පහත දැක්වේ. මෙම කාණ්ඩ යටතේ වසර තුළ දී උපයෝජනය වූ මුළු මුදල රු. මිලියන 287.3 කි.

1. ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන (NA Dep) – වර්ෂය තුළ නව පහසුකම් 151 කි.
2. තරුණ දිරිය - වර්ෂය තුළ නව පහසුකම් 390 කි.
3. 4 P මොඩියුලය යටතේ කුඩා වතු ගොවීන් සඳහා ණය පහසුකම් වර්ෂය තුළ 2,311 කි.

වර්ෂය තුළ දී මධ්‍යම, උතුරු මැද, වයඹ, උතුරු හා බස්නාහිර යන පළාත් වල සුළු හා මධ්‍ය පරිමාණ ණය පහසුකම් ඇගයීමට ලක් කිරීම හා කඩිනම් කිරීම සඳහා විශේෂ කාර්ය මණ්ඩල පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.

දරිද්‍රතාවය තුරන් කිරීම

1 දරිද්‍රතාවයෙන් තොරවීම

සමාජ පිරමීඩයේ පතුලේ සිටින අයට ණය සහ අනෙකුත් මූල්‍ය සේවාවන්ට ප්‍රවේශය ලබාදීම මඟින් මෙම ඉලක්කයට බැංකු වලට දායකවිය හැකි බව හඳුනාගෙන ඇත. බැංකුවේ "මිතුරු" ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන මඟින් බිම් මට්ටමේ ව්‍යවසායකයන්ට මූල්‍ය පහසුකම් සපයන අතර ඔවුන්ගේ නිෂ්පාදන අලෙවිකර ගැනීමට අවශ්‍ය පහසුකම් ද සපයයි.

- **මිතුරු වැඩසටහන යටතේ වැයකර ඇති සම්පූර්ණ අරමුදල් - රු. මිලියන 237.2 කි.**
- **නව මිතුරු කණ්ඩායම් 277 ක් පිහිටුවා ඇත.**

සමාජ විෂමතා අවම කිරීම



බැංකුව විසින් සමාජය තුළ අවධානමට ලක් වූ ප්‍රජාවන් හඳුනාගෙන ඇති අතර වයස, ස්ත්‍රී පුරුෂභාවය හා සමාජ පන්තියට සම්බන්ධ වන සමාජයේ ආදායම් විෂමතා අඩුකිරීම සඳහා කැප වූ මූල්‍යමය නිෂ්පාදන හඳුන්වා දී තිබේ.

- **තරුණ පරපුර වෙනුවෙන් කැප වූ "තරුණ දිරිය" විශේෂ සංවර්ධන ණය යෝජනා ක්‍රමය - රු. මිලියන 99.0 බෙදා හැර ඇත.**
- **කාන්තාවන් හා තරුණයින් සඳහා වන කාන්තාරන් ගිණුම් හා 18+ ගිණුම් සඳහා විශේෂිත පොළී අනුපාත**

කුසගින්න තුරන් කිරීම



මෙම ඉලක්කයට අපගේ ප්‍රධාන දායකත්වය වූයේ කෘෂිකාර්මික අංශය සඳහා ලබාදුන් ණය මුදල් වන අතර එමඟින් ගොවීන්හට අත්‍යාවශ්‍ය ආහාර අත්‍යාවශ්‍ය පුද්ගලයින්ට දැරිය හැකි මිලකට සැපයීම කල හැකිය. සංවර්ධන බැංකු අංශය මඟින් පමණක් මෙම වසර තුළ කෘෂිකාර්මික හා සත්ව පාලන කටයුතු සඳහා වැයකර ඇති මුදල රු. බිලියන 2.8 කි.

- **වසර අවසාන වනවිට කෘෂි කර්මාන්තය හා ධීවර කටයුතු සඳහා ණය ලබාදීම රු. බිලියන 91.2 කි.**
- **"රන් අස්වනු" හා "ගොවි නවෝද" සංවර්ධන ණය යෝජනා ක්‍රම වල බැංකුවේ වෙළඳපොල කොටස පිළිවෙලින් 40% සහ 61% ඉක්මවයි.**

ශාඛා ණය හා අත්තිකාරම්

නිවාස ණය

බොහෝ පවුල් ඔවුන්ගේ සමාජ මට්ටම කුමක් වුවද, ඔවුන් කොතැනක ජීවත් වුවද, තමන්ටම අයිති වූ නිවසක ජීවත් වීමට සිහින දකියි. මෙම අභිලාෂය සපුරා ගැනීමට අවශ්‍ය මධ්‍යස්ථ පොළී අනුපාත හා වාසිදායක ආපසු ගෙවීමේ කාල සීමාවන් සහිත නිවාස ණය යෝජනා ක්‍රම බොහෝමයක් බැංකුව විසින් ලබාදෙයි. ශාඛා කාර්ය මණ්ඩලයට අමතරව ව්‍යාපාර සංවර්ධන නිලධාරීන් හා විශේෂ බාහිර විකුණුම් බලකායක් හරහා නිවාස ණය ප්‍රවර්ධනය කරන ලදී. වර්තමානයේ දී නිවාස ණය අන්තර්ජාලය ඔස්සේ ද අයදුම් කල හැකිය. ගනුදෙනුකරුවන්ට ණය අයදුම් පත්‍රයක් වැඩකරන දින 14ක් ඇතුළත දී බැංකුව වෙත දෙවරක් පමණක් පැමිණීමෙන් අනුමත කරගත හැකිය. රාජ්‍ය සේවකයින් සහ පුද්ගලික විදේශ මුදල් ගිණුම් පවත්වාගෙන යන විදේශගත ශ්‍රමිකයන් සඳහා බැංකුව සතුව විශේෂ සහන ණය යෝජනා ක්‍රම ඇත. ලංකා බැංකුවේ නිවාස ණය කළඹ රන් නිවස, සිරි මැදුර, රජයේ නිවාස ණය, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සහ පුද්ගලයින්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ (REPPIA) කාර්ය මණ්ඩලය සඳහා වන විශේෂ ණය යෝජනා ක්‍රම ආදී බොහෝ ණය යෝජනා ක්‍රම වලින් සමන්විත වේ. එසේම, වර්ග අඩි 1,000 ට අඩු නිවාස ඉදිකිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ හඳුන්වා දුන් ණය යෝජනා ක්‍රමයක් වන "සොඳුරු පියස" සඳහා බැංකුව විශාල දායකත්වයක් ලබා දී ඇත. මෙම ණය යෝජනා ක්‍රමයේ ලංකා බැංකුවේ වෙළඳපොල කොටස 80% ක් පමණ වේ. වසර තුළ නිවාස ණය අංශය 17% ක සැළකිය යුතු වර්ධනයක් ලබා ඇත.

පුද්ගලික ණය

පුද්ගලික ණය, ශාඛා ණය කළඹෙන් 36% ක් වේ. අන්තර්ජාලය ඔස්සේ ද පුද්ගලික ණය අයදුම් කල හැක. බැංකුව සමඟ හොඳ බැංකු සම්බන්ධතාවයක් පවත්වාගෙන යන ජංගම හෝ ඉතුරුම් ගිණුම් හිමියන් සඳහා පුද්ගලික ණය පහසුකම් ලබාගත හැකිය. අවශ්‍ය ලියකියවිලි අනුව පුද්ගලික ණය ලබාදීමේ ක්‍රියාවලිය සරල කර ඇත. එසේම, අප තරඟකාරී පොළී අනුපාතයන් ලබාදෙන අතර නිවාස වැඩි දියුණු කිරීම, පාසල් ගාස්තු, විවාහ මංගල්‍ය වියදම්, නිවාඩු ගත කිරීම, අනපේක්ෂිත වියදම් මෙන්ම පාරිභෝගික භාණ්ඩ මිලදී ගැනීම වැනි අවශ්‍යතා සඳහා ලංකා බැංකුවේ පුද්ගලික ණය ලබාගත හැකිය.

වත්කම් වල ගුණාත්මකභාවය පවත්වා ගැනීම


අපගේ ශාඛා වත්කම් වලින් 52% ක් පමණ වන ණය සහ ලැබීම් වල ගුණාත්මකභාවය පවත්වා ගැනීම බැංකුවේ ලාභදායීත්වය හා ආර්ථික තිරසාරභාවය සඳහා ඉතා වැදගත් වේ. විචක්ෂණශීලි ණය ඇගයීම් හා පශ්චාත් උපයෝජන පසු විපරම් කිරීම තුළින් 2016 අවසානයේ දී 3.4% ක් වූ ශාඛා අංශයේ අක්‍රීය ණය අනුපාතය 2017 දෙසැම්බර් 31 දිනට 3.1% ක් දක්වා වර්ධනය කිරීමට බැංකුව සමත් විය. වසර තුළ දී ආර්ථිකය අපේක්ෂිත මට්ටමට වඩා පහළ මට්ටමක පැවතුණු අතර දිවයිනේ උතුරු ප්‍රදේශය තුළ පැවති දිගු නියගය හේතුවෙන් කෘෂිකාර්මික අංශයට ඇති වූ බලපෑම් අවශෝෂණය කරගැනීමට බැංකුවට සිදුවිය. කෙසේ වෙතත් බැංකුව අනුගමනය කල සාර්ථක ණය කළමනාකරණ ප්‍රතිපත්තිය මඟින් ශාඛා අංශයේ අක්‍රීය ණය අනුපාතය වර්ධනය කර ගැනීමට සමත් විය.

තැන්පතු

2017 වර්ෂය අවසානයේ දී බැංකුවේ ශාඛා අංශයේ සමස්ථ තැන්පතු ප්‍රමාණය 2016 වන විට පැවති රු. බිලියන 878.4 ට සාපේක්ෂව රුපියල් ට්‍රිලියනය ඉක්මවා තිබේ. අපගේ පුළුල් ශාඛා ජාලය සහ මූල්‍ය ඇතුළත්කරණය සමාජ පිරමිඩයේ පතුලට ම ගෙනයෑම් තුළින් තැන්පතු පදනම පුළුල් කර ගැනීමට අප සමත්විය. මීට අමතරව, අපගේ නවීන සංකල්පයක් වන ජංගම ශාඛා සේවාව තුළින් ඉතා දුරස්ථ ග්‍රාමීය ප්‍රදේශ වෙත හා සාම්ප්‍රදායික ශාඛාවක් වෙත පහසුවෙන් ළඟාවීමට අපහසු ගනුදෙනුකරුවන් වෙත පහසුවෙන් ළඟාවීමට හැකියාව ලැබුණි.

වසර අවසානයේ දී අපගේ ජංගම හා ඉතිරි කිරීමේ ගිණුම් අනුපාතය 37% ක් ලෙස තරමක් අඩු අගයක්ව පැවති අතර මෙම තත්ත්වය බැංකු කර්මාන්තය තුළ ම දැකිය හැකිවූයේ ඉහළ පොළී අනුපාතයන් නිසාය. මෙයට ප්‍රතිචාර ලෙස, බැංකුව අඩු පිරිවැය සහිත අරමුදල් ආකර්ෂණය කරගැනීමට විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, ශාඛා අංශයේ ජංගම හා ඉතිරි කිරීමේ ගිණුම් අනුපාතය 43% ක් විය.

ශාඛා අංශයේ තැන්පතු මිශ්‍රය




විශේෂ ගිණුම් ප්‍රවර්ධන වැඩසටහන්

විශේෂයෙන්ම ජ්‍යේෂ්ඨ පුරවැසියන් සහ බාල වයස්කාර ළමුන්ගේ ගිණුම් ප්‍රවර්ධනය සඳහා වසර තුළ විවිධ වැඩසටහන් දියත් කරන ලදී. ඉන් කිහිපයක් පහත දැක්වේ.

- වසර 2017 හි ජනවාරි සිට මාර්තු දක්වා කාල පරාසය තුළ පළමු වසර සඳහා ඇතුලත් වන නවක සිසුන් සඳහා රන් කැකුළු බාල වයස්කාර ගිණුම් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන මඟින් අතිරේක ගිණුම් 46,939 ක් විවෘත කල අතර එමඟින් රැස්කල මුළු තැන්පතු ප්‍රමාණය රු. මිලියන 243.7 කි.
- සිංහල හා හින්දු අවුරුද්දෙන් පසුව ඵලබුනු ගනුදෙනු කරන දින තුළදී රන් කැකුළු ගිණුම් සඳහා කරන තැන්පතු සඳහා ත්‍යාග පිරිනමන ලදී. මෙය දරුවන් තුළ ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීමට සහය වූවා පමණක් නොව අළුත් අවුරුද්දේ "ගනුදෙනු" චාරිත්‍රය ඉටු කිරීමක් ද විය. මෙමඟින් නව ගිණුම් 80,946 විවෘත කල අතර එමඟින් රු. මිලියන 289.5 ක තැන්පතු උපයන ලදී.
- 2017 අගෝස්තු මාසයේ උපත ලද සෑම දරුවකු සඳහාම ගිණුමක් විවෘත කිරීම සඳහා දෙමාපියන් දිරිගන්වනු වස් ගිණුමට තැන්පත් කරන මුදල උපරිමය රු. 1,000 ක් දක්වා දෙගුණ කිරීමක් සහිතව බැංකුවේ 78 වන සංවත්සරයට සමගාමීව "August Baby" වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.
- මේ හා සමාන වූ "උපදින සැමට ගිණුමක්" වැඩසටහනද 2017 අගෝස්තු 01 දා සිට දෙසැම්බර් 31 දින දක්වා අතර කාලය තුළ උපදින දරුවන් සඳහා දියත් කරන ලද අතර මෙමඟින් තැන්පතු රු. මිලියන 458.9 ක් සමඟ නව ගිණුම් 263,757 ක් අරඹන ලදී.

බැංකුව විසින් දිවයින පුරා පාසල් වල පවත්වාගෙන යන පාසල් සංසඳ 1,223 සහ ජංගම පාසල් ඒකක 152 හරහා අපගේ ගනුදෙනුකරුවන් වෙත ලඟාවීම ව්‍යාප්ත කිරීම පමණක් නොව අපගේ ඊලඟ පරපුරේ ගනුදෙනුකරුවන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සඳහා හැඩගැස්වීමද සිදු කරයි.

පාසල් සංසඳවල පළාත් ව්‍යාප්තිය



සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම

8 සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහ විශාල සමාගම් වලට මූල්‍ය පහසුකම් සපයමින් බැංකුව විසින් වතු ව්‍යවසායකත්වයන් සහ රැකියා අබණ්ඩව උත්පාදනය කරමින් සිටී.

- **ආයතනික ණයදීම් හරහා ආසන්න වශයෙන් වතු රැකියා 1,800 ක් පමණ නිර්මාණය කර ඇත.**
- **ව්‍යවසායකත්ව සංවර්ධන සඳහා ආයතනික සමාජීය වගකීම් කටයුතු සඳහා රු. මිලියන 9.6 ක් වැයකර ඇත.**

පූර්ණ ආරක්ෂිත, විචල්‍යයන්ට ඔරොත්තු දියහැකි, තිරසාර නගර සහ මානව ජනාවාස

11 තිරසර නගර සහ ප්‍රජාවන්

නාගරික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා බැංකුව මඟින් කරනු ලබන ආයතනික ණය දීම් හරහා එම නගර වඩාත් පූර්ණ, ආරක්ෂිත අපදාවන්ට ඔරොත්තු දිය හැකි සහ තිරසාර නගර බවට වර්ධනය කිරීමට උපකාරී වී ඇත.

- **කසළ ප්‍රතිචක්‍රීකරණය කර බලශක්ති නිපදවීම සඳහා වූ මහා පරිමාණ ව්‍යාපෘති දෙකක් සඳහා ඒකාබද්ධ ණය පහසුකම් හරහා අරමුදල් සැපයීම.**

ආයතනික හා අක්වෙරළ බැංකුකරණය

බැංකුවේ ආයතනික මූල්‍ය පහසුකම්, ආයතනික අංශයේ දිගුකාලීන මූල්‍යනය සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා යන දෙයාකාරයෙන්ම පහසුකම් සලසයි. දිගුකාලීන මූල්‍ය සම්පාදනය තුළ ස්ථාවර ආයෝජන පිරිවැය සඳහා මෙන්ම කාරක ප්‍රාග්ධන අවශ්‍යතා ද ඇතුලත් විශේෂයෙන්ම සකසන ලද පැකේජ ඇතුලත් වේ. තරඟකාරී පොළී අනුපාත මෙන්ම නම්‍යශීලී ගෙවීම් කොන්දේසි ද ඉදිරිපත් කරයි. මෙම ණය පහසුකම් හීනවන ශේෂ හා සමානුපාතික පොළී යන දෙයාකාරයෙන්ම පවතී.

ආයතනික හා අක්වෙරළ බැංකුකරණ ඒකකය 2017 වසරේ දී බැංකුවේ ණය කළඹ සඳහා 47% කින් දායක වී ඇති අතර බදු පෙර ලාභයට 28% කින් දායකත්වය සපයා ඇත. මෙම අංශය රටේ මහා පරිමාණ ආයතන, ව්‍යාපෘති මෙන්ම සෘජු රාජ්‍ය සහ රජයට අයත් ආයතන සඳහා මූල්‍ය පහසුකම් සැපයීම මඟින් රටේ සමස්ථ ආර්ථිකයටම සහය වේ.



ආයතනික ණය ප්‍රධානය කිරීම් තුළින් කර්මාන්ත අංශයට දායකත්වය

තනි බැංකුවකට අරමුදල් සැපයීමට අපහසු විශාල ප්‍රමාණයේ ව්‍යාපෘති සඳහා ඒකාබද්ධ ණය හරහා මූල්‍ය පහසුකම් සැපයීමට බැංකුව අනෙකුත් බැංකු සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. වසර තුළ ආරම්භ කරන ලද ඒකාබද්ධ ණය ව්‍යාපෘති සඳහා වූ සමස්ථ මූල්‍යනය රු. බිලියන 45.5 ක් වන අතර ලංකා බැංකුවේ දායකත්වය රු. බිලියන 7.3 කි. වසර තුළ මූල්‍යනය කරන ලද නව ව්‍යාපෘති හරහා ජනිත කරන ලද නව රැකියා අවස්ථා ගණන ආසන්න වශයෙන් 1,800 ක් පමණ වේ.

ආංශික දායකත්වය

2017 වර්ෂය අවසානයේ දී ආයතනික අංශයේ සමස්ත නිරාවරණය රු. බිලියන 572 කි. මෙයින් 44% ක් පෞද්ගලික අංශයට වන අතර 56% ක් රජය සහ රජයට අයත් ආයතන සඳහා වේ. 2016 වසර සඳහා මෙම අගයන් පිළිවෙලින් 51% ක් සහ 49% ක් විය. කෙසේ වෙතත්, පෞද්ගලික අංශය සඳහා වූ නිරාවරණය 2016 දී පැවති රු. බිලියන 209.0 සිට රු. බිලියන 245.8 ක් දක්වා ඉහළ ගොස් ඇත. මෙය ප්‍රධාන වශයෙන්ම අත්පත් කරගෙන ඇත්තේ ආයතනික අංශය මඟින් සිදුකල ආක්‍රමණශීලි ප්‍රවර්ධනයන් නිසා වන අතර එමඟින් ලඟාකරගත් නව ගනුදෙනුකරුවන් සංඛ්‍යාව 92 කි. ඉදිරියට යාමේදී, පෞද්ගලික අංශයේ නිරාවරණය තවදුරටත් ඉහළ නැංවීම සඳහා පවත්නා ගනුදෙනුකරුවන් සඳහා අනුමත කර ඇති ණය සීමාවන්හි භාවිතා නොකළ සීමාවන් යොදා ගැනීමට වැඩි අවධානය යොමු කර ඇත.


ප්‍රධාන ව්‍යාපෘති

මූල්‍යනය කරන ලද මහා පරිමාණ ව්‍යාපෘතීන්ගෙන් එකක් වනුයේ කොළඹ නගරයේ ප්‍රමුඛ ස්ථානයක ඉදි කෙරෙන කාමර 420 කින් සමන්විත වූ "පර්ල් ග්‍රෑන්ඩ් ටවර්" තරු පහේ සුඛෝපභෝගී හෝටල් ව්‍යාපෘතියයි. තවද හරිත බැංකු මූලාරම්භයන් සඳහා වූ සිය කැපවීම පෙන්නුම් කරමින් රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයේම හවුල්කාරිත්වයෙන් අපද්‍රව්‍ය තුලින් බලශක්තිය නිපදවීමේ ව්‍යාපෘති දෙකක් සඳහා ඒකාබද්ධ ණය පහසුකම් ලබාදී ඇත. මින් එකක් වනුයේ ෆෙයාර්වේ අපද්‍රව්‍ය කළමනාකරණ (පුද්) සමාගම (Fairway Waste Management (Pvt) Limited) සහ ශ්‍රී ලංකා රජයේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (WMA) අතර ඒකාබද්ධ ව්‍යාපාරයක් වූ කරදියාන පිහිටි අපද්‍රව්‍ය මඟින් විදුලිය සැකසීමේ ව්‍යාපාරයයි. අනෙක් ව්‍යාපෘතිය වනුයේ එයිටිකන් ස්පෙන්ස් (Aitken Spence) ආයතනය WMA සමඟ එක්ව ගෙනයන මීට සමාන වූ මුතුරාජවෙල පිහිටි ව්‍යාපෘතියයි.

කෙසේ වෙතත් විශාල යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා දිගු කාලීන මූල්‍ය පහසුකම් සැපයීම මඟින් මෙන්ම කෙටි කාලීන ණය අවශ්‍යතා මූල්‍යනය කිරීම මඟින් ද රජය සහ රජයට අයත් ආයතන සඳහා බැංකුව විසින් අඛණ්ඩව සහය ලබා දී ඇත. වසර තුළ ජල සම්පාදන ව්‍යාපෘති මූල්‍යනය සඳහා රු. බිලියන 17.0 ක අරමුදල් සපයා ඇති අතර මාර්ග නවීකරණය ව්‍යාපෘති සඳහා සපයන ලද මුදල රු. බිලියන 1.7 කි. මීට අමතරව, සොබ්‍ය අමාත්‍යාංශය විසින් ආරම්භ කිරීමට නියමිත සොබ්‍ය ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා රු. බිලියන 10.0 කට ආසන්න මුදලක් ලබාදීමට බැංකුව එකඟ වී ඇත.

ආංශික විශ්ලේෂණය

ආයතනික ණය කලඹේ ආංශික විශ්ලේෂණය



නව සංවර්ධනයන් සහ ඉසව්

වසර තුළදී ආයතනික අංශය තුළ බැංකුවේ අයකර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමේ අදහසින් අනුමත ණය පහසුකම් සඳහා වූ ලේඛනගත කිරීමේ/සැකසීම් ගාස්තු අයකර ගැනීම සඳහා ආයතනික ශාඛාවට ස්වයංක්‍රීය පද්ධතියක් හඳුන්වා දී ඇත.

2017 වර්ශය සඳහා ආයතනික අංශය විසින් පාරිභෝගික සේවා ප්‍රවර්ධන වැඩසටහන් හයක් සිදු කරන ලදී. මේ අතරින් වැඩසටහන් දෙකක් ආයතනික අංශය, අක්වෙරළ බැංකු අංශය සහ මෙට්‍රොපොලිටන් ශාඛාව සමඟ ගනුදෙනු කරන ආයතන වල ඉහළ කළමනාකාරිත්වය සඳහා පවත්වන ලද අතර තවත් වැඩසටහන් තුනක් පිළිවෙලින් ආයතනික අංශය, මෙට්‍රොපොලිටන් ශාඛාව සහ අක්වෙරළ බැංකු අංශය මඟින් පවත්වන ලද අතර එහි අරමුණු වූයේ තම ගනුදෙනුකාර ආයතන වලට අදාල සෘජුවම ගනුදෙනු කිරීමට අනුයුක්ත කාර්ය මණ්ඩලය විසින් සපයන ලද සහයෝගය ඇගයීමට ලක් කිරීමයි. මීට අමතරව තම ශාඛාවට සම්බන්ධ ඉහළ ශුද්ධ වටිනාකමකින් යුත් ගනුදෙනුකරුවන්ට උපහාර දැක්වීම සඳහා ප්‍රිමියර් බැංකු සේවා මධ්‍යස්ථානය මඟින් ද උත්සවයක් වසර තුළ සංවිධානය කෙරිනි.

අනාගත සැලසුම්

ණය, වෙළඳ මූල්‍යකරණය සහ විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ අත්දැකීම් ඇති නව සහ වත්මන් කාර්ය මණ්ඩලය යොදාගෙන, ඉහළ අගයක ශුද්ධ වත්කම් සහිත ගනුදෙනුකරුවන්/මහා පරිමාණ සමාගම් සඳහා සේවා සැපයීම සඳහා විශේෂ ව්‍යාපාර ඒකකයක් පිහිටු වීමට සැලසුම් කර ඇත.

විභවතාවයක් ඇති ව්‍යාපාරික අවස්ථා කල්තබා හඳුනාගෙන එම අවස්ථා උකහා ගැනීම සඳහා, ඒකාබද්ධ ණය ඇතුළු මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධව කටයුතු කිරීමේ හැකියාව ඇති විශේෂඥ කණ්ඩායමක් ඕහි කිරීමේ අරමුණින් නව ව්‍යාපෘති මූල්‍යකරණ ඒකකයක් ද පිහිටුවනු ඇත. මීට අමතරව, මූල්‍ය ප්‍රතිව්‍යුහගතකරණ කටයුතු කිරීම සඳහා හැකියාව ඇති නිසි කාර්ය මණ්ඩලයකින්ද මෙම ඒකකය සමන්විත වනු ඇත.

තවද, ආයතනික ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීමට පූර්ණ අන්තර්ජාල බැංකුකරණ විසඳුම් ඇතුළත් වෙබ් අඩවි සහිත තාක්ෂණික වේදිකාවක් සැපයීම සඳහා අවශ්‍ය පියවරයන් ද ක්‍රියාත්මක වෙමින් පවතී.

මීට අමතරව, පාරිභෝගික සේවාව වැඩිදියුණු කිරීම සඳහා ගනු ලැබූ තවත් පියවරක් ලෙස ආයතනික ගනුදෙනුකරුවන්ගේ අන්තර් ශාඛා ගෙවීම් අනුමත කිරීම් සඳහා ස්වයංක්‍රිය කාර්ය ප්‍රවාහ ක්‍රියාවලියක් හඳුන්වා දීමට කටයුතු කරමින් සිටියි.

වෙළඳ මූල්‍යකරණ අංශය

ආනයන සහ අපනයන යන දෙඅංශයටම පහසුකම් සැපයීම සඳහා පුළුල් වූ වෙළඳ මූල්‍යකරණ නිෂ්පාදන කළඹක් අප සතුව ඇත. තවද, මෙම අංශය මගින් රාජ්‍ය අංශය, ආයතනික ගනුදෙනුකරුවන්, කර්මාන්ත සංගම් සහ ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු පුළුල් පරාසයක පාර්ශවකරුවන් සඳහා උපදේශක සේවා සපයනු ලැබේ. බැංකුවේ වෙළඳ මූල්‍යකරණ අංශය, නව අපනයන/අපනයනකරුවන් හඳුනා ගැනීම සහ අපනයන වෙළඳපොලවල් තෝරා ගැනීම, බැංකු ක්‍රියාපටිපාටිය සහ ලේඛනගත කිරීම ආදිය සම්බන්ධයෙන් ඔවුන්ට උපදෙස් ලබාදීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව, සහ වාණිජ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සමඟ අඛණ්ඩව සම්බන්ධීකරණයක් සිදු කරයි. වසර තුළ අංශය මගින් නව කුරුඳු සහ ගම්මිරිස් අපනයනකරුවන් රුසකට සේවා සැපයීම මගින් අපනයන සේවාදායකයින් ප්‍රමාණය ඉහළ නංවා ඇත. වෙළඳ මූල්‍යකරණ අංශය, ක්ෂේත්‍රයේ සිය විශේෂඥතාවයන් භාවිතා කරමින් වෙළඳ ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම්කරණය සම්බන්ධයෙන් අදාල රාජ්‍ය ආයතන සමඟ තම දැනුම නුවමාරු කර ගැනීම ද සිදු කර ඇත. මෙම අංශයේ වෙළඳ මූල්‍යකරණ කටයුතු සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් අප සතු වන අතර අඛණ්ඩව මෙම අංශයෙහි නායකත්වය පවත්වාගෙන තිබේ. බැංකුව විසින් ඉහළම ආචාරධර්ම ප්‍රමිතීන් පවත්වාගෙන යන අතරම සියලුම නීති හා රෙගුලාසි වලට අනුකූලව තදින්ම කටයුතු කරනු ලබයි. මෙම ක්ෂේත්‍රය තුළ ගොඩනැගුණ අපගේ දැනුම් සංචිතය අපට ඉහළම ගිවිසුම් හැකියාවක් ලබා දෙන අතර එමඟින් අපගේ ගනුදෙනුකරුවන්ට තරඟකාරී මිල ගණන් සැපයීමට අපට හැකිවේ. මේ සඳහා පුළුල්ව පැතිර ඇති අපගේ විදේශීය රටවල නියෝජිත බැංකු ජාලය සමඟ ඇති දිගුකාලීන සබඳතා ද උපයෝගී කර ගැනීමට අපට හැකියාව ලැබී ඇත. තවද, බැංකුව විසින් තම ගනුදෙනුකරුවන් සමඟ පවත්වන සුහද හමු සහ උපදේශන සේවා සැපයීම තුළින් ඔවුන් සමඟ ඇති සබඳතාවය ශක්තිමත් කර ගනී. ඉහළ ශුද්ධ වත්කම් අගයක් සහිත ගනුදෙනුකරුවන් සඳහා ඔවුන් අතිශය තරඟකාරී මිල අනුපාත ලබා දෙනු ලැබේ.

2011 වර්ෂයේදී ලද ISO 9001:2008 තත්ත්ව සහතිකය අඛණ්ඩව මෙම අංශය සතුවීමද විශේෂත්වයකි. මෙම අංශයේ කාර්ය මණ්ඩලයට දේශීය සහ විදේශීය යන දෙයාකරයෙන්ම පුළුල් පුහුණුවක් ලබාදෙනු ලබයි. වර්තමානයේ පවතින නවතම ජාත්‍යන්තර පරිචයන්ට අදාලව අපගේ කාර්ය මණ්ඩලයට අවශ්‍ය පුහුණුව ලබාදීම සඳහා සහ ආනයනකරුවන්ගේ සහ අපනයනකරුවන්ගේ ගැටළු නිරාකරණය කිරීම ආදී කරුණු සම්බන්ධයෙන් ලංකා බැංකුවේ වෙළඳ මූල්‍යකරණ අංශය ශ්‍රී ලංකා වෙළඳ මූල්‍යකරණ සංගමය, ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ සංගමය, ශ්‍රී ලංකා ආනයනකරුවන්ගේ සංගමය, ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය සහ ජාතික වාණිජ මණ්ඩලය යන ආයතන ද නියෝජනය කරයි. වසර තුළ පාරිභෝගික පහසුකම් සැපයීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී.

තවද, වසර තුළ මෙම අංශය වෙළඳ මූල්‍යකරණ වැඩමුළු හරහා මේ පිළිබඳ ශාඛා කාර්ය මණ්ඩලයේ නාක්ෂණික නිපුනතාවයන් ඉහළ නැංවීම සඳහා ශාඛා ජාලය සමඟ සමීපව කටයුතු කරන ලදී. ශාඛා ජාලය හරහා නව සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයේ අපනයනකරුවන් ළඟාකර ගැනීම මෙහි අරමුණ වේ.

ආනයන සහ අපනයන යන දෙඅංශයටම පහසුකම් සැපයීම සඳහා පුළුල් වූ වෙළඳ මූල්‍යකරණ නිෂ්පාදන කළඹක් අප සතුව ඇත. තවද, මෙම අංශය මගින් රාජ්‍ය අංශය, ආයතනික ගනුදෙනුකරුවන්, කර්මාන්ත සංගම් සහ ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු පුළුල් පරාසයක පාර්ශවකරුවන් සඳහා උපදේශක සේවා සපයනු ලැබේ.

2017 වසරේ කාර්යසාධනය

පළාත	2017 රු. බිලියන	2016 රු. බිලියන	වර්ධනය %
ආනයන වටිනාකම	343.6	271.5	27
අපනයන වටිනාකම	37.1	33.0	12
වෙළඳ මූල්‍ය ආදායම	5.2	4.1	26

2017 වසරේ දී ආසියානු සංවර්ධන බැංකුව සිය වෙළඳ මූල්‍යකරණ වැඩසටහන යටතේ පිරිනැමූ "ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම හවුල්කාර බැංකුව" යන සම්මානයට ලංකා බැංකුව පාත්‍ර වූ අතර එය ශ්‍රී ලංකා ඉතිහාසයේ බැංකුවක් මෙම සම්මානය ලද ප්‍රථම අවස්ථාව වේ.

අක්වෙරළ බැංකුකරණ ඒකකය ආයතනික අංශයේ ප්‍රධාන කොටසක් නියෝජනය කරන අතර වසර තුළ ගනුදෙනුකරුවන්ට වඩාත් කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින් ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් හඳුන්වා දී ඇත. ආයතනික සහ අක්වෙරළ බැංකු ඒකක, රජයට සහ රජය සතු ප්‍රධාන ව්‍යවසායන්ට ඔවුන්ගේ අරමුදල් අවශ්‍යතා කළමනාකරණය සඳහා සහය දක්වයි. රාජ්‍ය භාණ්ඩාගාරය සහ ලංකා බණිජ තෙල් නීතිගත සංස්ථාව මෙම අංශයේ ප්‍රධාන ගනුදෙනුකරුවන් වේ. එය හානිකරණ කළමනාකරණය සඳහා ද කැපී පෙනන දායකත්වයක් දක්වයි.

ජාත්‍යන්තර, භාණ්ඩාගාර සහ ආයෝජන අංශය

මෙම අංශ මඟින්, දේශීය හා විදේශීය මුදල් වලින් සමන්විත අරමුදල් පාලනය කරමින් බැංකුව තුළ තීරණාත්මක භූමිකාවක් ඉටු කරයි. මූල්‍ය ආයතනයක් සතු ඉහළම තැන්පතු පරිමාව වන රු. ට්‍රිලියන 1.5 කට අධික තැන්පතු අප සතුවන බැවින් එම අරමුදල් කළමනාකරණයද සිදුකරන මෙම අංශයන්හි මෙහෙයුම් බැංකුවේ ස්ථායිතාවයට තීරණාත්මක වනවා සේම රටේ ආර්ථිකයටද අමිල මෙහෙවරක් ඉටු කරයි. මෙම අංශ හරහා බැංකුවේ අරමුදල් ආයෝජනය, විදේශ විනිමය කළමනාකරණය හා වත්කම් හා වගකීම් කළමනාකරණය ඇතුළු ප්‍රධාන කාර්යයන් කිහිපයක් සිදු කරනු ලබයි. සමාලෝචනය කරනු ලබන වසර තුළ 2016 වසර සමඟ සැසඳීමේදී තැන්පතු 23% කින් වැඩි වූ අතර ණය ගැනීම් 11% කින් අඩු විය.

භාණ්ඩාගාර අංශය


බැංකුවේ සමස්ත ලාභදායිත්වයට සැලකිය යුතු දායකත්වයක් සපයමින් ඉතිහාසය පුරාවටම ලංකා බැංකුවේ භාණ්ඩාගාර අංශය බැංකු ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා බවට පත් වී ඇත.

ප්‍රාපනික අංශය (Dealing Room), ප්‍රාථමික ප්‍රාපනික ඒකකය (PDU) සහ වත්කම් සහ වගකීම් කළමනාකරණ ඒකකය ලෙස වූ ප්‍රධාන දෙපාර්තමේන්තු තුනකින් භාණ්ඩාගාර අංශය සමන්විත වේ. භාණ්ඩාගාර අංශයෙහි සාමාන්‍ය කාර්යයන් ලෙස විදේශ විනිමය මෙහෙයවීම, මුදල් වෙළඳපොල ගනුදෙනු, අරමුදල් කළමනාකරණය, රාජ්‍ය සුරැකුම්පත් හි ආයෝජනය, ආයතනික විකුණුම්, නිමැවුම් මිලකරණය, ව්‍යවස්ථාපිත සංචිත හා ද්‍රවශීලතා අනුපාත පවත්වා ගැනීම සහ වත්කම් සහ වගකීම් කළමනාකරණය කිරීම යනාදිය ඇතුළත් වන අතර එමඟින් භාණ්ඩාගාර අංශය බැංකුවේ සමස්ථ ලාභදායිත්වයට සැලකිය යුතු කොටසකින් දායක වේ.


අරමුදල් ගලා ඒම සහ ගලායාම් මනා ලෙස පාලනය කිරීම මඟින් වගකීම් සපුරා ගැනීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් පවත්වගෙන යන බවට තහවුරු කර ගනිමින්, එම අංශය බැංකුවේ විදේශ විනිමය මෙහෙයුම් කළමනාකරණය කරයි. නිමවුම් වල ප්‍රශස්ථ මිලකරණය, කාලෝචිතව නැවත මිල කිරීම, පරිණති නොගැලපීම් කළමනකරණය කිරීම ආදිය අනුකූලතා අවශ්‍යතාවයන්ට ගැළපෙන බවට තහවුරු කර ගැනීම මඟින් වෙළඳපොල අවදානම් කළමනාකරණය කිරීමේදී ද භාණ්ඩාගාර අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

වසර තුළදී, බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, ණයකර සහ සමාගම් කොටස් වල සැලකිය යුතු ආයෝජනයන් සිදු කර ඇත.


විදේශ විනිමය ආදායම



බරතැබූ සාමාන්‍ය තැන්පතු අනුපාතයේ (AWDR) සහ බරතැබූ සාමාන්‍ය ප්‍රමුඛ ණය පොළී අනුපාතයේ (AWPLR) සංචලනය



විදේශීය ශාඛාවන්හි තැන්පතු, ණය සහ අත්තිකාරම්



2017 වසර ලංකා බැංකු භාණ්ඩාගාර අංශය සඳහා අතිශය සාර්ථක වූ වසරක් විය. සිය අරමුණු සියල්ලම පාහේ ළඟා කර ගනිමින්, විනිමය අනුපාතිකයේ වෙනස් වීම් වලින් ඉස්මතු වූ අවස්ථාවන් භාණ්ඩාගාර අංශය විසින් ප්‍රශස්ත ලෙස යොදාගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා රු. බිලියන 3.4 ක් වූ විදේශ විනිමය හුවමාරුව මත ලාභයක් 2017 දෙසැම්බර් මාසයේදී ප්‍රකාශයට පත්කරන ලදී. ආයතනික සේවා පුළුල් කිරීම, තරඟකාරී මිල යාන්ත්‍රණයක් හඳුන්වා දීම, ආක්‍රමණශීලි විදේශ විනිමය ගනුදෙනු, විනිමය හුවමාරු මධ්‍යස්ථාන සමඟ සබඳතා පුළුල් කිරීම සහ පද්ධති වැඩිදියුණු කිරීම යනාදි ලෙස භාණ්ඩාගාර කාර්යයන් ව්‍යාප්ත කිරීම සඳහා සැලසුම් කරන ලද හා ක්‍රියාත්මක කරන ලද ඇතැම් ක්‍රියාකරකම් වඩා හොඳ ප්‍රතිඵල ලඟාකර ගැනීමෙහිලා බලපා ඇත.

භාණ්ඩාගාර අංශය මඟින් වසර තුළ අනුගමනය කරන ලද නව තාක්ෂණයන් සහ එහි ප්‍රතිලාභ

බැංකුවේ වත්කම් හා වගකීම් කළමනාකරණය සඳහා නව පද්ධතියක් ක්‍රියාවට නැංවීම සඳහා වූ ක්‍රියාවලියක භාණ්ඩාගාර අංශය නිරත වන අතර මෙමඟින් අවශ්‍යවන වාර්තා උත්පාදනය පහසු වන අතර එය බැංකුවේ තීරණ ගැනීමේ කාර්යය වැඩි දියුණු කිරීමට අනිවාර්යයෙන්ම හේතු වනු ඇත. මෙම පද්ධතිය 2018 වසර තුළදී ක්‍රියාවලියට එක්වනු ඇති අතර නිවැරදි වත්කම් හා වගකීම් කළමනාකරණයන් සඳහා තවදුරටත් උපකාරී වනු ඇත.

තවද, භාණ්ඩාගාර අංශය භාණ්ඩාගාර ප්‍රතිපත්ති සහ වත්කම් හා වගකීම් කළමනාකරණ ප්‍රතිපත්ති මාලාවන් වෙළඳපොලෙහි නවතම වෙනස්කම්වලට අනුකූල වන පරිදි සංශෝධනය කර ඇත.

ප්‍රතිපත්තිමය පොළී අනුපාත, බර තැබූ සාමාන්‍ය ස්ථිර තැන්පතු අනුපාතය (AWFDR), බර තැබූ සාමාන්‍ය ප්‍රමුඛ ණය පොළී අනුපාතය (AWPLR), බර තැබූ සාමාන්‍ය තැන්පතු අනුපාතය (AWDR), විනිමය අනුපාතයන්හි සංචලනයන් සහ එහි බලපෑම

වාණිජ බැංකු වල සියළු රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාල වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) 2016 ජනවාරි 16 දිනෙන් පටන් ගන්නා සතියෙහි සිට බලපැවැත්වෙන පරිදි 7.5% දක්වා පදනම් ඒකක 150 කින් ඉහළ නංවන ලදී. 2017 මාර්තු 24 දින නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය (SDFR) සහ නිත්‍ය ණයදීම් පහසුකම් අනුපාතය (SLFR) පිළිවෙලින් 7.25% සහ 8.75% දක්වා පදනම් ඒකක 25 කින් ඉහළ නංවන ලදී. මේ අතරතුර, වාණිජ බැංකුවල ණයදීම් සහ තැන්පතු පසුගිය වසරට සමාන පදනමකින් පැවති අතර සුළු වෙනස්කම් පමණක් නිරීක්ෂණය විය. බර තැබූ සාමාන්‍ය ප්‍රමුඛ ණය පොළී අනුපාතය (AWPLR)

පසුගිය වසරේ පැවති 11.52% සිට 11.55% දක්වා ඉහළ ගිය අතර බර තැබූ සාමාන්‍ය ස්ථිර තැන්පතු අනුපාතය (AWFDR) පසුගිය වසරේ පැවති 10.46% සිට 2017 අග වන විට 11.48% දක්වා ඉහළ ගොස් ඇත. මාසික බර තැබූ සාමාන්‍ය තැන්පතු අනුපාතය (AWDR) පසුගිය වසරේ පැවති 8.17% සිට 9.07% දක්වා වැඩිවී ඇත.

බැංකු අංශය මඟින් පුද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයටම ණය දීම් ව්‍යාප්ත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පුළුල් මුදල් සැපයුමේ වාර්ෂික වර්ධනය 17.45% ක් ලෙස 2017 දෙසැම්බර් මාසය තුළදී තවදුරටත් පුළුල් විය. වාණිජ බැංකු විසින් පුද්ගලික අංශයට ලබා දුන් ණය පරිමාව වර්ෂය තුළ 15.48% කින් ඉහළ ගොස් ඇති බව පෙනේ. අපේක්ෂා කරන ලද දැඩි මූල්‍ය ප්‍රතිපත්ති ස්ථාවරයට ප්‍රතිචාර දක්වමින් ප්‍රධාන වශයෙන්ම වාණිජ බැංකු මඟින් පෞද්ගලික අංශයට ප්‍රදානය කරන ලද ණය පරිමාවේ අඩුවීම හේතුවෙන් පුළුල් මුදල් සැපයුමේ වර්ධනය 2017 නොවැම්බර් මාසයේදී සැලකිය යුතු ලෙස මන්දගාමී විය. මේ අතර, ප්‍රතිපත්ති අනුපාත සහ රජයේ සුරැකුම්පත්වල ඉපැයුම අතර පැවති යම් විෂමතාවයන් නිවැරදි කරමින් රාජ්‍ය සුරැකුම්පත්වල ඉපැයුම් පැවති ඉහළ මට්ටමේ සිට පහළ මට්ටමක් දක්වා සංශෝධනය කර ඇත. අනෙකුත් වෙළඳපොල පොළී අනුපාතයන් ද ඉපැයුම් අනුපාතය සමඟ සමගාමී විම සඳහා තවදුරටත් පහත දැමීම අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ජනවාරි මාසයේදී පැවති රු. 149.85 සිට 2% කින් අවප්‍රමාණය වී 2017 දෙසැම්බර් 31 වන විට රු. 152.85 ක් ලෙස වාර්තා විය. එය ජූලි මාසය තුළදී මේ දක්වා වාර්තා කළ ඉහළම අගය වන රු. 153.70 ක් දක්වා ළඟා විය.

2017 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු සහ භාණ්ඩාගාර මෙහෙයුම් කෙරෙහි බලපාන මාර්ගෝපදේශ 3 ක් නිකුත් කරන ලදී:

1. CIMM වාර්තාකරණය
2. විදේශ මුදලින් ණය ගැනීම්
3. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මාර්ගෝපදේශනයන්

දේශීය මුදල් වෙළඳපොල තුළ අතිරික්ත ද්‍රවශීලතාවය තවදුරටත් ඉහළ මට්ටමක පවතින බව ශ්‍රී ලංකා මහ බැංකුවද පෙන්වා දුනි. මෙවැනි ඉහළ ද්‍රවශීලතාවයක් පවතින පරිසරයක් තුළ මෙහෙයුම් කටයුතු කිරීමේදී තරඟකාරිත්වය සහ ඉහළ නඟින උද්ධමනය අභියෝගාත්මක විය හැකිය. අධික අතිරික්ත ද්‍රවශීලතාවයක් සහිත මෙම ප්‍රවණතාවය දිගටම පැවතුනහොත් එය මුදල් සමස්තයන්ගේ අනිසි ප්‍රසාරණයකට මඟ පාදනු ඇතැයි ඇස්තමේන්තු කරන අතර එය අනාගත ආර්ථිකයේ උද්ධමනයට ද හේතු වනු ඇත.

කෙසේ වෙතත්, උද්ගත විය හැකි සෘණ තත්ත්වයන් හේතු කොට ගෙන යහපත් ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීම ඉලක්ක කරගෙන ප්‍රති මිලදී ගැනුම් සහ ප්‍රති විකුණුම් පදනම පුළුල් කිරීම, නොස්ට්‍රෝ ගිණුම් තුළ අරමුදල් කළමනාකරණය ප්‍රශස්ත කිරීම වෙළඳ මූල්‍යන කටයුතු සහ විදේශ විනිමය කටයුතු කරන ගනුදෙනුකරුවන් සමඟ සබඳතා වැඩි දියුණු කිරීම, විදේශ ව්‍යවහාර මුදලින් ඒකාබද්ධ හා ද්විපාර්ශ්වික ණය ලබාදීම සහ දිගුකාලීන ණයකර නිකුතු වැඩි වශයෙන් සිදු කිරීම වැනි ක්‍රියාමාර්ග බැංකුව විසින් ගනු ලබනු ඇත.

රාජ්‍ය සුරැකුම්පත් වල සංචලනයන් සහ කළමනාකරණය

රු. බිලියන 500 කට අධික අපගේ කැපී පෙනෙන දැවැන්ත ආයෝජන කළඹ සමඟ බැංකුවේ ආයෝජනයන් සිදු කරනු ලබන්නේ අඛණ්ඩව විශ්ලේෂණය කරන ලද දැනට පවතින සහ නැගී එන ආකෘතියන්ට අනුව ප්‍රවේශම් සහගතව සහ නමුත් තියුණු ලෙස වේ. රාජ්‍ය සුරැකුම්පත්වල සිදුකරන ආයෝජනයන්ට අමතරව බැංකුව සිය ආයෝජනයන් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, ණයකර සහ සමාගම් කොටස් වලටද බෙදාහැර තිබේ. 2017 වසර අග වන විට බැංකුව ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරයන්හි (SLDBs) ඇ.ඩො. බිලියන 1.1 ක් ආයෝජනය කර ඇත. එම ආයෝජනයෙන් සැලකිය යුතු කොටසක් ලංකා බැංකුව වෙත විදේශීය ප්‍රේෂණ හා අපනයන ආදායම් ලෙස ලද තමන්ගේම අරමුදල් වේ.

භාණ්ඩාගාර බිල්පත් කළඹ පසුගිය වසර අග පැවති රු. බිලියන 28.8 සිට රු. බිලියන 114.0 දක්වා 296% කින් වර්ධනය වූ අතර, භාණ්ඩාගාර බැඳුම්කර කළඹ 2016 අගදී පැවති රු. බිලියන 220.1 සිට රු. බිලියන 207.9 දක්වා මඳ වශයෙන් පහළ බැස ඇත.

භාණ්ඩාගාර බිල්පත්, බැඳුම්කර හා කොටස් වල සිදුවූ පුළුල් වෙළඳාම සමඟ (gilt-edged සුරැකුම්පත් වෙළඳාමට එකතු කිරීමෙන්) වසර අවසානය වන විට භාණ්ඩාගාර අංශය රජයේ සුරැකුම්පත් මත රු. මිලියන 456.7 ක සැලකිය යුතු ප්‍රාග්ධන ලාභයක් ලබාගෙන ඇත.

බැංකුවේ අරමුදල් කළමනාකරණය සඳහා භාණ්ඩාගාර අංශයේ දායකත්වය

සිදුවීමට ඉඩ ඇති විවිධාකාර ආතති තත්ත්වන්ට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ඇති කිරීම මඟින් භාණ්ඩාගාර අංශය බැංකුවේ ද්‍රවශීලතා රාමුව තිරසාර ලෙස පවත්වාගෙන ඇත. ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ රාමුව සහ ද්‍රවශීලතා තත්ත්වය පිළිබඳ නිරන්තර තක්සේරුව, බැංකුවේ නිසි ක්‍රියාකාරිත්වය සහතික කරන වැදගත් අධීක්ෂණ ක්‍රියාමාර්ගයකි.

අඛණ්ඩව පැවති අඩු පොළී අනුපාත, ශේෂ පනු අස්ථාවරත්වය සහ ස්ථාවර නියාමන අවශ්‍යතාවයන් සමඟින් භාණ්ඩාගාර අංශය තරඟකාරී වසරකට මුහුණ දුනි. නමුත් මෙම සියළු බාධක මධ්‍යයේ භාණ්ඩාගාර අංශය සිය ද්‍රවශීලතා ආරක්ෂණ මට්ටම ශක්තිමත් කිරීම, අනිවාර්ය අනුපාතයන් පවත්වා ගැනීම සහ භාණ්ඩාගාර අංශයේ කාර්යභාරය නියාමනය කිරීමේ කාර්යයක් ලෙස ස්ථාපිත කර තිබේ.

පැහැදිලි නියෝගයන්, බලයක්, මධ්‍යගත පාලනයක් සහ වැඩිදියුණු කල පද්ධති සහ දත්ත ශක්‍යතාවයන් ලබාදෙන නව භාණ්ඩාගාර මෙහෙයුම් ආකෘතියක් අනුගමනය කිරීම මඟින් භාණ්ඩාගාර අංශය විසින් බැංකුවේ සුරැකුම්, ද්‍රවශීලතාවය සහ පොළී අනුපාතිකයන්හි කල්පිරීමේ කාල පරතරය ගැළපීම වැඩිදියුණු කර ඇත. මෙම වෙනස්කම් සමඟ සහ ද්‍රවශීලතාවය සහ ලාභදායිත්වය අතර නිසි සමතුලනයක් ඇති කිරීම මඟින් භාණ්ඩාගාර අංශය බැංකුවේ ශුද්ධ පොළී ආදායම (NII) ඉහළ නැංවීමට සහය විය.

ජාත්‍යන්තර අංශය

ප්‍රේෂණ

ශ්‍රී ලංකාවට එතෙර මුදල් ප්‍රේෂණය කිරීමේ ප්‍රථම බැංකුව වන ලංකා බැංකුවට අද වන විට 46% වෙළඳපොල කොටසක් හිමි වේ. අපගේ සෑම පාරිභෝගිකයෙකුටම සුමට සේවා සැපයීමක් සඳහා ආමුඛ ප්‍රේෂණ දෙපාර්තමේන්තුව සියළුම ශාඛා සමඟ බැඳී පවතී. අපගේ ලොව පුරා ව්‍යාප්තව සිටින 800 කට අධික නියෝජිත ජාලය, මෙම ක්‍රියාවලිය පහසු කරන අතර අරමුදල් ලබාගත හැකි ස්ථාන 600 කට අධික සංඛ්‍යාවක් අප සතුය. අප සතුව විවිධ ආකාරයේ ප්‍රේෂණ පද්ධති සහ ඊමේල්/කෙටි පණිවිඩ හරහා ලබන්නා සහ යවන්නා යන දෙපාර්ශවයටම දැනුම් දීම වැනි වෙනත් පහසුකම් ද ඇත. පාරිභෝගික විමසීම් කවුන්ටරයද වැඩි කාර්ය මණ්ඩලයක් සහිතව ශක්තිමත් කරනු ඇත. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු තුළින් බැංකුව විදේශගත සේවකයින්ට සාමාජීය වශයෙන් ඵලදායී කාර්යයක් ඉටු කරන අතර රටේ ආර්ථිකයට විශාල දායකත්වයක් ලබාදෙයි.


වසර තුළදී ලංකා බැංකුව "පිට පිට රට තෑගි" වැඩසටහන දියත්කරන ලද අතර එමඟින් ලංකා බැංකුව හරහා විදේශ ප්‍රේෂණ ලැබූවන් අතරින් ජයග්‍රාහකයින්ට අගනා ත්‍යාග 300 ක් ප්‍රදානය කරන ලදී. පාරිභෝගික පහසුකම් සැපයීමේ වැඩසටහන් 3 ක් තංගල්ල, බණ්ඩාරගම සහ අනුරාධපුර යන ප්‍රදේශවල පවත්වන ලදී. තවද විදේශගත ශ්‍රමිකයින් ඉලක්ක කරගනිමින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) සමඟ එකමුතුව දැනුවත් කිරීමේ වැඩසටහන් 112 ක් පවත්වන ලදී.

තවද, බැංකුව විසින් දකුණු කොරියාව, කටාර්, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඕමානය යන රටවල විදේශ විනිමය හුවමාරු මධ්‍යස්ථාන සහ බැංකු කාර්ය මණ්ඩලය සහ විදේශගත ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සුහද හමු සංවිධානය කරන ලදී. අපගේ මෙම අංශයේ ඉහළම කාර්යසාධනයක් පෙන්නුම් කර ඇත්තේ කටාර්, දකුණු කොරියාව සහ ඉතාලිය යන රටවල් වේ.

තවද, සිසුන් සහ අනෙකුත් සංචාරකයින් සඳහා ඉතා ප්‍රයෝජනවත් සේවාවක් සපයමින් බැංකුව විසින් ප්‍රතිමුඛ ප්‍රේෂණයන් සහ සංචාරකයින් සඳහාද සේවා සපයනු ලැබේ. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ අපගේ ගෙවීම් කාර්යාලය මුදල් ගනුදෙනු සහ අනෙකුත් සේවාවන් සැපයීම සඳහා පැමිණීමේ හා පිටවයාමේ ප්‍රදේශ දෙකෙහිම පැය 24 පුරාම ක්‍රියාත්මක වේ.

ආමුඛ ප්‍රේෂණ වටිනාකම

(රු. බිලියන)



නියෝජිත බැංකුකරණය

ලංකා බැංකුව සතුව ලොව පුරා විහිදුනු මූල්‍ය ආයතන 864 ක් සමඟ නියෝජිත සම්බන්ධතා ඇති අතර වසර තුළ විනිමය හුවමාරු මධ්‍යස්ථානයක්ද එකතු වෙන ලදී. විදේශීය රටවල් පදනම් කරගත් මූල්‍ය ආයතන වන අපගේ නියෝජිත බැංකු ආයතන මඟින් ලංකා බැංකුවේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් විද්‍යුත් මූල්‍ය සංසරණ පහසුකම් සැලසීම, ව්‍යාපාර ගනුදෙනු සිදු කිරීම, තැන්පතු භාර ගැනීම සහ ආනයන අපනයන ගනුදෙනු සඳහා පහසුකම් සැපයීම සිදු කරනු ලැබේ.

එතෙර මෙහෙයුම්

ලංකා බැංකුවේ එතෙර මෙහෙයුම් කටයුතු මාලේ, චෙන්නායි හා සීෂෙල්ස් යන ශාඛා සහ එක්සත් රාජධානියේ පරිපාලිත සමාගම පදනම් කරගෙන ක්‍රියාත්මක වේ. අප රටේ ජනතාව විශාල සංඛ්‍යාවක් විදේශගත වී ලොව පුරා විසිරී සිටීම හේතුවෙන්, එතෙර මෙහෙයුම් තවදුරටත් ව්‍යාප්ත කිරීමේ අවස්ථා බැංකුව සතුවේ. එතෙර මෙහෙයුම් කටයුතු පුළුල් කිරීම අවදානම් විවිධාංගීකරණය සඳහා ආකර්ෂණීය උපාය මාර්ගයකි.

අනාගත සැලසුම්

2018 - 2020 සඳහා වන ආයතනික සැලැස්මේදී "සේවා සත්කාර සහ පාරිභෝගිකයා වෙත ලඟාවීම" කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. සෑම පාරිභෝගිකයකුම ඉතා ඉහළින් තෘප්තිමත් විය හැකි මට්ටමකට පාරිභෝගික අත්දැකීම් සමස්ත ශාඛා ජාලය තුළම වැඩි දියුණු කිරීම සහ ප්‍රමිතකරණය කිරීම මෙහි අරමුණයි.

පාරිභෝගික මනාප ප්‍රවණතා අතරින්, 2018 වසරේ අපගේ උපායමාර්ග අතර ඩිජිටල් බැංකු කටයුතු තවදුරටත් පෙරමුණ ගෙන ඇත. "තොරතුරු තාක්ෂණය සහ සයිබර් ආරක්ෂාව" උපායමාර්ගික සැලැස්මෙහි අවධානය යොමුවන ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගෙන ඇත. නව සහස්‍රයේ පාරිභෝගික ඉල්ලීම් සමඟ කටයුතු කිරීමට බැංකුව තුළ ඇති තාක්ෂණික යටිතල පහසුකම් යාවත්කාලීන කළ යුතුය. තාක්ෂණය නව අවස්ථාවන් ලඟා කරන අතරම තර්ජනද ගෙන එයි. අපගේ දත්ත, පද්ධති හා ජාලයන් හැකි උපරිම තත්ත්වයකින් ආරක්ෂිත බව අප සහතික කරගත යුතුය. ගනුදෙනුකරුවන්ට සැබෑ යථාර්ථවාදී බැංකුකරණ අත්දැකීමක් ලබා දීමේ අරමුණින් බැංකුව වෙත නවීන තාක්ෂණික දියුණුව අත් කර ගැනීම සඳහා උපායමාර්ග සංවර්ධනය කර ඇත.

2018 - 2020 සඳහා වන ආයතනික සැලැස්මේදී "සේවා සත්කාර සහ පාරිභෝගිකයා වෙත ලඟාවීම" කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. සෑම පාරිභෝගිකයකුම ඉතා ඉහළින් තෘප්තිමත් විය හැකි මට්ටමකට පාරිභෝගික අත්දැකීම් සමස්ත ශාඛා ජාලය තුළම වැඩි දියුණු කිරීම සහ ප්‍රමිතකරණය කිරීම මෙහි අරමුණයි.

ඉදිරියට යාමේදී බැංකුව විසින් සියළුම පළාත් සඳහා සිය ප්‍රංගම බැංකු කටයුතු ව්‍යාප්ත කරනු ඇති අතර ඩිජිටල් ශාඛාද ආරම්භ කරනු ඇත. තවද, අප ව්‍යාපාර ක්‍රියාවලීන් ස්වයංක්‍රියකරණය නව දුරටත් ඉදිරියට ගෙන යනු ලබන අතර ඉදිරි වසර තුළ නව නිෂ්පාදන හඳුන්වා දෙනු ඇත.

"ක්‍රියාවලි සරල කිරීම හා නවෝත්පාදනය" යටතේ ගනුදෙනුකරුවන් මෙන්ම කාර්ය මණ්ඩලයේ තෘප්තිය සඳහා අවශ්‍ය උපරිම කාර්යක්ෂමතාවය හා ඵලදායීත්වය ලබාගැනීම සඳහා දැනට පවත්නා නිෂ්පාදන ක්‍රියාවලීන් සහ පද්ධති තුළ ඇති ගැටළුකාරී තත්ත්වයන් සොයා බලා අවශ්‍ය නව සංශෝධන හා වෙනස්කම් සිදු කිරීමට බැංකුව කටයුතු කරනු ලබයි.

නවෝත්පාදන ප්‍රවේශයකින් නව අවස්ථා විමර්ශනය කරමින් නව ව්‍යාපාර ආකෘති නිර්මාණය කරමින් සිය සීමා මායිම් පුළුල් කිරීම කෙරෙහි බැංකුව සිය අවධානය යොමු කොට ඇත. ලොව පුරා ඕනෑම තැනක සිට පැය 24 පුරාම ගනුදෙනුකරුවන් වෙත සේවා පහසුකම් සැලසීමේ අවස්ථාව මෙමඟින් ලබා දෙනු ඇත.

මෙයට සමගාමීව බැංකුවෙහි ආයතනික, ශාඛා, සුළු හා මධ්‍ය පරිමාණ සහ ක්ෂුද්‍ර මූල්‍ය යන පාරිභෝගික අංශයක් තුළම "ණය ගුණාත්මකභාවය සහ ණය සංස්කෘතිය" ඇති කිරීම සඳහා ද බැංකුව සිය ප්‍රමුඛත්වය ලබා දෙයි. මේ තුළින් ශ්‍රී.ලං.ගි.වා.ප්‍ර. අංක 9 විසින් ඉදිරිපත් කරන ලද දැඩි අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් වත්කම්වල ගුණාත්මක භාවය ඉහළ නංවන අතරම වඩා හොඳ ගනුදෙනුකාර සේවාවක් සැපයීමේ ද්විත්ව කාර්යය ඉටු කරනු ඇත.

ව්‍යාපාර හවුල්කරුවන්

භාණ්ඩ හා සේවා සැපයීම, බාහිර සේවා සපයන්නන් සහ නියෝජිත බැංකුකරණ කටයුතු සම්බන්ධයෙන් තෙවන පාර්ශවයන් සමඟ බැංකුව නිරන්තරයෙන් කටයුතු කරයි. ඔවුන් සපයන සේවාවන් බැංකුවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය වන අතර ඔවුන් බැංකුවේ හවුල්කරුවන් ලෙස සලකනු ලබයි. වසර තුලදී බැංකුව විසින් මිලදී ගැනිමි 556 ක් සිදුකර ඇත. මෙම මිලදී ගැනීම් වලින් 98% කට අධික ප්‍රමාණයක් දේශීය සැපයුම්කරුවන්ගෙන් හෝ නියෝජිතයින්ගෙන් වන අතර අප සෑම විටම අපගේ ව්‍යාපාර හවුල්කරුවන් සමඟ දෙපාර්ශවයටම වාසිදායක වන අයුරින් සබඳතා පවත්වාගෙන යාමට උත්සාහ කරමු. මෙම ව්‍යාපාර හවුල්කරුවන් සමඟ විශ්වාසය මත පදනම් වූ දිගුකාලින සබඳතා ගොඩනගා ගැනීම සහ පවත්වාගෙන යාම මඟින් සිය ව්‍යාපාර කටයුතු අඛණ්ඩව හා පහසුවෙන් කරගෙන යාමට හැකිවන පරිදි අවශ්‍ය ප්‍රමිතිය සපුරාලන භාණ්ඩ/සේවා සැපයුම නිරන්තරයෙන් පවතින බව තහවුරු කර ගැනීමට බැංකුව සමත් වී ඇත. ලංකා බැංකුව රාජ්‍ය බැංකුවක් වන අතර මිලදී ගැනීම් කටයුතු අදාල ක්‍රියාපටිපාටීන් අනුව විනිවිද භාවයකින් යුතුව සිදු කළ යුතුය. භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම අනිවාර්ය වේ. බැංකුවේ මිලදී ගැනුම් රජයේ මිලදී ගැනුම් ප්‍රතිපත්තිය මත පදනම් වන අතර එම නිසා, එය විනිවිදභාවයක් සහිතව පවත්වාගෙන යන අතර අදාල ප්‍රතිපත්ති මඟින් සකස් කර ඇති අවම පාරිසරික සහ සමාජීය ප්‍රමිතීන්ට අනුකූල වේ.

විදේශීය ව්‍යවහාර මුදල් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට බැංකුව සිය නියෝජිත බැංකු සමඟ කටයුතු කරයි. දිවයිනේ විශාලතම නියෝජිත බැංකු ජාලය ලංකා බැංකුව සතු වන අතර අපගේ ගනුදෙනුකරුවන්ට ඉක්මන් හා විශ්වාසනීය වෙළඳ මූල්‍යකරණ සේවාවන් හා මුදල් නුවමාරු සම්බන්ධ සේවා සැපයීම සඳහා මෙය විශාල ශක්තියක් වේ.

සමාජීය දායකත්වය/ආයතනික සමාජ වගකීම

තිරසාරත්වය බැංකුවේ උපාය මාර්ගික මුලිකාංගයකි. අප විසින් ආර්ථික වර්ධනයේ අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර හඳුනාගෙන ඇති අතර, බැංකුවේ උපාය මාර්ගික ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්, අධ්‍යාපනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, ජාතික උරුමයන් ආරක්ෂා කිරීම, ආචාරධර්ම හා වටිනාකම්, ජීවනෝපාය සංවර්ධනය, සමාජ සංවර්ධනය සහ පරිසර සංරක්ෂණය යන මෙම ක්ෂේත්‍රයන් යටතේ පවත්වාගෙන යනු ලබයි.

වසර තුළ ඉහත උපාය මාර්ගික ආයතනික සමාජ වගකීම් ක්ෂේත්‍ර යටතේ සමාජීය දායකත්වය ලෙස රු. මිලියන 127.5 ක් ආයතනික සමාජ වගකීම් අයවැය මඟින් ලබා දෙන ලදී. ඒවා පහත පරිදි වේ.

- ජාතික උරුමයන් සුරැකීම, ආචාරධර්ම හා වටිනාකම් - රු. මිලියන 28.3
- ව්‍යවසායකත්ව සංවර්ධනය - රු. මිලියන 9.6
- අධ්‍යාපනය - රු. මිලියන 22.5
- සමාජ සංවර්ධනය සහ පරිසර සංරක්ෂණය - රු. මිලියන 57.8
- ජීවනෝපාය සංවර්ධනය - රු. මිලියන 9.3

බැංකුව විසින් මෙම ක්ෂේත්‍රයන් සිය ආයතනික සමාජ වගකීම් අයවැය මඟින් පමණක් නොව තම මූලික ව්‍යාපාර ක්‍රියාවලීන් තුළින්ද ආමන්ත්‍රණය කරනු ලබයි. ක්ෂුද්‍ර මූල්‍ය හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය ලබාදීම තුළින් සිදු කරන ව්‍යවසායකයන් බිහි කිරීම හරහා බැංකුව බෙහෝ දෙනෙකුගේ පිවිත නඟා සිටුවීමට සහය වී ඇත.

තවද, බැංකුව විසින් 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වයෙන් සහ අ.පො.ස. (උ/පෙ) විභාගයෙන් ඉහළ සාමාර්ථ ලබාගන්නා රන් කැකුළු ගිණුම් හිමියන් සඳහා වාර්ෂිකව ශිෂ්‍යත්ව පිරිනැමීමද සිදු කරනු ලබයි. තවද, 5 ශ්‍රේණි සිසුන් සඳහා "හපනා වැඩසටහන්" ද ක්‍රියාත්මක කරනු ලබයි. මෙවැනි ඉසව් සිසු දරු දැරියන්ගේ අධ්‍යාපනය දියුණු කිරීම සඳහාද උපකාරී වේ.

ජාතික උරුමයන්, ආචාරධර්ම හා වටිනාකම් සුරැකීම

වාර්ෂිකව ශ්‍රී දළදා පෙරහැර, කතරගම ඇසළ පෙරහැර, ගංගාරාම විහාරස්ථානයේ නවම් මාවත පෙරහැර, ඉඳිගොල්ල ශාන්ත ජූඩ්ගේ සිද්ධස්ථානයේ වාර්ෂික සැමරුම් උත්සවය සඳහා වාර්ෂික ප්‍රදානයන් සහ ලංකා බැංකුවේ හින්දු සංගමය මඟින් සිදු කරන වාර්ෂික නවරාත්‍රී සැමරීම සඳහා බැංකුව විසින් අනුග්‍රාහකත්වය සැපයීම.

ව්‍යවසායකත්ව සංවර්ධනය

- "මිතුරු" ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය
- සුළු ව්‍යවසායකයින් සංවර්ධනය කිරීම සඳහා බැංකු අරමුදල් යොදා ගනිමින් ක්‍රියාත්මක කරන ලද විශේෂ ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන

පූර්ණ හා සාමානාත්මතාවයෙන් සපිරි ගුණාත්මක අධ්‍යාපනයක්



සිසුන් 24,024 කට ප්‍රතිලාභ සලසමින් 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා "හපනා" සම්මන්ත්‍රණ මාලාවක් බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලදී. ද්විතීයික පාසල් සිසුන් අතර මූල්‍ය විනය සහ මූල්‍ය සාක්ෂරතාවය කාවැද්දීම සඳහා "Guide to future" වැඩසටහන ද ක්‍රියාවට නංවන ලදී.

- **5 වසර ශිෂ්‍යත්ව ප්‍රතිලාභීන් - 2000**
- **අ.පො.ස. (උ/පෙ) ඉහළින් සමත් වීමෙන් 18+ ශිෂ්‍යත්ව ප්‍රතිලාභීන් - 198**

අධ්‍යාපනය

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සිදු කරන ලද සමාජීය වශයෙන් ඵලදායි අධ්‍යාපනික ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

- 5 වසර සිසුන් සහ ඔවුන්ගේ දෙමාපියන් සඳහා සිංහල සහ දෙමළ යන මාධ්‍ය දෙකෙන්ම ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දීම සඳහා ඔවුන් පුහුණු කිරීම සඳහා මග පෙන්වීමට "හපනා" සම්මන්ත්‍රණ 59 ක් වසර තුළ ක්‍රියාත්මක කරන ලදී. ප්‍රතිලාභී සිසුන් සංඛ්‍යාව 24,024 ක් වන අතර දෙමාපියන් සංඛ්‍යාව 18,000 කි.
- 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේදී ඉහළ දක්ෂතා දැක්වූ සිසුන් සඳහා "රන් කැකුළු" ශිෂ්‍යත්ව පිරිනමන ලදී. රු. 15,000 බැගින් වූ ශිෂ්‍යත්ව 2,000 ක් පිරිනැමුනු අතර වැයවූ මුදල රු. මිලියන 30.0 කි.
- අ.පො.ස. (උ/පෙ) විභාගයේදී දිස්ත්‍රික්ක මට්ටමින් එක් එක් විෂයධාරව යටතේ ඉහළ Z අගයක් ලබා ගත් 18+ ගිණුම් හිමි සිසුන් සඳහා ශිෂ්‍යත්ව පිරිනමන ලදී. මෙම වැඩසටහන යටතේ ලබා දුන් මුළු මුදල රු. මිලියන 6.0 කට අධික වන අතර ප්‍රතිලාභ ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 198 කි.



"හපනා" ශිෂ්‍යත්ව බෙදාදීම

- බැංකුව විසින් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව ජයග්‍රාහකයන්ට වටිනා ත්‍යාග පිරිනැමුන "පුංචි පිකාසෝ" නමින් පවත්වන ලද තරඟයකට අනුග්‍රාහකත්වය දරා ඇත. මෙම තරඟයට දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම විශාල ප්‍රතිචාරයක් ලැබිණි. ජාතික හා පළාත් මට්ටමේ ජයග්‍රාහකයින්ට සහ ඔවුන්ගේ පාසල් වලට මුදල් ත්‍යාග සහ සහතිකපත් පිරිනැමිනි.

සමාජ සංවර්ධනය සහ පරිසර සංරක්ෂණය

- පරිසරය සුරැකීම සහ මත්ද්‍රව්‍ය පිටුදැකීම සඳහා වූ යොවුන් කඳවුර - පොළොන්නරුව
- රටපුරා විවිධ පාසල් වල වාර්ෂික ක්‍රීඩා උළෙල සහ ක්‍රීඩා ඉසව් සඳහා අනුග්‍රාහකත්වය දැක්වීම
- වේදිකා නාට්‍ය, සංගීත ඉසව් ආදිය සඳහා අනුග්‍රාහකත්වය සැපයීම
- ලෝක ජල දිනය සැමරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලයට අනුග්‍රාහකත්වය සැපයීම



"පුංචි පිකාසෝ" තරඟයේ ජයග්‍රාහකයින් සඳහා සම්මාන පිරිනැමීම

නිරෝගී පැවැත්ම සහ යහපැවැත්ම

3 නිරෝගී බව සහ යහපැවැත්ම

නිදන්ගත වකුගඩු රෝගය සහ ප්‍රමාණවත් රෝහල් යටිතල පහසුකම් නොමැති වීම ඇතුළු ජාතික සෞඛ්‍ය ගැටළු පිටු දැකීම සඳහා බැංකුව දායකත්වය දැක්විය. තවද සේවකයන්ට ඔවුන්ගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා බැංකුව විසින් කායවර්ධන මධ්‍යස්ථානයක් සහ වෙනත් ක්‍රීඩා පහසුකම්ද සලසා ඇත.

- **ප්‍රජාවගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා ආයතනික සමාජීය වගකීම යටතේ ප්‍රදානයන් - රු. මිලියන 8.9**
- **කායවර්ධනය සඳහා ලියාපදිංචි වූ මුළු සේවක සංඛ්‍යාව - 1,020**

සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම්

6 පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව

ජාතික ජලසම්පාදන ව්‍යාපෘති සඳහා ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයට ලබා දුන් ණය තුළින් මේ සඳහා අපගේ ප්‍රධාන දායකත්වය ලබා දී ඇත. ග්‍රාමීය ප්‍රජාවට පිරිසිදු ජලය ලබාදීම සඳහා මහවැලි අධිකාරියට ද අපි සහයෝගය ලබා දී ඇත.

- **ආයතනික ශාඛාව මඟින් ජල සැපයුම් ව්‍යාපෘති සඳහා ලබාදුන් අරමුදල් - රු. බිලියන 17.0**
- **අත්‍යාවශ්‍ය ප්‍රජාවට ජල පිරිපහදු යන්ත්‍ර ලබාදීම සඳහා මහවැලි අධිකාරිය හා එක්ව දියත් කළ ආයතනික සමාජීය වගකීම් වැඩසටහන**

ජීවනෝපාය සංවර්ධනය

- ලෝක ළමා දිනය සමරමින් "අපේක්ෂා" රෝහලේ ළමා වාට්ටුවේ ළමුන් සඳහා චිත්‍ර ප්‍රදර්ශනයක් ද පවත්වන ලදී. සාමාන්‍ය ළමා අවධියක් නොමැති දරුවන් පිරිසකගේ ජීවිතයට යම් ආලෝකයක් ගෙන ඒමට මෙම වැඩසටහනට හැකිවිය. ඔවුන්ගේ කලාකෘති, රෝහලේ ඒ සඳහා වෙන්වූ ප්‍රදේශයක ප්‍රදර්ශනය කරන ලදී.



"අපේක්ෂා" රෝහලේ ළමා වාට්ටුවේ පැවති චිත්‍ර ප්‍රදර්ශනය

- "Guide to Future" සම්මන්ත්‍රණ මාලාව තුලින් සිසුන් අතර මූල්‍ය විනය වර්ධනය කිරීම, ශිෂ්‍යයින්ගේ මෘදු නිපුණතා වර්ධනය, ඔවුන් තුල වගකීම් සහගත බව වර්ධනය කිරීම, මූල්‍ය ඇතුළත්කරණය සඳහා පහසුකම් සැලසීම යනාදිය මඟින් අවසානයේ සමාජය සඳහා වැඩදායී පුරවැසියෙකු බිහි කිරීම අරමුණ කොටගෙන ඇත. තවද මෙම සම්මන්ත්‍රණ මාලාව මඟින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, මුදල් තැන්පතු යන්ත්‍ර, අන්තර්ජාල බැංකු පහසුකම් සහ ජංගම බැංකුකරණ කටයුතු භාවිතා කරන ආකාරය, පුද්ගල සම්බන්ධතා වෘත්තීය ප්‍රගමනය සහ රැකියා නියුක්තිය යන නිවැරදි ආකාරයෙන් අන්තර්ජාලය භාවිතා කරමින් ස්වයං - විවරණය කිරීම ආදිය ආවරණය කර ඇත. දිවයින පුරා සම්මන්ත්‍රණ 171 ක් ක්‍රියාත්මක කරන ලද අතර ප්‍රතිලාභී ශිෂ්‍යයින් සංඛ්‍යාව 40,000 කට අධිකය.
- "ලිට්ල් හාර්ට්" වැඩසටහන සඳහා අනුග්‍රාහකත්වය සැපයීම.

සම්බන්ධීකරණය

පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධව කටයුතු කරන ප්‍රධාන නාලිකා පහත දැක්වේ.

- දැන්වීම් ප්‍රචාරණය, නිවේදන
- වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම
- බැංකුවේ නිල සමාජ වෙබ් අඩවි
- සැපයුම්කරුවන් සහ සේවා සපයන්නන් සමඟ රැස්වීම්
- බැංකුවේ බාහිර සේවා ප්‍රතිපත්තිය සහ වෙනත් අභ්‍යන්තර ක්‍රියාපටිපාටි ලේඛන
- නියෝජිත බැංකු සමඟ ලිඛිත සන්නිවේදනයන්

නියාමනයන්

බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස ලංකා බැංකුව ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් නියාමනය වන අතර එහි උපදෙස්, මාර්ගෝපදේශන සහ විචක්ෂණශීලී රෙගුලාසි වලට යටත් වේ. මෙම මාර්ගෝපදේශ සහ රෙගුලාසි වලට අනුකූල වීම, බැංකුවේ සහ මූල්‍ය පද්ධතියේ ආරක්ෂාව සහ ශක්තිමත් භාවය සහතික කර ගැනීමට උපකාරී වේ. මෙම රෙගුලාසි උල්ලංඝනය කරන අවස්ථාවකදී බැංකුවට දඩ (මූල්‍ය හා වෙනත්) නියම කල හැකි අතර මෙමඟින් බැංකුවේ කීර්තිනාමය අවදානමට ලක් විය හැකිය.

තවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ කොටස් හුවමාරුව සහ ණය තොරතුරු කාර්යාංශය ඇතුළු වෙනත් ආයතන විසින් නිකුත් කරන ලද නියෝග සහ මාර්ගෝපදේශ වලටද බැංකුව යටත්වේ. බැංකුව මූලික වශයෙන් මෙම ආයතන සමඟ ලිඛිත සන්නිවේදනය, රැස්වීම් සහ සාකච්ඡා හරහා සම්බන්ධ වීම සිදු කරයි.

මෙම ආයතන සමඟ වැඩ කිරීමෙන්, බැංකුවේ එදිනෙදා ව්‍යාපාර කටයුතු මනාලෙස පවත්වාගෙන යෑම පහසු කරවන අතර, බැංකුවේ කීර්තිනාමය පළුදු වීමට ඇති අවදානමද මඟ හරවා ගත හැකිය.



"Guide to Future" දකුණු පළාතේ පැවති සම්මන්ත්‍රණය

බැංකු කර්මාන්තය හා සම්බන්ධ සමාගම්හි සාමාජිකත්වය

පහත දැක්වෙන ආයතන සහ සංගම් හි සාමාජිකත්වය බැංකුව සතුවේ.

- ආසියානු පැසිෆික් ග්‍රාමීය හා ගොවි ණය සංගමය (APRACA)
- බැංකු ක්ෂේත්‍රයේ අවදානම් වෘත්තිකයන්ගේ සංගමය, ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- අන්තර්ජාතික වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකාව
- ජාතික වාණිජ මණ්ඩලය, ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා බැංකු (ඇපයෙන්) සීමිත සමාගම
- ශ්‍රී ලංකා නීති පුස්තකාලය
- ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (ඇපයෙන්) සීමිත
- අනුකූලතා නිලධාරීන්ගේ සංගමය, ශ්‍රී ලංකාව
- ශ්‍රී ලංකා නීතීඥ සංගමය

තිරසාර සංවර්ධනය සඳහා වූ පාර්ශ්වකරණයන්

17 තිරසර සංවර්ධනය සඳහා පාර්ශවකරණයන්

රජය, රාජ්‍ය ආයතන සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ ජාල සබඳතා රාශියක් බැංකුව සතුය. තිරසාර බැංකුකරණ මූලාරම්භය ඇතුළුව ජාත්‍යන්තර සහයෝගිතාවයන් කිහිපයකම බැංකුව හවුල්කරුවකු වේ.

- **සියළුම ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය බැහැර කරනුයේ මධ්‍යම පරිසර අධිකාරිය මඟින් අනුමත කරන ලද නියෝජිතයෙකු හරහාය**
- **ඩිජිටල් මූලාරම්භයන් තුළින් ඉතිරි කරන ලද කඩදාසි ප්‍රමාණය කඩදාසි 259,892 කි.**

අපගේ වටිනාම වත්කම මඟින් උපරිම දායකත්වයක්





මුළු සේවක සංඛ්‍යාව

7,587



ස්ත්‍රී

57%



පුරුෂ

43%



වසර තුළදී සේවක පුහුණු පැය

11,884



වසර තුළ සේවක උසස්වීම්

1,831



වසර තුළ සේවක බඳවා ගැනීම්

534

නව සේවක නිවාඩු නිකේතන කයිට්ස් සහ ත්‍රිකුණාමලය **2**

සේවය හැරයාමේ ප්‍රතිශතය

0.3%

මානව ප්‍රාග්ධනය

ස්ත්‍රී පුරුෂ සාමානාත්මතාව

5 ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

සේවා නියුක්තිය ඇතුළුව සිය සෑම කටයුත්තකදීම බැංකුව ස්ත්‍රී පුරුෂ පදනම මත වෙනස් වශයෙන් සැලකීමක් සිදු කරනු නොලැබේ. අප කාර්ය මණ්ඩලයෙන් 57% ක් ස්ත්‍රී පක්ෂය වීම තුළින් සහ සියලු උසස්වීම් වලින් 57% ක් ස්ත්‍රී පක්ෂයට ප්‍රදානය කිරීම තුළින් මෙම කරුණ මනාව පැහැදිලි වේ.

- **සියලු සේවා නියුක්තිකයන්ගෙන් පුරුෂ:ස්ත්‍රී අනුපාතය – 1:1.3**
- **ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය (ප්‍රධාන කළමනාකරුවන්ද ඇතුළුව) පුරුෂ:ස්ත්‍රී අනුපාතය – 2.1:1**

සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම

8 සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය

යෝග්‍ය වැඩ පරිසරය සහ ආර්ථික වර්ධනය 7,587 ක් වූ අපගේ කාර්ය මණ්ඩලය මනා සේ වැටුප් ලබන අතර විශ්‍රාමික ප්‍රතිලාභ වලින් සුරක්ෂිත ව ඇත.

- **සේවා නියුක්තියකින් සඳහා දරණ ලද පිරිවැය – රු. බිලියන 17.0**
- **නව බඳවාගැනීම් සංඛ්‍යාව – 534**

තාක්ෂණික සහ නිෂ්පාදන ප්‍රාග්ධනය වශයෙන් බැංකුව සතුව කෙතරම් වත්කම් ප්‍රමාණයක් පැවතුනද අපගේ සාර්ථකත්වය සහ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වනුයේ අප සතු මානව සම්පතයි. වර්ෂ 2012 දී බැංකුව සතු වත්කම් ප්‍රමාණය රු. ට්‍රිලියනයක් වන විට අප සතු කාර්ය මණ්ඩලය 7,790 ක් විය. 2017 වර්ෂය අවසානයේදී 7,587 ක කාර්ය මණ්ඩලයක් සහිතව රු. ට්‍රිලියන 1.9 ක වත්කම් ප්‍රමාණයක් සතු කර ගැනීමට අප සමත් විය. මෙතුළින් අප කාර්ය මණ්ඩලය විසින් ලබා දෙන දායකත්වය මනා කොට පෙන්නුම් කරනු ලැබේ. නවින තාක්ෂණය භාවිතා කිරීම ඉහළ යාම ඉතා වැදගත් දායකත්ව කරුණක් බවට කිසිදු සැකයක් නැත. කෙසේ වුවද තාක්ෂණය තුළින් උපරිම ඵලදායීතාවක් ලබා ගැනීම සඳහා අප කාර්ය මණ්ඩලය සතු කුසලතාවයන්, දක්ෂතා, දැනුම සහ කැපවීම අත්‍යවශ්‍ය වේ. බැංකුව විසින් ගොඩනගාගෙන ඇති සන්නාම නාමයට සහ ජයග්‍රහණය කර අති ගෞරව සම්මානයන්ට අපගේ සේවක ප්‍රජාව ඉතා ඉහළ දායකත්වයක් සපයා අති බවට කිසිදු සැකයක් නැත. තවද මූල්‍ය ප්‍රාග්ධනය ගොඩ නැගීමේ ගෞරවයෙන් වැඩි කොටසක්ද අප සේවක මණ්ඩලය සතුවිය යුතුය.

අප කණ්ඩායම පුරුෂ පක්ෂය 43% කින් සහ ස්ත්‍රී පක්ෂය 57% කින් සමන්විත වන අතර ස්ත්‍රී පුරුෂ අසාමාන්‍යතාවක් නොමැති බව එතුළින් පෙන්නුම් කෙරේ. කාර්ය මණ්ඩලයේ සියලුම කාණ්ඩයන් අතර ස්ත්‍රීන්ට සහ පුරුෂයන්ට වන සමාන්‍ය මූලික වැටුප සහ මුළු පාරිශ්‍රමික එකම තලයේ පැවතීම තුළින් මෙය තවදුරටත් සහතික කරනු ලැබේ. එක් පළාතක් හැර අනෙකුත් සියලුම පළාත්හි බහුතර කාර්ය මණ්ඩලය ස්ත්‍රී පක්ෂය වේ. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ වර්ගීකරණයන් සලකා බලන කල, ශාඛා කළමනාකරුවන් සහ සහකාර කළමනාකරුවන් ජේෂ්ඨ කළමනාකරුවන් සහ ප්‍රධාන කළමනාකරුවන්ගෙන් ස්ත්‍රී පාර්ශවයේ නියෝජනය පිළිවෙලින් 57%, 47% හා 38% වේ.

සේවක බඳවාගැනීමේ ක්‍රියාපටිපාටිය

ඉතා ඉහළ ව්‍යක්තීමය හා ව්‍යුහමය බඳවා ගැනීමේ ක්‍රියාවලියක් ලංකා බැංකුව සතු අතර එතුළින් දක්ෂයන් අතරින් විශිෂ්ටයන් තෝරා ගැනීම සහතික කෙරේ. අපගේ බඳවා ගැනීමේ ක්‍රියාවලියේදී විෂය කරුණු කෙරෙහි පවතින දැනුම සහ තාක්ෂණික කුසලතා වලට අමතරව අනෙකුත් දක්ෂතාවන්ටද වැඩි වටිනාකමක් දෙනු ලැබේ. අපගේ බඳවා ගැනීම් වලින් බොහෝමයක් කළමනාකරණ පුහුණු තනතුරු සහ බැංකු සහකාර තනතුරු සඳහා වේ. සියලු බඳවා ගැනීම් ශ්‍රී ලාංකිකයන්ගෙන් වන අතර පාරදෘශ්‍ය බඳවා ගැනීමේ ක්‍රියාවලියක් අප සතුවේ. එය සියලු පක්ෂග්‍රාහී කටයුතුවලින් බැහැර වේ. බැංකුවට අතුළත් වීමට අපේක්ෂා කරන සියලු දෙනාම සිය ජනවර්ගය, වයස, ස්ත්‍රී පුරුෂ භාවය සහ සමාජ මට්ටම යන සාධක වලින් බැහැරව තරඟ කරනු ලැබේ. නවක සේවකයින්ගේ කුසලතා ඇගයීම සඳහා අප විශේෂ අවධානයක් යොමු කරනු ලබන අතර ඔවුන්ට වඩා ගැළපෙන කාර්යයන් සඳහා අනුයුක්ත කරනු ලැබේ. සේවකයන්ව බඳවා ගැනීමේදී, අපගේ සියලු නව බඳවාගන්නන් මූලික පුහුණුවකට යොමුකරනු ලබන අතර එහිදී බැංකුවේ සංස්කෘතිය සහ ආචාරධර්ම ඔවුන්ට උගන්වනු ලැබේ. බඳවා ගැනීමේ ක්‍රියාවලියේදී භූගෝලීය ව්‍යාප්තිය කෙරෙහි අප හැකිතාක් දුරට අවධානය යොමු කරනු ලබන අතර එතුළින් ඔවුන්ගේ නේවාසික ස්ථාන වලට ඔවුන් වඩාත් ආසන්නතම ස්ථාන වලට අනුයුක්ත කිරීමට කටයුතු කරනු ලැබේ.

බඳවාගැනීම්

සේවා කාණ්ඩය	පුරුෂ	ස්ත්‍රී	එකතුව
පද්ධති විශ්ලේෂක/වැඩසටහන් සම්පාදක	15	10	**25**
පුහුණු සහකාර නීති නිළධාරී	2	17	**19**
ප්‍රධාන ආරක්ෂක නිළධාරී	1	0	**1**
අධ්‍යක්ෂ මණ්ඩලයේ සහකාර ලේකම්	0	1	**1**
පුහුණු බහුකාර්ය සහය සේවක	16	3	**19**
ආරක්ෂක සහායකයින්	145	2	**147**
කළමනාකරණ පුහුණුවන්නන්	98	224	**322**
එකතුව	277	257	**534**

පුහුණු කිරීම් හා සංවර්ධනය

අපගේ කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ හැකියාවන් සහ කුසලතා උපරිමය දක්වා වර්ධනය කරගැනීමට අවස්ථාව ලබා දිය යුතු බවට අප විශ්වාස කරනු ලබන අතර එතුළින් ඔවුන්ගේ වෘත්තිය අභිලාශයන් ඉටු කර ගැනීමට අවස්ථාව ලැබේ. උපරිම ගනුදෙනුකාර සේවය ලබා දීම සඳහා අවශ්‍ය දැනුම සහ ගුණාංග ඔවුන් තුළ ස්ථාපිත කිරීම සඳහා අප ඉතා ඉහළ වැදගත් කමක් ලබා දෙනු ලැබේ. පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ සැලසුම් කිරීම සඳහා බැංකුව සතුව විධිමත් ක්‍රියාවලියක් ඇත. පුහුණු අවශ්‍යතා සේවා නියුක්තිකයින් ඔවුන් විසින්ම හෝ ඔවුන්ගේ අධීක්ෂකයින් මඟින් හෝ හඳුනා ගනු ලැබේ. බැංකුව සතුව පුහුණු කිරීමේ සැලැස්මක් අති අතර එතුළින් පෙර සැලසුම් කරන ලද වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර අවශ්‍යතාවයන් පැන නැඟුණු විට තත්කාර්ය පදනමකින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. සේවා නියුක්තිකයින්ගේ අනුමැතිය සහිතව අධීක්ෂකයින් විසින් කාර්යසාධනය ඇගයීම් ක්‍රියාවලියේදී පුහුණු අවශ්‍යතා හඳුනාගනු ලැබේ. වර්ෂය තුළදී බැංකු කර්මාන්තය තුළ නව නියාමන වෙනස් වීම් හෝ නව සංවර්ධයන් සිදු වූ විට අදාළ සේවා නියුක්තිකයින් සුදුසු පුහුණු කිරීම් සඳහා අධීක්ෂකයින් විසින් යොමු කරනු ලබන අතර එතුළින් ඔවුන්ගේ දැනුම වර්ධනය වේ.

සියලු මට්ටම්වල සේවා නියුක්තිකයින්ට අදාළ කාර්යසාධන ඇගයීම් වලට අමතරව, ජ්‍යෙෂ්ඨ කළමනාකාර සහ එයට ඉහළ ශ්‍රේණීන්හි වසර දෙකක් සම්පූර්ණ කළ කාර්ය මණ්ඩල සමාජිකයින් වෙත විශේෂ කුසලතා කළමනාකරණ ක්‍රියාවලියක් පවත්වාගෙන යනු ලැබේ. බැංකුවේ සේවය හැරයන ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ සේවා පුරප්පාඩු ආවරණය කිරීම සඳහා නව නායකයින් හඳුනා ගැනීම මෙම ක්‍රියාවලියේ එක් අංගයක් වන අතර කුමන ශ්‍රේණින් සඳහා මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුද යන්න කළමනාකාරිත්වයේ ඉල්ලීම මත සිදු කරනු ලැබේ. 2017 වර්ෂයේ දී මෙම කුසලතා කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක වූයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් සඳහායි. මෙම ඇගයීම සිදු කරනු ලබන ප්‍රධාන නිර්ණායකයන් වනුයේ, වෙනස්වීමේ දීක්ෂානතිය, ප්‍රතිඵල දිශානතිය, උපායමාර්ගික සැලසුම්කරණය, තීරණ ගැනීමේ ක්‍රියාවලිය, නායකත්වය සහ වෘත්තීමය හැසිරීමයි. මෙම ඇගයීමේදී, විධායක කළමනාකාරිත්ව සමාජිකයෙකු විසින් අධීක්ෂකයින්ගේ, යටත් සේවකයන්ගේ සහ සම සේවකයින්ගේ අදහස් සැලකිල්ලට ගනු ලැබේ. (මෙම විධායක කළමනාකාරිත්ව සමාජිකයා ඇගයීමේදී සෘජු වාර්තාකරණ රේඛාවෙන් පිටත සිටින සමාජිකයෙකු වේ) මෙම සමාලෝචන තීරණය කුසලතා කළමනාකරණ කමිටුවෙහි සිටින සමාලෝචකයින් සංචිතයක් මඟින් අගයනු ලැබේ. මෙම ක්‍රියාවලියේ ප්‍රධාන අරමුණ වනුයේ අනාගත නායකයින්ගේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ වෘත්තීමය වශයෙන් දියුණු විය හැකි මාර්ග ඔවුනට යෝජනා කිරීමයි.

සුදුසුකම් ලත් පුහුණුකරුවන්ගෙන් සමන්විත පහසුකම් වලින් මධ්‍යම පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් බැංකුව සතු වේ. ආසන පහසුකම් 100 කින් සපිරි ශ්‍රවණාගාරයක් සහ දේශන ශාලා 5 කින් යුක්තව මුළු ආසන පහසුකම් සංඛ්‍යාව 260 කින් එය සමන්විත වේ. දුර පළාත්වල සිට පුහුණුවීම් සඳහා පැමිණෙන කාර්ය මණ්ඩලය සඳහා නවාතැන් පහසුකම් මෙහිදී සැපයේ. මෙම ආයතනය සතුව පූර්ණ කාලීන කාර්ය මණ්ඩලය 5 ක් සිටින අතර ආශ්‍රිත පීඨ සාමාජිකයින් 120 ක්ද වේ. ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාරයෙහි ආසන පහසුකම් 225 ක් අති අතර ආසන පහසුකම් 80 කින් සමන්විත පුහුණු කිරීම් ශාලා දෙකක් ද වේ.

වර්ෂය තුළදී නේවාසික පුහුණු කිරීමේ වැඩසටහන් 442 ක් පැවැත්වූ අතර එය පුහුණු පැය 4,087 කින් සමන්විත විය. මීට අමතරව පුහුණු කිරීමේ වැඩසටහන් අනෙකුත් ආයතන හරහා දේශීය හා විදේශීය වශයෙන් පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමෙන් පසු සිදුකරනු ලැබේ. අනෙකුත් දේශීය ආයතන හරහා පුහුණු වැඩසටහන් 309 ක් පුහුණු පැය 2,997 කින් සමන්විතව පවත්වන ලදී. මීට අමතරව විදේශීය පුහුණු වැඩසටහන් 120 ක් පැවැත්වූ අතර පුහුණු පැය 4,800 ක් මෙම නිල සංචාර වලදී වැයකර තිබුණි. මෙම තුන් වර්ගයෙහිම පුහුණු කිරීම් සඳහා වූ මුළු පිරිවැය රු. මිලියන 322.0 ක් වේ. දේශීය පුහුණු කිරීම් පැය වැඩි වශයෙන් වැය කළ මාතෘකා වනුයේ බැංකු මෙහෙයුම්, ණය සහ අයකරගැනීම්, අනුකූලතා, තොරතුරු තාක්ෂණ, අභ්‍යන්තර විගණන, ණයදීම, කුසලතා සංවර්ධන සහ කළමනාකරණය යන්නයි. වර්ෂය තුළදී සෑම කාර්ය මණ්ඩල සමාජිකයෙකුම සාමාන්‍ය වශයෙන් පුහුණු කිරීමේ වැඩසටහන් තුනකට සහභාගි විය.

අපගේ පුහුණු වැඩසටහන් සැලසුම් කරනු ලබ ඇත්තේ සේවා නියුක්තිකයින්ගේ, වෘත්තීය සංවර්ධනය සහ අනුප්‍රාප්තික සැලසුම්වලට අනුකූලවය. කැපී පෙනෙන කාර්ය මණ්ඩල සමාජිකයන් හඳුනාගනු ලබන අතර ඉහළ තලයේ මට්ටම් වෙත ඔවුන් පුහුණු කිරීම සිදු කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය තුළින් සේවා නියුක්තිකයින්ගේ වෘත්තීය සංවර්ධනය තව දුරටත් පුළුල් කරනු ලබන අතර බැංකුවට සේවා නියුක්තිකයින් විශ්‍රාම ගැනීම හෝ සේවය හැර යාම නිසා ඇතිවන පුරප්පාඩු පිරවීමට අවස්ථාව ලැබේ. ඇතුළත් වීමේ මට්ටමට අමතරව දැනට සිටින සේවා නියුක්තිකයින්ට උසස්වීම දීම හරහා නව පත්කිරීම් සිදුකරනු ලැබේ. මෙයට අතිරේකව පත්කිරීම් සිදුකරනු ලබන්නේ විශේෂිත කුසලතා අවශ්‍ය වූ අවස්ථා වලදීය. එවැනි අවස්ථාවලදී බාහිර උපදේශකවරුන් පත්කිරීම මඟින් බාහිර දැනුම ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. උසස්වීම් ප්‍රදානය කරනු ලබන්නේ දැනුම සහ කුසලතා තක්සේරු කිරීම සඳහා පරීක්ෂණ සහ ඉන්පසු සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙනි. 2017 වර්ෂය තුළ දී එවැනි පරීක්ෂණ 9 ක් පවත්වන ලදී. සේවා නියුක්තිකයන් 1,831 කට අනතුරුව එම වර්ෂය තුළදී උසස්වීම් ප්‍රදානය කරන ලදී.

විධිමත් පුහුණු සැසිවාරයන්ට අමතරව අපි, අපගේ කාර්ය මණ්ඩලය සංවර්ධනය කිරීම සඳහා වෙනත් අවස්ථාවන් ලබා දීමට ද කටයුතු සිදු කරමු. සියලු පහසුකම් වලින් අංග සම්පූර්ණ වූ පුස්ථකාලයක් මධ්‍යම පුහුණු කිරීමේ ආයතනය(CTI) තුල ස්ථාපිත කර ඇති අතර එය පරිහරණය කිරීමට අපගේ සියලු කාර්ය මණ්ඩලය දිරිමත් කරනු ලැබේ. තවද, අපගේ කාර්ය මණ්ඩලයට ඉතා ප්‍රයෝජනවත් වන විෂය කරුණු එකතුවක් සඳහා ප්‍රවේශය සළසන විද්‍යුත් පුස්තකාලයක් අප විසින් ස්ථාපනය කර ඇත.



අපගේ කාර්ය මණ්ඩල සඳහා බාහිර පුහුණුව

වයස් මට්ටම් හා අත්දැකීම් අනුව අතිශයෙන්ම විවිධ වූ මිශ්‍රණයකින් යුත් කාර්ය මණ්ඩලයක් අප සතුව ඇත. අපගේ කාර්ය මණ්ඩලයෙන් 65% ක් වයස අවුරුදු 34 ට අඩුවීම සැළකිය යුතු කරුණකි. මෙයින් අදහස් කරන්නේ කණිෂ්ඨ මට්ටම් වලදී අපට සපේක්ෂ වශයෙන් තරුණ කණ්ඩායමක් සිටින බවයි. මෙමඟින්, තරුණ පරම්පරාව ඉතා නියුණු තාක්ෂණික දැනුමකින් යුතු වීමේ සහ ඩිජිටල් බැංකුකරණ කටයුතු හා පහසුවෙන් ගණුදෙනු කිරීමේ වාසිය ලබා ගත හැකිය.

එමෙන්ම, ජ්‍යෙෂ්ඨ තනතුරු පිරවීම සඳහා අප සතුව ඉතා පරිනත කාර්ය මණ්ඩලය ද සැළකිය යුතු සංඛ්‍යාවක් සිටී. යෞවනත්වය හා පරිනතභාවය යන මෙම සංකලනය මඟින් අපට වෙළඳපොල වෙනස්වීම් වලට හා හොඳින් මුහුණ දීමේ හැකියාව හා ශක්තිය ලැබේ. ජ්‍යෙෂ්ඨ තනතුරු භාරගැනීම සඳහා තරුණ පරම්පරාව සකස් කිරීමේ අවශ්‍යතාවය ද අපගේ සංවර්ධන වැඩසටහන් මඟින් අවධානය යොමු කෙරේ.

වසර තුලදී, සේවා ස්ථානයෙන් බැහැර පුහුණු පාඨමාලා 14 ක් පවත්වන ලද අතර ඒ මඟින් කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් 1,239 ක් ප්‍රතිලාභ ලැබූහ.

මානව හිමිකම්

ලංකා බැංකුව සියලුම සේවා නියුක්තිකයින්ගේ මානව හිමිකම් වලට ගරු කරන අතර සියලුම සේවා නියුක්තිකයින්ට සමසේ, යෝග්‍ය ගෞරවය සහිතව භේදයකින් තොරව සැලකීමට හැකි ලෙස පද්ධති ස්ථාපිත කර ඇත. කිසිම ආකරයකින් ළමා ශ්‍රමය අප භාවිතා කරනු නොලැබේ. අපගේ මානව සම්පත් හා බැඳුණු සියලු කර්තව්‍යයන් දේශීය හා විදේශීය සම්මතයන්ට අනුකූල ලෙස සිදු කෙරේ.

සාමූහික එකඟතාවයන් මත තීරණ ගැනීම සිදුකෙරෙන අතර සේවක මණ්ඩලයෙන් 98% ක් පමණ කුමන හෝ වෘත්තීය සමිතියක සමාජිකත්වය ලබා ඇත. ඉතා සුහද සම්බන්ධතාවයක් සියලුම වෘත්තීය සමිති සමඟ ගොඩ නගා ගෙන ඇත. සාමූහික ගිවිසුම යටතේ සෑම වසර තුනකට වරක්ම වැටුප් දීමනාවන් වෛද්‍ය පහසුකම් ආදී සේවක පාරිතෝෂික පිළිබඳව සාකච්ඡා කර අවශ්‍ය වෙනස්වීම් සිදු කරනු ලැබේ. එසේම සේවක දුක් ගැනවිලි/පැමිණිලි හැසිරවීමේ ක්‍රමවේදයක්ද බැංකුව සතුව ඇත.

දුක් ගැනවිලි

	සංඛ්‍යාව
2016 සිට ඉදිරියට ගෙන එන ලද සංඛ්‍යාව	04
2017 වර්ෂය තුළ වාර්තා වූ දුක්ගැනවිලි සංඛ්‍යාව	19
2017 වර්ෂය තුළ විසඳූ දුක්ගැනවිලි සංඛ්‍යාව	14
2017 වර්ෂය අවසානයේ ඉතිරිව ඇති දුක් ගැනවිලි සංඛ්‍යාව	09



අලුතින් බඳවා ගත් කළමනාකරණ අභ්‍යාසලාභීන් සඳහා පුහුණු වැඩසටහන

අපගේ සේවා නියුක්තිකයින් අභිප්‍රේරණය කිරීම

අපගේ උපායමාර්ගය වනුයේ බැංකුවට වඩා යහපත් දේ අපගේ සේවා නියුක්තිකයින්ට වඩා යහපත් වන දේ සමඟ අනුගත කිරීමයි. අපගේ ඇගයීම් හා සම්මාන ක්‍රියාවලිය සංවර්ධනය කරනු ලැබ ඇත්තේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සේවා නියුක්තිකයින් අභිප්‍රේරණය කිරීම තුළින් බැංකුවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මඟ පෙන්වීමෙනි. දීර්ඝ කාලීන වශයෙන් අපගේ සංවර්ධන හා පුහුණු කටයුතු ඉහත අරමුණු වෙනුවෙන් සිය දායකත්වය ලබා දෙනු ලැබේ. එබැවින් අප විසින් කාර්යසාධනය පදනම් කරගත් සංස්කෘතියක් නිර්මාණය කර ඇති අතර එය කෙටි කාලීන සහ දිගු කාලීන වටිනාකම් ජනනය කිරීම සඳහා උපකාරී වේ.

සුභසාධනය සහ සේවා ජීවන තුලනය


සේවා නියුක්තිකයින්ගේ චිත්ත ධෛර්යය වර්ධනය කිරීම, සේවා නියුක්තිකයින් අතර කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ඔවුනට සැහැල්ලුවෙන් සිටීම සඳහා අවස්ථාවක් ලබා දීම සඳහා බැංකුව විවිධ කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ. එම කටයුතු වනුයේ විශිෂ්ට කාර්යසාධනය සහිත සේවා නියුක්තිකයින් හඳුනා ගැනීම, ක්‍රීඩා ඉසව් පැවැත්වීම, සියලු ජන කොටස් සහ ආගම් ආවරණය වන පරිදි ආගමික හා සංස්කෘතික කටයුතු පැවැත්වීම සහ සෞඛ්‍යය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි.

වර්ෂය තුළදී සිදු කරන ලද එවැනි කටයුතු සමහරක් වනුයේ හොඳම ශාඛාව තේරීමේ තරඟය, දීර්ඝ කාලීන සේවා ඇගයීමේ සම්මාන උළෙල, සියලු පළාත් තුළ වර්ෂික ක්‍රීඩා උත්සව පැවැත්වීම සහ අනුරාධපුරයේදී පවත්වන ලද බැංකුවේ සමස්ත ක්‍රීඩා උත්සවය ආදියයි. හොඳම ශාඛා ඇගයීමේ උළෙලේදී ශාඛා 21 ක් සහ කාර්ය මණ්ඩලයෙහි 165 ක් උපහාර ලබන ලදී. දීර්ඝ කාලීන සේවා උපහාර උළෙලේදී කාර්ය මණ්ඩලයෙහි 234 ක් උපහාර ලැබීය. බැංකුවේ බෞද්ධ සංගමය වෙසක් උත්සවය වෙනුවෙන් එක් දින වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ වෙනුවෙන් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ දවස පුරා පවත්වන ලද ආගමික කටයුතු වලට කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් සහභාගි වෙන ලදී. ක්‍රිස්තියානි සංගමය විසින් නත්තල් උත්සවය සමරනු වස් නත්තල් බැති ගී වැඩසටහනක් සංවිධානය කරන ලදී. මහා ශිව රාත්‍රී උත්සවය සැමරීම සඳහා හින්දු සංගමය මඟින් විශේෂ පූජාවක් සංවිධානය කරන ලදී.

භූගෝලීය බෙදීයාම
අනුව ශ්‍රම බලකාය

පූර්ණ කාලීන ස්ථිර

පුරුෂ	ස්ත්‍රී
3,236	4,351



උතුරු පළාත

	පුරුෂ	ස්ත්‍රී
2017	241	231
2016	248	235

නැගෙනහිර පළාත

	පුරුෂ	ස්ත්‍රී
2017	252	160
2016	251	162

මධ්‍යම පළාත

	පුරුෂ	ස්ත්‍රී
2017	237	346
2016	254	354

දකුණු පළාත

	පුරුෂ	ස්ත්‍රී
2017	192	439
2016	206	445

ඌව පළාත

	පුරුෂ	ස්ත්‍රී
2017	158	243
2016	159	245

සබරගමුව පළාත

	පුරුෂ	ස්ත්‍රී
2017	204	277
2016	209	290

වයඹ පළාත

	පුරුෂ	ස්ත්‍රී
2017	250	356
2016	256	358

උතුරු මැද පළාත

	පුරුෂ	ස්ත්‍රී
2017	268	274
2016	254	281


බස්නාහිර පළාත

	පුරුෂ	ස්ත්‍රී
2017	1,434	2,025
2016	1,502	1,860

රැකියා කාණ්ඩ අනුව ශ්‍රම බලකාය

කාණ්ඩය/වසර	18 සිට 24		25 සිට 34		35 සිට 44		45 සිට 54		55 සිට 60	
	2017	2016	2017	2016	2017	2016	2017	2016	2017	2016
ආයතනික කළමනාකරණය	–	–	–	–	–	–	4	4	12	13
විධායක කළමනාකරණය	–	–	–	–	1	1	15	12	32	37
ප්‍රධාන කළමනාකරණය	–	–	–	–	25	8	34	27	45	55
ජ්‍යෙෂ්ඨ කළමනාකරණය	–	–	–	–	77	68	51	57	56	80
ශාඛා කළමනාකරණය සහ සහකාර කළමනාකරණය	–	–	290	160	424	321	154	127	227	304
කළමනාකරණ පුහුණුවන්නන් සහ අනෙකුත් නිළධාරී ශ්‍රේණි	3	2	1,526	1,438	319	353	186	204	218	253
බැංකු සහකාර සහ සමාන්තර ශ්‍රේණි	76	280	2,935	2,789	133	120	100	128	105	162
කාර්යාල සහයක සහ සමාන්තර ශ්‍රේණි	5	9	144	141	196	183	143	151	51	82
එකතුව	84	291	4,895	4,528	1,175	1,054	687	710	746	986


රැකියා කාණ්ඩ සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ශ්‍රම බලකාය



මුළු සේවක සංඛ්‍යාව

	පූර්ණ කාලීන සේවා නියුක්තිකයින්		බාහිර ආයතනවලින් ලබාගත්		කොන්ත්‍රාත් පදනම		එකතුව	
2017	3,236	4,351	1,363	36	151	7	4,750	4,394
2016	3,339	4,230	1,242	28	26	5	4,607	4,263

සේවා කාල සීමාව මත ශ්‍රම බලකාය





2017 වෙසක් මංගල්‍යය වෙනුවෙන් කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සිල් සමාදන් වීම



හොඳම ශාඛා ඇඟයීමේ උත්සවය 2017



78 වන සංවත්සරය නිමිත්තෙන් පැවැත්වූ හින්දු පූජාව



නත්තල් කැරොල් 2017

වියෝ වීම්, ස්වභාවික විපත් සහ පුද්ගලික අනතුරු වැනි උපකාර අවශ්‍ය අවස්ථා වලදී අප අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට අතහිත දෙනු ලැබේ.

බැංකුවේ ආයතනික හා සමජ වගකීම් ක්‍රියාකාරකම් වලට කාර්ය මණ්ඩල සාමාජිකයින් ක්‍රියාශීලිව දායක වෙන ලදී. මෙවැනි කටයුතු ප්‍රවර්ධනය කිරීම තුළින් සේවා නියුක්තික සේවා ජීවන තුලිතය වැඩි දියුණු කරනු ලැබේ. පහත සඳහන් වනුයේ අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ද සහභාගී වූ ආයතනික හා සමාජ වගකීම් ක්‍රියාකාරකම් කිහිපයකි.

1. 2017 වර්ෂයේ මැයි මාසයේ සිදු වූ ව්‍යසන අවස්ථාවේදී, කාර්ය මණ්ඩලය විසින් සිය දෛනික වැටුප පරිත්‍යාග කරන ලදී. තවද බලපෑමට ලක්වූ දිස්ත්‍රික්ක වල පදිංචි අවතැන් වූ ජන කොටස් වෙත අත්‍යාවශ්‍ය වියළි සලාක ලබා දීම සඳහාද ඔවුන් සිය ශ්‍රම දායකත්වය ලබා දෙන ලදී.
2. වර්ෂය තුළදී "අනාගතය සඳහා මඟපෙන්වීමක්" යන සම්මන්ත්‍රණ මලාව සියළු පළාත් වල තෝරාගත් පාසල් වල ක්‍රියාත්මක කරන ලදී. එහිදී විශේෂයෙන් පුනුණු කරන ලද ශාඛා කළමනාකරුවන් සම්පත් දායකයින් වශයෙන් ස්වේච්ඡා පදනමකින් සහභාගී වෙන ලදී.
3. කහටගස්දිගිලිය ශාඛා කාර්ය මණ්ඩලය ආයතනික හා සමාජ වගකීම් ව්‍යාපෘතියක් දියමයිලගස්වැව විද්‍යාලීය ශාලාවේදී පවත්වන ලද අතර එහිදී රන් කැකුළු ගිණුම් 60 ක්, එම සේවකයින්ගේ මූල්‍ය දායකත්වයෙන් ශිෂ්‍යයින් වෙත විවෘත කර දෙන ලදී.

අප විසින් අනුගමනය කරනු ලබන දිස්ත්‍රික්ක මත පදනම් වූ බඳවා ගැනීමේ ක්‍රමය අප කාර්ය මණ්ඩලයෙහි සේවා ජීවන තුලනය වැඩිදියුණු කරනු ලබන අතර එතුළින් ඔවුනගේ ප්‍රවාහනය සඳහා වැයවෙන කාලය අඩු කරනු ලැබේ.

බැංකුව විසින් රට පුරා විහිදුන නිවාඩු නිකේතන 11 ක් පවත්වාගෙන යනු ලබන අතර එම නිවාඩු නිකේතන අප කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සමාජිකයින්ට භාවිතා කළ හැක. 2017 වර්ෂය තුළදී කාර්ය මණ්ඩල වෙන් කිරීම් 14,872 ක් වාර්තා විය. කයිට්ස් සහ ත්‍රිකුණාමල නිවාඩු නිකේතන වර්ෂය තුළදී අලුතින් විවෘත කරන ලද ඒවා වේ. ලංකා බැංකුව විසින් දැඩිව ක්‍රියාත්මක කරනු ලබන නියාමන අවශ්‍යතාවයක් වන සියලු ස්ථිර සේවකයන් විසින් සිය වාර්ෂික නිවාඩු 7 ක් එක දිගට ලබා ගැනීම, සේවා ජීවන තුලිතය පවත්වාගෙන යාම සඳහාද එක් අතකින් දායක වෙනු ලැබේ.

සෞඛ්‍යය සහ ආරක්ෂාව

ඵලදායී ශ්‍රම බලකායක් වනුයේ බොහෝ දුරට සෞඛ්‍ය සම්පන්න සහ තෘප්තිමත් ශ්‍රම බලකායක් වේ. එබැවින් බැංකුව විසින් සිය කාර්ය මණ්ඩලයේ සෞඛ්‍යය සහ ආරක්ෂාව කෙරෙහි වැඩි වැදගත්කමක් ලබා දෙනු ලැබේ. බාහිර රෝගී ප්‍රතිකාර සිට සැත්කම් දක්වා ආවරණය වන පුළුල් වෛද්‍යාධාර ක්‍රමයක් තුළින් බැංකුවේ සියලුම සේවා නියුක්තිකයින් සහ ඔවුන්ගේ පවුල්

වල සාමාජිකයින් ආවරණය වේ. සේවය අතරතුර පැන නගින සෞඛ්‍ය ගැටළු සඳහා නේවාසික වෛද්‍යවරයෙකුගේ සේවාව ලබා ගැනේ. තවද පුළුල් ආරක්ෂිත ක්‍රමවේදයන්ද ක්‍රියාත්මක කර ඇත. ප්‍රධාන කාර්යාලය මඟින් කායවර්ධන මධ්‍යස්ථාන, යෝග සහ ඇරොබික්ස් පහසුකම් කාර්ය මණ්ඩලයට සපයනු ලබන අතර වර්ෂය තුළදී කාර්ය මණ්ඩලයේ 1,269 ක් මෙම පහසුකම් භාවිතා කර ඇත.

සියලුම ශාඛා සහ බැංකු මූලස්ථානයේ සියලුම අංශයන් සඳහා ගිනි නිවන නිලධාරීන් පත්කර තිබෙන අතර නිසිපරිදි ගිනි නිවීමේ පෙරහුරු පැවැත්වීම මඟින් හදිසි අවස්ථාවක් ඇති වුවහොත් ආරක්ෂණ ක්‍රියාමාර්ග ගත යුතු ආකාරය පිළිබඳව පුරුදු කරනු ලැබේ. සියලුම ශාඛාවන් සහ බැංකු මූලස්ථානයේ සියලු ප්‍රදේශ ආරක්ෂිත කැමරා (CCTV) මඟින් ආවරණය කර ඇත. ආරක්ෂාව හා සම්බන්ධ ගැටළු හැසිරවීමට හැකියාවක් ඇති පළපුරුද්ද හා දැනුම අතින් ඉහළ පුද්ගලයින් බැංකුවේ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය ලෙස කටයුතු කරයි.

විශ්‍රාම ප්‍රතිලාභ

සියලුම සේවා නියුක්තිකයින් ලංකා බැංකු අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වන අතර, ඔවුන්ගේ මාසික දළ වැටුපින් 12% ක් සඳහා බැංකුව දායක වන අතර 8% ක් සඳහා සේවා නියුක්තිකයින් දායක වෙයි. බැංකුවේ සෑම සේවා නියුක්තිකයෙක්ම සේවා නියුක්ති භාර අරමුදලේ සමාජිකයින් වන අතර, සේවා නියුක්තිකයින්ගේ දළ වැටුපෙන් 3% ක් සඳහා බැංකුව දායක වේ. ලංකා බැංකුවේ අවුරුදු 10 ක අවම අඛණ්ඩ සේවාවක් සම්පූර්ණ කර තිබෙන සියලුම සේවා නියුක්තිකයින් විශ්‍රාම යාමේදී දායකවීමකින් තොර විශ්‍රාම වැටුපකට හිමිකම් කියනු ලැබේ.

වර්ෂය තුළදී ජයග්‍රහණය කරන ලද සම්මාන වලින් අපගේ මානව සම්පත් කළමනාකරණයේ ගුණාත්මක බව යළි තහවුරු වේ. එපමණක් නොව කර්මාන්තයේ සම්මතයන්ට වඩා ඉතා පහළ මට්ටමේ පවතින අපගේ සේවය හැරයාමේ අනුපාතිකයද මේ බව යළි තහවුරු කරයි.

වයස් කාණ්ඩ සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවය හැර යාම

	2017			2016		
	පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
වයස් කාණ්ඩය	–	–	–	–	–	–
25-34	14	22	36	6	26	32
35-44	01	02	03	1	–	1
45-54	01	02	03	–	1	1
55-60	205	98	303	273	173	446
එකතුව	221	124	345	280	200	480
%	64	36	100	58	42	–

සේවය හැරයාමට බලපාන හේතු

හේතුව	2017	2016
වෙනත් තරඟකාරී සංවිධාන වලට සම්බන්ධ වීම	–	–
වෙනත් සංවිධාන වලට සම්බන්ධ වීම	9	5
විදේශ රට වලට සංක්‍රමණය වීම	8	17
උසස් අධ්‍යාපනය	2	3
පුද්ගලික හේතු	3	9
විශ්‍රාම යාම	303	446
වෙනත්	20	–
එකතුව	345	480

ස්වයංක්‍රිය මානව ප්‍රාග්ධන කළමනාකරණ පද්ධතිය (HCM)

අපගේ බොහෝමයක් සේවක මණ්ඩල පරිපාලනය හා බැඳි කටයුතු ස්වයංක්‍රියකරණය කළ මානව ප්‍රාග්ධන කළමනාකරණ පද්ධතියක් අප සතුවේ. මානව සම්පත් ඵලදායී ලෙස කාර්යක්ෂමව භාවිතය මෙමඟින් තහවුරු කෙරේ. වසර අවසන වන විටදී සේවක කාර්යසාධනය, ඉගෙනුම් කළමනාකරණය, සේවක කුසලතා කළමනාකරණය, රැකියා විස්තරයන්, පඩි වාර්තා සැකසුම්, සේවක ප්‍රතිලාභ කළමනාකරණය ආදී කටයුතු ස්වයංක්‍රීයව සිදු කරනු ලැබේ. මීට අමතරව සේවක පරිපාලනය සම්බන්ධ වඩා දියුණු මට්ටමේ තොරතුරු ලබා ගැනීම සහ තොරතුරු පරිශීලනය සම්බන්ධ කටයුතු ද ස්වයංක්‍රියකරණයට ලක් කරනු ඇත. සේවක පුහුණුව සහ සංවර්ධනය වැනි අංශයන්ද මීට ඇතුලත් කරනු ලැබේ.

වසර තුළදී නිවාඩු ඉල්ලුම් කිරීම සහ අනුමත කිරීමද HCM පද්ධතිය හරහා ස්වයංක්‍රිය කරන ලදී.

ඉදිරි දැක්ම

2018-2020 ආයතනික සැලැස්මට අනුව අපගේ ශ්‍රම බලකායේ කුසලතා, ගුණාංග සහ හැකියාවන් ශක්තිමත් කිරීම තුළින් මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. මෙතුළින් බැංකුවට තිරසර වීමට සහ වර්තමානයේ සීඝ්‍රයෙන් වෙනස්වන ව්‍යාපාරික පරිසරයට අනුව දියුණු වීමට අවස්ථාව ලැබේ. සේවා නියුක්තිකයින්ගේ වෘත්තීමය, රැකියාව හා සම්බන්ධිත විශේෂ දැනුම සහ අනෙකුත් කුසලතා සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත. පුහුණුව සහ සංවර්ධනය සඳහා වැදගත් වන භෞතික යටිතල පහසුකම් දියුණු කිරීමටද අප අවධානය යොමු කර ඇත. අනාගතයේදී සෑම සේවා නියුක්තිකයෙකුම පහත බර තැබීම අනුව පුහුණුවීම් ලැබීමට නියමිතය. වර්තමාන රැකියා කාර්යභාරය - 40%, පෞද්ගලික සංවර්ධනය 30% සහ සේවා සැපයීම 30% විශේෂිත අංශ සඳහා සේවක මණ්ඩලයක් පවත්වා ගෙන යාම කෙරෙහි අවධානය යොමු කරනු ලබන අතරම අප සේවා නියුක්තිකයින්ගේ බහුවිධ පරිවයන් දියුණු කිරීමද අප වැදගත් සේ සලකා ඇත.

මිහිතලය සුරැකීම සඳහා අපගේ දායකත්වය

සූර්ය බලශක්ති පැනල මඟින් විදුලි බලය ලබා ගන්නා ශාඛා ගණන

20

වසර තුළ සූර්ය බලශක්ති පැනල මඟින් උත්පාදිත විදුලි ධාරිතාව

කි.වො. **515**

මෙහෙයුම් ස්වංක්‍රීය කිරීම මඟින් සිදුවූ ගණනය කරන ලද කඩදාසි පිරිමැසීම A4 මුද්‍රිත කඩදාසි

259,892
(BoardPAC සහ DMS මඟින්)

විද්‍යුත් විගණනය හඳුන්වා දීම

සියලු විද්‍යුත් අපද්‍රව්‍ය මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි නියෝජිතයකු හරහා ක්‍රමානුකූලව බැහැර කිරීම

ශාඛා බැංකු අංශය මඟින් ණය සඳහා ඉදිරිපත් වූ යෝජනා අතුරින් යෝජනා **362** ක් පරිසරික සහ සමාජීය අනුකූලතාව සඳහා පරීක්ෂා කර ඇත.

ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සලය මඟින් කැකිරාව ශාඛාවට රන් සම්මාන පිරිනැමීම

හරිත ගොඩනැගිලි සංකල්පය බැංකුව තුළට හඳුන්වා දීම

ලංකා බැංකුව සඳහා පාරිසරික සහ සමාජ කළමනාකාරිත්ව ප්‍රතිපත්තියක් (ESMS Policy) සකස් කිරීම

වසර තුළ ශාඛා බැංකුකරණය මඟින් පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සහ පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා ලබා දුන් ණය සහ අත්තිකාරම් ප්‍රමාණය

රු. **මිලියන 640.6**

වසර තුළ විද්‍යුත් ගිණුම් වාර්තා සඳහා ලියාපදිංචි වූවන්ගේ වර්ධනය

67%

ස්වාභාවික ප්‍රාග්ධනය

විශ්වාසය තැබිය හැකි, තිරසාර සහ නවීන බලශක්තිය සඳහා සැමට ප්‍රවේශයක්



පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සඳහා ණය සහ අත්තිකාරම් ලබා දීමට බැංකුව කැපවී සිටින අතර, ජල විදුලි, සූර්ය සහ සුළං බලයෙන් විදුලි උත්පාදන ව්‍යාපෘති සඳහා මූල්‍ය දායකත්වය දක්වා ඇත.

- **ශාඛා බැංකු අංශය මඟින් පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සහ පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා වසර තුළ රු. මිලියන 640.6 ක ණය ලබා දී ඇත.**
- **ආයතනික බැංකු අංශය විසින් කසල මඟින් විදුලිය උත්පාදනය කරන්නාවූ මහා පරිමාණ ව්‍යාපෘති දෙකක් සඳහා ණය ලබා දීම ද සිදුකර ඇත.**

තිරසර පරිභෝජනයන් සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම



කඩදාසි භාවිතය අවම කිරීම, වගකීම් සහිත කැලි කසල බැහැර කිරීමේ ක්‍රමවේදයන් භාවිතය සහ ජල කළමනාකරණය මඟින්, බැංකුව විසින් මේ තිරසර සංවර්ධන ඉලක්කය සඳහා තම දායකත්වය සපයා ඇත.

- **සියලු විද්‍යුත් අපද්‍රව්‍ය මධ්‍ය පරිසර අධිකාරියේ ලියාපදිංචි නියෝජිතයකු හරහා බැහැර කරනු ලැබේ.**
- **මෙහෙයුම් ස්වයංක්‍රිය කිරීම ඔස්සේ සිදුවී ඇති ගණනය කරන ලද කඩදාසි පිරිමැසීම A4 මුද්‍රිත කඩදාසි 259,892.**

දේශගුණික විපර්යාස



පුනර්ජනනීය නොවන බලශක්ති භාවිතය අවම කිරීම සඳහා අප නිරන්තර උත්සාහයක නිරතව සිටින අතර, මේ ඔස්සේ අප විසින් සිදුකරන ලද එක් ව්‍යාපෘතියක් වනුයේ අපගේ ශාඛා ජාලය සූර්ය බලශක්තිය මඟින් තම විදුලි අවශ්‍යතා සපුරා ගන්නා ශාඛා බවට ක්‍රමිකව පරිවර්ථනය කිරීමයි. එමෙන්ම අප විසින් කැලිකසල බැහැර කිරීම අවම කිරීම හා පාලනය කිරීම මඟින්ද කඩදාසි භාවිතය අවම කිරීම මඟින්ද අපගේ කාබන් පියසටහන අවම කරගනිමින් සිටී.

- **සූර්ය බලශක්ති උත්පාදනයට යොමුවීම මඟින් අපගේ සමස්ත පුනර්ජනනීය නොවන ප්‍රභව මඟින් උත්පාදනය කරන විදුලි භාවිතය 2% කින් අවම වී ඇත.**
- **වසර තුළ සූර්ය බලශක්ති පැනල මඟින් නිශ්පාදනය කරන ලද විදුලි ධාරිතාව කිලෝ වොට් 515.**

වාසයට සුදුසු සහ දූෂණයට ලක් නොවූ ස්වභාවික පරිසරයක් අපගේ ආනාගත පරපුර වෙත සංරක්ෂණය කර දීම අප සැමගේ වගකීම වේ. අනෙකුත් පරිසර ගැටළු රැසක් සමඟින් ගෝලීය උෂ්ණත්වය සම්බන්ධයෙන් වන තර්ජනයට වර්තමානයේ ලෝකය මුහුණ දෙමින් සිටියි. වර්ෂ 2015 දී එක්සත් ජාතීන් විසින් තිරසර සංවර්ධන ඉලක්ක 17 ක් එලි දක්වන ලද අතර එතුළින් දුප්පත්කම සහ කුසගින්න අවම කිරීම, පරිසරය ආරක්ෂා කිරීම සහ තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ එවැනි අනෙකුත් ප්‍රශංසනීය සමාජ ආර්ථික අරමුණු ළඟා කරගැනීම අපෙක්ෂා කෙරේ.

අප රට තුළ වන විශාලතම බැංකුව සහ රට තුළ ඉහළම ලාභයක් උපයන තනි පුද්ගල ආයතනය වශයෙන් මේ සම්බන්ධයෙන් ඉතා ඉහළ දායකත්වයක් දැක්වීමට අවශ්‍ය හැකියාව සහ යුතුකම අප සතුව ඇත. එබැවින් මෙම තිරසර සංවර්ධන ඉලක්ක 17 අපගේ තිරසර පැවැත්ම පිළිබඳව වූ ආචාරධර්ම වලට අනුගත කර ඇති අතර එතුළින් අපගේ ව්‍යාපාරික ආකෘතියට මෙම ඉලක්ක ඇතුළත් කර ඇත.

සංවිධාන ව්‍යුහය

ජ්‍යේෂ්ඨ කළමනාකරණ තලයේදී හරිත බැංකුකරණ සංකල්පයට අවශ්‍ය සහය ලැබෙන අතර එහිදී මූලිකත්වය ගෙන කටයුතු කරනු ලබන්නේ බැංකුවේ තිරසාර කමිටුවයි. තිරසාර කමිටුව විසින් හඳුන්වා දෙන ලද තීරණයන් ක්‍රියාත්මක කරනු ලබන්නේ ආයතනික කළමනාකාරිත්වයේ මඟපෙන්වීම යටතේ අනෙකුත් මෙහෙයුම් අංශ හරහාය.

වර්ෂය තුළදී බැංකුව විසින් තිරසර ඒකකයක් ස්ථාපිත කරන ලද අතර එමඟින් තිරසාර කමිටුව විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයුම්කරණය තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ. මෙම තිරසාර ඒකකය තිරසාරත්වය පිළිබඳව වාර්තා කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරනු ලබන අතර මෙම අරමුණ සම්බන්ධයෙන් සියලු අදාළ අංශ පලාත් කාර්යාල සහ ශාඛා සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලැබේ.

තිරසර ඒකකය විසින් සියලු අංශ සමග මේ සම්බන්ධයෙන් වූ වර්ධනය නිරතුරුව අධීක්ෂණය කරනු ලබන අතර අනතුරුව තිරසාර කමිටුවට කාර්තුමය පදනමින් මෙය නැවත වාර්තා කරනු ලැබේ.

අපගේ හරිත මුල්පිරීම්

විදුලිය, වායු සමීකරණ, ජලය සහ කඩදාසි යන මාධ්‍යයෙන් බැංකුවට විශාල සෘජු සම්පත් පරිභෝජනයක් සහ පාරිසරික බලපෑමක් ඇත. අපගෙන් සිදුවන වායු දූෂණය අවම කිරීම සඳහා වාහන සමූහයේ ඉන්ධන භාවිතය කාර්යක්ෂම කිරීම, වායු සමීකරණ පරීක්ෂාකාරී ලෙස නඩත්තු කිරීම ආදිය මඟින් මේ සම්බන්ධයෙන් වන බලපෑම අවම කර ගත හැක. තවද මෙම වක්‍ර වායු දූෂණය අවම කිරීම සඳහා පුනර්ජනනීය නොවන බලශක්ති ප්‍රභව භාවිතය අවම කිරීම ආදී ක්‍රියාමාර්ග ගත හැක. මෙම කටයුතු මූලිකවම ක්‍රියාත්මක කරනු ලබන්නේ අපගේ හරිත බැංකුකරණ ප්‍රතිපත්තිය හරහා වන අතර එය 2016 වසරේදී දියත් කරන ලද්දකි. 2017 වසර අවසානයේදී ශාඛා 20ක් සූර්ය බලශක්තිය සඳහා පරිවර්තනය කර තිබූ අතර. කිලෝ වොට් 515 ක පුණර්ජනනීය බලශක්තියක් මෙම මුල්පිරීම තුළින් ජනනය කරන ලද අතර අපගේ මුළු බලශක්ති පරිභෝජනයෙන් එය 2% ක් වේ. මෙවැනි අනෙකුත් මුල්පිරීම් කිහිපයක් වනුයේ කඩදාසි නැවත භාවිතා කිරීම, විද්‍යුත් අපද්‍රව්‍ය බැහැර කිරීම කළමනාකරණය, ඉදිකිරීම්වලදී විෂ රහිත ගොඩනැගිලි ද්‍රව්‍ය භාවිතා කිරීම, පරිසර හිතකාමී උපකරණ ස්ථාපනය කිරීම, බලශක්ති භාවිතය කාර්යක්ෂම කිරීම, කාර්යක්ෂම ආලෝකකරණ පද්ධති භාවිතය සහ වැඟි වතුර නැවත භාවිතා කළ හැකි පරිදි හරිත උද්‍යාන පවත්වාගෙන යාම ආදියයි. වසර තුළ ඉවත ලන කඩදාසි කිලෝ ග්‍රෑම් 16,930 ක් ප්‍රතිචක්‍රීකරණය කර ඇත.

ගොඩබිම මත පරිසර පද්ධතිවල තිරසාර භාවිතය ප්‍රවර්ධනය කිරීම



ණය සහ අත්තිකාරම් පිරිනැමීමේදී, අදාල ව්‍යාපෘති වල පරිසර හා සමාජීය ශක්‍යතා අධ්‍යනය කිරීම මගින් සහ අදාල ව්‍යාපෘති පරිසර රෙගුලාසි වලට අනුකූල වීම සැලකිල්ලකට භාජනය කිරීම තුළින් බැංකුව විසින් තම ආයතනය විසින් මූල්‍ය පහසුකම් සලසන ව්‍යාපෘති මගින් පරිසරයට හානි සිදුවීම වලක්වනු ලැබේ.

- **ලංකා බැංකුව සඳහා පාරිසරික සහ සමාජ කළමනාකාරිත්ව ප්‍රතිපත්තියක් (ESMS Policy) සකස් කිරීම**
- **පාරිසරික රෙගුලාසි වලට අනුකූල නොවීම මත වසර තුළ ශාඛා බැංකුකරණ අංශය මගින් ප්‍රතික්ශේප කරන ලද ණය ඉල්ලුම් පත් ගණන 25**

පාරිසරික විඤ්ඤාදානය සහ අපගේ සේවක ප්‍රජාව තුළ හරිත බැංකුකරණය පිළිබඳව වන දැනුවත්භාවය ස්ථාපිත කිරීම සඳහා ඊ මේල් පණිවිඩ සහ අන්තර්ජාලය භාවිතා කරනු ලැබේ. කඩදාසි නැවත භාවිතා කිරීම, පිටපත් ලබාගැනීම සහ මුද්‍රණය සඳහා ද්විත්ව පැති භාවිතා කිරීම අප විසින් ක්‍රියාත්මක කර ඇති තිරසාර භාවිතයන් අතුරින් කිහිපයකි. වර්ෂය තුළදී බැංකුව විසින් සිය විද්‍යුත් ඉගෙනුම් ද්වාරය හරහා පුහුණු කිරීම් ක්‍රියාත්මක කිරීම තුළින් කඩදාසි භාවිතය අවම කිරීම සහ පුහණු කිරීම් සඳහා සේවා සම්පාදනයේදී දැරිය යුතු ඉන්ධන භාවිතය අවම කිරීම ඔස්සේ වඩා පරිසර හිතකාමී අයුරින් අප පුහුණු කිරීම් පරිසර හිතකාමී මාවතට රැගෙන යමින් සිටී.

අපගේ නිමැවුම් හා ක්‍රියාපටිපාටින්හිදී හරිත සංකල්පය හා අනුගත වීම

කඩදාසි භාවිතය ඩිජිටල්කරණ මුහුණතක් හා ආදේශ කිරීමට අපගේ ඩිජිටල්කරණ මුල්පිරීම් ඉතා විශාල දායකත්වයක් සපයා ඇත. උදාහරණයක් වශයෙන් අපගේ "ස්මාර්ට්පෙන්" නිමැවුම හරහා ඉතුරුම් ගිණුම්වලට අදාළ පාස්පොත් භාවිතය ඉවත්කර ඇත. 2017 වර්ෂය ගිණුම් වලට අදාළ පාස් පොත් භාවිතය ඉවත්කර ඇත. 2017 වර්ෂය තුළදී "ස්මාර්ට්පෙන්" ගිණුම් 94,395 ක් විවෘත කරන ලද අතර ඒ අනුව මුළු ස්මාර්ට්පෙන් ගිණුම් 196,343 ක් දක්වා වර්ධනය විය. අනෙකුත් ඩිජිටල්කරණ මුල්පිරීම් වන "ස්මාර්ට් පාස්පොත" මෙවලම නිකුත් කිරීම සහ විද්‍යුත් ප්‍රකාශන භාවිතා කිරීම අඛණ්ඩව ප්‍රවර්ධනය කිරීම මගින් කඩදාසි භාවිතා කරමින් සිදු කරන බැංකු සංස්කෘතියක් කරා පරිවර්තනයට මුල පිරීමට අපට හැකිවී ඇත.

සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය සඳහා පිටු අංක 113 බලන්න.

මෙහෙයුම් ප්‍රවාහ ස්වයංක්‍රියකරණය කිරීම කඩදාසි භාවිතය අවම කිරීම සඳහා දායකත්වයක් ලබා දේ. ජාලගත ලිපි ගොනු කළමනාකරණ පද්ධතිය සහ විද්‍යුත් ඉගෙනුම් ද්වාරය හඳුන්වාදීම කඩදාසි භාවිතය අවම කිරීම සඳහා දායකත්වය සපයා ඇත. වර්ෂ 2017 දී ලිපිගොනු කළමනාකරණ පද්ධතියේ පුද්ගල ණය සහ නිවාස ණය යන දිශානති ඡායා පිටපත් කඩදාසි 178,297 ක් ඉතිරි කර දෙමින් හරිත බැංකුකරණය සඳහා දායකත්වය සපයා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වන (BoardPAC) මෘදුකාංගය මගින් A4 පත්‍රිකා 81,595 ක් ඉතිරි කිරීමට හැකි වී තිබේ.

වසර තුළ විද්‍යුත් විගණනය හඳුන්වා දුන් අතර මෙම ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම ස්ථාපිත කළ පසුව A4 ඡායා පිටපත් කඩදාසි 348,480 ක් ඉතිරිවනු ඇති බවට ගණන් බලා ඇත. එමෙන්ම වසර තුළ හඳුන්වා දෙනු ලැබූ විද්‍යුත් නිවාඩු අනුමත කිරීමේ ක්‍රමවේදය මගින්ද වසර තුළදී විශාල කඩදාසි ප්‍රමාණයක් ඉතිරි වේ.

හරිත ණය පහසුකම්

කෙසේවුවද, පරිසරය පිළිබඳව බැංකුවට ඇති වගකීම සිය මෙහෙයුම් සඳහා පමණක් සීමා වී නොමැත. අපගේ සියලුම කටයුතු වලදී පරිසරය පිළිබඳව වන අපගේ වගකීම සැළකිමේදී මේ පිළිබඳව අප දක්වන කැපවීම විදහා දැක්වේ. සූර්ය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීම සඳහාම විශේෂිත වූ ණය පහසුකම් ප්‍රදානය කිරීම තුළින් පරිසර හිතකාමී මුල්පිරීම් සඳහා වන අපගේ කැපවීම පෙන්නුම් කෙරේ. පරිසර හිතකාමී ව්‍යාපෘති වන කසළ බලශක්තිය බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘති, සුළං බල ව්‍යාපෘති සහ හරිත ගොඩනැගිලි ඉදිකිරීම වැනි පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය කිරීමට අප කටයුතු කර ඇත. පුනර්ජනනීය බලශක්තිය භාවිතා කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණය, ප්‍රතිචක්‍රීකරණය සහ සුදුසු ලෙස බලශක්තිය භාවිතා කිරීම, වැනි කාර්යයන් සඳහා සුළු හා මධ්‍ය පරිමාණ සහ ආයතනික අංශ ඇතුලුව සියලුම ගනුදෙනුකරුවන් උනන්දු කරනු ලැබේ. තවද අපගේ ණය නිමැවුම් සඳහා පාරිසරික පරීක්ෂණ සිදුකරනු ලැබේ. ශාඛා බැංකුකරණ අංශය මගින් ණය යෝජනා 362 ක් පාරිසරික රෙගුලාසි සමඟ අනුගතව පවතිද යන්න සඳහා පරීක්ෂා කර ඇති අතර අනුගත නොවීම නිසා ණය යෝජනා 25 ක් ප්‍රතික්ෂේප කර ඇත. ශාඛා බැංකුකරණ අංශය මගින් පමණක් වර්ෂය තුළදී රු. මිලියන 640.6 ක් පුනර්ජනනීය බලශක්තිය සහ පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය කර ඇත.

ඉදිරි දැක්ම සහ අනාගතය

වර්ෂය තුළදී තම පාරිසරික සහ සමාජ කළමනාකරන ප්‍රතිපත්ති සකස්කිරීම මගින් බැංකුව විසින් වසර තුළ වැදගත් මුල්පිරීමක් සිදු කර ඇති අතර එය 2018 වර්ෂයේ මුල් භාගයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය. අපගේ ණය යෝජනා ඇගයීමේදී සිදුකරනු ලබන පාරිසරික සහ සාමාජීය පරීක්ෂණ මෙමඟින් තවදුරටත් ශක්තිමත් කරනු ලැබේ. විචක්ෂණශීලි ලෙස සමාජීය සහ පාරිසරික අවදානම කළමනාකරණය කිරීම සඳහා මෙමඟින් බැංකුවට තවදුරටත් අවකාශයක් ලැබෙනු ඇත.

ගෝලීය උෂ්ණත්වය ඉහළයාම වැනි ගැටළු පෙරමුණට පැමිණීම නිසා, ඉදිරි වර්ෂ වලදී පරිසරය ආරක්ෂා කර ගැනීම ඉතා වැඩි වැදගත්කමක් ඇති කර්තව්‍යක් බවට පත්වේ. අපගේ කටයුතු වලදී පරිසරය සම්බන්ධයෙන් වන අපගේ සැලකිල්ල සහ ලාභදායිත්වය පවත්වාගෙන යාම එකිනෙක අනුගත කර ගැනීමට අපට ඉතා ඉහළ අභියෝගයන්ට මුහුණ දීමට සිදු වෙනු ඇත. එනමුත් අපගේ දිගුකාලීන තිරසාරත්වය සහතික කර ගැනීම සඳහා මෙවැනි අභියෝගයන්ට මුහුණ දීම අනිවාර්යෙන්ම සිදු කළ යුත්තකි.

	විදුලිය (මෙගා වොට් පැය)		ජලය (ඝන මීටර)		ඉන්ධන (ලීටර)	
	2017	2016	**2017**	2016	**2017**	2016
මුළු පරිභෝජනය	**22,325**	21,493	**489,560**	386,779	**440,180**	929,853
ඒක පුද්ගල පරිභෝජනය	**2.94**	2.84	**64.53**	51.10	**58.02**	122.86



මූල්‍ය වාර්තා

139 — ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

144 — ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

146 — මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

148 — ස්වාධීන සහතිකවීමේ වාර්තාව

149 — මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

150 — විගණකාධිපති වාර්තාව

151 — ලාභ හෝ අලාභ ප්‍රකාශනය

152 — විස්තීරණ ආදායම් ප්‍රකාශනය

153 — මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

154 — හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

158 — මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

160 — මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

1. හැඳින්වීම

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, බැංකුවේ කටයුතු පිළිබඳ සිය වාර්තාව, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන් හි අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කරන ලදී. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන බැංකුවේ සහ සමූහයේ විගණනය කරන ලද ඒකාබද්ධිත මූල්‍ය ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන මත ඉදිරිපත් කරන විගණන වාර්තාව සමඟ එය ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි. තවද මෙම වාර්තාව තුළ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ වන 2007 අංක 11 දරණ බැංකු පනත් විධානය සහ එහි පසුකාලීන සංශෝධනයන් මඟින් හා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීති මඟින් දක්වන අවශ්‍යතාවයන්ට අනුව ඉදිරිපත් කරන හෙළිදරව් කිරීම් ද ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින සමාලෝචනය කර අනුමත කරන ලදී.

1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් යටතේ ස්ථාපනය කරන ලද ලංකා බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන අතර, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් යටතේ 1939 අගෝස්තු 1 දින සංස්ථාපනය කරන ලදී. බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතුවේ. බැංකුව විසින් සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර නිකුත් කර ඇති අතර කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත.

2. ව්‍යාපාර කටයුතු පිළිබඳ සමාලෝචනය

2.1 බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්

ගෙවුණු වර්ෂය තුළ බැංකුව නිරත වූ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස පුද්ගලික බැංකුකරණය, ආයතනික බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, අක්වෙරළ බැංකු කටයුතු, වෙළඳ මූල්‍ය, කල්බදුකරණය, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් සම්බන්ධව වෙළඳ කටයුතු, ආයෝජන බැංකුකරණය සහ භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත ආයතන සමඟ ගනුදෙනු සහ මුදල් ප්‍රේෂණ, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, උකස් සේවා, ණයපත් පහසුකම්, විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු සහ වෙනත් අදාළ මූල්‍ය සේවාවන් හැඳින්විය හැකිය.

2.2 පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම්

පරිපාලිත සහ ආශ්‍රිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව විස්තරාත්මක කරුණු මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් යටතේ පිටු අංක 160 සහ 161 හි ඇතුළත් වේ. සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි දක්වා ඇති වෙනස්වීම් හැරෙන්නට බැංකුවේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවය සමාලෝචිත වසර තුළදී සැලකිය යුතු තරමේ වෙනසකට භාජන වී නැත.

2.3 සමූහයේ සංයුතියේ වෙනස්වීම්

සමාලෝචිත වර්ෂය තුළ දී සමූහයේ සංයුතියේ සිදු වූ වෙනස්කම් වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 30 සහ 31, යටතේ පිටු අංක 215 සිට 222 දක්වා ඉදිරිපත් කර ඇත.

2.4 දැක්ම, මෙහෙවර සහ සංස්ථාපිත පරිචය

බැංකුවේ දැක්ම, මෙහෙවර සහ වටිනාකම් ප්‍රකාශන සඳහා මෙම වාර්ෂික වාර්තාවෙහි මුල් කවරයෙහි ඇතුළත දක්වා ඇත. බැංකුව උසස්ම ආචාර ධර්ම පද්ධතියකට අනුරූපව තම කටයුතු ඉටු කරන අතර, එමඟින් දැක්ම හා මෙහෙවර යටතේ ළඟා කරගැනීමට අපේක්ෂිත අරමුණු කරා බැංකුව මෙහෙයවනු ලැබේ.

2.5 වර්ෂයේ කාර්යසාධන සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුවේ/සමූහයේ කාර්යසාධනය සහ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව විවරණයක් අංක 12 සිට 14 දක්වා වූ පිටුවල අන්තර්ගත සභාපතිතුමාගේ පණිවිඩයෙහි ඇතුළත් කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුවේ මෙහෙයුම් කටයුතු පිළිබඳව විස්තරාත්මක විග්‍රහයක් අංක 16 සිට 22 දක්වා වූ පිටුවල මහා කළමනාකාරතුමාගේ සමාලෝචනයන්හි ඇතුළත් කර ඇත. බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම් කටයුතු පිළිබඳ විග්‍රහයන් වැදගත් මූල්‍ය සංඛ්‍යාත තුළ පිටු අංක 94 සිට 100 තෙක් දක්වා ඇත. මෙම වාර්තාවලින් සාධාරණ සමාලෝචනයක් ඉදිරිපත් කර ඇති අතර, ඒවා මෙම වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

2.6 ශාඛා ව්‍යාප්තිය

සමාලෝචිත වර්ෂය තුළ දී බැංකුව නව දේශීය ශාඛාවන් දෙකක් විවෘත කරමින් තම සේවා නව දුරටත් ව්‍යාප්ත කර ඇත. පාරිභෝගිකයින්ට වඩාත් පහසු සේවාවක් ලබාදීමේ අදහසින් ශාඛා ජාලය තවදුරටත් ව්‍යාප්ත කරන ලදී. වර්ෂය තුළ දී බැංකුව විසින් නව ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර 86 ක් ස්ථාපිත කළ අතර, මුදල් තැන්පතු යන්ත්‍ර 45 ක් සහ පාසල් ඉතුරුම් මධ්‍යස්ථාන 182 ක්ද ජංගම පාසල් ඉතුරුම් ඒකක 152 ක්ද ස්ථාපිත කර ඇති අතර, මේ අනුව වර්ෂය අවසානයේ දී මුළු සේවා මධ්‍යස්ථාන පිළිවෙලින් 764, 168, 1,223 සහ 152 ක් වේ. මෙම සංඛ්‍යාව අනෙකුත් බැංකු ආයතන සතු, ලංකා බැංකුවේ ගනුදෙනුකරුවන්ට ප්‍රවේශ විය හැකි ස්වයංක්‍රීය ටෙලර් පහසුකම්වලට අතිරේක වශයෙනි.

2.7 ආයතනික පරිත්‍යාග

බැංකුව විසින් 2017 වර්ෂය තුළ පරිත්‍යාග සිදු කර නොමැත. නමුත් තිරසාර පැවැත්ම සහ වගකීම් කටයුතු සඳහා රු. මිලියන 127.5 ක දායකත්වයක් බැංකුව විසින් වාර්තා කරන වර්ෂය තුළ දක්වා ඇත.

2.8 මූල්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කරන ආකාරයට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට, 1988 අංක 30 දරණ බැංකු පනතේ සහ එහි සංශෝධනවලට, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතේ සහ එහි සංශෝධනයන්ට සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීතිවලට අනුකූලවන ආකාරයට මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇති බවයි. පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී 2007 අංක 07 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදන ද භාවිතා කර ඇත. මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 149 හි ඉදිරිපත් කර ඇති අතර, එය මෙම අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත්කරන වාර්ෂික වාර්තාවේ සංකලිත කොටසකි.

2.9 විගණක වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා, ලංකා බැංකුවේ විගණක වශයෙන් පත්කර ඇත.

2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ හා පරිපාලිතයන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 150 හි දක්වා ඇත.

2.10 ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

බැංකුව සහ සමූහය සිය මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී ලං.ගි.ප්‍ර.) සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර.) අනුව පිළියෙල කරයි.

මූල්‍ය වර්තා සැකසීමේදී භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 160 සිට 302 තෙක් දක්වා ඇත. සමාලෝචිත වර්ෂය තුළදී බැංකුව විසින් භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සැලකිය යුතු වෙනසක් සිදු වී නොමැත.

3. සැලසුම් ගත සංවර්ධන කටයුතු

සැලසුම් ගත සංවර්ධන කටයුතු පිළිබඳව බැංකුවේ දර්ශනය හා සැලසුම් මෙම වාර්තාවේ පිටු අංක 12 සිට 14 දක්වා වූ සභාපතිතුමාගේ පණිවිඩයෙහි සහ පිටු අංක 16 සිට 22 දක්වා මහා කළමනාකරුගේ සමාලෝචනයන්හි ඇතුළත් වේ.

4. මුළු ආදායම

පෙර වර්ෂයේ සමූහයේ මුළු ආදායම වූ රු. මිලියන 159,701.2 ට සංසන්දනාත්මකව බැලීමේදී 2017 වර්ෂය සඳහා රු. මිලියන 197,013.0 ක් වශයෙන් මුළු ආදායම වාර්තා විය. බැංකුවේ මුළු ආදායම වර්ෂය සඳහා සමූහයේ මුළු ආදායමෙන් 96.0% ක් (2016-96.5%) විය. සමූහයේ ප්‍රධාන ආදායම පොළී ආදායම වන අතර, එය මුළු ආදායමෙන් 90.2% ක් නියෝජනය කරයි.

5. ලාභාංශ සහ සංචිත

5.1 ලාභය සහ විසර්ජනයන්

සමාලෝචිත 2017 වර්ෂය තුළ දී බැංකුව රු. මිලියන 30,343.0 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට සමත් වී ඇති අතර, එය සංසන්දනාත්මකව පෙර වර්ෂයේ රු. මිලියන 31,188.7 ට වඩා 2.7% ක අඩු වීමක් නිරූපණය කරයි. රු. මිලියන 9,030.7 ක් ආදායම් බදු වෙනුවෙන් අඩු කළ පසු (2016 දී රු. මිලියන 6,397.7) 2017 වර්ෂය සඳහා බදු පසු ලාභය රු. මිලියන 21,312.3 ක් ලෙස වාර්තා වී ඇති අතර, එය 2016 වර්ෂයේ වාර්තා වූ බදු පසු ලාභය වන රු. මිලියන 24,791.0 ට වඩා 14.0% ක අඩු වීමක් වේ. බැංකුවේ සහ සමූහයේ ලාභය හා සම්බන්ධව දත්තයන් පහත වගුවේ දක්වා ඇත:

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. මිලියන	2016 රු. මිලියන	2017 රු. මිලියන	2016 රු. මිලියන
සියළුම වියදම් දැරීමෙන් සහ ක්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන්, ණය හා අත්තිකාරම් සඳහා හානිකරණයන් හා අසම්භව්‍යන් සඳහා වෙන්කිරීමෙන් පසු, එහෙත් එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු සහ ආදායම් බද්දට පෙර වර්ෂයේ ලාභය	37,592	37,454	38,195	36,431
මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු (VAT) සහ ජාතිය ගොඩනැගීමේ බදු (NBT)	(7,249)	(6,265)	(7,431)	(6,377)
ආශ්‍රිත සමාගම්වල ලාභ/(පාඩු) කොටස, බදු පසු	–	–	52	63
ආදායම් බද්දට පෙර ලාභය	30,343	31,189	30,816	30,117
ආදායම් බදු වියදම	(9,031)	(6,398)	(9,329)	(6,731)
වර්ෂය සඳහා ලාභය	21,312	24,791	21,487	23,386
වර්ෂයට අදාළ වෙනත් විස්තීරණ ආදායම, බදු පසු	4,340	(1,080)	4,833	(706)
වර්ෂයට අදාළ මුළු විස්තීරණ ආදායම	**25,652**	**23,711**	**26,320**	**22,680**
විසර්ජනයන්				
ස්ථාවර සංචිත අරමුදලට මාරු කිරීම	(2,431)	(2,786)	(2,431)	(2,786)
ව්‍යවස්ථාපිත සංචිත අරමුදලට මාරු කිරීම	–	–	(22)	(35)
ලාභාංශ	(12,346)	(17,346)	(12,346)	(17,346)

සමූහයේ බදු පෙර ලාභය සමාලෝචිත වර්ෂය තුළ දී රු. මිලියන 30,117.0 සිට රු. මිලියන 30,815.6 දක්වා ඉහළ යමින් පෙර වර්ෂයට සාපේක්ෂව 2.3% ක වැඩි වීමක් පෙන්නුම් කරන ලදී. රු. මිලියන 9,328.9 ක් ආදායම් බදු වෙනුවෙන් අඩු කළ පසු (2016 දී රු. මිලියන 6,731.1) 2017 වර්ෂය සඳහා සමූහයේ බදු පසු ලාභය රු. මිලියන 21,486.6 ක් වන අතර, 2016 වර්ෂය සඳහා වාර්තා කළ රු. මිලියන 23,385.9 ට සාපේක්ෂව අඩු වීමක් පෙන්නුම් කරයි.

5.2 ලාභාංශ

සියළුම බදු, ණය අලාභයන් සඳහා වෙන්කිරීම් සහ සංචිත සඳහා අවශ්‍යවන්නා වූ මාරු කිරීම් යනාදිය සිදුකළ පසු ලාභය මත පදනම්ව බැංකුව විසින්, බැංකුවේ කොටස්කරු වශයෙන් ශ්‍රී ලංකා රජයේ උපදෙස් මත ලාභාංශ තීරණය කරනු ලැබේ. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා බැංකුව විසින් රු. මිලියන 12,346.4 ක මුදලක් ලාභාංශ වශයෙන් ගෙවා ඇත. (2016 - රු. මිලියන 17,346.4).

5.3 සංචිත

2017 දෙසැම්බර් 31 දිනට සමූහය සතු මුළු සංචිත වටිනාකම රු. මිලියන 101,399.1 (2016 - රු. මිලියන 87,475.3) වශයෙන් වාර්තා විය. සමූහයේ සංචිත පහත අයිතමවලින් සමන්විත වේ:

දෙසැම්බර් 31 දිනට	2017 රු. මිලියන	2016 රු. මිලියන
ස්ථාවර සංචිත අරමුදල	10,427	7,996
ප්‍රත්‍යාගණන සංචිතය	18,681	16,494
නිදහස් සංචිතය	367	367
විනිමය පරිවර්තන සංචිතය	1,703	1,060
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සඳහා සංචිතය	4,761	5,562
ව්‍යවස්ථාපිත සංචිතය	359	337
රඳවාගත් ඉපැයුම්	65,101	55,659
එකතුව	**101,399**	**87,475**

6. දේපල, පිරියත හා උපකරණ

වර්ෂය තුළ දී දේපල, පිරියත හා උපකරණ, කල්බදු වත්කම් හා අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරන ලද ප්‍රාග්ධන වියදම රු. මිලියන 3,963.8 ක් (2016 දී රු. මිලියන 2,597.8) වූ අතර, ඒවා පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 224 සිට 246 දක්වා ඇති සටහන් අංක 33-35 න් නිරූපණය කරයි.

7. නිදහස් දේපලවල අගය

2017 දෙසැම්බර් 31 දිනට සමූහය සතු නිදහස් දේපලවල අගය රු. මිලියන 21,470.2 ක් වශයෙන් (2016 දි රු. මිලියන 15,519.8) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 33 හි දක්වා ඇත.

8. ප්‍රකාශිත ප්‍රාග්ධනය හා කොටස් හිමිකම

8.1 ප්‍රකාශිත ප්‍රාග්ධනය

2017 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ සහ සම්පූර්ණයෙන්ම ගෙවා නිමි ප්‍රාග්ධනය රු. මිලියන 15,000 කි. (2016: රු. මිලියන 10,000 කි.)

2018 රාජ්‍ය අයවැය යටතේ බැංකුව වෙත වෙන් කළ රු. මිලියන 10,000.0 න් පළමු අදියර වශයෙන් රු. මිලියන 5,000.0 ක් 2017 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා රජය විසින් ලබා දෙන ලදී. මෙම මුදල 2017 දෙසැම්බර් 31 දිනට විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය යන ශීර්ෂයේ දක්වා ඇත.මේ හේතුවෙන් ශ්‍රී ලංකා රජය වෙත රුපියල් 1,000 බැගින් වූ සාමාන්‍ය කොටස් මිලියන පහක් නිකුත් කිරීමට බැංකුව විසින් කටයුතු කරගෙන යන අතර, 2018 වර්ෂයේ දී විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය යටතේ දක්වා ඇති මෙම මුදල කොටස් ප්‍රාග්ධනය වෙත මාරු කරනු ඇත.

8.2 කොටස් හිමිකම

ලංකා බැංකුවේ එකම කොටස්හිමියා ශ්‍රී ලංකා රජයයි.

9. යටත් කාලීන ණයකර නිකුතුව

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී සමූහය විසින් නිකුත් කළ යටත් කාලීන ලැයිස්තු ගත ණයකරවල අගය රු. මිලියන 10,000 ක් (2016 දී රු. මිලියන 8,000) විය. බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල ණය සහ අත්තිකාරම් ප්‍රමාණය වැඩි කර ගැනීම සඳහා මෙම ණයකර නිකුතුව මගින් ජනනය වූ අරමුදල් භාවිතා කරන ලදී. මෙම ණයකර නිකුතුව මගින් බැංකුව විසින් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරයි:

- දෙවන පෙළ ප්‍රාග්ධනය වැඩි කිරීම මගින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය හා තනි පුද්ගල ණය සීමාව වැඩි කිරීම හරහා මුළු ණය සහ අත්තිකාරම් පුළුල් කර ගැනීම.
- බැංකුවේ වත්කම් හා වගකීම් පරතරයේ නිරාවරණය වීම් අඩු කිරීම සහ කළමනාකරණය කිරීම.
- බැංකුවේ ද්‍රවශීලතාව වැඩි කිරීම හා වත්කම් පදනම වැඩි කිරීම.

මෙම ණයකර සම්බන්ධ විස්තර, සටහන් අංක 47 යටතේ පිටු අංක 263 සිට 264 තෙක් දක්වා ඇත.

10. කොටස් පිළිබඳ තොරතුරු

සමාලෝචිත වර්ෂය තුළ දී සමූහයේ කොටසක ඉපැයුම හා කොටසක් සඳහා වූ ශුද්ධ වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රු. 1,870.3 (2016 දී රු. 2,349.7) ක් සහ රු. 8,093.3 (2016 දී රු. 10,247.5) ක් විය.

11. ආයතනික තිරසාරභාවය සහ වගකීම

ආයතනික තිරසාරභාවය සහ සමාජීය වගකීම් යටතේ ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩසටහන් පිළිබඳව විස්තරාත්මක සමාලෝචනයක් මෙම වාර්තාවෙහි අංක 122 සිට 124 දක්වා වූ පිටුවල "සමාජීය සහ මානව සම්බන්ධතා ප්‍රාග්ධනය" යන අංශය යටතේ දක්වා ඇත.

12. අධ්‍යක්ෂ මණ්ඩලය

2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයින් හය දෙනෙකුගෙන් සමන්විත විය. ඔවුන් කිසිවෙක් බැංකුවේ විධායක තනතුරු දරනු නොලැබේ. ඔවුන් විශාල පරාසයක කුසලතාවයන් සහ පළපුරුද්ද සමස්ත අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සඳහා ලබා දේ. අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 35 සිට 37 දක්වා විස්තරාත්මකව සඳහන් කර ඇත.

12.1 අධ්‍යක්ෂක ලැයිස්තුව

වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය.

ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා මහතා
ස්වාධීන විධායක නොවන
අධ්‍යක්ෂ/සභාපති

සජිත් ආර් ආටිගල මහතා
ස්වාධීන නොවන විධායක නොවන නිලබලයෙන් පත්වූ

රනෙල් ඊ විජේසිංහ මහතා
ස්වාධීන විධායක නොවන

එච් පී අජිත් ගුණවර්ධන මහතා
ස්වාධීන විධායක නොවන

චරිත එන් විජේවර්ධන මහතා
ස්වාධීන විධායක නොවන
(2017 ජූලි 21 දින සිට ධූරයෙන් ඉවත් විය)

සංජය පද්මපෙරුම මහතා
ස්වාධීන විධායක නොවන
(2017 ජූනි 30 දින සිට ධූරයෙන් ඉවත් විය)

මනෝ සේකරන් මහතා
ස්වාධීන විධායක නොවන
(2017 ජූලි 6 දින පත් වූ අතර 2017 සැප්තැම්බර් 8 දින සිට ධූරයෙන් ඉවත් විය)

සමන්ත රාජපක්ෂ මහතා
ස්වාධීන විධායක නොවන
(2017 ජූලි 25 දින සිට පත් විය)

මොහාන් විජේසිංහ මහතා
ස්වාධීන විධායක නොවන
(2017 නොවැම්බර් 24 දින සිට පත් විය)

කනගසබෙයි විමලෙන්තිරාජා මහතා
(සජිත් ආර් ආටිගල මහතාට විකල්ප අධ්‍යක්ෂ වශයෙන් 2017 නොවැම්බර් 9 දින සිට පත් විය)

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන දිනට එනම් 2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අධ්‍යක්ෂවරුන් පහත දැක්වේ:

අධ්‍යක්ෂවරයාගේ නම	විධායක/විධායක නොවන	ස්වාධීනත්වයේ තත්ත්වය
ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා මහතා	විධායක නොවන	ස්වාධීන
සජිත් ආර් ආටිගල මහතා	විධායක නොවන නිලබලයෙන් පත්වූ	ස්වාධීන නොවන
රනෙල් ටී විජේසිංහ මහතා	විධායක නොවන	ස්වාධීන
එච් පී අජිත් ගුණවර්ධන මහතා	විධායක නොවන	ස්වාධීන
සමන්ත රාජපක්ෂ මහතා	විධායක නොවන	ස්වාධීන
මොහාන් විජේසිංහ මහතා	විධායක නොවන	ස්වාධීන

බලපත්‍රලාභී වාණිජ බැංකු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, 2007 අංක 11 දරණ බැංකු පනත යටතේ නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳව මගපෙන්වීම් අනුව අධ්‍යක්ෂවරු, ස්වාධීන/ස්වාධීන නොවන අධ්‍යක්ෂවරුන් ලෙස වර්ග කර ඇත.

12.2 අධ්‍යක්ෂ මණ්ඩලීය උපකමිටු

ඉහත දැක්වූ 2007 අංක 11 දරණ බැංකු පනත යටතේ නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳව මගපෙන්වීම්වලට අනුකූල වීම සඳහා සහ බැංකුවේ කටයුතු මනාව පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය උප කමිටු හතරක් පිහිටුවා ඇත. උප කමිටු සංයුතීන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 69 සිට 77 දක්වා සඳහන් කර ඇත.

12.3 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල හා උප කමිටු රැස්වීම්වලට අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වය පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 69 වන පිටුවේ දක්වා ඇත.

12.4 ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

බැංකුව සමඟ ඇති ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම පිළිබඳව දත්තයන් අංක 144 සිට 145 දක්වා වූ පිටුවල විස්තර කර ඇත. මෙම ඇල්ම පිළිබඳව තොරතුරු අධ්‍යක්ෂවරු විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී අනාවරණය කර ඇත. දී ඇති ගිවිසුම්වලට අමතරව කිසිම අධ්‍යක්ෂවරයෙකු වෙනත් සෘජු හෝ වක්‍ර ඇල්මක් බැංකුව සමඟ ඇතිකරගෙන නොමැති අතර, අනාගතයේ දී යෝජිත ගිවිසුමකට සම්බන්ධයක් හෝ නොමැති බව ප්‍රකාශ කෙරේ.

12.5 බැංකුව/සමූහය මඟින් නිකුත් කර ඇති ණයකර පිළිබඳව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

කිසිදු අධ්‍යක්ෂවරයෙකුගේ නමින් ණයකර ලේඛනගත කර නොතිබිණි.

12.6 අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා/ගාස්තු

අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවනු ලබන දීමනා/ගාස්තු සියල්ලම, 2011 සැප්තැම්බර් 15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 58 (2), 2013 නොවැම්බර් 12 සහ 2014 ජූනි 18 දිනැති මුදල් අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලිපි අනුව සහ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුව සිදු කර ඇත. 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳ තොරතුරු පිටු අංක 180 හි සටහන 15 යටතේ දක්වා ඇත.

13. අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

13.1 අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය සඳහා සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් අනුගමනය කරන ලද විශේෂ ක්‍රියාමාර්ග මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 80 සිට 92 දක්වා ඇතුළත් කර ඇත.

13.2 අභ්‍යන්තර පාලනය

බැංකුව තුළ විගණන කමිටුව හරහා වඩාත් ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලැබේ. විගණන කමිටුව විසින් හාරකාර වගකීම් නිදහස් කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලයට සහයෝගය දෙනු ලබයි. විගණන කමිටුවේ සභාපතිතුමාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 70 සිට 73 දක්වා ඇතුළත් කර ඇත. සමාලෝචනයට පාත්‍ර වූ වර්ෂය තුළ මූල්‍ය වාර්තා සහ වාර්ෂික වාර්තාව නිකුත් කළ දිනය දක්වා වූ අභ්‍යන්තර විගණන පාලන පද්ධතියෙහි ඵලදායීතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ.

බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත 2007 අංක 11 දරණ බැංකු පනත යටතේ නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳව මගපෙන්වීම්වල විධිවිධාන අංක 3 (8) (II) (ආ) අනුව අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කර ඇත. ඉහත සඳහන් වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 146 සහ 147 දක්වා ඇතුළත් කර ඇත.

මූල්‍ය වාර්තාකරණ පද්ධතිය, සාධාරණ තහවුරුවක් ලැබෙන පරිදි නිර්මාණය කර ඇති බවටත්, බාහිර පාර්ශවයන්ට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශ, අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් සකස් වී තිබෙන බවටත්, අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශනය මත සහතිකවීමේ වාර්තාවක් විගණකාධිපතිතුමාගෙන් ලබාගෙන ඇති අතර එය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 148 හි දක්වා ඇත.

14. ආයතනික යහපාලනය

වඩාත් ඵලදායී ආයතනික යහපාලන රාමුවක් සහ ක්‍රියාවලියන් පවත්වාගෙන යෑමට අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටියි. බැංකුවේ මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා ක්‍රියාකාරකම් ආයතනික යහපාලන පරිචයට අනුකූල වන පරිදි මෙහෙයවීම සහ කාර්යක්ෂමව පාලනය කිරීම සිදු වේ. වාණිජ බැංකුවල නියාමක වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, 2007 අංක 11 දරණ බැංකු පනත යටතේ නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳව මගපෙන්වීම් සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයට මෙම පද්ධතීන් සහ පරිචයන් අනුකූල වන අතර, මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 62 සිට 77 දක්වා ඇති ආයතනික යහපාලන පරිචයේ සවිස්තරාත්මකව සඳහන් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඉහත දැක්වූ 2007 අංක 11 විධිවිධානයන්ට අනුකූලවීම මත විගණකාධිපතිතුමාගෙන් වාර්තාවක් ලබා ගෙන ඇත.

15. මානව සම්පත

බැංකුව සතු ඉහළ වටිනාකමක් සහිත සම්පතක් ලෙස එහි සේවකයින් සලකන අතර, ඔවුන්ගේ සංවර්ධනය බැංකුවට ඉතාමත් වැදගත්වනු ඇත. සංස්ථාපිත අරමුණු ඉටු කර ගැනීමේ දී ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය උපරිම තත්ත්වයෙන් පවත්වාගෙන යෑම සඳහා ඉතා වටිනා මෙම මානව ප්‍රාග්ධනය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර රාශියක් ගෙන ඇත. බැංකුවේ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ පරිචයන්, "අපගේ වටිනාම වත්කම මඟින් උපරිම දායකත්වයක්" යටතේ විස්තර කර ඇත. පිටු අංක 126 සිට 133 දක්වා ඇතුළත් කර ඇත.

16. නීති රීති සඳහා වූ අනුකූලතාවය

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි බැංකුව නීති රීතිවලට පටහැනිව කිසිදු ක්‍රියාකාරකමක නියුක්තවී නොමැති බව ප්‍රකාශ කරයි.

මෙම වාර්තාවේ සංකලිත කොටසක් වන "අනුකූලවීමේ ඇමුණුම්" යටතේ පිටු අංක 304 සිට 343 දක්වා නීති හා රෙගුලාසි සමඟ බැංකුවේ අනුකූලතාවය පිළිබඳ විස්තර ඇතුළත් වේ. තවද දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ 104 වන පරිච්ඡේදය මඟින් නිරූපනය කරනු ලැබූ පැවරුම් මිල සම්බන්ධ නීති රීති සංග්‍රහයට අනුකූලව බැංකුව කටයුතු කරනු ලබන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එය සහතික කරනු ලබයි. මේ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල සහතිකය පිටු අංක 344 යටතේ දක්වා ඇත.

17. සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය පරිදි සහ බැංකුවේ නීතිඥයින් විසින් තහවුරු කළ පරිදි දැනට බැංකුව විසින් මෙහෙයවනු ලබන තවමත් සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම්වලින් බැංකුවේ මූල්‍ය තත්ත්වයට හෝ අනාගත මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් අහිතකර බලපෑමක් සිදු වෙතැයි අපේක්ෂා නොකෙරේ.

18. ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් සහ සේවකයින් වෙනුවෙන් රජයට ගෙවිය යුතු ගෙවීම් නියමිත කාලයේ දී සිදුකර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසයෙන් තහවුරු කරයි.

19. පාරිසරික ආරක්ෂාව

පරිසරයට අයහපත් ප්‍රතිඵල ළඟා කරදෙන කිසිම ක්‍රියාකාරකමක බැංකුව නියුක්ත වී නැත. තවද, පරිසරය රැකගැනීමේ අරමුණින් ගත් පියවර පිටු අංක 134 සිට 136 දක්වා "මිහිතලය සුරැකීම සඳහා අපගේ දායකත්වය" යන මාතෘකාව යටතේ දක්වා ඇත.


20. ශේෂ පත්‍රයෙන් පසු සිදුවූ සිද්ධීන්

අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ප්‍රමාණාත්මක ගැලපීමක් හෝ හෙලිදරව්වක් සිදු කළ යුතු කිසියම් ප්‍රමාණාත්මක සිද්ධියක් ශේෂ පත්‍ර දින හා මෙම වාර්තාව නිකුත් කළ දින අතර කාල පරාසය තුළදී සිදුවී නැති බවයි.

21. අබණ්ඩභාවය

තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රමාණයේ සම්පත්, බැංකුව සතු බව අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසයයි. එම නිසා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අඛණ්ඩ පවැත්ම යන සංකල්පය භාවිතාකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

2018 මාර්තු 27 දින
කොළඹ දීය.

ගිවිසුම් හා සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි අවශ්‍යතාවන්ට අනුකූලව, "සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ අනාවරණය" විස්තරාත්මක වශයෙන් මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 57 හි පිටු අංක 274 සිට 279 තෙක් දක්වා ඇත. අතිරේක වශයෙන් ව්‍යාපාරමය සාමාන්‍ය ක්‍රියාකාරකම් තුළ බැංකුවේ සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපති හෝ අධ්‍යක්ෂධූර දරණ අනෙකුත් ආයතනයන් සමග කරන ලද ගනුදෙනු සම්බන්ධව විස්තරයක් දැක්වේ:

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව රු. '000	2017.12.31 දිනට ශේෂය/හිගහිටි වටිනාකම රු. '000	2016.12.31 දිනට ශේෂය/හිගහිටි වටිනාකම රු. '000
ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා මහතා					
ලංකා බැංකුව (යූ.කේ.) සමාගම	සභාපති	ජංගම ගිණුම්		ඇ.ඩො. 4,881	ඇ.ඩො. 659
		(නොස්ට්‍රෝ ගිණුම්)		*746,084	*98,775
				මහා බ්‍රිතාන්‍ය පවුම් 232	මහා බ්‍රිතාන්‍ය පවුම් 531
				*47,684	*97,755
				යූරෝ 1,017	යූරෝ 1,656
				*185,588	*261,444
		බැංකුවල ඇති තැන්පතු		ඇ.ඩො. 8,000	ඇ.ඩො. 8,000
				*1,222,838	*1,198,400
				මහා බ්‍රිතාන්‍ය පවුම් 55,300	මහා බ්‍රිතාන්‍ය පවුම් 73,400
				*11,366,152	*13,508,852
				යූරෝ 1,000	යූරෝ 1,000
				*182,486	*157,874
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම [ජනාධිපති නීතීඥ රොනල්ඩ් සී පෙරේරා මහතා 2017 ඔක්තෝම්බර් 19 දින සිට සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගමෙහි වැඩබලන සභාපති ලෙස පත්විය]	වැඩබලන සභාපති	ඉතිරිකිරීමේ ගිණුම්		6,046	
		ජංගම ගිණුම්		12,563	
		කාලීන තැන්පතු		152,278	
		ණය		5,243	
		වෙනත් ලැබිය යුතු ශේෂයන්		47,050	
සපිත් ආර් ආටිගල මහතා		ඉතිරි කිරීමේ ගිණුම්			484,227
සී/ස එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) සමාගම [සපිත් ආර් ආටිගල මහතා 2017 දෙසැම්බර් 31 දිනට සී/ස එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු නොවීය.]	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්			1,399,730
		කාලීන තැන්පතු			2,890,369
		ණයවර ලිපි			240,740
		ඇපකාර ලිපි			18,300
රනෙල් ටී විජේසිංහ මහතා					
සී/ස කොළඳෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම [රනෙල් ටී විජේසිංහ මහතා 2017 ඔක්තෝම්බර් 25 දින සිට සී/ස කොළඳෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ ලෙස පත් විය]	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		2,551	
		කාලීන තැන්පතු		237,165	
		ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්		6,103	
එච් පී අජිත් ගුණවර්ධන මහතා					
සී/ස ලංකා සිකියුරිටීස් (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		10,835	10,486
		කාලීන තැන්පතු		231,400	102,879
		අයිරා පහසුකම්	25,000		
		ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්		77,037	22,007

* *රුපියල් වලට සමාන අගය.*

සටහන: *මුදල් ඒකකය විශේෂයෙන් සඳහන් කොට නොමැති සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.*

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව රු. '000	2017.12.31 දිනට ශේෂය/හිඟහිටි වටිනාකම රු. '000	2016.12.31 දිනට ශේෂය/හිඟහිටි වටිනාකම රු. '000
සමන්ත රාජපක්ෂ මහතා					
[සමන්ත රාජපක්ෂ මහතා 2017 ජූලි 25 දින සිට ලංකා බැංකුවේ අධ්‍යක්ෂ ලෙස පත් විය]					
සී/ස ඇසෝෂියේටඩ් මෝටර්වේස් (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ඉතිරි කිරීමේ ගිණුම් (රු.)		71,849	
		ඉතිරි කිරීමේ ගිණුම්		ඇ.ඩෝ. 3,306	
				*505,274	
		ජංගම ගිණුම්		119,592	
		කාලීන තැන්පතු		ඇ.ඩෝ. 156	
				*23,904	
		නැව් ඇපකර	250,000	20,709	
		ණයවර ලිපි	1,000,000	822,239	
		කැපකර ණය	200,000	–	
		ප්‍රතිග්‍රහණ		9,660	
		ඇපකාර ලිපි	100,000	36,267	
		අපනයන එකතූන්		15,124	
		ආනයන බිල්පත්		234	
සී/ස ඇසෝෂියේටඩ් ඔටෝවේස් (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		1,946	
		ඇපකාර ලිපි	1,000	–	
		නැව් ඇපකර	6,000	–	
		ණයවර ලිපි	6,000	–	
		කැපකර ණය	8,000	–	
සී/ස ඇසෝෂියේටඩ් මෝටර් (ලංකා) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		249	
		ණයවර ලිපි	90,000	–	
		නැව් ඇපකර	120,000	–	
		කැපකර ණය	19,975	–	
		ඇපකාර ලිපි	5,000	–	
ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලිසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	අධ්‍යක්ෂ	ඉතිරි කිරීමේ ගිණුම්		4,700	
		ජංගම ගිණුම්		15,523	
මොහාන් විජේසිංහ මහතා					
[මොහාන් විජේසිංහ මහතා 2017 නොවැම්බර් 24 දින සිට ලංකා බැංකුවේ අධ්‍යක්ෂ ලෙස පත් විය]					
ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පී එල් සී	අධ්‍යක්ෂ	ඉතිරි කිරීමේ ගිණුම්		ඇ.ඩෝ. 235	
				*35,944	
		ජංගම ගිණුම්		53,555	
		කාලීන තැන්පතු		ඇ.ඩෝ. 6,301	
				*963,159	
සී/ස මග නැගුම කන්සල්ටන්සි ඇන්ඩ් ප්‍රොපෙක්ට් මැනේජ්මන්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම්		2,864	

** රුපියල් වලට සමාන අගය.*

සටහන: *මුදල් ඒකකය විශේෂයෙන් සඳහන් කොට නොමැති සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.*

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

වගකීම

2007 අංක 11 දරණ බැංකු පනත් විධානයෙහි 3 (8) (II) (ආ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

ලංකා බැංකුවෙහි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණාත්මතාවය සහ සඵලදායීත්වය අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. මෙහිදී බැංකු කටයුතුවලට අදාළ අවදානම් හා ප්‍රතිඵල සමබර ලෙස කළමනාකරණය කළ යුතු අතර, බැංකුවේ අවදානම් අභිරුචිය පිළිබඳ සීමා හා දර්ශකවල විචල්‍යතා ඉස්මතුවන සේ අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් නිර්මාණය කරයි. මේ අනුව මූල්‍ය තොරතුරු හා වාර්තාවල මූලික අවප්‍රකාශයන්, මූල්‍ය අලාභයන් හෝ වංචාවලට එරෙහිව අභ්‍යන්තර පාලන පද්ධතීන්ට ලබාදිය හැක්කේ පූර්ණ සහතිකයක් නොව සාධාරණ සහතිකයක් පමණි.

බැංකුව විසින් මුහුණ පෑ හැකි සැලකිය යුතු අවදානම් කාරකයන් හඳුනා ගැනීම, ප්‍රමාණ නිර්ණය, නිරීක්ෂණය සහ කළමනාකරණය සඳහා වූ අඛණ්ඩව බලපැවැත්වෙන ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කර ඇත. ව්‍යාපාර පරිසරයේ සහ ව්‍යවස්ථාපිත මාර්ග සූචකයන්හි සිදුවන වෙනස්වීම් වලට අනුරූපිව මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධති වර්ධනය කිරීම හා ශක්තිමත් කිරීමද මෙයට ඇතුළත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් බැංකු අධ්‍යක්ෂවරුන් හට මග පෙන්වීම සඳහා නිකුත් කර ඇති අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව උපයෝගී කර ගනිමින් සහ ඒ අනුව යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරතුරුවම ඉහත සඳහන් ක්‍රමවේදය නිරීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන කටයුතු නිරීක්ෂණයේ දී ඉහත මගපෙන්වීමෙහි සඳහන් පරිදි අභ්‍යන්තර පාලන පද්ධති තක්සේරු කිරීමේ මූලධර්ම යොදාගෙන ඇත.

දැනට ක්‍රියාත්මක වන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධති සාධාරණ සහතික ප්‍රතිඥාවක් ලබා දීමට ප්‍රමාණවත් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි. තවද බාහිර උපයෝගීතාවය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශයන් අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූල බවද අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි.

මතු වූ අවදානම් හඳුනා ගැනීමට හා තක්සේරු කිරීමට මෙන්ම එම අවදානම් අවම කිරීමට හා පාලනය කිරීමට සුදුසු අභ්‍යන්තර පාලන විධි නිර්මාණය, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම මගින් අවදානම් සහ පාලනයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලීය ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග භාවිතයට කළමනාකාරිත්වය සහය දක්වනු ලැබේ.

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි සැලැස්ම සහ සඵලදායීත්වය නිරීක්ෂණය කිරීමේදී යොදා ගන්නා ලද ක්‍රමවේදය සහ එහි මූලික ලක්ෂණ

අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි ප්‍රමාණාත්මකතාවය සහ සම්පූර්ණත්වය නිරීක්ෂණය කිරීමට ස්ථාපිත කර ඇති ප්‍රධාන ක්‍රමවේදයන්හි පහත දෑ ඇතුළත් වේ.

- බැංකුවෙහි දෛනික කටයුතුවල සඵලතාවය සහ බැංකුවේ සමස්ත මෙහෙයුම් අනුමත කළ ආයතනික සැලැස්ම මගින් උකහා පිළියෙල කල ආයතනික අරමුණු, උපක්‍රම සහ වාර්ෂික අයවැය අනුව පවතිද යන්න සහතික කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහය පිණිස විවිධ කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇත.
- නියැදි හා චක්‍රීය ක්‍රම භාවිතයෙන්, ප්‍රතිපත්තීන්ට හා ක්‍රියාදාමයන්ට අනුගත වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි කාර්යසාධනය පිළිබඳව අඛණ්ඩව පරීක්ෂා කිරීම බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කරනු ලබන අතර එමගින් සොයා ගනු ලබන සැලකිය යුතු අනුගත නොවීම් අවධානයට ලක් කරනු ලබයි. සියලු අංශවල සහ ශාඛාවල විගණනයන් පවත්වනු ලබන අතර, ස්වාධීන සහ විෂයමූලික වාර්තාවක් නිකුත් කිරීම උදෙසා විගණනයෙහි වාර ගණන ඇගයීමට ලක්වූ අවදානම මත තීරණය වේ. වාර්ෂික විගණන සැලසුම අධ්‍යක්ෂ මණ්ඩල විගණන නිරීක්ෂණ කමිටුව නිරීක්ෂණය කොට අනුමත කරනු ලබයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුවේ නිරන්තර රැස්වීම්හි නිරීක්ෂණය සඳහා යොමු කරයි.
- නියාමන අධිකාරීන්, කළමනාකාරිත්වය, අභ්‍යන්තර හා බාහිර විගණකයින් විසින් හඳුනාගත් අභ්‍යන්තර පාලනය පිළිබඳ ගැටළු අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අවධානය යොමු කර අවදානම් කළමනාකරණයෙහි සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණාත්මකභාවය සහ කාර්ය සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරයි. අභ්‍යන්තර විගණන ක්‍රියාවලියෙහි ගුණාත්මකභාවය සහ විෂය පථය පිරික්සීම ද විගණන කමිටුව මගින් සිදු කරයි. සියලුම විගණන කමිටු රැස්වීම් වාර්තා ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. පිටු අංක 70 සිට 73 දක්වා ඇති විගණන කමිටු වාර්තාවෙහි විගණන කමිටුව විසින් අදාළ වර්ෂය තුළ ක්‍රියාත්මක වීම සවිස්තරව දක්වා ඇත.
- අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීමේ දී, හඳුනාගත් බැංකු නිලධාරීන් විසින් මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් ගිණුම් සහ හෙළිදරව් කිරීම් වලට සම්බන්ධ සිය ක්‍රියා පිළිවෙත් සහ පාලනයන් පරීතුලනය කරන ලදී. එහි සැලස්මේ උචිතභාවය හා සඵලතාවය පිළිබඳ අභ්‍යන්තර විගණන අංශය විසින් නැවත නිරීක්ෂණය කරන ලදී.
- බැංකුව 2012 වර්ෂයේ දී නව ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත යොදා ගන්නා ලදී. ඉහත ගිණුම්කරණ ප්‍රමිත මූලිකව භාවිතා කිරීමේ දී යොදාගත් ක්‍රමවේදයන් සහ ක්‍රියා පටිපාටීන්, නියාමන අධිකාරීන්, අභ්‍යන්තර හා බාහිර විගණකයින් හා අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව මගින් ලද ප්‍රතිචාර අනුව ඉන් පසු වර්ෂවල දී නවදුරටත් ශක්තිමත් කරන ලදී. බැංකුව විසින් බැංකුවේ සහ එතෙර ශාඛාවන්හි ණය හා අත්තිකාරම් හානිකරණ හඳුනා ගැනීමේ ක්‍රියාවලිය, මූල්‍ය ප්‍රකාශනවල අවදානම් කළමනාකරණය හා සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ හෙළිදරව් කිරීම් කිරීමට ක්‍රියාමාර්ග ගනිමින් සිටී. තවද මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට මූල්‍ය උපකරණ කාර්යක්ෂම සහ සඵලව හඳුනාගැනීම, මිනුම් කිරීම හා වර්ගීකරණය කිරීම සඳහා යෝග්‍ය ස්වයංක්‍රිය ගිණුම් වාර්තා ක්‍රියාවලියක අවශ්‍යතාවය බැංකුව හඳුනා ගෙන ඇත. මෙහිදී බැංකුවේ පරිපාලිත සමාගම් විසින් සිදුකරන ලද ක්‍රියා පටිපාටීන් විශ්ලේෂණය කර නැත. තවද බැංකුව විසින් 2018 ජනවාරි 1 දින සිට බලපවත්වන්නා වූ ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 9: "මූල්‍ය උපකරණ" ගිණුම් ප්‍රමිතියට පූර්ණ වශයෙන් අනුගත වීම සඳහා අවශ්‍ය කරන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කරන පියවර දැනටමත් ගෙන ඇත.
- පෙර වර්ෂයන්හි මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් බාහිර විගණකයින්ගේ නිර්දේශයන් සමාලෝචනය කර යෝග්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග වර්ෂය තුළදී ගන්නා ලදී. මූල්‍ය වාර්තාකරණයට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් 2017 වර්ෂයේ දී බාහිර විගණක නිර්දේශයන් සම්බන්ධයෙන් අනාගතයේ දී ක්‍රියා කරනු ඇත.

තහවුරු කිරීම

ඉහත සඳහන් ක්‍රියාවලින් හා ක්‍රියාදාමයන් පදනම්ව බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇත්තේ බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවයන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව, බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශන සැකසීමේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතිකවීමක් සැපයෙන අයුරින් බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



සභාපති
විගණන කමිටුව



සභාපති



අධ්‍යක්ෂ

2018 මාර්තු 27 දින
කොළඹ දීය.

ස්වාධීන සහතිකවීමේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } බිඒඑන්/බි/බිඕසි/අයිසි/2017

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2018 මැයි 18

සභාපති
ලංකා බැංකුව,

ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයන්ට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන ස්වාධීන සහතිකවීමේ වාර්තාව

හැඳින්වීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාවේ ඇතුළත් ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ සහතිකවීමක් මෙම වාර්තාවෙන් සපයනු ලැබේ. මෙම සහතිකවීමේ කාර්යයේ දී මා විසින් ස්වාධීන වරලත් ගණකාධිකාරී ආයතනයක සහාය ලබාගන්නා ලදී.

කළමනාකරණයේ වගකීම

2007 අංක 11 දරණ බැංකු පනතේ 3 (8) (ii) (ආ) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති "අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වූ මාර්ගෝපදේශයට" අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, කළමනාකරණය සතු වගකීම වේ.

මාගේ වගකීම හා ශ්‍රී ලංකා සහතිකවීමේ කාර්යභාර ප්‍රමිත (ශ්‍රී ලං.ස.කා.ප්‍ර.) 3050 ට අනුකූල වීම

මාගේ පරීක්ෂණ මත පදනම්ව මෙම අභ්‍යන්තර පාලනයන්ට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ වාර්තාවක් නිකුත්කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති අභ්‍යන්තර පාලනයට අදාළව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු ආයතන සඳහා සහතික වීමේ වාර්තාව ශ්‍රී ලං.ස.කා.ප්‍ර. 3050 ට අනුකූලව මාගේ සහතිකවීමේ කාර්යභාරය මා විසින් මෙහෙයවා ඇත.

ඉටුකළ කාර්යයේ සාරාංශය

අදාළ ප්‍රකාශය, අධ්‍යක්ෂවරුන් විසින් හෝ අධ්‍යක්ෂවරුන් සඳහා හෝ පිළියෙල කළ ලිපි ලේඛන මගින් තහවුරු වන්නේ ද, සහ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේ දී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන තිබෙන ක්‍රියාවලිය මගින් මැනවින් පිළිබිඹු වන්නේ ද යන්න අගය කර බැලීම සඳහා මාගේ කාර්යභාරය මෙහෙයවා තිබේ.

මෙම පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම මගින් යෝජනා සාක්ෂි ලබා ගන්නා ලදී.

(අ) අභ්‍යන්තර පාලන සැලසුම්කරණය සහ කාර්යක්ෂමතාවය පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කර ඇති ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යක්ෂකවරුන්ගේන් විමසීමක් කළ අතර, වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂකවරුන් විසින් කරන ලද ප්‍රකාශනය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සන්සන්දනය කරන ලදී.

(ආ) සිය ප්‍රකාශය සනාථ කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරන ලද ලියකියවිලි සමාලෝචනය කිරීම.

(ඇ) මූල්‍ය ප්‍රකාශණ විගණනය අතරේදී අධ්‍යක්ෂකවරුන් විසින් ප්‍රකාශිත ප්‍රකාශ බැංකුව පිළිබඳව මාගේ දැනුම සඳහා ලබා ගන්නා ලදී.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අදාළ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු රැස්වීම්වල වාර්තා සමාලෝචනය කිරීම.

(ඉ) වාර්ෂික වාර්තාවේ ඇතුළත් කරන විගණන කමිටු රැස්වීම් පැමිණීම්, අභ්‍යන්තර පාලන වාර්තාව යනදිය සලකා බලා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම අනුමත කර ඇත.

(ඊ) සමාලෝචනය කරනු ලබන වර්ෂය ආවරණය වන පරිදි අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව ඉදිරිපත් කර ඇති බවටත් සැලකිය යුතු කරුණු හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන ඇති බවටත් සලකා බලන ලදී.

(උ) විගණන සාක්ෂි සාධාරණ ලෙසින් අපේක්ෂා කළ නොහැකි අභ්‍යන්තර පාලන ක්‍රමයට අදාළ කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලිඛිතව කරුණු ලබා ගැනීම.

මෙම ප්‍රකාශය තුළින් සියලු අවදානම් හා පාලනයන් ආවරණය වන්නේදැයි සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් හා පාලන ක්‍රියා පටිපාටිවල සඵලදායීතාවය පිළිබඳ මතයක් ගොඩනැගීම හෝ ශ්‍රී ලං.ස.කා.ප්‍ර. 3050 ට අනුව අවශ්‍ය නොවේ. එසේම ශ්‍රී ලං.ස.කා.ප්‍ර. 3050 ට අනුව වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇති ප්‍රමාණාත්මක අභ්‍යන්තර පාලන අංශයන් පිළිබඳව පවතින සැලකිය යුතු ගැටළු සඳහා ක්‍රියා කිරීමට විස්තර කර ඇති ක්‍රියාවලීන් මගින් එම ගැටළු සඳහා නියත පිළියම් ලැබේ දැයි යන්න මා විසින් සලකා බැලීම අවශ්‍ය නොවේ.

නිගමනය

ඉටුකරන ලද ක්‍රියා පටිපාටීන් මත පදනම්ව වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය, මූල්‍ය වාර්තාකරණය සඳහා වූ බැංකුවේ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම හා සඵලදායකත්වය පිළිබඳ සමාලෝචනයේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදවා ඇති ක්‍රියාවලිය පිළිබඳ මාගේ අවබෝධය හා සංගත නොවන බවට විශ්වාස කිරීමට හේතුවන කරුණු කිසිවක් මාගේ අවධානයට ලක්වී නොමැත.

එච් එම් ගාමිණී විජේසිංහ
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. . · இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. · No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණයට අදාළ අධ්‍යක්ෂවරුන්ගේ හා විගණකවරුන්ගේ වගකීම් පැහැදිලිව දැක්වීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පිළිබඳ ප්‍රකාශය සකසනු ලබයි. ලංකා බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම මෙම ප්‍රකාශය මගින් දැක්වේ.

මූල්‍ය ප්‍රකාශ

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් සමඟ 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් සහ විධිවිධානයන්ට අනුව, සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් නිරවද්‍යතාවක් සමඟ බැංකුවේ මූල්‍ය තත්ත්වය පිළිබිඹු කෙරෙන ගිණුම් පොත් බැංකුව විසින් පවත්වාගෙන යාම තහවුරු කිරීමත් සහ බැංකුවේ කටයුතු පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය වන ආකාරයට සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කිරීමත් බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන පරිදි මෙම වාර්ෂික වාර්තාවේ නිරූපණය කර ඇති, 2017 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී වඩාත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගෙන ඇති අතර, ඒවා ඒකාකාරීව භාවිතා කර, කළමනාකරණය විසින් වඩාත් සාධාරණ හා විවක්ෂණ ලෙස තම විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීම් පාදක කරගෙන ඇත. භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්තීන් පිළිබඳව ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් එවැනි දෑ පිළිබඳව අනාවරණය හා පැහැදිලි කිරීම් කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන් හා අනෙකුත් නියාමන අවශ්‍යතාවයන් හා අනුකූලවන පරිදි සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශවලින් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කෙරේ.

අඛණ්ඩ පැවැත්ම

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, බැංකුවට හා සමූහයට අනාගතය දැකිය හැකි නිශ්චිත කාලයක් සඳහා තම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමට ප්‍රමාණවත් සම්පත් ඇති බවයි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී තව දුරටත් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය භාවිතා කර ඇත.

අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය හා අනුකූලතාවය

බැංකුවේ වත්කම්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමට මෙන්ම වංචාවන් සහ අවකළමනාකරණය වැළැක්වීමට, වඩාත් ශක්තිමත් අභ්‍යන්තර පාලන පරිසරයක් පවත්වාගෙන යෑම සඳහා සැලකිය යුතු වැදගත්කමක් ලබා දීම, අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ අවදානම් කළමනාකරණය ද අධ්‍යක්ෂවරුන් සතු වගකීමකි.

ආවේණික හා අවශේෂ අවදානම් මුළුමනින්ම තුරන් කරලීම කළ නොහැකි නමුත් කලින් තීරණය කරන ලද පද්ධති හා සීමා පැනවීම් තුළ උචිත යටිතල පහසුකම්, පාලනයන්, පද්ධති හා ආචාරධර්ම පදනම් වූ චර්යාවන් භාවිතය හා ක්‍රියාවට නැංවීම තුළින් එවැනි දෑ අවම කර ගැනීම තහවුරු කිරීම අපේක්ෂා කෙරේ. මූල්‍ය වාර්තාකරණයේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතික වීමක් ලබා දෙන ආකාරයට මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සකසා ඇති බව පිටු අංක 146 සහ 147 හි අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මගින් තහවුරු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණය විසින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ ඒ සඳහා වන මගපෙන්වීම් මනා ලෙස සංවිධානය කර ඇත. ප්‍රමාණාත්මක අවදානම් පාලනය කිරීමටත්, ඒවා කළමනාකරණය කිරීමටත් කළමනාකරණ කමිටු ස්ථාපිත කර ඇත. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සාකච්ඡා කිරීම සඳහා කාර්තුමය පදනමක් මත අවදානම් වාර්තාවන් සැපයීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. අදාළ නීති, රෙගුලාසි, රීති, විධානයන් සහ මගපෙන්වීම් සමඟ අනුකූලවන ආකාරය ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් අධීක්ෂණය කරන අතර, මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරේ.

අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ගයන්ගේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සඳහා විගණන කමිටුව හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අඛණ්ඩව ක්‍රියා කරයි. විගණන කමිටුවේ හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 70 සිට 73 සහ 74 සිට 75 දක්වා අන්තර්ගත වේ.

විගණන වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත විගණන වාර්තාව සහ අවසාන විගණන මතය ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපතිගේ වගකීම මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 150 හි ඇතුළත් කර ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව පිළිබඳ විගණකාධිපතිවරයා විසින් ලබාදුන් සහතිකය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 148 හි දක්වා ඇත.

අනුකූලතාව

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට නියාමන හා ව්‍යවස්ථාපිත අධිකාරීන්ට ගෙවීමට ඇති සිය ව්‍යවස්ථාපිත ගෙවීම් බැංකුව සහ පරිපාලිතයන් විසින් නියමිත පරිදි ගෙවා අවසන් කර හෝ ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි සෑහීමට පත් වේ.

මෙම වාර්තාවේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ඔවුන්ගේ වගකීම් යථා පරිදි ඉටුකර ඇති බවයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්
2018 මාර්තු 27

කොළඹ දිය.

විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } බිඒඑෆ්/ඕ/ඕඕසී/එෆ්ඒ/2017
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2018 මාර්තු 29

සභාපති,
ලංකා බැංකුව.

ලංකා බැංකුව සහ එහි පරිපාලිතයන්හි 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ පාඩු ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා බැංකුවේ ('බැංකුව') මූල්‍ය ප්‍රකාශන සහ බැංකුව හා එහි පරිපාලිතයන්ගේ ('සමූහය') ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය සිදුකරන ලදී. මෙම විගණනය සිදුකිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය අධ්‍යක්ෂ මණ්ඩලයේ ('අධ්‍යක්ෂ මණ්ඩලය') වගකීම වේ.

විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමට ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

මතය

මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

නිදහස් කිරීම

1971 අංක 38 දරන මුදල් පනතේ 5 (1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, 1992 මැයි 14 දිනැති අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද එවකට මුදල් අමාත්‍යවරයාගේ නියෝගය පරිදි එකී මුදල් පනතේ 11 කොටසෙහි ඇතුළත් විධිවිධානවලින් බැංකුව නිදහස් කර ඇත.

පාර්ලිමේන්තුවට වාර්තා කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

එච් එම් ගාමිණී විජේසිංහ
විගණකාධිපති

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. . இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

ලාභ හෝ අලාභ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව			සමූහය		
		2017 රු. '000	2016 රු. '000	වෙනස %	2017 රු. '000	2016 රු. '000	වෙනස %
මුළු ආදායම	7	**189,211,395**	**154,121,372**	**22.8**	**197,012,961**	**159,701,225**	**23.4**
පොළී ආදායම		171,343,888	134,685,338	27.2	177,746,357	139,701,569	27.2
අඩු කළා: පොළී වියදම		112,987,696	80,727,850	40.0	116,256,255	83,095,077	39.9
ශුද්ධ පොළී ආදායම	8	**58,356,192**	**53,957,488**	**8.2**	**61,490,102**	**56,606,492**	**8.6**
ගාස්තු සහ කොමිස් ආදායම		9,178,655	8,739,625	5.0	9,436,780	8,983,083	5.1
අඩු කළා: ගාස්තු සහ කොමිස් වියදම		1,883,302	1,520,190	23.9	1,972,374	1,607,271	22.7
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	9	**7,295,353**	**7,219,435**	**1.1**	**7,464,406**	**7,375,812**	**1.2**
වෙළඳපොල ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	10	2,802,048	2,061,616	35.9	2,822,168	2,037,390	38.5
ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට නම් කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභ/(පාඩු)		–	–	–	–	–	–
මූල්‍ය ආයෝජනවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	11	905,527	273,881	230.6	925,733	312,273	196.4
වෙනත් මෙහෙයුම් ආදායම්	12	4,981,277	8,360,912	(40.4)	6,081,923	8,666,910	(29.8)
මුළු මෙහෙයුම් ආදායම		**74,340,397**	**71,873,332**	**3.4**	**78,784,332**	**74,998,877**	**5.0**
අඩු කළා: ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා ප්‍රතිපාදන/(ප්‍රතිවර්තන) කිරීම	13	9,340,658	4,396,761	112.4	9,884,889	4,421,000	123.6
ශුද්ධ මෙහෙයුම් ආදායම		**64,999,739**	**67,476,571**	**(3.7)**	**68,899,443**	**70,577,877**	**(2.4)**
අඩු කළා: මෙහෙයුම් වියදම්							
සේවක මණ්ඩල වියදම්	14	16,996,176	16,844,431	0.9	18,723,550	18,409,329	1.7
වෙනත් වියදම්	15	10,411,797	13,178,506	(21.0)	11,980,852	15,737,789	(23.9)
මුළු මෙහෙයුම් වියදම්		**27,407,973**	**30,022,937**	**(8.7)**	**30,704,402**	**34,147,118**	**(10.1)**
මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්දට හා ජාතිය ගොඩනැගීමේ බද්දට පෙර ලාභය		**37,591,766**	**37,453,634**	**0.4**	**38,195,041**	**36,430,759**	**4.8**
අඩු කළා: මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්ද හා ජාතිය ගොඩනැගීමේ බද්ද		7,248,786	6,264,949	15.7	7,431,502	6,376,679	16.5
මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බද්දට හා ජාතිය ගොඩනැගීමේ බද්දට පසු ලාභය		**30,342,980**	**31,188,685**	**(2.7)**	**30,763,539**	**30,054,080**	**2.4**
ආශ්‍රිත සමාගම්වල ලාභ/(පාඩු) කොටස, බදු පසු	16	–	–	–	52,024	62,952	(17.4)
ආදායම් බද්දට පෙර ලාභය		**30,342,980**	**31,188,685**	**(2.7)**	**30,815,563**	**30,117,032**	**2.3**
අඩු කළා: ආදායම් බදු වියදම	17	9,030,696	6,397,689	41.2	9,328,918	6,731,105	38.6
වර්ෂය සඳහා ලාභය		**21,312,284**	**24,790,996**	**(14.0)**	**21,486,645**	**23,385,927**	**(8.1)**
වර්ෂයේ ලාභයෙන්:							
බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස		21,312,284	24,790,996	(14.0)	21,470,163	23,496,656	(8.6)
පාලනයට යටත් නොවන හිමිකම		–	–	–	16,482	(110,729)	114.9
වර්ෂය සඳහා ලාභය		**21,312,284**	**24,790,996**	**(14.0)**	**21,486,645**	**23,385,927**	**(8.1)**
කොටසක ඉපැයුම්:	18						
කොටසක මූලික ඉපැයුම් (රු.)		1,856.56	2,479.10	(25.1)	1,870.31	2,349.67	(20.4)
කොටසක තනුක ඉපැයුම් (රු.)		1,414.36	2,439.01	(42.0)	1,424.84	2,311.67	(38.4)
කොටසක ලාභාංශ (රු.)	18	1,075.52	1,734.64	(38.0)	1,075.52	1,734.64	(38.0)

පිටු අංක 160 සිට 302 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

විස්තීරණ ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව			සමූහය		
	2017 රු. '000	2016 රු. '000	වෙනස %	2017 රු. '000	2016 රු. '000	වෙනස %
වර්ෂය සඳහා ලාභය	**21,312,284**	**24,790,996**	**(14.0)**	**21,486,645**	**23,385,927**	**(8.1)**
වර්ෂය සඳහා වෙනත් විස්තීරණ ආදායම, බදු පසු						
ලාභයට හෝ පාඩුවට නැවත වර්ගීකරණය නොකරන අයිතමයන්						
ප්‍රත්‍යාගණන අතිරික්තයන්හි/(ඌණතාවයන්හි) වෙනස්වීම	6,059,715	1,394,640	334.5	6,406,248	2,307,452	177.6
ප්‍රත්‍යාගණන අතිරික්තයන්හි/ඌණතාවයන්හි වෙනස්වීම මත විලම්බිත බදු බලපෑම	(4,094,358)	–	–	(4,191,387)	(255,587)	1,539.9
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ/(පාඩු)	2,789,929	(1,621,904)	272.0	2,766,683	(1,580,561)	275.0
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මත ආයුගණක ලාභ/පාඩු මත විලම්බිත බදු බලපෑම	(8,400)	32,038	(126.2)	8,363	30,061	(72.2)
ලාභයට හෝ පාඩුවට නැවත වර්ගීකරණය නොකරන අයිතමයන්හි ශුද්ධ වෙනත් විස්තීරණ ආදායම	**4,746,886**	**(195,226)**	**2,531.5**	**4,989,907**	**501,365**	**895.3**
ලාභයට හෝ පාඩුවට නැවත වර්ගීකරණය කිරීමට හැකි අයිතමයන්						
විදේශීය මෙහෙයුම්වල මූල්‍ය වාර්තා පරිවර්තනයේ දී ඇතිවන ශුද්ධ විනිමය ලාභ/(පාඩු)	361,375	165,793	118.0	643,365	(228,067)	382.1
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන නැවත අගය කිරීමෙන් ලැබූ ලාභ/(පාඩු)	(595,034)	(1,025,760)	(42.0)	(619,591)	(957,182)	(35.3)
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන නැවත අගය කිරීමෙන් ලැබූ ලාභ/පාඩු මත විලම්බිත බදු බලපෑම	(177,006)	(8,893)	1,890.4	(177,006)	(8,893)	1,890.4
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන විකිණීමෙන් ලැබුණු ප්‍රතිලාභ ලාභයට හෝ පාඩුවට මාරු කිරීම	3,385	(15,525)	121.8	3,385	(15,525)	121.8
ආශ්‍රිත සමාගම්වල වෙනත් විස්තීරණ ආදායම් කොටස, බදු පසු	–	–	–	(6,600)	2,174	(403.6)
ලාභයට හෝ පාඩුවට නැවත වර්ගීකරණය කිරීමට හැකි අයිතමයන්හි ශුද්ධ වෙනත් විස්තීරණ ආදායම	**(407,280)**	**(884,385)**	**(53.9)**	**(156,447)**	**(1,207,493)**	**(87.0)**
වර්ෂයට අදාළ වෙනත් විස්තීරණ ආදායම, බදු පසු	**4,339,606**	**(1,079,611)**	**502.0**	**4,833,460**	**(706,128)**	**784.5**
වර්ෂයට අදාළ මුළු විස්තීරණ ආදායම	**25,651,890**	**23,711,385**	**8.2**	**26,320,105**	**22,679,799**	**16.1**
මුළු විස්තීරණ ආදායමෙන්:						
බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස	25,651,890	23,711,385	8.2	26,270,244	22,758,128	15.4
පාලනයට යටත් නොවන හිමිකම	–	–	–	49,861	(78,329)	163.7
වර්ෂයට අදාළ මුළු විස්තීරණ ආදායම	**25,651,890**	**23,711,385**	**8.2**	**26,320,105**	**22,679,799**	**16.1**

පිටු අංක 160 සිට 302 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට	සටහන	බැංකුව			සමූහය		
		2017 රු. '000	2016 රු. '000	වෙනස %	2017 රු. '000	2016 රු. '000	වෙනස %
වත්කම්							
මුදල් සහ මුදල් හා සමාන දෑ	20	72,843,108	67,705,791	7.6	78,005,362	73,244,043	6.5
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	21	68,689,012	56,387,741	21.8	68,689,012	56,387,741	21.8
බැංකුවල ඇති තැන්පතු	22	8,067,490	11,674,664	(30.9)	5,319,602	12,931,605	(58.9)
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	23	18,455,555	1,901,618	870.5	19,872,247	2,350,704	745.4
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	24	1,618,823	5,300,844	(69.5)	1,618,823	5,300,844	(69.5)
මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	25	8,359,274	8,474,041	(1.4)	8,596,548	8,804,647	(2.4)
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	26	213,167,048	191,874,638	11.1	214,349,624	191,984,082	11.6
ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම්	27	1,163,160,914	1,000,082,574	16.3	1,194,294,394	1,027,768,110	16.2
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	28	17,921,170	10,463,046	71.3	22,552,292	16,263,641	38.7
මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් දරා සිටින	29	308,256,082	243,178,400	26.8	308,750,317	243,253,967	26.9
පරිපාලිත සමාගම්වල ආයෝජන	30	6,513,048	6,213,048	4.8	–	–	–
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	31	92,988	92,988	–	446,793	420,669	6.2
ආයෝජන දේපල	32	2,882,928	3,000,000	(3.9)	123,773	127,670	(3.1)
දේපල, පිරියත හා උපකරණ	33	23,046,114	15,482,163	48.9	36,608,919	29,200,036	25.4
කල්බදු දේපල	34	101,481	101,839	(0.4)	134,441	136,155	(1.3)
අස්පෘශ්‍ය වත්කම්	35	810,730	563,490	43.9	1,074,436	655,630	63.9
විලම්බිත බදු වත්කම්	36	–	–	–	8,621	5,456	58.0
වෙනත් වත්කම්	37	37,818,188	46,794,389	(19.2)	38,964,979	47,721,701	(18.3)
මුළු වත්කම්		**1,951,803,953**	**1,669,291,274**	**16.9**	**1,999,410,183**	**1,716,556,701**	**16.5**
වගකීම්							
බැංකුවලට ගෙවිය යුතු	38	2,203,199	2,042,322	7.9	2,194,266	2,053,945	6.8
ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	39	44,487,462	59,424,629	(25.1)	44,628,686	58,925,801	(24.3)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	40	70,715	171,663	(58.8)	70,715	171,663	(58.8)
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	41	1,546,832,036	1,256,589,490	23.1	1,566,376,418	1,273,631,287	23.0
වෙනත් ණය ගැහිම්	42	178,191,089	195,469,853	(8.8)	184,330,181	204,485,301	(9.9)
නිකුත් කළ ණය සුරැකුම්පත්	43	–	3,427,058	(100.0)	5,667,514	8,360,333	(32.2)
ප්‍රවර්තන බදු වගකීම්		1,877,342	–	–	2,051,020	253,020	710.6
විලම්බිත බදු වගකීම්	36	5,820,329	1,439,285	304.4	8,625,219	4,078,734	111.5
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත	44	–	–	–	547,026	514,675	6.3
රක්ෂණ ප්‍රතිපාදන - ජීවිත නොවන	44	–	–	–	430,093	775,375	(44.5)
වෙනත් වගකීම්	45	18,596,249	19,231,833	(3.3)	19,936,478	21,656,513	(7.9)
යටත් කාලීන ණය	47	42,570,457	38,645,546	10.2	42,226,067	38,295,318	10.3
මුළු වගකීම්		**1,840,648,878**	**1,576,441,679**	**16.8**	**1,877,083,683**	**1,613,201,965**	**16.4**
ස්කන්ධය							
කොටස් ප්‍රාග්ධනය	48	20,000,000	15,000,000	33.3	20,000,000	15,000,000	33.3
ස්ථාවර සංචිත අරමුදල	49	10,427,000	7,996,000	30.4	10,427,000	7,996,000	30.4
රඳවාගත් ඉපැයුම්		63,472,250	54,154,685	17.2	65,100,871	55,659,003	17.0
වෙනත් සංචිත	50	17,255,825	15,698,910	9.9	25,871,254	23,820,288	8.6
බැංකුවේ කොටස්හිමියාට අයත් මුළු ස්කන්ධය		**111,155,075**	**92,849,595**	**19.7**	**121,399,125**	**102,475,291**	**18.5**
පාලනයට යටත් නොවන හිමිකම	51	–	–	–	927,375	879,445	5.4
මුළු ස්කන්ධය		**111,155,075**	**92,849,595**	**19.7**	**122,326,500**	**103,354,736**	**18.4**
මුළු වගකීම් සහ ස්කන්ධය		**1,951,803,953**	**1,669,291,274**	**16.9**	**1,999,410,183**	**1,716,556,701**	**16.5**
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	53	507,258,821	547,398,625	(7.3)	508,399,376	548,333,620	(7.3)
කොටසක ශුද්ධ වත්කම් වටිනාකම (රු.)	48	7,410.34	9,284.96	(20.2)	8,093.28	10,247.53	(21.0)

පිටු අංක 160 සිට 302 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය කරන බවට සහතික කරමි.

ඩබ් පී රසල් ගොන්සේකා
ප්‍රධාන මූල්‍ය නිලධාරී

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී,

රොනල්ඩ් සී පෙරේරා
සභාපති

රනෙල් ටී විජේසිංහ
අධ්‍යක්ෂ

සෙනරත් බණ්ඩාර
මහා කළමනාකරු

2018 මාර්තු 27
කොළඹ දීය.

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

බැංකුව

	සටහන	කොටස් ප්‍රාග්ධනය රු. '000	විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය රු. '000	ස්ථාවර සංචිත අරමුදල රු. '000
2016 ජනවාරි 1 දිනට ශේෂය		10,000,000	–	5,209,955
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම				
වර්ෂය සඳහා ලාභය		–	–	–
වෙනත් විස්තීරණ ආදායම, බදු පසු		–	–	–
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**–**	**–**	**–**
කෘජුව හිමිකමට හඳුනා ගත් කොටස්හිමියා සමග සිදුකළ ගනුදෙනු				
2016 සඳහා ලාභාංශ	18.3	–	–	–
වර්ෂය තුළ ප්‍රාග්ධනය සඳහා ලැබීම්		–	5,000,000	–
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	49	–	–	2,786,045
කොටස්හිමියා සමග සිදුකළ මුළු ගනුදෙනු		**–**	**5,000,000**	**2,786,045**
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය		**10,000,000**	**5,000,000**	**7,996,000**
2017 ජනවාරි 1 දිනට ශේෂය		10,000,000	5,000,000	7,996,000
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම				
වර්ෂය සඳහා ලාභය		–	–	–
වෙනත් විස්තීරණ ආදායම, බදු පසු		–	–	–
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**–**	**–**	**–**
කෘජුව හිමිකමට හඳුනාගත් කොටස්හිමියා සමග සිදුකළ ගනුදෙනු				
2017 සඳහා ලාභාංශ	18.3	–	–	–
කොටස් ප්‍රාග්ධනයට මාරු කිරීම	48.1	5,000,000	(5,000,000)	
වර්ෂය තුළ ප්‍රාග්ධනය සඳහා ලැබීම්		–	5,000,000	–
ඉවත් කරන ලද දේපල මත ප්‍රත්‍යාගණන අතිරික්තය		–	–	–
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	49	–	–	2,431,000
කොටස්හිමියා සමග සිදුකළ මුළු ගනුදෙනු		**5,000,000**	**–**	**2,431,000**
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය		**15,000,000**	**5,000,000**	**10,427,000**

පිටු අංක 160 සිට 302 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

	අනෙකුත් සංචිත			
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සඳහා සංචිතය	අනෙකුත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම්	මුළු හිමිකම
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
5,537,359	1,043,642	8,607,654	51,086,010	81,484,620
–	–	–	24,790,996	24,790,996
(1,050,178)	165,793	1,394,640	(1,589,866)	(1,079,611)
(1,050,178)	**165,793**	**1,394,640**	**23,201,130**	**23,711,385**
–	–	–	(17,346,410)	(17,346,410)
–	–	–	–	5,000,000
–	–	–	(2,786,045)	–
–	**–**	**–**	**(20,132,455)**	**(12,346,410)**
4,487,181	**1,209,435**	**10,002,294**	**54,154,685**	**92,849,595**
4,487,181	1,209,435	10,002,294	54,154,685	92,849,595
–	–	–	21,312,284	21,312,284
(768,655)	361,375	1,965,357	2,781,529	4,339,606
(768,655)	**361,375**	**1,965,357**	**24,093,813**	**25,651,890**
–	–	–	(12,346,410)	(12,346,410)
–	–	–	–	–
–	–	–	–	5,000,000
–	–	(1,162)	1,162	–
–	–	–	(2,431,000)	–
–	**–**	**(1,162)**	**(14,776,248)**	**(7,346,410)**
3,718,526	**1,570,810**	**11,966,489**	**63,472,250**	**111,155,075**

සමූහය

	සටහන	කොටස් ප්‍රාග්ධනය	විභජනය සඳහා පවතින ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල
		රු. '000	රු. '000	රු. '000
2016 ජනවාරි 1 දිනට ශේෂය		10,000,000	–	5,209,955
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම				
වර්ෂය සඳහා ලාභය		–	–	–
වෙනත් විස්තීරණ ආදායම, බදු පසු		–	–	–
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**–**	**–**	**–**
කෘජුව හිමිකමට හඳුනාගත් කොටස්හිමියන් සමග සිදුකළ ගනුදෙනු				
2016 සඳහා ලාභාංශ	18.3	–	–	–
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ පරිපාලිත ලාභාංශ		–	–	–
වර්ෂය තුළ ප්‍රාග්ධනය සඳහා ලැබීම්	48.1	–	5,000,000	–
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	49	–	–	2,786,045
වෙනත් සංචිතවලට පැවරුම්	50.5	–	–	–
කොටස්හිමියන් සමග සිදුකළ මුළු ගනුදෙනු		**–**	**5,000,000**	**2,786,045**
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය		**10,000,000**	**5,000,000**	**7,996,000**
2017 ජනවාරි 1 දිනට ශේෂය		10,000,000	5,000,000	7,996,000
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම				
වර්ෂය සඳහා ලාභය		–	–	–
වෙනත් විස්තීරණ ආදායම, බදු පසු		–	–	–
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**–**	**–**	**–**
කෘජුව හිමිකමට හඳුනාගත් කොටස්හිමියන් සමග සිදුකළ ගනුදෙනු				
2017 සඳහා ලාභාංශ	18.3	–	–	–
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ පරිපාලිත ලාභාංශ		–	–	–
කොටස් ප්‍රාග්ධනයට මාරු කිරීම		5,000,000	(5,000,000)	–
වර්ෂය තුළ ප්‍රාග්ධනය සඳහා ලැබීම්	48.1	–	5,000,000	–
ඉවත් කරන ලද දේපල මත ප්‍රත්‍යාගණන අතිරික්තය		–	–	–
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	49	–	–	2,431,000
වෙනත් සංචිතවලට පැවරුම්	50.5	–	–	–
කොටස්හිමියන් සමග සිදුකළ මුළු ගනුදෙනු		**5,000,000**	**–**	**2,431,000**
2017 දෙසැම්බර් 31 දිනට ශේෂය		**15,000,000**	**5,000,000**	**10,427,000**

පිටු අංක 160 සිට 302 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

බැංකුවේ කොටස්හිමියාට අදාළ කොටස					
අනෙකුත් සංචිත					
උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන සඳහා සංචිතය	අනෙකුත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ඉපැයුම්	පාලනයට යටත් නොවන හිමිකම	මුළු හිමිකම
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
6,539,515	1,956,800	14,469,008	53,888,295	1,010,640	93,074,213
–	–	–	23,496,656	(110,729)	23,385,927
(977,249)	(228,067)	2,025,051	(1,558,263)	32,400	(706,128)
(977,249)	**(228,067)**	**2,025,051**	**21,938,393**	**(78,329)**	**22,679,799**
–	–	–	(17,346,410)	–	(17,346,410)
–	–	–	–	(52,866)	(52,866)
–	–	–	–	–	5,000,000
–	–	–	(2,786,045)	–	–
–	35,230	–	(35,230)	–	–
–	**35,230**	**–**	**(20,167,685)**	**(52,866)**	**(12,399,276)**
5,562,266	**1,763,963**	**16,494,059**	**55,659,003**	**879,445**	**103,354,736**
5,562,266	1,763,963	16,494,059	55,659,003	879,445	103,354,736
–	–	–	21,470,163	16,482	21,486,645
(801,650)	643,365	2,188,368	2,769,998	33,379	4,833,460
(801,650)	**643,365**	**2,188,368**	**24,240,161**	**49,861**	**26,320,105**
–	–	–	(12,346,410)	–	(12,346,410)
–	–	–	–	(1,931)	(1,931)
–	–	–	–	–	–
–	–	–	–	–	5,000,000
–	–	(1,162)	1,162	–	–
–	–	–	(2,431,000)	–	–
–	22,045	–	(22,045)	–	–
–	**22,045**	**(1,162)**	**(14,798,293)**	**(1,931)**	**(7,348,341)**
4,760,616	**2,429,373**	**18,681,265**	**65,100,871**	**927,375**	**122,326,500**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව		සමූහය	
		2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
මෙහෙයුම් කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහ					
ආදායම් බද්දට පෙර ලාභය		30,342,980	31,188,685	30,815,563	30,117,032
ගැලපුම්:					
ශුද්ධ පොළී ආදායම	8	(58,356,192)	(53,957,488)	(61,490,102)	(56,606,492)
වෙළෙඳ සුරැකුම්පත් වෙනුවෙන් ලැබූ ලාභාංශ ආදායම	10	(111,783)	(113,674)	(120,214)	(126,801)
පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වලින් ලැබූ ලාභාංශ	12	(76,680)	(1,102,158)	–	–
ආශ්‍රිත සමාගම්වල (ලාභ)/පාඩු කොටස, බදු පසු	16	–	–	(52,024)	(62,952)
මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්	52.1	(176,623,016)	(160,667,438)	(177,474,266)	(163,958,901)
මෙහෙයුම් වගකීම්වල වෙනස්වීම්	52.2	304,162,970	131,411,796	306,329,345	134,895,340
බදු පෙර ලාභයේ ඇතුළත් මුදල් නොවන වෙනත් අයිතමයන්	52.3	10,872,287	3,832,099	12,102,838	4,890,843
ආයෝජන කටයුතුවලින් ලද වෙනත් ශුද්ධ ලාභ	11	(905,527)	(273,881)	(925,733)	(312,273)
		109,305,039	**(49,682,059)**	**109,185,407**	**(51,164,204)**
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් තුළින් ප්‍රතිලාභ ගෙවීම්		(6,976,625)	(6,427,894)	(6,994,516)	(6,469,307)
පොළී ලැබීම්		120,744,703	95,086,587	126,994,502	99,900,577
පොළී ගෙවීම්		(85,565,050)	(54,415,320)	(88,311,449)	(56,022,201)
ලාභාංශ ලැබීම්		111,783	113,674	120,214	126,801
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ/(යෙදවූ) ශුද්ධ මුදල්, බදු පෙර		**137,619,850**	**(15,325,012)**	**140,994,158**	**(13,628,334)**
ආදායම් බදු ගෙවීම්		(2,580,454)	(6,020,924)	(2,683,837)	(6,248,626)
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ/(යෙදවූ) ශුද්ධ මුදල්		**135,039,396**	**(21,345,936)**	**138,310,321**	**(19,876,960)**
ආයෝජන කටයුතු වලින් ලත් මුදල් ප්‍රවාහ					
කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ (වැඩිවීම)/අඩුවීම		(65,055,871)	3,105,015	(65,470,538)	3,090,334
උපලබ්ධිය සඳහා පවතින මුල්‍ය ආයෝජනයන්හි ශුද්ධ (වැඩිවීම)/අඩුවීම		(7,716,838)	624,947	(6,571,920)	(861,988)
ණය හා ලැබිය යුතු මූල්‍ය ආයෝජනයන්හි ශුද්ධ (වැඩිවීම)/අඩුවීම		(21,292,409)	40,686,630	(22,365,555)	41,019,663
ආශ්‍රිත සමාගමක් විකිණීමෙන් ලද මුදල්		–	3,880,000	–	3,880,000
දේපල, පිරියත, උපකරණ සහ කල්බදු දේපල අත්පත් කර ගැනීම්		(3,080,752)	(2,052,805)	(3,199,778)	(2,207,275)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම්		(528,565)	(376,643)	(764,014)	(390,549)
දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්		62,457	18,961	69,101	63,951
ලාභාංශ ලැබීම්		649,270	1,268,331	592,796	204,565
පොළී ලැබීම්		40,578,598	36,487,727	41,088,070	36,809,586
ආයෝජන කටයුතුවලින් ලැබූ/(යෙදවූ) ශුද්ධ මුදල්		**(56,384,110)**	**83,642,163**	**(56,621,838)**	**81,608,287**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	බැංකුව		සමූහය	
		2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහයන්					
වෙනත් ණයට ගැනීම්වල ශුද්ධ අඩුවීම		(49,653,199)	(42,090,586)	(52,901,368)	(38,650,060)
කොටස් නිකුතුවෙන් ලද මුදල්		5,000,000	5,000,000	5,000,000	5,000,000
ණයකර නිකුතුවෙන් ලද මුදල්		10,000,000	8,000,000	12,000,000	7,990,000
ණයකර නිදහස් කිරීම සඳහා ගෙවූ මුදල්		(9,501,723)	(5,032,015)	(10,867,381)	(5,368,253)
බැංකුවේ කොටස්හිමියාට ගෙවූ ලාභාංශ		(12,346,410)	(18,346,410)	(12,346,410)	(18,346,410)
පාලනයට යටත් නොවන හිමිකම සඳහා ගෙවූ ලාභාංශ		–	–	(1,931)	(52,866)
ණය ගැනීම් හා ණය සුරැකුම්පත් සඳහා පොළී ගෙවීම්		(17,320,884)	(21,458,109)	(18,093,765)	(22,211,745)
මූල්‍ය කටයුතුවලට යෙදවූ ශුද්ධ මුදල්		**(73,822,216)**	**(73,927,120)**	**(77,210,855)**	**(71,639,334)**
වර්ෂය තුළදී මුදල් සහ මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		4,833,070	(11,630,893)	4,477,628	(9,908,007)
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		66,898,438	78,529,331	72,425,067	82,333,074
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		**71,731,508**	**66,898,438**	**76,902,695**	**72,425,067**
මුදල් සහ මුදල් හා සමාන දෑ විශ්ලේෂණය					
මුදල් සහ මුදල් හා සමාන දෑ	20	72,843,108	67,705,791	78,005,362	73,244,043
බැංකු අයිරා	38	(1,111,600)	(807,353)	(1,102,667)	(818,976)
වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන දෑ		**71,731,508**	**66,898,438**	**76,902,695**	**72,425,067**

පිටු අංක 160 සිට 302 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 වාර්තාකරණ ඒකකය

1.1 ආයතනික තොරතුරු

ලංකා බැංකුව ("බැංකුව"), 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත යටතේ 1939 අගෝස්තු 1 දින ශ්‍රී ලංකාව තුළ ප්‍රතිෂ්ඨාපිත රාජ්‍ය බැංකුවකි. 1988 අංක 30 දරණ බැංකු පනත හා ඒ හා අනුෂාංගික සංශෝධනවලට යටත්වන ලෙස ස්ථාපිත කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. ලංකා බැංකුවේ ලියාපදිංචි කාර්යාලය ශ්‍රී ලංකාවේ, කොළඹ 01, ලංකා බැංකු මාවත, ලංකා බැංකු චතුරස්‍රයෙහි අංක 01 දරණ ස්ථානයේ පිහිටා ඇත. ලංකා බැංකුව නිකුත් කර ඇති ණයකර කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇති අතර ඇමරිකානු ඩොලර් මිලියන 500 ක් වටිනා ජාත්‍යන්තර බැඳුම්කර සිංගප්පූරුවෙහි කොටස් වෙළඳපොලෙහි ලැයිස්තුගත කර ඇත. 2017 දෙසැම්බර් 31 දිනට සේවකයින් 7,587 ක් ලංකා බැංකුවෙහි සේවයේ නියුක්තව සිටියහ. (2016 දෙසැම්බර් 31 දිනට එම ප්‍රමාණය 7,569 කි.)

1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2017 දෙසැම්බර් 31 දිනට හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන බැංකුව, ඊට අයත් වන පරිපාලිතයන් (බැංකුව සහ එහි පරිපාලිතයන්ගේ එකතුව සමූහය සහ තනිව ගත් කල සමූහ ආයතන ලෙස හැඳින්වේ) සහ ආශ්‍රිත සමාගම්වල සමූහයට ඇති අයිතිවාසිකම් අයත් වන ආකාරයට සකස් කර ඉදිරිපත් කර ඇත. සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම සහ සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම හැර සමූහයේ අනෙකුත් සමාගම්වල ගිණුම් වර්ෂය දෙසැම්බර් 31 න් අවසන් වේ. සමූහයේ පරම මව් සමාගම බැංකුව වේ.

1.3 ප්‍රධාන ක්‍රියාකාරකම්

1.3.1 බැංකුව

ගෙවුණු වර්ෂය තුළ බැංකුව නිරත වූ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස පුද්ගලික බැංකුකරණය, ආයතනික බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, අක්වෙරළ බැංකු කටයුතු, වෙළඳ මූල්‍ය, කල්බදුකරණය, ප්‍රාථමික වෙළඳ කටයුතු, ආයෝජන බැංකුකරණය සහ භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත ආයතන සහ මුදල් ප්‍රේෂණ, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, උකස් සේවා, ණයපත් පහසුකම්, විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු සහ වෙනත් මූල්‍ය සේවාවන් හැඳින්විය හැකිය.

1.3.2 පරිපාලිතයන්

ලංකා බැංකුවේ පරිපාලිතයන්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත:

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී	ලංකා බැංකු ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ අයිතිය, පාලනය, නඩත්තු කිරීම හා උපයෝගිතාවය රඳවා ගැනීම.
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී	කල්බදුකරණය සහ කුලී පිට ගනුදෙනු, සංස්ථාපිත හා සිල්ලර ණය, සංස්ථාපිත වෙළඳ මූල්‍ය උපදේශක සේවා, ප්‍රාග්ධන වෙළඳපොල ක්‍රියාකාරකම්, ආන්තික වෙළඳාම සහ ක්ෂුද්‍ර මූල්‍යනය, කෘෂිකාර්මික ණය පහසුකම් සැපයීම, දේපල ආශ්‍රිත සේවා, උකස් සේවා සහ නැන්පතු බාර ගැනීම.
සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම	ක්‍රියාකාරිත්වයේ නොමැති අතර ඈවර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.
සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම	කොළඹ 03 බී ඕ සී මර්චන්ට් ටවර් හි සහ මහනුවර සීබෑන්ක් හවුස් හි කාර්යාල නඩත්තුව සහ ඉඩ පහසුකම් කුලියට දීම.
සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක සේවා සම්බන්ධ කටයුතුවල නිරතවීම.
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම	හෝටල් සේවා සැපයීම.
සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක සහ ආගන්තුක නිවහන් පහසුකම් පවත්වාගෙන යාම.
සී/ස එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් සමාගම	ජීවිත සහ පොදු රක්ෂණ සේවා සැපයීම.
සී/ස කොළදෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම	ජල විදුලි උත්පාදනය.
ලංකා බැංකුව (යූ කේ) සමාගම	එක්සත් රාජධානියේ මූල්‍ය සේවා අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති, සිල්ලර සහ ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, නියෝජිත බැංකු සේවා සහ වෙළඳ මූල්‍යන සේවා සැපයීමේ නිරතව සිටී.

1.3.3 ආශ්‍රිතයන්

ලංකා බැංකුවේ ආශ්‍රිත සමාගම්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත:

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	ඒකක භාර අරමුදල් සහ පෞද්ගලික ආයෝජන කළඹයන් කළමනාකරණය
සී/ස ලංකා සික්‍යුරිටීස් (පෞද්ගලික) සමාගම	ලියාපදිංචි කොටස් තැරැව්කරුවෙකු වන අතර ස්කන්ධ ගනුදෙනු, ණය ගනුදෙනු සහ ආන්තික ගනුදෙනුවල යෙදේ
සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම	දේපල කුලියට දීම
සී/ස සදර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම	ක්‍රියාකාරිත්වයේ නොමැති අතර ඈවර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත

අදාළ වර්ෂය තුළ දී බැංකුවේ, පරිපාලිතයන් හි සහ ආශ්‍රිතයන්හි මූලික ක්‍රියාකාරකම්වල ස්වභාවයන්හි සැලකිය යුතු වෙනසක් සිදු වී නැත. සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම, 2007 වසරේ සිට සිය මූලික ව්‍යාපාර කටයුතු කර නැති අතර සමාගම ඈවර කිරීම සඳහා බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කර ඇත.

සී/ස සඳර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම ක්‍රියාකාරිත්වයේ නොමැති අතර සමාගමේ අධ්‍යක්ෂකවරුන් විසින් සමාගම ඈවර කිරීමට තීරණය කර ඈවර කිරීමේ ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

2.1 මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම

1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්හි ප්‍රතිපාදන, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව, බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි හා ආශ්‍රිතයන්හි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

මෙම මූල්‍ය ප්‍රකාශ පහත ප්‍රකාශනයන්ගෙන් සමන්විත වේ.

- ලාභ හෝ පාඩු ප්‍රකාශනය
- විස්තීරණ ආදායම් ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.2 මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 මාර්තු 27 වන දින අනුමත කරන ලදී.

3 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

3.1 අනුකූලතා ප්‍රකාශය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී ලං.මූ.වා.ප්‍ර.) හා ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ලං.ගි.ප්‍ර.) වලින් සමන්විත වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇත. ලංකා බැංකු ආඥා පනතට, 1988 අංක 30 දරණ බැංකු පනතට සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර හා වාර්තා කර ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විස්තර කෙරෙන පරිදි සමූහයේ මූල්‍ය ප්‍රකාශ 2017 දෙසැම්බර් 31 වැනි දිනට බලපැවැත්වෙන ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. සහ ලං.ගි.ප්‍ර. වලට අනුකූල වන පරිදි පිළියෙල කර ඇති අතර ඒ සමඟ සංසන්දනාත්මක වර්ෂය වන 2016 දෙසැම්බර් 31 වැනි දිනට සහ දිනෙන් අවසන් වන වර්ෂය සඳහා දත්ත ඉදිරිපත් කර ඇත.

3.2 මිනුම්කරණයේ පදනම

පහත සඳහන් ඒවා හැරුණු විට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සංගතතා පදනමට ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත:

- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සාධාරණ අගය මත මැනීම. (සටහන් අංක 24 සහ 40)
- වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින මූල්‍ය උපකරණ සාධාරණ අගය මත මැනීම. (සටහන් අංක 25)
- මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින සාධාරණ අගය මත මැනීම. (සටහන් අංක 28)
- අයිතිකරු විසින් පදිංචි සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අගයේ එනම් ප්‍රත්‍යාගණනය කළ දිනට පැවති සාධාරණ අගයෙන් පසු කාලීන සමුච්චිත ක්ෂය හා පසු කාලීන සමුච්චිත හානිකරණ අලාභ වේ නම් ඒ සඳහා වෙන්කිරීම් අඩු කළ අගයට වාර්තා කෙරේ. (සටහන් අංක 33)
- නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් ආයුගණකවරයෙකු විසින් තක්සේරු කර වර්තමාන අගය මත හඳුනාගත් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වලින් සැළසුම්ගත වත්කම්වල සාධාරණ අගය අඩු කරනු ලැබේ. (සටහන් අංක 46)

මූල්‍ය ප්‍රකාශවලට බලපාන්නා වූ උද්ධමනකාරී සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නැත.

3.3 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

බැංකුවේ හා සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ඇති අයිතමය එම අයිතමයේ ස්වභාවය අනුව කාණ්ඩ ගතකර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය හා කල්පිරීමේ කාලය අනුව පෙළ ගස්වා ඉදිරිපත් කරනු ලැබේ. වාර්තාකරණ දිනයේ සිට මාස 12 ඇතුලත කල් පිරෙන (ජංගම) හා මාස 12 ක් පසුව කල්පිරෙන (ජංගම නොවන) වත්කම් හා වගකීම් පිළිබඳ විස්තරයක් සටහන් අංක 56 හි අන්තර්ගත වේ.

3.3.1 ව්‍යවහාර හා වාර්තාකරණ මුදල් ඒකක

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් අයිතමයන් මිනුම්කරණය හා වාර්තාකරණය කරනු ලබන්නේ බැංකුව ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය තුළ පවතින මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සමූහයේ ව්‍යවහාර මෙන්ම වාර්තාකරණ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් වන අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

3.3.2 උපචිත පදනම් මත ගිණුම්කරණය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය හැරුනු කොට අනෙකුත් මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම මත පිළියෙල කර ඉදිරිපත් කර ඇත.

3.3.3 හිලව් කිරීම

සාමාන්‍යයෙන් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ මූල්‍ය වත්කම් හා වගකීම් වෙන් වෙන් වශයෙන් වාර්තා කරන අතර මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කිරීම, ශුද්ධ වටිනාකමට වාර්තා කිරීම සිදුවන්නේ නීතිමය වශයෙන් බලය ලබාදී ඇති විටක සහ පහත සඳහන් අවස්ථාවල දී සම්බන්ධ පාර්ශවයන් විසින් එකවිටම වත්කම් උපලබ්ධිය මගින් වගකීම් පියවා ගැනීමේ අදහස් ඇති විට පමණක් වේ.

- සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු අතර
- ණය පැහැර හැර ඇති අවස්ථාවක දී
- බැංකුවට සහ එහි පාර්ශවයන්ට වගකීම් පියවීමට නොහැකි අවස්ථාවන්හි හෝ බුන්වත් අවස්ථා වල දී

ගිණුම්කරණ ප්‍රමිතයක් මගින් ඉඩ සලසා ඇති අවස්ථාවල දී හෝ අර්ථ නිරූපනය කර ඇති විටක සහ විශේෂයෙන් සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ගේ සඳහන් කර ඇති විටක පමණක් ඒකාබද්ධ ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ සඳහන් ආදායම් සහ වියදම් හිලව් කරනු ලැබේ.

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලං.ගි.ප්‍ර. 07 "මුදල් ප්‍රවාහ ප්‍රකාශනය" ට අනුව "චතු ක්‍රමය" අනුව පිළියෙල කරනු ලැබේ. මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් ප්‍රවාහයන් ලබා ගනු ලබන්නේ ලාභයට ගැලපුම් කිරීමෙනි. මුදල් හා මුදල් සමාන දෑ ලෙස ඇතුලත් වන්නේ අතැති මුදල් හා අත්පත් කර ගන්නා දිනයේ දී කල්පිරෙන කාලය දින හතකට වඩා අඩු, වැඩි ද්‍රවශීලතාවයකින් යුතු කෙටි කාලීන ආයෝජනයන්ය.

3.3.4 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට අවශ්‍ය අවස්ථා හිදී පෙර වර්ෂයේ මූල්‍ය තොරතුරු විස්තරාත්මකව දක්වා ඇත. ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කිරීමට සමගාමිව පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන අතර ප්‍රවර්ථන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම් වලට අනුකූලව පෙර වර්ෂයේ මූල්‍ය තොරතුරු නැවත වර්ගීකරනය කරනු ලැබේ.

3.3.5 ප්‍රමාණාත්මකභාවය සහ ඒකරාශි කිරීම

ලං.ගි.ප්‍ර. 01 - "මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමට" අනුකූලව, සමාන අයිතමයන්ගේ සෑම ප්‍රමාණාත්මක වර්ගයක්ම මූල්‍ය ප්‍රකාශවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. ප්‍රමාණාත්මක විවිධ ස්වභාවයේ අසමාන අයිතමයන් හෝ කාර්යයන් ද වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

3.3.6 වැටයීම

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී වෙනත් අයුරකින් සඳහන් කර නොමැති විටෙක සියලුම අගයන් ආසන්නම රුපියල් දහස දක්වා වන පරිදි වටයා ඇත.

3.3.7 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්ගේ භාවිතය

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී ඒ සඳහා භාවිතා කළ යුතු සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති, තීරණය කිරීම හා වාර්තා වන වත්කම් සහ වගකීම් අගයන් මෙන්ම ආදායම් සහ වියදම් නිශ්චය කිරීමේ දී ඒ සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් නිශ්චය කිරීමට කළමනාකාරිත්වයට සිදුවේ. සැබෑ ප්‍රතිඵලය ඇස්තමේන්තු සමඟ වෙනස් විය හැක.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් අතීත අත්දැකීම් සහ විවිධ අවස්ථාවන් මත සෑහීමකට පත්විය හැකි සාධක මත පදනම් වන අතර මේවා කාලීන පදනමක් මත සමාලෝචනයට භාජනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සමාලෝචනයේ දී ඒවා පිළිබඳව සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම් සමාලෝචනයට භාජනය කෙරෙන වර්ෂය තුළ දී සහ අනාගත කාලපරිච්ඡේදයන් සඳහා එම සංශෝධනයන් අදාළ වන පරිදි ගිණුම්ගත කෙරේ.

සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් අනුගමනය කිරීමේ දී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල වඩා වැදගත් බලපෑමක් ඇති කරන්නා වූ අගයන් මත කළමනාකරණය විසින් පහත සඳහන් විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් භාවිතා කර ඇත.

3.3.7.1 අබණ්ඩ පැවැත්ම

තම මෙහෙයුම් කටයුතු අබණ්ඩව පවත්වාගෙන යාමට හැකි බවට සෑහීමකට පත්විය හැකි සම්පත්, සමූහය සතු බව කළමනාකාරිත්වය උපකල්පනය කරයි. තවද සමූහයෙහි අබණ්ඩ පැවැත්ම පිළිබඳව සැළකිය යුතු අවිශ්වාසයක් සහ අවිනිශ්චිතතාවයක් කළමනාකාරිත්වය හඳුනාගෙන නොමැත. එම නිසා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී සමූහය අබණ්ඩව පවතීය යන සංකල්පය භාවිතා කර ඇත.

3.3.7.2 බැඳීම් සහ අසම්භාව්‍ය වගකීම්

සියළුම දැනගත හැකි සහ මැනිය හැකි වගකීම් හි වටිනාකම් ගිණුම් තබනු ලැබේ. අසම්භාව්‍ය වගකීම් යනු අනාගත අවිනිශ්චිත සිදුවීම්වල තහවුරු කිරීමක් මත ඇතිවිය හැකි බැඳියාවක් හෝ වර්තමානයේ බැඳීමක් ඇතත් ආර්ථික ප්‍රතිලාභයන් ගලා යාමේ නම්‍යතාවක් නොමැති හෝ විශ්වසනීය ලෙස මැනිය නොහැකි වගකීමය. අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර, ඒවායේ සිදුවිය හැකි බව දුරස්ථ නොවන්නේ නම් අනාවරණය කිරීමක් කෙරේ.

3.3.7.3 සාධාරණ අගය මත මූල්‍ය උපකරණ

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තාවන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළඳපොලෙන් ලබා ගත නොහැකි අවස්ථාවල ඒවා නොයෙකුත් ගණිතමය ආකෘතියන් පදනම් කරගත් තක්සේරු ශිල්ප ක්‍රමයක් භාවිතා කර ලබා ගනු ලැබේ. මෙම ආකෘතීන් සඳහා අවශ්‍ය යෙදවුම් සොයාගනු ලබන්නේ හැකි උපරිම අයුරින් වෙළඳපොල නිරීක්ෂණය කිරීමෙනි. කෙසේ වෙතත් මේ සඳහා දත්ත නොමැති විට යොදා ගන්නා නිරීක්ෂණය කළ නොහැකි දත්තවල බලපෑම අවම වන පරිදි විනිශ්චයන් මත සාධාරණ අගය ගණනය කරනු ලැබේ. මූල්‍ය උපකරණ සාධාරණ අගයට ගණනය කිරීමේ ක්‍රමවේදය මූල්‍ය සටහන් 59 මගින් විස්තර කර ඇත.

3.3.7.4 ණය සහ අත්තිකාරම් සඳහා හානිකරණ අලාභ

වාර්ථා කරන දිනට ණය හා අත්තිකාරම් වල හා හානිකරණ අලාභය ගණනය කිරීමට කළමනාකාරිත්වය විසින් ප්‍රශස්ථ ලෙස ඇස්තමේන්තු සකස් කරනු ලැබේ.

සමූහය විසින් නිරීක්ෂණය කරනු ලබන කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය සහ අත්තිකාරම් වාර්තාකරණ දිනයට අගයකර ඒ සඳහා හානිකරණ අලාභයක් ඇත්නම් ඒවා ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ වාර්තා කරනු ලබයි. හානිකරණ අලාභය තීරණය කිරීමේ දී උපකල්පන සහ අනාගත මුදල් ප්‍රවාහයන්වල කාලය නිශ්චය කරන විට නිශ්චිත කළමනාකරණ විනිශ්චයන් අවශ්‍ය වේ. මෙම විනිශ්චයන් සාධක කිපයක් පදනම් කරගත් උපකල්පනයන්ගෙන් යුක්ත වන නිසා එය සැබෑ නත්ත්වය සමග වෙනස් වන බැවින් අනාගත ප්‍රතිපාදන ද එහි ප්‍රතිඵලයක් වශයෙන් වෙනස් විය හැක.

ණය සහ අත්තිකාරම් කේවල වශයෙන් තක්සේරුකර හානිකරණයක් නොමැති බව හඳුනාගත් විට සහ කේවල වශයෙන් ප්‍රමාණාත්මක නොවන ණය සහ අත්තිකාරම් සාමූහිකව තක්සේරු කර දරන ලද අලාභ සිදුවීම් සඳහා විෂයබද්ධ සාධක ඇතිවිට ඒ මත පදනම්ව ඒ හා සමාන අවදානම් ලක්ෂණ ඇති සාමූහික වත්කම් සඳහා ප්‍රතිපාදන නිර්ණය කල යුතුය. සාමූහික තක්සේරුව සඳහා අවශ්‍ය දත්ත ගනු ලබන්නේ ණය කළඹ මගින් (ඒවා නම් ණය වර්ගය, හිඟ වාරික මට්ටම යනාදිය) සහ අවදානම් ඒකරාශීවීමේ බලපෑම සඳහා උපකල්පනයන් සමග ආර්ථික දත්ත (විරැකියා මට්ටම, දේපල වෙළඳාම් මිල දත්තයන්, රටේ අවදානම සහ එක් එක් සමූහයන්ගේ ක්‍රියාකාරිත්වයේ වෙනස්වීම්) උපයෝගී කරගනිමින්ය. ණය හා අත්තිකාරම් හානිකරණයට අදාළ විස්තර සටහන් අංක 27 හි දක්වා ඇත.

3.3.7.5 උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන හානිකරණය

සමූහය විසින් උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන ලෙස වර්ග කර ඇති ණය සුරැකුම්පත් හානිකරණයට ලක් වී දැයි නිරීක්ෂණය කර අගය කරනු ලැබේ.

සමූහය විසින් උපලබ්ධිය සඳහා පවතින ස්කන්ධ ආයෝජනවල පිරිවැයට වඩා සාධාරණ අගය සැළකිය යුතු හෝ දිගුකාලීනව ඇතිවන අඩුවීමක් ඇතිවිට ඒ සඳහා හානිකරණ වියදම් වාර්තා කරනු ලැබේ. සැළකිය යුතු හෝ දිගුකාලීන යන්න නිර්ණය කිරීමට විනිශ්චයක් අවශ්‍ය වේ. මෙම විනිශ්චයන් ගැනීමේ දී අනෙකුත් සාධක අතර පෙර කාලීන කොටස් මිලෙහි චලනයන්, සාධාරණ අගයට වඩා ධාරණ අගය අඩු වූ විට එම සාධකය පැවති කාලය සහ අගයන් දෙක අතර පරතරයේ පරාසය යන කරුණු ද සමූහය විසින් අගයනු ලැබේ. උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය වත්කම් හානිකරණයට අදාළ විස්තර සටහන් අංක 28 යටතේ දක්වා ඇත.

3.3.7.6 පරිපාලිත සමාගම්වල ආයෝජනයන්හි හානිකරණය සහ වෙනත් මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් සඳහා හානිකරණය

ආයෝජනයක් හෝ මූල්‍ය වත්කමක් හානිකරණයට ලක්වේදැයි සලකා බැලීම සඳහා බැංකුව සහ සමූහය විසින් ලං.ගි.ප්‍ර. 36 "වත්කම් සඳහා හානිකරණය" හා ලං.ගි.ප්‍ර. 39 "මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මැනීම" ප්‍රමිතයන්හි දී ඇති උපදෙස් අනුගමනය කරයි. වත්කමක අගයට වඩා අයකර ගත හැකි වටිනාකම අඩු වේ නම් හානිකරණයන් ඇති වන අතර එම හානිකරණය නිරණය කිරීම හා මැනීම සඳහා අදාළ බාහිර හා අභ්‍යන්තර පරිසරය මගින් ලබා දෙන සංඥා හඳුනා ගත යුතු වේ. එම සංඥා හඳුනා ගැනීමට සහ හානිකරණ වටිනාකම නිරණය කිරීම සඳහා ආසන්න ව්‍යාපාරික පරිසරය විශ්ලේෂණය කිරීම සහ අදාළ වන ව්‍යාපාර බණ්ඩයේ මූල්‍ය පරිසරයේ ස්වාභාවය, කර්මාන්ත, තාක්ෂණය සහ මෙහෙයුම් පරිසරය වෙනස් වීම යන සාධක අනාගත මුදල් ප්‍රවාහය සමඟ විශ්ලේෂණය කළ යුතු වේ. මෙම ක්‍රියාවලිය සඳහා සැළකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන් උපකාරී වේ. මෙම ගිණුම්කරණ විනිශ්චයන් ඒ ඒ අදාළ සටහන්වල දක්වා ඇත.

3.3.7.7 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මත වගකීම්

ආයුගණක තක්සේරු යොදා ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම සැලැසුම් සහ අනෙකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් හි පිරිවැය නිර්ණය කරනු ලබයි. ආයුගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාත, සැලසුම් වත්කම් මත අපේක්ෂිත අනුපාතය, අනාගත වැටුප් වැඩිවීම්, මරණ අනුපාතය සහ අනාගත විශ්‍රාම වැඩිවීම යන උපකල්පන භාවිතා කරනු ලැබේ. මෙම සැලසුම් දිගු කාලීන ස්වභාවයක් ගන්නා බැවින් මෙම ඇස්තමේන්තු අවිනිශ්චිත ස්වභාවයක් ගනු ඇත. සියලුම උපකල්පන සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරන අතර වර්ෂය තුළ භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 46 හි දක්වා ඇත.

3.3.7.8 ඉඩම් සහ ගොඩනැගිලිවල සාධාරණ අගය

සමූහයේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි සහ කල්බදු ඉඩම් මත ඇති ගොඩනැගිලි සාධාරණ අගය මත සටහන් කරනු ලැබේ. ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 13 "සාධාරණ අගය මිනුම්කරණය" අනුව, දේපල වල සාධාරණ අගය නිර්ණය කිරීම සඳහා සමූහය විශේෂඥ ස්වාධීන තක්සේරුකරුවන් යොදවනු ලැබේ. නිදහස් අයිතිය සහිත ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු අයිතිය සහිත ඉඩම් මත ගොඩනැගිලි තක්සේරුවට අදාළ විස්තර සටහන් 33 හි දක්වා ඇත.

3.3.7.9 දේපල, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල ඵලදායි ජීවිත කාලය

දේපල, පිරියත සහ උපකරණවල සුන්බුන් අගය, ඵලදායී ජීවිතකාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදයන් සෑම වාර්තා කරන දිනයකදීම සමූහය විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම තක්සේරු කිරීම් සඳහා කළමනාකරණය විසින් විවිධ ප්‍රභවයන්, අගයන් සහ ක්‍රමවේදයන් යොදාගනු ලබන බැවින් එම විනිශ්චයන් යම් අවිනිශ්චිතතාවයකට භාජනය විය හැක. එක් එක් වත්කම් බණ්ඩය සඳහා යොදා ගත් ක්ෂය කිරීමේ ක්‍රමවේදය සහ ක්ෂය අනුපාතයන් සටහන් 33 හි දක්වා ඇත.

3.3.7.10 ආයෝජන දේපල වර්ග කිරීම

ආයෝජන දේපලක් ලෙස සුදුසුකම් ලැබීම නිර්ණය කිරීම සඳහා කළමනාකරණ විනිශ්චයක් අවශ්‍ය වේ. බදු කුලී ලබා ගැනීම සඳහා හෝ ප්‍රාග්ධන අගය වැඩි කිරීම හෝ ඒ අරමුණු දෙකම සඳහා පවත්වා ගනු ලබන දේපල තුළින්, සමූහය පවත්වාගෙන යනු ලබන අනෙකුත් වත්කම්වලින් ස්වාධීනව විශාල මුදල් ප්‍රවාහයක් ජනනය කරනු ලබයි නම් එම දේපල ආයෝජන දේපලක් ලෙස නිර්ණය කෙරේ. අනෙක් අතට මෙහෙයුම් කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන හෝ සේවා සැපයීමේ ක්‍රියාවලියේ යොදාගන්නා හෝ පරිපාලන අරමුණින් පවත්වාගෙන යනු ලබන එක එල්ලේ මුදල් ප්‍රවාහ ජනනය කරනු නොලබන වත්කම්, දේපල පිරියත සහ උපකරණ ලෙස නිර්ණය කරනු ලැබේ.

3.3.7.11 බදුකරණය

සමූහය විසින් ආදායම් බදු සහ මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බද්ද සහ ජාතිය ගොඩනැගීමේ බද්ද ඇතුළුව අනෙකුත් බදු ගෙවිය යුතුවේ.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන කාලය තුළ අදාළ වන්නා වූ බදු නීතිරීතිවල හා එම නීති අර්ථ නිරූපනය කරන ආකාරයෙන් ඇති අවිනිශ්චිතතාවයන් නිසා ආදායම් බදු වගකීම හා විලම්බිත බදු වගකීමට අදාළ වෙන් කිරීම් සඳහා ගිණුම්කරණ විනිශ්චයන් යොදා ගත යුතු වේ. අදාළ බදු අනුපාතයන් සහ බදුකරණයට අදාළ වෙනත් තොරතුරු සටහන් 17 සහ 36 යටතේ දක්වා ඇත.

පැවරුම් මිල රෙගුලාසීන්ට සමූහය යටත් වන අතර මෙවැනි ගනුදෙනුවල බලපෑම නිරණය කිරීම සඳහා කළමනාකරණ විනිශ්චය භාවිතා කිරීම අවශ්‍ය වේ. ආශ්‍රිත ගැණුම්, සාධාරණ මිල නිරණය කිරීම සහ සුදුසු මිල ගණන් තෝරා ගැනීම ඇතුළුව පැවරුම් මිල රෙගුලාසිවලට අනුකූල වීම සඳහා එහි බලපෑම නිරණය කිරීමට අවශ්‍ය අවස්ථාවල දී මෙම කළමනාකරණ විනිශ්චයන් භාවිතා කරන ලදී. ප්‍රවර්තන බදු වියදම තුළ මෙම විනිශ්චයන් ඇතුළත් වේ. ඇස්තමේන්තු කරන ලද ආදායම් බදු වියදම හා සත්‍ය බදු ගෙවීම අතර වෙනසට හේතු වන්නේ කළමනාකාරිත්වයේ බදු සම්බන්ධ අර්ථ දැක්වීමේ වෙනස්කම් හා පැවරුම් මිල රෙගුලාසි භාවිතා කිරීමෙන් ඇති වූ වෙනසයි.

4 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

බැංකුව සහ සමූහය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදාගන්නා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දැක් වේ. විශේෂයෙන් සඳහන් වන අවස්ථාවක දී හැර අන් සෑම විටකම පහත සඳහන් සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේ දී සෑම කාලපරිච්ඡේදයක් සඳහාම අඛණ්ඩව භාවිතා කර ඇත. සමූහය විසින් භාවිතා කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති විස්තරාත්මකව අදාල සටහන් තුළ සඳහන් කර ඇත.

4.1 ඒකාබද්ධ කිරීමේ පදනම

ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 10 - "ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ" සහ ලං.ගි.ප්‍ර. 27 "ඒකාබද්ධ සහ කේවල මූල්‍ය ප්‍රකාශ" අනුව බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශ ඒකාබද්ධ කර සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත. ලං.ගි.ප්‍ර. 28 "ආශ්‍රිතයන් සහ ඒකාබද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන" අනුව ආශ්‍රිත සමාගම් වල ලාභ හා ශුද්ධ වත්කම් අයත් ප්‍රමාණය හා පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබයි.

දේශීය බැංකු අංශයේ, අක්වෙරළ බැංකු අංශයේ සහ අන්තර්ජාතික ගනුදෙනු අංශයේ ඒකාබද්ධ කරන ලද මූල්‍ය ප්‍රකාශනවලින් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සමන්විත වේ.

පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් 30 හා 31 යටතේ දක්වා ඇත.

4.1.1 ව්‍යාපාර සංයෝජනය

සමූහය ශ්‍රී ලං.මූ.වා.ප්‍ර. 3 "ව්‍යාපාර සංයෝජනය" හි නිර්වචනයට අනුකූලව ගනුදෙනුව හෝ වෙනත් සිද්ධියක් ව්‍යාපාරයක්ද යන වග නිර්නය කරනු ලැබේ. ඒ අනුව ව්‍යාපාර කටයුත්තක් සඳහා දේපල අත්පත් කරගැනීම සහ වගකීම් භාර ගැනීම අත්‍යවශ්‍ය වේ. අත්පත් කර ගැනීමේ ක්‍රමය මඟින් ව්‍යාපාර සංයෝජනය ගණනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ දිනයේ දී පාලනයට යටත්නොවන හිමිකම ගණනය කරනු ලබන්නේ සාධාරණ අගය මත හෝ ආයෝජකයාගේ හඳුනාගත් ශුද්ධ වත්කම්වල පාලනයට යටත්නොවන හිමිකමට සමානුපාත කොටසෙනි.

අත්පත් කර ගැනීම සම්බන්ධිත වියදම යනු ව්‍යාපාර සංයෝජනයේ දී අත්පත් කරනු ලබන්නා විසින් දරන ලද වියදම් වේ. එම වියදම්වල අඩංගු වන්නේ තැරැව්කාර ගාස්තු, උපදේශක, නීති, ගිණුම්කරණ, ඇස්තමේන්තු සහ අනෙකුත් වෘත්තිමය නීති උපදේශන ගාස්තු, සාමාන්‍ය පරිපාලන වියදම්, අභ්‍යන්තර දෙපාර්තමේන්තු අත්පත් කරගැනීමේ සහ පවත්වා ගැනීමේ වියදම් සහ ණය සහ ස්කන්ධ සුරැකුම්පත් ලියාපදිංචි කිරීමේ සහ නිකුත් කිරීමේ වියදම්ය. ණය සහ ස්කන්ධ සුරැකුම්පත් නිකුත් කිරීමේ කටයුතු හා සම්බන්ධ නොවන අනෙකුත් අත්පත් කර ගැනීම සහ සම්බන්ධිත වියදම් එම සේවාවට අදාළව දැරුවිට එම කාලච්ඡේදයේ වියදමක් ලෙස හඳුනා ගනේ.

අත්පත් කර ගැනීමේ දිනයේ දී පාලනයට යටත් නොවන හිමිකම් ගණනය කිරීම සඳහා පදනම වශයෙන් සාධාරණ අගයට ගනුදෙනුවෙන් ගනුදෙනුවට හෝ ශුද්ධ වත්කම්වලින් සමානුපාතික කොටස සමූහය විසින් තෝරා ගනු ලැබේ.

සමූහය විසින් ව්‍යාපාර සංයෝජනයේ දී දරණ ලද ණය නිකුත් කිරීමේ දී හා ස්කන්ධ සුරැකුම්පත් සඳහා ගැණුනු වියදම් හැරුණු විට අනෙකුත් වියදම් දැරූ අවස්ථාවේදීම වියදමක් ලෙස හඳුනා ගනේ.

4.1.2 පාලනය අහිමි වීම

පාලනය අහිමි වීමේ දී සමූහය විසින් පරිපාලිතයන්ගේ හඳුනාගත් වත්කම් සහ වගකීම් ඉවත් කරගන්නා අතර ඒ අනුව පාලනයට යටත් නොවන හිමිකම්වල ධාරණ අගය සහ සමුච්චිත පරිවර්තන වෙනස්කම් පරිපාලිතයන්ගේ ස්කන්ධයට ගලපනු ලැබේ. තවද වෙනත් විස්තීරණ ආදායම යටතේ පෙර හඳුනාගත් යම් අගයක් වේනම් ඒවා සුදුසු පරිදි ලාභ හෝ පාඩු ප්‍රකාශනයට හෝ රඳවාගත් ඉපයුමට නැවත හඳුනාගනු ලැබේ. පාලනය අහිමි වීමේ දී ඇතිවන ඍණතාවය හෝ අතිරික්තය ලාභ හෝ පාඩු ප්‍රකාශනයට ගලපනු ලැබේ. සමූහය විසින් අදාළ පරිපාලිතයේ යම් ඇල්මක් රඳවා තබා ගනී නම් එවැනි රඳවාගත් හිමිකම පාලනය අහිමි වන දිනට සාධාරණ අගයට මනිනු ලැබේ. ඉන්පසුව සමූහයට අදාළව රඳවාගත් හිමිකම මූල්‍ය ප්‍රකාශනවල සමූහයේ මූල්‍ය උපකරණවලට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව හෝ ආයෝජිතයන්ගේ ස්කන්ධය මත ගණනය කරනු ලැබේ.

4.2 විදේශ මුදල් පරිවර්තනය

4.2.1 විදේශ මුදල් ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් ගනුදෙනු ව්‍යවහාර මුදල් ඒකකය බවට පරිවර්තනය කරන්නේ ගනුදෙනුව සිදු වන දිනට පවතින විනිමය අනුපාත මඟින් පරිවර්තනය කිරීමෙනි. විදේශ වලංගු මුදල්වලින් නිරූපණය කෙරෙන මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනට බලපැවැත්වෙන විනිමය අනුපාතිකයන්ට අනුව ව්‍යවහාර මුදල්වලට නැවත පරිවර්තනය කරනු ලබන අතර වෙළඳ නොවන කටයුතු තුළින් ඇතිවන්නා වූ අසමානතා ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ අනෙකුත් මෙහෙයුම් ආදායම් යටතේ සටහන් කරනු ලැබේ. විදේශ මුදල්වලින් නිරූපණය කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම්වල වටිනාකම සාධාරණ අගයට වාර්තා කරන විට, ව්‍යවහාර මුදල් ඒකකය බවට පරිවර්තනය කරනු ලබන්නේ සාධාරණ අගය තීරණය කරන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින්ය.

විදේශ මුදල්වලින් ඓතිහාසික පිරිවැයට නිරූපණය කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් එම ගනුදෙනුව මුලින්ම සිදු වන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් පරිවර්තනය කරනු ලැබේ.

විදේශ මුදල්වලින් නිරූපණය කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම්වල වටිනාකම සාධාරණ අගයට වාර්තා කරන විට, ව්‍යවහාර මුදල් ඒකකය බවට පරිවර්තනය කරනු ලබන්නේ සාධාරණ අගය තීරණය කරන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින්ය. නැවත පරිවර්තනයේ දී ඇතිවන විදේශ විනිමය අසමානතා ඇතුළු ලාභ හෝ පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කරයි. ඉදිරි විනිමය ගිවිසුම් තක්සේරු කරනු ලබන්නේ වාර්තා කරන දිනට බලපැවැත්වෙන ඉදිරි වෙළඳපොල අනුපාතිකයන්ට අනුව වන අතර ඉන් ඇතිවන උපලබ්ධි නොවූ ශුද්ධ ලාභ සහ අලාභ, ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ සටහන් කරනු ලැබේ.

4.2.2 විදේශීය මෙහෙයුම්

ශ්‍රී ලංකා රුපියල් නොවන ව්‍යවහාර මුදල් භාවිතා කරන්නා වූ විදේශීය මෙහෙයුම්වල මෙහෙයුම් ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වයන් පහත දැක්වෙන පරිදි ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ.

විදේශීය මෙහෙයුම්වල පවතින වත්කම් සහ වගකීම් වාර්තාකරණ දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ ආදායම් සහ වියදම් කාලපරිච්ඡේදයේ සාමාන්‍ය විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කෙරේ. විදේශ මෙහෙයුම් පරිවර්තනයේ දී ඇතිවන විදේශ විනිමය අසමානතා විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ සටහන් කරයි.

යම් විදේශ මෙහෙයුමක් ඉවත් කිරීමේ දී අදාළ මෙහෙයුමට අදාළව පරිවර්තන සංචිතයේ ඇති ප්‍රමාණය විකිණීමෙන් ලද ලාභයක් හෝ අලාභයක් ලෙස ලාභ හෝ අලාභ ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායම් හෝ වියදම් යටතේ දැක්වේ.

4.3 මූල්‍ය උපකරණ, ණය උපකරණ හා හිමිකම් උපකරණ වශයෙන් වර්ග කිරීම

මූල්‍ය උපකරණ ණය හා හිමිකම් උපකරණ වශයෙන් වර්ග කිරීම සඳහා අදාළ මූල්‍ය උපකරණවල පහත සඳහන් ලක්ෂණ පදනම් කර ගනු ලබයි.

- මූල්‍ය උපකරණ නම් කර ඇති ආකාරය
- නිශ්චිත කල්පිරෙන දිනයක් පැවතීම හෝ නොමැති වීම
- මූල්‍ය උපකරණවල ජීවිත කාලය
- ගෙවනු ලබන මූලාශ්‍ර
- ගෙවීම් මත බලපෑම් කිරීමේ අයිතිය
- කළමනාරණ කටයුතු සඳහා සහභාගි වීමේ අයිතිය
- උපකරණ හා බැඳී ඇති අවදානම
- මුදල් ප්‍රවාහයේ විචල්‍ය බව
- ලබා දී ඇති ඇප සුරැකුම්

4.4 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්

4.4.1 මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වර්ගීකරණය

මූල්‍ය උපකරණ වර්ගීකරණය ප්‍රථමයෙන් හඳුනා ගැනීම සිදු වන්නේ එහි අරමුණු, ලක්ෂණ සහ ඒවා අත්පත් කර ගැනීමේ කළමනාකරණ අරමුණු අනුවය.

4.4.1.1 මූලික වශයෙන් මූල්‍ය වත්කම් පහත අයිතමයන් යටතේ වර්ග කරනු ලබයි

- ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම්
  - මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින (සටහන 25)
  - ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණ
- මූල්‍ය ආයෝජන - ණය සහ ලැබිය යුතු දෑ (සටහන 26)
- මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින (සටහන 28)
- මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් දරා සිටින (සටහන 29)

4.4.1.2 මූලික වශයෙන් මූල්‍ය වගකීම් පහත අයිතමයන් යටතේ වර්ග කරනු ලබයි

- ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වගකීම්
  - මූල්‍ය වගකීම් - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින
  - ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වගකීම්
- මූල්‍ය වගකීම් - අනෙකුත් මූල්‍ය වගකීම්

4.4.2 හඳුනාගැනීමේ දිනය

සියලුම මූල්‍ය වත්කම් සහ වගකීම් ආරම්භයේ දී හඳුනාගනු ලබන්නේ පියවුම් දිනයේ දීය. එනම් උපකරණවල ගිවිසගත් නියෝග සඳහා සමූහය පාර්ශවයක් ලෙස පත්වන දිනයයි. මෙයට ඇතුළත්වන්නේ අඛණ්ඩ වෙළඳම් කටයුතුය. එනම් වෙළඳපොල නීති සහ සම්මුතීන් මත නියමිත කාල පරාසයක් තුළ දී වෙළඳපොල අගය මත වත්කමක් හුවමාරු කිරීම, අවශ්‍ය වන මූල්‍ය වත්කමක් මිලදී ගැනීම හෝ විකිණීම.

4.4.3 මූල්‍ය උපකරණ මුල් වරට මිනුම්කරණය

ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් හා වගකීම් හැරුණු විට මූල්‍ය වත්කම් සහ වගකීම් මුල් වරට මිනුම්කරණය කිරීමේ දී ඒවායේ සාධාරණ අගයට ගනුදෙනු පිරිවැයද ඇතුළත් කෙරේ. ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම්කළ මූල්‍ය වත්කම් හා වගකීම්වල ගනුදෙනු පිරිවැය ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ සටහන් කෙරේ.

4.4.4 "එක් දින" ලාභ හෝ අලාභ

යම් මූල්‍ය උපකරණයක ගනුදෙනුවන මිල, එම මූල්‍ය උපකරණයම ගනුදෙනු වන වෙනත් නිරීක්ෂිත වර්තමාන වෙළඳපොලක සාධාරණ අගයට හෝ නිරීක්ෂිත වර්තමාන වෙළඳපොලක දත්ත මත ගණනය කරන ලද සාධාරණ අගයට හෝ වෙනස් වන්නේ නම් එම සාධාරණ අගයෙහි හා ගනුදෙනු මිලෙහි වෙනස සමූහය විසින් වහාම ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ හඳුනා ගැනේ. නිරීක්ෂිත නොවන දත්ත මත සාධාරණ අගය ගණනය කරනු ලබන අවස්ථාවන් හි දී ගනුදෙනු මිල සහ ආදර්ශ මිල අතර වෙනස එම මූල්‍ය උපකරණයේ ආයුකාලය තුළ ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ හඳුනා ගනී.

4.4.5 මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම

සමූහය විසින් කිසිදු මූල්‍ය උපකරණයක් ලාභ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණ ලෙස නැවත වර්ගීකරණය නොකරයි. තවද මූලික හඳුනා ගැනීමේ දී ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය උපකරණ නැවත වර්ගීකරණයක් ලෙස ඉන් ඉවත් කරනු නොලබයි. ශ්‍රී ල.ගි.ප්‍ර. 39 "මූල්‍ය උපකරණ හඳුනා ගැනීම සහ මිනුම්කරණය" අවසර දී ඇති පරිදි වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ උපලබ්ධිය සඳහා පවතින හෝ ණය හා ලැබිය යුතු දෑ හෝ කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන වශයෙන් අවශ්‍ය වූ විටක සමූහය විසින් නැවත වර්ගීකරණය කරනු ලබයි. තවද විශේෂ අවස්ථාවල දී උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන ණය හා ලැබිය යුතු දෑ හෝ කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන ලෙස නැවත වර්ගීකරණය කිරීමට සමූහයට අවසර ඇත. සාධාරණ අගයට අගය කරනු ලබන මූල්‍ය ආයෝජන ක්‍රමක්ෂය පදනම මත අගය කිරීමට නැවත වර්ගීකරණය කරනු ලැබුවහොත් නැවත වර්ගීකරණය කරන දිනයේ දී ඇති සාධාරණ අගය ක්‍රමක්ෂය අගය ලෙස සලකනු ලබයි.

උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය උපකරණ ක්‍රමක්ෂය ක්‍රමය යටතේ නැවත වර්ගීකරණය කිරීමේ දී හිමිකම් ප්‍රකාශය යටතේ හඳුනා ගන්නා ලද ලාභ හෝ අලාභ මූල්‍ය උපකරනයේ ජීවිත කාලය පුරාවට සුළු පොළී අනුපාතය යටතේ ලාභයට හෝ අලාභයට ලියා හරිනු ලබයි. එමෙන්ම නව ක්‍රමක්ෂය අගය හා ඉදිරියේ දී ලැබේ යැයි බලාපොරොත්තු වන මුදල් ප්‍රවාහය අතර යම් වෙනසක් වේ නම් එම වෙනස ද ඉහත ක්‍රමයට ලාභයට හෝ අලාභයට ලියා හරිනු ලබයි. මෙවැනි වත්කම් හානිකරණයට ලක් වූයේ යැයි නිරණය කරනු ලැබුවහොත් හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයේ හඳුනා ගන්නා ලද නැවත අගය කිරීමේ ලාභ හෝ අලාභයන් ලාභ හෝ පාඩු ප්‍රකාශනයට මාරු කරනු ලබයි.

සමූහය විසින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ නොවන වෙළඳපොල කටයුතු සඳහා දරා සිටින මූල්‍ය උපකරණ ණය හා ලැබිය යුතු දෑ වශයෙන් නැවත වර්ගීකරණය කිරීමේ දී ණය හා ලැබිය යුතු දෑ වශයෙන් වර්ග කරන මූල්‍ය ඇස්තමේන්තූන්හි අඊට දැක්වීමට නැවත වර්ග කරන මූල්‍ය උපකරණ ගැලපේ නම් නැවත වර්ගීකරණය කරනු ලබයි. මෙහි දී සමූහය විසින් අදාළ මූල්‍ය උපකරණ දිගු කාලයක් පුරා හෝ උපකරණයේ ජීවිත කාලය අවසන් වන තෙක් දරා සිටීමට අදහස් කරයි.

මෙසේ නැවත වර්ගීකරණය කරනු ලබන මූල්‍ය උපකරණයන්ගේ ඇස්තමේන්තු ගත මුදල් ප්‍රවාහය අයකර ගැනීම් වැඩිවීම මත පසුකාලීනව වැඩි වන්නේ නම් එම වැඩිවූ මුදල් ප්‍රමාණයේ බලපෑම අළුතින් ඇස්තමේන්තු කරනු ලබන අතර එය ඇස්තමේන්තු වෙනස සිදුවූ දිනයේ සිට එම උපකරණයේ සළුල පොළී අනුපාතයට ගලපනු ලබයි.

කෙසේ වෙතත් කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන සැලකිය යුතු ප්‍රමාණයක් විකිණීමට හෝ උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ප්‍රකාශන ලෙස නැවත වර්ගීකරණය කරනු ලැබුවේ නම් අදාළ බාන්ඩයට අයිති සියලුම කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය උපකරණ උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය උපකරණ ලෙස නැවත වර්ග කළ යුතුය. එසේ උපලබ්ධිය සඳහා පවතින ලෙස නැවත වර්ග කළ මූල්‍ය උපකරණ නැවත වර්ග කළ වසර සහ තවත් වසර දෙකක් ඉක්ම යනතුරු කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය උපකරණ ලෙස නැවත වර්ග කළ නොහැකි වේ. කෙසේ වෙතත් පහත සඳහන් අවස්ථාවල දී අදාළ මූල්‍ය උපකරණ විකිණීම හෝ නැවත වර්ගීකරණය කර ඇති විටක ඉතිරි මූල්‍ය උපකරණ බාන්ඩයම නැවත වර්ගීකරණය කළ යුතු නොවේ.

- විකිණීම හෝ නැවත අගය කිරීම කළ මූල්‍ය උපකරණ පරිණත වීමට ආසන්න නම් හා වෙළඳපොල පොළී අනුපාතිකයේ වෙනස් වීම මූල්‍ය වත්කමේ සාධාරණ අගයට ප්‍රමාණාත්මක බලපෑමක් නොකරන්නේ නම්
- ප්‍රමාණාත්මක මුදල් ප්‍රමාණයක් අදාළ වත්කමෙන් අයකර ගෙන අවසන් වූ පසු නැවත වර්ගීකරණය කර ඇති විටක හෝ උපලබ්ධි කර ඇති විටක
- සමූහයේ පාලනයෙන් තොරව සාධාරණව අපේක්ෂා කළ නොහැකි සිදුවීමකට අනුගාමීව මූල්‍ය උපකරණ විකිණීමෙන් නැවත වර්ගීකරණය කරනු ලැබේ නම්

නැවත වර්ගීකරණය කළමනාකරණයේ තීරණයක් වන අතර මූල්‍ය උපකරණයන් උපකරණයට වෙන් වෙන් වශයෙන් සලකා බලයි.

4.4.6 බැහැර කිරීම

4.4.6.1 මූල්‍ය වත්කම් බැහැර කිරීම

මූල්‍ය වත්කම් මඟින් ජනනය වන මුදල් ප්‍රවාහයන් සඳහා ඇති ගිවිසුම් ගත අයිතිවාසිකම කල්පිරෙන විට දී හෝ ගනුදෙනුවක් මඟින් මූල්‍ය වත්කමේ අයිතිය හා බැඳුණු සැලකිය යුතු ප්‍රමාණයක අවදානම් හා ප්‍රතිලාභ අනෙකුත් පාර්ශවය වෙත මාරු කිරීමේ දී හෝ සමූහය විසින් එම මූල්‍ය වත්කම බැහැර කරනු ඇත.

බැහැර කිරීමට යටත්ව මාරු කරන ලද මූල්‍ය වත්කම්වලට අදාළව සමූහය රඳවා ගනු ලබන යම් අයිතියක් ඇත්නම් එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනී. මූල්‍ය වත්කමක් බැහැර කිරීමේ දී ධාරණ අගය සහ පහත අගයන් හි අතර වෙනස ලාභ හෝ පාඩු ප්‍රකාශනය යටතට ගැනේ.

1. ප්‍රතිඥාව මත ලද අගයන් (අත්කර ගත් නව වත්කම්වලින් කල්පිත වගකීම් අඩු කළ පසු අගයන් ද ඇතුලුව) හෝ වත්කමේ පොත් අගය (හෝ හුවමාරු වූ වත්කම් වලට සමානුපාතිකව ඇති පොත් අගය).
2. විස්තීරණ ආදායම් ප්‍රකාශනය යටතේ හඳුනාගෙන තිබූ ලාභ හෝ අලාභවල අගයන්.

වත්කම්වලට අදාළව සියලු හා යම් ප්‍රමාණාත්මක අවදානම් සහ ප්‍රතිලාභ සමූහය වෙත රඳවා ගනිමින් අදාළ වත්කම් වෙනත් පාර්ශ්වයකට පැවරීමේ හැකියාව සමූහය වෙත පවතී. එවන් අවස්ථාවක දී වත්කම් බැහැර කිරීමක් ලෙස නොසැලකේ. උදා: ප්‍රති මිල දී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණනු ලබන සුරැකුම්.

වත්කම් තෙවන පාර්ශ්වයක් වෙත, එහි සමකාලීන මුළු ඉපැයුම් අනුපාතිකය නුවමාරුවන පරිදි විකුණූ විට එය සුරැකුම් මත සිදු කරන ලද මූල්‍යමය ගනුදෙනුවක් හා සමානව ගිණුම් ගත කරනු ඇත. සමූහය වෙත ප්‍රමාණාත්මක අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගනිමින් සිදු කරනු ලබන ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනු මේ හා සැසඳේ.

සමූහය විසින් සිදු කරන ගනුදෙනු මූල්‍ය වත්කමේ හිමිකම හා බැඳුණු ප්‍රමාණාත්මක අවදානම් හා ප්‍රතිලාභ සමූහය වෙත රඳවා නොගන්නා නමුත් එම වත්කමෙහි පාලන අයිතිය රඳවා ගන්නා විට එම වත්කමෙහි පාලනය දරා සිටින තාක් සහ එම පාලනය මඟින් වත්කමේ වටිනාකම වෙනස්වීමට නිරාවරණය වීමේ ප්‍රමාණයට සමූහයෙහි ගිණුම් තුළ එම වත්කම හඳුනාගැනේ.

ගනුදෙනුවල දී මූල්‍ය වත්කමක් වෙනත් පාර්ශවයක් වෙත පැවරීම සිදුකල ද එම වත්කම හා බැඳුණු සේවාවන් යම් ගාස්තුවක් අය කිරීම මත සැපයීමේ වගකීම සමූහය රඳවා ගනී. එවන් අවස්ථාවලදී එම වත්කම බැහැර කිරීමේ උපමානයන් සපුරා ඇත්නම් එය බැහැර කෙරෙනු ඇත. තව ද එම සේවා සැපයුමට අදාළ ගිවිසුමක් වේ නම් ඒ හා බැඳි සේවා ගාස්තුව හා සපයනු ලබන සේවාව අතර වන වෙනස මත වත්කමක් හෝ වගකීමක් හඳුනා ගනී.

ඇපකරයක් ආකාරයට දිගටම ක්‍රියාත්මක වන නුවමාරුකල වත්කමක් අගය කරනු ලබන්නේ වත්කම මූලිකව රැගෙන ආ අගය හෝ ප්‍රතිඥාව ලෙස සමූහය ගෙවිය යුතු අගය යන අගයන්ගෙන් වඩා අඩු අගයට වේ.

4.4.6.2 මූල්‍ය වගකීම් බැහැර කිරීම

මූල්‍ය වගකීම් හා බැඳුනු වගකීම නිසියාකාරව නිම කිරීම නිසා හෝ එය අහෝසි වී යාම නිසා හෝ කාලසීමාව ඉකුත්වීම නිසා හෝ යන කාරණා මත නිමා වී ඇති නම් එම මූල්‍ය වගකීම ගිණුම් තුළින් බැහැර කිරීම් සිදු කරයි. පවත්නා මූල්‍ය වගකීමක් එම ණයහිමියා විසින්ම වෙනත් වගකීමක් මඟින් ප්‍රමාණාත්මක කොන්දේසි මත ප්‍රතිඥාපනය කරන විට හෝ පවත්නා කොන්දේසි ප්‍රමාණාත්මක හා සැලකිය යුතු ලෙස වෙනසකට භාජනය කරන විට එය මුල් වගකීමෙහි බැහැර කිරීමක් ලෙසත් නව වගකීමෙහි හඳුනා ගැනීමක් ලෙසත් ගිණුම් ගත කරනු ඇත. මුල් මූල්‍ය වගකීමෙහි ධාරණ අගයෙහි සහ ගෙවූ ප්‍රතිඥාවෙහි අතර වෙනස ලාභ හෝ පාඩු ප්‍රකාශනයෙහි සටහන් කෙරේ.

4.4.7 වත්කම් හි හානිකරණය

4.4.7.1 මූල්‍ය වත්කම් හි හානිකරණය

සෑම වාර්තාකරණ දිනයක දීම මූල්‍ය වත්කම් හි අගය තනිව හෝ සාමූහිකව සලකන විට හානිකරණයකට ලක්ව තිබේ ද යන්න පිළිබඳව සපයනු ලබන විෂය බද්ධ සාක්ෂි මඟින් තක්සේරු කරනු ලැබේ. එලෙස විෂය බද්ධ සාක්ෂි මඟින් හානිකරණයක් සිදු ව ඇති බවට විද්‍යාමාන වනුයේ වත්කමෙහි මූලික හඳුනා ගැනීමට පසු අලාභයක් ජනනය වන සිද්ධියක් සිදු ව ඇති විට සහ එම අලාභගත සිද්ධිය එම වත්කමෙහි අනාගත මුදල් ප්‍රවාහ මත බලපෑමක් සිදු කල හැකි බව හා එය විශ්වාසනීය ලෙස මැනිය හැකි විටදීය. ණය හා ලැබිය යුතු දෑ, ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්, උපලබ්ධිය සඳහා පවතින හා කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජනවලට අදාළ හානිකරණය පිළිබඳ විස්තර පිළිවෙලින් සටහන් අංක 26, 27, 28 හා 29 යටතේ දක්වා ඇත.

4.4.7.2 මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය

සෑම වාර්තාකරණ දිනකටම අදාළව මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය හා සම්බන්ධ වන සංඥාවන් පිළිබඳව බැංකුව තක්සේරු කරනු ලැබේ. එවන් සංඥාවක් පවතින විට දී හෝ හානිකරණය පිළිබඳව පරීක්ෂාවක් අවශ්‍ය විටක දී එම මූල්‍ය නොවන වත්කම් යළි අයකර ගැනීමේ ශක්‍යතාවය පිළිබඳව සළකා බැලේ. වත්කම් නැවත අයකර ගත හැකි අගය වනුයේ වත්කමේ භාවිතයේ පවතින වටිනාකම සහ එහි මුදල් ජනනය කරන ඒකකයන්ගේ සාධාරණ අගයෙන් විකුණුම් වියදම් ඉවත් කළ පසු අගය යන දෙකෙහි උපරිම අගයයි. වත්කමේ ධාරණ අගය හෝ මුදල් ජනනය කරන ඒකකවල අගය එහි නැවත අයකර ගැනීමේ අගය ඉක්මවන විට, එය හානිකරණයට ලක් වූ ලෙස සලකා වත්කම නැවත අයකර ගත හැකි අගයට ගිණුම්වල ගලපනු ලැබේ.

භාවිතයේ පවතින වටිනාකම ගණනයේ දී, වත්කමට බද්ධ වන අවදානම සහ වෙළඳපොල තක්සේරුව මත මුදලේ කාලානුරූපී වටිනාකම අර්ථ නිරූපනය කෙරෙන බදු පෙර වට්ටම් අනුපාතය භාවිතයෙන් තක්සේරුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ඇත. විකුණුම් පිරිවැය සාධාරණ අගයෙන් අඩුකර නිරණය කිරීමේ දී ඒ සඳහා සුදුසු තක්සේරු ආකෘතීන් භාවිතා කෙරේ. මෙම තක්සේරුකරණයන් බහුවිධ තක්සේරු ක්‍රම, පොදු වශයෙන් විකිණෙන පරිපාලිතයන්ගේ ලැයිස්තු ගත කොටස් මිල හෝ අනෙකුත් වටිනාකම් ඇති සාධාරණ මිලක් පෙන්වන සංඥාවක් මඟින් තව දුරටත් තහවුරු කෙරේ.

4.4.8 භාරකාර සේවා

පාරිභෝගිකයින් වෙනුවෙන් වත්කම් රඳවා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස සමූහය විසින් භාරකාර සේවා සපයනු ලැබේ. භාරකාරත්වයේ පවතින වත්කම් සමූහයේ වත්කම් නොවන නිසා මූල්‍ය ප්‍රකාශවල ඉදිරිපත් නොකෙරේ.

4.5 ප්‍රතිපාදනයන්

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමානයේ දී නෛතික හෝ සම්මුතික වගකීමක් ඇති වූ විට දී එම වගකීම නිවැරදිව තක්සේරුගත කල හැකි නම් සහ අදාළ වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභයන්හි පිටතට ගලා යාමක් සිදුවන බවට අපේක්ෂාවක් වේ නම් ඒ සඳහා ප්‍රතිපාදනයන් වෙන් කෙරේ.

ප්‍රතිපාදන වටිනාකම නිරණය කිරීමේදී වාර්ථාකරන දිනට පවතින වගකීම් පියවීමට අවශ්‍ය වඩාත් යෝග්‍යතම අගය ඇස්තමේන්තු කරන අතර එහිදී අදාළ සිද්දිය සිදුවීමට ඇති අවිනිශ්චිතතාව හා අවදානම සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රතිපාදන නිරණය කිරීමේදී වර්තමාන වගකීම පියවීමට අවශ්‍ය මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කරනු ලබයි නම්, එහිදී අදාළ මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගය මත පදනම්ව දරා සිටින අගය නිරණය කරයි. භාරදූර ගිවිසුම් සඳහා ප්‍රතිපාදනයන් කරනු ලබන්නේ අදාල ගිවිසුමෙන් සමූහයට ලැබෙන අපේක්ෂිත ප්‍රතිලාභ එම ගිවිසුම් ඉටු කිරීමේදී දැරීමට සිදු වන නොවැලැක්විය හැකි පිරිවැයට වඩා අඩු නම් පමණි. අදාල ගිවිසුම අත්හිටුවීමට සිදුවුවහොත් එහිදී දැරීමට සිදුවන පිරිවැය හා ගිවිසුම අඛන්ඩව පවත්වාගෙන යාමට දැරිය යුතු අපේක්ෂිත ශුද්ධ පිරිවැය යන දෙකෙහි අඩු වටිනාකමෙන් වර්තමාන අගය ප්‍රතිපාදනය ලෙස හඳුනාගනු ලැබේ.

4.6 ආදායම් බදු වියදම හා අනෙකුත් බදු

4.6.1 ආදායම් බදු වියදම

ආදායම් බදු, ප්‍රවර්තන බදු සහ විලම්බිත බදු යන කොටස් දෙකකින් සමන්විත වේ. සටහන 17 යටතේ විස්තරාත්මකව දක්වා ඇත.

4.6.2 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද (VAT)

එකතු කල අගය මත බද්ද සඳහා පදනම වන්නේ සේවක පාරිශ්‍රමික හා බදු පෙර ලාභයට නියම කර ඇති ආකාරයට ක්ෂය ගැලපීමෙන් පසු ලැබෙන ලාභයයි.

2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතෙහි අංක 25 (අ) වගන්තිය හා ආනුෂාංගික සංශෝධන අනුව වර්ෂය සඳහා බැංකුවේ මුළු එකතු කළ අගය මත 15% (2016: 15%) ක බද්දකට යටත් විය. එසේම සමූහය "වටිනාකම ආරෝපිත ක්‍රමය" යටතේ මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු ගණනය කෙරේ.

4.6.3 ලාභාංශ මත රඳවා ගත් බදු (WHT)

- බැංකුව බෙදාහල ලාභාංශ මත රඳවා ගත් බදු

  බැංකුව එහි එකම කොටස්කරුවා වන ශ්‍රී ලංකා රජයට ලාභාංශ බෙදා හැර ඇති බැවින් බැංකුව විසින් කිසිදු ලාභාංශයක් මත බද්දක් ගෙවා නොමැත.
- පරිපාලිතයන් හා ආශ්‍රිතයන් බෙදා හල ලාභාංශ මත රඳවාගත් බදු

පරිපාලිතයන් සහ ආශ්‍රිතයන්හි බදු වන ලාභයෙන් බෙදා හරින ලද ලාභාංශ සඳහා ප්‍රභවයේ දී, 10% ක ලාභාංශ බද්දක් අඩු කරගන්නා අතර මෙය බැංකුවේ බදු බැරකම් ගණනය කිරීමේ දී එයට එරෙහිව අඩු කරගත නොහැකිය. එම නිසා ප්‍රභවයේ දී අඩු කර ගන්නා ලද රඳවාගත් බද්ද, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ඒකාබද්ධකරණ ගැලපුමක් සේ බදු වියදමට එකතු කරගනු ලැබේ.

4.6.4 ආර්ථික සේවා ගාස්තු (ESC)

2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනතේ සහ ඇමුණුම් වගන්ති අනුව, ආර්ථික සේවා ගාස්තු, බැංකුවේ බද්දට යටත් ආදායමෙන් 0.5% ගෙවිය යුතු වන අතර එය ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකර ගත හැකි වේ. 2012 අප්‍රේල් 1 වන දිනෙන් පසුව 2012 අංක 11 දරණ ආර්ථික සේවා ගාස්තු සංශෝධන පනත පරිදි ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වන්නේ බැංකුවේ ආදායම මත වේ. එය ගෙවිය යුතු ආදායම් බද්දෙන් අඩුකළ හැකිය.

4.6.5 බෝග රක්ෂණ බද්ද

2013 අංක 12 දරණ මුදල් පනතේ 15 වැනි වගන්තිය යටතේ බෝග රක්ෂණ බද්ද 2013 අප්‍රේල් 1 දින සිට බලපැවැත්වෙන අතර බදු අය කිරීමෙන් පසු ලාභයෙන් 1% ක බද්දක් ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය වෙත ගෙවිය යුතු වේ.

4.6.6 මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT)

ජාතිය ගොඩනැගීමේ බද්ද ගණනය කරනු ලබන්නේ, 2009 අංක 9 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනත සහ එහි සංශෝධන අනුව 2014 ජනවාරි 1 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි වේ. මූල්‍ය සේවා මත ජාතිය ගොඩනැගීමේ බද්ද, මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද ගණනය කිරීමේ දී භාවිතා කරන ලද එකතු කළ අගයෙන් 2% ලෙස ගණනය කෙරේ.

5 රක්ෂණ ව්‍යාපාරය

5.1 ප්‍රතිරක්ෂණය

මෙමගින් සමූහය සිය සියලු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සහ බැඳි රක්ෂණ අවදානම පැවරීමකට ලක්කරන අතර ප්‍රතිරක්ෂණ වත්කම මඟින් ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ලැබිය යුතු ශේෂයන් නිරූපණය වේ. ප්‍රතිරක්ෂණය මඟින් ලැබිය යුතු ප්‍රමාණය නිරණයේ දී ප්‍රතිරක්ෂණ ගිවිසුම් සහ බැඳි හිමිකම් පෑම් සඳහා වන ප්‍රතිපාදන සහ ගෙවා නිමකල හිමිකම් සැලකිල්ලට භාජනය කරනු ඇත.

වාර්තාකරණ වර්ෂය තුළ සංඥාවක් ලද විට හෝ වාර්තාකරණ දිනයේ දී හෝ ප්‍රතිරක්ෂණ වත්කම්වල හානිකරණය පිළිබඳව සමාලෝචනයකට ලක්කරනු ලැබේ. ප්‍රතිරක්ෂණ වත්කමෙහි මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව සිදු වන ලද යම් සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිරක්ෂණය මඟින් ලැබිය යුතු මුදල් නොලැබී යාමේ විෂය බද්ධ ගත සාක්ෂියක් සපයනු ලබන විට හානිකරණයක් සිදු ව ඇති බවට නිගමනය කෙරේ. එය ලාභ හෝ පාඩු ප්‍රකාශනයෙහි සටහන් තැබේ.

ප්‍රතිරක්ෂණය කරන ලද හෝ කිරීමට බලාපොරොත්තු වන ගිවිසුම් වලට අදාළ වාරික ලැබීම් හා හිමිකම් දල පදනම මත වාර්ථා කරනු ලැබේ. ගිවිසුම් ගත අයිතිය නිම වූ පසු හෝ වෙනත් පාර්ශවයකට පැවරූ පසු ප්‍රතිරක්ෂණ වත්කම හෝ වගකීම බැහැර කිරීම සිදු වේ.

5.2 ලැබිය යුතු රක්ෂණයන්

ලැබිය යුතු රක්ෂණයන් ඒවා උපචිත වූ විට හඳුනා ගැනෙන අතර මූලික හඳුනා ගැනීමේ දී ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිඵලවේ සාධාරණ අගය මත ගිණුම් ගත කෙරේ. ධාරණ අගය ගත නොහැකි බවට යම් සිද්ධියක් හෝ අවස්ථාවක් සංඥාවන් සපයන විට දී, ලැබිය යුතු රක්ෂණයන්හි ධාරණ අගයෙහි හානිකරණය පිළිබඳව සලකා බැලේ. එසේ හානිකරණ අලාභයක් වේ නම් එය ලාභ හෝ පාඩු ප්‍රකාශයෙහි හඳුනාගනී.

5.3 විලම්බිත වියදම්

5.3.1 විලම්බනය කළ අත්පත් කර ගැනීමේ පිරිවැය

නව රක්ෂණ ඔප්පුවක් හා සම්බන්ධවන හෝ අභිමතානුසාරී සහභාගිත්ව ලක්ෂණ (අ.ස.ල.) ඇති ආයෝජන ගිවිසුමක් හෝ සම්බන්ධවන කොමිස්, ප්‍රතිරක්ෂණ ගාස්තු, අලෙවිකරණ වියදම්, ගිවිසුම් නිකුත් කිරීමේ වියදම් ආදී පිරිවැය අනාගත වාරික මඟින් පියවාගත හැකි ප්‍රමාණයට විලම්බනය කරනු ලැබේ. අනෙකුත් සියලු ආරම්භක අත්පත් කර ගැනීමේ පිරිවැය ඒවා දැරූ විට වියදමක් ලෙස හඳුනා ගනී. මූලික හඳුනාගැනීමෙන් පසුව, උපයා නොගත් වාරිකයන් ක්‍රමක්ෂය කිරීමේ පදනමෙන් කාලපරිච්ඡේදය හා සමගාමීව විලම්බනය කළ අත්පත් කර ගැනීමේ පිරිවැය ද ක්‍රමක්ෂය කරනු ලැබේ. අපේක්ෂිත ඵලදායි ආයුකාලයේ හෝ වත්කම සහ බැඳුනු අනාගත ප්‍රතිලාභයන් පරිභෝජන රටාවේ අපේක්ෂිත වෙනස්කම් එම වත්කමේ ක්‍රමක්ෂය කාලපරිච්ඡේදයෙහි සිදු කරනු ලබන වෙනස් කිරීම මඟින් ගිණුම් ගත කරනු ඇත. එය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සිදුවන වෙනසක් ලෙස සැලකේ. අදාළ ගිවිසුම් අවසන් වූ පසු හෝ අවලංගු වූ පසු විලම්බනය කල අත්පත් කරගැනීමේ පිරිවැය බැහැර කිරීම සිදු වේ.

5.4 ප්‍රතිරක්ෂණ කොමිස්

පිටස්තර ප්‍රතිරක්ෂණ ගිවිසුම මත ලැබිය යුතු කොමිස් විලම්බනයකර ක්‍රමක්ෂය කරනු ලැබේ.

5.5 ආයෝජන ගිවිසුම් වගකීම්

ආයෝජන ගිවිසුම් අභිමතානුසාරී සහභාගිත්ව ලක්ෂණ සහිත හා රහිත ගිවිසුම් අතර වර්ගීකරණය කරයි. අ.ස.ල. සහිත ආයෝජන ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පීවිත රක්ෂණ ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සමාන වේ.

අ.ස.ල. රහිත ආයෝජන ගිවිසුම් වගකීම් හඳුනා ගනු ලබන්නේ ගිවිසුමට ඇතුලත් වූ පසු සහ වාරිකය අය කිරීමෙන් පසුවය. මෙම වගකීම් මූලිකවම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර මෙම සාධාරණ අගය වන්නේ ගිවිසුම නිකුත් කෙරෙන ගනුදෙනු මිලයි. එම ගනුදෙනු මිල සඳහා සෘජුවම ආරෝපිත කල හැකි ගනුදෙනු පිරිවැය ඇතුලත් නොවේ. ආයෝජන ගිවිසුම් වගකීම මූලිකව හඳුනා ගැනීමෙන් අනතුරුව එය ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගය මනිනු ලැබේ.

තැන්පතු හා නැවත ගැනීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීම්වලට ගැලපුමක් වශයෙන් සෘජුවම වාර්තා කරයි. සාධාරණ අගයට ගැලපුම් සෑම වාර්තා කරන දිනකම සටහන් කරන අතර ඒවා ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ හඳුනා ගනු ලබයි. සාධාරණ අගය අනාගතය සඳහා වූ වට්ටම් කල මුදල් ප්‍රවාහ ක්‍රම භාවිතය තුළින් නිර්ණය කරනු ලබයි. ඒකක ගත ගිවිසුම් සඳහා සාධාරණ අගය ගණනය කරනුයේ සෑම ඒකකයකම ඔප්පු හිමියන් සඳහා ඇති ඒකක ගණන එම අරමුදල වාර්තාකරණ දිනයේ දී ඇති ඒකක මුදලින් වැඩි කිරීම මඟින්ය. වාර්තාකරණ දිනයට ඒකක මිල තීරණය කිරීම සඳහා යොදා ගනු ලබන අරමුදල්මය වත්කම් සහ වගකීම්වල පදනම රඳාපවතින්නේ ඒවා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දැක්වෙන අගයට විලම්බිත බදු සහ උපචිත නොවූ ලාභ වෙනුවෙන් වන ගැලපීම් සිදු කළ පසු අගයයි.

ඒකක ගත නොවූ ගිවිසුම් ද අනතුරුව සාධාරණ අගයට පවත්වාගෙන යනු ලබන අතර ඒවා වට්ටම් ගත මුදල් ප්‍රවාහ හා අනුමානගත ආකෘති යන තක්සේරු ක්‍රම භාවිතය මඟින් නිර්ණය කරනු ලබයි. මෙම ආකෘතිවල වලංගු භාවය, ක්‍රමාංකිත බව සුදුසුකම් සහිත ස්වාධීන පුද්ගලයෙකු විසින් කලින් කල නිරීක්ෂණය කරනු ලබයි.

ගිවිසුම කල් පිරුණු පසුව නිදහස් කිරීමෙන් හෝ අවලංගු කිරීමක් මඟින් වගකීම් බැහැර කල යුතුය. ඔප්පු හිමියා විසින් අවලංගු කරනු ලබන ගිවිසුම් සඳහා වන සාධාරණ අගය අයිතිය අත්හරින අගයට වඩා අඩු නොවිය යුතුය. ගිවිසුම් මූල්‍ය අවදානම් සංරචක සහ සැළකිය යුතු රක්ෂණ අවදානම් සංරචකවලින් සමන්විත වන අතර සහ මෙම සංරචක දෙක සඳහා වූ මුදල් ප්‍රවාහයන් එකිනෙකට වෙනස් අතර ඒවා විශ්වාසී ලෙස මිනුම්කරණය කළ හැකිය. මේ සඳහා පාදක වන වට්නාකම් කලඛයක් ලෙස නොපවතී. රක්ෂණ අවදානම් සංරචක සඳහා වන වාරික ගණනය රක්ෂණය හා වන පදනම් හා සමාන වේ.

5.6 අභිමතානුසාරී සහභාගිත්ව ලක්ෂණ (අ.ස.ල.)

අ.ස.ල. මඟින් ගිවිසුම් ගත අයිතීන් ඔප්පුහිමියන් වෙත පරිපූරක පොරොන්දු වූ ප්‍රතිලාභ වශයෙන් ඔවුන්ගේ අයිතීන් ලබාදෙනු ලබන අතර සැළකිය යුතු වැඩිපුර ප්‍රතිලාභ අ.ස.ල. කළඹ පවතින වත්කම්වල ක්‍රියාකාරිත්වය මත පදනම් වේ. 90/10 පදනම මත ඔප්පු හිමියන්ට සහ කොටස් හිමියන්ට අ.ස.ල. අරමුදලේ අතිරික්ත කොන්දේසි ප්‍රකාරව බෙදා දිය හැකිය. මෙම අතිරික්ත ඔප්පු හිමියන් වෙත බෙදා දීමේ දී එහි වට්නාකම සහ කාලය තීරණය කිරීමේ අභිමතය සමූහය සතුය. පොරොන්දු වූ සහ අභිමතානුරූපී, වෙන්නොකළ අතිරික්ත ද ඇතුව සියලුම අ.ස.ල. වගකීම් රක්ෂණය යටතේ හෝ ආයෝජන ගිවිසුම් වගකීම් යටතේ සුදුසු ලෙස වාර්ෂිකව රඳවයි.

5.7 නොඉපැයූ වාරික මුදල් සංචිතය

නොඉපැයූ වාරික මුදල් සංචිතය නිරූපණය කරන්නේ නොඉක්ම වූ කාල සීමාව සඳහා ආවරණය වන අදාළ වාරිකවල අගයයි. නාමික ප්‍රතිපත්තීන් හැරුණු විට නොඉපැයූ වාරික මුදල් ගණනය කර ඇත්තේ 1/24 පදනමටය.

6 නිකුත් කළ නමුදු වාර්තාකරණ දිනයේ දී බල නොපැවැත්වෙන නව ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති නමුත් ඒවා 2017 දෙසැම්බර් 31 වෙනි දිනට බල නොපැවැත්වේ. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මෙම ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කර නැත.

සමූහය සඳහා බලපාන අප විසින් හඳුනාගත් ප්‍රමිත සහ ඒවා පිළිබඳ වැඩිදුර තොරතුරු පහත දක්වා ඇත.

(i) ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 9 - මූල්‍ය උපකරණ

එමඟින් ලං.ගි.ප්‍ර. 39 - "මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ මැනීම", ප්‍රතිස්ථාපනය වේ. 2018 ජනවාරි 1 වෙනි දිනට හෝ පසුව ආරම්භ වන මූල්‍ය වර්ෂ සඳහා අනුගමනය කළ යුතු අතර ඊට පෙර අනුගමනය කිරීම සඳහාද අවසර ඇත.

මේ වන විට බැංකුව ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 9 ක්‍රියාත්මක කිරීම සඳහා (ව්‍යාපෘතිය) අවදානම්, මූල්‍ය හා මෙහෙයුම් අංශවල සාමාජිකයින්ගෙන් සමන්විත බහුවිධ කණ්ඩායමක් (කණ්ඩායම) ස්ථාපනය කර ඇත. ප්‍රධාන මූල්‍ය නිලධාරිතුමා ප්‍රධානත්වය දරන නියාමන කමිටුව විසින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම අබන්ධව අධීක්ෂණය කරයි.

ව්‍යාපෘතියෙහි වර්ගීකරණය හා මිනුම්කරණය හා මූල්‍ය වත්කම් හානිකරණය සඳහා උපකණ්ඩායම් දෙකක් පැහැදිලි වැඩකටයුතු ධාරාවන් යටතේ තනිව කටයුතු කරයි. මූලික තක්සේරු කිරීම සහ විශ්ලේෂණය අදියර 2016 හානිකරණය සඳහා නිමකළ අතර, වර්ගීකරණය සහ මිනුම්කරණය සඳහා උපකණ්ඩායම කටයුතු කරමින් සිටී.

ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 9 - "මූල්‍ය උපකරණ" සඳහා බැංකුව ගැටළු හඳුනාගැනීමේ අදියර (තක්සේරු කිරීමේ දී ඇතිවන බලපෑම හඳුනාගැනීමේ කාර්යය) සහ විසඳුම් ගොඩනැඟීමේ කාර්යය අවසන් කර ඇත. බැංකුව විසින් ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 9 ක්‍රියාත්මක කිරීම පිළිබඳ දීර්ඝ ලෙස අධ්‍යනය කර ඇති අතර අවශ්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණ අවශ්‍ය පරිදි ගෙන ඇත.

වර්ගීකරණය සහ මිනුම්කරණය

වර්ගීකරණය සහ මිනුම්කරණ දෘශ්‍යයි කෝණයෙන් සලකා බැලූවිට, මෙම ගිණුම්කරණ ප්‍රමිතය මඟින් ස්කන්ධ උපකරණ හා ව්‍යුත්පන්න උපකරණ හැර සියළුම මූල්‍ය වත්කම්, ආයතනයේ වත්කම් හා උපකරණවල කොන්ත්‍රාත්තුමය මුදල් ප්‍රවාහ ලක්ෂණ හා ආයතනයේ ව්‍යාපාර ආකෘතියේ එකතුව මත පදනම්ව තක්සේරු කරනු ලැබේ.

ව්‍යාපාර ආකෘතිය ඇගයීම

බැංකුවේ අරමුණු ලඟාකර ගැනීමට හැකිවන ආකාරයට මූල්‍ය වත්කම් කළමණාකරණය කල යුතු ආකාරය දැක්වෙන හොඳම ව්‍යාපාර ආකෘතිය බැංකුව විසින් තීරණය කරයි.

බැංකුවේ ව්‍යාපාර ආකෘතිය මූල්‍ය උපකරණයෙන් උපකරණයට ඇගයීම නොව පහත සඳහන් ආකාරයේ හඳුනාගත හැකි සාධක පදනම් ව කළඹ වශයෙන් ඉහළ මට්ටමක එකතුවක් ලෙස ඇගයීම සිදුකරයි.

- ව්‍යාපාර ආකෘතියේ කාර්ය මණ්ඩලය හා එම ව්‍යාපාර ආකෘතිය ඇතුලත පවත්වාගෙන යන මූල්‍ය වත්කම් ඇගයීමක් කර ආයතනයේ ප්‍රධාන කළමණාකරනයට වාර්තා කරයි.
- ව්‍යාපාර ආකෘතියේ කාර්ය මණ්ඩලය සඳහා බලපාන අවදානම් සහ එම ව්‍යාපාර ආකෘතිය ඇතුලත ඇති මූල්‍ය වත්කම් සහ එම අවදානම් කළමණාකරනය කරන ආකාරය.
- ව්‍යාපාරයේ කළමණාකරුවන්ට ගෙවන ආකාරය (උදාහරණයක් ලෙස කළමණාකරුවන් කළමණාකරනය කරන වත්කම් වල සාධාරණ අගය පදනම් කරගෙන ගෙවීම හෝ ගිවිසුම් ගත මුදල් ප්‍රවාහ එකතු කර ගන්නා ආකාරය අනුව).
- විකිණීම බලාපොරොත්තු වන අවස්ථා ගණන, වටිනාකම සහ විකුණු වේලාව බැංකුවේ තක්සේරුවන් සඳහා වැදගත් වේ.

ව්‍යාපාර ආකෘතිය ඇගයීම අභිතකරම තත්ත්වය හෝ ආතති තත්ව නොසලකා වඩාත්ම තාර්කික බලාපොරොත්තු වන තත්වය පදනම් කර සිදුකර ඇත.

මූල්‍ය වත්කමට අනුව මුලින් හඳුනාගත් ආකාරයට වෙනස් ආකාරයට මුදල් ප්‍රවාහ ලැබුනාවූවත් බැංකුව එම ව්‍යාපාර ආකෘතිය තුල හඳුනාගත් ඉතුරු මූල්‍ය වත්කම් වල වර්ගීකරණය වෙනස් නොකරන අතර එම තොරතුරු අළුතින් ඇතිවන හෝ මිලදී ගන්නා මූල්‍ය වත්කම් ඇගයීමේදී සැලකිල්ලට ගනියි.

ගිවිසුම් ගත මුදල් ප්‍රවාහ ගතිලක්ෂණ පරීක්ෂණය

වර්ගීකරණයේ දෙවන පරීක්ෂණය ලෙස මූල්‍ය වත්කම් වල ශුද්ධ වශයෙන්ම ප්‍රාග්ධනය හා පොළිය පමණක් ගෙවීම සිදුවන්නේ දැයි තහවුරු කර ගැනීම සඳහා ගිවිසුම් ගත කොන්දේසි පරීක්ෂා කරයි.

මූල්‍ය වත්කම් මූලික හඳුනා ගැනීමේදී සාධාරණ අගය ප්‍රාග්ධනය ලෙස මේ පරීක්ෂණ සඳහා හඳුන්වනු ලබන අතර කාලය පුරා සමහර වෙනස්කම් සිදුවිය හැක. (උදාහරණයක් ලෙස ප්‍රාග්ධනය ආපසු ගෙවීම හෝ අධි මිල හෝ වට්ටම් වල ක්‍රම ක්ෂය) ණය පහසුකමක පොළියේ වැදගත් කොටස ලෙස මුදලේ කාල අගය සහ ණය අයිතම හඳුන්වා දිය හැක.

ශුද්ධ වශයෙන්ම ප්‍රාග්ධනය හා පොළිය ගෙවීම සඳහා වූ පරීක්ෂාවේදී බැංකුව විනිශ්චයන්ට එළඹෙන අතර මූල්‍ය වත්කම් පවතින මුදල් වර්ගය, පොළි අනුපාතය, අඳාල කාල පරිච්ඡේදය ආදිය සලකා බලයි.

මූල්‍ය වත්කම් හානිකරණය

ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 09 යටතේ හඳුන්වාදෙනු ලැබූ අපේක්ෂිත ණය හානිකරණ ප්‍රවේශය මඟින් බැංකුව දැනට භාවිතා කරන ශ්‍රී ලං.ගි.ප්‍ර. 39 "මූල්‍ය වත්කම් හඳුනා ගැනීම හා මැනීම" යටතේ හඳුන්වා දී තිබූ සිදුවූ ලාභ ප්‍රවේශයට අනුව හානිකරණය වාර්ථා කිරීමේ ක්‍රමවේදය මූලික වශයෙන් වෙනස්වේ. මෙම ප්‍රවේශය මඟින් ඉදිරි දැක්ම සහිතව ණය හානිකරණය වර්තා කරනු ලබයි.

අපේක්ෂිත ණය අලාභයට පදනම වන්නේ වත්කමේ ආයු කාලය පුරාවට අපේක්ෂිත ණය අලාභයයි.

ණය ප්‍රදානය කරන අවස්ථාවේදී අපේක්ෂිත ණය අවදානමට වඩා වාර්ථාකරන දිනට අපේක්ෂිත ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩිවී නොමැති නම් අලාභ දීමනාව ඉදිරි මාස 12 තුළ අපේක්ෂිත ණය හානිකරණ අලාභයට පමණක් හඳුනා ගනි.

ඉදිරි මාස 12 තුළ අපේක්ෂිත අලාභ දීමනාව යනු මූල්‍ය උපකරණයක ආයුකාලය තුළ අපේක්ෂිත ණය හානියෙන් වාර්තාකරන දිනයේ සිට ඉදිරි මාස 12 ඇතුලත අපේක්ෂාකරණ ණය හානිය වේ.

මුලික ණය අවදානම හඳුනාගැනීමෙන් පසු මූල්‍යමය උපකරණවල ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේදැයි එක් එක් වාර්තාකරන කාලපරිච්ඡේදය අවසානයේදී තක්සේරු කිරීම සඳහා බැංකුව විසින් ප්‍රතිපත්ති ස්ථාපිතකර ඇත. මෙම ක්‍රියාවලිය මත පදනම්ව මට්ටම 1 ,මට්ටම 2, මට්ටම 3 වශයෙන් බැංකුව විසින් ණය වර්ගීකරණය කරනු ලබයි.

- **මට්ටම 1** ණය පළමුවෙන්ම පොත්වල හඳුනාගන්නා විට බැංකුව විසින් ඉදිරි මාස 12 සඳහා අපේක්ෂිත හානිකරණ අලාභය මත පදනම්ව ණය හානිකරණ දීමනාවක් පිළිගනු ලබයි. මට්ටම් 2 තුළ තිබී ණය අවධානම අඩුවූ ණය 1 මට්ටමට නැවත වර්ග කරයි. මට්ටම 1 සාමූහික පදනම අනුව තක්සේරු කරනු ලබයි.
- **මට්ටම 2** මූලික හඳුනාගැනීමෙන් පසුව ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇතිවිට මූල්‍ය උපකරණය ආයුකාලය පුරා අපේක්ෂිත ණය අවදානම සඳහා හානිකරණ අලාභය වාර්තා කරයි. තවද 3 මට්ටම තුළ තිබී ණය අවදානම අඩුවූ ණය ද මට්ටම 2 වෙත නැවත වර්ග කරනු ලබයි. මෙහිදී ණය හානිය සමූහික පදනම අනුව හඳුනා ගනී.
- **මට්ටම 3** හානිකරනය වූ ණය ලෙස සලකන ණය හා හානිකරණය සිදුවී ඇති බවට නිරීක්ෂණය කල හැකි සාක්ෂි සහිත ණය මෙම මට්ටම තුල වාර්තාකරණ අතර මූල්‍ය උපකරණයේ ආයුකාලය පුරා අපේක්ෂිත හානිකරණ අලාභය හඳුනාගනී.

මූල්‍ය උපකරණයන් කළඹ ඉදිරි මාස 12 තුළ අපේක්ෂිත ණය හානියට හෝ ආයු කාලය පුරා අපේක්ෂිත ණය හානියට යටත් වේ දැයි නිගමනය කිරීම සඳහා ආරම්භයේ සිට ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී තිබේදැයි නිරතුරුව බැංකුව නිරීක්ෂණය කරනු ලබයි. පහත දැක්වෙන නිර්නායක වලින් එකක් හෝ කිපයක් සම්පූර්ණ වී ඇත්නම් ණය අවදානම සැලකිය යුතු ලෙස වැඩි වී ඇතැයි නිගමනය කරනු ලැබේ.

- දින 30 කට වඩා කල්පසු වී ඇති පහසුකම්
- ණය අවදානම් කළමනාකරණ කණ්ඩායම විසින් සිදුකරන ලද ඇගයීම අනුව අවදානම ඉහළ ගිය කිසියම් කර්මාන්තයක් සඳහා දුන් ණය පහසුකම්
- ප්‍රතිව්‍යුහගත කරන ලද පහසුකම් අවදානම් දර්ශකයට මාරු කිරීම වැනි ගුණාත්මක දර්ශකයක් වෙනස්වීම හේතුවෙන් ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ යාම

ප්‍රමාණාත්මක කේවල ඇගයීම හා කේවල වශයෙන් හානිකරණය නොවූ

කලින් නියම කල ණය සීමාවට වඩා ඉහළ සියලුම ගණුදෙනුකරුවන්ගේ ණය හානිකරණය බැංකුව විසින් තනි තනිව ඇගයීම් කරනු ලැබේ. මෙම කේවල ඇගයීම දැනටමත් හානිකරණය වූ එනම් මට්ටම 3 ලෙස වර්ගකරනු ලැබූ කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය ගනුදෙනුකරුවන් සඳහා භාවිතා කරයි. කේවල වශයෙන් ප්‍රමාණාත්මක නමුත් හානිකරණයට ලක්නොවූ එනම් මට්ටම 1 හා මට්ටම 2 යටතේ වර්ගීකරණය කරනු ලැබූ ණය හා අත්තිකාරම් වල හානිකරණ අලාභය සාමූහික වශයෙන් තක්සේරු කරනු ලැබේ.

ප්‍රමාණාත්මක ණය හානිකරණයක් ලෙස සැලකීමේදී බැංකුව විසින් පහත සඳහන් නිර්ණායකයන් සලකා බලනු ඇත.

- පවතින මූල්‍ය උපකරණයක ආරම්භයේදී තිබූ අනුපාත හෝ වෙනත් කොන්දේසි වල ප්‍රමාණාත්මක වෙනස්වීමක්
- විශේෂිත මූල්‍ය උපකරණයක් හෝ සමාන මූල්‍ය උපකරණයක් සඳහා ණය අවදානම පිළිබඳ බාහිර වෙළඳපල දර්ශන වල සැලකිය යුතු වෙනස්කම්
- ණය ගැනුම්කරුගේ ණය හෝ ප්‍රාග්ධන උපකරණ වල මිල වෙනස්වීම් වැනි ණය ගැනුම්කරුට අදාළ තොරතුරු වල වෙනස්වීමක්
- ණය ගැතියන් සඳහා සත්‍ය/අපේක්ෂිත අභ්‍යන්තර ණය ශ්‍රේණිය පහළ දැමීම හෝ ණය අවදානම තක්සේරු කිරීම සඳහා අභ්‍යන්තරව භාවිතා කරන ච්‍යාත්මක අනුපාතය අඩුවීම.
- ණය ගැතියන් සතු වගකීම් සපුරාලීමට ඇති හැකියාවෙහි කැපී පෙනෙන වෙනසක් ඇතිකිරීමට හේතු වන ව්‍යාපාර මූල්‍ය හෝ ආර්ථික තත්ත්වයෙහි සිදුවන අහිතකර වෙනස්වීම්
- සැබෑ/අපේක්ෂිත ආදායම අඩුවීම,මෙහෙයුම් අවදානම වැඩිවීම, කාරක ප්‍රාග්ධනය අඩුවීම, වත්කම් වල ගුණාත්මකභාවය අඩුවීම,දැවශීලතා කළමනාකරණය පිළිබඳ ගැටලු මතුවීම වැනි මෙහෙයුම් කටයුතු වල සැබෑ හෝ අපේක්ෂිත වෙනසක් ඇතිවීම
- ණය ගැතියෙකුගේ අනෙකුත් මූල්‍ය උපකරණ මත අවදානම සැලකිය යුතු ලෙස වැඩිවීම
- ණය වගකීම් ඉටුකිරීමට ණයගැතියන් සතු හැකියාවෙහි කැපී පෙනෙන වෙනසක් ඇතිවන ණයගැතියෙකුගේ නෛතික, ආර්ථික හෝ තාක්ෂණික පරිසරයේ සත්‍ය හෝ අපේක්ෂිත සැලකිය යුතු මට්ටමේ අහිතකර වෙනස්වීමක්

සාමූහික පදනම මත මැනීම සිදුකරන මූල්‍ය උපකරණ කාණ්ඩගත කිරීම

ඉහත සඳහන් කල පරිදි බැංකුව විසින් ණය හානිකරණ අලාභය කේවල හෝ සාමූහික වශයෙන් ගණනය කරනු ලබයි. 3 වන මට්ටම යටතට වැටෙන්නාවූ සියලුම කේවල වශයෙන් ප්‍රමාණාත්මක මූල්‍ය වත්කම් කේවල පදනම මත අපේක්ෂිත හානිකරණ අලාභය ගණනය කරනු ලබන අතර 1 වන සහ 2 වන මට්ටමට ගැනෙන කේවල වශයෙන් හානිකරණයට ලක් නොවූ මූල්‍ය වත්කම් සාමූහික පදනම මත අපේක්ෂිත හානිකරණ අලාභය ගණනය කරනු ලැබේ.

ණය උපකරණ වල හානිර හෝ අභ්‍යන්තර ලක්ෂණ මත පදනම්ව එම උපකරණ කුඩා කණ්ඩායම් වලට කාණ්ඩගත කිරීම බැංකුව විසින් සිදු කරයි.

එම ලක්ෂණ පහත දැක්වේ.

- උපකරණ වල ස්වභාවය
- සුරැකුමේ ස්වභාවය
- හිඟහිටි දින ගණන
- කර්මාන්තය

අපේක්ෂිත ණය හානිය ගණනය කිරීම

අපේක්ෂිත ණය හානිය, ඇතිවිය හැකි සිදුවීම් තුනක බරතැබූ සම්භාවිතාවය ඇසුරෙන් ගණනය කරනු ලැබේ. ගිවිසුම අනුව ලැබිය යුතු මුදල් ප්‍රමාණය සහ ආයතනය විසින් ලැබෙයැයි අපේක්ෂිත මුදල් ප්‍රමාණය අතර වෙනස මුදල් හිඟය වේ.

අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීමේ යාන්ත්‍රණය සහ එහි ප්‍රධාන උපාංගයන් පහත සඳහන් පරිදි වේ.

- **පැහැර හැරීමේ සම්භාවිතාවය (PD):** පැහැර හැරීමේ සම්භාවිතාවය යනු කිසියම් කාල සීමාවක් තුළදී ණය පැහැර හැරීමේ සම්භාවිතාවය පිළිබඳව තක්සේරුවකි. වත්කම පෙර කාලච්ඡේදයකදී පොත්වලින් ඉවත් කර නොමැති නම් හා තවමත් එම වත්කම ආයෝජන කළඹ තුළ ඇත්නම් යම් නිශ්චිත කාලච්ඡේදයක් පුරාවට පැහැර හැරීම සිදුවේ.
- **ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය (EAD):** ණය පැහැර හරින අවස්ථාවේදී නිරාවරණ අගය යනු අනාගත දිනකදී පැහැර හැරීම සිදුවන අවස්ථාවේදී පැහැර හැරීම සිදුවන අගයයි. මෙම අගය ගණනය කරනු ලබන්නේ වාර්තාකරන දිනට පසුව සිදුවන ණය ගෙවීම් වැනි අඩුකිරීම් ගැලපීමෙන් පසු ලැබෙන නිරාවරණය වීමේ අගය වේ.
- **පැහැර හැරීමේ අලාභය (LGD):** පැහැර හැරීමේ අලාභය යනු කිසියම් පැහැර හැරීමක් සිදුවන අවස්ථාවක ඇතිවන අලාභයේ ඇස්තමේන්තුවක් වේ. යම් කිසි කාලච්ඡේදයක් තුළදී පැහැර හැරීමෙන් පසුව සුරැකුම් උපලබ්ධි කිරීම් වැනි දෑ සැලකිල්ලට ගනිමින් ලැබෙතැයි අපේක්ෂිත මුදල් ප්‍රමාණය හා ගිවිසුම්ගත මුදල් ප්‍රමාණය අතර වෙනස මත පැහැර හැරීමේ අලාභය පදනම් වේ.

අපේක්ෂිත ණය හානිය ගණනය කරන විට බැංකුව විසින් පදනම් සිද්ධිය, හොඳම සිද්ධිය සහ නරකම සිද්ධිය ලෙස ගනිමින් එවැනි සිදුවීම් තුනේ සිදුවීම මත පදනම් වේ. මෙම එක් එක් සිදුවීම සිදුවීමේ අලාභය එකිනෙකට වෙනස් නොවූ අනුපාතය සමඟ බැඳී ඇත. සියලුම මූල්‍ය උපකරණ සඳහා ණය අලාභය නිර්ණය කල හැකි උපරිම කාල පරිච්ඡේදය වන්නේ එම උපකරණයේ ගිවිසුම්ගත පසු කාලයයි.

අනාගත තොරතුරු

අපේක්ෂිත ණය අලාභය ගණනය කිරීමේ ආකෘතිය තුළ පුළුල් පරාසයක ගුණාත්මක/ප්‍රමාණාත්මක ඉදිරි දැක්මක් සහිත තොරතුරු ආර්ථික ආදාන ලෙස භාවිතා කරයි. එම ආදාන පහත දැක්වේ.

ප්‍රමාණාත්මක	ගුණාත්මක
දළදේනි. වර්ධනය	රාජ්‍ය ප්‍රතිපත්ති
උද්ධමනය	කර්මාන්තයේ තත්ත්වය
සේවා වියුක්තිය	නෛතික බලපෑම
පොළි අනුපාත	
විනිමය අනුපාත	

ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 9 නිසා බැංකුවට සිදුවීමට අපේක්ෂිත බලපෑමේ සාරාංශය පහත දැක්වේ.

බලපෑම් වන අංශය	ශ්‍රී ල.ගි.ප්‍ර. 39 අනුව අවශ්‍යතාව	ශ්‍රී ල.මූ.වා.ප්‍ර. 9 අනුව අවශ්‍යතාව	විය හැකි බලපෑම
මූල්‍ය වත්කම් වර්ගීකරණය හා මැනීම	මූල්‍ය වත්කම් වර්ගීකරණය එම උපකරණයේ අලෙවි කිරීමේ හා කල්පිරෙන තෙක් තබාගැනීමේ අරමුණ මත පදනම් වේ. ඒ අනුව පහත සඳහන් ආකාරයට මූල්‍ය වත්කම් වර්ග කරයි. • කල් පිරෙන තෙක් දරාසිටින • ණය හා ලැබිය යුතු දෑ • ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම්කරන ලදී • උපලබ්ධිය සඳහා පවතින	මූල්‍ය උපකරණ වර්ගීකරණය එම මූල්‍ය උපකරණයේ ලක්ෂණ හා ව්‍යාපාර ආකෘතිය මත තීරණය වේ. මේ අනුව පහත ආකාරයට මූල්‍ය උපකරණ වර්ග කරනු ලබයි. • ක්‍රමක්ෂය පිරිවැය • ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම්කල • වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට නම්කල	ආයතනය විසින් වෙනත් විස්තීර්ණ ආදායම මඟින් සාධාරණ අගයට නම් කල ව්‍යාපාර වල ස්කන්ධ උපකරණ වල කර ඇති ආයෝජන වල මිල වෙනස් වීමේ ලාභ හෝ පාඩු කිසිවක් ලාභ හෝ පාඩු ප්‍රකාශයේම දැක්විය නොහැක. ප්‍රමාණාත්මක බලපෑමක් නැත.
මූල්‍ය වගකීම්	පහත ආකාරයට වර්ගීකරණය කරනු ලැබේ. • ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම්කල • ක්‍රමක්ෂය පිරිවැය	පහත ආකාරයට වර්ගීකරණය කරනු ලැබේ. • ලාභ හෝ පාඩු මඟින් සාධාරණ අගයට නම්කල • ක්‍රමක්ෂය පිරිවැය	වෙනසක් නැත
හානිකරණය	ඇති වූ හානි ආකෘතිය	තක්සේරු අලාභ ආකෘතිය	• ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා සාංගමික ණයකර හානිකරණයට යටත් වේ. • ණය අවදානම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති ක්‍රියාකාරිත්වයේ පවතින ණය සඳහාද වත්කම් ආයුකාලය පුරා අපේක්ෂිත හානිකරණයට වෙනස්කිරීම් කරනු ලබයි. • එකඟ වූ ණය පහසුකම් වල ලබානොගෙන ඇති ණය සඳහාද හානිකරණය ගණනය කරයි. • ආර්ථික සාධක ගැලපීම මඟින් ආර්ථික සාධක වල අනාගත වෙනස්වීම් මඟින් ඇතිවන බලපෑම සැලකිල්ලට ගනී.
හෙජින් ගිණුම්කරණය	අතීතයේදී හෙජින් උපකරණයේ සඵලදායිබව සලකා බැලෙන අතර එම සඵලදායිබව 80% - 125% අතර අගයක පැවතිය යුතුයි.	80% - 125% අතර ප්‍රමාණාත්මක කාර්යක්ෂමතාවය ඉවත්කර ඇති අතර උපකරණයේ ගුණාත්මක සාධක සලකා බලමින් උපකරණයේ සඵලදායිතාව තීරණය කරයි.	බලපෑමක් නැත.

ශ්‍රී ල.ගි.ප්‍ර. 39 සිට ශ්‍රී ල.මු.වා.ප්‍ර. 9 වෙත පරිවර්තනය වීමේ ක්‍රියාවලිය තවම අවසන් නොමැති අතර අපේක්ෂිත ණය හානිය ගණනය කිරීමට භාවිතා කරණ ආකෘතීන්, නව ගිණුම්කරණ ප්‍රතිපත්ති, උපකල්පන විනිශ්චයන් සහ තහවුරු කරන ක්‍රමවේදයන් ශ්‍රී.ල.ගි.ප්‍ර. 9 ට අනුරූපී ලෙස සැකසීමේ ක්‍රියාවලිය තවම සිදුවන අතර එම ක්‍රියාවලිය අරම්භක මූල්‍ය වාර්ථා කෙටුම්පත් කල පසු අවසන් වේ. එමෙන්ම 2017 දෙසැම්බර් 31 වැනි දිනට බැංකුවේ ශේෂයන් කෙරෙහි වන බලපෑම බැංකුව විසින් තවම තක්සේරු කරමින් පවතී. එම නිසා එහි බලපෑම ප්‍රමානාත්මක වශයෙන් හෙළදරව් කර නැත. එමෙන්ම සමූහයද එම බලපෑම තවම තක්සේරු කර නොමැත.

(ii) ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 15 - ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම් මත ආදායම

ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 15 මඟින් ගනුදෙනුකරුවෙකු සමඟ ඇතිවන ගිවිසුමක් මඟින් ඇතිවන ආදායම හා මුදල් ප්‍රවාහවල ස්වාභාවය, ප්‍රමාණය, කාලය සහ අවිනිශ්චිතතාවය පිළිබඳ ඵලදායක තොරතුරු ඇතුළත් වාර්තාවක් මූල්‍ය ප්‍රකාශන පරිහරණය කරන්නන් සඳහා ඉදිරිපත් කිරීමට මෙම ප්‍රමිතිය මඟින් අවශ්‍ය මූලධර්ම ඉදිරිපත් කෙරේ.

ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 15 මඟින් ගනුදෙනුකරුවන් සමඟ ඇති ගිවිසුම් මඟින් ජනනය වන ආදායම් හඳුනා ගැනීම සඳහා පස් පියවර ප්‍රවේශයක් හඳුන්වා දෙන අතර සියලුම අනෙකුත් වර්තමානයේ බලපැවැත්වෙන ආදායම් ගිණුම්කරණ ප්‍රමිත සහ සම්බන්ධිත නිර්වචනයන් මෙමඟින් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.(ශ්‍රී ලං.ගි.ප්‍ර. 18 "ආදායම්", "ශ්‍රී ල.ගි.ප්‍ර. 11 "ඉදිකිරීම් කොන්ත්‍රාත්", ජ.මු.වා.අ.ක. (I F R I C)-13- "පාරිභෝගික පක්ෂපාති වැඩසටහන්")

ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 15, 2018 ජනවාරි 1 වෙනි දින සිට අනුගමනය කළ යුතු අතර ඊට පෙර ද අනුගමනය කිරීමට අවසර දී ඇත. කෙසේ වෙතත් සමූහයේ මූල්‍ය ප්‍රකාශන සඳහා සැලකිය යුතු මට්ටමේ බලපෑමක් ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 15 මඟින් ඇතිවේ යැයි බලාපොරොත්තු නොවේ.

(iii) ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 16 - කල්බදු

ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 16 මඟින් කල්බදු සඳහා වන වර්තමාන ද්විත්ව ගිණුම්කරණ ආකෘති වන ශේෂ පත්‍ර දින ඇති මූල්‍ය කල්බදු සහ ශේෂ පත්‍රයෙන් බැහැර මෙහෙයුම් කල්බදු සඳහා වන වෙනස බැහැර කරනු ලැබේ. ඒ වෙනුවට දැනට පවතින මූල්‍ය කල්බදු ගිණුම්කරණයට සමාන ශේෂපත්‍රය මත ගිණුම් තබන්නාවු ගිණුම්කරණ ක්‍රමයක් අනුගමය කෙරේ. මෙම ප්‍රමිතය මඟින් ශ්‍රී ල ගි ප්‍ර 17 "කල්බදු", ජ.මු.වා.අ.ක. (I F R I C)- 4- "ගිවිසුමේ කල්බදු ගිණුමක් ඇත්දැයි තිරණය කිරීම", ප්‍ර.අ.ක. (S I C)-5- "මෙහෙයුම් කල්බදු දිරි දීමනා" සහ ප්‍ර.අ.ක. (S I C) -27 "ගනුදෙනුවල හරය කල්බදු හා සම්බන්ද නිත්‍යනුකූල ආකෘතිය සමග ඇගයීම" යන ගිණුම්කරණ ප්‍රමිත සහ සම්බන්ධිත නිර්වචනයන් ප්‍රතිස්ථාපනය කරනු ලැබේ.

ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 16, 2019 ජනවාරි 1 දින හෝ ඊට පසු ආරම්භ වන මූල්‍ය වර්ෂ සඳහා බල පැවැත් වේ. සමූහය විසින් ශ්‍රී ලං.මු.වා.ප්‍ර. 16 භාවිතා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතිවිය හැකි බලපෑම පිළිබඳ තක්සේරු කරමින් සිටී.

7 මුළු ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ආර්ථික ප්‍රතිලාභ බැංකුවට/සමූහයට ගලා ආ බවට විශ්වාසනීය ලෙස මැනිය හැකිතාක් දුරට ආදායම් හඳුනාගනු ලැබේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
පොළී ආදායම (සටහන 8.1)	171,343,888	134,685,338	177,746,357	139,701,569
ගාස්තු සහ කොමිස් ආදායම (සටහන 9.1)	9,178,655	8,739,625	9,436,780	8,983,083
වෙළඳපොල ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 10)	2,802,048	2,061,616	2,822,168	2,037,390
මූල්‍ය ආයෝජනවලින් ලත් ශුද්ධ ලාභ/(පාඩු) (සටහන 11)	905,527	273,881	925,733	312,273
වෙනත් මෙහෙයුම් ආදායම් (සටහන 12)	4,981,277	8,360,912	6,081,923	8,666,910
මුළු ආදායම	**189,211,395**	**154,121,372**	**197,012,961**	**159,701,225**

8 ශුද්ධ පොළී ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

පොළී ආදායම හා වියදම සඵල පොළී අනුපාත ක්‍රමය පදනම් කර ගනිමින් ලාභ හෝ පාඩු ප්‍රකාශනය තුළ හඳුනාගනු ලබයි.

ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ සඳහන් කර ඇති පොළී ආදායම හා වියදම යටතේ පහත සඳහන් අයිතමයන් ඇතුළත් වේ.

- ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබූ මූල්‍ය වත්කම් හා වගකීම් වලින් ජනිත වන්නා වූ පොළී ආදායම හා වියදම.
- වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින මූල්‍ය උපකරණ වලින් ජනිත වන්නා වූ පොළී ආදායම.
- උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන වලින් ජනිත වන්නා වූ පොළී ආදායම.

සඵල පොළී අනුපාතය (EIR)

සඵල පොළී අනුපාතය යනු මූල්‍ය වත්කමට හෝ වගකීමට අදාළව ජනනය වන්නා වූ හෝ ගෙවනු ලබන මුදල් ප්‍රවාහය අදාළ වත්කමේ හෝ වගකීමේ ධාරණ අගයට සමාන වීමට වට්ටම් කළ යුතු අනුපාතය වේ. මෙම සඵල පොළී අනුපාතය ගණනය කරන විට මූල්‍ය උපකරණ තුළ සියළුම ගිවිසුම්ගත කොන්දේසි සලකා බලා මුදල් ප්‍රවාහය තක්සේරු කරයි.

මූල්‍ය උපකරණ හුවමාරු කිරීමේදී අදාළ වන සේවා ගාස්තු ලැබීම් හෝ ගෙවීම් හා ගනුදෙනු පිරිවැය සඵල පොළී අනුපාතය ගණනය කිරීමේ දී එහි ඇතුළත් වේ. ගනුදෙනු පිරිවැය තුළ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් අත්පත් කර ගැනීම හෝ නිකුත් කිරීමට සම්බන්ධ සෘජුවම ගතහැකි වර්ධන වියදම් ඇතුළත් වේ. ණය හානිකරණය වූ මූල්‍ය වත්කම් සඳහා අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහය ඇස්තමේන්තු කර ඒ ඇසුරෙන් හානිකරණය ගැලපූ සඵල පොළී අනුපාතය ගණනය කරනු ලබයි.

8.1 පොළී ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
මුදල් සහ මුදල් හා සමාන දෑ	716,983	464,027	794,400	560,812
බැංකුවල ඇති තැන්පතු	623,881	580,833	688,805	646,813
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	1,082,293	561,823	1,059,185	615,444
මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	585,342	428,314	586,073	428,314
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	11,540,713	11,807,028	11,661,827	11,847,619
ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම්	124,890,681	93,898,806	130,663,714	98,376,809
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	754,802	151,785	996,946	342,840
මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් දරා සිටින	31,149,193	26,792,722	31,295,407	26,882,918
මුළු පොළී ආදායම	**171,343,888**	**134,685,338**	**177,746,357**	**139,701,569**

ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය සහ අත්තිකාරම්වල පොළී ආදායම තුළ 2017 වර්ෂය සඳහා රු. මිලියන 1,258.7 (2016 : රු. මිලියන 441.5) ක හානිකරණ වූ ණය මත පොළිය ඇතුළත් වේ.

8.2 පොළී වියදම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
බැංකුවලට ගෙවිය යුතු	30,262	11,607	33,853	262,192
ප්‍රතිමිලට ගැණුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්	5,464,801	6,521,994	5,495,603	6,559,119
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	92,229,110	57,907,175	94,518,371	59,437,884
වෙනත් ණය ගැනීම්	10,249,478	11,716,862	10,510,630	11,663,625
නිකුත් කළ ණය සුරැකුම්පත්	399,087	1,365,604	1,147,939	2,026,725
යටත් කාලීන ණය	4,614,958	3,204,608	4,549,859	3,145,532
මුළු පොළී වියදම	**112,987,696**	**80,727,850**	**116,256,255**	**83,095,077**
ශුද්ධ පොළී ආදායම	**58,356,192**	**53,957,488**	**61,490,102**	**56,606,492**

8.3 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් ලද ශුද්ධ පොළී ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
පොළී ආදායම	32,623,129	27,710,618	32,823,130	27,905,965
අඩු කළා : පොළී වියදම	5,464,801	6,521,994	5,495,603	6,559,119
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්වලින් ලද ශුද්ධ පොළී ආදායම	27,158,328	21,188,624	27,327,527	21,346,846

8.4 ද්විතීයික වෙළඳපොලේ ගනුදෙනු වෙනුවෙන් රජයේ සුරැකුම්පත් මත රඳවා ගැනීමේ බද්ද සඳහා නාමික බදු බැර

2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධනයන්ගේ 137 වන වගන්තියේ විධිවිධාන වලට අනුව රජයේ සුරැකුම්පත් මත ද්විතීයික වෙළඳපොලේ ගනුදෙනුවලින් ලබන පොළී ආදායම මත බැංකුවට නාමික බදු බැර සඳහා නිමිකම් [ශුද්ධ පොළී ආදායමෙන් නමයෙන් එකක් (1/9)] ඇත. ඒ සඳහා එකී පොළී ආදායම එම තක්සේරු වර්ෂයේ ව්‍යවස්ථාපිත ආදායමෙහි කොටසක් විය යුතුය. ඒ අනුව, රජයේ සුරැකුම්පත් මත ද්විතීයික වෙළඳපොලෙන් බැංකුව සහ සමූහය විසින් උපයන ලද ශුද්ධ ආදායම මූල්‍ය ප්‍රකාශනවල සමුච්චිත කොට දක්වා ඇති අතර, එමඟින් ඇතිවන නාමික බදු බැර බැංකුව සඳහා රු. මිලියන 2,165.0 (2016 - රු. මිලියන 1,844.3) සහ සමූහය සඳහා රු. මිලියන 2,206.4 (2016 - රු. මිලියන 1,893.6) වේ.

9 ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහය විසින් පුළුල් පරාසයක සේවා සැපයීම මඟින් ලබා ගන්නා ලද ආදායම, ගාස්තු සහ කොමිස් ආදායම තුළ අන්තර්ගත වේ.

එම ආදායම පහත පරිදි ප්‍රධාන අංශ දෙකක් යටතේ වර්ග කළ හැකිය.

I. යම් නිශ්චිත කාලයක් පුරා ලබා දී ඇති සේවා වෙනුවෙන් උපයාගන්නා ලද කොමිස්.

යම් නිශ්චිත කාලයක් පුරා සේවා සැපයීම වෙනුවෙන් ලබාගන්නා ලද ගාස්තු හා කොමිස් එම කාලය පුරාම උපචිත පදනම යටතේ හඳුනාගනු ලබයි. මෙහි කොමිස් ආදායම් සහ පුද්ගලික ධනය හා වත්කම් කළමනාකරණ ගාස්තු, භාරකාරත්ව සේවා, වෙනත් කළමනාකරණ සේවා හා උපදේශන ගාස්තු අන්තර්ගත වේ.

II. සැලකිය යුතු ගනුදෙනුකාර සේවාවන් ඉටුකිරීම සම්බන්ධයෙන් උපයන ගාස්තු හා කොමිස් ආදායම.

ව්‍යාපාර සැලසුම් සකස් කිරීම, කොටස් මිල දී ගැනීමේ ගනුදෙනු වලට සහභාගී වීම, ව්‍යාපාර මිල දී ගැනීමේ හෝ විකිණීමේ ගිවිසුම් වැනි ක්‍රියාවන් වලට අදාළ කාර්යය සම්පූර්ණ කළ පසු අදාළ ගාස්තු හා කොමිස් ආදායම හඳුනාගනු ලබයි.

සේවා ලබා ගැනීම වෙනුවෙන් දරනු ලබන ගාස්තු හා කොමිස් වියදම් උපචිත පදනමට හඳුනා ගනු ලබයි.

9.1 ගාස්තු සහ කොමිස් ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
වෙළඳ සේවා	2,017,427	1,925,657	2,157,147	1,966,365
හර හා ණය කාඩ්පත් සම්බන්ධිත සේවා	2,646,648	2,061,285	2,646,648	2,061,285
සංචාරක හා ප්‍රේෂණ	916,007	833,768	916,007	833,768
භාරකාරත්ව සේවා	65,514	57,183	65,514	57,183
ශාඛා බැංකු සේවා	2,107,808	2,212,222	2,117,176	2,212,222
ඇපකර සම්බන්ධිත සේවා	1,220,235	1,313,247	1,221,301	1,314,382
වෙනත් මූල්‍ය සේවා	205,016	336,263	312,987	537,878
මුළු ගාස්තු සහ කොමිස් ආදායම	**9,178,655**	**8,739,625**	**9,436,780**	**8,983,083**

9.2 ගාස්තු සහ කොමිස් වියදම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
වෙළඳ සේවා	95,306	79,710	95,306	79,710
හර හා ණය කාඩ්පත් සම්බන්ධිත සේවා	1,448,287	1,100,633	1,448,287	1,100,633
සංචාරක හා ප්‍රේෂණ	105,762	93,857	105,762	93,857
ශාඛා බැංකු සේවා	216,860	221,193	227,999	221,193
ඇපකර සම්බන්ධිත සේවා	8,562	9,241	8,562	9,241
වෙනත් මූල්‍ය සේවා	8,525	15,556	86,458	102,637
මුළු ගාස්තු සහ කොමිස් වියදම	**1,883,302**	**1,520,190**	**1,972,374**	**1,607,271**
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	**7,295,353**	**7,219,435**	**7,464,406**	**7,375,812**

10 වෙළඳපොල ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ස්ථාවර ආදායම් ලැබෙන සුරැකුම් හා ස්කන්ධයන් විකිණීමෙන් ලැබූ ලාභ පාඩු, එම උපකරණ වෙළඳපොල අගය මත තක්සේරු කිරීමෙන් ලැබූ ලාභ හෝ පාඩු, වෙළඳපොල ගනුදෙනු වලින් ලැබූ විදේශ විනිමය ලාභ හෝ පාඩු, වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින ස්කන්ධයන්ගෙන් ලැබූ ලාභාංශ ආදායම සහ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ වෙළඳපොල අගයට තක්සේරු කිරීමෙන් ලැබූ ලාභ හෝ පාඩු මේ යටතේ දක්වා ඇත.

ලාභාංශ ලබා ගැනීමට බැංකුවට හෝ සමූහයට ඇති අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
විදේශ විනිමය				
බැංකුවලින්	1,479	6,959	20,403	24,561
වෙනත් ගනුදෙනුකරුවන්ගෙන්	2,709,355	2,075,002	2,721,536	2,086,767
රාජ්‍ය සුරැකුම්පත්				
වෙළඳපොල අගය මත සුරැකුම් අගය කිරීමේ ලාභ/(පාඩු)	75,448	1,865	75,448	1,865
සුරැකුම් විකිණීමේ ලාභ/(පාඩු)	48,276	405,122	48,276	405,122
ස්කන්ධයන්				
වෙළඳපොල අගය මත ස්කන්ධයන් අගය කිරීමේ ලාභ/(පාඩු)	(174,510)	(560,428)	(170,717)	(587,115)
ස්කන්ධ විකිණීමේ ලාභ/(පාඩු)	30,217	19,422	7,008	(20,611)
ලාභාංශ ආදායම	111,783	113,674	120,214	126,801
වෙළඳපොල ගනුදෙනුවලින් ලද ශුද්ධ ලාභ/(පාඩු)	**2,802,048**	**2,061,616**	**2,822,168**	**2,037,390**

11 මූල්‍ය ආයෝජනයන්ගෙන් ලද ශුද්ධ ලාභ/(පාඩු)

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය ආයෝජන විකිණීමෙන් ලද ලාභ හෝ පාඩු සහ එම මූල්‍ය ආයෝජන මගින් ලැබූ ලාභාංශ ආදායම, මූල්‍ය ආයෝජනයන්ගෙන් ලද ශුද්ධ ලාභ/(පාඩු) යටතේ දැක් වේ.

ලාභාංශ ලබා ගැනීමට බැංකුවට හෝ සමූහයට ඇති අයිතිය ස්ථාපිත වූ විට ලාභාංශ ආදායම හඳුනා ගනු ලබයි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින				
රජයේ සුරැකුම්පත් හා විකිණීමේ ලාභ/(පාඩු)	332,937	107,708	332,937	107,708
ලාභාංශ ආදායම	572,590	166,173	592,796	204,565
මූල්‍ය ආයෝජනයන්ගෙන් ලද ශුද්ධ ලාභ/(පාඩු)	**905,527**	**273,881**	**925,733**	**312,273**

12 වෙනත් මෙහෙයුම් ආදායම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

පරිපාලිත හා ආශ්‍රිතයන්ගෙන් ලද ලාභාංශ ආදායම
පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වලින් ලද ලාභාංශ ආදායම මෙහි දැක්වේ. එය හඳුනා ගනු ලබන්නේ බැංකුවට එම ලාභාංශ ලැබීමේ අයිතිය තහවුරු වූ පසුව වේ.

මූල්‍ය නොවන වත්කම් විකිණීමෙන් ලද ලාභ
දේපල, පිරියත හා උපකරණ සහ පරිපාලිත හා ආශ්‍රිත සමාගම් ඇතුළුව වෙනත් ජංගම නොවන වත්කම් බැහැර කිරීමට අදාළ ලාභ හෝ පාඩු මෙහි අන්තර්ගත වේ. ලාභය හෝ පාඩුව ගණනය කරනු ලබන්නේ විකුණුම් අගයෙන් වත්කමේ පොත් අගය සහ අදාළ වියදම් අඩු කිරීමෙනි.

විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)
විදේශ විනිමය වත්කම් හා වගකීම් සෑම වාර්තා කරන දිනයකම නැවත අගය කරනු ලබයි. මෙම වත්කම් හා වගකීම් වල සාධාරණ අගයන් වෙනස් වීම ලාභ හෝ පාඩු ප්‍රකාශනය තුළ අදාළ කාලපරිච්ඡේදය තුළදී හඳුනා ගනු ලබයි.

කුලී ආදායම
කුලී ආදායම උපචිත පදනම යටතේ හඳුනා ගනී. බැංකු පරිශ්‍රය කුලියට දීමෙන් ලැබූ ආදායම, නිල නිවාස කුලියට දීමෙන් ලැබූ ආදායම, සුරක්ෂිතාගාර වලින් ලද ආදායම හා බැංකු පරිශ්‍රයට අදාළ කල්බදු කුලිය අයකර ගැනීම තුළින් ලද කුලී ආදායම මෙහි අන්තර්ගත වේ.

සේවා ආදායම
ණය දීම්, බදු දීම් වලින් අයකර ගත් ප්‍රලේඛන ආදායම්, ණය හා තොරතුරු කාර්යාංශ සොයා බැලීම්, නීති සේවා සැපයීම් හා නියෝජිත බැංකු වලට සේවා සැපයීම් තුළින් ලබා ගත් ආදායම් මෙහි දැක් වේ. සේවා ආදායම උපචිත පදනමට හඳුනා ගනී.

දළ රක්ෂණ වාරික
අභිමතානුසාරී සහභාගිත්ව ලක්ෂණ (අ.ස.ල.) සමඟ ඇති ජීවිත සහ ආයෝජන ගිවිසුම්වල නැවත ගෙවිය යුතු දළ වාරික ඔප්පු හිමියන්ගෙන් ලැබිය යුතු විට ඒවා ආදායම් ලෙස හඳුනා ගනී. එක් වාරිකයක් පමණක් ලැබෙන විට ආදායම හඳුනා ගනු ලබන්නේ ඔප්පුව බල සහිත වන දින දීය.

සාමාන්‍ය දළ රක්ෂණ වාරික මුදල් ලෙස සමන්විත වන්නේ ගිණුම්කරණ කාලය තුළ දී ඇතුළු වන විට ලැබිය යුතු මුළු ගිවිසුම් කාලය සඳහාම අදාළ වාරික මුදල්ය. එය ගිවිසුම ආරම්භ වන දිනයේ දීම හඳුනා ගනු ලැබේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
පරිපාලිත හා ආශ්‍රිතයන්ගෙන් ලද ලාභාංශ ආදායම්	76,680	1,102,158	–	–
මූල්‍ය නොවන වත්කම් විකිණීමෙන් ලද ලාභ*	–	3,130,000	–	2,378,666
විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)	701,621	1,069,579	701,621	1,069,579
දේපල, පිරියත හා උපකරණ විකිණීමේ ලාභ/(පාඩු)	55,105	51,643	59,399	87,249
අත්පත් කරගත් දේපල විකිණීමෙන් ලද ලාභ/(පාඩු)	70,866	19,052	70,866	19,052
කුලි ආදායම	250,454	231,326	329,905	298,791
සේවා ආදායම	2,043,604	2,143,545	2,403,599	2,611,013
රත්රන් විකිණීමෙන් ලද ලාභය	15,342	13,025	15,342	13,025
විවිධ ආදායම්	1,554,635	448,187	1,656,118	797,373
දළ රක්ෂණ වාරික	–	–	632,103	1,239,765
ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම (සටහන 12.1)	212,970	152,397	212,970	152,397
මුළු වෙනත් මෙහෙයුම් ආදායම්	**4,981,277**	**8,360,912**	**6,081,923**	**8,666,910**

*බැංකුවේ ආශ්‍රිත සමාගමක් වූ සී/ස මීර්කා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගම විකිණීමෙන් ලද ලාභය මූල්‍ය නොවන වත්කම් විකිණීමෙන් ලද ලාභය තුළ අන්තර්ගත වේ.

12.1 ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව/සමූහය	
	2017 රු. '000	2016 රු. '000
ඉස්ලාමීය බැංකුකරණ මෙහෙයුම්වලින් ලද ආදායම	364,126	252,846
අඩුකළා : ආයෝජකයන්ට ගෙවූ ලාභ	151,156	100,449
ඉස්ලාමීය බැංකුකරණයෙන් ලද ශුද්ධ ආදායම	**212,970**	**152,397**

13 ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය) කිරීම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

ණය හා අත්තිකාරම් සඳහා වූ හානිකරණයට අදාළ වෙන් කිරීම් වෙනස්වීම බැංකුව හා සමූහය විසින් ශ්‍රී ලං.ගි.ප්‍ර. 39 ට ආදාළව හඳුනා ගනී. වැඩි විස්තර සටහන් අංක 27 ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම් යටතේ දක්වා ඇත.

තවද බැංකුව හා සමූහය විසින් මූල්‍ය නොවන ස්ථාවර වත්කම් සඳහා හානිකරණයන් වෙතොත් එයද හඳුනා ගනී. එම හානිකරණය හඳුනා ගනු ලබන්නේ ශ්‍රී ලං.ගි.ප්‍ර. 36 ට අනුව ධාරණ අගය වත්කමේ නැවත අයකර ගත හැකි අගයට වඩා වැඩි නම් පමණි.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
ණය සහ අත්තිකාරම් සඳහා ශුද්ධ හානිකරණ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය) (සටහන 13.1)	9,640,658	4,396,761	9,884,889	4,421,000
වෙනත් ආයෝජන සඳහා ශුද්ධ හානිකරණ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය) (සටහන 30.2)	(300,000)	–	–	–
ණය සහ අත්තිකාරම් සඳහා ශුද්ධ හානිකරණ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය)	**9,340,658**	**4,396,761**	**9,884,889**	**4,421,000**

13.1 ණය සහ අත්තිකාරම් සඳහා ශුද්ධ හානිකරණ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
ණය සහ අත්තිකාරම් සඳහා කේවල හානිකරණ ප්‍රතිපාදන (සටහන 13.1.1)	9,631,746	6,685,680	9,676,575	6,765,378
ණය සහ අත්තිකාරම් සඳහා සමූහ හානිකරණ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය)	8,912	(2,288,919)	208,314	(2,344,378)
ණය සහ අත්තිකාරම් සඳහා ශුද්ධ හානිකරණ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය)	**9,640,658**	**4,396,761**	**9,884,889**	**4,421,000**

13.1.1 ණය සහ අත්තිකාරම් සඳහා කේවල හානිකරණය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
වර්ෂය තුළ හානිකරණ ප්‍රතිපාදනයන්	11,713,536	9,209,538	11,758,365	9,289,236
අඩුකළා : වර්ෂය තුළ ප්‍රතිවර්ත්‍ය/අයකරගත් අගය	2,081,790	2,523,858	2,081,790	2,523,858
වර්ෂය තුළ ශුද්ධ කේවල හානිකරණ ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය)	**9,631,746**	**6,685,680**	**9,676,575**	**6,765,378**

14 සේවක මණ්ඩල වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සේවක පාරිශ්‍රමික, නිශ්චිත දායකත්ව හා ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය හා සේවක මණ්ඩලය සඳහා දරනු ලබන වෙනත් වියදම් සේවක මණ්ඩල වියදම් යටතේ ඇතුළත් වේ.

කෙටිකාලීන සේවක ප්‍රතිලාභ වට්ටම් කිරීමෙන් තොරව එම සේවාව ලැබූ කාලච්ඡේදයට අදාළව හඳුනා ගනු ලබයි. සේවකයින්ට ලබා දෙන ඉදිරියේ දී ගෙවීමට අපේක්ෂා කරන කෙටිකාලීන ප්‍රසාද දීමනා වගකීමක් ලෙස හඳුනා ගනු ලබන්නේ අතීතයේ සැපයූ සේවාවන් වෙනුවෙන් සේවකයාට එම මුදල ගෙවීමට නීතිමය හෝ සාධනීය වගකීමක් ඇත්නම් හා එම වගකීම විශ්වාසවන්තභාවයකින් ඇස්තමේන්තු කළ හැකි නම් පමණි.

අභ්‍යන්තර හා බාහිර නීති හා රෙගුලාසිවලට අනුකූලව සේවකයා විසින් නිශ්චිත ප්‍රතිලාභ හා දායකත්ව සැලසුම් සඳහා අරමුදල් දායකත්වය සැපයීමට බැඳී සිටී.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හා නිවාඩු මුදල් කිරීම සඳහා කරන ලද වෙන් කිරීම්වලට අදාළ වියදම් හා ආදායම් ආයුගණක තක්සේරුවක් මගින් ශ්‍රී ලං.ගි.ප්‍ර. 19 ට අදාළව ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ හඳුනාගනු ලබයි.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
සේවක පාරිශ්‍රමික	13,142,117	12,679,264	14,335,669	13,888,137
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය (සටහන 14.1)	1,032,383	1,043,376	1,167,164	1,170,963
නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය (සටහන 14.2)	495,125	1,188,793	562,159	1,250,027
වෙනත් සේවක පිරිවැය	2,326,551	1,932,998	2,658,558	2,100,202
මුළු සේවක මණ්ඩල වියදම්	**16,996,176**	**16,844,431**	**18,723,550**	**18,409,329**

14.1 නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායකත්වය

නිශ්චිත දායකත්ව සැලසුමක් යනු පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් යටතේ ආයතනය විසින් වෙනත් පාර්ශවයකට දක්වන ස්ථාවර දායකත්වයයි. මෙම ස්ථාවර දායකත්ව අගය හැරුනු විට වැඩිමනත් ගෙවීමක් සඳහා වෙනත් නීතිමය හෝ අනුමිත වගකීමක් නොමැත. වාර්තා කරන දින අවසානයට පෙර කරන ලද සේවය උදෙසා වන නිශ්චිත දායකත්ව සැලසුම් වෙනුවෙන් ආයතනය තම වගකීම මත දක්වනු ලබන නිශ්චිත දායකත්වය ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ වාර්තා කරන දිනට අදාළව වියදමක් වශයෙන් හඳුනා ගැනේ. නියමිත දිනට පෙර ගෙවන ලද දායකත්වය එහි මුදල් ප්‍රතිගෙවීමක් හෝ ඉදිරි ගෙවීම්වල අඩුවීමක් ලෙස සලකයි නම් එය වත්කමක් ලෙස හඳුනා ගැනේ. නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා වන දායකත්වය සේවකයන් වෙත ගෙවීම සිදුවන්නේ වාර්තා කරන දින සිට මාස 12 කට පසු කාල පරාසයකින් නම් එය වාර්තා කරන දිනට වන වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ.

ලංකා බැංකුවේ අර්ථසාධක අරමුදල

බැංකුවේ සියලුම සේවකයින් ලංකා බැංකුවේ අර්ථසාධක අරමුදලේ සාමාජිකයෝ වෙති. මෙම අරමුදලට, සේවකයාගේ දළ වැටුපෙන් 12% ක මුදලක් බැංකුව විසින් දායක මුදල් වශයෙන් ගෙවනු ලබන අතර, සේවකයින්ගේ දායක මුදල 8% කි. බැංකුවේ අර්ථසාධක අරමුදල අනුමත අරමුදලක් වන අතර, එය ස්වාධීනව පරිපාලනය කෙරේ.

සේවක අර්ථසාධක අරමුදල

ලංකා බැංකු සේවකයින් හැර සියලුම පරිපාලිතයින් ඔවුන්ගේ සේවකයන් වෙනුවෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා එහි සංශෝධනවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% (ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී 15%) ප්‍රමාණයක් දායක මුදල් ගෙවන අතර, සෑම සේවකයකුගෙන්ම සේවක අර්ථසාධක අරමුදල් සඳහා 8% (ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී 10%) ක දායකත්වයක් දරයි.

සේවක භාරකාර අරමුදල

1980 අංක 46 දරණ සේවක භාරකාර අරමුදල් පනත අනුව, බැංකුව සහ සියලුම පරිපාලිතයින් සේවකයින් සඳහා මෙම අරමුදලට දායක විය යුතු අතර, මාසිකව බැංකුව/සමූහය, දළ වැටුපෙන් 3% ක මුදලක් මේ සඳහා ගෙවනු ලැබේ.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
සේවය දායකත්වය:				
සේවක අර්ථසාධක අරමුදල	827,212	836,910	938,876	939,617
සේවක භාරකාර අරමුදල	205,171	206,466	228,288	231,346
නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා මුළු දායකත්වය	**1,032,383**	**1,043,376**	**1,167,164**	**1,170,963**

14.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායකත්ව සැලසුම් නොවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙත සමූහයේ ශුද්ධ වගකීම හෝ බැඳීම එක් එක් සැලසුම වෙන් වශයෙන් සලකා එම සේවකයන් විසින් ඔවුන්ගේ වර්තමාන සහ පෙර සේවාවන් උදෙසා උපයාගත් අනාගත ප්‍රතිලාභයන් වර්තමාන අගයට වට්ටම් කර, ඉන් සැලසුම්ගත වත්කම්වල සාධාරණ අගය ඉවත් කල පසු අගයට ගණනය කෙරේ. වට්ටම් අනුපාතය ලෙස සලකනු ලබන්නේ වාර්තාකරණ දිනට දිගුකාලීන භාණ්ඩාගර බැඳුම්කරවල ඉපැයුම් අනුපාතයයි. මෙම ගණනය කිරීම් සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් "ප්‍රෝජකථනය කළ ඒකක බැර ක්‍රමය" භාවිතයෙන් ගණනය කෙරේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්හි ගණනය කරන ලද, ලාභ හෝ අලාභ සමූහය විසින් විස්තිරණ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගන්නා අතර, ඊට අදාළ වියදම්, ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ සේවක මණ්ඩල වියදම් යටතේ හඳුනාගනී. වැඩි විස්තර සටහන් අංක 46 යටතේ දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
සේවය දායකත්වය :				
ලංකා බැංකුවේ විශ්‍රාම වැටුප් භාරකාර අරමුදල (සටහන 46.1.1)	936,596	619,988	936,596	619,988
ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ සහ අනත් දරු විශ්‍රාම අරමුදල (සටහන 46.2.1)	(830,309)	(369,423)	(830,309)	(369,423)
විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන (සටහන 46.3)	41,964	23,263	101,498	77,425
ලංකා බැංකුවේ විශ්‍රාම වැටුප් අරමුදල 2014 (සටහන 46.4.1)	137,767	699,789	137,767	699,789
අසනීප නිවාඩු මුදල් කිරීම සඳහා ප්‍රතිපාදන	209,107	215,176	209,107	215,176
විශ්‍රාම අරමුදල - ලංකා බැංකුව (යූ කේ) සමාගම	–	–	7,500	7,072
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා මුළු දායකත්වය	**495,125**	**1,188,793**	**562,159**	**1,250,027**

15 වෙනත් වියදම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වියදම දරනු ලබන කාලපරිච්ඡේදයට අදාළව වෙනත් වියදම් ලාභ හෝ පාඩු ප්‍රකාශනය තුළ හඳුනා ගනී. ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු ඉහත සඳහන් සහ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමට ඉවහල් වන ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීම සඳහා දරන ලද සියළු වියදම් සමූහයේ ලාභය ගණනය කිරීම සඳහා ආදායමෙන් අඩුකර පෙන්වනු ලබයි. අතීත සිදුවීමක් සම්බන්ධයෙන් වර්තමාන වගකීමක් බැංකුවට හෝ සමූහයට ඇති විට දී වෙන් කිරීම් හඳුනා ගනු ලබන අතර, ආර්ථික ප්‍රතිලාභ බැංකුවෙන්/සමූහයෙන් ගලා ගිය බවට විශ්වාසනීය ලෙස මැනිය හැකිනාක් දුරට වියදම් හඳුනාගනු ලැබේ.

තැන්පතු සඳහා රක්ෂණ ගාස්තු

2010 ඔක්තෝබර් 1 දින සිට බලපැවැත්වෙන පරිදි බැංකු පනත යටතේ නිකුත් කර ඇති 2010 අංක 5 දරන විධිවිධානයන්ට යටත්ව ආසන්න විගණිත මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (CAR) මත පදනම්ව සුදුසුකම්ලත් තැන්පතු වගකීම් වලින් 0.1% ක හෝ 0.125% ක ගෙවීමක් කාර්තුමය පදනමින් බැංකුව විසින් තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමයට (වර්තමානයේ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය සහ ද්‍රවශීලතා සහය වැඩසටහන ලෙස හඳුන්වනු ලැබේ) සිදු කළ යුතුය.

ප්‍රතිලාභ හිමිකමේ සහ වියදමේ හඳුනා ගැනීම

ජීවිත රක්ෂණ ගිවිසුම් සඳහා අ.ස.ල. සමඟ ඇති ආයෝජන ගිවිසුම් සඳහා වන දළ ප්‍රතිලාභ සහ හිමිකම්වල ඇතුළත් වර්ෂය තුළ ජනිත වූ හිමිකම් පිරිවැයයි. මෙම පිරිවැයෙහි සැකසුම් කිරීම සහ බේරුම් කිරීම සඳහා ඍජුවම සම්බන්ධවන බාහිර සහ අභ්‍යන්තර පරිහරණය කිරීමේ පිරිවැය සහ අ.ස.ල. ගිවිසුම් සඳහා ප්‍රකාශිත ප්‍රසාද දීමනා ද, එමෙන්ම රක්ෂණයේ දළ තක්සේරුවේ සහ අ.ස.ල සමඟ ඇති අයෝජන ගිවිසුම් හිමිකම්වල සිදුවන වෙනස්වීම් ද ඇතුළත්ය. මරණ හිමිකම් සහ අයිතිය අත් හැරීම වාර්තාවන්නේ දැනුම්දීම ලැබුණු පසුයි. කල් පිරීම් සහ වාර්ෂික ගෙවීම් වාර්තා වන්නේ යථාවත් විටය. අතුරු ගෙවීම් සහ අයිතිය අත්හැරීම් හිණුම්ගත වන්නේ ඒවා බේරුම් කරන විටය.

වර්ෂ අවසාන දිනය දක්වා සිදුව ඇති සිදුවීම් මත හිමිකම් සහ ඒ හා සම්බන්ධ සැකසීමේ සහ බේරුම් කිරීමේ වියදම්, තවමත් දැනුම් දී නැති සිදුවීම් සඳහා හිමිකම්, සුන්බුන් විකිණීමෙන් ලැබෙන ලැබීම් සහ වෙනත් ආවරණය කර ගැනීම්වලින් ලැබිය හැකි ප්‍රමාණය අඩුකළ පසු සහ පසුගිය වසරවල සිට පවතින හිඟ හිමිකම්වලට කරන ගැලපීම් කළ පසු අගය හිමිකම් ලෙස හඳුනා ගනේ. ඍජු සහ අභ්‍යන්තර ප්‍රතිරක්ෂණ ව්‍යාපාර ලෙස නොපිය වූ හිමිකම්වන හිමිකම් වියදම් සහ වගකීම් හඳුනා ගෙන ඇත. වගකීම් ලෙස ආවරණය වනුයේ වාර්තා කළ නමුදු තවම ගෙවා නොමැති හිමිකම්, සිදු වූ නමුදු වාර්තාකර නොමැති හිමිකම්ය. මෙම හිමිකම් පියවීමේ ඍජු සහ වක්‍ර පිරිවැය කලින් අපේක්ෂා කෙරේ. නොපිය වූ හිමිකම් එක් එක් හිමිකම් පාදකව තක්සේරු කර ඇති අතර, මෙහි දී හිමිකම් නිරවුල් කිරීමේ දී ගෙවිය යුතු අවසාන පිරිවැය මත එය ඇස්තමේන්තු කර ඇත. මෙතෙක් සිදුවී ඇති එහෙත් වාර්තා නොකරන ලද හිමිකම් සඳහා වඩාත් නාත්වික ඇස්තමේන්තු කිරීමක් වෙනුවෙන් අතීත පළපුරුදු සහ ප්‍රවනතා මත ගණනය කරන ලද අනාගත බැරකම් පිළිබඳව ආයුගණකවරයෙකුගේ තක්සේරුව ලබා ගනු ලබන අතර, එකී තක්සේරු හිමිකම් නිරවුල් කිරීම සඳහා වන සම්පූර්ණ වගකීම පසුව ලැබෙන තොරතුරු හා සිදුවන සිද්ධීන් මත තීරණය වුවත්, අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන පරිදි වර්තමානයේ පවතින තොරතුරු අනුව හිමිකම් මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත. මෙම තත්ත්වය නිසා ප්‍රතිපාදනය කරන ලද අගයක් වෙනුවෙන් සිදු කරන ගැලපීම් අදාළ කාලච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වේ. හිමිකම් වෙනුවෙන් භාවිතා කරන ලද ක්‍රම හා ඇස්තමේන්තු නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ. ප්‍රතිරක්ෂණ හිමිකම හඳුනාගනු ලබන්නේ එයට අදාළ දළ රක්ෂණ වගකීම ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව හඳුනාගත් විට දීය.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
අධ්‍යක්ෂ පාරිශ්‍රමික	6,255	7,055	14,229	14,348
විගණක ගාස්තු				
විගණන සේවා ගාස්තු	15,145	17,767	28,220	28,391
විගණන නොවන සේවා ගාස්තු	–	–	127	1,301
තැන්පතු රක්ෂණ ගාස්තු	1,615,314	1,280,587	1,643,869	1,304,401
වෘත්තීය හා නීති ගාස්තු	136,301	143,182	197,102	198,417
ආයෝජන දේපල ක්ෂය	117,072	–	2,906	2,961
දේපල, පිරියත සහ උපකරණ ක්ෂය	1,523,783	1,263,914	2,197,108	1,758,041
ගොඩනැගිලි මත ශුද්ධ ප්‍රත්‍යාගණන පාඩු	44,661	–	52,820	–
කල්බදු දේපල ක්‍රමක්ෂය	2,821	2,814	4,178	4,175
අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක්ෂය	281,326	186,468	338,288	234,727
ස්ථාවර වත්කම් නඩත්තු කිරීමේ වියදම්	4,588,624	4,124,359	4,061,002	3,707,238
අතැති රත්රන් තොග සාධාරණ අගයට ගැලපුම්	(3,306,545)	1,733,508	(3,306,545)	1,733,508
ප්‍රතිරක්ෂණ වාරික, හිමිකම් හා වෙනත් ප්‍රතිලාභ	–	–	446,723	1,114,074
කාර්යාල පරිපාලන සහ මෙහෙයුම් වියදම්	5,387,040	4,418,852	6,300,825	5,636,207
මුළු වෙනත් වියදම්	**10,411,797**	**13,178,506**	**11,980,852**	**15,737,789**

16 ආශ්‍රිත සමාගම්වල ලාභ/(පාඩු) කොටස, බදු පසු

ස්කන්ධ ක්‍රමය යටතේ ආශ්‍රිත සමාගම්වල ලාභ හෝ පාඩු කොටස් වල අගය ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සමූහය	
	2017 රු. '000	2016 රු. '000
සී/ස සිබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	26,600	30,156
සී/ස ලංකා සිකියුරිටීස් (පෞද්ගලික) සමාගම	1,362	(8,885)
සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගම	–	21,148
සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලුයුෂන්ස් (පෞද්ගලික) සමාගම	24,062	20,533
ආශ්‍රිත සමාගම්හි මුළු ලාභ/(පාඩු) කොටස, බදු පසු	**52,024**	**62,952**

17 ආදායම් බදු වියදම

සෘජුවම ස්කන්ධය යටතේ හෝ විස්තිරණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනා ගැනෙන අයිතම හැර අනෙකුත් අයිතමයන්ට අදාළ වන ප්‍රවර්තන සහ විලම්බිත බදු, ලාභ හෝ පාඩු ප්‍රකාශනයෙහි හඳුනා ගැනේ.

ප්‍රවර්තන බදු

ප්‍රවර්තන බදු ලෙස හඳුන්වනුයේ වාර්තාකරණ දිනට පවතින බදු අනුපාතය යොදා ගනිමින් වර්ෂය සඳහා බදු අයකළ හැකි ආදායම හෝ පාඩුව මත ගණනය කරන ලද බදු ගෙවීම හෝ ලැබීමයි. තවද පෙර වර්ෂයන් හි බදු ගෙවීම් සඳහා යම් ගැලපීමක් වේ නම් එයද සැලකිල්ලට භාජනය කෙරේ. ප්‍රවර්තන බදු ගෙවීම හෝ ලැබීම් වටිනාකම යනු ආදායම් බදු වෙන්ස්වීම කෙරෙහි බලපාන යම් අවිනිශ්චිතතාවයක් පිළිබිඹු වේ නම්, බදු ලැබීමක හෝ ගෙවීමක සිදුවිය හැකි ප්‍රශස්ථ ඇස්තමේන්තුවකි.

මේ අනුව, බදුකරණය සඳහා වර්තමාන ලාභය සඳහා වෙන්කරන ලද බදු මුදල දේශීය ආදායම් බදු පනතේ 2006 අංක 10 දරණ පනත හා එහි සංශෝධන වලට යටත්ව ගණනය කර ඇත.

විදේශීය මෙහෙයුම් මත, ප්‍රවර්තන වර්ෂයේ ගිණුම්කරණ ලාභයෙන් වෙන්කරන ලද බදු මුදල ගණනය කරන ලද්දේ, ඒ ඒ රට වලට අදාළ වන නීති හා රෙගුලාසි මත, වාර්තා කරන දිනට බලපාන හෝ ඉදිරියේදි බලපවත්නා බදු අනුපාත සැලකිල්ලට ගෙන වේ.

විලම්බිත බදු

වැඩි විස්තර සටහන් අංක 36 යටතේ දක්වා ඇත

පහත තොරතුරු ශ්‍රී ලං.ගි.ප්‍ර. 12 - "ආදායම් බදු" වලට අනුකූලව දක්වා ඇත

17.1 ආදායම් බදු වියදමෙහි සංරචක

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
ප්‍රවර්තන බදු වියදම				
වර්ෂයේ ලාභය මත ආදායම් බදු වියදම	8,068,543	5,495,446	8,268,754	5,877,192
ආදායම් බද්දට අදාළව පෙර වර්ෂවල ගැළපුම්	860,873	956,808	876,874	953,463
විලම්බිත බදු වියදම				
විලම්බිත බදු ප්‍රතිපාදන/(ප්‍රතිවර්ත්‍ය) කිරීම (සටහන 36)	101,280	(54,565)	183,290	(99,550)
වර්ෂය සඳහා ආදායම් බදු වියදම	**9,030,696**	**6,397,689**	**9,328,918**	**6,731,105**

17.2 ගිණුම්කරණ ලාභය සහ ආදායම් බදු වියදම සැසඳීම

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
බදු පෙර ගිණුම්කරණ ලාභය	30,342,980	31,188,685	30,815,563	30,117,032
එකතු කලා: සමූහයේ සමාගම්වලින් ලද ලාභාංශ ආදායම	–	–	76,680	1,102,158
	30,342,980	**31,188,685**	**30,892,243**	**31,219,190**
එකතු කලා: ඉඩ නොදෙන වියදම	24,093,557	12,188,589	27,755,668	14,845,661
	54,436,537	**43,377,274**	**58,647,911**	**46,064,851**
අඩු කලා: ඉඩ දෙන වියදම	9,198,542	4,900,759	12,690,036	6,606,075
අඩු කලා: බදු නිදහස් ආදායම	19,405,951	21,889,267	19,463,696	21,941,912
බදු ගෙවිය යුතු ආදායම	**25,832,044**	**16,587,248**	**26,494,179**	**17,516,864**
ප්‍රවර්තන බදු අනුපාතය 28% (2016 - 28%)	7,232,972	4,644,429	7,418,370	4,904,722
සමූහයේ විවිධ බදු අනුපාතයන්ගේ බලපෑම	–	–	7,694	7,803
වෙනත් රටවල වෙනස් බදු අනුපාතයන්ගේ බලපෑම	835,571	851,017	835,571	851,017
අන්තර් සමාගම් ලාභාංශ මත 10% රඳවා ගැනීමේ බද්ද	–	–	7,120	113,650
පෙර වර්ෂ වෙනුවෙන් ප්‍රවර්තන ආදායම් බදු සඳහා ගැළපීම	860,873	956,808	876,873	953,463
විලම්බිත බදු ප්‍රතිපාදන/(ප්‍රතිවර්තන කිරීම) (සටහන 36)	101,280	(54,565)	183,290	(99,550)
වර්ෂය සඳහා ආදායම් බදු වියදම	**9,030,696**	**6,397,689**	**9,328,918**	**6,731,105**
සඵල ආදායම් බදු අනුපාතය (%)	29.8	20.5	30.3	22.3

17.3 නේවාසික සමාගම්වල බදු වගකීම ගණනය කරන්නේ සම්මත අනුපාතය වන 28% (2016- 28%) ට වන අතර පහත සඳහන් බැංකු කටයුතු සහ සමාගම් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ බදු නිදහස් කිරීම් වලට සහ බදු සහනයන්ට හිමිකම් ලබයි.

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017 %	2016 %
දේශීය මෙහෙයුම් සඳහා බදු අනුපාත		
සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම	12	12
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම	12	12
සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම	12	12
සී/ස කොළඳෙනිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම*	10	අදාල නොවේ
විදේශීය මෙහෙයුම් සඳහා බදු අනුපාත		
මාලේ ශාඛාවේ බැංකු කටයුතු	25	25
චෙන්නායි ශාඛාවේ බැංකු කටයුතු	40	40
සීෂෙල්ස් ශාඛාවේ බැංකු කටයුතු		
සීෂෙල්ස් රුපියා 1,000,000 දක්වා	25	25
ඉතිරිය සඳහා	33	33
ලංකා බැංකුව (යූ කේ) සමාගම	19	20

** සී/ස කොළඳෙනිය හයිඩ්‍රොපවර් (පෞද්ලික) සමාගම, ආයෝජන මණ්ඩලය (BOI) සමඟ ඇති කරගත් ගිවිසුමකට අනුව, සමාගමේ ව්‍යාපාරික කටයුතු ආරම්භ කර වර්ෂ දෙකක් හෝ ලාභ උත්පාදනය ආරම්භ කළ වසර යන දෙකින් පළමුව යෙදෙන අවස්ථාවේ සිට වර්ෂ 5 ක කාලයක් බද්දෙන් නිදහස් වේ. බදු නිදහස් කාලය 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය. බදු නිදහස් කාලයෙන් පසු තවත් වසර දෙකක කාලයක් වෙළඳ ලාභය මත 10% ක බදු අනුපාතයකටද ඉන් පසුව 20% බැගින් බද්දට යටත් වෙයි.*

18 කොටසක ඉපැයුම සහ කොටසක ලාභාංශ

18.1 කොටසක මූලික ඉපැයුම

ශ්‍රී ල.ගි.ප්‍ර. - 33 "කොටසක ඉපැයුම" අනුව කොටසක් වෙනුවෙන් මූලික ඉපැයුම ගණනය කරනු ලබන්නේ මව් සමාගමේ සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් ශුද්ධ ලාභය හෝ අලාභය (ලවය) වර්ෂය සඳහා නිකුත් කර තිබූ බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් (හරය) බෙදීමෙනි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017	2016	2017	2016
බැංකුවේ සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් වර්ෂයේ ශුද්ධ ලාභය (රු. '000)	21,312,284	24,790,996	21,470,163	23,496,656
නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය (සටහන 18.1.1)	11,479,452	10,000,000	11,479,452	10,000,000
කොටසක මූලික ඉපැයුම (රු.)	**1,856.56**	**2,479.10**	**1,870.31**	**2,349.67**

18.1.1 නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය

	බැංකුව		සමූහය	
	2017	2016	2017	2016
ජනවාරි 1 වන දිනට නිකුත් කර ඇති සාමාන්‍ය කොටස් ප්‍රමාණය	10,000,000	10,000,000	10,000,000	10,000,000
වර්ෂය තුළ නිකුත් කළ හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	1,479,452	–	1,479,452	–
දෙසැම්බර් 31 දිනට නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	11,479,452	10,000,000	11,479,452	10,000,000

18.2 කොටසක තනුක ඉපැයුම

කොටසක තනුක ඉපැයුම ගණනය කරනු ලබන්නේ, බැංකුවේ කොටස් හිමියන්ට අයත් ලාභය හෝ පාඩුව (ලවය) වර්ෂය සඳහා නිකුත් කර තිබූ බර තැබූ සාමාන්‍ය කොටස් සහ සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කිරීමේ සම්භාවිතාවක් ඇති කොටස්වල බලපෑම ගැලපුම් කළ පසු හරිත සාමාන්‍ය කොටස් ප්‍රමාණයෙන් (හරය) බෙදීමෙනි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017	2016	2017	2016
බැංකුවේ සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් වර්ෂයේ ශුද්ධ ලාභය (රු. '000)	21,312,284	24,790,996	21,470,163	23,496,656
ගැලපුම් සිදු කළ පසු හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය (සටහන 18.2.1)	15,068,493	10,164,384	15,068,493	10,164,384
කොටසක තනුක ඉපැයුම (රු.)	**1,414.36**	**2,439.01**	**1,424.84**	**2,311.67**

18.2.1 ගැලපුම් සිදු කළ පසු හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017	2016	2017	2016
නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සමාන්‍ය කොටස් ප්‍රමාණය	11,479,452	10,000,000	11,479,452	10,000,000
සාමාන්‍ය කොටස්වලට පරිවර්තනය කිරීම සඳහා සම්භාවිතාවක් සහිත විභජනයට ඇති ප්‍රාග්ධනයට අදාළ බර තැබූ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව	3,589,041	164,384	3,589,041	164,384
ගැලපුම් සිදු කළ පසු හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය	15,068,493	10,164,384	15,068,493	10,164,384

18.3 කොටසක ලාභාංශය

කොටසක ලාභාංශය ගණනය කර ඇත්තේ, කොටස්හිමියන්ට බෙදා හරින මුළු ලාභාංශය (ලවය) වර්ෂය සඳහා නිකුත් කර තිබූ බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් (හරය) බෙදීමෙනි.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2017	2016	2017	2016
වර්ෂය තුළ සාමාන්‍ය කොටස් හිමියාට බෙදා දුන් ලාභාංශ (රු. '000)	12,346,410	17,346,410	12,346,410	17,346,410
නිකුත් කර ඇති හරිත සාමාන්‍ය, සාමාන්‍ය කොටස් ප්‍රමාණය (සටහන 18.1.1)	11,479,452	10,000,000	11,479,452	10,000,000
කොටසක ලාභාංශය (රු.)	**1,075.52**	**1,734.64**	**1,075.52**	**1,734.64**

වර්ෂය තුළ ලාභාංශ ගෙවීම් 6 ක් සිදු කරන ලද අතර, කොටසක ලාභාංශය ගණනය කිරීම සඳහා නිකුත් කර ඇති හරිත සාමාන්‍ය කොටස් ප්‍රමාණය භාවිතා කර ඇත.

19 මිනුම් කිරීමේ පදනම මත මූල්‍ය උපකරණ විශ්ලේෂණය

සියළුම මූල්‍ය වත්කම් හා වගකීම් ශ්‍රී ලං.ගි.ප්‍ර. 39 - "මූල්‍ය උපකරණ : හඳුනා ගැනීම සහ මිනුම්කරණය"ට අනුකූලව මිනුම් කිරීමේ පදනම මත පහත දක්වා ඇත.

19.1 බැංකුව

දෙසැම්බර් 31 දිනට	2017			
	ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට නම් කල	වෙනත් විස්තිරණ ආදායම මගින් සාධාරණ අගයට නම් කල	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	–	–	72,843,108	72,843,108
මහ බැංකු සමග ඇති ශේෂයන්	–	–	68,689,012	68,689,012
බැංකුවල ඇති තැන්පතු	–	–	8,067,490	8,067,490
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	–	–	18,455,555	18,455,555
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,618,823	–	–	1,618,823
මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	8,359,274	–	–	8,359,274
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	–	–	213,167,048	213,167,048
ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම්	–	–	1,163,160,914	1,163,160,914
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	–	17,921,170	–	17,921,170
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	–	–	308,256,082	308,256,082
මුළු මූල්‍ය වත්කම්	**9,978,097**	**17,921,170**	**1,852,639,209**	**1,880,538,476**

දෙසැම්බර් 31 දිනට	2017		
	ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට නම් කල	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	–	2,203,199	2,203,199
ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	–	44,487,462	44,487,462
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	70,715	–	70,715
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	–	1,546,832,036	1,546,832,036
වෙනත් ණය ගැනීම්	–	178,191,089	178,191,089
නිකුත් කළ ණය සුරැකුම්පත්	–	–	–
යටත් කාලීන ණය	–	42,570,457	42,570,457
මුළු මූල්‍ය වගකීම්	**70,715**	**1,814,284,243**	**1,814,354,958**

දෙසැම්බර් 31 දිනට	2016			
	ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට නම් කල	වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට නම් කල	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	–	–	67,705,791	67,705,791
මහ බැංකු සමග ඇති ශේෂයන්	–	–	56,387,741	56,387,741
බැංකුවල ඇති තැන්පතු	–	–	11,674,664	11,674,664
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	–	–	1,901,618	1,901,618
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	5,300,844	–	–	5,300,844
මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	8,474,041	–	–	8,474,041
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	–	–	191,874,638	191,874,638
ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම්	–	–	1,000,082,574	1,000,082,574
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	–	10,463,046	–	10,463,046
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	–	–	243,178,400	243,178,400
මුළු මූල්‍ය වත්කම්	**13,774,885**	**10,463,046**	**1,572,805,426**	**1,597,043,357**

දෙසැම්බර් 31 දිනට	2016		
	ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට නම් කල	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	–	2,042,322	2,042,322
ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	–	59,424,629	59,424,629
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	171,663	–	171,663
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	–	1,256,589,490	1,256,589,490
වෙනත් ණය ගැනීම්	–	195,469,853	195,469,853
නිකුත් කළ ණය සුරැකුම්පත්	–	3,427,058	3,427,058
යටත් කාලීන ණය	–	38,645,546	38,645,546
මුළු මූල්‍ය වගකීම්	**171,663**	**1,555,598,898**	**1,555,770,561**

19.2 සමූහය

දෙසැම්බර් 31 දිනට	2017			
	ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට නම් කල	වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට නම් කල	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	–	–	78,005,362	78,005,362
මහ බැංකු සමග ඇති ශේෂයන්	–	–	68,689,012	68,689,012
බැංකුවල ඇති තැන්පතු	–	–	5,319,602	5,319,602
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	–	–	19,872,247	19,872,247
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,618,823	–	–	1,618,823
මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	8,596,548	–	–	8,596,548
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	–	–	214,349,624	214,349,624
ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම්	–	–	1,194,294,394	1,194,294,394
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	–	22,552,292	–	22,552,292
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	–	–	308,750,317	308,750,317
මුළු මූල්‍ය වත්කම්	**10,215,371**	**22,552,292**	**1,889,280,558**	**1,922,048,221**

දෙසැම්බර් 31 දිනට	2017		
	ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට නම් කල	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	–	2,194,266	2,194,266
ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	–	44,628,686	44,628,686
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	70,715	–	70,715
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	–	1,566,376,418	1,566,376,418
වෙනත් ණය ගැනීම්	–	184,330,181	184,330,181
නිකුත් කළ ණය සුරැකුම්පත්	–	5,667,514	5,667,514
යටත් කාලීන ණය	–	42,226,067	42,226,067
මුළු මූල්‍ය වගකීම්	**70,715**	**1,845,423,132**	**1,845,493,847**

දෙසැම්බර් 31 දිනට	2016			
	ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට නම් කල	වෙනත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට නම් කල	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	–	–	73,244,043	73,244,043
මහ බැංකු සමග ඇති ශේෂයන්	–	–	56,387,741	56,387,741
බැංකුවල ඇති තැන්පතු	–	–	12,931,605	12,931,605
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	–	–	2,350,704	2,350,704
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	5,300,844	–	–	5,300,844
මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	8,804,647	–	–	8,804,647
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	–	–	191,984,082	191,984,082
ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම්	–	–	1,027,768,110	1,027,768,110
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	–	16,263,641	–	16,263,641
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	–	–	243,253,967	243,253,967
මුළු මූල්‍ය වත්කම්	**14,105,491**	**16,263,641**	**1,607,920,252**	**1,638,289,384**

දෙසැම්බර් 31 දිනට	2016		
	ලාභ හෝ පාඩු මගින් සාධාරණ අගයට නම් කල	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වගකීම්			
බැංකුවලට ගෙවිය යුතු	–	2,053,945	2,053,945
ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්	–	58,925,801	58,925,801
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	171,663	–	171,663
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	–	1,273,631,287	1,273,631,287
වෙනත් ණය ගැනීම්	–	204,485,301	204,485,301
නිකුත් කළ ණය සුරැකුම්පත්	–	8,360,333	8,360,333
යටත් කාලීන ණය	–	38,295,318	38,295,318
මුළු මූල්‍ය වගකීම්	**171,663**	**1,585,751,985**	**1,585,923,648**

20 මුදල් සහ මුදල් හා සමාන දෑ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මුදල් සහ මුදල් හා සමාන දෑ තුළ ඇතුළත් වන්නේ අතැති දේශීය හා විදේශ විනිමය නෝට්ටු සහ කාසි, මහ බැංකු සමඟ ඇති සීමා නොකළ ශේෂයන්, අනෙකුත් බැංකු සමඟ ඇති ශේෂයන් සහ කල්පිරීම් දින හතකට වඩා අඩු ද්‍රවශීලතාවයෙන් ඉහළ මූල්‍ය වත්කම්වල සාධාරණ අගය වෙනස්වීමේ අවදානම අවම මට්ටමක පවතින, සමූහය විසින් කෙටි කාලීන බැඳීම් කළමනාකරණය සඳහා භාවිතා කරන දෑය.

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
අතැති දේශීය මුදල් ප්‍රමාණය	40,267,119	27,454,238	40,459,621	27,641,383
අතැති විදේශීය මුදල් ප්‍රමාණය	1,507,867	1,446,976	1,516,294	1,454,169
බැංකු සමඟ ඇති ශේෂයන්	12,429,737	14,492,569	11,798,422	14,434,784
කෙටි දැනුම් දීමකින් මුදල් බවට පත් කළ හැකි වත්කම්	18,638,385	24,312,008	24,231,025	29,713,707
මුළු මුදල් සහ මුදල් හා සමාන දෑ	**72,843,108**	**67,705,791**	**78,005,362**	**73,244,043**

21 මහ බැංකු සමඟ ඇති ශේෂයන්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

මහ බැංකු සමඟ ඇති ශේෂයන් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
ශ්‍රී ලංකා මහ බැංකුව (සටහන 21.1)	64,800,808	51,055,931	64,800,808	51,055,931
රිසර්ව් බැන්ක් ඔෆ් ඉන්ඩියා (සටහන 21.2)	165,035	161,463	165,035	161,463
මාලදිවයින් මූල්‍ය අධිකාරිය (සටහන 21.3)	3,239,492	4,900,518	3,239,492	4,900,518
සීෂෙල්ස් මහ බැංකුව (සටහන 21.4)	483,677	269,829	483,677	269,829
මහ බැංකු සමඟ ඇති මුළු ශේෂයන්	**68,689,012**	**56,387,741**	**68,689,012**	**56,387,741**

21.1 ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL)

1949 අංක 58 දරණ මූදල් නීති පනතේ 93 ඡේදයේ ප්‍රතිපාදනයන්ට අනුව බැංකුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ මුදල් සංචිතයක් පවත්වා ගත යුතු යැයි නියම කෙරේ. 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ පවත්වාගෙන යා යුතු අවම මුදල් සංචිතය ශ්‍රී ලංකා රුපියල් තැන්පතු වගකීම්වලින් 7.5% ක් විය (2016 - 7.5%). දේශීය ශාඛාවන්හි පවත්වා ගෙන යන විදේශ මුදල් තැන්පතු වගකීම් හා ශ්‍රී ලංකාවේ අක්වෙරළ අංශයෙහි පවත්වාගෙන යන තැන්පතු වගකීම් සඳහා බැංකුව විසින් මෙවැනි සංචිතයක් පවත්වා ගැනීම අවශ්‍ය නොවේ (2016 - නැත).

21.2 රිසර්ව් බැන්ක් ඔෆ් ඉන්ඩියා (RBI)

1934 අංක 02 දරණ රිසර්ව් බැන්ක් ඔෆ් ඉන්ඩියා පනතේ අංක 42 (1) වගන්තිය ප්‍රකාරව චෙන්නායිහි ලංකා බැංකු ශාඛාව රිසර්ව් බැන්ක් ඔෆ් ඉන්ඩියා සමඟ මුදල් සංචිතයක් පවත්වාගෙන යා යුතුය, 2017 දෙසැම්බර් 31 දිනට මුදල් සංචිත අවශ්‍යතාවය එහි ඉල්ලුම් සහ කාලීන තැන්පතු බැරකම්වලින් 4% ක් (2016 - 4%) විය.

21.3 මාලදිවයින් මූල්‍ය අධිකාරිය (MMA)

මාලදිවයින් මූල්‍ය අධිකාරිය විසින් පනවා ඇති රෙගුලාසි ප්‍රකාරව, මාලදිවයිනේ පිහිටි ලංකා බැංකු ශාඛාව විසින් වාණිජ තැන්පතු හා මහජනයා වෙතැති වගකීම්වලින් 10% ක තැන්පතු සංචිතයක් මාලදිවයින් රුෆියාවලින් සහ ඇමරිකානු ඩොලර්වලින් වෙන වෙනම පවත්වාගත යුතුය (2016 - 10%).

21.4 සීෂෙල්ස් මහ බැංකුව (CBS)

සීෂෙල්ස් මහ බැංකුව පනවා ඇති මූල්‍ය රෙගුලාසිවලට අනුව එහි පිහිටි ලංකා බැංකු ශාඛාව විසින් සීෂෙල්ස් මහජනතාවට ඇති වාණිජ තැන්පතු වගකීමෙන් 13% ක සංචිතයක් සීෂෙල්ස් මහ බැංකුව සමඟ පවත්වාගත යුතුය (2016 - 13%).

22 බැංකුවල ඇති තැන්පතු

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

බැංකුවල ඇති තැන්පතු යන්නෙන් ගමය වනුයේ ක්‍රියාකාරී වෙළඳපොලක ලැයිස්තු ගතව නොමැති ස්ථිර හෝ නිශ්චිත ගෙවීමක් සම්බන්ධ වන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. කෙසේ නමුත් පහත සඳහන් දෑ මීට ඇතුළත් නොවේ:

- මූලික හඳුනාගැනීමේ දී, ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල සහ ඉතා මෑත කාලයේදී අලෙවි කිරීමට බැංකුව අදහස්කර ඇති මූල්‍ය වත්කම්.
- මූලික හඳුනාගැනීමේ දී, උපලබ්ධිය සඳහා පවතින මූල්‍ය වත්කම් ලෙස වර්ග කර ඇති දෑ.
- ණය හානිකරණය සඳහා වන යම් අගයක් හැර ප්‍රධාන වශයෙන්ම මූලික ආයෝජනය යලිත් අයකර ගැනීමට නොහැකි මූල්‍ය වත්කම්.

බැංකුවල ඇති තැන්පතු සාධාරණ අගයට මූලිකව හඳුනා ගැනේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව බැංකුවල ඇති තැන්පතු, සහ ගනුදෙනුකරුවන් වෙතැති ණය සහ අත්තිකාරම් සඵල පොළී අනුපාතිකය මත ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කල පිරිවැයට, ණය හානිකරණය සඳහා වන වෙන්කිරීම් ගලපා මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනේ. ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කිරීමේ දී අත් පත් කර ගැනීමේ දී පැන නගින අව මිල හෝ අධි මිලත් සඵල පොළී අනුපාතිකයේ සැලකිය යුතු කොටසක් බවට පත්වන ගාස්තු සහ පිරිවැයත් සැලකිල්ලට ගනු ලැබේ. ක්‍රමක්ෂය, ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ පොළී ආදායම (සටහන 8.1) යටතේ ඇතුළත් වන අතර ණය හානිකරණය මගින් පැන නගින අලාභ, ලාභ හෝ පාඩු ප්‍රකාශනයේ ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා (ප්‍රතිපාදන)/ප්‍රතිවර්ත්‍ය කිරීම (සටහන 13) යටතේ දක්වා ඇත. බැංකුවල ඇති තැන්පතු යළි අයකර ගත නොහැකි බවට තහවුරු වූ පසු එම අයකර ගත නොහැකි අගයන් කපා හැරීම සමූහයේ ප්‍රතිපත්තියයි.

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
දේශීය බැංකු	4,399,062	–	4,399,062	–
විදේශීය බැංකු	3,668,428	11,674,664	920,540	12,931,605
බැංකුවල ඇති මුළු තැන්පතු	**8,067,490**	**11,674,664**	**5,319,602**	**12,931,605**

23 ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

නිශ්චිත අනාගත දිනයක් තුළ ඉහළ මිළක් යටතේ විකුණා දැමීමේ ගිවිසුම් යටතේ මිලදී ගනු ලබන සුරැකුම්පත් ප්‍රතිවිකුණුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත් ලෙස හඳුන්වයි. සමූහය විසින් ලබා දුන් අත්තිකාරම් වශයෙන් ආර්ථික තත්ත්වය පිළිබිඹු කරමින් ගෙවූ ප්‍රතිෂ්ඨාව සහ උපචිත පොළිය (සඵල පොළී අනුපාතය භාවිතයෙන් මිනුම් කරන ලද) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය යටතේ වාර්තා කරයි. ගැණුම් සහ විකුණුම් මිල අතර වෙනස "පොළී ආදායම" යටතේ වාර්තා කරන අතර එය ගිවිසුම් කාලය පුරා හඳුනාගනු ලබයි.

දෙසැම්බර් 31 දිනට	බැංකුව		සමූහය	
	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
බැංකු සමඟ	15,157,328	–	15,195,040	62,707
ගනුදෙනුකරුවන් සමඟ	3,298,227	1,901,618	4,677,207	2,287,997
මුළු ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	**18,455,555**	**1,901,618**	**19,872,247**	**2,350,704**

24 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

සමූහය විසින් ව්‍යුත්පන්න උපකරණ ලෙස හරස් විනිමය අනුපාත, විදේශ විනිමය ඉදිරි කොන්ත්‍රාත්තු භාවිතා කරයි. ව්‍යුත්පන්න උපකරණ සාධාරණ අගයට වාර්තා කරනු ලබන අතර ඒවායේ සාධාරණ අගය ධන අගයක් ගන්නා විට එය වත්කම් ලෙසද සාධාරණ අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසද වාර්තා කරනු ලබයි. ව්‍යුත්පන්න උපකරණවල සාධාරණ අගයේ වෙනස් වීම ශුද්ධ වෙළඳ ආදායම්වල ඇතුළත් වේ.

පොළී අනුපාත, මූල්‍ය උපකරණ වල මිල, භාණ්ඩ මිල, විදේශ විනිමය අනුපාත සහ ණය අවදානම වැනි සංරචකයන්ගේ වෙනස්වීම් වලට අනුරූපීව ව්‍යුත්පන්න අගය වෙනස් වීම සිදු වේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
විදේශීය විනිමය ව්‍යුත්පන්න				
ඉදිරි විනිමය ගිවිසුම්	4,288	9,063	4,288	9,063
මුදල් හුවමාරු ගිවිසුම් (SWAPs)	1,614,535	5,291,781	1,614,535	5,291,781
මුළු ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**1,618,823**	**5,300,844**	**1,618,823**	**5,300,844**

25 මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

විකිණීම හෝ මිලදී ගැනීම තුළින් කෙටිකාලීන ලාභ ලැබීමේ පරමාර්ථයෙන් අත්පත් කර ගන්නා මූල්‍ය උපකරණ මේ යටතේ දක්වනු ලැබේ.

සාධාරණ අගයේ වෙනස් වීම සහ ලාභාංශ ආදායම ශුද්ධ වෙළඳ ආදායම්/(වියදම්) වල ඇතුළත් කරනු ලැබේ (සටහන 10). පොළී ආදායම, පොළී ආදායමේ (සටහන 8.1) වාර්තා කරනු ලබන්නේ ගිවිසුම් වගන්ති පරිදි වේ.

මේ යටතේ දක්වා ඇති සියළු මූල්‍ය වත්කම් මූලික වශයෙන් සාධාරණ අගයට වර්ගීකරණය කරන අතර ඉන්පසු කාලච්ඡේද වලදී ද සාධාරණ අගයට වාර්තා කරයි. මූලික වශයෙන් වාර්තා කිරීමේ දී අදාළ මූල්‍ය උපකරණයට ආදාළ ගනුදෙනු පිරිවැය ලාභ හෝ පාඩු ප්‍රකාශයනට මාරු කරනු ලැබේ.

	බැංකුව		සමූහය	
දෙසැම්බර් 31 දිනට	2017 රු. '000	2016 රු. '000	2017 රු. '000	2016 රු. '000
භාණ්ඩාගාර බිල්පත්	4,749,058	4,538,007	4,749,058	4,538,007
භාණ්ඩාගාර බැඳුම්කර	682,169	681,439	682,169	681,439
ශ්‍රී ලංකා රාජ්‍ය බැඳුම්කර	166,863	156,142	166,863	156,142
මිල ප්‍රකාශිත ස්කන්ධයන් (සටහන 25.1)	2,761,184	3,098,453	2,993,845	3,426,824
මිල ප්‍රකාශිත ඒකක භාරවල ඒකකයන් (සටහන 25.2)	–	–	4,613	2,235
මුළු මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	**8,359,274**	**8,474,041**	**8,596,548**	**8,804,647**

වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර සුරැකුම් ලෙස බැංකුව 2017 දෙසැම්බර් 31 දිනට ඔඩපණය කර නොමැත (2016 - නොමැත).

25.1 මිල ප්‍රකාශිත ස්කන්ධයන්

25.1.1 මිල ප්‍රකාශිත ස්කන්ධයන්හි ආංශික දායකත්වය

දෙසැම්බර් 31 දිනට	2017			2016		
	ආයෝජන පිරිවැය රු. '000	වෙළඳපොල වටිනාකම රු. '000	අංශ අනුව වෙළඳපොල අගයේ සංයුතිය %	ආයෝජන පිරිවැය රු. '000	වෙළඳපොල වටිනාකම රු. '000	අංශ අනුව වෙළඳපොල අගයේ සංයුතිය %
බැංකුව (සටහන 25.1.2)						
බැංකු, මූල්‍ය සහ රක්ෂණ	13,872	15,190	0.6	19,611	19,303	0.6
ආහාරපාන හා දුම්කොළ	443,439	423,214	15.3	494,031	436,191	14.1
රසායනික ද්‍රව්‍ය හා ඖෂධ	261,945	112,586	4.1	261,945	146,703	4.7
ඉදිකිරීම් සහ ඉංජිනේරු	205,814	83,247	3.0	206,144	74,943	2.4
විවිධාංගීකරණය වූ සමාගම්	1,334,634	877,614	31.7	1,372,393	892,243	28.7
පාවහන් සහ රෙදිපිළි	23,668	16,141	0.6	22,793	16,152	0.5
සෞඛ්‍ය ආරක්ෂණ	30,545	26,017	0.9	20,425	17,335	0.6
හෝටල් සහ සංචාරක	718,505	319,581	11.6	717,456	386,666	12.5
ආයෝජන භාර	168,781	62,854	2.3	168,781	63,399	2.0
ඉඩම් සහ දේපල	24,815	16,857	0.6	24,685	19,056	0.6
නිෂ්පාදන	647,413	446,308	16.2	703,129	575,116	18.6
රථ වාහන	149,185	78,812	2.9	149,185	89,177	2.9
තෙල් සහ ආශ්‍රිතයන්	83,965	25,104	0.9	83,965	33,392	1.1
වැවිලි	142,099	61,102	2.2	156,335	61,541	2.0
විදුලිය හා බලශක්තිය	206,555	101,505	3.7	206,555	153,181	4.9
සේවාවන්	22,759	13,486	0.5	22,759	14,261	0.5
ගබඩා සහ සැපයුම්	21,923	12,054	0.4	21,923	11,274	0.4
විදුලි සංදේශ	7,496	6,099	0.2	8,166	8,380	0.3
වෙළෙඳ	142,914	63,413	2.3	148,765	80,140	2.6
එකතුව	**4,650,327**	**2,761,184**	**100.0**	**4,809,046**	**3,098,453**	**100.0**

දෙසැම්බර් 31 දිනට	2017			2016		
	ආයෝජන පිරිවැය රු. '000	වෙළඳපොල වටිනාකම රු. '000	අංශ අනුව වෙළඳපොල අගයේ සංයුතිය %	ආයෝජන පිරිවැය රු. '000	වෙළඳපොල වටිනාකම රු. '000	අංශ අනුව වෙළඳපොල අගයේ සංයුතිය %
සමූහය (සටහන 25.1.3)						
බැංකු, මූල්‍ය සහ රක්ෂණ	145,778	117,828	3.9	166,491	133,672	3.9
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	213,167,048	–	–	206,756,877
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	1,219,914,481	66,872,015	49,660,188	310,703,980
අඩු කලා - ණය හානිකරණය	(56,753,567)	–	–	–
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	17,921,170	–	–	9,677,543
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	308,256,082	–	–	256,069,541
එකතුව	**1,880,538,476**	**177,336,013**	**49,660,188**	**807,261,586**

2016 දෙසැම්බර් 31 දිනට	ණය අවදානම සඳහා උපරිම නිරාවරණය රු. '000	මුදල් රු. '000	රන් රු. '000	ශ්‍රී ලංකා රාජ්‍ය සුරැකුම්පත්/ඇපකර රු. '000
මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් හා සමාන දෑ	67,705,791	28,901,214	–	–
මහ බැංකු සමඟ ශේෂයන්	56,387,741	56,387,741	–	–
බැංකුවල ඇති තැන්පතු	11,674,664	–	–	–
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	1,901,618	–	–	1,901,618
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	5,300,844	–	–	–
මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	8,474,041	–	–	5,375,588
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	191,874,638	–	–	185,683,966
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	1,047,189,690	60,535,565	44,954,643	281,263,263
අඩු කලා - ණය හානිකරණය	(47,107,116)	–	–	–
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	10,463,046	–	–	2,061,794
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	243,178,400	–	–	159,061,022
එකතුව	**1,597,043,357**	**145,824,520**	**44,954,643**	**635,347,251**

60.2.2 මූල්‍ය වත්කම් කාණ්ඩය අනුව ණය ගුණාත්මකභාවය

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය මඟින් ආයතනික ගනුදෙනුකාර ශ්‍රේණිකරණ ආකෘතියක් හා ණය ශ්‍රේණි ලකුණු පුවරුවක් අභ්‍යන්තරව ගොඩනගා ඇත. මෙම ආකෘතිය ණය අලාභ සිදුවීමේ සම්භාවිතාව ඇස්තමේන්තු කිරීමට සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා යොදා ගැනේ. ණය ගුණාත්මක භාවය අනුව ගනුදෙනුකාර ශ්‍රේණිකරණ ආකෘතිය මගින් සියළුම සක්‍රිය ආයතනික ණය ශ්‍රේණි නමයකට ගොණු කර ඇත. පාරිභෝගික ණය සඳහා ණය අයදුම්පත් සැකසීම හා ණය ගුණාත්මකභාවය අධීක්ෂණය සඳහා ණය ශ්‍රේණි ලකුණු පුවරුවක් ගොඩනගා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මග පෙන්වීම අනුව අක්‍රිය ණය වර්ග කරනු ලැබේ. සෑම වාර්තා කරන දිනයක දීම විෂයානුබද්ධ සාක්ෂි ඇගයීමක් සිදු කර මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක හානිකරණයක් සිදු වී ඇත්දැයි ඇගයීමක් සිදු කෙරේ. අලාභයක් ඇතිවී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි ඇති විට මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩයක හානිකරණයක් වී ඇතැයි සලකනු ලැබේ.

ඇප සුරැකුම් සහ වෙනත් ණය වර්ධකවල සාධාරණ අගය					
චංචල දේපල	දේපල	වෙනත්	අතිරික්ත ඇප	ශුද්ධ ඇප	ශුද්ධ නිරාවරණය
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
–	–	–	–	41,774,986	31,068,122
–	–	–	–	68,689,012	–
–	–	–	–	–	8,067,490
–	–	–	–	18,455,555	–
–	–	–	–	–	1,618,823
–	–	–	–	5,598,090	2,761,184
–	–	–	–	206,756,877	6,410,171
108,434,274	213,153,077	66,655,828	(97,502,880)	717,976,482	501,937,999
–	–	–	–	–	(56,753,567)
–	–	–	–	9,677,543	8,243,627
–	–	–	–	256,069,541	52,186,541
108,434,274	**213,153,077**	**66,655,828**	**(97,502,880)**	**1,324,998,086**	555,540,390

ඇප සුරැකුම් සහ වෙනත් ණය වර්ධකවල සාධාරණ අගය					
චංචල දේපල	දේපල	වෙනත්	අතිරික්ත ඇප	ශුද්ධ ඇප	ශුද්ධ නිරාවරණය
රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
–	–	–	–	28,901,214	38,804,577
–	–	–	–	56,387,741	–
–	–	–	–	–	11,674,664
–	–	–	–	1,901,618	–
–	–	–	–	–	5,300,844
–	–	–	–	5,375,588	3,098,453
–	–	–	–	185,683,966	6,190,672
98,159,598	192,955,783	60,339,865	(88,264,007)	649,944,710	397,244,980
–	–	–	–	–	(47,107,116)
–	–	–	–	2,061,794	8,401,252
–	–	–	–	159,061,022	84,117,378
98,159,598	**192,955,783**	**60,339,865**	**(88,264,007)**	**1,089,317,653**	**507,725,705**

ක්‍රමක්ෂය පිරිවැයට පවත්වාගෙන යන මූල්‍යමය වත්කම්හි ධාරණ අගයත්, සළුල පොළී අනුපාතිකයත් ඇසුරෙන් වට්ටම් කරන ලද අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන්ගේ වර්තමාන අගයත් අතර වෙනස හානිකරණ අලාභය ලෙස සැලකේ. හානිකරණ අලාභයන්, ලාභ හෝ පාඩු ප්‍රකාශනය යටතේ වර්තාකරන අතර, ණය හා අත්තිකාරම්හි හානිකරණ ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ද සටහන් වේ. ණය සහ අත්තිකාරම් හානිකරණ අලාභය පිළිබඳ සවිස්තර සටහන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 27 යටතේ දක්වා ඇත.

ඇතැම් ණය සහ අත්තිකාරම් ද, මූල්‍ය ආයෝජනයන් ද නැවත අයකරගත නොහැකි යැයි නිශ්චය කරගත් විට බැංකුව විසින් ඒවා කපා හරිනු ලැබේ.

බැංකුවේ අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයන්ට හා මූල්‍ය වත්කම්වලට ආවේනික අවදානම් පදනම්කර ගෙන, ණය අවදානමකට විවෘත වූ සියලු මූල්‍ය වත්කම්වල ණය ගුණාත්මය පහත වගුව මඟින් නිරූපණය කෙරේ. ශ්‍රී ලංකා රජයට ලබා දුන් ණය හා අත්තිකාරම් AAA, AA හෝ A අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් සහිත ආයතනික ණය ගැනුම්කරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම් ඉහළ ශ්‍රේණියට ඇතුළත් කරනු ලබයි. සම්මත ශ්‍රේණියට අභ්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් BBB, BB හෝ B සහිත ආයතනික ණය ගැනුම්කරුවන් ඇතුළත් වේ. ආශ්‍රිත සම්මත ශ්‍රේණියට ශ්‍රේණිගත කිරීම් C හෝ D සහිත ආයතනික ණය ගැනුම්කරුවන් ඇතුළත් වේ.

මූල්‍ය වත්කම් කාණ්ඩය අනුව ණය ගුණාත්මය	2017 දෙසැම්බර් 31 දිනට						
	හානිකරණවීමක් හෝ කල්පසුවීමක් සිදු නොවූ						
	ඉහළ ශ්‍රේණිය	සම්මත ශ්‍රේණි	ආශ්‍රිත සම්මත ශ්‍රේණිය	කාණ්ඩ නොබෙදූ/ ශ්‍රේණියක් නොමැති	කල් පසුවීමක් සිදු වූ නමුත් කේවල හානිකරණයක් සිදු නොවූ	කේවල හානිකරණය වූ	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්							
මුදල් සහ මුදල් හා සමාන දෑ	54,204,723	–	–	18,638,385	–	–	72,843,108
මහ බැංකු සමඟ ශේෂයන්	68,689,012	–	–	–	–	–	68,689,012
බැංකුවල ඇති තැන්පතු	8,067,490	–	–	–	–	–	8,067,490
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	18,455,555	–	–	–	–	–	18,455,555
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,618,823	–	–	–	–	–	1,618,823
මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	5,598,090	–	–	2,761,184	–	–	8,359,274
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	206,756,877	–	–	6,410,171	–	–	213,167,048
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	314,509,110	104,311,326	34,810,132	463,277,623	239,218,214	63,788,076	1,219,914,481
අඩු කලා- ණය හානිකරණය	–	–	–	–	–	–	(56,753,567)
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	9,677,543	–	–	8,243,627	–	–	17,921,170
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	256,069,541	–	–	52,186,541	–	–	308,256,082
එකතුව	**943,646,764**	**104,311,326**	**34,810,132**	**551,517,531**	**239,218,214**	**63,788,076**	**1,880,538,476**

මූල්‍ය වත්කම් කාණ්ඩ අනුව කල් පසුවීමක් සිදු වූ (එනම් එක් දිනක හෝ ඊට වැඩි දින ගණනක් හිඟ මුදල් සහිත පහසුකම්) නමුත් හානිකරණයක් සිදු නොවූ ණයවල ආයු විශ්ලේෂණය.

කල්පසුවීමක් සිදු වූ නමුත් හානිකරණය සිදු නොවූ ණයවල ආයු විශ්ලේෂණය	කල්පසු වූ නමුත් කේවල හානිකරණයක් සිදු නොවූ					
	දින 30 ට අඩු	දින 30 සිට 60 දක්වා	දින 60 සිට 90 දක්වා	දින 90 සිට 180 දක්වා	දින 180 සහ ඊට වැඩි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	124,756,928	74,175,997	6,216,779	2,644,976	31,423,534	239,218,214

මූල්‍ය වත්කම් කාණ්ඩය අනුව ණය ගුණාත්මය	2016 දෙසැම්බර් 31 දිනට						
	හානිකරණවීමක් හෝ කල්පසුවීමක් සිදු නොවූ						
	ඉහළ ශ්‍රේණිය	සම්මත ශ්‍රේණි	ආශ්‍රිත සම්මත ශ්‍රේණිය	කාණ්ඩ නොබෙදූ/ ශ්‍රේණියක් නොමැති	කල් පසුවීමක් සිදු වූ නමුත් කේවල හානිකරණයක් සිදු නොවූ	කේවල හානිකරණය වූ	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්							
මුදල් සහ මුදල් හා සමාන දෑ	43,393,783	–	–	24,312,008	–	–	67,705,791
මහ බැංකු සමඟ ශේෂයන්	56,387,741	–	–	–	–	–	56,387,741
බැංකුවල ඇති තැන්පතු	11,674,664	–	–	–	–	–	11,674,664
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	1,901,618	–	–	–	–	–	1,901,618
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	5,300,844	–	–	–	–	–	5,300,844
මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	5,375,587	–	–	3,098,454	–	–	8,474,041
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	185,683,966	–	–	6,190,672	–	–	191,874,638
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	279,845,017	108,409,398	16,554,840	422,192,716	187,105,186	33,082,533	1,047,189,690
අඩු කලා - ණය හානිකරණය	–	–	–	–	–	–	(47,107,116)
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	2,061,794	–	–	8,401,252	–	–	10,463,046
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	159,061,022	–	–	84,117,378	–	–	243,178,400
එකතුව	**750,686,036**	**108,409,398**	**16,554,840**	**548,312,480**	**187,105,186**	**33,082,533**	**1,597,043,357**

මූල්‍ය වත්කම් කාණ්ඩ අනුව කල් පසුවීමක් සිදු වූ (එනම් එක් දිනක හෝ ඊට වැඩි දින ගණනක් හිඟ මුදල් සහිත පහසුකම්) නමුත් හානිකරණයක් සිදු නොවූ ණයවල ආයු විශ්ලේෂණය.

කල්පසුවීමක් සිදු වූ නමුත් හානිකරණය සිදු නොවූ ණයවල ආයු විශ්ලේෂණය	කල්පසු වූ නමුත් කේවල හානිකරණයක් සිදු නොවූ					
	දින 30 ට අඩු	දින 30 සිට 60 දක්වා	දින 60 සිට 90 දක්වා	දින 90 සිට 180 දක්වා	දින 180 සහ ඊට වැඩි	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	93,525,723	51,317,462	5,680,504	5,122,053	31,459,444	187,105,186

60.2.3 අවදානම් සංකේන්ද්‍රණය පිළිබඳ විශ්ලේෂණය

තනි පුද්ගලයෙකුට, කණ්ඩායමකට, කර්මාන්ත ක්ෂේත්‍රයන්ට හා භූගෝලීය කලාපයන්ට සංකේන්ද්‍රණය වීමේ අවදානම ණය කළඹ මට්ටමේ දී ණය අවදානම යටතට ගැනේ.

රටවල් අනුව නිරාවරණයන්

ඉන්දියාවේ, මාලදිවයිනේ, සීෂෙල්ස් රාජ්‍යයේ පවතින ශාඛාවන් හා එක්සත් රාජධානියේ පවතින පරිපාලිත සමාගම හේතුවෙන් බැංකුව, ලංකාවෙන් පිටත පැනනගින අවදානම් සඳහා නිරාවරණය වේ. සියලුම විදේශීය ශාඛාවන් කලින් සකස් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සීමාවන්ට (ණය ප්‍රමාණ සීමාවන් මෙන්ම රටවල් සඳහා පනවා ඇති සීමාවන්) යටත්ව මෙහෙයුම් කටයුතු කරනු ලබන අතර, කොළඹ ප්‍රධාන කාර්යාලය සතුව ඉහළ මට්ටමේ අධිකාරිය පවතින ලෙස විමධ්‍යගත බල අධිකාරීන් ඔස්සේ ණය කළමනාකරණය කරනු ලැබේ.

එක්සත් රාජධානියෙහි මූල්‍ය සේවා අධිකාරියේ නියාමනය යටතේ මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන බැංකුවට සම්පූර්ණයෙන්ම අයත්, පරිපාලිතය සතු සිය වත්කම් එක්සත් රාජධානිය කෙරෙහි දක්වන නිරාවණයවීමට අන්තර්ගත වන අතර, එහි ණය තීරණයන් පිළිබඳ පාලනයන් කොළඹ ප්‍රධාන කාර්යාලය සතුව පවතිනුයේ අදාළ පරිපාලිතයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය පත්කිරීම බැංකුව විසින් සිදු කරනු ලැබීම හේතුවෙනි. එහි සේවක මණ්ඩලයෙහි ප්‍රධානත්වය ගෙන කටයුතු කරන ප්‍රධාන විධායක නිලධාරිවරයා සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරිවරයා පත් කරනු ලබන්නේ ද ලංකා බැංකුවේ අනුමැතිය අනුවය. එක්සත් රාජධානියේ මෙහෙයුම්වල අවදානම් නිරාවරණයන් පිළිබඳ මට්ටම් එම පරිපාලිතයන් හි අවදානම් කළමනාකරණ රාමුවෙහි ස්ථාපනය කර ඇත.

මීට අමතරව අනෙකුත් රටවලට දක්වන නිරාවරණයවීම් සඳහා එම රටවල නියෝජිත බැංකුවල පවත්වාගෙන යන ගිණුම් ශේෂයන් ඇතුළත් වන අතර එහි අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කොට ඇති අදාළ බැංකු සීමා හා රටවලට පනවා ඇති සීමා මත පදනම්ව සිදු කෙරේ.

2017 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකාව	එක්සත් රාජධානිය	මාලදිවයින	ඉන්දියාව	ඇමරිකා එක්සත් ජනපදය	සිංගප්පූරුව	වෙනත් රටවල්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්								
මුදල් සහ මුදල් හා සමාන දෑ	40,187,549	13,988,645	8,448,677	85,582	6,870,236	77,092	3,185,327	72,843,108
මහ බැංකු සමඟ ශේෂයන්	64,800,808	–	3,239,492	165,035	–	483,677	–	68,689,012
බැංකුවල ඇති තැන්පතු	4,399,061	3,037,776	–	630,653	–	–	–	8,067,490
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	18,455,555	–	–	–	–	–	–	18,455,555
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,618,823	–	–	–	–	–	–	1,618,823
මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	8,359,274	–	–	–	–	–	–	8,359,274
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	206,448,353	–	6,718,695	–	–	–	–	213,167,048
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	1,133,450,152	–	21,525,646	6,967,240	–	1,217,876	–	1,163,160,914
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා දරා සිටින	16,442,300	–	–	1,478,870	–	–	–	17,921,170
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	308,256,082	–	–	–	–	–	–	308,256,082
එකතුව	**1,802,417,957**	**17,026,421**	**39,932,510**	**9,327,380**	**6,870,236**	**1,778,645**	**3,185,327**	**1,880,538,476**
මූල්‍ය වගකීම්								
බැංකුවලට ගෙවිය යුතු	1,583,334	–	–	619,865	–	–	–	2,203,199
ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකිණූ සුරැකුම්පත්	44,487,462	–	–	–	–	–	–	44,487,462
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	70,715	–	–	–	–	–	–	70,715
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	1,510,562,066	–	30,301,978	4,368,004	–	1,599,988	–	1,546,832,036
වෙනත් ණය ගැනීම්	36,176,514	–	–	13,171	–	–	142,001,404	178,191,089
නිකුත් කළ ණය සුරැකුම්පත්	–	–	–	–	–	–	–	–
යටත් කාලීන ණය	42,570,457	–	–	–	–	–	–	42,570,457
මුළු වගකීම්	**1,635,450,548**	**–**	**30,301,978**	**5,001,040**	**–**	**1,599,988**	**142,001,404**	**1,814,354,958**

2016 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකාව	එක්සත් රාජධානිය	මාලදිවයින	ඉන්දියාව	ඇමරිකා එක්සත් ජනපදය	සිංගප්පූරුව	වෙනත් රටවල්	එකතුව
	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
මූල්‍ය වත්කම්								
මුදල් සහ මුදල් හා සමාන දෑ	38,436,122	13,156,378	3,912,193	89,880	10,908,334	94,560	1,108,324	67,705,791
මහ බැංකු සමඟ ශේෂයන්	50,700,556	–	4,900,518	516,838	–	269,829	–	56,387,741
බැංකුවල ඇති තැන්පතු	156,619	10,200,705	–	1,317,340	–	–	–	11,674,664
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	1,901,618	–	–	–	–	–	–	1,901,618
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	5,300,844	–	–	–	–	–	–	5,300,844
මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	8,474,041	–	–	–	–	–	–	8,474,041
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	176,705,115	–	15,169,523	–	–	–	–	191,874,638
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්	953,431,521	–	39,544,046	6,145,043	–	961,964	–	1,000,082,574
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	9,321,157	–	–	1,141,889	–	–	–	10,463,046
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	243,178,400	–	–	–	–	–	–	243,178,400
එකතුව	**1,487,605,993**	**23,357,083**	**63,526,280**	**9,210,990**	**10,908,334**	**1,326,353**	**1,108,324**	**1,597,043,357**
මූල්‍ය වගකීම්								
බැංකුවලට ගෙවිය යුතු	1,309,844	–	–	732,478	–	–	–	2,042,322
ප්‍රතිමිලට ගැනුම් ගිවිසුම් යටතේ විකිණූ සුරැකුම්පත්	59,424,629	–	–	–	–	–	–	59,424,629
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	171,663	–	–	–	–	–	–	171,663
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	1,222,384,532	–	29,039,013	3,664,581	–	1,501,364	–	1,256,589,490
වෙනත් ණය ගැනීම්	2,615,588	–	–	276,903	–	–	192,577,362	195,469,853
නිකුත් කළ ණය සුරැකුම්පත්	3,427,058	–	–	–	–	–	–	3,427,058
යටත් කාලීන ණය	38,645,546	–	–	–	–	–	–	38,645,546
මුළු වගකීම්	**1,327,978,860**	**–**	**29,039,013**	**4,673,962**	**–**	**1,501,364**	**192,577,362**	**1,555,770,561**

අංශ අනුව නිරාවරණය වීම

2017 දෙසැම්බර් 31 දිනට	කෘෂිකාර්මික සහ ධීවර රු. '000	බැංකු, මූල්‍ය සහ රක්ෂණ රු. '000	හෝටල්, ප්‍රවාහන සහ සේවා රු. '000	නිවාස, ඉදිකිරීම් සහ යටිතල පහසුකම් රු. '000	නිෂ්පාදන රු. '000
මූල්‍ය වත්කම්					
මුදල් සහ මුදල් හා සමාන දෑ	–	12,429,737	–	–	–
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	–	–	–	–	–
බැංකුවල ඇති තැන්පතු	–	8,067,490	–	–	–
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	–	–	–	–	–
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	1,618,823	–	–	–
මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	86,206	78,045	333,067	100,104	1,099,754
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	–	5,641,373	–	–	–
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්*	91,074,381	31,480,730	53,637,678	262,592,679	70,781,133
අඩු කලා - ණය හානිකරණය	–	–	–	–	–
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	–	8,243,627	–	–	–
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	–	–	–	–	–
	91,160,587	**67,559,825**	**53,970,745**	**262,692,783**	**71,880,887**

2016 දෙසැම්බර් 31 දිනට	කෘෂිකාර්මික සහ ධීවර රු. '000	බැංකු, මූල්‍ය සහ රක්ෂණ රු. '000	හෝටල්, ප්‍රවාහන සහ සේවා රු. '000	නිවාස, ඉදිකිරීම් සහ යටිතල පහසුකම් රු. '000	නිෂ්පාදන රු. '000
මූල්‍ය වත්කම්					
මුදල් සහ මුදල් හා සමාන දෑ	–	14,492,569	–	–	–
මහ බැංකු සමඟ ඇති ශේෂයන්	–	–	–	–	–
බැංකුවල ඇති තැන්පතු	–	11,674,664	–	–	–
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්	–	–	–	–	–
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	5,300,844	–	–	–
මූල්‍ය උපකරණ - වෙළඳපොල ගනුදෙනු සඳහා දරා සිටින	531,124	82,702	386,666	93,999	827,151
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	–	5,225,215	–	–	–
ගනුදෙනුකරුවන්ට දුන් ණය හා අත්තිකාරම්*	93,122,279	35,577,036	38,962,287	220,818,815	64,745,001
අඩු කලා - ණය හානිකරණය	–	–	–	–	–
මූල්‍ය ආයෝජන - උපලබ්ධිය සඳහා පවතින	–	8,401,252	–	–	–
මූල්‍ය ආයෝජන - කල්පිරෙන තෙක් දරා සිටින	–	–	–	–	–
	93,653,403	**80,754,282**	**39,348,953**	**220,912,814**	**65,572,152**

*රජය සතු ව්‍යාපාරයන් සඳහා අනාවරණය ඇතුළත් නොවේ.

60.2.4 බැඳීම් සහ ඇපකරයන්

ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතාවයන් මුදුන්පත් කරලීම වෙනුවෙන් බැංකුව අවලංගු කළ නොහැකි විවිධ බැඳීම්වලට හා අසම්භාව්‍යයන්ට ඇතුළත් වේ. එවැනි බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි අන්තර්ගත නොවුවද යම්තාක් දුරකට හෝ ණය අවදානමක් දරණ බැවින් බැංකුවේ මුළු අවදානමෙහි කොටසක් ලෙස සැලකිය යුතුය.

බැඳීම් හා ඇපකරයන් වෙනුවෙන් වන බැංකුවෙහි උපරිම ණය අවදානම් නිරාවරණයවීම් පිළිබඳව පහත වගුවෙහි දක්වා ඇත.

දෙසැම්බර් 31 දිනට	බැංකුව	
	2017 රු. '000	2016 රු. '000
ප්‍රතිග්‍රහණ සහ ණයවර ලිපි	147,887,385	133,108,741
ඉදිරි විනිමය ගිවිසුම්	39,125,183	78,538,947
ඇපකර	83,593,855	88,636,554
	270,606,423	**300,284,242**

වාණිජ වෙළෙඳාම රු. '000	රජය සහ සෘජු රාජ්‍ය රු. '000	ප්‍රවාහන සහ සේවා සම්පාදන රු. '000	වෙනත් වාණිජ සේවා රු. '000	පරිභෝජනය සහ වෙනත් රු. '000	එකතුව රු. '000
–	–	–	–	60,413,371	72,843,108
–	68,689,012	–	–	–	68,689,012
–	–	–	–	–	8,067,490
–	18,455,555	–	–	–	18,455,555
–	–	–	–	–	1,618,823
889,668	5,598,090	84,911	89,429	–	8,359,274
768,799	206,756,876	–	–	–	213,167,048
209,406,599	108,058,736*	89,891,385	31,716,190	271,274,970	1,219,914,481
–	–	–	–	–	(56,753,567)
–	8,198,673	–	–	1,478,870	17,921,170
–	308,256,082	–	–	–	308,256,082
211,065,066	**724,013,024**	**89,976,296**	**31,805,619**	**333,167,211**	**1,880,538,476**

වාණිජ වෙළෙඳාම රු. '000	රජය සහ සෘජු රාජ්‍ය රු. '000	ප්‍රවාහන සහ සේවා සම්පාදන රු. '000	වෙනත් වාණිජ සේවා රු. '000	පරිභෝජනය සහ වෙනත් රු. '000	එකතුව රු. '000
–	–	–	–	53,213,222	67,705,791
–	56,387,741	–	–	–	56,387,741
–	–	–	–	–	11,674,664
–	1,901,618	–	–	–	1,901,618
–	–	–	–	–	5,300,844
972,381	5,375,587	11,274	193,157	–	8,474,041
965,457	185,683,966	–	–	–	191,874,638
180,657,875	101,138,871*	49,524,934	22,027,488	240,615,104	1,047,189,690
–	–	–	–	–	(47,107,116)
–	434,475	–	–	1,627,319	10,463,046
–	243,178,400	–	–	–	243,178,400
182,595,713	**594,100,658**	**49,536,208**	**22,220,645**	**295,455,645**	**1,597,043,357**

60.3 ද්‍රවශීලතා අවදානම සහ අරමුදල් කළමනාකරණය

වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුව ද්‍රවශීලතා හා වෙළෙඳපොල අවදානම් තත්ත්වයන් පිළිබඳව තීරණ ගන්නා වූ ප්‍රධානතම කළමනාකරණ කමිටුව වන අතර, එය බැංකුවෙහි අරමුදල් සැලැස්ම මාසිකව විමර්ශනය කරමින් ද්‍රවශීල පිඩන තත්ත්වයකට හේතුවන යම් හෝ සැලකිය යුතු විචලනාවක් ඇතිවන්නේ නම් ඒ පිළිබඳ ප්‍රතිකර්ම යෝජනා ඉදිරිපත් කරනු ලබයි.

වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවේ තීරණ ගැනීමේ කටයුතු සඳහා භාණ්ඩාගාර අංශය මගින් සෑම මසකටම අදාළ වත්කම් හා වගකීම් පරිණතියේ පරතරය පිළිබඳ විශ්ලේෂණයක් සිදු කෙරේ. බැංකුවේ වත්කම් හා වගකීම් ඒවායේ පරිණත කාලය අනුව කලින් තීරණය කර ඇති කාල රාමුවලට අදාළ කරනු ලැබේ. වත්කම් හා වගකීම් පරිණතියේ නොගැලපීම බැංකුවේ ද්‍රවශීල අවදානම් අවම කිරීමේ සීමාවන්ට සාපේක්ෂව නිරීක්ෂණය කෙරේ.

2017 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය වගකීම්වල ගිවිසුම්ගත වට්ටම් නොකළ පරිණති පහත වගුවෙන් පෙන්නුම් කෙරේ:

2017 දෙසැම්බර් 31 දිනට	ඉල්ලුමේ දී රු. '000	මාස 3 ට අඩු රු. '000	මාස 3 සිට 12 දක්වා රු. '000	වසර 1 සිට 5 දක්වා රු. '000	වසර 5 ට වැඩි රු. '000	එකතුව රු. '000
බැංකුවලට ගෙවිය යුතු	–	2,203,199	–	–	–	2,203,199
ප්‍රති මිලට ගැනුම් ගිවිසුම් යටතේ විකිණූ සුරැකුම්පත්	–	33,391,992	11,095,470	–	–	44,487,462
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	70,715	–	–	–	70,715
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	576,214,705	392,398,282	528,814,674	48,652,021	752,354	1,546,832,036
වෙනත් ණය ගැනීම්	–	91,247,400	77,835,383	8,262,972	845,334	178,191,089
නිකුත් කළ ණය සුරැකුම්	–	–	–	–	–	–
යටත් කාලීන ණය	–	–	4,090,196	9,941,700	28,538,561	42,570,457
එකතුව	**576,214,705**	**519,311,588**	**621,835,723**	**66,856,693**	**30,136,249**	**1,814,354,958**

2016 දෙසැම්බර් 31 දිනට	ඉල්ලුමේ දී රු. '000	මාස 3 ට අඩු රු. '000	මාස 3 සිට 12 දක්වා රු. '000	වසර 1 සිට 5 දක්වා රු. '000	වසර 5 ට වැඩි රු. '000	එකතුව රු. '000
බැංකුවලට ගෙවිය යුතු	–	2,042,322	–	–	–	2,042,322
ප්‍රති මිලට ගැනුම් ගිවිසුම් යටතේ විකිණූ සුරැකුම්පත්	–	43,420,086	61,985,387	17,307	–	105,422,780
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	–	171,663	–	–	–	171,663
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	544,978,039	286,365,143	390,777,612	61,946,504	3,178	1,284,070,476
වෙනත් ණය ගැනීම්	–	34,719,659	81,273,566	79,892,126	824,918	196,710,269
නිකුත් කළ ණය සුරැකුම්	–	–	3,823,000	–	–	3,823,000
යටත් කාලීන ණය	–	–	9,584,647	8,595,013	9,455,669	27,635,329
එකතුව	**544,978,039**	**366,718,873**	**547,444,212**	**150,450,950**	**10,283,765**	**1,619,875,839**

60.4 වෙළඳපොල අවදානම

පොළී අනුපාතයන්, විදේශ විනිමය හුවමාරු අනුපාතයන්, කොටස් මිල සහ භාණ්ඩ මිල ගනන් ආදී වෙළෙඳපොල විචල්‍යයන්ගේ සිදු වන උච්ඡාවචනයන් හේතුවෙන් මූල්‍ය උපකරණයන් හි අනාගත මුදල් ප්‍රවාහයන්ගේ සාධාරණ අගය වෙනස්වීම් කෙරෙහි දක්වන අවදානම වෙළඳපොල අවදානම ලෙස සලකනු ලබයි. වෙළඳාම් කරන හෝ නොකරන කළඹ වශයෙන් බැංකුව වෙළඳපොල අවදානම අනාවරණයවීම් වර්ග කර වෙන වෙනම කළමනාකරණය කරනු ලබයි. විදේශ විනිමය හුවමාරු සහ කොටස් වෙළඳාම් කළඹයන් හි වෙළෙඳපොල අවදානම කළමනාකරණය සහ අධීක්ෂණය කරනු ලබන්නේ අවදානම් විචල්‍යයන්හි අන්තර් බැඳීම් පෙන්නුම් කරනු ලබන "අවදානමේදී අගය" (Value at Risk –VaR) ක්‍රමවේදය අනුව වේ. පදනම් අගය මත මිල වෙනස්වීම (Price Value of Basis Point – PVBP) සහ කාල විශ්ලේෂණය (Duration Analysis) ඇසුරෙන් වෙළඳ කළඹට බලපාන පොළී අනුපාත අවදානම කළමනාකරණය සහ අධීක්ෂණය සිදු කරයි.

සංවේදිතා අධ්‍යයනයෙන් හා ආතති පරීක්ෂාවන් මගින් වෙළඳාම් නොකරන කළඹ කළමනාකරණය සහ අධීක්ෂණය සිදු කරනු ලබයි.

60.4.1 මුදල් ඒකක අවදානම

විදේශ විනිමය අනුපාත විචලනය වීම නිසා මූල්‍ය උපකරණවල වටිනාකමට වෙන බලපෑම මුදල් ඒකක අවදානම වේ. බැංකුව විසින් විදේශ මුදල්වලට අඩු ප්‍රමාණයක විවෘත තත්ත්වයන් පවත්වාගෙන යන නිසා විදේශ මුදල් ගනුදෙනු හේතුවෙන් ප්‍රමාණාත්මක ලාභ අලාභ ඇති නොවේ. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය මගින් නිර්දේශ කරන ලද අවදානම් අගයෙහි සීමාවන් ඇතුළු විස්තරාත්මක සීමා ව්‍යුහයක් මගින් විදේශ විනිමය අවදානම පාලනය කරනු ලබයි. විදේශ විනිමය අවදානම අධීක්ෂණය කිරීම සඳහා බැංකුව විසින් ඓතිහාසික අවදානමේදී අගය ක්‍රමවේදය භාවිතා කරනු ලබයි.

2017 දෙසැම්බර් 31 දිනට විදේශීය විනිමය අවදානමේ දී අගය (VaR) රු. 21,066,977 සහ අවදානම් අභිරුචි සීමාව රු. 160,000,000 වේ.

දෙසැම්බර් 31 දිනට විදේශ විනිමය තත්ත්වය	2017		2016	
	සමස්ත ධණ අගය (ශුද්ධ) රු. '000	සමස්ත ඍණ අගය (ශුද්ධ) රු. '000	සමස්ත ධණ අගය (ශුද්ධ) රු. '000	සමස්ත ඍණ අගය (ශුද්ධ) රු. '000
මුදල් ඒකකය				
ඇමරිකානු ඩොලර්	877,195	–	82,924	–
බ්‍රිතාන්‍ය පවුම්		(3,974)	14	–
යුරෝ	1,331	–	112	–
ජපන් යෙන්	–	(5,263)	2	–
ඔස්ට්‍රේලියන් ඩොලර්	–	(582)	–	(1,123)
කැනේඩියන් ඩොලර්	–	(410)	–	(326)
ස්විස් ෆ්‍රෑන්ක්		(386)	489	–
සිංගප්පුරු ඩොලර්	–	(930)	–	(1,052)
හොංකොං ඩොලර්	–	(1,562)	(1,838)	–
උප එකතුව	**878,526**	**(13,107)**	**11,745**	**(2,501)**
වෙනත් මුදල් ඒකක වර්ග	12,090	(3,489)	4,783	(647)
මුළු එකතුව	**890,616**	**(16,596)**	**2,376**	**(3,148)**
ධණ හෝ ඍණ අගයන්හි වැඩි අගය		(16,596)		(3,148)

විනිමය අනුපාත කම්පනයන්ගෙන් ලාභ හෝ පාඩු ප්‍රකාශනයට වන බලපෑම

විදේශ විනිමය අනුපාතයේ කම්පන (%)	2017		2016	
	ශුද්ධ විවෘත තත්ත්වය (අනුපාතික වෙනස්වීමෙන් පසු) රු. '000	2017 දෙසැම්බර් 31 වන දිනට ලාභ හෝ පාඩු ප්‍රකාශනයට වන බලපෑම රු. '000	ශුද්ධ විවෘත තත්ත්වය (අනුපාතික වෙනස්වීමෙන් පසු) රු. '000	2016 දෙසැම්බර් 31 වන දිනට ලාභ හෝ පාඩු ප්‍රකාශනයට වන බලපෑම රු. '000
5	(15,766)	830	(2,991)	157
10	(14,936)	1,660	(2,833)	315
-5	(17,426)	(830)	(3,305)	(157)
-10	(18,256)	(1,660)	(3,463)	(315)

60.4.2 පොළී අනුපාත අවදානම

පොළී අනුපාතයන්හි වෙනස්වීම අනාගත මුදල් ප්‍රවාහයන්ට හෝ මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකමට බලපෑ හැකි සම්භාවිතාව මත පොළී අනුපාත අවදානම පැන නගී.

පදනම් අගය මත මිල වෙනස්වීම (PVBP) සහ කාල විශ්ලේෂණය මඟින් දෙනිකව බැංකුව මඟින් වෙළඳාම් කරනු ලබන භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්වල පොළී අනුපාත වෙනස්වීම තක්සේරු කරනු ලබයි.

විනිමය අනුපාත කම්පන	2017 රු. '000	2016 රු. '000
පදනම් අගය මත මිල වෙනස්වීම (PVBP)		
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන	32,201	8,864
භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන	58,835	25,308
කාල සීමාව		
භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන	වසර 0.5	වසර 0.5
භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජන	වසර 1.0	වසර 2.5

කලින් නිර්ණය කරන ලද කල් පිරීමේ කාලවිච්ඡේදයන් භාවිත කරමින් බැංකුවේ පොළී සංවේදී වත්කම් හා වගකීම් ඇගයීමට ලක් කිරීමෙන් බැංකු කටයුතු සඳහා ඇති වත්කම් මත පොළී අවදානම් නිරීක්ෂණය කරනු ලැබේ. මෙහිදී කල්පිරීමට ඇති කාල පරතර සීමා පිහිටුවීම හා අධීක්ෂණය කිරීම, නැවත මිල කිරීමේ පැතිකඩ ආදිය සැලකිල්ලට ගනු ලැබේ.

2017	මාසයක් දක්වා %	මාස 1-3 දක්වා %	මාස 3-6 දක්වා %	මාස 6-12 දක්වා %	අවුරුදු 1-2 දක්වා %	අවුරුදු 2-3 දක්වා %	අවුරුදු 3-4 දක්වා %	අවුරුදු 4-5 දක්වා %	අවුරුදු 5 ට වැඩි %
පොළී අනුපාත සංවේදී වත්කම්	9.1	17.1	6.3	22.2	9.3	9.3	5.0	5.0	16.7
පොළී අනුපාත සංවේදී වගකීම්	8.8	15.1	16.8	18.2	4.5	4.5	4.0	4.0	24.2
පරතරය	0.3	2.0	-10.5	4.0	4.8	4.8	1.0	1.0	-7.5

2016	මාසයක් දක්වා %	මාස 1-3 දක්වා %	මාස 3-6 දක්වා %	මාස 6-12 දක්වා %	අවුරුදු 1-2 දක්වා %	අවුරුදු 2-3 දක්වා %	අවුරුදු 3-4 දක්වා %	අවුරුදු 4-5 දක්වා %	අවුරුදු 5 ට වැඩි %
පොළී අනුපාත සංවේදී වත්කම්	8.6	13.8	9.5	13.8	15.1	15.1	3.6	3.6	16.9
පොළී අනුපාත සංවේදී වගකීම්	8.1	11.7	8.4	25.1	7.4	7.4	4.5	4.5	23.0
පරතරය	0.5	2.1	1.0	-11.3	7.7	7.7	-0.8	-0.8	-6.1

60.4.3 ස්කන්ධ අවදානම

ස්කන්ධ දර්ශකයන්හි හා එක් එක් කොටස්වල මිල උච්ඡාවචනය හේතුකොට ගෙන ස්කන්ධ කළඹෙහි සාධාරණ අගය අඩුවීම ස්කන්ධ අවදානම ලෙස හැඳින්වේ. සමස්ත ස්කන්ධ ආයෝජන කළඹ සඳහා සීමාවක් පැනවීම සහ අවදානමේ දී අගය (VaR) යන ශිල්පීය ක්‍රම මඟින් මෙම අවදානම අධීක්ෂණය කෙරේ. 2017 වර්ෂය සඳහා ස්කන්ධය සඳහා වන අවදානම් අනිරුවිය අවදානමේ දී අගය (VaR) රු. 315,000,000 වේ.

ස්කන්ධයන්හි අවදානමේ දී අගය	2017 රු. '000	2016 රු. '000
ඉහළම	263,051	151,146
පහළම	87,841	117,168
සාමාන්‍ය	144,906	134,170
දෙසැම්බර් 31 දිනට	89,852	131,409

60.5 මෙහෙයුම් අවදානම

අප්‍රමාණවත් හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලිවල, පුද්ගලයින්ගේ හෝ පද්ධතිවල ප්‍රතිඵලයක් ලෙස හෝ බාහිර සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස අලාභ ඇතිවීමේ අවදානම මෙහෙයුම් අවදානම ලෙස නිර්වචනය කෙරේ. මෙයට නෛතික අවදානම ඇතුළත් වන නමුත් උපායමාර්ගික හා කීර්තිනාම අවදානම ඇතුළත් නොවේ.

සැලකිය යුතු මෙහෙයුම් අවදානමක්, බැංකුවේ ව්‍යාපාර කටයුතුවල නිරන්තරව පවතින අතර, එය ඕනෑම ව්‍යාපාරයකට පොදු ලක්ෂණයකි. කාර්යක්ෂම කළමනාකරණ මෙහෙයුම් ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම ඔස්සේ මෙහෙයුම් අවදානමට ඇති අනාවරණය අවම කර ගැනීමට බැංකුව උත්සාහ කරනු ලැබේ.

මූලික දර්ශක ප්‍රවේශය (Basic Indicator Approach - BIA) ඇසුරෙන්, මෙහෙයුම් අවදානම සඳහා ප්‍රාග්ධනය වෙන් කිරීම බැංකුව විසින් සිදු කරන නමුත්, ප්‍රායෝගිකව සත්‍ය මෙහෙයුම් අලාභය උක්ත සඳහන් ප්‍රාග්ධන වෙන් කිරීමට සාපේක්ෂව ඉතා පහළ මට්ටමක පවතින බව ගම්‍ය වේ.

60.6 ප්‍රාග්ධන කළමනාකරණය

ප්‍රාග්ධන කළමනාකරණයෙහි මූලික අරමුණ වනුයේ නියාමන ප්‍රාග්ධන අවශ්‍යතාවයට අනුරූපව ප්‍රාග්ධන මට්ටම පවත්වාගෙන යාමයි. බැංකුවෙහි අවදානම් අනිරුවිය සහ උපක්‍රමික අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අවශ්‍ය තරම් ප්‍රාග්ධනය වෙන් කර ඇති බව බැංකුව තහවුරු කරයි.

60.6.1 ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය

ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය (CAR) බැංකුවෙහි ප්‍රාග්ධනය, අවදානම මත බර තැබූ වත්කම්, බැංකුකරණ ව්‍යාපාරයෙහි ණය, වෙළඳපොල අංශ සහ මෙහෙයුම් අතර සම්බන්ධතාවය අනුපාතිකයක් ලෙස පෙන්නුම් කරයි. බලාපොරොත්තු නොවන අවස්ථාවන්ට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වාගෙන යාමට බැංකුවෙහි මූල්‍ය ස්ථාවරත්වය හා ශක්තිය පෙන්නුම් කිරීම සඳහා ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය භාවිතා කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (CAR) නිර්වචනය කිරීම සහ නියාමනය කිරීම තුළින් තහවුරු කරනුයේ, බැංකුව විසින් ණය පැහැර හැරීමේ අවදානම ඉහළ යන ආයෝජන දරා සිටීම හෝ සහභාගිවීමෙන් වැළකී සිටීමත්, මෙහෙයුම් අවදානම දරා සිටීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගැනීමත්, එයින් බැංකු පද්ධතියේ විශ්වසනීයත්වය පවත්වා ගැනීමත්ය.

ප්‍රාග්ධන මිණුම්කරණය පිළිබඳ ජාත්‍යයන්තර ප්‍රමිති හා ප්‍රාග්ධන ප්‍රමිත සංශෝධන ආකෘතිය අනුව බැංකුව විසින් ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (CAR) ගණනය කරයි. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් විය හැකි අයහපත්ම තත්ත්වය සඳහා දැඩිව ආතතියකට පත්කර ක්‍රියාකාරිව හා අබණ්ඩව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව අධීක්ෂණය කෙරේ. අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීම් ක්‍රියාවලිය (ICAAP) යටතේ කීර්තිනාම අවදානම, උපායමාර්ග අවදානම, අනුකූලවීමේ අවදානම, සංකේන්ද්‍රණ අවදානම සහ බැංකු කටයුතු සඳහා ඇති වත්කම් මත පොළී අවදානම වැනි සියළුම අවදානම් සලකා බලනු ලැබේ.



අනුකූලවීමේ ඇමුණුම්

304—2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

324—කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

326—ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතා

329—ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය

344—පැවරුම් මිල සම්බන්ධ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහතිකය

2007 අංක 11 දරණ බැංකු පනත යටතේ අනුකූලවීමේ අවශ්‍යතා

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1)	**අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්**	
3 (1) (i)	පහත සඳහන් දෑ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම තුළින් බැංකුවේ ආරක්ෂාව හා අඛණ්ඩතාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශක්තිමත් කර ඇත. (අ) බැංකුවේ උපායමාර්ගික අරමුණු හා ආයතනික හර පද්ධතීන් අනුමත කිරීම හා අධීක්ෂණය කිරීමත් ඒවා බැංකුව තුළ සන්නිවේදනය කිරීම.	අනුකූල වී ඇත. උපාය මාර්ගික අරමුණු සහ හර පද්ධතිය අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ඉහළ කළමණාකාරිත්වයේ සහභාගිත්වය ඇතුව බැංකුවෙන් බාහිර ස්ථානයක දී සකස් කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද 2017-2019 කාලපරිච්ඡේදය සඳහා වූ ආයතනික සැලැස්මෙහි මෙම අරමුණු සහ හර පද්ධතිය අන්තර්ගත කර ඇත. ආයතනික සැලසුම් ඉදිරිපත් කරන ලද බාහිර ස්ථානයේදී මෙම කරුණු පිළිබඳව ශාඛා කළමණාකරුවන් දක්වා වූ සියළු කාර්ය මණ්ඩලයට සන්නිවේදනය කරන ලද අතර ආයතනික කළමණාකාරිත්ව කණ්ඩායම මගින් එය තවදුරටත් ශක්තිමත් කරන ලදී. නිතිපතා පවත්වන ලද සාකච්ඡා සැසි සහ රැස්වීම් හරහා අනෙකුත් සියළුම කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලදී. 2018 - 2020 සඳහා ඉහත ආකාරයෙන් සකස් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයතනික සැලසුම ද ක්‍රියාත්මක වේ. 2018 වසරේ සිට ඉදිරියට ආයතනික වටිනාකම් නැවත සකස් කරන ලදී. සියළුම සේවකයන්ට බෙදා දී ඇති සාරධර්ම අත්පොතෙහි ආයතනික වටිනාකම් අන්තර්ගත කර ඇති අතර, එය අන්තර් ජාලයෙන් ද ලබා ගත හැකිය.
	(ආ) අඩුම වශයෙන් ඊළඟ වසර තුන සඳහා සමස්ථ අවදානම් ප්‍රතිපත්තිය හා අවදානම් කළමනාකරණ පටිපාටීන් සහ මැනිය හැකි අරමුණු සහිත යාන්ත්‍රණයන් ඇතුළත් බැංකුවේ සමස්ථ වෙළඳ කටයුතු පිළිබඳව උපායමාර්ග අනුමත කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය 2017-2019 වර්ෂ සඳහා බැංකුවේ උපායමාර්ග පිහිටුවා ඇති අතර, එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. උපායමාර්ගික සැලසුම සමඟ යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවදානම් අභිරුචිය, ප්‍රතිපත්තිය, කළමනාකරණ රාමුව සහ යාන්ත්‍රණය අනුමත කර ඇත. සේවා ස්ථානයෙන් පිටත සිදු කරන ලද රැස්වීමකදී සමස්ථ බැංකුවට මැනිය හැකි ඉලක්ක පිහිටුවා ඇති අතර, එම ඉලක්කයන් පදනම්ව කාර්යඵලයන් ඇගයීම සිදු කරයි.
	(ඇ) ප්‍රධාන ආදායම් හඳුනා ගැනීම හා විචක්ෂණ ලෙස අවදානම් කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය පද්ධති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.	අනුකූල වී ඇත. බැංකුවේ අවදානම් ප්‍රතිපත්තිය අනුමත කිරීම, අවදානම් අභිරුචිය නිර්වචනය කිරීම, ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම, පාලන ව්‍යුහයක් ඇති කිරීම, ප්‍රධාන අවදානම් මැනීම, අධීක්ෂණය හා පාලන සහ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම ආදිය අරමුණු කරගෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත. බැංකු සාමාජිකයින් විසින් නව මූලෝපායයන් හා එවැනි අවදානම් තවදුරටත් අවම කිරීමේ ක්‍රම හා උපක්‍රම සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කරන ක්‍රියාවලියක් බැංකුව ආරම්භ කර ඇත. අවදානම් සම්බන්ධ සියළුම ප්‍රදේශ ආවරණය කරන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ සංශෝධිත අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වේ. • අවදානම් කළමනාකරණ වාර්තාව පිටු 80 සිට 92 දක්වා. • ඒකාබද්ධ අවදානම් කළමනාකරණ වාර්තාව පිටු 74 සහ පිටු 75 දක්වා.
	(ඈ) තැන්පත්කරුවන්, ණයහිමියන්, කොටස්කරුවන් සහ ණයගැතියන් ඇතුළු උනන්දුවක් දක්වන සියළුම පාර්ශ්වයන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා වූ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම.	අනුකූල වී ඇත. උනන්දුවක් දක්වන සියළු පාර්ශ්වයක්ම ආවරණය වන පරිදි සන්නිවේදන ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ක්‍රියාත්මක කර ඇති අතර, මෙය වර්ෂය තුළදී විමර්ශනය කරන ලදී.
	(ඉ) බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සහ කළමනාකරණ තොරතුරු පද්ධතීන්හි ප්‍රමාණාත්මකභාවය සහ විශ්වසනීයත්වය විමර්ශනය කිරීම	අනුකූල වී ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ මූල්‍ය වාර්තාකරණයේ ප්‍රමාණාත්මකභාවය හා අඛණ්ඩභාවය සමාලෝචනය කිරීම විගණන කමිටුවට පැවරී ඇත. මෙම කටයුතු කිරීමට විගණන කමිටුවට සෘජුව වාර්තා කරන අභ්‍යන්තර විගණන දෙපාර්තුමේන්තුවෙන් වාර්තා ලබා ගන්නා අතර, බාහිර විගණකයින්ගෙන්ද වාර්තා ලබා ගනී. කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායිත්වය ඇගයීම සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් තොරතුරු පද්ධති විගණන සිදු කරන ලදී. අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කර ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඊ) ප්‍රධාන කළමනාකරණ මඩුල්ල හඳුනා ගැනීම හා නම් කිරීම.	අනුකූල වී ඇත. 2015 දෙසැම්බර් 02 දිනැති ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශ හා 2010 අංක 03 දරන බැංකු පනතේ මහා කළමනාකරු, නියෝජ්‍ය මහා කළමනාකරු, සහකාර මහා කළමනාකරුවන් සහ ඊට සමාන ශ්‍රේණිවලට අයත් නිලධාරීන් බැංකුවේ යහපාලන අරමුණු සඳහා වූ ප්‍රධාන කළමනාකරණ මඩුල්ල (KMP) ලෙස බැංකුව හඳුනාගෙන තිබේ.
	(උ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ මඩුල්ලට අයත් අධිකාරී බල ක්ෂේත්‍රය හා ප්‍රධාන වගකීම් නිර්වචනය කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අධිකාරී බලතල හා වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි ද ප්‍රධාන කළමනාකරණ මඩුල්ලෙහි අධිකාරී බලතල හා වගකීම් රැකියා විස්තරයෙහි ද පිළිවෙලින් අර්ථ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය 2017 වර්ෂයේදී අවසන් වරට විමර්ශනය කරන ලදී.
	(ඌ)අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ප්‍රධාන කළමනාකරණ මඩුල්ල විසින් බැංකුවේ කටයුතු යෝග්‍ය ආකාරයෙන් අධීක්ෂණය කරනු ලබන බවට සහතික කිරීම.	අනුකූල වී ඇත. බැංකුවේ ආයතනික සැලැස්මට එරෙහිව කාර්යසාධනය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමර්ශනය කරනු ලැබේ. ප්‍රධාන කළමනාකරණ මණ්ඩලය විසින් තමන්ගේ විෂය පථයට අදාළ කරුණු සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම් සිදු කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ විෂය පථයට අදාළව කරුණු පැහැදිලි කිරීම් වලටද කැඳවනු ලැබේ.
	(එ) පහත සඳහන් දේ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ යහපාලන පරිචයන්හි ඵලදායීතාවය කලින් කලට දැන ගැනීම: (1) අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ මඩුල්ල තෝරා ගැනීම, නම් කිරීම සහ පත්කිරීම; (2) අරමුණු අතර ගැටුම් කළමනාකරණය කිරීම; සහ (3) දුර්වලතාවයන් නිශ්චය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී වෙනස්කම් කිරීම	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යසාධනය පිළිබඳව ස්වයං ඇගයීමක් වාර්ෂිකව සිදු කරනු ලබන අතර එහිදී ඔවුන්ගේ යහ පාලන පුරුදු ද අගයනු ලැබේ.
	(ඒ) ප්‍රධාන කළමනාකරණ මඩුල්ල සඳහා යෝග්‍ය වූ අනුප්‍රාප්තික සැලැස්මක් බැංකුව සතු බව සහතික කිරීම.	අනුකූල වී ඇත. ප්‍රධාන කළමනාකරණ මඩුල්ල සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලසුමක් බැංකුව සතුව ඇත. නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව විසින් මෙය විමර්ශනය සහ සංශෝධනය කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත 2017 වසර තුල ඉදිරිපත් කර ඇත.
	(ඔ) ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග පිහිටුවීම සහ ආයතනික අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ ප්‍රගතිය විමර්ශනය කිරීම යනාදිය සඳහා අවශ්‍යතාවය අනුව නිතිපතා ප්‍රධාන කළමනාකරණ මඩුල්ල සමඟ රැස්වීම් පැවැත්වීම.	අනුකූල වී ඇත. තමන්ගේ විෂය පථයට අදාළව ප්‍රධාන කළමනාකරණ මඩුල්ලේ සාමාජිකයින් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීම් ක්‍රමානුකූල පදනමින් සිදු කරන අතර, අවශ්‍ය නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රධාන කළමනාකරණ සාමාජිකයින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට කැඳවනු ලැබේ. ආයතනික සැලැස්ම සම්බන්ධයෙන් වූ කාර්යසාධනය සමාලෝචනය කිරීම බැංකුවෙන් පිට ස්ථානවලදී කළමනාකරණයේ සහභාගිත්වයෙන් කරගෙන යනු ලැබේ.
	(ඕ) නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සහ නියාමකයින් සමඟ බැංකුව ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගන්නා බවට සහතික කිරීම.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරයකු පත් වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සියළුම නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ ලිපිගොනුවක් ඔහුට ලබා දේ. අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් හරිහැටි ඉටු කිරීම සඳහා ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමට නියාමන පරිසරයේ සිදුවන වෙනස්වීම් පිළිබඳ අධ්‍යක්ෂවරුන් කලින් කලට දැනුවත් කරනු ලැබේ. නියාමකවරුනට ලබා දෙන සියළුම ප්‍රතිලාභ ඇතුළත් ශ්‍රී ලංකා මහ බැංකුව ලබාදෙන අනුකූලතා වාර්තා මාසිකව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන අතර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඕනෑකමින් අධීක්ෂණය කරනු ලැබේ.
	(ක) බාහිර විගණකයින්ගේ සේවය ලබාගැනීමේදී සහ අධීක්ෂණය නිසි ප්‍රවේශම් සහගත භාවයකින් යුතුව කටයුතු කිරීම.	අනුකූල වී ඇත. බැංකුව රජය සතු ව්‍යාපාරයක් වන බැවින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්ට අනුව, විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ. කෙසේ වෙතත් විගණකාධිපති ගේ සහය සඳහා පත් කළ බාහිර විගණකවරුන්ගේ සේවය අධීක්ෂණයට විගණන කමිටුව පත් කර තිබේ.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1) (ii)	මෙම නියමයන්ගේ 3 (5) නියමයේ දක්වා ඇති ආකාරයට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි පත් කිරීමත් ඔවුන්ගේ කාර්යයන් හා වගකීම් නිශ්චය කර අනුමත කිරීමත් කළයුතු වන්නේය.	උපදෙස් අංක 3 (9) (II) සමඟ කියවන විට අනුකූල වේ. බැංකුව අයත්වන අමාත්‍යාංශය හාරව සිටින ඇමතිවරයාගේ පූර්ව අනුමැතිය සහිතව ලංකා බැංකුවේ මහා කළමනාකරු ලෙසද හඳුන්වන ප්‍රධාන විධායක නිලධාරී පත්කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වන අතර 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත හා එහි සංශෝධනයන්ට අනුව උක්ත ඇමතිවරයා විසින් සභාපති පත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තිය මගින් භූමිකා දෙක අතර, බල තුලනය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ඔවුන්ගේ කාර්යයන් සහ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර තිබේ.
3 (1) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය අඛණ්ඩව පැවැත්විය යුතු අතර, ආසන්න වශයෙන් මාසික පරතරයක් සහිතව අවම වශයෙන් වසරකට දොළොස් වතාවක්වත් අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් පැවැත්විය යුතුය. එවැනි රැස්වීම්වලට පැමිණීමට අයිතිය ඇත්තා වූ අධ්‍යක්ෂවරුන්ගෙන් බහුතරයකගේ පුද්ගලික ක්‍රියාශීලි සහභාගිත්වය තිබිය යුතුය. ලිඛිත යෝජනා/පත්‍රිකා ආදිය තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනීම හැකිනාක් දුරට වැලැක්විය යුතුවේ.	අනුකූල වී ඇත. අඛණ්ඩ අර්ධ මාසික අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වන අතර විශේෂ රැස්වීම් අවශ්‍යතාව පැන නගින ආකාරයට සැලසුම් කරනු ලැබේ. සමාලෝචිත වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය 28 වතාවක් රැස්වී තිබේ. චක්‍රලේඛ යෝජනා මගින් අනුමැතිය ලබා ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවම කර තිබෙන අතර, එය විශේෂිත පදනමක් මත පමණක් කරනු ලබන අතර එවැනි යෝජනා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඊළඟ රැස්වීමේදී සම්මත කෙරේ. 2017 වසර තුළ යෝජනා 5 ක් චක්‍රලේඛ මගින් සම්මත කර ඇත.
3 (1) (iv)	අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සඳහා වූ න්‍යාය පත්‍රයට විෂයයන් හා යෝජනා ඇතුළත් කිරීමට අධ්‍යක්ෂවරුන්ට හැකියාව ලැබෙන අයුරින් නිසි පියවර ගෙන ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුත්තේය. ඒවා බැංකු ව්‍යාපාරික කටයුතු හා අවදානම් කළමනාකරණය වැඩි දියුණු කිරීමට අදාළ වූ විෂයයන් හා යෝජනා විය යුතුය.	අනුකූල වී ඇත. ක්‍රමානුකූලව පැවැත්වෙන රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය යෝජනා ඇතුළත් කළ හැකි වන පරිදි සෑම වර්ෂයක්ම ආරම්භයේදී රැස්වීම් නියම කර අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වනු ලැබේ.
3 (1) (v)	සියළුම අධ්‍යක්ෂවරුන්ට අවස්ථාවක් ලබාදීමේ අරමුණින් සාමාන්‍ය අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අවම වශයෙන් දින 7 ක පෙර දැනුම්දීමක් කරන බවට අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටියක් මගින් සහතික කළ යුත්තේය. අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කළ හැකිය.	අනුකූල වී ඇත. වර්ෂය ආරම්භයේදී වාර්ෂික දින දර්ශනය මගින් රැස්වීම් පිළිබඳ දැනුම් දීම සිදු කෙරේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට දින හතකට පෙර න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ආරක්ෂිත විද්‍යුත් මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වේ. අනෙකුත් විශේෂ රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කරනු ලැබේ.
3 (1) (vi)	පසුගිය මාස 12 ක කාලය තුළ පැවැත්වූ රැස්වීම් වාර අඩුම වශයෙන් 2/3 කට සහභාගි නොවුණ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ පසුගිය රැස්වීම් වාර 3 කට අඛණ්ඩව සහභාගි නොවුණු අධ්‍යක්ෂවරයෙකුගේ හෝ අධ්‍යක්ෂ ධූරය අහිමි වන බවට අධ්‍යක්ෂ මණ්ඩල පටිපාටිය මගින් සහතික කළ යුතුය. විකල්ප අධ්‍යක්ෂවරයෙකු මාර්ගයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගිවීම, නිසි පැමිණීමක් ලෙස පිළිගත හැකිය.	අනුකූල වී ඇත. ආයතනික යහපාලන සංග්‍රහයට අනුව අධ්‍යක්ෂවරුන්ට ඔවුන්ගේ රැස්වීම් වලට සහභාගි වීම් පිළිබඳ දැනුවත් කර ඇත. අධ්‍යක්ෂවරුන් රැස්වීම් වලට සහභාගි වීම් පිළිබඳ පිටු අංක 69 හි දක්වා ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම මෙම නියෝගයට අනුකූලව තිබේ.
3 (1) (vii)	1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ දැක්වෙන විධිවිධාන සපුරන්නා වූ සමාගම් ලේකම්වරයකු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කළ යුත්තේය. එම තැනැත්තාගේ මූලික වගකීම් විය යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේඛකාධිකාරී සේවා ලබාදීම සහ අණ පනත්වල හා වෙනත් නියාමනයන් මගින් දක්වා ඇති අනෙකුත් කාර්යයන් කිරීමත්ය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ ලේකම්/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් නීතිඥවරියක වන අතර 1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධාන අයෙ විසින් සපුරාලනු ලබයි. ඇයගේ මූලික වගකීම් විය යුත්තේ අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමියන්ගේ රැස්වීම් සඳහා ලේඛකාධිකාරී සේවා ලබාදීම සහ අණ පනත්වල හා වෙනත් නියාමනයන් මගින් දන්වා ඇති අනෙකුත් කාර්යයන් කිරීමත්ය.
3 (1) (viii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ පටිපාටීන් සහ අදාළ සිය රීති හා නියාමනයන් පිළිපදින බව සහතික කරනු පිණිස සියළුම අධ්‍යක්ෂවරුන්ට සමානව ලේකම්ගෙන් උපදෙස් හා සේවා ලබාගැනීම සඳහා අවකාශය තිබිය යුතුය.	අනුකූල වී ඇත. සියළුම අධ්‍යක්ෂවරුන්ට ලේකම්ගෙන් උපදෙස් ලබා ගැනීමේ හැකියාව ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය නීතිඥවරියක වන අතර, අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියාපටිපාටි පිළිබඳ සොයා බැලීමට, නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබා ගැනීම හා පවත්වාගෙන යාම සහ බැංකුවට අදාළ වාර්තා තබා ගැනීම සඳහා ඇය අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු වේ.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1) (ix)	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා ලේකම්වරිය විසින් පවත්වා ගතයුතු අතර, ඕනෑම සාධාරණ වේලාවක දී සාධාරණ දැනුම්දීමකින් පසු ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට එවැනි වාර්තා පරීක්ෂා කිරීම සඳහා විවෘතව පැවතිය යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා ලේකම්වරිය විසින් පවත්වාගෙන යන අතර, ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික් සම්බන්ධතාවයක් තුළ තැන්පත් කරන අතර ඒවා සෑම අධ්‍යක්ෂවරයකුටම ලැබීමට සලස්වා ඇත. රැස්වීම් වාර්තා ඊට පසුව පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී අනුමත කර ඇත. අධ්‍යක්ෂවරුන්ට එම ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික් සම්බන්ධතාවය හරහා පැරණි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තාවලට ප්‍රවේශ වීමට හැකියාව ඇත.
3 (1) (x)	අධ්‍යක්ෂ මණ්ඩලය නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණශීලි බවකින් කටයුතු කළා ද යන්න වාර්තා මඟින් තොරතුරු ලබාගත හැකිවන ආකාරයෙන්, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල වාර්තා ප්‍රමාණවත් අයුරින් විස්තරාත්මක විය යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඇති වන සාකච්ඡාවන්ගේ ගැඹුරු බව පිළිබඳ තක්සේරු කිරීමට මෙම වාර්තා නියාමන හා අධීක්ෂණ අධිකාරීන්ට උපකාරී විය යුතුය. එම නිසා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා තුළ පහත දෑ පැහැදිලිව ඇතුළත් විය යුතුය: (අ) අධ්‍යක්ෂ මණ්ඩලය තම සාකච්ඡා සඳහා භාවිතා කරනු ලැබූ තොරතුරු හා දත්ත පිළිබඳ සාරාංශයක් (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සලකා බැලීමට යෙදුන විෂය කරුණු (ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තම යුතුකම් නිසි සැලකිල්ලෙන් හා ප්‍රවේසම් සහගත භාවයකින් යුතුව කරගෙන යන්නේ ද යන්න පිළිබඳ තොරතුරු, රැස්වීමේ සාකච්ඡා සහ මතභේදයට හෝ විරෝධයට බඳුන් වූ විෂය කරුණු (ඈ) අධ්‍යක්ෂ මණ්ඩලයේ උපායමාර්ග හා ප්‍රතිපත්ති සහ අදාළ නීති හා නියාමනයන් වලට අනුකූල වන බව විදහාපාන්නා වූ, අදාළ විධායකයින් විසින් කරනු ලබන සාක්ෂිදීම් සහ සනාථ කිරීම් (ඉ) බැංකුව විවෘත වන අවදානම් වලට සම්බන්ධ කරුණු සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තා ඇතුළත්ව අවදානම් කළමනාකරණය පිළිබඳ විශ්ලේෂණයන් (ඊ) තීරණ සහ අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා	අනුකූල වී ඇත. විස්තරාත්මක අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා මඟින් මෙම නිර්ණායකයන්ට අදාළ කරුණු ආවරණය වේ.
3 (1) (xi)	යෝග්‍ය අවස්ථාවන්හි දී, සාධාරණ ඉල්ලීම් මත, බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීයමය උපදෙස් පැතීම සඳහා අධ්‍යක්ෂවරුන්ට අවස්ථා ලබාදෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟ වූ පරිපාටියක් තිබිය යුත්තේය. අදාළ අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරුන්ට ඔහුගෙන්/ඇයගෙන්/ඔවුන්ගෙන් බැංකුවට ඉටුවිය යුතු යුතුකම් ඉටුකිරීම සඳහා ආධාර වීම පිණිස වෙනම ස්වාධීන වෘත්තීයමය උපදෙස් අධ්‍යක්ෂවරුන්ට ලබාදීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කළ යුතුය.	අනුකූල වී ඇත. ස්වාධීන වෘත්තීමය උපදෙස් පැතීම සඳහා බැංකුව විසින් අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසා ඇති අතර, අවශ්‍ය අවස්ථාවලදී අධ්‍යක්ෂ මණ්ඩලය එවැනි උපදෙස් කරා යොමුවෙයි.
3 (1) (xii)	අනෙකුත් සංවිධාන හෝ සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ කටයුතු කිරීමේදී සහ ඒවාට ඇති බැඳීම්වල දී, අරමුණු අතර ගැටුම් ඇතිවීම හෝ එවැනි ගැටුම් ඇති බව පෙන්නුම් කිරීම අධ්‍යක්ෂවරුන් විසින් වළක්වා ගත යුත්තේය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිල්ලට භාජනය කිරීමට ඇති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සැලකිය යුතු වැදගත්කමකින් යුතු විෂය කරුණක් බව නිශ්චය කර ඇති, විෂය කරුණක් සම්බන්ධයෙන් යම් අධ්‍යක්ෂවරයෙකුට අරමුණු අතර ගැටුමක් තිබේ නම්, එවැනි විෂය කරුණු සාකච්ඡාවට බඳුන් කළ යුත්තේ අදාළ විෂය කරුණු සම්බන්ධයෙන් සැලකිය යුතු හිමිකමක් නොමැති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් (මෙම නියමයන්ගේ 3(2)(IV) නියමය බලන්න) සහභාගි වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දීය. තවද, ඔහුට/ඇයට හෝ ඔහුගේ/ඇයගේ සමීප ඥාතියෙකුට හෝ අධ්‍යක්ෂවරයෙකුට සැලකිය යුතු හිමිකමක් ඇත්තා වූ ව්‍යාපාරයකට සම්බන්ධතාවයක් ඇති කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවක දී අධ්‍යක්ෂවරයෙකු විසින් ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතුය. එසේම එම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයේ අදාළ අධීක්ෂණය සඳහා ගණපූරණය ගණන් බැලීමේ දී ඔහු/ඇය ඊට ඇතුළත් නොකළ යුතු ය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ අරමුණු අතර ගැටුමක් ඇති වන තත්ත්වයක් තුළ අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීමට ඔවුන්ගේ වගකීම් පිළිබඳව අධ්‍යක්ෂවරු දැනුවත්ය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අරමුණු අතර ගැටුම් සඳහා වූ ප්‍රතිපත්තීන් යොදාගෙන ඇත. අධ්‍යක්ෂවරුන්ගේ අරමුණු අතර ගැටුම් වේ නම් ඒ බව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී හෙළිදරව් කළ යුතුය. අරමුණු අතර ගැටුමක් පවතිනා අවස්ථාවක අධ්‍යක්ෂවරුන් තීරණ ගැනීමට සහභාගී වීමෙන්, ඡන්දය දීමෙන් හෝ සම්මත කිරීමෙන් වැළකී සිටී. එවැනි අවස්ථාවක ඔහු හෝ ඇය ගණපූර්ණය සඳහා ගණන් නොගැනේ.
3 (1) (xiii)	බැංකුවේ මෙහෙයවීම හා පාලනය ස්ථිරසාර ලෙස තම අධිකාරිය යටතේ පවතින බව සහතික කිරීම පිණිස, තම තීරණ ගැනීම සඳහා තමන්ට විශේෂයෙන් වෙන් කරන ලද්දා වූ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ විධිමත් උප ලේඛනයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තබාගත යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ, අධ්‍යක්ෂ මණ්ඩලයට හිමි බලතල ඇතුළත් කර ඇති අතර, එය වසර තුලදී සමාලෝචනය කරන ලදී.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (1) (xiv)	බැංකුවට තම වගකීම් ගෙවීමට නොහැකි යැයි හෝ නොහැකිවීමට ඉඩ ඇතැයි හෝ බැංකුව බුන්වත් වීමට ආසන්න යැයි හෝ තැන්පතුකරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට නියමිත ගෙවීම් අත්හිටුවීමට ආසන්න යැයි හෝ බැංකුව සළකන්නේ නම්, වෙනත් කිසිම තීරණයක් හෝ ක්‍රියාවක් ගැනීමට පෙර එහාම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැන්විය යුතු වේ.	අනුකූල වී ඇත. 2017 වර්ෂය තුළ මෙවැනි තත්ත්වයක් මතු නොවුණි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද මාසික මූල්‍ය වාර්තා මඟින් බැංකුවේ නුඹුන්වත්බව සහතික වනු ඇත.
3 (1) (xv)	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ අනෙකුත් විවක්ෂණශීලී පදනම් අනුව මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති මට්ටම්වලට අනුකූල වන මට්ටමක බැංකුවේ ප්‍රාග්ධනය පවතින බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුව මුදල් මණ්ඩලයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවයන්ට පූර්ණ අනුකූලතාවයක් දක්වයි. අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන මාසික මූල්‍ය වාර්තාවන්හි ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පිළිබඳ විස්තර කරයි. ත්‍රෛමාසික පදනම මත ප්‍රාග්ධන ආවර්ධන සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කෙරේ. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත ගණනය බැංකුවේ මාසික මූල්‍ය ප්‍රකාශනය සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.
3 (1) (xvi)	මෙම නියමයන්ගේ 3 වැනි නියමයෙහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් වූ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවක්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාව තුළින් ප්‍රසිද්ධ කළ යුතු ය.	අනුකූල වී ඇත. මෙම අනාවරණයන් බැංකුවේ වාර්ෂික වාර්තාවේ ආයතනික යහපාලන වාර්තාවට අඩංගු කොටසක් වේ.
3 (1) (xvii)	වාර්ෂිකව සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම ස්වයං ඇගයීමක් කිරීම සඳහා වූ ක්‍රමයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කළයුතු අතර, එවැනි ඇගයීම්වල වාර්තා තබා ගතයුතු වන්නේය.	අනුකූල වී ඇත. ස්වයං ඇගයීමේ යාන්ත්‍රණයක් පිළිගෙන ඇත. ලංකා බැංකුවේ ලේකම්තුමිය/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය විසින් ස්වයං ඇගයීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා පවත්වාගෙන යා යුතුය.
3 (2)	**අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**	
3 (2) (i)	අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7 ට වඩා අඩු නොවිය යුතු අතර, 13 ට වඩා වැඩි නොවිය යුතුය.	1938 අංක 53 දරණ ලංකා බැංකු පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව 6 ක් වන අතර 2013 දෙසැම්බර් 31 වෙනි දිනට අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරුන් 6 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම විධිවිධානයට අනුකූල වන පරිදි ලංකා බැංකු ආඥා පනත සංශෝධනය කිරීමට බැංකුව විසින් පියවර ගනිමින් පවතී.
3 (2) (ii)	(අ) ප්‍රධාන විධායක නිලධාරී තනතුරෙහි සිටින අධ්‍යක්ෂවරයා හැර, අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර 9 නොඉක්මවිය යුතු අතර, එම සේවා කාලයට 2008 ජනවාරි 01 දින දක්වා එවැනි අධ්‍යක්ෂවරයෙකු එම ධූරයේ සේවය කරන ලද මුළු කාලයද ඇතුළත් විය යුත්තේය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ වත්මන් අධ්‍යක්ෂවරුන් වසර 9 කට වඩා අඩු සේවා කාලයක් එම තනතුරෙහි සේවය කර ඇත. වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර යටතේ පිටු අංක 36 සිට 41 දක්වා සඳහන් කර ඇත.
3 (2) (iii)	විධායක අධ්‍යක්ෂවරුන් ගණන අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටින අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් තුනෙන් එකක ප්‍රමාණය නොඉක්මවන පරිදි බැංකු සේවකයකු බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස (මින් මතු විධායක අධ්‍යක්ෂවරුන් ලෙස හඳුන්වන) පත් කිරීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට හැකිය. එවැනි අවස්ථාවකදී එක් විධායක අධ්‍යක්ෂවරයකු ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකු ආඥා පනත, ලංකා බැංකුව තුළ විධායක අධ්‍යක්ෂවරුන් සඳහා පහසුකම් සලසනු නොලැබේ.
3 (2) (iv)	අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් හෝ මුළු අධ්‍යක්ෂවරුන් ගණනින් තුනෙන් එක යන දෙකෙන් වැඩි ගණනකින් සමන්විත විය යුතු ය. මෙම අනු විධානය අදාළ වන්නේ 2010 ජනවාරි 01 දිනෙන් පසුවය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන් හය දෙනෙකු ගෙන් සමන්විත වේ. ඒ අතරින් පස් දෙනෙකු මෙම විධිවිධානයට අනුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් ලෙස හඳුනාගත හැකිය. මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා ස්වාධීන නොවන ලෙස සලකනු ලබන්නේ, ඔහු බැංකුවේ පාර්ශවකරු වන ශ්‍රී ලංකා රජය නියෝජනය කරන බැවිනි.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	අධ්‍යක්ෂ මණ්ඩලය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් හෝ මුළු අධ්‍යක්ෂවරුන් ගණනින් තුනෙන් එක යන දෙකෙන් වැඩි ගණනකින් සමන්විත විය යුතු ය. මෙම අනු විධානය අදාළ වන්නේ 2010 ජනවාරි 01 දිනෙන් පසුවය. විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු පහත සඳහන් දෑට යටත් වන්නේ නම් ඔහු/ඇය ස්වාධීන අයෙකු ලෙස නොසැලකේ; (අ) බැංකුවේ කොටස් හිමිකාරත්වයෙන් 1% කට වඩා සෘජු ලෙස හෝ වක්‍ර ලෙස අත්කර ගෙන සිටීම. (ආ) දැනට හෝ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර 2 ක කාල සීමාවක් තුළ මෙහි 3 (7) වන වගන්තියෙන් දක්වන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන කිසිදු ව්‍යාපාරික ගනුදෙනුවක වර්තමානයේ යෙදී සිටීම/යෙදී සිට තිබීම. (ඇ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර දෙකක කාලයක් තුළ බැංකුවේ සේවා නියුක්ත වී සිට තිබීම. (ඈ) කිට්ටු ඥාතීත්වයක් ඇති අධ්‍යක්ෂවරයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියෙකු හෝ ජ්‍යෙෂ්ඨ විධායක කළමනාකාරිත්වයේ සාමාජිකයෙක් හෝ වෙනත් සැලකිය යුතු කොටස් හිමිකරුවෙකු බැංකුවේ හෝ වෙනත් බැංකුවක සිටීම. මෙහි අරමුණ සඳහා, සමීප ඥාතියකු, යන්නෙන් අදහස් වන්නේ කාලතුයා හෝ මූල්‍යමය වශයෙන් යැපෙන්නා වූ ළමයෙකි. (ඉ) බැංකුව පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් නියෝජනය කිරීම. (ඊ) පහත දැක්වෙන සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ සැලකිය යුතු කොටස්කරුවෙකු වීම: (1) පහත 3(7) විධානයේ දැක්වෙන පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක බැංකුව සමඟ වර්තමානයේ සිටින; හෝ (2) බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරුන් සේවයේ යෙදී සිටින හෝ අධ්‍යක්ෂවරයෙක් වන හෝ සැලකිය යුතු කොටස් හිමියකු වී සිටින; හෝ (3) මෙම විධානයන්ගේ 7 වන විධානයේ දක්වා ඇති පරිදි බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරයෙකු බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක යෙදී සිටින.	පිටු අංක 35 සිට 37 දක්වා අධ්‍යක්ෂවරුන්ගේ විස්තර යටතේ සහ පහත සඳහන් විධිවිධාන අංක 3 (2) (viii) හි ඔවුන්ව දක්වා ඇත.
3 (2) (v)	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇති විටක එසේ පත් කරන ලද පුද්ගලයා ද ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුට අදාළ වන මිනුම් දඬු සම්පූර්ණ කළ යුතුය.	කිසිදු ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කර නොමැත. (මුදල් අමාත්‍යංශය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා වෙනුවෙන් පමණක් විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇත)
3 (2) (vi)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් තරමේ කීර්තිමත් පෙර වාර්තා සහිත ඉහළ හැකියාවකින් යුතු පුද්ගලයන් විය යුතු අතර, ක්‍රමෝපාය, කාර්යසාධනය සහ සම්පත් පිළිබඳව මතුවන ගැටළුවලට ස්වාධීන වූ තීරණ ගැනීමේ පළපුරුද්ද සහ හැකියාවන්ගෙන් ද යුක්ත විය යුතුය.	අනුකූල වී ඇත. පිටු අංක 36 සිට 41 දක්වා වූ අධ්‍යක්ෂවරුන්ගේ විස්තරයෙහි අවශ්‍ය තොරතුරු දක්වා ඇත.
3 (2) (vii)	අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ ගණපූර්ණය සම්පූර්ණ වුවද, එම රැස්වීමට සහභාගී වන අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් භාගයකට වඩා විධායක නොවන අධ්‍යක්ෂවරුන් සිටිය යුතු අතර, එසේ නොවේ නම් එවැනි රැස්වීමක් නිසි පරිදි පවත්වන ලද්දක් නොවනු ඇත. මෙම අනු විධානය බල පැවැත්වෙනුයේ 2010 ජනවාරි 01 දින සිටය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (2) (viii)	සියළුම ආයතනික සන්නිවේදන කටයුතු වලදී බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළි කිරීමේ දී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් එවැනි විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස නිශ්චිතව හඳුනාගත යුතුය. සභාපති, විධායක අධ්‍යක්ෂ, විධායක නොවන අධ්‍යක්ෂ සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් නම් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය සමන්විත වන අධ්‍යක්ෂවරුන්ගේ වර්ගීකරණයක් බැංකුව විසින් තම වාර්ෂික යහපාලන වාර්තා මගින් අනාවරණය කළ යුතුය.	අනුකූල වී ඇත. 2017 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය: • **රොනල්ඩ් සී පෙරේරා මහතා ජනාධිපති නීතීඥ** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ/සභාපති • **සජිත් ආර් ආටිගල මහතා** විධායක නොවන නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ • **රනෙල් ටී විජේසිංහ මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ • **එච් පී අජිත් ගුණවර්ධන මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ • **චරිත එන් විජේවර්ධන මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2017.07.21 දින සිට බල පැවැත්වෙන පරිදි ඉවත් වූ) • **සංජය පද්මපෙරුම මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2017.06.30 දින සිට බල පැවැත්වෙන පරිදි ඉවත් වූ) • **මනෝ සේකරම් මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2017.07.06 දින පත් වූ සහ 2017.09.08 දින සිට බල පැවැත්වෙන පරිදි ඉවත් වූ) • **සමන්ත රාජපක්ෂ මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2017.07.25 දින සිට බල පැවැත්වෙන පරිදි පත් වූ) • **මොහාන් විජේසිංහ මහතා** ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ (2017.11.24 දින සිට බල පැවැත්වෙන පරිදි පත් වූ) • **කනගසබෙයි විමලෙන්තිරාජා** (2017.11.09 දින සිට බල පැවැත්වෙන පරිදි සජිත් ආර් ආටිගල මහතා වෙනුවෙන් පත් වූ විකල්ප අධ්‍යක්ෂ)
3 (2) (ix)	අධ්‍යක්ෂ මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා වූ විධිමත්, සිතාමතා සකස් කරන ලද විනිවිදභාවයෙන් යුක්ත ක්‍රියා පටිපාටියක් තිබිය යුතුය. එසේම අධ්‍යක්ෂ මණ්ඩලයට අනුප්‍රාප්තිකයන් පත් කිරීම සිදු කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ද තිබිය යුතු ය.	ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් රජයේ බැංකු අයත්වන අමාත්‍යවරයා විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කිරීම් කරනු ලැබේ.
3 (2) (x)	තාවකාලික ඇබෑර්තු පිරවීම සඳහා පත් කරනු ලැබූ සියළුම අධ්‍යක්ෂවරුන් එම පත් කිරීම් වලින් පසුව ඵළඹෙන පළවෙනි මහා සභා රැස්වීමේදී කොටස්කරුවන්ගේ ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමට යටත් විය යුතු ය.	අදාළ ඇමතිවරයා විසින් ඔවුන් පත්කරන නිසා මෙය පැන නොනගී.
3 (2) (xi)	අධ්‍යක්ෂවරයෙකු සිය ධූරයෙන් ඉවත් කරන ලද්දේ නම් හෝ ඉල්ලා අස්වූයේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, (අ) අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීමේ හෝ ඉවත් කිරීමේ හේතූන් එම අධ්‍යක්ෂවරයා බැංකුව සමඟ එකඟ නොවීමට අදාළ තොරතුරු තිබේ නම් එම තොරතුරු ද සමඟ ප්‍රසිද්ධ කළයුතුය; සහ	අනුකූල වී ඇත. බැංකුවේ එකම කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය වෙනුවෙන් බැංකුව අයත්වන අමාත්‍යවරයා විසින් පත්කිරීම් හා ඉවත් කිරීම් සිදුකරයි. ඉල්ලා අස්වීමක් වේ නම් එයද එම අමාත්‍යවරයාට යොමු කරයි. ඉල්ලා අස්වීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට හා කොළඹ කොටස් හුවමාරුවට දැනුම් දෙනු ලැබේ.
	(ආ) කොටස්කරුවන්ගේ අවධානයට ලක්විය යුතු කිසියම් කරුණක් තිබීම හෝ නොතිබීම සහතික කරමින් ප්‍රකාශනයක් නිකුත් කළ යුතුය.	විශේෂයෙන් අවධාරණය කලයුතු කරුණු කිසිවක් නොමැත. බැංකුවේ කොටස් හිමියා රජය වන අතර අධ්‍යක්ෂධූරයන්හි සිදු කරන වෙනස් වීම් අදාළ අමාත්‍යවරයා හරහා ශ්‍රී ලංකා රජය විසින් සිදු කරනු ලැබේ.
3 (2) (xii)	බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයෙකු බැංකුවේ පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් නොවන වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කිරීම, තෝරා ගැනීම හෝ නම් කිරීම නොකළ යුතුය.	2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කළමනාකරුවකු පත් කිරීම හැර ලංකා බැංකුවේ වෙනත් අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයකු ආශ්‍රිත සමාගමක් නොවන වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරුන් ලෙස කටයුතු නොකරයි.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (3)	**අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ උචිතභාවය ඇගැයීමේ නිර්ණායක**	
3 (3) (i)	අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කරන පුද්ගලයකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතු ය. මෙවැනි අවස්ථාවලදී පහත දැක්වෙන සාමාන්‍ය නිදහස් කිරීම් අදාළ වන්නේය: 2008 ජනවාරි 01 දිනට වයස අවුරුදු 70 සපුරන හෝ 2008 දෙසැම්බර් 31 දිනට පෙර වයස අවුරුදු 70 සපුරන අධ්‍යක්ෂවරයෙකුට 2009 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන උපරිම වසර 3 ක කාලසීමාවක තවදුරටත් රාජකාරියේ යෙදිය හැක.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් කිසිම අයෙකු වයස අවුරුදු 70 ට වඩා වැඩි නොවේ.
3 (3) (ii)	පුද්ගලයකු විසින් බැංකුවේ පාලිත සමාගම් හෝ ආශ්‍රිත සමාගම් ද ඇතුළත්ව සමාගම්/ඒකකයන්/ආයතන 20 කට වඩා වැඩි ප්‍රමාණයක අධ්‍යක්ෂ තනතුර නොදැරිය යුත්තේය.	අනුකූල වී ඇත. සමාගම්/ආයතන 20 කට වඩා අධ්‍යක්ෂධුර හොබවන අධ්‍යක්ෂවරුන් නොමැත.
3 (4)	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරා ඇති කළමනාකරණ කාර්යයන්**	
3 (4) (i)	බලතල පවරා දීම සඳහා පවතින ක්‍රියාවලිය අධ්‍යක්ෂවරුන් විසින් සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කිරීම හා නිරවුල්ව අවබෝධ කර ගැනීම කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය බලය පවරා දීමේ කටයුතු කාලෝචිතව අධීක්ෂණය හා අනුමත කිරීම කරන අතර, බලය බෙදීමේ ප්‍රමාණය අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ කාර්යයන් කාර්යක්ෂමව සිදු කිරීමට ඉඩ තබමින් බැංකුවේ කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රමාණයට ඇද්ද යන්න තහවුරු කර ගනී. මෙම ක්‍රියාවලියේදී දැනට පවතින පාලන ආඥා පනතේ සඳහන් වෙන් කිරීම් සලකා බලනු ලැබේ.
3 (4) (ii)	අධ්‍යක්ෂ මණ්ඩලයට සමස්තයක් ලෙස තම කාර්යයන් ඉටු කිරීම සඳහා සැලකිය යුතු ලෙස අවහිරවන්නා වූ හෝ ඉටුකිරීමේ හැකියාව අඩු කරන්නාවූ ආකාරයේ ප්‍රමාණයකට, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩලීය කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරියාට, විධායක අධ්‍යක්ෂවරු හෝ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ට කිසිම කාර්යයක් පවරා දීම නොකළ යුත්තේය.	
3 (4) (iii)	බැංකුවේ අවශ්‍යතාවයන්ට අදාළ වන ආකාරයෙන් තිබෙන බව සහතික කර ගැනීම සඳහා, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවතින බලතල පවරාදීමේ ක්‍රියාවලිය කාලීනව විමර්ශනය කළයුතු වේ.	
3 (5)	**සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී**	
3 (5) (i)	සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරයන් වෙන් කළයුතු අතර, මෙම කාර්යයන් තනි පුද්ගලයෙකු විසින් සිදු නොකළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ සභාපති තනතුර හා මහා කළමනාකරු වශයෙන් හඳුන්වන ප්‍රධාන විධායක තනතුර පුද්ගලයින් දෙදෙනෙකු විසින් දරනු ලැබේ. සභාපතිතුමන්ගේ සහ මහා කළමනාකරුගේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි විස්තර වෙයි.
3 (5) (ii)	සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර ස්වාධීන අධ්‍යක්ෂවරයකු වන්නේ නම් මැනවි. සභාපති ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නොවන විට, ස්වාධීනත්වය සහතික කිරීම පිණිස ලිඛිත කාර්යභාරයන් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු පත්කළ යුතුය. මෙම ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි පළ කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුවේ සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු හෙයින් ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු පත්කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.
3 (5) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වාර්ෂික වාර්තාවේ අනිවාර්ය කොටසක් විය යුතු ආයතනික යහපාලන වාර්තාවේ, සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියාගේ අනන්‍යතාවය ද, සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර කිසියම් සම්බන්ධතාවයක් ඇත්නම්, (මූල්‍ය, ව්‍යාපාරික, පවුලේ හෝ අනෙකුත් සැලකිය යුතු/අදාළ සම්බන්ධතාවයන් ඇතුළුව) එයද පළ කළ යුතුයි.	අනුකූල වී ඇත. සභාපති සහ මහා කළමනාකරු කවරෙක්ද යන්න මෙම වාර්ෂික වාර්තාවේ අංක 12 සිට 22 දක්වා පිටුවලින් අනාවරණය කර ඇත. 2017 වසර අවසානයේදී ලබාගත් ප්‍රකාශනවලට අනුව සභාපති, මහා කළමනාකරු සහ අනිකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් අතර ද්‍රව්‍යමය, මූල්‍යමය, ව්‍යාපාරික හෝ පවුල් සම්බන්ධතාවයන් නැත.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (5) (iv)	සභාපතිතුමා විසින් (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීම, (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන බව හා සිය වගකීම් නිසි ලෙස ඉටුකරන බව සහතික කිරීම (ඇ) ප්‍රධාන ගැටළු කාලීන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සාකච්ඡා කරන බව සහතික කිරීම කළයුතු වේ.	අනුකූල වී ඇත.
3 (5) (v)	අනිකුත් අධ්‍යක්ෂවරුන් විසින් රැස්වීම්වල දී සාකච්ඡා කිරීමට යෝජනා කරනු ලබන කාරණා සැලකිල්ලට ගනිමින් රැස්වීම්වල න්‍යාය පත්‍රය සැකසීමේ වගකීම සභාපතිතුමා සතුවන අතර, සමාගම් ලේකම්ට අදාළ කාර්යය පැවරිය හැකිය.	අනුකූල වී ඇත. සභාපති විසින් බලය පවරාදීම යටතේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් මහා කළමනාකරු හරහා ඉදිරිපත් කරන සංදේශය මත හා කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන වෙනත් අදාළ කරුණු මත පදනම්ව රැස්වීම් සඳහා න්‍යාය පත්‍රය පිළියෙල කරයි.
3 (5) (vi)	සභාපති විසින් සියළුම අධ්‍යක්ෂවරුන් රැස්වීමේ පැහැනගින කරුණු පිළිබඳව නිසි ලෙස දැනුවත්ව සිටින බවට සහතික විය යුතු අතර, ප්‍රමාණවත් තොරතුරු කාලීන පදනමක් මත අධ්‍යක්ෂවරුන්ට ලැබෙන බවට ද සහතික විය යුතුය.	අනුකූල වී ඇත. සියළුම අධ්‍යක්ෂවරුන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ඇතිවන කරුණු පිළිබඳව දැනුවත්ය යන්න සභාපති විසින් සොයා බලා තහවුරු කරගත යුතුය. මෙම කටයුත්ත තහවුරු කිරීම සඳහා පහත ක්‍රියාපටිපාටි ඇතිකර ඇත: • අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා රැස්වීමට දින හතකට පෙර ආරක්ෂිත ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් හරහා අධ්‍යක්ෂවරුන්ට ලැබීමට සැලැස්වේ. • පැහැදිලි කිරීම් සඳහා කළමනාකරණයේ අදාළ සාමාජිකයා සුදානම්ව සිටී • බැංකුවේ කාර්යඵලය හා ස්ථායිතාවය ඇගයීම සඳහා අවශ්‍ය කළමනාකරණ තොරතුරු එකඟ වූ ආකෘතියකට නියමිත කාලවකවානු අනුව අධ්‍යක්ෂවරුන්ට සපයනු ලැබේ. • අධ්‍යක්ෂවරුන්ට අවශ්‍යතාවය පරිදි බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීමය උපදෙස් ලබා ගැනීමේ හැකියාව ඇත.
3 (5) (vii)	සභාපති විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු සඳහා සම්පූර්ණ හා සක්‍රීය දායකත්වයක් ලබාදීම සඳහා සියළුම අධ්‍යක්ෂවරුන් දෛර්යමත් කළ යුතු අතර, බැංකුවේ උපරිම වාසිය සඳහා ක්‍රියාකරන බව සහතික කිරීමට මූලිකත්වය ගත යුතුය.	අනුකූල වී ඇත.
3 (5) (viii)	සභාපතිතුමා විසින් විශේෂයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී දායකත්වය ලබාගැනීමට පහසුකම් සැපයිය යුතු අතර, විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර හිතකර සබඳතාවයන් පවත්වා ගැනීම ද සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ සියළු දෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (5) (ix)	ප්‍රධාන කළමනාකරණ පිරිස් හෝ වෙනත් කිසිම විධායක කාර්යයක් සෘජුවම අධීක්ෂණය සඳහා සභාපති සම්බන්ධ නොවිය යුතුය.	අනුකූල වී ඇත. සභාපතිතුමන් ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර, ප්‍රධාන කළමනාකරණ පිරිස් අධීක්ෂණය කිරීමේ කටයුතු වලට සෘජුවම සම්බන්ධ නොවේ.
3 (5) (x)	කොටස් හිමියන් සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බවට හා කොටස් හිමියන්ගේ අදහස් අධ්‍යක්ෂ මණ්ඩලයට සන්නිවේදනය වන බවට සභාපති විසින් සහතික විය යුතුය.	අනුකූල වී ඇත. මුළුමනින්ම කොටස් හිමිකාරිත්වය දරණ ශ්‍රී ලංකා රජය සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගනී. නිල බලයෙන් පත්වන අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ මණ්ඩලය හා කොටස් හිමිකාරිත්වය අතර සම්බන්ධිත මඟක් ලෙස ක්‍රියා කරයි.
3 (5) (xi)	ප්‍රධාන විධායක නිලධාරිවරයා බැංකුවේ දෛනික මෙහෙයුම් හා ව්‍යාපාරික කටයුතු භාර ඉහළම විධායකයා වශයෙන් ක්‍රියා කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ එදිනෙදා මෙහෙයුම් ඉටු කිරීම මහා කළමනාකාරතුමාගේ වගකීමයි. මහා කළමනාකරුගේ බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට විශේෂයෙන් අදාළ වේ.

පරිච්ඡේදය	මූලධර්මය	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (6)	**අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කළ කමිටු**	
3 (6) (i)	මෙම විධානයන්ගේ 3 (6)(II), 3 (6)(III), 3 (6)(IV) සහ 3 (6)(V) යන විධානවල දක්වා ඇති ආකාරය අනුව සෑම බැංකුවකම අඩුම තරමේ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක්වත් තිබිය යුතු ය. සෑම කමිටුවක්ම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය. කමිටුවේ සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ රැස්වීම් සංවිධානය කිරීම හා රැස්වීම් වාර්තා පවත්වා ගැනීම යනාදිය සඳහා සෑම කමිටුවක් විසින්ම ලේකම්වරයෙකු පත්කර ගත යුතුය. සෑම කමිටුවකම යුතුකම් හා කාර්යයන් ඇතුළත් කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.	අනුකූල වී ඇත. මෙම විධිවිධානය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලීය උප කමිටු 4 ක් (විගණන, මානව සම්පත් හා පාරිශ්‍රමික, නාමයෝජනා හා ආයතනික යහපාලන සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ) ස්ථාපිත කර ඇති අතර, රැස්වීම් වාර්තා සමඟ නිර්දේශයන් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි. සෑම අනුකමිටුවක් සඳහා පවතින විෂය ක්ෂේත්‍රය වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්/ලංකා බැංකුවේ ලේකම් සියළුම කමිටුවල ලේකම් ලෙස පත්කර ඇති අතර, සමිතියේ සභාපතිගේ අධීක්ෂණය යටතේ රැස්වීම් වාර්තා පවත්වා ගනී. අනුකමිටුවල වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇත: විගණන කමිටුව පිටු 70 සිට 73 දක්වා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පිටු 74 සිට 75 දක්වා මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව පිටු අංක 76 නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුව පිටු අංක 77 එකම කොටස්කරුවා රජය වන නිසා, බැංකුවේ වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට හා අදාළ අමාත්‍යාංශවලට ඉදිරිපත් කෙරේ.
3 (6) (ii)	විගණන කමිටුව සම්බන්ධයෙන් පහත රිති අදාළ වේ: (අ) ගණකාධිකරණය සහ/හෝ විගණනය පිළිබඳ සුදුසුකම් ඇති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු කමිටුවේ සභාපතිවරයා විය යුතුය.	අනුකූල වී ඇත. විගණන කමිටුවේ සභාපති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර, ඔහුට අවශ්‍ය සුදුසුකම් පිටු අංක 36 හි පැතිකඩ යටතේ ඉදිරිපත් කර ඇත.
	(ආ) කමිටුවේ සෑම සාමාජිකයෙක්ම විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු ය.	අනුකූල වී ඇත. කමිටුවේ සියළුම සාමාජිකයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
	(ඇ) කමිටුව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කළ යුතුය: (i) අදාළ නීති ප්‍රකාරව විගණන සේවා සඳහා බාහිර විගණකවරුන් පත් කිරීම (ii) මහ බැංකුව විසින් විගණකවරුන් වෙත වරින් වර නිකුත් කරන ලද උපදෙස් මාලාවන් ක්‍රියාත්මක කිරීම (iii) අදාළ ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කිරීම (iv) විගණකවරුන්ගේ සේවා කාලය, ගාස්තු සහ විගණකවරයාගේ ඉල්ලා අස්වීමක් හෝ ඉවත් කිරීම. මෙහි දී විගණක හවුල්කරුවකුගේ සේවය ලබා ගැනීම වසර පහක් නොඉක්මවිය යුතු අතර, එම කාලය සපිරූ හවුල්කරුවකු නැවත පත්කළ හැකි වන්නේ මුල් වාරය සම්පූර්ණකර වසර තුනක් ඉක්මවූ පසුවය.	අනුකූල වී ඇත. විෂය ක්ෂේත්‍රය අනුව, විගණන කමිටුවේ අනිකුත් කරුණුවලට අමතරව පහත නිර්දේශ කර ඇත: • විගණකවරුන්ට කලින් කල නිකුත් කර ඇති ශ්‍රී ලංකා මහ බැංකු මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම • අදාළ ගිණුම්කරණ ප්‍රමිත භාවිතය විගණකාධිපති ජනරාල් බැංකුවේ බාහිර විගණක වන නිසා, බාහිර විගණකගේ කටයුතු සම්බන්ධයෙන් කමිටුවට ඉටු කළ හැකි භූමිකාවක් නැත.
	(ඈ) බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ විගණන ක්‍රියාවලියේ සඵලදායකත්වය, අදාළ ප්‍රමිතීන් සහ මනා පරිචයන් අනුව සමාලෝචනය කිරීම කමිටුවේ කාර්යයකි.	අනුකූල වී ඇත. විගණකාධිපති ජනරාල් බැංකුවේ බාහිර විගණක වන නිසා, ඔහුගේ ස්වාධීනත්වය හා සඵලතාව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සහතික කර ඇත. විගණකාධිපති ජනරාල් විසින් බැංකුවේ විගණන කටයුතු සඳහා සහයට යොදා ගන්නා විගණක වරුන්ගේ ස්වාධීන්වය තහවුරු කරනු ලැබේ.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඉ) අදාළ නීති නියමයන්, අවශ්‍යතාවයන් සහ මාර්ගෝපදේශ මගින් අවසර දෙන ලද විගණන නොවන සේවා සැපයීම සඳහා බාහිර විගණකයින් යොදා ගැනීම පිළිබඳව ප්‍රතිපත්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම විගණන කමිටුවේ වගකීමකි. බාහිර විගණකවරයා විසින් සපයනු ලබන එවැනි විගණන නොවන සේවා ඔහුගේ ස්වාධීනත්වය සහ විෂය මූලිකභාවයට හානි නොවන බවට කමිටුව වගබලා ගත යුතුය. විගණන නොවන සේවා සැපයීමේ දී විගණකවරයාගේ ස්වාධීනත්වය හෝ විෂය මූලිකභාවය තක්සේරු කිරීමේදී කමිටුව විසින් පහත කරුණු සළකා බැලිය යුතුය: (i) විගණන සමාගමේ නිපුණතා සහ පළපුරුද්ද විගණන නොවන සේවා සැපයීම සඳහා යෝග්‍ය වන්නේ ද නැද්ද යන්න (ii) බාහිර විගණකවරයා විසින් එවැනි සේවා සැපයීමේදී විගණනයේ ස්වාධීනත්වය හා/හෝ විෂය මූලිකභාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇද්දැයි යන්න; සහ (iii) විගණන නොවන සේවාවල ස්වභාවය, අදාළ ගාස්තු මට්ටම්, විගණන සමාගමට සාපේක්ෂව එක් එක් ගාස්තු මට්ටම් හා සමුච්චිත ගාස්තු මට්ටම් යනාදිය බාහිර විගණකවරයාගේ විෂය මූලිකභාවයට හෝ ස්වාධීනත්වයට කිසියම් බලපෑමක් කරන්නේ ද යන වග.	අනුකූල වී ඇත. විගණකාධිපති, බැංකුවේ විගණක නිසා මෙය පැහැ නොනගී. කෙසේ වුවද විගණකාධිපති විසින් බැංකුවේ විගණන කටයුතු සඳහා සහය වීමට පත් කරනු ලබන විගණන සමාගම් විසින් සපයනු ලබන එවැනි විගණන නොවන සේවා ස්වාධීනත්වයට සහ විෂය මූලිකතාවයට හානි නොවන බවට කමිටුව වග බලා ගත යුතුය.
	(ඊ) විගණනය ආරම්භ කිරීමට පෙර කමිටුව විසින් පහත සඳහන් දේ ඇතුළත් විගණනයේ ස්වභාවය සහ විෂය පථය පිළිබඳව බාහිර විගණකවරයා සමඟ සාකච්ඡා කර අවසන් කළ යුතුය: (i) අදාළ ආයතනික නීති සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ කළමනාකරණයේ අභ්‍යන්තර පාලන විධිවිධානවලට බැංකුවේ අනුකූලවීම පිළිබඳ ඇගැයීමක්. (ii) අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් අනුව බාහිර අවශ්‍යතා වෙනුවෙන් මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම. (iii) එක් විගණන සමාගමකට වඩා වැඩි සංඛ්‍යාවක් සම්බන්ධ වන විට ඒවා අතර සම්බන්ධීකරණය යනාදියයි.	අනුකූල වී ඇත. විගණනයේ විෂය පථය හා පරාසය පිළිබඳව විගණකාධිපති විසින් තීරණය කරනු ලබන අතර, විගණකාධිපතිගේ සහය පිණිස 2017 වසර තුල කටයුතු කරන කේ.පී.එම්.ජී ආයතනයට, ප්‍රමාණය සහ අවදානම පිළිබඳ සලකා බලමින් විෂය පථය සම්බන්ධයෙන් වැඩිදුර වෙනස් කිරීම්/සංශෝධනය කිරීම් සිදු කළ හැක. කේ පී එම් ජී ආයතනය 2017 වසර සඳහා විගණන සැලැස්ම ඉදිරිපත් කර තිබෙන අතර, එය කමිටුව විසින් සාකච්ඡා කිරීමෙන් පසු එකඟවන ලදී.
	(උ) තොරතුරු අනාවරණය කිරීම සඳහා බැංකුව විසින් නිකුත් කරනු ලබන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තාවල සත්‍යතාවය සහ ඒවායේ අඩංගු මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් පරීක්ෂා කිරීම සඳහා කමිටුව විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කළ යුතුය. බැංකුවේ වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර කමිටුව විසින් විශේෂයෙන් අවධානය යොමු කළයුතු කරුණු වන්නේ (i) ප්‍රධාන විනිශ්චයන් සහිත ක්ෂේත්‍ර, (ii) ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන්ගේ සිදු වූ වෙනස්කම්, (iii) විගණනය තුළින් ඇති වූ ප්‍රධාන ගැලපීම්, (iv) අබණ්ඩ පැවැත්මේ උපකල්පනයන්, සහ (v) අදාළ ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලවීම ආදියයි.	අනුකූල වී ඇත. මෙය කමිටුව විසින් මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික මූල්‍ය තොරතුරු සමාලෝචනය කරමින් සිදු කරන අඛණ්ඩ ක්‍රියාවලියක් වන අතර, කමිටුවේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.
	(ඌ)කමිටුව විසින් අතුරු සහ වාර අවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කළයුතු අතර, ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ගේ සහභාගිත්වය නොමැතිව විගණකවරයාට සාකච්ඡා කිරීමට අවශ්‍ය දෑ වේ නම් ඒවාද ඇතුළු අනෙකුත් කරුණු ද අවශ්‍ය විට සාකච්ඡා කළයුතුය.	අනුකූල වී ඇත. කමිටුව විසින් අතුරු සහ වසර අවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කරයි. විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන අතර, ඔහුගේ නියෝජිතයෙකු විගණකාධිපතිට සහාය වන කේ පී එම් ජී ආයතනයේ නියෝජිතයෙකු අදාළ අවස්ථා වලදී විගණන කමිටුවට ඉදිරිපත් වෙයි.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඒ) කමිටුව බාහිර විගණනයේ කළමනාකරණ ලිපිය හා එයට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළ යුතුය.	අනුකූල වී ඇත.
	(ඒ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳව කමිටුව විසින් පහත දැක්වෙන පියවර ගත යුතුය:	අනුකූල වී ඇත.
	(i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත් ප්‍රමාණවත්ද යන්න සමාලෝචනය හා සිය කටයුතු කරගෙන යාම සඳහා දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය බලය තිබේද යන්න පිළිබඳව සෑහීමකට පත් වීම.	අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කාර්යයන් සහ සම්පත්හි ප්‍රමාණාත්මකභාවය සම්බන්ධයෙන් විගණන කමිටුව සමාලෝචනය කර අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරයි.
	(ii) අභ්‍යන්තර විගණන වැඩසටහන හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය සහ අදාළ වන පරිදි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත උචිත ක්‍රියා මාර්ග ගෙන තිබේදැයි සහතික කිරීම.	අනුකූල වී ඇත. කමිටුව මඟින් අභ්‍යන්තර විගණන වැඩ සටහන් හා අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කරයි. වැඩි දියුණු කිරීම් සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගෙන තිබෙන බවට එහිදී සහතික කරනු ලැබේ.
	(iii) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම සමාලෝචනය කිරීම.	අනුකූල වී ඇත. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්යසාධනය හා අභ්‍යන්තර විගණන කාර්යයේ ක්‍රියා පටිපාටිය හා ප්‍රතිඵල විගණන කමිටුව විසින් අගයන ලදී. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ඇගයුම් ක්‍රියා පටිපාටිය අනුව යමින්, ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ඉටු කරන අතර, එය විගණන කමිටුව හමුවේ සභාගත කෙරේ.
	(iv) අංශ ප්‍රධානී, ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් හා අභ්‍යන්තර විගණන කාර්යය සඳහා බාහිර සේවා සපයන්නන් බඳවා ගැනීම හා සේවය හමාර කිරීම පිළිබඳ නිර්දේශ කිරීම.	අනුකූල වී ඇත.
	(v) ප්‍රධාන අභ්‍යන්තර විගණකද ඇතුළුව අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයේ හා බාහිර සේවා සම්පාදකයන්ගේ ඉල්ලා අස්වීම් පිළිබඳව කමිටුව දැනුවත් කරන බවටද ඉල්ලා අස්වන ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලයට හා බාහිර සේවා සම්පාදකයන්ට තමන් ඉල්ලා අස්වීමට හේතු ඉදිරිපත් කරන්නට අවස්ථාවක් සලසා දී ඇති බවට සහතික වීම.	අනුකූල වී ඇත. මෙබඳු අවස්ථාවක් වසර තුළ පැන නැගුනේ නැත.
	(vi) අභ්‍යන්තර විගණනය, එහි විගණනයට බඳුන්වන කටයුතු වලින් ස්වාධීන වන බවට හා අපක්ෂපාතීව, ප්‍රවීණතාවයෙන් යුක්තව හා නිසි වෘත්තීය සැලකිල්ල සහිතව ඉටු කෙරෙන බවට සහතික වීම.	අනුකූල වී ඇත. බැංකුවේ සංවිධාන ව්‍යුහය අනුව ප්‍රධාන අභ්‍යන්තර විගණක, විගණන කමිටුව හරහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සෘජුවම වාර්තා කරන අතර, ඔහු බැංකුවේ මෙහෙයුම් කටයුතු වලින් ස්වාධීනව කටයුතු කරයි.
	(ඕ) කමිටුව, අභ්‍යන්තර විමර්ශණයන් හි ප්‍රධාන පෙළේ නිගමන හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සලකා බැලිය යුතුය.	අනුකූල වී ඇත. විගණක කමිටුව, අභ්‍යන්තර විමර්ශණයන් හි ප්‍රධාන පෙළේ නිගමන හා ඊට කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කළේය.
	(ඕ) ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක හා බාහිර විගණකවරුන්ගේ නියෝජිතයෙක් සාමාන්‍යයෙන් රැස්වීම් සඳහා සහභාගි වනු ඇත. සෙසු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට හා ප්‍රධාන විධායක නිලධාරීන්ට, කමිටුවේ ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගි වීමට ඉඩ ඇත. කෙසේ වුවත් කමිටුව යටත් පිරිසෙයින් වසරකට දෙවරක් විධායක අධ්‍යක්ෂවරුන් රහිතව බාහිර විගණකවරුන් හමුවිය යුතුය.	අනුකූල වී ඇත. ප්‍රධාන මූල්‍ය නිලධාරී, ප්‍රධාන අවදානම් නිලධාරී, අනුකූලතා නිලධාරී විගණකාධිපතිවරයාගේ නියෝජිතවරයා හා විගණකාධිපතිවරයාට සහය දීමට පත්කර ඇති කේ පී එම් පී විගණකවරුන්ගේ නියෝජිතයෝ සියළුම කමිටු රැස්වීම් වලට සහභාගි වූහ. මහා කළමනාකාරතුමාද කමිටුවේ ආරාධනය මත රැස්වීම් වලට සහභාගි විය. කළමනාකාරිත්වයේ සාමාජිකයන් අවශ්‍යතාවය මත, කරුණු පැහැදිලි කිරීම සඳහා කැඳවනු ලබති. කළමනාකාරිත්වයේ සහභාගීත්වයෙන් තොරව "වැසුණු දොරටු" රැස්වීමක් බාහිර විගණකවරුන් සමඟ පවත්වන ලදී.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ක) කමිටුවට පහත කියැවෙන දෑ සතුව තිබිය යුතුය: (i) විෂය පථයට අයත් වන කරුණක් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා ප්‍රකාශිත අධිකාරිය (ii) එසේ කටයුතු කරන්නට අවශ්‍ය සම්පත්, (iii) තොරතුරු සඳහා පූර්ණ ප්‍රවේශය, (iv) අවශ්‍ය නම්, බාහිර වෘත්තීය උපදෙස් ලබා ගැනීමට හා අදාළ පළපුරුද්ද සහිත බාහිර පාර්ශ්වයන්ට රැස්වීම් සඳහා ආරාධනා කිරීම උදෙසා අධිකාරිය.	අනුකූල වී ඇත.
	(ග) කමිටුව, සාකච්ඡාවට නියමිත කරුණු පිළිබඳ නිසි දැනුම්දීමක් සහිතව ක්‍රමිකව රැස්විය යුතු අතර, සිය කාර්යයන් හා වගකීම් ඉටු කිරීමෙහි දී එලඹී නිගමනයන් වාර්තාගත කළ යුතුය.	අනුකූල වී ඇත. විගණන කමිටුව ක්‍රමිකව රැස්වීම් පැවත්වීය. අවශ්‍ය කරන පරිදි අතිරේක රැස්වීම් පවත්වනු ලැබේ. ඒ අනුව මෙම වසර තුළදී එකොළොස් වතාවක් කමිටුව රැස්වන ලදී. කමිටුවේ සාමාජිකයන් වෙත සාකච්ඡාවට භාජනය වන කරුණු පිළිබඳ කල් ඇතිව දැනුම් දී ඇති අතර, එහි බලතල හා වගකීම් ඉටු කිරීමේදී එළඹෙන නිගමනයන් බැංකුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්වරිය විසින් නිසි පරිදි වාර්තා කර ඇත.
	(ඝ) අධ්‍යක්ෂක මණ්ඩලය පහත සඳහන් කරුණු පිළිබඳ සවිස්තරාත්මක හෙලිදරව්වක් කළ යුතුය: (i) විගණන කමිටුවේ කටයුතු පිළිබඳ සවිස්තර තොරතුරු, (ii) වසර තුළ පැවැත්වූ විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව, හා (iii) එම රැස්වීම් තුළ ඒ ඒ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීම.	අනුකූල වී ඇත. කමිටුවේ කටයුතු පිටු අංක 70 සිට 73 දක්වා විගණන කමිටු වාර්තාවේ දක්වා ඇත. කමිටුව 2017 වසර තුළ එකොළොස් වතාවක් රැස්වූ අතර, සහභාගිවීම් විස්තර පිටු අංක 69 හි දක්වා ඇත.
	(ඞ) කමිටුවේ ලේකම් (සමාගම් ලේකම් හෝ අභ්‍යන්තර විගණන කාර්ය ප්‍රධානී විය හැක) කමිටු රැස්වීම්වල වාර්තා සවිස්තරව වාර්තා ගත කර පවත්වාගෙන යා යුතුය.	අනුකූල වී ඇත. කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරන ලංකා බැංකුවේ හා අධ්‍යක්ෂක මණ්ඩලයේ ලේකම් විසින් රැස්වීම්වල වාර්තා පවත්වා ගනු ලබයි.
	(ඟ) බැංකු කාර්ය මණ්ඩලයට, මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන විධි හෝ වෙනත් දෑ පිළිබඳ විය හැකි අයථා ක්‍රියාවන් සම්බන්ධ සිය සැලකිලිමත් වීම්, රහස්‍යභාවයෙන් යුතුව මතු කිරීමට පවත්නා විධිවිධාන කමිටුව විසින් සමාලෝචනය කළ යුතුය. ඒ අනුව කමිටුව මෙකී කරුණු මත සාධාරණ හා ස්වාධීන විමර්ශනය සඳහා නිසි විධිවිධාන ස්ථාපිත කර ඇති බවට හා උචිත පසු විපරම් කාර්යයන් පිළිබඳව සහතික විය යුතු අතර, බාහිර විගණකවරුන් හා බැංකුවේ සම්බන්ධතා සුපරීක්ෂුම සඳහා වන ප්‍රධානතම නියෝජන මණ්ඩලය ලෙසද කටයුතු කළ යුතුය.	අනුකූල වී ඇත. මෙම කරුණු ආවරණය කෙරෙන "විස්ල් බ්ලෝවර් ප්‍රතිපත්තියක්" ස්ථාපිත කර ඇති අතර, සැලකිය යුතු මට්ටමේ සොයා ගැනීම්, උචිත පසු විපරම් කටයුතු සඳහා විගණන කමිටුවට වාර්තා කරන ලදී. විගණන කමිටුව, බාහිර විගණකවරු සමග බැංකුවේ සම්බන්ධතා නිරීක්ෂණයේ ප්‍රධානතම නියෝජිතයා වේ.
3 (6) (iii)	පහත දැක්වෙන රීති මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව සම්බන්ධයෙන් බල පවත්වනු ඇත: (අ) කමිටුව, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරියාගේ (CEO) හා ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින්ගේ පාරිශ්‍රමික (වැටුප්, දීමනා හා සෙසු මූල්‍යමය ගෙවීම්) ප්‍රතිපත්තිය නිශ්චය කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික අදාළ අමාත්‍යාංශය හරහා ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ/ලිපි හා 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥ, පණත හා එහි සංශෝධන වලට අනුරූප වන අතර, තවද බැංකුව ඉහත සඳහන් කළ චක්‍රලේඛ මත පදනම් පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් සම්මත කොට ඇත. ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයින් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් ස්ථාපිත කොට ඇති අතර එය 2017 වර්ෂය තුළ සමාලෝචනය කරන ලදී

පරිච්ඡේදය	මූලධර්මය	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ආ)කමිටුව, අධ්‍යක්ෂකවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන් හා ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් සඳහා අරමුණු හා ඉලක්ක ස්ථාපිත කළ යුතුය.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් බැවින් ඔවුන් සඳහා ඉලක්ක පනවා නැත. ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් සඳහා අරමුණු හා ඉලක්ක බැංකුවේ ආයතනික සැලැස්ම පදනම් කොට සැකසූ ක්‍රියාකාරී සැලැස්ම තුළ විස්තරාත්මකව වාර්තාගතකර ඇත. ප්‍රධාන කළමනාකාරිත්ව කණ්ඩායම තුළින් ආයතනික සැලැස්ම ක්‍රියාත්මක කරලීමේ වගකීම මහා කළමනාකරුට පැවරේ. එසේම ඔවුන්ගේ කාර්යසාධනයද සමාලෝචනය කෙරේ. මහා කළමනාකරු උදෙසා කාර්යයන් ඇගැයුමක් වාර්ෂිකව කරගෙන යනු ලබයි.
	(ඇ) කමිටුව ප්‍රධාන විධායක නිලධාරියාගේ හා ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ගේ කාර්යසාධනය, ඔවුන්ට ලබාදුන් ඉලක්ක හා අරමුණු සමග කලින් කලට ඇගයීමට ලක් කරණු ලබන අතර, පාරිශ්‍රමික, ප්‍රතිලාභ හා කාර්යසාධනය මත පදනම් අනෙකුත් ගෙවීම් සමාලෝචනය කිරීමේ පදනම නිශ්චය කළ යුතුය.	අනුකූල වී ඇත. කමිටුව මහා කළමනාකරුට හා නියෝජ්‍ය මහා කළමනාකරුවන්ට වසර මුලදී ලබා දුන් ඉලක්ක මත ඔවුන්ගේ කාර්යසාධනය ඇගයීමට ලක් කළේය. සහකාර මහා කළමනාකරුවන්ගේ කාර්යසාධනය ඒ ඒ නියෝජ්‍ය මහා කළමනාකරුවන් විසින් සිදු කරන ලදී.
	(ඈ)ප්‍රධාන විධායක නිලධාරි පිළිබඳ කරුණු සාකච්ඡා වන අවස්ථාවන් හි හැර සෙසු සියළුම කමිටු රැස්වීම් වලදී ප්‍රධාන විධායක නිලධාරීගේ පෙනී සිටීම අවශ්‍යය.	අනුකූල වී ඇත.
3 (6) (iv)	නාමයෝජනා කමිටුව සම්බන්ධව පහත දැක්වෙන රීති බලපානු ඇත:	බැංකුව නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුවක් ස්ථාපනය කර ඇත. මෙම නිර්දේශයේ දක්වා ඇති වැඩකටයුතු වලට අමතරව අදාළ ආයතනික යහපාලන මූලධර්ම පවත්වාගෙන යාම හා බැඳුණු අනෙකුත් නිශ්චිත වැඩ කටයුතුද කමිටුවේ විෂය ක්ෂේත්‍රය තුළ අන්තර්ගත කර ඇත.
	(අ) කමිටුව, නව අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් තෝරා පත් කර ගැනීම සඳහා පටිපාටියක් ක්‍රියාත්මක කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුව අයත් වන අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂවරුන් පත් කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉහතකී අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව මහා කළමනාකරු පත් කරයි. ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් පත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත පොදු පටිපාටියක්/යෝජනා ක්‍රමයක් පවතී.
	(ආ)අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් අදාළ අධ්‍යක්ෂවරයාගේ කාර්යසාධනය හා දායකත්වය සැලකිල්ලට ගනිමින් වර්තමාන අධ්‍යක්ෂවරුන් යළි පත් කිරීම නිර්දේශ කිරීම (හෝ නිර්දේශ නොකිරීම) සලකා බැලිය යුතුය.	අධ්‍යක්ෂවරුන් පත්කරනු ලබන්නේ අදාළ අමාත්‍යවරයා විසින් බැවින් මෙය පැන නොනගී.
	(ඇ)ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් යන තනතුරු සඳහා උසස් කිරීම/තෝරා පත් කිරීමට සලකා බැලිය යුතු සුදුසුකම්, පළපුරුද්ද හා විශේෂිත ගුණාංග බදු නිර්ණායකයන් කමිටුව විසින් ස්ථාපිත කළ යුතුය.	අනුකූල වී ඇත. 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන තුළින් විශේෂිතව දක්වා ඇති පරිදි බැංකුව පිළිගත් පටිපාටිය මත පදනම්ව, අධ්‍යක්ෂ මණ්ඩලයේ හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව මහා කළමනාකරු පත් කරණු ලබයි. සෙසු ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් තනතුරු සඳහා තෝරා ගැනීම හෝ උසස් කිරීමට යෝග්‍යතාවය ලැබීමට අවශ්‍ය උප ලක්ෂණ, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත උසස් කිරීමේ යෝජනා ක්‍රම තුළ නියම කොට ඇත.
	(ඈ)කමිටුව, අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරි සහ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් අංක 3 (3) නියෝගය හි ආඥා පනත්වල දක්වා ඇති නිර්ණායක පරිදි අදාළ තනතුරු දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බවට සහතික කළ යුතුය.	අනුකූල වී ඇත. තමන්, අංක 3 (3) නියෝගය හා ආඥා පනත් වල දක්වා ඇති නිර්ණායක තුළින් විශේෂිතව පෙන්වා ඇති පරිදි සිය තනතුරු දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බවට සහතික කරමින් අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික ප්‍රකාශ ලබා ගන්නා අතර, එය ශ්‍රී ලංකා මහා බැංකුව වෙත යොමු කෙරේ. තවද ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් එම තනතුරු වලට පත් කරන හෝ උසස් කෙරෙන අවස්ථාවන්හිදී ඔවුන් එකී තනතුර දැරීමට සුදුසු හා යෝග්‍ය පුද්ගලයන් බව කමිටුව තහවුරු කරයි.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඉ) කමිටුව, අතිරේක/නව නිපුණතාවයන් පිළිබඳව අවශ්‍යතා හා විශ්‍රාම ගන්නා අධ්‍යක්ෂවරුන්ගේ හා ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ගේ අනුප්‍රාප්තික සැලසුම් පිළිබඳව සළකා බලා, විටින් විට නිර්දේශ කරනු ලැබේ.	අනුකූල වී ඇත. ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් උදෙසා අනුප්‍රාප්තික සැලැස්ම ස්ථාපිත කර ඇත. අවශ්‍ය අතිරේක හෝ නව නිපුණතා අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු විසින් හෝ නැතහොත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කෙරේ.
	(ඊ) කමිටුව ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුගේ සභාපතිත්වය සහිත විය යුතු අතර, වඩා යෝග්‍ය ලෙස බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත විය යුතුය. ප්‍රධාන විධායක නිලධාරියාට, ආරාධනයෙන් රැස්වීම් සඳහා සහභාගි විය හැකිය.	අනුකූල වී ඇත. කමිටුවේ සභාපතිත්වය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් දරණු ලබයි. මෙම වාර්ෂික වාර්තාවේ 77 වැනි පිටුවෙහි මේ පිළිබඳ විස්තර අඩංගු වේ.
3 (6) (v)	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සම්බන්ධයෙන් පහත දැක්වෙන රීති බලපවත්වනු ඇත: (අ) කමිටුව, යටත් පිරිසෙයින් විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, ප්‍රධාන විධායක නිලධාරි සහ ණය, වෙළෙඳපොළ, ද්‍රවශීලතාවය මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම් බඳු පුළුල් අවදානම් කාණ්ඩ සුපරීක්ෂණය කරන ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ගෙන් සමන්විත විය යුතුය. කමිටුව, ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් හා සම්පව කටයුතු කළ යුතු අතර, කමිටුවට අනුයුක්ත වගකීම් හා අධිකාරිත්ව රාමුව තුළ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගත යුතුය.	අනුකූල වී ඇත. කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු, මහා කළමනාකරු සහ ණය, වෙළෙඳපොළ, මෙහෙයුම්, කීර්තිනාම හා උපායමාර්ගික අවදානම් සුපරීක්ෂණය කරන ප්‍රධාන අවදානම් නිලධාරියාගෙන් සමන්විතය. ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන මූල්‍ය නිලධාරි හා අනුකූලතා නිලධාරි, කමිටුවේ ආරාධනාව මත සෑම කමිටු රැස්වීමකටම සහභාගි වෙති. සෙසු ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් හා සෙසු කාර්ය මණ්ඩලය කමිටුවට ඔවුන්ගේ පැමිණීම අවශ්‍ය අවස්ථා වලදී ආරාධනය කරනු ලැබේ. කමිටුව, එහි අධිකාරිත්ව රාමුව හා ඊට අනුයුක්ත වගකීම් තුළ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් හා සමීපව කටයුතු කරයි.
	(ආ)කමිටුව බැංකුවට ඇති සියළුම අවදානම්, උදාහරණ ලෙස ණය, වෙළඳපොල, ද්‍රවශීලතාවය මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම්, සුදුසු අවදානම් දර්ශක හා කළමනාකරණ තොරතුරු තුළින් මාසිකව තක්සේරු කරනු ලැබේ. පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණය බැංකුව පදනම්න් හා සමූහ පදනම්න් යන දෙයාකාරයෙන්ම සිදු කළ යුතුය.	අනුකූල වී ඇත. බැංකුවේ ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය, බැංකුවේ ණය, වෙළඳපොල, ද්‍රවශීලතාවය, මෙහෙයුම් හා උපායමාර්ගික අවදානම් කමිටුව විසින් නිර්දේශ කොට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති ලේඛණ මත පදනම්ව, මාසික පදනමකින් තක්සේරු කරන අතර, සාරාංශ ගත වාර්තා කමිටු රැස්වීම් වලටද ඉන් පසු එළෙඹෙන ආසන්නතම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමටද ඉදිරිපත් කරනු ලැබේ. පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම් අවදානම් පිළිබඳව කටයුතු කිරීම සඳහා අවදානම් කළමනාකරණ දර්ශන පුවරුවක් සකස් කොට ඇත.
	(ඇ)කමිටුව, විශේෂිත අවදානම් කෙරේ පියවර ගන්නට හා කමිටුව විසින් පැහැදිළිව පනවා ඇති ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම් සීමා තුළ හිඳිමින් මෙකී අවදානම් කළමනාකරණය කරන්නට, ණය කමිටුව හා වත්කම් හා වගකීම් කමිටු බඳු කළමනාකාරිත්ව මට්ටමේ කමිටුවල ප්‍රමාණාත්මකතාව හා සඵලතාවයන් සමාලෝචනය කළ යුතුය.	අනුකූල වී ඇත.
	(ඈ) බැංකුවේ ප්‍රතිපත්ති හා නියාමක හා සුපරීක්ෂණ අවශ්‍යතා පදනම මත කමිටුව විසින් තීරණය කළ විචක්ෂනශීලිතාවයන්ට ඔබ්බෙන් වන මට්ටමේ විශේෂිත අවදානම් පවත්නා අවස්ථාවන් හිදී කමිටුව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය.	අනුකූල වී ඇත. සීමාවන් ඉක්මවා ගිය විශේෂිත ගුණාත්මක හා ප්‍රමාණාත්මක අවදානම්, ප්‍රධාන අවදානම් නිලධාරි විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඒ සම්බන්ධ ගැටළුවල නිවිරතාවය මත කමිටුවට සෘජුවම වාර්තා කෙරේ.
	(ඉ) මෙම කමිටුව, යාවත්කාලීන කළ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්ද ඇතුළුව අවදානම් කළමනාකාරිත්වයේ සියළු පැතිකඩ තක්සේරු කිරීම සඳහා යටත් පිරිසෙයින් ත්‍රෛමාසිකව හමුවිය යුතුය.	අනුකූල වී ඇත. වසර තුළදී කමිටුව පස් වතාවක් රැස්විය. රැස්වීම් තොරතුරු හා සහභාගිත්වය පිටු අංක 69 හි දැක්වේ.
	(ඊ) විශේෂිත අවදානම් හඳුනා ගැනීමට අසමත් වීමට වග කියයුතු නිලධාරීන්ට විරුද්ධව කමිටුව උචිත ක්‍රියා මාර්ග ගත යුතු අතර, කමිටුව විසින් නිර්දේශ කළ පරිදි හෝ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ විසින් නිර්දේශ කළ පරිදි, කඩිනම් ප්‍රතිකර්ම සලකාලිය යුතුය.	අනුකූල වී ඇත. බැංකුව තුළ විධිමත්, ලේඛන ගත විනය ක්‍රියාමාර්ග පටිපාටියක් ස්ථාපිතව ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඌ) කමිටුව, හැම රැස්වීමක් පවත්වා සතියක් ඇතුළත අවදානම් තක්සේරු වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර, එමගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්, එකඟතාවය හා/හෝ විශේෂිත නියෝග ඉල්ලා සිටිය යුතුය.	අනුකූල වී ඇත. හැම රැස්වීමකටම පසු ඵලඛෙන ආසන්නතම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට කමිටු රැස්වීම් වාර්තා ඉදිරිපත් කරන අතර, ඒ හා සමග අවදානම් කළමනාකරණ වාර්තා සහ නිර්දේශ යොමු කෙරේ.
	(ඎ) කමිටුව, නීති, රෙගුලාසි, නියාමන මග පෙන්වීම්, අභ්‍යන්තර පාලන විධි හා ව්‍යාපාරික මෙහෙයුම් තුළ සෑම අංශයකම අනුමත ප්‍රතිපත්ති හා බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම උදෙසා අනුකූලතා කෘත්‍යයක් ස්ථාපනය කළ යුතුය. ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් කාර්ය මණ්ඩලය තුළින් තෝරා ගැනුණු කැපවූ අනුකූලතා නිලධාරියෙකු අනුකූලතා කෘත්‍යය ඉටුකළ යුතු අතර, කලින් කලට කමිටුවට වාර්තා කළ යුතුය.	අනුකූල වී ඇත. සියළුම ව්‍යාපාරික ක්ෂේත්‍රවල අදාළ නීති, නියාමනය, නියාමන මග පෙන්වීම්, අභ්‍යන්තර පාලන විධි හා අනුමත ප්‍රතිපත්ති හා සමග බැංකුවේ අනුකූලතාවය තක්සේරු කිරීම සඳහා බැංකුව විශේෂ අනුකූලතා කෘත්‍යයක් ස්ථාපනය කර ඇත. මෙම කෘත්‍යය සඳහාම කැපවූ අනුකූලතා නිලධාරියකු විසින් එය මෙහෙයවන අතර, ඔහු ත්‍රෛමාසික අනුකූලතා වාර්තා කමිටුවටද මාසික අනුකූලතා වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයටද ඉදිරිපත් කරයි. අනුකූලතා ක්‍රියාවලිය, අභ්‍යන්තර පාලන විධි හා බැංකුවේ සෑම ව්‍යාපාරික අංශයක් තුළම අනුමත ප්‍රතිපත්ති හා සමග බැංකුවේ අනුකූලතාවයද තක්සේරු කරයි.
3 (7)	**සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු**	
3 (7) (i)	කිසියම් පුද්ගලයෙකු සහ විශේෂයෙන් මෙම නිර්දේශයට අනුව සම්බන්ධිත පාර්ශව සේ සැලකෙන පහත දැක්වෙන පුද්ගල කාණ්ඩ හා බැංකුවේ කිසියම් ගනුදෙනුවකින් මතු විය හැකි අර්මුණු අතර, ගැටුම් ඇතිවීම වළකාලන්නට අවශ්‍ය පියවර, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගත යුතුය: (අ) බැංකුවේ පරිපාලිත සමාගම් අතුරින් කිසිවක්. (ආ) බැංකුවේ ආශ්‍රිත සමාගම් අතුරින් කිසිවක්. (ඇ) බැංකුවේ අධ්‍යක්ෂවරුන් අතුරින් කිසිවෙක්. (ඈ) බැංකුවේ ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් අතුරින් කිසිවෙක්. (ඉ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ ප්‍රධානතම කළමනාකාරිත්ව පුද්ගලයෙකුගේ සාමාජිකයෙකුගේ ආසන්නතම පවුලේ සාමාජිකයෙක්. (ඊ) බැංකුවේ සැලකිය යුතු බැඳියාවක් සහිත කොටස් හිමියෙක්. (උ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක්, බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ කිසියම් ආසන්න පවුලේ සාමාජිකයෙක් හෝ කිසියම් සැලකිය යුතු කොටස් හිමියෙක් සැලකිය යුතු බැඳියාවක් දරන ව්‍යාපාරයක්.	අනුකූල වී ඇත. සම්බන්ධිත පාර්ශව, ඔවුන්ගේ ගනුදෙනු හා සම්බන්ධිත පාර්ශ්වයන්ට වඩා වාසිදායක සැලකිල්ලක් පිරිනැමීම සීමා කිරීම ආවරණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ප්‍රතිපත්තියක් ඇති අතර, එහි අර්මුණ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර අර්මුණු සඳහා ගැටුම් ඇතිවීම වළකාලීමය. සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු සහිත අධ්‍යක්ෂවරුන්ගෙන් සිය ගනුදෙනු හෙළිදරව් කරන ලෙස පුද්ගලිකව ඉල්ලා සිටිනු ලැබේ. එම ගනුදෙනු ස්වයංක්‍රීය පද්ධතියක් හරහා අධීක්ෂණය කෙරේ.
3 (7) (ii)	මෙම නියෝගය මගින් ආවරණය කෙරෙන සම්බන්ධිත පාර්ශ්ව හා ගනුදෙනු වර්ග තුළ පහත දැක්වෙන දෑ ඇතුළත්විය යුතුය: (අ) උපරිම ණය පහසුකම් පිළිබඳ මුදල් මණ්ඩලයේ නියෝග තුළ නිර්වචනය කර ඇති කිසියම් ආකාරයක ණය පහසුකමක් පිරිනැමීම. (ආ) තැන්පතු, ණය ගැනීම් හා ආයෝජන යන ආකාරයෙන් බැංකුවේ ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම. (ඇ) බැංකුවට සැපයූ හෝ බැංකුවෙන් ලබාගත් කිසියම් මූල්‍යමය හෝ මූල්‍යමය නොවන සේවා සම්පාදනය. (ඈ) බැංකුව හා කිසියම් සම්බන්ධිත පාර්ශ්ව අතර, එබදු සම්බන්ධිත පාර්ශ්වයන්ට ප්‍රතිලාභ අත්කර දිය හැකි, හිමිකාරිත්ව, රහසිගත හෝ වෙනයම් ආකාරයකින් සංවේදී විභවයක් සහිත තොරතුරු නුවමාරු කිරීමට තුඩුදිය හැකි වාර්තාකරණ මාර්ග හෝ තොරතුරු ප්‍රවාහ ගොඩනැගීම හා පවත්වා ගෙන යාම.	අනුකූල වී ඇත. මේ පිළිබඳ තොරතුරු සම්බන්ධිත පාර්ශ්ව හෙළිදරව් කිරීම් ප්‍රකාශයේ 57 සටහනේ පිටු අංක 274 හි හෙළිදරව් කර ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
3 (7) (iii)	බැංකුව ඉහත සඳහන් විධාන අංක 3 (7) (i) තුළ නිර්වචනය කර ඇති අන්දමට සම්බන්ධිත පාර්ශ්ව හා සමඟ, සමාන ව්‍යාපාරික කටයුතු වල, නිරත බැංකුවේ සෙසු ගනුදෙනුකරුවන්ට සපයනවාට වඩා වැඩි වාසිදායක සැලකීමක් එබඳු පාර්ශ්වයන්ට පිරිනැමෙන අන්දමේ ගනුදෙනුවල නිරත නොවන බවට අධ්‍යක්ෂක මණ්ඩලය සහතික කළ යුතුය. මේ සම්බන්ධයෙන් තුළ වැඩි වාසිදායක සැලකීම යන්නට, පහත දැක්වෙන දෑ ඇතුළත් වෙයි. (අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කළ පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනය විචක්ෂණශීලි ප්‍රතිශතයකින් ඉක්මවමින් සමස්ථ ශුද්ධ ණය පහසුකම්, සම්බන්ධිත පාර්ශවයන්ට සැපයීම. මෙම උප විධානය අනුව, (i) 2007 අංක 7 දරණ බැංකු ආඥා පනත අනුව ණය පහසුකම් යනුවෙන් නිර්වචනය කරනුයේ උපරිම ප්‍රමාණයේ ණය පහසුකමයි. (ii) සමස්ත ශුද්ධ ණය පහසුකම සමස්ථ ණය පහසුකමෙන්, මුදල්මය සුරැකුම් හා මෙබඳු සම්බන්ධිත පාර්ශ්ව විසින් බැංකුවේ කොටස් ප්‍රාග්ධනය තුළ හා වසර 5 කට හා එයට වැඩි කල්පිරීමේ කාලසීමාවක් සහිත ණය උපකරණයන් හි ආයෝජනය අඩු කිරීමෙන් ගණනය කළ යුතුය. (ආ) අසම්බන්ධිත සංසන්දනාත්මක ප්‍රතිපාර්ශ්වයක් සමඟ සංසන්දනාත්මක ගනුදෙනුවකදී බැංකුවේ ප්‍රශස්තම ණය පොළී අනුපාතයට වඩා අඩු පොළියක් අය කිරීම හෝ බැංකුවේ තැන්පතු පොළියට වඩා වැඩි පොළියක් ගෙවීම. (ඇ) අසම්බන්ධිත පාර්ශව හා සාමාන්‍ය ව්‍යාපාරික ගනුදෙනු කරගෙන යාමේදී පිරිනමන කොන්දේසි ඉක්මවන, වාසිදායක කොන්දේසි, වෙළඳ අලාභ ආවරණය හෝ ගාස්තු/කොමිස් කපා හැරීම බඳු පක්ෂපාති සැලකිල්ල දැක්වීම. (ඈ) ඇගයීම් පටිපාටියක් රහිතව සම්බන්ධිත පාර්ශවයකට සේවා සැපයීම හෝ සේවා ලබා ගැනීම. (ඉ) නිත්‍යානුකූල වැඩකටයුතු හා කාර්යාවලි සාධනය සඳහා අවශ්‍ය ප්‍රමාණ හැර, හිමිකාරිත්ව, රහසිගත හෝ වෙනත් ආකාරයකින් සංවේදී විභවයක් සහිත තොරතුරු සම්බන්ධිත පාර්ශව හා බෙදාගැනීමට තුඩුදිය හැකි වාර්තාකරණ මාර්ග හා තොරතුරු ප්‍රවාහ පවත්වාගෙන යාම.	අනුකූල වී ඇත. බැංකුව, අනුකූලතා අංශය විසින් අධීක්ෂණය කෙරෙන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත සම්බන්ධිත පාර්ශව ගනුදෙනු අධීක්ෂණය කිරීමේ පටිපාටියක් ක්‍රියාත්මක කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත මාසිකව ඉදිරිපත් කරනු ලබන අනුකූලතා වාර්තාවෙහි අනුකූලතා තත්ත්වය සඳහන් කර ඇත.
3 (7) (iv)	බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී, අදාළ අධ්‍යක්ෂවරයා හැර සෙසු අධ්‍යක්ෂවරුන් අතරින් තුනෙන් දෙකක්, එබඳු ණය පහසුකමක් පිරිනැමීම සඳහා කැමැත්තෙන් ඡන්දය පාවිච්චි කොට එකී පහසුකම අනුමත කළ අවස්ථාවේ හැර, බැංකුව කිසිදු අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරයාගේ සමීප ඥාතියෙකුට කිසිදු ණය පහසුකමක් පිරි නොනැමිය යුතුය. මෙබඳු ණය පහසුකමක්, මුදල් මණ්ඩලය මඟින් වරින් වර නිශ්චය කරනු හැකි කිසියම් සුරැකුමකින් සුරැකුම්ගත කළ යුතුය.	අනුකූල වී ඇත.
3 (7) (v)	(අ) බැංකුවක් කිසියම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකුගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට හෝ පුද්ගලයා විසින් සැලකිය යුතු බැඳියාවක් දරණ කිසියම් ව්‍යාපාරයකට කිසියම් ණය පහසුකමක් පිරිනමන ලැබූ අවස්ථාවක එකී පුද්ගලයා පසු කාලීනව බැංකුවේ අධ්‍යක්ෂවරයා ලෙස පත්කර ඇත්නම්, බැංකුව විසින් එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්කළ දිනයේ සිට වසරක් ඇතුළත, මුදල් මණ්ඩලය විසින් මෙබඳු කරුණක් සඳහා වරින් වර අනුමත කරනු ලැබිය හැකි අවශ්‍ය සුරැකුම් ලබාගැනීමට බැංකුව විසින් පියවර ගැනිය යුතුය.	අනුකූල වී ඇත. මෙබඳු අවස්ථාවක් 2017 වසර තුළ උද්ගත නොවිය.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ආ) ඉහත කී 3 (7) (v) (අ) විධානය මඟින් සලසා ඇති පරිදි එකී කාලසීමාව තුළ එබඳු සුරැකුමක් සම්පාදනය නොකළ අවස්ථාවකදී බැංකුව එකී පහසුකම සම්බන්ධයෙන් ගෙවීමට නියමිත මුදල පොලිය සමඟ, ණය මුදල පිරිනමන අවස්ථාවේදී නියාමනය කළ කාල සීමාව ඇතුළත හෝ එකී අධ්‍යක්ෂවරයෙකු ලෙසින් පත් කළ දිනයේ සිට මාස දහඅටක් ඉකුත්වූ පසු යන මේ දෙකින් මුලින් එලෙඹෙන දිනයේදී ආපසු අය කරගත යුතුය.	
	(ඇ) මෙකී උප නියෝග අනුව කටයුතු කරන්නට අපොහොසත් වන කිසියම් අධ්‍යක්ෂවරයෙකු වේ නම් ඔහු එකී අධ්‍යක්ෂ ධුරය හැර ගියා සේ සැලකෙන අතර, බැංකුව ඒ බව පොදු මහ ජනතාව වෙත හෙළිදරව් කළ යුතුය.	
	(ඈ) කෙසේ වුවද, පහසුකම පිරිනමන අවස්ථාවේදී එකී අධ්‍යක්ෂවරයා බැංකුවේ සේවකයකුව සිටිමින් හා එකී පහසුකම බැංකුවේ සියළුම සේවකයන්ට අදාළ යෝජනා ක්‍රමයක් යටතේ ලබා දුන් අවස්ථාවකදී මෙම උප විධානය අදාළ නොවිය යුතුය.	
3 (7) (vi)	බැංකුවක්, බැංකුවේ සේවකයන්ට අදාළ යෝජනා ක්‍රමයක් මත වන පදනමින් හෝ ඉහත 3 (7) (v) විධානය ප්‍රකාර පහසුකම් පිරිනැමීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් අනුමත කළ හැකි සුරැකුමකින් සුරැකුම්ගත කළ අවස්ථාවකදී හැර කිසියම් සේවකයෙකුට හෝ සේවකයෙකුගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට හෝ එකී සේවකයා හෝ ආසන්න පවුලේ සාමාජිකයකු සැලකිය යුතු බැඳියාවක් දරණ කිසියම් ව්‍යාපාරයකට හෝ ගාස්තු හෝ කොමිස් කපා හැරීම හා බැඳුණු කිසිදු පහසුකමක් හෝ වඩා වාසිදායක සැලකීමක් පිරි නොනැමිය යුතුය.	අනුකූල වී ඇත. බැංකුව සියළුම සේවකයන්ට අදාළ වන සාමාන්‍ය සේවක ණය යෝජනා ක්‍රම යටතේ හැර බැංකුවේ කිසිම සේවකයෙකුට වඩා වාසිදායක සැලකීමත්/ණය පහසුකම් සපයා නැත. මේ පිළිබඳව චක්‍රලේඛන උපදෙස් නිකුත් කර ඇත. බැංකු සේවකයන්ගේ ආසන්න පවුලේ සාමාජිකයෙකුට කිසිදු වාසිදායක සැලකීමක්/පහසුකමක් සපයන්නේද නැත.
3 (7) (vii)	බැංකුවක් විසින් ඉහත 3 (7) (v), 3 (7) (vi) විධාන මත ලබා දුන් කිසිදු පහසුකමක් හෝ එකී පහසුකමක කිසියම් කොටසක් හෝ ඒ සඳහා ලැබිය යුතු කිසියම් පොලියක්, මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය රහිතව ප්‍රේෂණය නොකළ යුතු අතර, කිසියම් ප්‍රේෂණයක් සිදු කරයි නම් එය වලංගු රහිත හා නිශ්ඵල එකක් විය යුතුය.	අනුකූල වී ඇත. 2017 වසර තුළ මෙබඳු තත්ත්වයක් උද්ගත නොවිය.
3 (8)	**හෙළිදරව් කිරීම**	
3 (8) (i)	අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතු දෑ:	
	(අ) වාර්ෂිකව විගණනය කළ මූල්‍ය ප්‍රකාශ හා ත්‍රෛමාසික මූල්‍ය ප්‍රකාශ, සුපරීක්ෂණය හා නියාමන බලධාරීන් විසින් නියම කර ඇති ආකෘතිය හා බල පවත්වනා ගිණුම්කරණ ප්‍රමිති හා සමඟ අනුරූපව සකස් කොට ප්‍රකාශයට පත් කර ඇති බවටද,	අනුකූල වී ඇත.
	(ආ) එකී ප්‍රකාශයන් හි සංක්ෂිප්තයක් සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පුවත්පත් වල ප්‍රසිද්ධ කරන බවටද අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය.	
3 (8) (ii)	පහත දැක්වෙන අවම හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාවේ තිබෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතුය:	අනුකූල වී ඇත.
	(අ) වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන, විශේෂිත හෙළිදරව් කිරීම් ද ඇතුළත්ව, අදාළ ගිණුම්කරණ ප්‍රමිති හා නියාමන අවශ්‍යතාවය අනුව යමින් සකස් කොට ඇති බවට ප්‍රකාශයක්.	වාර්තා පිටු අංක 139 සිට 143 දක්වා බැංකු කටයුතු තත්ත්වය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව යටතේද, පිටු අංක 149 හී මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් යටතේද හෙළිදරව් කර ඇත.
	(ආ) මූල්‍ය වාර්තාකරණ පද්ධතිය, මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසනීයත්වය පිළිබඳ සාධාරණ සහතිකයක් සැපයීම සඳහා නිර්මාණය කර ඇති බවට හා බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශ සැකසීම අදාළ මූල්‍යකරණ හා නියාමන අවශ්‍යතා හා අනුරූපවෙමින් ඉටු කළ බවටද, බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක්.	අනුකූල වී ඇත. වාර්ෂික වාර්තාවේ පිටු අංක 146 සිට 147 දක්වා "අභ්‍යන්තර පාලන විධි පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය" හා පිටු අංක 149 හී "මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම" තුළ හෙළිදරව් කර ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඇ)සහතික ප්‍රතිඥාත මත ශ්‍රී ලංකා ප්‍රමිති SLSAE 3050 අභ්‍යන්තර පාලනය මත අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශ පිළිබඳව බැංකු සඳහා සහතික වාර්තා යටතේ විගණනකරුවන් විසින් නිකුත් කළ සහතික වාර්තා.	අනුකූල වී ඇත. බැංකුව මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලන විධින් හි සඵලතාවය පිළිබඳව විගණනාධිපතිවරයාගෙන් සහතිකයක් ලබාගෙන ඇති අතර, එය මෙම වාර්තාවේ පිටු අංක 148 යටතේ දැක්වේ.
	(ඈ)නම්, යෝග්‍යතාවය, බැංකුව සමඟ ඇති ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවූ මුළු ගාස්තු/පාරිශ්‍රමික ඇතුළුව අධ්‍යක්ෂවරුන්ගේ විස්තරාත්මක තොරතුරු.	අනුකූල වී ඇත. අධ්‍යක්ෂවරුන්ගේ තොරතුරු පිටු අංක 35 සිට 37 දක්වා ඇත. බැංකුව සමඟ අධ්‍යක්ෂවරුන්ගේ ගිවිසුම් පිටු අංක 144 හා 145 හි දක්වා ඇත. බැංකුව විසින් ගෙවූ පාරිශ්‍රමික පිළිබඳ විස්තර, පිටු අංක 180 හි 15 වන සටහන යටතේ දක්වා ඇත.
	(ඉ) 3 (7) (iii) හි නිර්වචනය කර ඇති පරිදි ඒ ඒ සම්බන්ධිත පාර්ශව කාණ්ඩයන්ට ලබා දුන් සමස්ත ශුද්ධ ණය පහසුකම. ඒ ඒ සම්බන්ධිත පාර්ශ්ව කාණ්ඩයන්ට ලබා දුන් ශුද්ධ පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙසද හෙළිදරව් කළ යුතුය.	අනුකූල වී ඇත. 2017 වර්ෂය තුළ ඒ ඒ සම්බන්ධිත පාර්ශව කණ්ඩායම් වලට ලබා දුන් ශුද්ධ සමස්ත ණය පහසුකම්, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස පහත දැක්වේ:

	රු. '000	%
ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්	140,125	0.11
පරිපාලිතයන්	1,751,755	1.40
ආශ්‍රිත සමාගම්	254,365	0.20
රජය හා රජයට සම්බන්ධිත ආයතන (මූල්‍ය ප්‍රකාශයේ සටහන් අංක 57.4 හි සඳහන් නිර්වචනනය බලන්න)	1,065,487,630	849.26

(ඊ) බැංකුව ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ට ගෙවූ පාරිශ්‍රමික වල මුළු එකතුව හා ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින් සමඟ බැංකුවේ මුළු ගනුදෙනු එකතුව, ගෙවූ පාරිශ්‍රමික, සැපයූ ණය පහසුකම්, තැන්පතු හා ආයෝජන ආදී වශයෙන් පුළුල් වර්ග යටතේ වෙන්ව දැක්වීම.	අනුකූල වී ඇත. 2017 වර්ෂය සඳහා ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයින්ට ගෙවූ පාරිශ්‍රමික හා බැංකුව හා ඔවුන් අතර වූ ගනුදෙනු පහත දැක්වේ:

	රු. '000
කෙටි කාලීන සේවය ප්‍රතිලාභ	392,458
පශ්චාත් රැකියා නියුක්ති ප්‍රතිලාභ	171,459

මෙයට අමතරව බැංකුව එහි අනුමත ප්‍රතිලාභ සැලසුම යටතේ, ප්‍රධානතම කළමනාකාරිත්ව පුද්ගලයින්ට වාහන පරිහරණය බදු මුදල්මය නොවන ප්‍රතිලාභ ද සපයා ඇත.

	රු. '000
ණය	410,435
බැංකු අයිරා	11,666
ණය කාඩ්පත්	9,215
තැන්පතු	368,897
ණයකර	7,626
භාවිතා නොකළ පහසුකම්	51,410

(උ) විගණකවරුන් විසින් ඒ පිළිබඳව බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ වෙත ඒ බව තහවුරු කර ඇත්නම්, "ශ්‍රී ලංකා සම්බන්ධිත සේවා පරිච ප්‍රකාශය 4750" යටතේ නිකුත් කළ විගණකවරුන්ගේ "සත්‍ය සොයා ගැනීම් වාර්තාවන්" හි සියළුම සොයා ගැනීම්, වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව තුළට අන්තර්ගත කර ඇති බවට අධ්‍යක්ෂවරුන් විසින් සිය වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවේ දක්වන සහතිකයක්.	අනුකූල වී ඇත. බැංකුව 2007 අංක 11 දරණ ආයතනික යහපාලන විධානය පිළිබඳව විගණකාධිපතිවරයාගෙන් සහතිකයක් ලබා ගෙන ඇත. විගණකවරුන්ගේ සියළුම සොයාගැනීම් මෙම ආයතනික යහපාලන වාර්තාව තුළ අන්තර්ගත කර ඇති බවට ද, කිසියම් නිර්දේශයක් වේ නම් ඒ පිළිබඳව 2018 තුළ කටයුතු කරන බවට ද අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

පරිච්ඡේදය	මූලධර්ම	2017 වසර තුළ අනුකූලවීමේ මට්ටම
	(ඌ) විචක්ෂණශීලී අවශ්‍යතා, නියාමන නීති, රීති හා අභ්‍යන්තර පාලන විධි හා කිසියම් සැලකිය යුතු අනුකූල නොවීම් නිවැරදි කරන්නට ගත් ක්‍රියාමාර්ග සමඟ අනුකූලතා විස්තර විදහා පෙන්වන වාර්තාවක්	අනුකූල වී ඇත. පිටු අංක 149 දැක්වෙන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම යටතේ විචක්ෂණශීලී අවශ්‍යතා, රෙගුලාසි, නීති හා අභ්‍යන්තර පාලන විධි පිළිබඳ අනුකූලතාවය විස්තරාත්මකව පැහැදිලි කරයි.
	(එ) බැංකුවේ අවදානම් කළමනාකරණයේ ප්‍රමාදදෝෂ හෝ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂ විසින් පෙන්වා දී ඇති පරිදි මෙකී විධානයන් හා අනුකූල නොවීම් පිළිබඳ නියාමන හා සුපරීක්ෂණ සැලකිලිමත් වීම පිළිබඳ ප්‍රකාශයක් හා එවැන්නක් පොදු මහ ජනතාවට හෙලිදරව් කළ යුතු යැයි මුදල් මණ්ඩලය විසින් නියෝග කළ අවස්ථාවක, එකී සැලකිලිමත් වීම් පිළිබඳව බැංකුව විසින් ගන්නා ලද නිවැරදි කිරීමේ ක්‍රියා මාර්ග.	අනුකූල වී ඇත. බැංකුවේ අවදානම් කළමනාකරණ පද්ධති හෝ මෙම විධාන සමඟ අනුකූල නොවීම් තුළ සුපරීක්ෂණ සැලකිලිමත් වීම් මතු කළ ප්‍රමාද දෝෂ නොවූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු සුපරීක්ෂණ අධ්‍යක්ෂට පෙන්වාදීම් සඳහා ඒ තුඩුදුන්නේ නැත. එබැවින් එබඳු දෑ හෙලිදරව් කරන ලෙස මුදල් මණ්ඩලයට, නියෝග පැනවීමට සිදුවූයේ නැත. මෙබඳු ප්‍රමාද දෝෂ හෝ අනුකූලතා සිදු නොවූ හෙයින් මුදල් මණ්ඩලය එබඳු කිසිදු විධානයක් නොකළ බැවින් ද ගන්නා ලද ක්‍රියාමාර්ග පැන නොනගින අතර, මෙහිලා හෙලිදරව් කළ යුතු කිසිවක් නැත.
3 (9) (i)	**තාවකාලික හා වෙනත් පොදු ප්‍රතිපාදන** මෙම විධානය හා අනුකූලත්වය 2008 ජනවාරි 01 දා සිට ඉදිරියට ආරම්භ කෙරෙන අතර, මෙම විධානය තුළ සපයා ඇති අනුකූලතා දිනයන් විශේෂයෙන් සම්පාදනය කර ඇති විටෙක හැර සියළුම බලපතලාභී වාණිජ බැංකු 2009 ජනවාරි 01 දා හෝ ඊට ප්‍රථම මෙම විධානයේ විධිවිධානයට පූර්ණ ලෙසින් අනුකූල විය යුතුය.	අනුකූල වී ඇත.
3 (9) (ii)	ශ්‍රී ලංකාව තුළ විශේෂිත ව්‍යවස්ථාපිත පනත් මඟින් සංස්ථාපනය කරන ලද බැංකු සම්බන්ධයෙන් එකී ව්‍යවස්ථාපිත පනත් ප්‍රතිපාදන සමඟ පටහැනි නොවන මෙම විධානයේ සියළුම ප්‍රතිපාදන හා අනුකූල වන්නට පියවර ගන්නේ නම්, එකී පනත් තුළින් විශේෂිතව දක්වා ඇති අධ්‍යක්ෂ මණ්ඩල එකී ව්‍යවස්ථාපිත පනත් ප්‍රතිපාදන හා අනුව යමින් දිගටම කටයුතු කළ යුතුය.	අනුකූල වී ඇත. ලංකා බැංකුව 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධන මඟින් පැන නැඟෙන ප්‍රතිපාදන හා පටහැනි නොවන ලෙස මෙම විධානයේ අදාළ හැම ප්‍රතිපාදනයක්ම හා අනුකූල වන්නට ගත හැකි හැම ක්‍රියාමාර්ගයක්ම ගනිමින්, එහි පැනවුම බලාත්මක කර ඇත. කිසියම් අනුකූල අවස්ථා හා එකඟ නොවන අවස්ථාවන්හි බැංකුව ඊට අදාළ ව්‍යවස්ථාපිත පනත් ප්‍රතිපාදන අනුව යමින් කටයුතු කරගෙන යන අවස්ථාවන්හිදී, ඒ බැව් ඉහත අදාළ පරිච්ඡේද/ඡේද එල්ලේ විශේෂිතව සඳහන් කර ඇත.
3 (9) (iii)	මෙම විධානය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විදේශ බැංකු ශාඛාවකට අදාළ විය යුත්තේ, එය එකී බැංකුවේ සංස්ථාපිත රට තුළ බලාත්මක නීති හා රෙගුලාසි සමඟ පටහැනි නොවන වපසරිය තුළය, විදේශීය බැංකු ශාඛාව, එහි වාර්ෂික වාර්තාව හා ගිණුම් හා ශ්‍රී ලංකා ශාඛා මෙහෙයුම් හා බැඳුණු ගිණුම් සමඟ මව් බැංකුවේ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව ද ප්‍රකාශයට පත් කළ යුතුය.	අදාළ නොවේ.
3 (9) (iv)	මෙම විධානයේ ප්‍රතිපාදන සහ කිසියම් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය (හෝ අභ්‍යන්තර රීති) අතර ගැටුමක් මතු වූ කිසියම් අවස්ථාවක මෙම විධානයේ ප්‍රතිපාදන බලපවත්වනු ඇත. කෙසේ වූවත්, එක් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලියේ ප්‍රතිපාදන, මෙම විධානයේ දක්වා ඇති ප්‍රතිපාදනවලට වඩා දැඩි වේ නම් සාංගමික ව්‍යවස්ථාවලියේ ප්‍රතිපාදන අනුව කටයුතු කළ හැකිය.	අදාළ නොවේ.
3 (9) (v)	යම් හෙයකින් අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ බැංකු පනතේ විධි විධාන සලසා ඇති පරිදි විධාන අංක 3 (2) (ii) ආ, 3 (3) (i) අ හා 3 (3) (ii) අ හා යොමුවෙන මුදා හැරීම් ලබා නොගත යුතු යැයි මුදල් මණ්ඩලය අදහස් කරන්නේ නම්, එකී පදනම මුදල් මණ්ඩලය විසින් එම තැනැත්තාට දැනුම් දිය හැකි අතර, විභාගයකට පසු මුදල් මණ්ඩලයට මුදා හැරීමේ කාලසීමාව සීමා කළ හැකිය.	අදාළ නොවේ.

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති අනුකූලවීමේ අවශ්‍යතාවයන්

කොළඹ කොටස් හුවමාරුව විසින් පනවා ඇති 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය හා බැඳුණු ලැයිස්තුගත රීති හා අනුකූලවීම් පහත පරිදි සාරාංශ කළ හැකිය:

රීති අංකය	අවශ්‍යතාවය	කාලපරිච්ඡේදය	ඉදිරිපත් කළ දිනය
7.4 අ (i)	කාර්තුමය පදනම මත සකස් කළ අතුරු මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර, කොළඹ කොටස් හුවමාරුව වෙත ඉදිරිපත් කළ යුතු අතර, පළමු කාර්තු තුන සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාළ කාර්තු නිමවී දින 45 ක් තුළ දී ද අවසන් කාර්තුව සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අදාළ කාර්තුව අවසන් වූ දින සිට මාස දෙකක් තුළද ඉදිරිපත් කළ යුතුය.	2017 මාර්තු 31 න් අවසන් පළමු කාර්තුව	2017 මැයි 12
		2017 ජූනි 30 න් අවසන් දෙවන කාර්තුව	2017 අගෝසතු 14
		2017 සැප්තැම්බර් 30 න් අවසන් තෙවන කාර්තුව	2017 නොවැම්බර් 15
		2017 දෙසැම්බර් 31 න් අවසන් සිව්වන කාර්තුව	2017 පෙබරවාරි 28

රීති අංකය	අවශ්‍යතාවය	අනුකූලතාවය
7.4 ආ (i)	ශ්‍රී ල.ගි.ප්‍ර. 34 ට අනුකූලවීම සහ බැංකුව හා සමූහය වෙන් වෙන්ව හෙළිදරව් කිරීම	අනුකූලතාවය දක්වන ලදී
7.4 ආ (ii)	ලැයිස්තුගත රීති වලට අනුව අතිරේක සටහන් සහ අනුපාත හෙළිදරව් කිරීම	අනුකූලතාවය දක්වන ලදී
7.4 ආ (iii)	අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කිරීම	අනුකූලතාවය දක්වන ලදී
7.4 ආ (iv)	මූල්‍ය ප්‍රකාශ විගණනය කර ඇති ද යන්න සඳහන් කිරීම	අනුකූලතාවය දක්වන ලදී
7.5 අ	අදාළ මූල්‍ය වර්ෂය අවසන් වන දින සිට මාස 5 ක් තුළ වාර්ෂික වාර්තාව කොළඹ කොටස් හුවමාරුවට ඉදිරිපත් කළ යුතුය	2017 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින ඉදිරිපත් කර ඇත. 2017 වසර සඳහා වාර්ෂික වාර්තාව නියමිත දිනට පෙර ඉදිරිපත් කෙරෙනු ඇත.

රීති අංකය	අනාවරණ අවශ්‍යතාව	පරිශීලනය/අර්ථ කථනය	පිටු අංකය
7.6 (i)	අදාළ මූල්‍ය වර්ෂය තුළ ආයතනයෙහි අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයන්ගේ නම්	ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව	141
7.6 (ii)	අදාළ මූල්‍ය වර්ෂය තුළ දී ආයතනයෙහි සහ එහි පරිපාලිතයන්ගේ ප්‍රධාන ක්‍රියාකරකම් සහ එම ක්‍රියාකාරකම්හි ස්වභාවයේ සිදුවූ වෙනස්කම්	ලංකා බැංකුවේ කටයුතු පිළිබඳ ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව	139
		මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්	160
7.6 (iii)	ජන්ද හිමි හා අහිමි කොටස් හිමිකාරිත්වය මත, ඉහළම ප්‍රමුඛත්වය ලැබූ ප්‍රථම කොටස් හිමියන් විසිදෙනාගේ නම්, හිමිකම් කියනු ලබන කොටස් ප්‍රමාණය සහ අදාළ හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස	ශ්‍රී ලංකා රජය ලංකා බැංකුවෙහි එකම කොටස්හිමියා වේ.	364
7.6 (vi)	පොදු හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස	අදාළ නොවේ	
7.6 (v)	මූල්‍ය වර්ෂය ආරම්භයේදී සහ අවසානයේදී අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරියාගේ කොටස් හිමිකාරිත්වය පිළිබඳ ප්‍රකාශය	අදාළ නොවේ	
7.6 (vi)	ආයතනය මුහුණ දිය හැකියැයි හඳුනාගත් ප්‍රමාණාත්මක අවදානම් සාධකයන් පිළිබඳ කරුණු	අවදානම් කළමනාකරණ වාර්තාව	80-92
7.6 (vii)	ආයතනයෙහි සේවක සහ ඥේත්‍ර සබඳතාවයන්ට අදාළ ප්‍රමාණාත්මක ගැටළු පිළිබඳ තොරතුරු	සලකා බලනු ලබන වර්ෂය තුළ දී ප්‍රමාණාත්මක ගැටළු කිසිවක් පැන නොනැගිණි.	
7.6 (viii)	ආයතනය සතු ඉඩම් සහ ආයෝජිත දේපලවල ප්‍රමාණ, පිහිටීම, තක්සේරු වටිනාකම සහ ඒවායේ ඇති ගොඩනැගිලි සංඛ්‍යාව	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් අංක 32 සහ 33	223-244
7.6 (ix)	ආයතනයෙහි ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් නියෝජනය වන කොටස් සංඛ්‍යාව	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් අංක 48.1	265
7.6 (x)	එක් එක් වර්ගයේ ස්කන්ධ සුරැකුම් හිමිකරුවන් ගණන සහ එම හිමිකාරිත්වය සහ එම හිමිකාරිත්වය ප්‍රතිශතයක් ලෙස දක්වන ලද ව්‍යාප්ති සටහන	අතිරේක තොරතුරු	364

රීති අංකය	අනාවරණ අවශ්‍යතාව	පරිශීලනය/අර්ථ කථනය	පිටු අංකය
7.6 (xi)	අනුපාතයන් සහ වෙළඳපොල මිල පිළිබඳ තොරතුරු		
	1. කොටසක ලාභාංශය, කොටසක ශුද්ධ වත්කම්, සංසන්දනීය රාජ්‍ය සුරැකුම්පත්වල පොළී අනුපාතිකය, ණය/ප්‍රාග්ධන අනුපාතිකය, පොළී ආවරණය සහ ද්‍රවශීල වත්කම් අනුපාතය	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 18.3 සහ 48.2 අතිරේක තොරතුරු	184,265 363
	2. ලැයිස්තුගත ණයකර වලට අදාළ වෙළඳපොළ තොරතුරු	මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් අංක 47 අතිරේක තොරතුරු	263-264 364-365
	3. ණය ශ්‍රේණිගත කිරීමෙහි සිදුවූ වෙනස්වීම්	සම්මාන	107
